ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

විගණකාධිපති වාර්ෂික වාර්තාව

2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නවවන පාර්ලිමේන්තුව
(පළමු සැසිවාරය)



# විගණකාධිපති
වාර්ෂික වාර්තාව
# 2019

# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

**2019**

ජාතික විගණන කාර්යාලය

# ජාතික විගණන ආයතනයේ නිල ලාංඡනය

**මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ.**

- ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මගින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.
- එහි මැද ඇති තරාදිය මගින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මගින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති පලා පෙති රටාව මගින් ජාතික සංස්කෘතිය නිරූපනය කෙරේ.

## අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

## අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

## අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

## අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AGS/AR/2019/21 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2020 ඔක්තෝබර් 29

ගරු කථානායකතුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

මැතිතුමණි,

**<u>විගණකාධිපති වාර්ෂික වාර්තාව 2019</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධව 2019 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ නවය යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

| | | |
|---|---|---|
| පළමුවන කාණ්ඩය | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |
| දෙවන කාණ්ඩය | - | රාජ්‍ය සංස්ථා, අධිකාරී හා මණ්ඩල |
| තුන්වන කාණ්ඩය | - | ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් |
| හතරවන කාණ්ඩය | - | විදේශ ආධාර ව්‍යාපෘති |
| පස්වන කාණ්ඩය | - | පළාත් සභා |
| හයවන කාණ්ඩය | - | පළාත් පාලන ආයතන |
| අටවන කාණ්ඩය | - | කාර්යසාධන විගණන වාර්තා |
| නමවන කාණ්ඩය | - | රාජ්‍ය සමාගම් |
| දහවන කාණ්ඩය | - | විශේෂ විගණන වාර්තා |

මාගේ කාර්ය සාධනය සහ රාජකාරී ඉටු කිරීම පිළිබඳව වන මෙම වාර්ථාව අන්තර්ජාතික පරිචයන්ට අනුකූලව ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය සම්පත් පරිහරණය පිළිබඳ තොරතුරු ද ඇතුළත් කරමින් මෙහෙයුම් කටයුතු පිළිබඳ විග්‍රහයක් ද සහිතව වාර්ෂික වාර්තාව ලෙස ඉදිරිපත් කරමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

# පටුන


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| අපේ සංවිධානය | 01 | විදුලිබල හා බලශක්ති | |
| නිත්‍යානුකූලව ඉටු කිරීම | 05 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 261 |
| අපගේ සංවිධාන සටහන | 14 | බලශක්ති | 265 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 17 | වාරිමාර්ග හා ජල සම්පත් | 277 |
| සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම | 21 | ජලසැපයුම් හා සනීපාරක්ෂාව | |
| | | ජලසම්පාදනය හා සනීපාරක්ෂාව | 283 |
| පාර්ලිමේන්තුවට සහායවීම | 22 | නිවාස හා නාගරික සංවර්ධනය | |
| විගණකාධිපති විසින් පනවනු ලබන අධිභාර | 24 | නිවාස හා ඉදිකිරීම් | 291 |
| | | නාගරික පහසුකම් | 395 |
| විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය | 25 | මානව සම්පත් සංවර්ධනය | |
| | | සංස්කෘතික හා කලා කටයුතු | 311 |
| | | අධ්‍යාපනය | 315 |
| විශේෂ විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ කටයුතු | 47 | උසස් අධ්‍යාපනය | 323 |
| | | කුසලතා වර්ධනය | 333 |
| 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන | 61 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 345 |
| 2019 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තා | 69 | සෞඛ්‍ය | 355 |
| | | ක්‍රීඩා කටයුතු | 377 |
| ඒකාබද්ධ අරමුදල | 99 | යෞවන කටයුතු | 381 |
| රාජ්‍ය ව්‍යවසාය | 121 | තාක්ෂණික සංවර්ධනය | |
| පළාත් පාලනය | 131 | විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ | 387 |
| විදේශාධාර ව්‍යාපෘති | 139 | සන්නිවේදනය | 391 |
| බැංකුකරණය | 147 | පරිසරය | |
| ජාතික ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම | | වනජීවී | 405 |
| | | පරිසර කළමනාකරණය | 409 |
| ජාතික ආරක්ෂාව | 167 | ප්‍රාදේශීය සංවර්ධනය | |
| අධිකරණය හා බන්ධනාගාර කටයුතු | 175 | ග්‍රාමීය ආර්ථික කටයුතු | 419 |
| මූර්ථ ආර්ථිකය | | ප්‍රාදේශීය පරිපාලනය | 421 |
| කෘෂිකර්මය | 185 | සමාජ ආරක්ෂණය | |
| පශු සම්පත් | 193 | ප්‍රජා සංවර්ධනය | 427 |
| වැවිලි කර්මාන්තය | 199 | සමාජ සහන | 433 |
| ධීවර හා ජලජ සම්පත් | 209 | සමාජ ආරක්ෂාව | 437 |
| කර්මාන්ත | 217 | සේවා ආර්ථිකය | |
| ඉඩම් කටයුතු | 221 | මූල්‍ය සේවා | 445 |
| ප්‍රවාහනය | | රාජ්‍ය සේවය | 451 |
| මගී ප්‍රවාහනය | 231 | වෙළෙඳ කටයුතු | 457 |
| වරාය හා නාවික කටයුතු | 245 | සංචාරක කටයුතු | 463 |
| මහාමාර්ග | 253 | සත්වෝද්‍යාන හා උද්භිද උද්‍යාන | 469 |

| | | | |
|---|---|---|---|
| පළාත් සභා හැදින්විම | 471 | නැගෙනහිර පළාත් සභාව | 487 |
| බස්නාහිර පළාත් සභාව | 475 | උතුරු මැද පළාත් සභාව | 493 |
| මධ්‍යම පළාත් සභාව | 479 | වයඹ පළාත් සභාව | 499 |
| දකුණු පළාත් සභාව | 483 | සබරගමුව පළාත් සභාව | 503 |
| උතුරු පළාත් සභාව | 485 | ඌව පළාත් සභාව | 507 |

## අපගේ ඉතිහාසය

එවකට ලංකාව යනුවෙන් හැඳින්වුන ශ්‍රී ලංකාවේ වත්මන් ජාතික විගණන කාර්යාලයේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1776 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1779 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව ලියකියවිලි වලින් සනාථ වේ. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වශයෙන් විගණකාධිපතිවරු 40 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව පැවැති අතර වර්තමානයේදී ජාතික විගණන කාර්යාලය වශයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

## විගණන සම්බන්ධව අපේ අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබී තිබුණි. එය 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් වඩා පුළුල් වී ඇත.

සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනක් විසින් දරනු ලබන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සමාගම්ද, ආවරණය වන පරිදි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය තවදුරටත් පහත පරිදි පුළුල් කර ඇත.

''විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.''

පහත සඳහන් අණපනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති බලය විකාශනය කිරීමක් හෝ ප්‍රසාරණය කිරීමක් හෝ කර තිබේ.

- රාජ්‍ය මුල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සළසන 2018 අංක 19 දරන ජාතික විගණන පනත
- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය

- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය .
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය .
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය.
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය.
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය.

පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි කරගෙන යාමට විගණකාධිපතිවරයා සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද පවරනු ලැබේ. විගණකාධිපතිවරයාගේ කටයුතු හා රාජකාරි ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා ඉහතින් සඳහන් කරන ලද ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිසීමට විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත

## අපගේ සේවා ග්‍රාහකයෝ

විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කරන අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම පහත සඳහන් පරිදි වේ.

| සේවාලාභියා | ආයතන ගණන |
|---|---|
| අමාත්‍යාංශ | 31 |
| අමාත්‍ය මණ්ඩලයේ සමාජික නොවන අමාත්‍යාංශ | 06 |
| දෙපාර්තමේන්තු | 96 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25 |
| සංස්ථා | 285 |
| රාජ්‍ය සමාගම් (දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණකාධිපතිවරයාගේ විෂය පථයට යටත් කර ඇති) | 114 |
| රාජ්‍ය බැංකු | 10 |
| ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් | 64 |
| විදේශ අරමුදල් ව්‍යාපෘති | 163 |
| අනෙකුත් ස්වාධීන ආයතන | 22 |
| පළාත් සභා | 09 |
| පළාත් පාලන ආයතන | 341 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 562 |
| ක්‍රීඩා සංගම් | 64 |
| පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක | 259 |
| පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන | 61 |
| එකතුව | 2112 |

## අපගේ විෂය පථය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ I කොටසේ 3 වන වගන්තියේ සිට 5 වන වගන්තිය දක්වා වගන්තිවලින් විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන විගණනවල විෂය පථය සඳහන් කර ඇත. ඒ අනුව,

- විගණකධිපතිවරයා විසින්
    - ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියළුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියළු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
    - විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කර ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
    - වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය; සහ
    - එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.
- විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද විගණනයක විෂය පථයට විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්, මූල්‍යයන්, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍යවල සහ දේපළ විචක්ෂණ කළමනාකරණ පරීක්ෂා කිරීම ඇතුළත් වන්නේය.
- විගණකාධිපතිවරයා මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතුය.

- විගණන පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරිමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. ඒ අනුව

- විගණන පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටවන ලද ජාතික විගණන කාර්යාලය විසින් භාරගනු ලබන විගණන සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින් අදාළ විය යුතුය.
- කාර්යසාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

- පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි.

## අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය මත පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග ගැලපීමට මෙය තවදුරටත් විකාශනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

''විගණකාධිපතිවරයෙක් වන්නේය. ඔහු සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන අතර විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධුරය දරන්නේය.''

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හිදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

## නීත්‍යානුකූල ඉටු කිරීම

### නීත්‍යානුකූල ඉටුකිරීම් සඳහා අවශ්‍යතාවය

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම් සිදුකර තිබුණි. නමුත් 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එම සීමාකිරීම් ඇහිරී ඇත. විගණකාධිපතිවරයා කිසිදු පුද්ගලයෙකුගේ හා ආයතනයක සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික පළිගැනීම්වලින් තොරවිය යුතු නිසා මූල්‍ය හා මිනිස් බලය යන දෙවර්ගයෙන් දැක්වෙන ඔහුගේ සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකයේ රඳාපැවැත්ම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද විගණනයේ ස්වාධීනත්වය සැබවින්ම හානියට ලක්වන බව පිළිගනී. මූල්‍ය පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. 2018 වර්ෂය දක්වා විගණකාධිපතිවරයා ඔහුගේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය තුළ යැපීම සිදු විය. අනෙකුත් උසස් පොදු රාජ්‍ය

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මඟින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය

මණ්ඩලීය රටවල්වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, ව්‍යවස්ථාදායක සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයෙන් බැහැරවන පරිදි 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් විධිවිධාන සලසා තිබීම විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කිරීමේ ස්වාධිනත්වය තහවුරු කර ඇත.

විගණකාධිපතිවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම, කාර්ය මණ්ඩලයේ උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ජාතික විගණන සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාළවේ. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීන්ත්වය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරී පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලැකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහොමයක් විය.

පිළිබඳව මුලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරිතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මඟින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන

අපගේ සංවිධානය

පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

### 1 ප්‍රතිපත්තිය

යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

### 2 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධුරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

පහත සඳහන් තත්ත්වයන්ට යටත්වන උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන්ගේ සහ විද්‍යායතනික ආයතනවල සාමාජිකයන් ගේ පත්වීම්, නැවත පත්වීම්, සේවා නියුක්තිය, සේවයෙන් සේවසේවයෙන් ඉවත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳ කොන්දේසි අදාළ නීති සම්පාදනය මගින් විශේෂයෙන් දැක්විය යුතුය.

- ව්‍යවස්ථාදායකයෙන් සහතික කෙරෙන ක්‍රියාවලියක් මගින් ස්වාධීනත්වය තහවුරු කෙරෙන පත්කිරීම්, නැවත පත් කිරීම් හෝ සේවයෙන් ඉවත් කිරීම් (උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනත්වය හා සම්බන්ධ ISSAI II මාර්ගෝපදේශ සහ යහපත් පරිචයන්)
- ස්වකීය නියෝග (Mandate) විරෝධ මත ඉදිරිපත්වීමේ බියකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රමාණවත් තරම් දීර්ඝ සහ නිශ්චිත කාල සීමාවක් සහිතව කරනු ලබන පත්වීම් ; සහ
- ස්වකීය රාජකාරී නිසියාකාරයෙන් සාමාන්‍ය පරිදි ඉටු කිරීමේදී අතීතයේදී වර්තමානයේදී සිදුකරන ලද කවර හෝ කාර්යයක් හේතු කොට ගෙන සිදු කරනු ලබන පැමිණිල්ලකදී නිර්මුක්ත වීම. (Immune)

### 3 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නියෝගයක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.
- රජයට හෝ රජයේ ආයතනවලට ලැබියයුතු ආදායම් එකතු කිරීම.
- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව
- මූල්‍ය කළමනාකරණයේ හා වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ
- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මගින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී විනා, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්තිය විගණනය නොකළ යුතු නමුත් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන විසින් එම ආයතනවලට අදාල වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට ගරු කළයුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරා ගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩසටහන් ගතකිරීම, පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම ;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය ;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නියෝගයේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

උත්තරීතර විගණන ආයතන, ස්වකීය විගණිත ආයතන සමඟ වඩා සමීප සම්බන්ධතා ඇති කර නොගන්නා බවට සහතික විය යුතුය. ඒ අනුව ඔවුන් අරමුණුවලට අනුකූලව කටයුතු කරමින් සිටින බව විදහා දැක්විය යුතුය.

ස්වකීය වගකීම් ඉටු කිරීමේදී උත්තරීතර විගණන ආයතනවලට පූර්ණ අභිමතය අනුව ක්‍රියා කළහැකි විය යුතුය. ඔවුන් රාජ්‍ය අරමුදල් භාවිතය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට වෙහෙසෙන රාජ්‍ය හෝ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ ද අනෙකුත් පිළිගත් ප්‍රමිති නියම කරන ආයතනවලද නිල ලේඛන පදනම් කරගත් යෝග්‍ය වූ වැඩ සහ විගණන ප්‍රමිතීන් ද ආචාර ධර්ම සංග්‍රහයක් ද උත්තරීතර විගණන ආයතන විසින් භාවිත කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මගින් නියම කර ඇති ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍යආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

### 4 ප්‍රතිපත්තිය

### සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, වැරදීමෙන් තොරව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතනය සතු විය යුතුය.

### 5 ප්‍රතිපත්තිය

**ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම**

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

### 6 ප්‍රතිපත්තිය

**විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම**

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.
- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.
- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මගින් කළ යුතුය.
- වාර්තා කිරීමට අවශ්‍ය කරුණු නිශ්චිත වශයෙන් නීතියෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර ස්වකීය විගණන වාර්තාවල කාල නියමය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.
- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක්, හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.
- උත්තරීතර විගණන ආයතනවල වාර්තා නීතියෙන් නියම වී ඇති පරිදි අදාළ බලධාරීන්ට විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් හෝ භාරදීමෙන් පසු ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරිය යුතුය.

### 7 ප්‍රතිපත්තිය

**උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම**

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.
- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.
- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීයම වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ

පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

### 8 ප්‍රතිපත්තිය

**මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම**

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නියෝගය (Mandate) සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉදුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නියෝගය (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම වෙනමම විගණන පනතක් මගින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තර කිරීමට අවශ්‍ය වේ. එම අවශ්‍යතාවය 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් ලැබී ඇත.

අපගේ සංවිධානය

## දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ 153 හා 154 ව්‍යවස්ථාවන්ට සිදුකළ සංශෝධන

විගණකාධිපතිවරයා විසින් මුහුණ දුන් පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වයේ අඩුපාඩු මඟ හැරීම සඳහා පහත සඳහන් සංශෝධනයන් දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කර ඇත. රාජ්‍ය විගණනය නවීකරණය කරමින් තවදුරටත් ප්‍රතිසංස්කරණයන් විගණන පනතෙහි ඇතුළත් කර ඇත.

- විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.
- විගණකාධිපතිවරයා සභාපතිත්වය දරන විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටවනු ලැබේ. නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙකු අනෙකුත් සාමාජිකයන් වනු ඇත. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයන්ට යටත්ව වර්ෂ 03 ක ස්ථිර කාලපරිච්ඡේදයකට කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරයි.
- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ බඳවාගැනීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන ස්වාධිනත්වය ආරක්ෂා කර ගැනිමට කටයුතු කිරිම
- රජය විසින් රාජ්‍ය සමාගමක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 කට වැඩි හිමිකමක් ඇති රාජ්‍ය සමාගම් සියල්ලේ විගණනය විගණකාධිපතිවරයාගේ විෂයය පථය යටතට ගැනේ.
- විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනිමට ''රාජ්‍ය නිලධාරියා'' යන නිර්වචනයෙන් ඉවත් කරයි.
- විධායකයේ කිසිදු මැදිහත්වීමකින් තොරව විගණකාධිපතිවරයාගේ කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් සපයන බවට සහතික කර ගැනීමට විගණන සේවා කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ජාතික විගණන ආයතනයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් නිශ්චය කිරිම

## 2018 අංක 19 දරන ජාතික විගණන පනත

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහාද, ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත.

ජාතික විගණන පනතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ

කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂයපථය පුළුල් කර තිබීම.

- විගණනය කරනු ලබන ආයතනයකට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණ සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනයා අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් බාරගනු ලබන අතර එය සියලු විගණනයන්ට අදාළ වේ.
- කාර්යසාධන විගණනය, පාරිසරික විගණනය, තාක්ෂණික විගණනය සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවයට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතුය.
- රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආයතනයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වීමෙන් පසු මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු වීම.
- රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.
- අදාළ විගණනය කරනු ලබන ආයතනය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආයතනයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.
- රජයේ මූල්‍ය ප්‍රකාශන රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම.
- විගණනය කරනු ලබන රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන යම්

සමාගම්වලින් ගාස්තුවක් අය කළ යුතුවීම.

- විගණන සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම කොමිෂන් සභාව සතු විය යුතුවීම.
- කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන තැනැත්තන්ගේ වැටුප් සහ වෙනත් දීමනා සහ වෙනත් යම් ප්‍රතිලාභ, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එකී වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතුය.
- සියළුම විගණනය කරනු ලබන ආයතනයන් විසින් විගණකාධිපතිවරයාට සහ ඔහු විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයෙකුට සහයෝගය දැක්විය යුතු අතර ඵලදායි විගණනයක් සිදු කිරීමට පහසුකම් සැලැසීම සඳහා වැඩ කිරීමට අවශ්‍ය සුරක්ෂිත සහ රැකවරණ සහිත පරිසරයක් සකස් කර දිය යුතුය.
- මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කොමිෂන් සභාව විසින් සකස් කළ යුතුය. කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සළසා තිබේ.
- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සළසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.
- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.
- විගණකාධිපතිවරයාගේ මතය පරිදි ගනුදෙනුවක් කවර හෝ නීතියකට, රෙගුලාසියකට හෝ රීතියකට පටහැනිව කර තිබීමෙන් එම ගනුදෙනුවට අදාල වුවන්ගේ වංචාව, නොසැලකිල්ල, දූෂණය හෝ විෂමාචාරය හේතුවෙන් අඩුවක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවකදී හෝ ඇතුළත් කළ යුතු කවර වු හෝ ගනුදෙනුවක් ගිණුම්වලින් අත්හැර තිබෙන අවස්ථාවකදී එවැනි සියලු ගනුදෙනුවල මුල්‍ය හෝ වෙනත් වටිනාකම, ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය. එවැනි ගනුදෙනුවට අදාල මුළු වටිනාකම අධිභාර කිරීමේ බලතල විගණකාධිපතිවරයාට ලබාදෙනු ලැබේ. එකී ගනුදෙනුවේ වටිනාකම එයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් වෙන් වෙන්ව හෝ සාමුහික වන පරිදි අධිභාර කිරීමට විගණකාධිපතිවරයාට හැකිය.
- අධිභාරයන් පැනවීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයෙකුට, එයට එරෙහිව විගණන සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට අයිතිවාසිකම් තිබේ. කොමිෂන් සභාව අවසාන තීරණය ගනු ලැබේ.
- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කිරීම.
- රටේ උත්තරීතර විගණන ආයතනය ලෙස ජාතික විගණන කාර්යාලයක් පිහිටුවනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු විගණන කාර්ය මණ්ඩලය ජාතික විගණන කාර්යාලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- මේ පනත මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නියම කරනු ලැබේ.
- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.
- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.
- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිදු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුත්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

## අපගේ සංවිධාන සටහන

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය හා අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදූම්ලත් ධූරාවලි 5 කින් සමන්විත වේ.

පළමු මට්ටම අතිරේක විගණකාධිපතිවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම තනතුරු මේ වන විට පුරප්පාඩු වී ඇත. දෙවන මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රාජ්‍ය විගණන කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය හා සමස්ථ රාජ්‍ය විගණනය අධීක්ෂණය කිරීම සිදු කරන ලබයි. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ අංශ 44 ක් ස්ථාපිත කර ඇති අතර එම එක් එක් අංශය භාරව සිටින සහකාර විගණකාධිපතිවරු තෙවන මට්ටම නියෝජනය කරනු ලබයි. එම සහකාර විගණකාධිපතිවරුන් යටතේ රජයේ හා පළාත් සභාවල විගණන කටයුතු සිදු කරනු ලැබේ. අංශ ප්‍රධානීන් වෙත පැවරෙන විගණන “ශාඛා” වන්හි ප්‍රධානත්වය “ශාඛා ප්‍රධානී” ලෙස විගණන අධිකාරිවරයෙකු හෝ විගණන පරීක්ෂක සේවයේ ජ්‍යෙෂ්ඨ තම නිලධාරියෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් සිව්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් පස්වන මට්ටමට අයත් වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වේ. ඉහත සඳහන් තෙවන මට්ටමට අයත්වන අංශ 44 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 17 දෙනෙකු පළාත් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල භාරව කටයුතු කරන අතර ඔවුන්ගේ අධික්ෂණයට නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු විසින් ඉටු කරනු ලබයි.

ජාතික විගණන කාර්යාලයේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) යටතේ වන ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී යටතේ ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

මුදල් රෙගුලාසි 133 සඳහන් පරමාර්ථ ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ රාජ්‍ය කළමනාකරණ සහායක නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර, ඔහු සෘජුව විගණකාධිපතිවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ. විගණනය ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධාන සටහන පහත සඳහන් කර ඇත.


Auditor General
Add.AG(CGSE)
DAG (OPE)
AAG- 4
SAs
AEs
DAG(TND)
AAG -4
SAs
AEs
DAG(SIN)
AAG - 1
SAs
AEs
DAG(COM)
AAG - 2
SAs
AEs
DAG(SBE)
AAG - 2
SAs
AE
DAG(SOF)
AAG 2
SAs
AEs
DAG(SPR)
AAG- 3
SAs
AEs
DAG(ADM)
Director (Admin)
AD(Admin)
MAs
Chief Accountant
Accountant
MAs
SAs
AEs
Add.AG(CGMD)
DAG(INC)
AAG -3
SAs
AEs
DAG(MDP)
AAG- 1
SAs
AEs
DAG(FFP)
AAG-1
SAs
AEs
DAG(CGL)
AAG -11
SAs
AEs
Add.AG(PZIA)
DAG(WNS)
AAG - 4
SAs
AEs
DAG(NNE)
AAG - 3
SAs
AEs
DAG(UCS)
AAG- 3
SAs
AEs
CIA
MAs

ජාතික විගණන කාර්යාලයේ වගකීම හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2011 නොවැම්බර් 14 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 350 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 1200 ක්ද වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන සේවා කොමිෂන් සභාව 2018 ජූලි 27 දින ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමත්, 2018 අගෝස්තු 01 දින අතිගරු ජනාධිපතිතුමා විසින් ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයකින් ජාතික විගණන පනත බලාත්මක කර තිබුණි. නමුත් ජාතික විගණන කාර්යාලයේ රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට කෙටුම්පත් කර ඇති සේවා ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට 2020 අගෝස්තු 31 දින වන විටත් නොහැකි වී තිබුණු අතර ඇති වන පුරප්පාඩු පිරවීමට පැරණි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවටද කටයුතු කිරීමට නොහැකි වී ඇත.

එම තත්ත්වය යටතේ 2019 වර්ෂය ආරම්භයේ, 2019 වර්ෂය අවසානයට හා 2020 ජූනි 30 දිනට ජාතික විගණන කාර්යාලයේ ඒ ඒ තනතුරුවල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුව 01 හි දැක්වේ.

| තනතුර | 2019 ජනවාරි 01දිනට | | | 2019 දෙසැම්බර් 31දිනට | | | 2020 ජූනි 30 දිනට | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
| විගණන කාර්ය මණ්ඩලය | | | | | | | | | |
| අතිරේක විගණකාධිපති | 03 | 01 | 02 | 03 | - | 03 | 03 | - | 03 |
| නියෝජ්‍ය විගණකාධිපති | 15 | 11 | 04 | 15 | 11 | 04 | 15 | 10 | 05 |
| සහකාර විගණකාධිපති | 44 | 32 | 12 | 44 | 26 | 18 | 44 | 23 | 21 |
| විගණන අධිකාරි | 288 | 212 | 76 | 288 | 205 | 83 | 288 | 202 | 86 |
| විගණන පරීක්ෂක | 1200 | 1102 | 98 | 1200 | 1013 | 187 | 1200 | 999 | 201 |
| විගණන නොවන කාර්ය මණ්ඩලය | | | | | | | | | |
| අධ්‍යක්ෂ -පරිපාලන | 01 | 01 | - | 01 | 01 | - | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරි | 01 | 01 | - | 01 | 01 | - | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | - | - | - | - | - | 01 | 01 | - |
| අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් | 17 | 11 | 06 | 17 | 11 | 06 | 17 | 12 | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහයක සේවාව හා සමාන්තර ශ්‍රේණි | 127 | 115 | 12 | 127 | 113 | 14 | 127 | 114 | 13 |
| වාර්තා සැකැසුම්කරු | 42 | 42 | - | 41 | 41 | - | 41 | 41 | - |
| කණිෂ්ඨ සේවකයින් | 213 | 185 | 28 | 213 | 201 | 12 | 213 | 196 | 17 |
| එකතුව | 1951 | 1713 | 238 | 1950 | 1623 | 327 | 1951 | 1600 | 351 |

වගුව 01 - කාර්ය මණ් ඩල තත්ත්වය 2019 දෙසැම්බර් 31 දිනට හා 2020 ජූනි 30 දිනට

ඉහත වගුවේ සඳහන් පරිදි 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ 238 දෙනෙකුගේ සිට 327 දෙනෙකු දක්වා පරාසයක ප්‍රමාණයක කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම ජාතික විගණන කාර්යාලය වෙත පැවරි ඇති වගකීම් හා කාර්යභාරය ඉටු කිරිම කෙරෙහි විශාල බාධාවක්ව පැවැතුණි. එසේම 2020 ජූනි 30 දින වන විට එම පුරප්පාඩු සංඛ්‍යාව 351 ක් දක්වා වැඩි වී තිබුණි.

## සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීම

ජාතික විගණන කාර්යාලයේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව එවකට හිටපු විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන්, හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර “ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය” නමින් නව සේවයක් ඇති කිරිම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ “ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය” පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කෙරෙමින් පවතින අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්මතවීමෙන් පසු විගණන සේවා කොමිෂන් සභාව විසින් එය අනුමත කර ගැනිමේ කාර්යයෙහි නියැලී ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේම, නව සේවාවේ පත්වීම් හා විනය බලධාරියා විගණන සේවා කොමිෂන් සභාව බැවින් ප්‍රමාදයකින් තොරව එම කටයුතු ඉටු කිරීමට හැකිවීම ජාතික විගණන කාර්යාලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට පිටිවහලක් වනු ඇත. විගණන පනත ක්‍රියාත්මක වී වර්ෂ දෙකක පමණ කාලයක් ගතවී තිබුණත්, 2020 අගෝස්තු 31 දින වන විටත් එම සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට නොහැකි වී ඇත.

### කාර්ය මණ්ඩල පුහුණුව

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතනවල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන්දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.
මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1,277 ක් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 355 කින් සමන්විත කාර්ය මණ්ඩලයක

දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

ඒ සඳහා ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි එහි කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කරන අතර, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය සහ දිරිගැන්වීමත් එම අංශය විසින් ලබාදෙනු ලැබේ. එහිදී සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන් සම්බන්ධ කර ගන්නා අතර ඊට අමතරව බාහිර දේශකවරුන්ගේ සහයද ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදී ක්‍රමයන්ද යොදා ගන්නා අතර පුහුණුව තුළින් පහත අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- නිලධාරීන්ගේ දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- නිලධාරීන්ගේ කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- නිලධාරීන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම

### දේශීය වශයෙන් පුහුණුව ලබා දීම

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2019 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සියළුම විගණන නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාතෘකා 10 ක් යටතේ පුහුණු වැඩසටහන් 51 ක් පවත්වා ඇති අතර විගණන නොවන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබේ.

### විදේශීය පුහුණුවීම්

සියළුම විගණන නිලධාරීන් සඳහා කාර්යසාධන විගණනය පිළිබඳව විදේශ පුහුණුව ලබාදීමේ අරමුණින් ආරම්භ කරන ලද මැලේසියානු කාර්යසාධන විගණන පුහුණු වැඩමුළුව සඳහා සමාලෝචිත වර්ෂයේදී ද නිලධාරීන් 229 ක් සහභාගී කරවා ඇති අතර වෙනත් මාතෘකා 6 ක් ආවරණය වන පරිදි විගණන නිලධාරීන් 29 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් හා වැඩමුළු 22 කට සහභාගී කර ඇත.

සමාලෝචිත වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශයක් වගුව 02 හි දක්වා ඇත.

| | වැඩසටහන් විස්තරය | වැඩසටහන් ගණන | සහභාගී වූ නිලධාරීන් | | | | පුහුණු පැය ගණන |
|---|---|---|---|---|---|---|---|
| | | | අංශ ප්‍රධානීන් | විගණන අධිකාරී | විගණන පරීක්ෂක | එකතුව | |
| දේශීය පුහුණුවැඩසටහන් | | | | | | | |
| 1 | මූල්‍ය විගණන පුහුණුව | 21 | 40 | 160 | 706 | 906 | 7,111 |
| 2 | කාර්යසාධන විගණන පුහුණුව | 9 | 29 | 213 | 908 | 1,150 | 14,072 |
| 3 | ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් විගණනය | 3 | | 4 | 18 | 22 | 189 |
| 4 | වෝහාරික විගණනය | 5 | 40 | 27 | 136 | 203 | 5,191 |
| 5 | පරිගණක පිළිබඳ පුහුණුව | 1 | | | 28 | 28 | 609 |
| 6 | බදුකරණය පිළිබඳ පුහුණුව | 3 | | 9 | 237 | 246 | 3,507 |
| 7 | ධනාත්මක චින්තන සංවර්ධන සඳහා වන වැඩමුළු | 5 | 40 | 221 | 1,028 | 1,289 | 17,830 |
| 8 | සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ | 1 | 4 | 6 | 31 | 41 | 892 |
| 9 | වාර්තාකරණ පුහුණු වැඩසටහන් | 1 | 9 | 94 | 162 | 265 | 1,921 |
| 10 | සම්පත් දායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් | 2 | 8 | 43 | 25 | 76 | 2,030 |
| | එකතුව | 51 | | | | 4,516 | 53,352 |
| | විදේශීය පුහුණු වැඩසටහන් | | | | | | |
| 1 | කාර්යසාධන විගණනය | 4 | 1 | 3 | 226 | 230 | 20,010 |
| 2 | මූල්‍ය වංචා සහ අපරාධ විමර්ශනය | 1 | 1 | 3 | 3 | 7 | 305 |
| 3 | පොදු ඉදිකිරීම් කටයුතු පිළිබඳ රජයේ විගණනය JICA | 1 | | 2 | | 2 | 363 |
| 4 | තොරතුරු තාක්ෂණ විගණන පුහුණුව | 1 | | | 1 | 1 | 87 |
| 5 | රාජ්‍ය විගණන කළමණාකරනය | 1 | | 3 | | 3 | 457 |
| 6 | ASSOSAI/ SAI පුහුණු වැඩසටහන් සහ වෙනත් රැස්වීම් | | | | | | |
| 6.1 | International Workshop on Audit of Waste Management - India | 1 | | | 1 | 1 | 73 |
| 6.2 | 13thBAI seminar on IT Audit - Korea | 1 | | 1 | | 1 | 51 |
| 6.3 | Audit of Financial Statements of CIRDAP for the 19th Biennium - Bangladesh | 1 | 1 | | 1 | 2 | 174 |
| 6.4 | 19th INTOSAI WEGA Meeting - Thailand | 1 | | | 1 | 1 | 44 |
| 6.5 | SAI Leadership and Stakeholders Meeting | 1 | 1 | | 1 | 2 | 87 |
| 6.6 | Asian Evaluation Week | 1 | 1 | | | 1 | 44 |
| 6.7 | Seminar on enhancing work comprehensive for Young Officials | 1 | | 1 | | 1 | 167 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6.8 | IFAD Financial Management Meeting | 1 | | | 1 | 1 | 29 |
| 6.9 | Seminar on Belt & Road Countries Risk Management Capacity Improvement | 1 | 1 | | | 1 | 94 |
| 6.10 | Seminar on China's Development Experience | 1 | | 1 | | 1 | 218 |
| 6.11 | IPSASB Round Table and Capacity Building Forum | 1 | 2 | | | 2 | 102 |
| 6.12 | Regional Public Financial Management Forum - Bangladesh | 1 | | 1 | | | 29 |
| 7 | පශ්චාත් උපාධි | 1 | | 1 | | 1 | |
| | එකතුව | 23 | | | | 258 | 21,330 |

වගුව 02 – දේශීය හා විදේශීය වශයෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන්

මූලාශ්‍රය – ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය

## පරිගණක ගත දත්ත පද්ධතියක් හඳුන්වා දීම

නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගැනීම, පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, එක් එක් නිලධාරීන් සඳහා වෙන් වෙන් වශයෙන් පුහුණු වාර්තා පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සඳහා පරිගණක ගත දත්ත පද්ධතියක් (Computerized Data System) 2019 වර්ෂයේ සිට පුහුණු අංශය විසින් පවත්වා ගෙන යනු ලබයි.

## බාහිර ආයතන සඳහා සම්පත්දායකත්වය ලබාදීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 39 දෙනෙකු විසින් 2019 වර්ෂයේදී වගුව 03 හි දක්වා ඇති ක්ෂේත්‍ර යටතේ වෙනත් රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු නිලධාරීන්ගේ විගණනය හා සමගාමී ක්ෂේත්‍රයන්හි දැනුම හා හැකියාවන් වර්ධනය සඳහා තම සම්පත්දායකත්වය ලබා දීමට කටයුතු කර තිබේ. විස්තර වගුව 03 හි දැක්වේ.

| ක්ෂේත්‍රය /වැඩසටහන් විස්තරය | ආයතන ගණන | වැඩසටහන් ගණන |
|---|---|---|
| නව විගණන පනත පිළිබඳ දැනුවත් කිරීම | 93 | 93 |
| මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 1 | 1 |
| විගණනය හා කළමනාකරණය | 1 | 1 |
| ප්‍රසම්පාදනය හා ගබඩාකරණය | 1 | 1 |
| විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන් | 3 | 6 |
| ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහන් | 1 | 1 |
| රාජ්‍ය මූල්‍ය කළමණාකරණය හා රාජ්‍ය මූල්‍ය වගවීම | 2 | 2 |
| සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වල විගණන භාවිතාව | 1 | 1 |
| එකතුව | 103 | 106 |

වගුව 03-සත්දායකත්වය භාහිර ආයතන වෙත ලබාදීම

මූලාශ්‍රය – ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය











## සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

විගණන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වන සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

ඒ අනුව සේවයේ යොදවන ලද විගණන සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවාව වෙනුවෙන් 2019 හා 2018 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 42.64 ක් හා රු.මිලියන 33.85 ක් ගෙවා ඇත. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ

සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදි සාධක සලකා බලන ලදී. ඊට අමතරව, විගණන සමාගමට ඇති ජාත්‍යන්තර සම්බන්ධතාවය හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල ස්වභාවය යනාදි කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට ඇතුළත් වී තිබුණි. ඒ අනුව විගණනකවරුන් තෝරා ගැනීම පුසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කළ අතර සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛන්ඩව එක් විගණන කාර්යභාරයක් පවරන ලදී.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් 150 කින් සමාගම් 23 ක් විගණනය කිරීම සඳහා පමණක් ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් 04 ක් මට සහය විය. ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව සහ ක්‍රීඩා සංගම් 60 ක් විගණනය කිරීම සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් 20 කගේ සහය ලබා ගන්නා ලදී.

## පාර්ලිමේන්තුවට සහාය වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය පිළිබඳ ප්‍රධාන දායකත්වයක් සලසන ජාතික විගණන කාර්යාලය විසින්, මූල්‍ය භාරකාරත්වය හා රාජ්‍ය ආයතනවල මෙහෙයුම් හි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ ඍජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන රජයේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හා 120 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තුවේ කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ. මෙම කාරක සභා දෙකෙහි කාර්ය භාරය වනුයේ රාජ්‍ය ගිණුම් පරීක්ෂා කිරීම මඟින් රාජ්‍ය අරමුදල් හා සම්පත් නිසියාකාරව භාවිත කෙරේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ව්‍යවස්ථාදායකයට සහාය වීමයි. එබැවින් රාජ්‍ය අංශයේ ගණන්දීමේ වගකීම හා ඵලදායී පාලනය තහවුරු කර ගැනීම සඳහා ඉතා වැදගත් කාර්ය භාරයක් මෙම කමිටු දෙක මඟින් සිදු කරනු ලැබේ.

ස්ථාවර නියෝග 119 යටතේ පිහිටුවන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්ය වනුයේ මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්යසාධනය සහ කළමණාකරනය පරීක්ෂා කිරීම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථා, මුළුමණින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවැරීමක් සම්බන්ධව

පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහය ඇතිව පරීක්ෂා කිරීම වේ. යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවැරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටිය, කාර්යසාධනය හා සාමාන්‍ය කළමනාකරණය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකු බැගින් වන පරදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයින් විසින් විශේෂයෙන් විගණනයන් සඳහා සෘජුවම සම්බන්ධ නිලධාරීන් සමඟ කමිටුවලට සහාය වේ. සමාලෝචිත කරුණු පිළිබඳව අවශ්‍ය සියලු තොරතුරු හා මතයන් ප්‍රකාශ කරමින් කමිටුවල කටයුතුවලට සහාය වීම තුළින් විගණකාධිපතිවරයා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

විගණකාධිපතිවරයාගේ කාර්යභාරය වනුයේ පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳ අදාළ අදහස් දැක්වීම මඟින් කමිටුවට සහාය වීමයි. කාරක සභා පරීක්ෂාවේ දී තොරතුරු ලබා දීම හා කමිටුවට අදහස් දැක්වීම හා කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට පිළිතුරු දැක්වීම ද විගණකාධිපතිවරයාගෙන් අපේක්ෂා කෙරේ. ඇසිය හැකි ප්‍රශ්න කිරීම් පිළිබඳ ක්‍රියාපරිපාටියක් හෝ කිසියම් සාකච්ඡා කළ යුතු ගැටළු පිළිබඳ පසුබිම් තොරතුරු විගණකාධිපතිවරයා යෝජනා කරයි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කරගෙන අදාළ රාජ්‍ය ආයතනයේ මෙහෙයුම් පිළිබඳ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කාරක සභාව විසින් ලබා දේ. විගණිත ආයතනය විසින් යාවත්කාලීන ප්‍රගති වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා කෙටි සාකච්ඡා සටහනක් පිළියෙල කිරීම සඳහා

විගණකාධිපතිවරයාට හැකිවන පරිදි ප්‍රතිචාරයක් ලිඛිතව විගණිත ආයතනය විසින් පිළියෙල කළ යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිර්දේශ විගණිත ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරුවල සාධාරණ බව තහවුරු කර ගැනීම සඳහා විගණිත ආයතනයේ සියලු ලිඛිත ප්‍රතිචාර ජාතික විගණන කාර්යාලය විසින් සමාලෝචනය කෙරේ. සමාලෝචනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී හෝ පාලක මණ්ඩලය විසින් සිදු කරන අදහස් දැක්වීම් හා නිරීක්ෂණ සැලකිල්ලට ගෙන විගණන වාර්තාව මගින් පාර්ලිමේන්තුවට වාර්තා කරන ලද වැදගත් විගණන නිරීක්ෂණ පිළිබඳව කෙටි සාකච්ඡා සටහනක් ජාතික විගණන කාර්යාලය විසින් පිළියෙල කරනු ලබයි. එබැවින් කමිටු සාමාජිකයන්ට එම විගණන නිරීක්ෂණ මගින් විගණිත ආයතනයේ වර්තමාන තත්ත්වය පිළිබඳ මැනවින් අවබෝධයක් ලබා දේ. තවද, පෙර පවත්වන ලද රැස්වීම්වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනයත් එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ.
2019 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 20 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභාවාර 32 ක්, කාර්යසාධන සහ විශේෂ විගණන වාර්තා සම්බන්ධයෙන් ආයතන 09 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභාවාර 11 ක් පවත්වා ඇති අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 31 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභා වාර 37 ක් පවත්වා ඇත.

විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට සහාය වී ඇත. එක් එක් හා සියලු ආයතන විසින් තම නිරවද්‍යතාවය තහවුරු කිරීම් සඳහා දෙන ලද පිළිතුරුවල වලංගුභාවය තහවුරු කිරීම මගින් විගණන නිලධාරීන් තවදුරටත් කමිටුවට සහාය වේ.

## විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර, මහා නගර සභා 24 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් විය. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත, අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥා පනත් සහ පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු සහා ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපති වෙත බලය පවරා ඇත.

එකී බලය අනුව 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 10 ක කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතනවල පාර්ශවකරුවන් 529 ක් වෙත රු.මිලියන 32.73 ක අධිභාර සහතික 82 ක් නිකුත් කර තිබුණි. එහෙත් 2020 ජුනි 30 දින වන විට ඉන් රු.මිලියන 6.11 ක් හෙවත් සියයට 18.67 ක් පමණක් අයකර තිබුණි. අදාළ බලධාරීන් විසින් අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොතිබුණි.

# විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය

## විෂයයන්

- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය

## නිරීක්ෂණ

- කලා විෂය ධාරාව යටතේ අධ්‍යාපනයට යොමුවීමේ ප්‍රවණතාවය හා කලා උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය
- ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක බස්නාහිර පළාතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන්වල කාර්යසාධනය ඇගයීම
- තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ආනයනය, භාවිතය සහ පසුභාවිත කළමනාකරණය
- සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය සහ එහි පාරිසරික බලපෑම
- පළිබෝධනාශක ආනයනය, භාවිතය හා එහි පාරිසරික බලපෑම
- අන්තර් ජාතික රැම්සා තෙත්බිම්

# විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය

රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හා වියදම් ඒකකයක තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්ගේ කටයුතුවල ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑමද ඇගයීමට ලක්කර අදාළ විගණන නිරීක්ෂණ අනුව සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනය මගින් සිදු කරනු ලැබේ.

රාජ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෙනත් විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා, මෙම කාර්යසාධන හා පරිසර විගණන ඒකකය මගින් තෝරා ගනු ලබන ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් ඇති විශේෂ ක්ෂේත්‍ර ඔස්සේ කාර්යසාධන හා පරිසර විගණනයන් සිදු කරනු ලැබේ. තවද මූල්‍ය විගණන වාර්තාවන්ට අමතරව ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන්ද පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රයට අදාළ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් පුහුණු කිරීමද සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා එක් එක් ආයතනය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) නිශ්චය කිරීම ඉතා වැදගත් වන නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්යඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර කාර්යසාධන දර්ශක නිශ්චය කර ඇතත් කාර්යඵල මැනීමක් සිදු නොකෙරේ. මේ හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව කාර්යසාධන දර්ශක අප විසින් නිශ්චය කර කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද කාර්යසාධන විගණනවලදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

## කලා විෂය ධාරාව යටතේ අධ්‍යාපනයට යොමුවීමේ ප්‍රවණතාවය හා කලා උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය

වර්තමානය වන විට ශ්‍රී ලංකා ජනගහනය මිලියන 21.3 ක් පමණ වන අතර එම ජනගහනයෙන් මිලියන 8.31 ක් පමණ සේවා නියුක්තියක් වාර්තා වේ. සමාලෝචිත වර්ෂය වන විට සමස්ථ සේවා වියුක්තිය ආසන්න වශයෙන් 362,999 ක් පමණ වී තිබුණි. මෙම රැකියා විරහිත අය අතුරින් සියයට 38.4 ක් වර්ෂයකට අධික කාලයක් සුදුසු රැකියාවක් සොයමින් සිටින අය බව සමීක්ෂණ දත්ත අනුව වාර්තා වී ඇත. මින් වැඩි ප්‍රතිශතයක් කලා විෂය ධාරාවෙන් අධ්‍යාපනය ලැබූ උපාධිධාරීන් වේ.

දිනෙන් දින විවිධ මාධ්‍ය මගින් නිරූපනය කරන ආකාරයට ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවයෙන් පෙළෙන උපාධිධාරීන් විශේෂයෙන් කලා උපාධිධාරීන් මෙන්ම උසස් පෙළ කලා විෂයධාරාවෙන් අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබූ සිසුන්ගේ සේවා වියුක්තිභාවය ගැටළුකාරී වී ඇති බැවින් ඒ පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදි.

ලොව සියළු සමාජ තලවල කලාව අනිවාර්යයෙන්ම පැවතිය යුත්තකි. එය මානව සමාජයේ යහපැවැත්ම උදෙසා අත්‍යාවශ්‍ය අංගයකි. ඒ අනුව පාසල් මට්ටමින්, විශ්වවිද්‍යාල මට්ටමින් සෞන්දර්යයවාදී චින්තනයක් සහිත මිනිසුන් බිහිකිරීමට පොදුවේ කලාවිෂය ධාරාව ඉමහත් මෙහෙයක් සිදුකරන බව අවිවාදිතය. නමුත් ආර්ථික වර්ධන වේගය සියයට 2.7 ක් තරම් පහළ අගයක සිටින හා ශ්‍රම බලකායෙන් සියයට 4.3 ක් සේවා වියුක්තව සිටින ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක අධ්‍යාපනය ආර්ථික සංවර්ධනය කරා යොමුවීමේදී මෙන්ම අධ්‍යාපනය හා රැකියා නියුක්තිය අතර නොගැලපීම ද අවම කළ යුතුය.

මෙම කාර්යසාධන විගණනයේදී අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණ අතර ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සඳහා කාලීනව සංශෝධනය වූ අධ්‍යාපන ප්‍රතිපත්තීන් නොමැතිව ඉගැන්වීමේ කාර්යයන් සිදුකෙරෙන බවත්, පාසල් මට්ටමේ පවතින මානව හා භෞතික පහසුකම්වල විෂමතා මත වැඩි සිසුන් පිරිසක් උසස් පෙළ සඳහා කලා විෂය ධාරාව තෝරාගන්නා බවත්, විශේෂයෙන් සිසුන්ට තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමට බාධාවන් පවතින බවත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගත්කල ඒවායේද කලා උපාධි පාඨමාලා කාලීනව සංශෝධනය වී නොමැති බවත්, ඉංග්‍රීසි භාෂා හා තොරතුරු තාක්ෂණමය දැනුම හා මෘදු කුසලතා වර්ධනය කර ගැනීම පිණිස පවතින ඉඩ ප්‍රස්ථා අවම බවත් නිරීක්ෂණය විය.

රටේ මිනිස් බල සැලැසුම් ප්‍රතිපත්තියක් 2018 වර්ෂයේදී සංශෝධනය කර තිබුණද, එය ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතන දෙකක් හරහා සිදුකිරීමට අපේක්ෂිත වූ නමුත් ඒ එකදු ආයතනයකින්වත් පවතින රැකියා ගැටළු හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක වී නොතිබුණි.

මෙවැනි තත්ත්වයකදී 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ උපාධිය සමත් වී ඇති උපාධිධාරීන් 54,824 දෙනෙක් 2018 ජූනි 30 දින වන විට රැකියා විරහිතව සිටි අතර, 2019 සැප්තැම්බර් 18 දින වන විට අදියර 03 ක් යටතේ 19,920 දෙනෙක් (එනම් සියයට 36 ක්) සඳහා පමණක් අභ්‍යාසලාභී උපාධිධාරීන් ලෙස පත්වීම් ලබාදීමට මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් පියවර ගෙන තිබුණි.

ඉහත ගැටළු අවමකර රටේ සේවා නියුක්තිභාවය වර්ධනය කිරීම සඳහා පවතින අධ්‍යාපන ප්‍රතිපත්ති වහාම කාලීන සංශෝධනයන්ට ලක් කළ යුතු බවත්, දිවයිනේ පළාත් අතර අධ්‍යාපනයේ පවතින විෂමතා අවම කර සැමට සමාන මානව හා භෞතික අධ්‍යාපනික පහසුකම් ලබාදිය යුතු බවත්, තාක්ෂණවේදය වැනි වෘත්තීය අධ්‍යාපනික කුසලතා වැඩිදියුණු කරගත හැකි විෂයධාරාවන් තුළින් ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කළයුතු බවත්, විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පාඨමාලා හා විෂයන් කාලීනව සංශෝධන විය යුතු බවත්, ඉංග්‍රීසි, තාක්ෂණය, මෘදු කුසලතා යනාදී රැකියා වෙළඳපල කේන්ද්‍රකරගත් අනෙකුත් සුදුසුකම් වර්ධනයට ශිෂ්‍යන්ට පහසුකම් තවදුරටත් වර්ධනය කරදිය යුතු බවත් මෙහිදී විගණන නිර්දේශ ලෙස දක්වා තිබුණි.

### ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය

ශ්‍රී ලංකාවේ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය සමන්විත වන්නේ වර්ෂ 1815 ට පෙර සමයට අයත් ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු සහ වසර සියයකට වඩා පැරණි වූ

ප්‍රමාදයන් හේතුවෙන් ඉලක්ක කළ කාලය තුළ සම්පූර්ණ කර නොතිබීම, හඳුනාගත් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක, පැරණි ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත ආදිය රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාදවීම, මානව ක්‍රියාකාරකම් මගින් සිදු කරන පුරාවස්තු විනාශයන් හේතුවෙන් පුරාවස්තුවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු මතුවී තිබීම, අරමුදල් සම්පාදනය කර ගැනීමේදී පවතින අපහසුතා, සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමේ පැවති ප්‍රමාදවීම්, පුරාවිද්‍යාත්මක සම්පත් කළමනාකරණය සහ පර්යේෂණ සඳහා ඊට ප්‍රවීනතාවයන් හා නිපුණතාවයන් ඇති පළපුරුදු වෘත්තිකයන් හා පුරාවස්තු ආරක්ෂාවට ප්‍රමාණවත් මානව සම්පත සහ අනෙකුත් සම්පත් දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත්ව නොමැතිවීම යන කරුණු ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය.

ඉහත තත්ත්වයන් සඳහා පිළියම් ලෙස පුරාවස්තු ආඥාපනත හා ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම, ජාතික මට්ටමින් පුරාවිද්‍යා ස්ථාන වාර්තා කිරීම සඳහා දීර්ඝකාලීන වැඩසටහනක් සකස් කිරීම, ගවේෂණය, ලේඛනගත කිරීම, ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම, රක්ෂිත කිරීම, කැණීම්, සංරක්ෂණය හා නඩත්තුව යන සෑම කටයුත්තකදීම එම කටයුතු නෛතික රාමුවක් තුළ සිදුවීම හා එම කටයුතු අධීක්ෂණය, මෙහෙයවීම, සමාලෝචනය හා පසුවිපරම යන සෑම කාර්යයක්ම සැලැසුමකට අනුව යාවත්කාලීනව සිදු කිරීම, පුරාවිද්‍යාත්මක සම්පත් කළමනාකරණය සහ පර්යේෂණ සඳහා ඊට ප්‍රවනතාවයක් ඇති පුද්ගලයන් බඳවා ගැනීම හා ඔවුන් අදාළ කාර්යයන්හි නියුක්ත කරවීම යන නිර්දේශ මෙම විගණනයේදී ඉදිරිපත් කර තිබුණි.

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක බස්නාහිර පළාතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන්වල කාර්යසාධනය ඇගයීම

කෘෂිකර්මය හා සම්බන්ධිත පාර්ලිමේන්තු තීරණ ක්‍රියාත්මක කිරීමේ ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය වන අතර, එම අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය මට්ටමින් කෘෂිකර්මාන්තය හා සම්බන්ධිත ප්‍රධාන ආයතනය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වේ. කෘෂිකාර්මික වැඩසටහන් සඳහා මූලික සැපයුම් සේවා ලබාදීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණු අතර, එය වර්තමානයේ 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත මඟින් පාලනය වේ.

බස්නාහිර පළාතේ කුඹුරු පුරන් වීමට බලපාන සාධක හඳුනාගැනීම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පුරන් කුඹුරු නැවත වගා කිරීමට සිදුකරන දායකත්වය හා අදාළ ගැටළුවලට විසඳුම් ලබාදීමේ ක්‍රියාපිළිවෙල ඇගයීම මෙම කාර්යසාධන විගණනයේ අරමුණු විය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පුරන් කුඹුරු නැවත වගා කරවීමට අදාළව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුද සිදුකරනු ලබයි. බස්නාහිර පළාත සලකන විට කුඹුරු පුරන්වීමට මූලිකම ගැටළුව වී ඇත්තේ වාරිමාර්ග හා ජල කළමනාකරණ ගැටළු වන අතර බස්නාහිර පළාතේ ප්‍රතිසංස්කරණය කළ යුතු සුළු වාරිමාර්ග කර්මාන්ත විශාල ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකිය. බස්නාහිර පළාතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර පුරන් කුඹුරු නැවත අස්වැද්දවීම සඳහා කටයුතු කර

2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති සමග ඉලක්ක 78 ක් හා 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති සමග ඉලක්ක 75 ක් තිරසර සංවර්ධන අරමුණු සඳහා වෙන්කර තිබුණි. එසේ වුවද, අදාළ අමාත්‍යාංශ හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඒවා ජාතික වශයෙන් මැනීමක් සිදු කර නොතිබුණි.

රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ක්‍රියාත්මක කළ වැඩසටහන් ඇගයීමේදී වනගහණය 2015 වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබීම, කොළඹ නගරයේ වායු තත්ත්වය ලෝක සෞඛ්‍ය සංවිධාන (WHO) ප්‍රමිත ඉක්මවා යාමට ආසන්න වෙමින් පැවතීම, අලිමිනිස් ගැටුම වර්ධනය වීම, ලෝක කාලගුණ අවදානම් දර්ශකයේ ශ්‍රී ලංකාව දෙවන ස්ථානයට පත්වීම යන කරුණු අනුව පාරිසරික සමතුලිතතාව රැකගැනීමට ශ්‍රී ලංකාවේ සූදානම පිළිබඳ ගැටලු පැන නැගී තිබුණි.

මධ්‍යම පරිසර අධිකාරියේ 2019 වර්ෂයට අදාළ දත්ත අනුව නාගරික ඝන අපද්‍රව්‍ය වලින් සියයට 84 ක් නිසි පරිදි අපහරණයට ලක් නොවීම, ජාතික ප්‍රතිචක්‍රීකරණ අනුපාතය සියයට 5 ක් වීම, ඒක පුද්ගල උපද්‍රවකාරී අපද්‍රව්‍ය ජනනය 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කි.ග්‍රෑම් 9.5 ක සිට කි.ග්‍රෑම් 13 ක් දක්වා වැඩිවීම, පිළියම් කරන උපද්‍රවකාරී අපද්‍රව්‍ය අනුපාතය අඩුවීම, දහනය කරනු ලබන සායනික අපද්‍රව්‍ය ප්‍රතිශතය අඩුවීම, ප්‍රතිචක්‍රීකරණය සඳහා අපනයනය කරන ඉලෙක්ට්‍රොනික් අපනයන ප්‍රතිශතය පමණක් වැඩිවීම යන කාර්යසාධන තොරතුරු නිරීක්ෂණය විය.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අනුව අදාළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධව ඉලක්ක 14 ක් සඳහා දර්ශක සකස් කර තිබුණත්, එම දත්ත මගින් සියලු පාර්ශවයන් නියෝජනය වන ආකාරයට ඉලක්ක 9 ක් සඳහා පමණක් දක්වා තිබුණි.

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන මගින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් ලබා ගැනීම වර්තමාන ක්‍රමෝපාය වී තිබුණි. එහිදී 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් (ණය ගෙවීම් අඩුකර) සියයට 14 ක් හා 2019 වාර්ෂික ඇවැය ඇස්තමේන්තුවේ (ණය ගෙවීම් අඩුකර) සියයට 17 ක් ප්‍රධාන ව්‍යාපෘති හා ඉලක්ක සමග සම්බන්ධ කර තිබුණි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක 169 කින් 46 ක් සඳහා දර්ශක හා පාදක දත්ත සකස් කර තිබුණු අතර ඉලක්ක 29 ක් සඳහා දර්ශක හා පාදක දත්ත සකස් කරමින් පැවැතුණි. අනෙකුත් ආයතන සකස් කළ යුතු දර්ශක 131 ක් සඳහා අදාළ ආයතන සතුව පෞද්ගලික දත්ත පැවතුනත්, ඒවා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග එකඟ වී ජාතික දත්ත පද්ධතියට ඒකාබද්ධ කර නොතිබුණි.

තිරසර සංවර්ධන අරමුණු 17 හි ප්‍රගතිය මහජනතාවට, විධායකයට හා පාර්ලිමේන්තුවට දැනගැනීම සඳහා ක්‍රමවේදයක් 2019 දෙසැම්බර් මාසය වන විටත් සකස් කර නොතිබුණි. 2030 න්‍යාය පත්‍රය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ ආයතන ඔවුන්ගේ විෂයපථයන්ට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු හා උපක්‍රමය පිළියෙල කිරීමට අදාළ තොරතුරු තිරසර සංවර්ධන සභාවට ලබාදීමෙන් තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ දක්වා ඇති කාර්යසාධන දර්ශක (KPI) අදාළ ආයතන සමග සම්බන්ධ වී මැනීමේ ක්‍රමයක් සංවර්ධනය කිරීම, ජාතික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති

සම්පාදනයේදී 2019 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන සෞභාග්‍යයේ දැක්ම තුළ, තිරසර සංවර්ධන ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ නැවත සකස් කිරීම පිළිබඳව තිරසර සංවර්ධන සභාව විසින් නියාමනය කිරීම, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පාරිසරික පැතිකඩ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම, ඉලක්ක සපුරාගැනීම සඳහා සම්පත් ඉල්ලා සිටීමට පහසු වනු පිණිස රාජ්‍ය ආයතනවලට පැහැදිලි ලෙස චක්‍රලේඛ නිකුත් කිරීම, තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාවේ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රජයේ ආයතනවල සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ සමස්ථ ප්‍රගතිය නියාමනය හා ඇගයීමට හැකි ලෙස නියාමන හා ඇගයීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම හා කාලීනව වාර්තා කිරීමේ ක්‍රමයක් සකස් කිරීම හා ඒවා මහජනතාවට හා ඒ සම්බන්ධයෙන් ඇල්මක් දක්වන පාර්ශවයන්ට ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම මෙම විගණනයේදී නිර්දේශ ලෙස ඉදිරිපත් කර තිබුණි.

## ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ආනයනය, භාවිතය සහ පසුභාවිත කළමනාකරණය

“ප්ලාස්ටිකෝස්” (Plastikos) යන ග්‍රීක වචනය ඇසුරින් බිහි වී ඇති ප්ලාස්ටික් යන්නෙහි අරුත “බිඳී යාමකින් තොරව හැඩය වෙනස් කළ හැකිය” යන්නයි. වර්තමාන ලෝකයේ බහුල වශයෙන් භාවිතා වන්නා වූ ප්ලාස්ටික් ප්‍රධාන වශයෙන් කාණ්ඩ 07 ක් යටතේ වර්ගීකරණය සිදු කරනු ලැබේ.

ඝණ, ද්‍රව හා වායුමය වශයෙන් අපද්‍රව්‍ය කාණ්ඩ ඇතුළත් වනසේ සකස් කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තෝබර් 10 දින වනවිට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, 2019 වර්ෂය අවසන් වන විටත් එය ක්‍රියාත්මක තත්ත්වයට පත්ව නොතිබුණි. එසේම මෙම ද්‍රව්‍යවල ඇතුළත් වන ඝණ අපද්‍රව්‍ය අපහරණය සඳහා නියමිත ප්‍රතිපත්තියක් නොතිබීම හා 2016 ඔක්තෝබර් 11 දිනැති අංක 10/2236/704/061 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් විස්තීර්ණ වූ වගකීම් මූලධර්මය බලාත්මක කිරීමේ අවශ්‍යතාවය තහවුරු කර තිබුණත්, 2019 සැප්තැම්බර් 30 දින වන විටත් එය ක්‍රියාත්මක තත්ත්වයට පත් වී නොතිබුණි.

2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 07 ක කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ප්ලාස්ටික් ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 3,353.9 ක් ලෙස වාර්තා වී තිබූ අතර ඒ සඳහා රු.මිලියන 184,300.9 ක් වැය කර තිබුණි. අමුද්‍රව්‍ය, නිමි භාණ්ඩ, ගෘහ භාණ්ඩ සහ සෙල්ලම් බඩු යන ප්‍රධාන ආකාර 04 ක් යටතේ ප්ලාස්ටික් ආනයනය සිදුවන අතර 2018 වර්ෂයේදී මුළු ප්ලාස්ටික් ආනයන ප්‍රමාණයෙන් සියයට 64 ක් ප්ලාස්ටික් අමුද්‍රව්‍ය ලෙසින් ආනයනය කිරීම කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ප්ලාස්ටික් අමුද්‍රව්‍ය ආනයනික වර්ධනය සියයට 3.7 ක් වන අතර ඒ සඳහා සිදු කළ වියදමද සියයට 1.23 කින් වර්ධනය වී තිබුණි.




2014 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී පොලිවයනයිල් ක්ලෝරයිඩ් (PVC) වර්ගයේ ප්ලාස්ටික් ආනයනය සියයට 21.19 කින්ද, පොලිස්ටයරීන් (PS) වර්ගයේ ප්ලාස්ටික් ආනයනය සියයට 44.67 කින්ද, පොලිප්‍රොප්ලීන් (PP) වර්ගයේ ප්ලාස්ටික් ආනයනය සියයට 39.24 කින්ද, විවිධ වර්ගයේ ප්ලාස්ටික් ආනයනය සියයට 160.79 කින්ද, යන ප්‍රමාණවලින් වර්ධනය වී තිබුණි. වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කරන ප්ලාස්ටික් ප්‍රමාණයෙන් ක්‍රමවත්ව ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය සඳහා යොදවන ප්‍රමාණය දළ වශයෙන් සියයට 30 ක් වී තිබුණි.

පසුභාවිත ප්ලාස්ටික් කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන මධ්‍යස්ථාන 100 ක කාර්යසාධන පරික්ෂාවේදී පරිසර ආරක්ෂණ බලපත්‍රයක් රහිතව මධ්‍යස්ථාන 26 ක් පැවති අතර 2019 අගෝස්තු 31 දින වන විට මධ්‍යස්ථාන 28 ක බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා තිබුණි.

නොදිරණ අපද්‍රව්‍ය මඟින් පරිසරයට සිදුවන හානිය අවමකරලීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් සඳහා 2018 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 452.7 ක් ආයෝජනය කර තිබුණි. එම ව්‍යාපෘතියේ කාර්යසාධනය පරික්ෂාවේදී අදාළ පාර්ශවයන් සිය වගකීම් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණි. එසේම පොලිතීන් ප්ලාස්ටික් නිෂ්පාදනය, වෙළඳාම, භාවිතය අවම කිරීමේ පරමාර්ථයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2017 සැප්තැම්බර් 01 දින ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදන 6 ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී නීතිවිරෝධීව කරනු ලබන ප්ලාස්ටික්

නිෂ්පාදනය නියාමනය නොවීම, ප්ලාස්ටික් එළිමහනේදී පිළිස්සීම සම්බන්ධව පළාත් පාලන ආයතන මගින් ජනතාව දැනුවත් නොකිරීම හා අවශ්‍ය උපකරණ ප්‍රමාණවත් පරිදි නොමැතිවීම යනාදිය නිරීක්ෂණය විය.

ප්ලාස්ටික් පොලිතීන් සම්බන්ධ වර්තමානයේ ක්‍රියාත්මක නෛතිකමය තත්ත්වය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය සංශෝධනයන් මගින් ප්ලාස්ටික් පොලිතීන් ආනයනය, නිෂ්පාදනය ,වෙළඳාම, භාවිතය අවම කිරීම සහ පසුභාවිත කළමනාකරණය සඳහා කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් බව නිරීක්ෂණය විය. ප්ලාස්ටික් පොලිතීන් ආනයනය හා රටතුළ නිෂ්පාදනය අධෛර්යමත් කිරීමත් වර්තමානයේදී රටතුළ පවතින ප්ලාස්ටික් පොලිතීන් භාවිතය අවම කිරීමත්, පසුභාවිත කළමනාකරණ ක්‍රමවේදයන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමත් හා පසු භාවිත කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඒ සඳහා වූ වෙළඳපල නිර්මාණය තවදුරටත් ශක්තිමත් කිරීමත් සිදු විය යුතුව තිබුණි.

පාරිභෝගිකයන් භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදී බහාලුම් ලෙස ලබා දෙන සිලි සිලි බෑග් ඇතුළු වැඩි ඝනත්වයෙන් යුත් පොලිතීන් මළු නිෂ්පාදනය විකිණීම හා භාවිතය තහනම් වන අතර පරිසර හිතකාමී ඇසුරුම් පාරිභෝගිකයන්ට ලබා දීම අරමුණු කරගනිමින් 2016 ජූනි 02 දිනැති අංක 16/1702/704/45 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටිකාලීන ක්‍රියාකාරකම් පිළියෙල වුවද, අපේක්ෂිත පරිදි එම අරමුණු ඉටුවී නොතිබුණි.









ප්ලාස්ටික්/පොලිතින් අපහරණය

2016 – 2018 පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ වූ භාවිතයෙන් පසු ඉවතලන පළිබෝධනාශක ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ජාතික ව්‍යාපෘතිය 2019 සැප්තැම්බර් 30 දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

සාගර සංරක්ෂණ ආයතනය (Coastal Conservancy) මගින් ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන (International Coastal Cleanup) අනුව 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ කිලෝමීටර් 318 ක ප්‍රමාණයක් ඇතුළත බීම බෝතල් 150,242 ක් , ආහාර දැවටුම් 100,875 ක් , බීම බට (ස්ට්‍රෝස්) 80,483 ක්, බෝතල් පියන් 74,183 ක්, ප්ලාස්ටික් බෑග් 64,646 ක් හා සිගරට් බඩ්ස් 56,154 ක් එකතු වී තිබුණි. ඒ අනුව ප්ලාස්ටික භාවිතය නියාමනය සම්බන්ධයෙන් හඳුන්වා දී තිබුණු නෛතික ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරිම මගින් ප්ලාස්ටික් භාවිතය හේතුවෙන් ඇති වී ඇති පරිහානිය අවම කිරිම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

### සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය සහ එහි පාරිසරික බලපෑම

රෝහල්වල දෛනික කටයුතු මගින් බැහැර කරන සායනික අපද්‍රව්‍ය මූලික වශයෙන් පාරිසරිකව හානිකර හා හානිකර නොවන ලෙස වර්ග කළ හැකිය. මෙයින් පාරිසරික වශයෙන් හානිකර අපද්‍රව්‍ය අනෙකුත් සාමාන්‍ය අපද්‍රව්‍යවලින් වෙන්කර හඳුනාගැනීම, ඒවා ක්‍රමවත්ව හා ආරක්ෂිතව අපහරණය කිරීම සිදු විය යුතුය.

සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව ශ්‍රී ලංකාවට ජාතික ප්‍රතිපත්තියක් 2001 වර්ෂයේදී කෙටුම්පත් කර තිබුණු අතර එය 2018 වර්ෂය වන විටත් අනුමත වී නොතිබුණි. තවද රෝහල් අපද්‍රව්‍ය කළමනාකරණය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම, වුවමනාව හා අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි පැවතීම මෙන්ම එම කාර්යය ඇගයීම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයට අනුව රෝහල් අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් හඳුන්වා දී තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍රය හා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබා ගත යුතුව තිබුණි. එම අවශ්‍යතාවයට අනුව පෞද්ගලික රෝහල්ද ඇතුළුව රෝහල් හා වෛද්‍ය ආයතන 328 කින් 181 ක් පමණක් පරිසර ආරක්ෂා බලපත්‍ර ලබා ගැනීමට පහසුකම් ලබා තිබුණි. එය මුළු ලියාපදිංචි වෛද්‍ය ආයතන සංඛ්‍යාව වූ 1,521 කින් සියයට 12 ක් පමණක් වූ අතර පරිසර ආරක්ෂා බලපත්‍ර ලබාගෙන තිබූ අනෙක් ආයතනවලින් සියයට 3 ක් පමණක් උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගෙන තිබුණි.

සෞඛ්‍ය හා පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් 2006 මාර්තු 21 දිනැති අංක 01-12/2006 දරන පොදු චක්‍ර ලේඛය සහ ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවී විද්‍යාර්ථයින්ගේ විද්‍යාලයේ අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සායනික අපද්‍රව්‍ය ජනනය වන අවස්ථාවේදීම වර්ණාවලිය අනුව වර්ග කිරීම (Segregation) ඉතා වැදගත් වේ. බොහෝ රෝහල් සායනික අපද්‍රව්‍ය ජනනයේදී වෙන්කිරීම (Seperate) සඳහා ක්‍රමවේද සකස් කර තිබුණද, ඊට අවශ්‍ය භෞතික සම්පත් අදාළ වර්ණ මාලාවන් අනුව ලබාදී නොතිබුණු බැවින් නියැදි පරීක්ෂණයට භාජනය වූ රෝහල් රැසක්ම ඒ අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විශේෂිත වූ පොලිතීන් කවර ප්‍රමිතියට සම්මත නොවූ බව ජාතික

රෝහල් ඇතුළු රෝහල් කිහිපයකින් නිරීක්ෂණය විය. තවද මෙම අපද්‍රව්‍ය ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, අපද්‍රව්‍ය නිසි පරිදි අපහරණය කිරීම ඇතුළු කටයුතු සඳහා අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයෙන් උපදෙස් ලබා දී තිබුණත්, ඒ අනුව කටයුතු නොකළ රෝහල්ද පැවැති බව නියැදි පරීක්ෂාවෙන් අනාවරණය විය.

රෝහල් භූමියේ පිලිස්සීමෙන්, රෝහල් භූමියේ ඇති භෂ්මක මගින් අඩු උෂ්ණත්වයෙන් දහනය කිරීමෙන් හා රෝහල් පරිශ්‍රයේම වැළලීමෙන් සායනික අපද්‍රව්‍ය අනාරක්ෂිත අයුරින් බැහැර කර තිබුණි. එසේම භෂ්මීකරණයෙන් හා ව්‍යවච්ඡේදනයෙන් පසු ඉතිරිවන අළු හා මඩිති ආරක්ෂිත බිම් පිරවුමක් වෙත යොමු කිරීම වෙනුවට විවෘත භූමිය තුළම, පරිසර හිතකාමී නොවන ආකාරයෙන් වළ දැමීම, සාමාන්‍ය අපද්‍රව්‍ය ඉවත් කරන ආකාරයට මෙම අපද්‍රව්‍යයද ඉවත් කිරීම හෝ එකතුකර තබා ගැනීම සිදු කර තිබුණි. ත්‍රිකුණාමලය, තිස්සමහාරාමය, පොලොන්නරුව, කතරගම යන නගරවල ස්ථාපිත සමස්ථ රෝහල් නියැදි පරීක්ෂාවට භාජනය වූ අතර එම රෝහල්වල ඉහත කී අඩුපාඩු නිරීක්ෂණය විය.

සායනික අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා රජය විසින් පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, අධිකරණමය නියෝගයක් හේතුවෙන් 2018 ඔක්තෝබර් 30 දින සිට මෙහි මෙහෙයුම් කටයුතු නවතා තිබුණි.

ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික රෝහල්වල ජනනය වන සායනික අපද්‍රව්‍ය මධ්‍යගත පද්ධතියක් මගින් ප්‍රතිකාර කර පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ අරමුණින් යුක්තව 2014 ජනවාරි 02 දින ප්‍රධාන පාර්ශවකරුවන් තිදෙනෙකු යටතේ ගිවිසුම් ගත ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ගිවිසුමේ පළමු පාර්ශවය සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දෙවන පාර්ශවය මධ්‍යම පරිසර අධිකාරියෙන් තෙවන පාර්ශවය ලෙස පෞද්ගලික ආයතනය සම්බන්ධ වී තිබුණ අතර මෙම ගිවිසුම මගින් සේවා සැපයීමේ කාලය නියමු ව්‍යාපෘතියක් ආකාරයෙන් වර්ෂ 05 ක කාලයක් සඳහා විය. මෙම ගිවිසුම මගින් රේඛීය අමාත්‍යාංශය හා සම්බන්ධිත සියලුම රජයේ රෝහල් හා පළාත් රෝහල් සහ පළාත් පාලන ආයතන යටතේ ආවරණය වන රෝහල් මගින් ජනනය වන සායනික අපද්‍රව්‍ය ප්‍රතිකාර කිරීමට යොමු කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම ආයතනය විසින් එකතු කර ප්‍රතිකාර නොකරන ලද රෝහල් පරිශ්‍රවල ගබඩා කර තිබුණු සායනික අපද්‍රව්‍යවල මුළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 252,764 ක් සහ දළ වශයෙන් කන්ටේනර් 21 ක ප්‍රමාණයක් වී තිබුණි.

රෝහල් අපද්‍රව්‍ය ප්‍රතිකර්මය සඳහා එ.ජ.ඩොලර් මිලියන 13.76 ක ණය මුදලක් ශ්‍රී ලංකා රජයට ප්‍රධානය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය හා රක්ෂණ සංස්ථාව (EFIC) හා ශ්‍රී ලංකා රජය අතර 2015 දෙසැම්බර් 07 දින ගිවිසුම් ගත වී තිබුණි. මෙමගින් ශ්‍රී ලංකාවේ තෝරාගත් පළාත් 06 කින් රෝහල් 20 ක් යටතේ වර්ග කර හඳුනාගෙන තිබුණු අතර එහිදී ඉන් රෝහල් 05 ක් සඳහා භෂ්මකයන්ද ඇතුළුව හඳුනාගත් රෝහල් 20 ක් සඳහා මෙටාමයිසර් ලබා දීමට සැලැසුම් කර තිබුණි. එහි සමස්ථ පිරිවැය එ.ජ.ඩොලර් 15,023,157.7 ක් වී තිබුණත්, සායනික අපද්‍රව්‍ය ක්‍රමවත්ව අපහරණය කිරීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ඇති කර නොතිබුණි.

ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ක්‍රියාත්මක කර තිබුණු සායනික අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතිය විගණනයට භාජනය කරන ලද රෝහල්වල උපරිම ඵලදායීතාවයෙන් යුක්තව ක්‍රියාත්මක වී නොතිබුණි. ඒ සඳහා එ.ජ.ඩොලර් මිලියන 13.76 ක් ලබාදී තිබු අතර ඉන් රෝහල් 20 ක් සඳහා මෙටාමයිසර්

නම් උපකරණය ලබාදීමට එ.ජ.ඩොලර් මිලියන 14 ක් වැයකර තිබුණි. එම වියදම නිසි කාර්යක්ෂමතාවයකින් සිදු කර නොතිබුණු අතර අපේක්ෂිත අරමුණුද ඉටු කර නොතිබුණි.

අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීම පිණිස ලෝක බැංකු ආධාර යටතේ දෙවන සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ යටිතල පහසුකම් දියුණු කිරීම අරමුණු කර ගෙන තිබුණි. එම ප්‍රතිපාදන උපරිම වශයෙන් ප්‍රයෝජනයට නොගැනීම හා අරමුදල් ප්‍රයෝජනයට ගත් රෝහල් ඒවා ඵලාදායී ආකාරයෙන් යොදාගෙන නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. නියැදි පරීක්ෂණයට ලක්වූ බදුල්ල රෝහලේ එවැනි තත්ත්වයක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකාවේ රෝහල් හා වෛද්‍ය ආයතන විසින් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබා දී නොතිබුණි. එම ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණ හා නියාමන කාර්යයෙහි දුර්වලතා පැවැතුණි. 2019 වර්ෂයේදී පුවත්පත් වාර්තාවලට අනුව සායනික අපද්‍රව්‍ය දිවයිනේ විවිධ ස්ථානවලට අනවසරයෙන් හඳුනා නොගත් පිරිස් විසින් බැහැර කරන අවස්ථා අනාවරණය කර තිබුණි.

තවද සායනික අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා බලපැවැත්වෙන නීති, රීති රෙගුලාසි හා ප්‍රතිපත්තීන්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වූ සම්මුති හා ඒ සඳහා වන මාර්ගෝපදේශකයන් අනුව ස්ථාපිත කිරීම හා අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි ලබා දීමත් සිදුකළ යුතුව තිබුණි. සායනික අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතීන්වල කාර්යසාධන මට්ටම පිළිබඳ පසුවිපරම් කටයුතු ඉටුකිරීමෙන් හා මේ පිළිබඳ අදාළ ආයතනික කාර්යසාධනය උපරිම මට්ටමින් පවත්වා ගැනීමෙන් මෙම ගැටළුවට සාර්ථකව පිළියම් යෙදිය හැකිව තිබුණි. එම කටයුතුවල අවිධිමත් භාවය හේතු කොටගෙන සායනික අපද්‍රව්‍ය මගින් ජනජීවිතය පීඩාවට පත්වීම හා ඇති කරනු ලබන විවිධ පාරිසරික ගැටළු මගින් රටක තිරසාර සංවර්ධනයක් කරා ළඟා වීමේදී අනිවාර්යෙන්ම විසඳිය යුතු ගැටළුවක් බවට පත්ව තිබුණි.

### පළිබෝධනාශක ආනයනය, භාවිතය හා එහි පාරිසරික බලපෑම

පළිබෝධනාශක යනු වල්නාශක, දිලීරනාශක හා කෘමිනාශක ආදී රසායනික සංයෝග ආකාරයෙන් නිපදවා කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන යෙදවුම් වේ. බෝග සඳහා හානිකර වන්නා වූ විවිධ ජීවී හා ශාක විශේෂ පාලනය සඳහා පළිබෝධනාශක භාවිතය සිදු කිරීම අතීතයේ ආරම්භ වූ අතර වර්තමානය වන විට එම භාවිතයේ වර්ධනයක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත මගින් පළිබෝධනාශක ආනයනය, ඇසිරීම, ලේබල් කිරීම, ගබඩා කිරීම, සංයෝග සකස් කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම, විකිණීම සඳහා බෙදා හැරීම සහ භාවිතය පාලනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විධිවිධාන සැපයීම සිදු කරන අතර එම කටයුතු නියාමනය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් සිදු කෙරේ.



පළිබෝධනාශක ආනයනය, භාවිතය හා එහි පාරිසරික බලපෑම

පළිබෝධනාශක භාවිතය පිළිබඳ අදාළ නියාමන ආයතන විසින් ඉටු කළ යුතු කාර්යභාරය හා ඒ සඳහා බලපැවැත්වෙන රෙගුලාසි, නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුව එය කිරීම පිළිබඳව හා ඒ තුළින් ඇතිවිය හැකි සෞඛ්‍යමය හා පාරිසරික ගැටළු අවම කිරීම පිළිබඳ කාර්යභාරය මෙම විගණනය මගින් ආවරණය නොකෙරුණි.

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවට පළිබෝධනාශක මෙට්‍රික් ටොන් 28,640 වූ ආනයනය කර තිබුණු අතර ඒ සඳහා එ.ජ.ඩොලර් මිලියන 225 ක් වැය කර තිබුණි. 2019 ජුනි 30 දින වන විට පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි ආනයනකරුවන් 80 දෙනෙකු විසින් ශ්‍රී ලංකාවට පළිබෝධනාශක ආනයනය කර තිබුණු අතර එහි අඩංගු සක්‍රීය සංඝටක ප්‍රමාණය 200 ක් වී තිබුණි. රට තුළට ආනයනය කරනු ලබන පළිබෝධනාශකවල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වර්තමානයේදී එම පළිබෝධනාශක නිෂ්පාදිත රටවලින් නිකුත් කරනු ලබන තත්ත්ව සහතිකය පාදක කරගන්නා අතර සියයට සියයක්ම දේශීය රසායනාගාර පරීක්ෂාවන් තුළින් පළිබෝධනාශක පරීක්ෂා කිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය.

පළිබෝධනාශක අලෙවි සහතික ලබා දීමේ කාර්යභාරය පරීක්ෂාවේදී විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර පළිබෝධනාශක අලෙවිසැල් නියාමනයද ප්‍රමාණාත්මකව හා අඛණ්ඩව සිදු කර නොතිබුණි. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන පළිබෝධනාශක වල අඩංගු සක්‍රීය සංඝටක 110 ක් අතරින් සංඝටක 60 ක් සඳහා පමණක් පෙර අස්වනු කාලය හා උපරිම අවශිෂ්ට සීමා 219 ක් තීරණය කර තිබුණි. ඒ අනුව සක්‍රීය සංඝටක 50 ක් සඳහා වූ උපරිම අවශිෂ්ට සීමා ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර නොතිබුණි.

2019 සැප්තැම්බර් 30 දින වන විට අපහරණය නොකරන ලද කල් ඉකුත් වූ පළිබෝධනාශක ද්‍රව ආකාරයේ ලීටර 2,057

ක් හා ඝන ආකාරයේ කිලෝග්‍රෑම් 24,153 ක් රාජ්‍ය අංශයට අයත් ස්ථාන කිහිපයක ගබඩා කර තිබුණි. මෙම කල් ඉකුත් වූ පළිබෝධනාශක පරිසර හිතකාමී ලෙස අපහරණය සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණු අතර ඉතා දීර්ඝ කාලයක සිට අනාරක්ෂිතව ගබඩා කර තිබුණි.

ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන තත්ත්ව සහතිකයට මත ආනයනය කරනු ලබන පළිබෝධනාශක නිෂ්කාශණය කිරිම සිදු කර තිබුණි. එම පළිබෝධකනාශකවල නියැදියක් ලබා ගෙන රසායනාගාර පරීක්ෂාවට භාජනය කිරිමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ශ්‍රී ලංකා රේගුවේ සහ පළිබෝධකනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේද ස්ථාපිත කර නොතිබුණි.

මානව සෞඛ්‍යයට ගැලපෙන හා පරිසර හිතකාමී යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා Good Agriculture Practice (GAP ) වැඩසටහන හඳුන්වා දී තිබුණි. එම වැඩසටහන ගොවීන් අතර ව්‍යාප්ත කිරිමේ ක්‍රියාවලිය පහළ මට්ටමක පැවතුණි. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් වඩා සාර්ථක කෘෂිකාර්මික සංස්කෘතියක් ඇති කර ගැනීමට හැකියාව පැවැතුණි. 2017 ජූනි 14 දිනැති අංක 2023/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයට අනුකූල නොවන පරිදි ගොවීන් විසින් පළිබෝධනාශක අධිමාත්‍රා භාවිතා කිරිම හා 2010 මැයි 25 දිනැති අංක 1655/07 දරන ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය පරිදි ගොවීන් විසින් පළිබෝධනාශක භාවිතයේදී ආරක්ෂිත ක්‍රම අනුගමනය කර නොතිබුණි.

පළිබෝධනාශක අලෙවිය මූලික වශයෙන් පුද්ගලික පළිබෝධනාශක අලෙවිකරුවන් මගින් සිදු කරනු ලබන අතර, අලෙවිකරුවන් බහුතරයකට පළිබෝධනාශක සම්බන්ධ විධිමත් පුහුණුවක් ලබා දී නොතිබුණි. එසේම පළිබෝධ ගැටළු හා පළිබෝධනාශක පිළිබඳ ගොවීන් විසින් උපදෙස් ලබන්නේද, ඉහත පරිදි පළිබෝධනාශක අලෙවිය සම්බන්ධ විධිමත් පුහුණුවක් ලබා නොගත් පළිබෝධනාශක අලෙවිකරුවන් මගිනි. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ලබා ගත් විධිමත් සහතිකයක් යටතේ පළිබෝධනාශක අලෙවි කටයුතු සිදු කළ යුතුව තිබුණත්, 2018 වර්ෂය වන විට දිවයින පුරා පළිබෝධනාශක අලෙවිසැල් 2,294 ක් අතරින් අලෙවිසැල් 1,079 ක් පමණක් අලෙවි සහතික ලබා තිබුණි.

ජාතික ශාක නිරෝධායන සේවා ආයතනයේ (National Plant Quarantine Service – NPQS) අපනයනය සඳහා සූදානම් කෙරෙන එළවළු හා කොළ එළවළු දූෂණය වී තිබුණි. එසේ එළවළු දූෂණය විම පිළිබඳව නියැදි 95 ක් පරීක්ෂා කිරීමේදී නියැදි 24 ක් හෙවත් සියයට 25 ක දූෂණය පළිබෝධකනාශක හේතුවෙන් දූෂණය (Contamination) වී තිබුණි.

මේ අනුව පළිබෝධනාශක ආනයනය, භාවිතය, කල්ඉකුත් වූ පළිබෝධනාශක හා පළිබෝධනාශක හිස් බහාලුම් විධිමත් හා කාර්යක්ෂමව පරිසර හිතකාමී ආකාරයට අපහරණය කළ යුතුය. එසේ කිරිම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනවල කාර්යභාරය වර්ධනය කිරිම සඳහා අවශ්‍ය පියවර ඉතා කඩිනමින් ගැනීම මගින් මානව සෞඛ්‍යයට හා ස්වාභාවික පරිසරයට සිදු වී ඇති හා සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කර ගත හැක.

## අන්තර් ජාතික රැම්සා තෙත්බිම්

ලෝකයේ මානව ශිෂ්ඨාචාරය ආරම්භය සඳහා පසුබිම් වන සුවිශේෂී වූ හා ජෛව විවිධත්වයෙන් අනූන වූ පරිසර පද්ධතීන් ලෙස තෙත් බිම් හැඳින්විය හැක. මෙම පරිසර පද්ධති මගින් ඇති වන්නා වූ සුවිශේෂීභාවය හේතුවෙන් අන්තර්ජාතික වශයෙන් මෙම තෙත් බිම් ආරක්ෂා කිරීමේ සහ කළමනාකරණයේ මෙවලමක් ලෙසින්

1971 වර්ෂයේදී අන්තර් ජාතික රැම්සා තෙත් බිම් සම්මුතියේ ආරම්භය ඇති විය. 2018 වර්ෂය වන විට ලොව පුරා රැම්සා තෙත් බිම් කලාප 2,331 ක් හඳුනාගෙන තිබූ අතර ශ්‍රී ලංකාවද කළාප 06 ක් සඳහා හිමිකම් දරා ඇත.

ජනගහන වර්ධනය හා නාගරීකරණය සමග සීමිතව පවතින භූමියේ සම්පත් භාවිතය වර්ධනය වූ අතර තෙත් බිම්වල තිරසර භාවයටද එය තර්ජනයක්ද වී තිබුණි. පාරිසරික වශයෙන් වැදගත් වූ මෙම ප්‍රදේශ මානව ක්‍රියාකාරකම් මත දැඩි අභියෝගයකට ලක්ව ඇති අතර ඒ සඳහා බල අධිකාරිත්වය ඇති ආයතන විසින් ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

වගුරු බිම් ගොඩ කිරීම, වන ආවරණය ඉවත් කිරීම, තෙත් බිම්වල පවතින සම්පත් අධික ලෙස ලබා ගැනීම හා ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා ජීව විශේෂ සීඝ්‍ර ලෙස පැතිර යාමේ ගැටළු මතු වී තිබුණි. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන රැම්සා තෙත් බිම් ලෙසින් අන්තර්ජාතික වැදගත්කමක් සහිත ජාතික උද්‍යාන හා අභය භූමි ලෙස බුන්දල, විල්පත්තු , කුමන , ආනවිලුන්දාව, වන්කාලෙයි හා මාදු ගඟ යන ප්‍රදේශ නම් කර තිබුණි. අන්තර්ජාතික රැම්සා තෙත් බිම් සම්මුතිය යටතේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව ඇතුළත් වී තිබුණත්, සම්මුතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම නීති පද්ධතියක් ශ්‍රී ලංකාව තුල ස්ථාපිත වී නොතිබුණි. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනතේ විධිවිධාන යටතේ මෙම රැම්සා තෙත් බිම් නියාමනය සිදු කරනු ලබයි. රැම්සා තෙත් බිම් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු තෙත් බිම්වල පවතින ජෛව විවිධත්වයේ තිරසාර භාවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයේ පර්යේෂණ සිදු කර නොතිබුණි. තවද ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා විවිධ වූ උපායක්‍රමික හා ජාතික සැලැසුම් පිළියෙල කර තිබුණද රැම්සා තෙත් බිම් කළාප සම්බන්ධයෙන් විශේෂිත වූ සැලැසුමක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම හෝ වර්තමාන තත්ත්වය පිළිබඳ කාර්යසාධන ඇගයීමක් සිදු කර නොතිබුණි.

රැම්සා තෙත් බිම් කළාප ලෙසින් හඳුනාගන්නා ලද භූමි ප්‍රමාණයන්ට අදාළ මායිම් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කර තිබුණද, විගණිත දිනය වන විටත් රැම්සා තෙත්බිම් සම්බන්ධයෙන් පැන නැගී තිබෙන මායිම් ගැටළු නිරාකරණය කිරීම සඳහා අවධානය යොමු කිරීම ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. රැම්සා තෙත් බිම් කළාප ඇතුළත හා ස්වාරක කළාපය තුළ අනවසර ලෙස ගොඩනැගිලි ඉදිකිරීම්, ඉඩම් ගොඩකිරීම් හා පරිසර හිතකාමී නොවන අනීතික ක්‍රියාකාරකම් බොහොමයක් නිරීක්ෂණය වූ අතර ආක්‍රමණශීලී ශාක ව්‍යාප්තිය මගින් වැව් පද්ධතීන්ට හා රක්ෂිත ප්‍රදේශය තුළ පවතින ජෛව විවිධත්වයට විශාල ලෙස බාධාවන් එල්ල වී තිබුණි.

ශ්‍රී ලංකාවේ වන සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ කිරීම සහ පරීක්ෂණය කිරීම, එම වන සත්වයින් හා වෘක්ෂලතා වාණිජ වශයෙන් ප්‍රයෝජනයට ගැනීම වැලැක්වීම සඳහා විධිවිධාන සැලැසීම ඊට සම්බන්ධ හෝ අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 02 (1) උපවගන්තිය මගින් ජාතික රක්ෂිත භූමි හා අභය භූමි ප්‍රකාශයට පත් කර තිබුණි. එම වගන්තියට අනුකූලව ජාතික උද්‍යාන 03 ක් හා අභය භූමි 03 ක් සම්මුතිය යටතේ රැම්සා තෙත් බිම් වශයෙන් වරින් වර ප්‍රකාශයට පත් කර තිබුණි. පනතේ විධිවිධාන ප්‍රකාරව රක්ෂිතය තුළ හෝ අභය භූමියක් තුළ අවසර පත්‍රයක් සහිතව විද්‍යාත්මක පර්යේෂණයකට බලය දීම සිදු කළ හැකිය. මෙම පර්යේෂණ මගින් ලබා ගන්නා නිරීක්ෂණ හා නිර්දේශවලට අනුකූලව රක්ෂිතය තුළ හෝ අභය භූමිය තුළ පවතින වනසත්ව හා

වෘක්ෂලතා සංරක්ෂණ කිරීමේ කාර්යය දුර්වල මට්ටමක පැවතුණි.

බූන්දල රැම්සා තෙත් බිම් තුළ පවතින ආක්‍රමණශීලී ශාක විශේෂ තක්සේරුකරණය, පාලනය හා කළමනාකරණය පිළිබඳව 2017 වර්ෂයේදී පර්යේෂණයක් සිදු කර තිබුණි. එම පර්යේෂණය අනුව කලපු අන්දර හා කටු පතොක් (*__Prosopis__* *__juliflora__* හා *__Opuntia__* *__dillenil__*) නමින් හැඳින්වෙන ආක්‍රමණශීලී ශාක පිළිවෙලින් හෙක්ටයාර 486 ක් හෙවත් සියයට 8 ක් හා හෙක්ටයාර 568 හෙවත් සියයට 9 ක ප්‍රමාණයක් බූන්දල තෙත් බිම තුළ පැතිරී තිබුණි. නමුත් ඒවා පාලනයට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

කුමන රැම්සා තෙත් භූමිය තුළ පිහිටා තිබුණු කුමන විල්ලුවේ ජෛව විවිධත්වය සම්බන්ධයෙන් සිදු කර තිබුණු පර්යේෂණයන් මඟින් හඳුනාගන්නා ලද තර්ජනයන් හා ඒ සඳහා වූ නිර්දේශයන් ප්‍රමාණාත්මකව ඉටු වී නොතිබුණි.

මාදු ගඟ රැම්සා තෙත් බිම් අභය භූමියට අයත් දූපතක __Competencies__ පවුලට අයත් *Lemnitzer littorea* (රතමිල්ල) සත්‍ය කඩොලාන ශාකය පැවැතුණි. 2012 වර්ෂයේදී ජාතික රතු දත්ත ලේඛනයට අනුව දැඩි ලෙස තර්ජනයට ලක් වී තිබුණු සත්‍ය කඩොලාන වර්ග දෙකෙන් එක් ශාකයක් ලෙස මෙය හඳුනාගෙන තිබුණි. නමුත් මෙම ශාකය සංරක්ෂණය කර හා නැවත රෝපණය කිරීම සඳහා අවශ්‍ය වූ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් ලෙස ගෙන නොතිබුණි.



තෙත් බිම තුළ ඉදිකිරීම්



වනජීවී දෙපාර්තමේන්තුව සලකුණු කරන ලද මායිම් ගල පෙරලා දමා ඇති ආකාරය





කැළි කසල බැහැර කර තිබූ ආකාරය




තෙත් බිම තුළ මායිම් වෙන් කර තිබූ ආකාරය

ජෛව විවිධත්වය අනුව තීරණාත්මකව වැදගත් තෙත් බිම් හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය අවස්ථාවලදී අඩවි වාර්තා හා කළමනාකරණ සැලැසුම් පිළියෙල කිරීම සිදු කළ යුතුව තිබුණි. එසේ වුවද රැම්සා තෙත් බිම් සම්බන්ධයෙන් වර්තමානයේදී පවතින තර්ජනයන් අවම කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කළමනාකරණ සැලැසුම් **2018** දෙසැම්බර් **31** දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

මාදු ගඟ රැම්සා තෙත් බිමට අයත් පේරක කලාපය තුළ වගුරු බිම් ගොඩ කිරීම හා හෝටල් ව්‍යාපෘති ඉදිකිරීම් කර තිබුණු අතර එම ක්‍රියාකාරකම් මගින් සිදුවන පාරිසරික හානිය වැළැක්වීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කිරිම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

මධ්‍යම පරිසර අධිකාරිය මගින් **2006** වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ජාතික තෙත් බිම් ප්‍රතිපත්තිය සහ උපාය ක්‍රමවල අඩංගු අරමුණු අතරින් එක් අරමුණක් ලෙස රැම්සා සම්මුතියේ පාර්ශවකරුවකු වශයෙන් ඊට අනුකූල ජාතික වගකීම් භාරය ඉටු කිරීම සඳහා කටයුතු කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

ඉස්සන් කොටුවල අපජලය බැහැර කිරීමේදී **1980** අංක **47** දරන ජාතික පාරිසරික පනතේ නියමතා අනුගමනය කරන බවට තහවුරු කර ගැනීමකින් තොරව ඉස්සන් වගා සඳහා බලපත්‍ර ලබා දී තිබුණි.




ඉස්සන් කොටුවල අප ජලය බැහැර කිරීම

තෙත් බිම් කලාප තුළ ජල ජීවී වගා ව්‍යාපෘති සඳහා බලපත්‍ර ලබා දීමේදී ජලතලය මත කූඩු තුළ පාද සම්බහන මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම මගින් ජෛව විවිධත්වයට හානි වන අහිතකර තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වූ පස්වෙනි ජාතික වාර්තාවේ ජෛව ක්‍රියාකාරී සැලැස්ම (BCAPC) අනුව, ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති ප්‍රධාන තේමා 04 ක් යටතේ වර්ග කර තිබුණි. එනම්, වනාන්තර, තෙත් බිම්, සමුද්‍ර පද්ධති හා කෘෂි කාර්මික පද්ධති වශයෙනි. මෙම සැලැස්මේ තෙත් බිම් යටතේ හඳුනාගෙන තිබුණු ක්‍රියාකාරී සැලැස්ම යටතේ විශේෂිත වූ අරමුණු 03 ක් ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙන් නිර්දේශ 16 ක් ප්‍රකාශයට පත් කර තිබුණි. විගණිත දිනය වන 2019 නොවැම්බර් 11 වන දින වන විටත් එම නිර්දේශ ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

2011 දෙසැම්බර් 13 දිනැති අංක 1736/21 දරන ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනය අනුව කූඩු තුළ මත්ස්‍ය වගාව සිදු කරන ව්‍යවසායකයෙක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම සිදු කර තිබුණි. ගාල්ල දිස්ත්‍රික්කයේ මාදු ගඟ රැම්සා තෙත් බිම් ආශ්‍රිතව කූඩු තුළ මත්ස්‍ය වගාව සඳහා පුද්ගලයින් 18 දෙනකු ඒසේ බලපත්‍ර ලබාගෙන තිබුණද, සම්භාහන මත්ස්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘති වර්ගීකරණය යටතේ ව්‍යවසායකයන් 05 දෙනෙකු පමණක් බලපත්‍ර ලබා තිබුණි. මේ අනුව අනෙකුත් මධ්‍යස්ථාන 13 ක් නියමිත බලපත්‍රයකින් තොරව සිය කටයුතු පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. මත්ස්‍ය සම්භාහන මධ්‍යස්ථාන 04 ක බලපත්‍ර කාල සීමාව ඉකුත් වී තිබුණි.

කැස්බෑ සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යොදවා නොතිබුණි. විල්පත්තු ජාතික උද්‍යානයේ බස්නාහිර මායිමේ කිලෝමීටර් 38 ක් පමණ වන වෙරළ තීරය තුළ පිහිටි සාගර කලාපය රැම්සා තෙත් බිම්වලට අයත් ප්‍රදේශ වේ. මෙම සාගර කලාපයෙහි ආරක්ෂාව සහ සම්පත් සංරක්ෂණය කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා මුහුදු ඌරන්ගේ සහ කැස්බෑවුන්ගේ පැවැත්මට දැඩි තර්ජනයක් වී තිබුණි.

රැම්සා තෙත් බිම් ලෙස ප්‍රකාශිත අභය භූමියක්/ ජාතික උද්‍යානයක් තුළ පිහිටි පුද්ගලික ඉඩමක ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහනක් හෝ එකී සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස පරිසරයට බැහැර වන අපද්‍රව්‍ය ,අපජලය හා වායු විමෝචනය මගින් පරිසර පද්ධතියට විය හැකි පාරිසරික හානිය නියාමනය කිරීමට අදාළ විධිවිධාන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතින් ආවරණය වී නොතිබුණි.

බොහොමයක් ආක්‍රමණික ශාකවලින් විල්පත්තු ජාතික උද්‍යානයේ වැව් පද්ධතිය ගොදුරු වී තිබුණි. මෙම වැව් අතරින් විශාලම වැව වන මහ වැවෙහි හතරෙන් තුනක් පමණ ප්‍රමාණයක් හම්බුපන්වලින් වැසීගොස් තිබුණි. 2019 වර්ෂයේදී මෙම ශාක ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණු අතර එය ඉතා මන්දගාමීව හා ප්‍රමාණාත්මක නොවන ආකාරයට සිදුවන බව නිරීක්ෂණය විය. මීට අමතරව ජපන් ජබර, සැල්වීනියා වැනි අනෙකුත් ආක්‍රමණික ශාකද මෙම වැව්වලට තර්ජනයක් වී තිබුණි.



හම්බු පන්



සැල්වීනියා

**2016-2022** වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රධාන පාර්ශවකරුවකු ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද්විතික පාර්ශවකරුවකු ලෙස හඳුනාගෙන තිබුණි. ඉලක්ක ගත අරමුණුවල කාර්යසාධන පරීක්ෂාව සඳහා පිහිටුවන ලද දර්ශකවල වර්තමාන ප්‍රගතිය මැන බැලීම **2019** කොවැම්බර් මාසය වන විටත් සිදු කර නොතිබුණි.

මෙම රැම්සා තෙත් බිම් සංරක්ෂණ කටයුතු සඳහා කාර්යමණ්ඩලය යෙදවීම හා අනෙකුත් මූලික පහසුකම් ප්‍රමාණවත්ව සපයා නොතිබුණු අතර අන්තර්ජාතික වශයෙන් වැදගත්කමක් සහිත වූ මෙම තෙත් බිම් සංරක්ෂණ කටයුතු සඳහා ඉහළ අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය බව නිරීක්ෂණය විය. රැම්සා තෙත් බිම් ජෛව විවිධත්වයෙන් ඉතා ඉහළ වටිනාකමක් සහිත, ගං වතුර පාලනය ඇතුළු පාරිසරික සේවාවන් රැසක් සපයන්නා වූ, වඳවී යන ශාක හා සත්ව විශේෂත්ව, සංක්‍රමණික කුරුළු විශේෂ බොහොමයකට පාරාදීසයක් වී තිබුණි. මෙම තෙත් බිම් ජල පෝෂක ප්‍රදේශයන් වශයෙන්ද ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත් වන හෙයින් මෙම රැම්සා තෙත් බිම් සංරක්ෂණය සඳහා රජයේ මැදිහත්වීමේ අවශ්‍යතාවය මතු වී තිබුණි.

# විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

## නිරීක්ෂණ

- ගොඩනැගිලි කුලී වැඩිපුර ගෙවීම
- විදුලි කණු නිෂ්පාදන ව්‍යාපෘතියේ සිදු වූ අලාභයන්
- විදුලිය බෙදා හැරීමේ කණු, රැහැන් සහිත රූපවාහිනී සම්බන්ධතා සඳහා ලබාදීම
- ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම
- ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මුදල් ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගමේ කොටස්වල ආයෝජනය
- නිශ්චිත ක්‍රමවේදය නොසලකා මනුගත නොවූ විදුලි පරිභෝජනය ගණනය කිරීම
- යාපනය ශික්ෂණ රෝහල් ප්‍රධාන ආපනශාලාව බඳුදීම.
- සුභසාධක සංගමය විසින් රෝහල් පරිශ්‍රයේ විවිධ ස්ථාන බඳුදීම.
- රජය විසින් මිලදී ගත් ඉඩම රාජ්‍ය නොවන සංවිධානයක නමින් ලියාපදිංචි කිරිම
- රාජ්‍ය නොවන සංවිධානයකට ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිරිනැමීම.
- බදුල්ල මහ රෝහලේ කිලිටි රෙදි සේදීම
- ඉදිරිපත් වූ එකම ලංසුවක් මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම
- අතිකාල දීමනා වැඩියෙන් ගෙවීම
- අනාර්ථික වියදම්
- තනතුරට අදාළ නොවන රාජකාරී පැවැරීම
- රාජකාරී ඉටු නොකිරිම
- ඉන්ධන සඳහා වැඩිපුර ගෙවීම
- වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි ඉටු නොකිරිම
- ශිෂ්‍ය නේවාසිකාගාරයේ කළමණාකරණය දූර්වලවීම
- අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම
- කුකුළු කොටුව ඉදිකිරීමේ කටයුතු අතහැර තිබිම
- විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණය ඉදිකිරීම
- තීරු බදු සහන යටතේ වාහනයක් ආනයනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම
- නීති විරෝධීව මත්පැන් නිෂ්පාදනය කළ ස්කාගාරයට වාසිදායක වන පරිදි සුරා බදු ගණනය කිරිම
- පොරොත්තු සේවයේ සිටි නිලධාරීන් පුහුණු කළ වියදම නිෂ්ඵල වීම

## විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් අසාධාරණව හෝ නීතියට පටහැනි ආකාරයට වාසියක් හෝ ප්‍රතිලාභයක් ලබාගැනීමට ඇති අවදානම් පිළිබඳව එහි මූලයන් පරීක්ෂා කිරීම විමර්ශන විගණනයකින් අපේක්ෂා කරයි. මෙවැනි අවස්ථාවකදී වංචාවන් සොයා ගැනීම හා ඒවා වැළැක්වීමට පාලන පද්ධතිය ශක්තිමත් කිරීම කෙරෙහි විමර්ශන විගණනයේ සැලකිල්ල යොමු වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් රාජ්‍ය මූල්‍යනය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය විගණනය ශක්තිමත් කර ඇත. විගණිත ආයතනවල රාජකාරි ලිපි ලේඛන පරීක්ෂා කිරීමට අමතරව, විමර්ශනය පුළුල් කිරීම පිණිස මහජන නියෝජන ද, කොමිෂන් සභාවල ඉල්ලීම්, රාජ්‍ය ගිණුම් පිළිබඳ හා පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවල නියෝජන, ආයතන ප්‍රධානීන්ගේ නියෝජන හා මාධ්‍ය මගින් අනාවරණය වන තොරතුරු ලබා ගනිමින් රාජ්‍ය මූල්‍යනය කළමනාකරණය කාර්යක්ෂමව කිරීම කෙරෙහි විමර්ශන විගණනයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙයට සමගාමීව දෙපාර්තමේන්තු විසින් නිලධාරින්ගේ දැනුම හා කුසලතාව වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමත්, අවශ්‍ය පුහුණුවීම් ලබාදීමත්, භෞතික සම්පත්, ක්ෂණික ඇමතුම් අංකයන්, විද්‍යුත් තැපැල යනාදිය වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

විශේෂ විමර්ශන අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැදගත් හා ක්ෂණික අවධානය යොමු විය යුතු (නියෝජන) කෙරෙහි අවධානය යොමු කිරීමේදී නියෝජන 23 කට අදාළව රු.මිලියන 12,557.4 ක වියදම් පරීක්ෂා කිරීමේදි රජයට සිදුවී තිබුණු ඇස්තමේන්තුගත අලාභය රු.මිලියන 9,868.1 ක් වී තිබුණි. 2019 වර්ෂයේදී සිදුකළ විමර්ශනයන්ට අදාළ වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ගොඩනැගිලි කුලී වැඩිපුර ගෙවීම

බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යවරයාගේ සංකල්පයක් අනුව අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියළුම ආයතන එක් ගොඩනැගිල්ලකට ගෙන ඒම සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. 2016 මැයි 10 දින සිට මාස 24 ක කාලයක් සඳහා මාසයකට රු.5,089,500 ක් බැගින් වූ කුලියකට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා ගොඩනැගිලි හිමිකරු සමග අමාත්‍යාංශය ගිවිසුමකට එළඹ තිබුණි. රජයේ තක්සේරුකරු විසින් එම ගොඩනැගිල්ලේ මාසික කුලිය වශයෙන් රු.මිලියන 3 ක් වශයෙන් තක්සේරු කර තිබුණි. එම තක්සේරුව නැවත සලකා බලන ලෙස කරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරව සමථයකට පත්වීම සඳහා මාසයකට රු.මිලියන 4.2 දක්වා කුලිය වැඩිකර තිබුණි. මේ පිළිබඳව ගොඩනැගිලි හිමිකරු සමඟ සමථයකට පත්වීම සඳහා සාකච්ඡා නොකර ඔහු ඉදිරිපත් කළ ලංසු වටිනාකමට ගොඩනැගිල්ල කුලියට ගැනීම හේතුවෙන් මාසයකට රු.889,500 ක් බැගින් වර්ෂ 02 ක කාලයක් වෙනුවෙන් රු.21,348,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. රජයේ තක්සේරුකරුගේ වාර්තාවට අනුව ගොඩනැගිල්ලේ වපසරිය වර්ග අඩි 30,808 ක් වුවත්, ගොඩනැගිලි හිමිකරු සඳහන් කළ වර්ග අඩි 35,100 ක් වෙනුවෙන් කුලී ගෙවීම නිසා ගිවිසුම්ගත කාලයට අදාළව රු.මිලියන

14.93 ක් වැඩිපුර ගෙවා තිබුණි. අවම මිල සහිත ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිසා රු.මිලියන 88.51ක්ද, අවම දෙවන මිල සහිත ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිසා රු.මිලියන 4.21 ක අලාභයක් රජයට සිදුවී තිබුණි. කාර්යාලීය අවශ්‍යතාවයන්ට අනුව අභ්‍යන්තර සැකසීම් සිදුකර තිබූ අවම සහ අවම දෙවන මිල ගණන් සහිත ගොඩනැගිලි දෙක කුලියට නොගෙන ගිවිසුමකට එළඹී ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැකසීම් සඳහා රු.මිලියන 19.09 ක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. ලංසු ලියවිලි තුළ කිසිදු වගන්තියක් ඇතුළත් නොවූ නමුත් ගොඩනැගිලි හිමිකරුගේ ඉල්ලීමට අනුව රු.මිලියන 15.27 ක ආරක්ෂිත තැන්පතුවක් ගෙවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. වෙනත් ගොඩනැගිලි පරිශ්‍රයන් තුළ සිය කාර්යාල පවත්වා ගෙන පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාංශයට මසකට රු.799,779 ක අමතර පිරිවැයක්ද, හානිපූර්ණය සඳහා වන කාර්යාලයට වර්ග අඩි 5,684 ක ගොඩනැගිලි වපසරියක් අහිමි වී මාසයකට රු.44,779 ක මූල්‍යමය පාඩුවක් දැරීමට සිදුවී තිබුණි.

### විදුලි කණු නිෂ්පාදන ව්‍යාපෘතියේ සිදු වූ අලාභයන්

ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.1,000 ක කොටස් ප්‍රාග්ධනයක් සහිතව ආරම්භ කළ ලෙකෝ ව්‍යාපෘති නම් උප සමාගම විසින් 2012 වර්ෂයේදී ආරම්භ කළ විදුලි කණු නිෂ්පාදන ව්‍යාපෘතිය හේතුවෙන් රු.මිලියන 5.9 ක්ව පැවති සමුච්චිත ලාභය රු.මිලියන 3.4 ක සමුච්චිත අලාභයක් දක්වා පහත වැටී තිබුණි. නිෂ්පාදන කළ විදුලි කනු 786 ක් තත්ත්ව පරීක්ෂණයන්ගෙන් අසමත් වීම නිසා සිදුවූ අලාභය රු. මිලියන 7.31 ක් වී තිබුණි. ඉතා සරල මෙහෙයුම් කටයුත්තක් සිදුකිරීමට අපේක්ෂිත සමාගම වෙත ඉහළ නිලයන් සහිත කාර්ය මණ්ඩලය 19 ක් බඳවා ගැනීම තුළ වැටුප් වශයෙන් රු.මිලියන 10.29 ක් වැය කර තිබුණි. නිවැරදි තත්ත්වයෙන් නිෂ්පාදන කටයුතු සිදුකිරීමට බලාපොරොත්තුවෙන් පානදුර ප්‍රදේශයේ කුලියට ගත් ඉඩම සඳහා මාස 10 ක් තුළ රු.90,000 ක කුලියක් ගෙවා තිබුණද, කිසිදු නිෂ්පාදනයක් එහිදී සිදුකර නොතිබුණි. පෙර නිෂ්පාදනයන් සිදුකළ බණ්ඩාරගම ප්‍රදේශයේ වැඩබිම නැවත මාරු කර තිබුණද, නිෂ්පාදන කාර්යය සඳහා භාවිතා කළ රු. මිලියන 4.16 ක උපකරණ විනාශ වී තිබුණු අතර, මාස 03 කාලයකට ප්‍රමාණවත් රු. මිලියන 4.83 ක් වටිනා නිෂ්පාදන ද්‍රව්‍ය 2013 වර්ෂයේ ලාභයට එරෙහිව මුළුමනින්ම ලියාහැර තිබුණි.

### විදුලිය බෙදා හැරීමේ කණු, රැහැන් සහිත රූපවාහිනී සම්බන්ධතා සඳහා ලබාදීම

ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ විදුලිය බෙදාහැරීමේ කණු භාවිතා කරමින් රැහැන් සහිත රූපවාහිනී සම්බන්ධතා (Cable TV) ලබාදීමට ලෙකෝ ව්‍යාපෘති සමාගම, පෞද්ගලික සමාගම් දෙකක් සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. 2013 හා 2014 වර්ෂවලදී ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ආදායම්, ලාභාලාභ ගිණුම තුළින් ලියාහැර තිබුණු අතර, එහි එකතු වටිනාකම රු.මිලියන 9.27 ක් වී තිබුණි. එම වටිනාකම තුළ පෞද්ගලික රූපවාහිනී සමාගම් දෙකෙන් ලැබිය යුතු රු. මිලියන 5.98 ක ණයගැති ශේෂයන් ඇතුළත් වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් නිසි පරිදි නොගෙවන්නේ නම් පෞද්ගලික සේවා වයරය කණුවලින් ඉවත් කළ හැකි වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුනු අතර, ලෙකෝ ව්‍යාපෘති සමාගම පවත්වාගෙන යන වාර්තා අනුව 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු. මිලියන 40.08 ක් වී තිබුණි.

## ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම.

ලංකා විදුලි (පුද්ගලික) සමාගමට නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී රු.මිලියන 53.54 ක් වැය කර නාරාහේන්පිට ප්‍රදේශයෙන් පර්චස් 73.85 ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. 2019 වර්ෂය වන විටත් එම ඉඩමේ කිසිදු ඉදිකිරීමක් සිදු කර නොතිබුණි. නමුත් වර්ෂ 18 ක කාලය තුළ ඉඩමේ ආරක්ෂාව සඳහා රු.මිලියන 10 කට වඩා අධික වියදමක් කර තිබුණි. ප්‍රධාන කාර්යාල පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා 1999 සැප්තැම්බර් මාසයේ සිට 2019 ජූනි මාසය දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.මිලියන 208 ක්ද, එහි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2015 වර්ෂයේදී කුලියට ගත් අමතර ගොඩනැගිල්ල සඳහා 2019 ජූනි මාසය දක්වා රු.මිලියන 22.3 ක කුලී ගෙවා තිබුණි.

## ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මුදල් ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගමේ කොටස්වල ආයෝජනය

ලංකා විදුලිබල (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගමේ වරණීය කොටස්වල 2001 ජූලි 20 දින රු.මිලියන 15 ක්ද, 2001 ජූලි 06 දින සාමාන්‍ය කොටස්වල රු.මිලියන 5 ක් එකතුව රු.මිලියන 20 ක් ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි. එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් සඳහා ලංකා බැංකුව ගෙවනු ලබන පොලියට සියයට 2 ක් එකතු කිරීමෙන් සකස් කරන පොලී අනුපාතයට වරණීය කොටස් සඳහා පොලි ගෙවීමට එකඟ වී තිබුණද, 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට නියමිත පොලිය රු.මිලියන 32.68 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ආයෝජනය කරන ලද සාමාන්‍ය කොටස් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු අතර, වරණීය කොටස් සඳහා ගෙවීමට එකඟ වූ පොලී ප්‍රතිශතය අනුව සාමාන්‍ය කොටස් සඳහා ද පොලිය ගණනය කළහොත් 2018 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබුණු පොලී ආදායම රු.මිලියන 10.96 ක් වී තිබුණි. යථෝක්ත ආයෝජිත සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.මිලියන 1,207.13 ක ඍණ අගයක් ගෙන තිබුණි. එසේම ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් ඉහත පරිදි කරන ලද රු.මිලියන 20 ක්වූ මුළු ආයෝජනය විගණිත සමාගමේ යෝජනාවකට අනුව 2009 වර්ෂයේදී ලියාහැරීමට කටයුතු කර තිබුණි.

## නිශ්චිත ක්‍රමවේදය නොසලකා මනුගත නොවූ විදුලි පරිභෝජනය ගණනය කිරීම.

ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් මොරටුව රාවතාවත්ත කාගිල්ස් පරිශ්‍රයට සපයා තිබුණු 100KVA තොග සැපයුමේ එක් කලාවක් මනුගත වී නොතිබුණි. ලංකා විදුලි (පුද්ගලික) සමාගම නිරතුරුව අනුගමනය කරන ක්‍රමවේදයන් නොසලකා හැර වෙනත් ක්‍රමයක් අනුගමනය කරමින් මනුගත නොවූ විදුලි පරිභෝජනය ගණනය කිරීම හේතුවෙන් අයකර ගත යුතු රු.මිලියන 3.61 ක් වෙනුවට රු.මිලියන 1.93 ක් අයකිරීම නිසා විදුලි සමාගමට රු.මිලියන 1.66 ක පාඩුවක් සිදුවි තිබුණි.

## යාපනය ශික්ෂණ රෝහල් ප්‍රධාන ආපනශාලාව බඳුදීම.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය හා රු.මිලියන 3.53 ක් ද්‍රව්‍ය සඳහා වැය කර ආකර්ශණීය ලෙස යාපනය ශික්ෂණ රෝහලේ ප්‍රධාන ආපන ශාලාව ඉදිකර තිබුණි. එම ආපන ශාලාව 2018 අප්‍රේල් 09 දින සිට 2020 මාර්තු 31 දින දක්වා බඳු දීම සඳහා ඉදිරිපත් කර තිබුණු මාසයකට රු.310,000 ක් වූ වැඩිම ලංසුව වංචනික ලෙස මගහැර රු.123,000 ක් වූ දෙවන

වැඩිම ලංසුව පිළිගෙන තිබුණි. මේ නිසා රජයට රු.මිලියන 4.03 ක බදු ආදායමක් අහිමි වී තිබුණි.

## සුභසාධක සංගමය විසින් රෝහල් පරිශ්‍රයේ විවිධ ස්ථාන බදුදීම.

කිසිදු පාර්ශවයක අනුමැතියකින් සහ රජයට කිසිදු ගෙවීමකින් තොරව යාපනය ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ස්ථාන 11 ක් විවිධ පාර්ශවයන්ට ව්‍යාපාර පවත්වාගෙන යාමට පරිපාලනය විසින් අවසර ලබාදී තිබුණි. එමෙන්ම සුභසාධක සංගමයට ලබාදුන් ස්ථාන 06 කින් ස්ථාන 03 ක් පෞද්ගලික අංශය වෙත බදුදීම නිසා රජයට අයවිය යුතු රු.මිලියන 2.62 ක බදු ආදායම සුභසාධක සංගමය අය කරගැනීමට කටයුතු කර තිබුණි. සුභසාධක සංගමය විසින් තවත් ව්‍යාපාරික ස්ථාන දෙකක් උප බදු දීමට කටයුතු කිරීම හේතුවෙන් රජයට අහිමි වූ බදු ආදායම රු.මිලියන 1.60 ක් වී තිබුණි.

## රජය විසින් මිලදී ගත් ඉඩම රාජ්‍ය නොවන සංවිධානයක නමින් ලියාපදිංචි කිරීම

යාපනය ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීමට අනුව යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අක්ෂි ඒකකයක් පිහිටුවීම සඳහා රු.මිලියන 12.50 ක් වැය කර අවශ්‍ය ඉඩමක් මිලදී ගැනීම සඳහා ලබා දුන් අනුමැතිය මත එම වටිනාකමට ඉඩමක් මිලදී ගෙන තිබුණි. එම ඉඩම, ශික්ෂණ රෝහල නමින් ලියාපදිංචි කළ යුතුව තිබුණත්, එය රාජ්‍ය නොවන සංවිධානයක් වන යාපනය රෝහල් සංවර්ධන සංගමය නමින් ලියාපදිංචි කර තිබුණි. එම ඉඩමෙහි තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රජයේ ප්‍රතිපාදන රු.මිලියන 1.90 ක් වැයකර තිබුණි.

## රාජ්‍ය නොවන සංවිධානයකට ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිරිනැමීම.

යාපනය ශික්ෂණ රෝහලේ රු.මිලියන 2 ට අඩු සියළුම ඉදිකිරීම් කොන්ත්‍රාත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9 හා 3.9.1 මාර්ගෝපදේශ පාදක කර ගනිමින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි වී තිබුණු යාපනය රෝහල් සංවර්ධන සංගමය වෙත පිරිනමා තිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවලදී එකතුව රු.මිලියන 170.24 වූ කොන්ත්‍රාත් 310 ක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. මෙම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරු වූ රෝහල් සංවර්ධන සංගමය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශයේ විධිවිධාන කඩ කර තිබුණි.

## බදුල්ල මහ රෝහලේ කිලිටි රෙදි සේදීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 මැයි 15 දින සිට 2019 මැයි 14 දින දක්වා බදුල්ල මහ රෝහලේ කිලිටි රෙදි සේදීමේ රු.මිලියන 20.52 ක් වටිනා කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබුණි. බදුල්ල රෝහල තුළ කිලිටි රෙදි සියල්ල සෝදා ගැනීමට හැකියාව පැවැතුණද, ඒ කෙරෙහි අවධානය යොමු නොකර රෙදි සේදීම කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා තිබුණි. මේ නිසා 2018 වර්ෂය තුළදී පමණක් රු.මිලියන 9.57 ක් රජයේ මුදල් වැය කර තිබුණි.

## ඉදිරිපත් වූ එකම ලංසුවක් මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම

බදුල්ල මහ රෝහලේ සැපයුම් අවශ්‍යතා සඳහා ඉදිරිපත් වූ එක් ලංසුවක් පමණක් පාදක කර ගෙන කොන්ත්‍රාත්කරුවෙකු ලියාපදිංචි කර තිබුණි. එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වූ විට ඒ සඳහා නැවත ලංසු කැඳවීමක් සිදු කර නොතිබුණු අතර, එම

සැපයුම්කරුවන්ගෙන් අවස්ථා 30 කදී එකතුව රු.මිලියන 17.91 ක් වැය කර සැපයුම් ලබා ගෙන තිබුණි.

## අතිකාල දීමනා වැඩියෙන් ගෙවීම

ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 5.6 වගන්තියේ සඳහන් විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව දිනකට පැය 07 බැගින් වූ සතියකට පැය 42 ක් ඉක්මවා වැඩ කරන ලද කාලය පදනම් කරගෙන අතිකාල දීමනා ගෙවීම සඳහා පැය ගණන ගණනය කළ යුතුව තිබුණි. නමුත් සාමාන්‍ය රාජකාරි වේලාව ද ඇතුළත්වන පරිදි දුම්රිය ස්ථාන 13 කින් මරදාන දුම්රිය ස්ථානයට අනුයුක්ත කර තිබූ දුම්රිය නියාමකයින් 18 දෙනෙකු වෙනුවෙන් 2017 නොවැම්බර් මාසයේ සිට 2018 අප්‍රේල් මාසය දක්වා මාස 06 ක කාල සීමාවට අදාළව රු. මිලියන 1.20 ක අතිකාල දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

## අනාර්ථික වියදම්

සෞඛ්‍ය අමාත්‍යාශයේ ගණකාධිකාරීවරයකු 2016 මැයි හා අගෝස්තු මාසවලදී International Exposure and Professional Development Course on Hospital Management and Accounting යන පාඨමාලාව හැදෑරීම සඳහා පාඨමාලා හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු.691,680 ක් වැය කර තිබුණි. නැවත එම නිලධාරියාම එම පාඨමාලාව හැදෑරීම සඳහා රු.691,680 ක් වැය කර සහභාගී කර තිබුණි. මේ නිසා එක් අවස්ථාවක් සඳහා වැය කර තිබුණු රු.691,680 ක් වූ පාඨමාලා ගාස්තු ඇතුළු අනෙකුත් වියදම් අනාර්ථික වී තිබුණි.

## තනතුරට අදාළ නොවන රාජකාරී පැවරීම

ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකයින් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 10 ඡේදයට අනුව මැනුම් සහයක තනතුර සඳහා රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින් හෝ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගතයුතුව තිබුණි. ඒ අනුව කටයුතු නොකර ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, මිරිදිය ධීවර කර්මාන්ත, ඉඩම්, සංචාරක හා ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශය විසින් මීට පෙර ලැබී ඇති අයදුම්පත් පදනම් කරගෙන 2015 අප්‍රේල් 01 දින සිදුකරනු ලැබූ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අනියම් පදනම යටතේ මැනුම් ක්ෂේත්‍ර සහායකයින් 07 දෙනෙකු බඳවාගෙන තිබුණි. මෙම පත්වීම් ලබාදෙන අවස්ථාව වන විට අනුමත මිනින්දෝරු තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතීම නිසා බඳවාගත් සියළුම මැනුම් සහායකයින්ට මැනුම් කටයුතු නොවන වෙනත් රාජකාරී පවරා තිබුණි.

## රාජකාරී ඉටු නොකිරිම

2018 නොවැම්බර් 12 දින අළුයම 03.45 ට පමණ නාමල්ඔය වැව් බැම්ම මත මාර්ගයේ ගමන් කිරීමට නොහැකි පරිදි වනඅලින් දෙදෙනෙකු සිටින බවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගල්ඔය ජාතික වන උද්‍යානයේ මූලස්ථාන කාර්යාලයේ දුරකථන අංකයට දැනුම් දී තිබුණි. ඒ පිළිබඳ සොයා බැලීමට කිසිඳු නිලධාරියෙකු එම ස්ථානයට පැමිණ නොතිබුණි. රාත්‍රී කාලයේ වන අලින් ගම්වැදීම් සිදුවන අවස්ථාවන්හිදී ගම්මුන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂාකර දීමට සහාය වීම සඳහා වනජීවී නිලධාරීන් සේවයේ යොදවා තිබුණත්, 2018 නොවැම්බර් 12 දින අළුයම 04.15 ට ගල්ඔය ජාතික වන උද්‍යානයේ මූලස්ථාන කාර්යාලය පරීක්ෂා කළ අතර, එම අවස්ථාව වන විට රාජකාරී කටයුතුවල පවරා තිබුණු නියෝජ්‍ය උද්‍යාන

භාරකරු, කාර්යාලයේ රාජකාරීවල නිරතව වී නොතිබුණු බව අනාවරණය විය.

### ඉන්ධන සඳහා වැඩිපුර ගෙවීම

සේනානායක සමුද්‍රය නැරඹීමට එක් ගමන් වාරයක් සඳහා පැය 02 ක කාලයක් වෙන් කරනු ලබන අතර එක් බෝට්ටුවක් එක් ගමන් වාරයක් වෙනුවෙන් ඉන්ධන (භූමි තෙල්) ලීටර් 17 ක් වැයවන බවට දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණි. 2018 නොවැම්බර් 14 දින අවස්ථා 05 කදී සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂණවලදී බෝට්ටු 03 ක් ඇතුළත් වන පරිදි එක් බෝට්ටුවක් පැය දෙකක සංචාරයක් සඳහා දහනය වන ඉන්ධන ප්‍රමාණය ලීටර් 07 ක සිට 09 ක් දක්වා පරාසයක පැවැතුණි. 2017 හා 2018 වර්ෂවලදී ඉන්ධන ලීටර් 38,107 ක් බෝට්ටු 03 ක් සඳහා නිකුත් කර තිබූ අතර, දෛනික ධාවන සටහන් අනුව ගමන් වාර 2,241 ක් සිදුකර තිබුණි. භෞතික පරීක්ෂණය අනුව එක් ගමන් වාරයක් සඳහා දහනය වන උපරිම ඉන්ධන ප්‍රමාණය ලීටර් 10 ක් ලෙස සැලකුවහොත් ගමන්වාර 2,241 සඳහා ඉන්ධන ලීටර් 22,410 ක් පමණක් වැය විය යුතුව තිබුණි. ඒ අනුව දළ වශයෙන් භූමිතෙල් ඉන්ධන ලීටර් 15,697 ක් වෙනුවෙන් රු. මිලියන 1.04 වැඩිපුර ගෙවා තිබුණි.

### වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි ඉටු නොකිරීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මොනරාගල ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් 2017 අගෝස්තු 22 දින ආරම්භ කරන ලද යුදගනාව වැවේ ප්‍රතිසංස්කරණ කටයුතුවල පස්වැඩ සියයට 80 ක් හා රළපනාව ඉදිකිරීම සියයට 60 ක් පමණක් ඉටුකර ඉතිරිය සම්පූර්ණ නොකර අතරමග නවතා දමා තිබුණි. එම තත්ත්වය ඇතිවීමට හේතු සොයාබලා ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට පිටවාන හා සොරොව්ව ඉදිකිරීම වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය වෙත පවරාගෙන අදාළ ඉදිකිරීම් සිදුකර තිබුණි. බැම්ම හා රළපනාව සකස් කිරීමේ කාර්ය තවදුරටත් මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා වෙත පැවරී තිබුණද, 2019 නොවැම්බර් මාසය වන විටත් එම කාර්යය අවසන් කිරීමට පියවර ගෙන නොතිබුණි.

මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් වැවේ රළපනාව ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මිලියන 31.26 ක් වැය කර තිබුණි. එම ඉදිකිරීම් සිදු කිරීමේදී නොසැලකිලිමත්ව ගල් ඇතිරීම හා නිසි පරිදි අධීක්ෂණය නොකිරීම නිසා අතුරා තිබූ ආරක්ෂිත කාපට් භාවිතයට ගැනීමට නොහැකිව විනාශ වී තිබුණි. තවද වැවේ පිටවාන ඉදිකිරීමේදී අසල ඇති මාර්ගය හා පාලමේ ආරක්ෂාව පිළිබඳව සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් පිටාර ජලයෙන් ඉවුර ඛාදනයට ලක් වීම නිසා පාලම කැඩීයාමේ අවධානමක් පැවතුණි.



පරීක්ෂණ අවස්ථාවේදී යුධගනාව වැවු බැම්ම දිස්වූ ආකාරය



පිටවානට වඩා කුඩා පාලම හාඅනාරක්ෂිත ඉවුර පිටාර ජලය හේතුවෙන් ඉවුර සේදීගොස් ඇතිආකාරය

### ශිෂ්‍ය නේවාසිකාගාරයේ කළමණාකරණය දුර්වලවීම

කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර තුළ ඉහළ මාලයේ 7 හා 8 වසර සිසුන්ගේ සයනාගාරයන්හි තට්ටු ඇඳන්වල ඉහළ ඇඳ හා වහලය අතර අඩු උසක් (පරතරයක්) පැවැතුණි. බොහෝ ඇඳන්වලට ඉහළින් සිවිලින් විදුලි පංකා ස්ථානගත වී තිබීම නිසා උඩ ඇඳන්වල සිටින සිසුන්ට යම් අනතුරක් ඇතිවීමේ අවධානමක පැවැතුණි. එමෙන්ම එසේ විදුලි පංකා ස්ථානගත කර තිබීම නිසා ඉහළ ඇඳන්වල සිටින සිසුන්ට මදුරු දැලක් භාවිතා කිරීමට ද නොහැකි වී තිබුණි. නේවාසිකාගාර වහලයේ මුදුන් යටලීය දිරා තිබීම, සිවිලිම කඩාවැටී තිබීම, වැසිකිළි හා නාන කාමර නිසි ලෙස පිරිසිදු නොකිරීම, ඒ සදහා ප්‍රමාණවත් සේවකයින් යොදවා නොතිබිම, අවට පරිසරය පිරිසිදු නොකිරීම සහ නේවාසික උපදේශන කමිටුව 2019 ජුලි මාසයේ සිට රැස්වී නොතිබීම වැනි අඩුපාඩු අනාවරණය වි තිබුණත්, ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.



උඩ ඇඳ හා සිවිලිම අතර අඩු පරතරයක් පැවතීම



උඩුමහලට පිවිසෙන ස්ථානයේ වහලයේ සිවිලිම කැඩී ඇති ආකාරය



වහලය අළුත්වැඩියා කළ යුතු ස්ථානයක



වතුර පිල්ටරය ඇති ස්ථානයේ අපිරිසිදු බව



අපිරිසිදු ලෙස ගබඩාකර තිබූඅර්තාපල් අල



මුළුතැන්ගෙය පිටුපස ඇති පිරිසිදු නොකරන ලද කානුවක්

## අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ඉහළතම විධායක තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2017 අප්‍රේල් 30 දින සිටද, ආයතනයේ දෙවන විධායක තනතුරු ලෙස අනුමත අධ්‍යක්ෂ තනතුරු 06 න් 03 ක්ම 2018 වර්ෂයේ සිටද, පුරප්පාඩුව පැවැති අතර, එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පාලන අධිකාරිය 2020 මැයි 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. අධ්‍යක්ෂ පරිපාලන තනතුර සඳහා 2018 නොවැම්බර් 11 දින සිට 2020 අප්‍රේල් 30 දින දක්වා ද, අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා 2019 පෙබරවාරි 01 දින සිට 2020 මැයි 31 දින දක්වා බාහිර ආයතනවල නිලධාරීන් වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. තවද,

ආයතනයේ කාර්යයන් ඉටුකිරීම සඳහා 374 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණු අතර 2020 මැයි 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 254 දෙනෙකු විය. මේ අනුව එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 121 ක් වී තිබුණි.

### කුකුළු කොටුව ඉදිකිරීමේ කටයුතු අතහැර තිබීම

වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය සඳහා නව කුකුළු කොටුවක් ඉදිකිරීම වෙනුවෙන් බස්නාහිර පළාත් සභා අරමුදල යටතේ රු. 1,500,000 ක ප්‍රතිපාදන අනුමතවී තිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.1,433,033 ක් වී තිබුණි. මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිතියක් තෝරාගෙන තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව 2018 ඔක්තෝබර් 18 දින වනවිට වැඩ අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද, අදාළ ඉදිකිරීම්වලින් සියයට 60 ක ප්‍රමාණයක් නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතුහැර තිබුණි. එසේ තිබියදී කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කල වැඩ සඳහා වූ බිල්පත්‍රයෙහි අදාළ කුකුළු නිවාසය ඉදිකිරීම පිරිවිතරවලට අනුව සාර්ථකව නිමකර ඇති බවත් වැඩ අවසන්වීමෙන් පසු නිවැරදිව ආපසු භාරදී ඇති බවත් සඳහන් කරමින් පුහුණු ආයතනය භාර සහකාර අධ්‍යක්ෂවරිය විසින් ගෙවීම නිර්දේශ කර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත යවා තිබුණි. ඒ අනුව රු.885,400 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. 2020 ජනවාරි 13 දින වන විටත් මෙම කුකුළු නිවාසය ඉදිකිරීම් නිමකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එහි වහලයේ ඇති ඇතැම් සෙවිලි තහඩු මලකඩ කා ඇති බවද අනාවරණය විය.



කුකුළු නිවාසයේ පරීක්ෂණ දින වන 2020 ජනවාරි 13 දිනට තත්ත්වය



කුකුළු නිවාසයේ වහලය මලකඩකා තිබූ අයුරු

### විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණය ඉදිකිරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පූර්වගාමී ශක්ති අධිකාරියේ විද්‍යාගාර හා කාර්යාල සංකීරණය, ජනාකීර්ණ ප්‍රදේශයෙන් බැහැරව ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණින් මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ හල්බරාවවත්ත නම් ප්‍රදේශයේ අක්කර 03 පර්චස් 36.5 ඉඩම මිලදී ගැනීම සඳහා 2014 ජූලි 31 දින සිට 2015 ඔක්තෝබර් 29 දින දක්වා අවස්ථා 05 කදී රු.මිලියන 181 ක් ගෙවා තිබුණි. එසේ වුවද, එම ඉඩමේ වටිනාකම රු.මිලියන 116 ක් ලෙස රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරුකර තිබුණි. රජයේ ප්‍රධාන

තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම රු.මිලියන 65 කින් ඉක්මවා රු.මිලියන 181 ක් වැය කර ඉඩම මිලදී ගෙන තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එම ඉඩම සඳහා මුදල් ගෙවා වර්ෂ 03 කට වැඩි කාලයක් ඉකුත්වී තිබුණද, ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පැවරීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කර නොතිබුණි.

මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා තනි මහලේ විද්‍යාගාර ගොඩනැගිල්ලක් පළමු අදියර යටතේ ඉදිකරදීමට මාර්ග සංවර්ධන අධිකාරිය එකඟවී තිබුණු අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමකට 2013 ඔක්තෝබර් 25 දින එළඹ තිබුණි. ඒ අනුව ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) ණය ප්‍රදානය මත රු.මිලියන 367.2 ක් හා දේශීය අරමුදල් මත රු.මිලියන 51.8 වශයෙන් එකතුව රු.මිලියන 419 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ අතර එම ඉදිකිරීම් සම්බන්ධයෙන් මහජන විරෝධතාවයක් මතුවීම හේතු කොටගෙන ඉදිකිරීම් නතර කිරීමට සිදුවී තිබුණි. එම අවස්ථාව වන විට ඉදිකිරීම් සඳහා රු.මිලියන 60.1 ක් වැය කර තිබුණි. මේ නිසා මාලඹේ හල්බරාවවත්තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීම අත්හිටුවා ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ ආයතනයට අයත් ඔරුගොඩවත්තේ පිහිටි කල්බදු ඉඩමක මෙම ඉදිකිරීම් සිදු කිරීමට තීරණය කර තිබුණි. මේ නිසා මාලබේ හල්බරාවවත්ත ඉඩමේ ඉදිකිරීම් වෙනුවෙන් වැයකරන ලද රු.මිලියන 60.1 ක් අනාර්ථික වියදමක් (අලාභයක්) බවට පත්වී තිබුණි.

අදාළ ඉදිකිරීම් නැවත ඔරුගොඩවත්ත ඉඩමේ සිදු කිරීමට තීරණය කිරීම නිසා සමස්ථ ඉදිකිරීම් පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 267.8 කින් වැඩිකිරීමට ද කටයුතු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් ඔරුගොඩවත්තේ පිහිටි ඉඩමේ මූලික ඉදිකිරීම්වල සිදුවී තිබූ අඩුපාඩු හේතු කොටගෙන JICA අයතනය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඊලඟට ලංසු ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 597.2 කට ඉදිකිරීම් කටයුතු පවරා දී තිබුණි. මේ අනුව සමස්ත ඉදිකිරීම් ඇස්තමේන්තුගත පිරිවැය (මාලඹේ හල්බරාවවත්ත ඉඩමේ ඉදිකිරීම් සඳහා වැය කළ රු.මිලියන 60.1ක ද ඇතුළුව) රු.මිලියන 925.7 ක් වී තිබුණි. මේ අනුව මාලබේ හල්බරාවවත්ත තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විද්‍යාගාර ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඔරුගොඩවත්ත ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනයට පවරා ගැනීමට යෝජිත ඉඩමෙහි ඉදිකිරීම් කටයුතු නැවත අළුතින් ආරම්භ කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුගත පිරිවැයට වඩා රු.මිලියන 506.7 කින් ඇස්තමේන්තුගත පිරිවැය වැඩි වී තිබුණි.

### තීරු බදු සහන යටතේ වාහනයක් ආනයනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩබලන ප්‍රධාන මානව සම්පත් කළමනාකරු 2017 පෙබරවාරි 13 දින සිට 2017 අගෝස්තු 13 දින දක්වා මාස 06 ක කාලයක් සක්‍රීය සේවයේ යෙදී නොතිබුණි. සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු අයදුම්පත්‍රයේ ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම ඔහු සම්බන්ධයෙන් 1999, 2003 හා 2013 වර්ෂවලදී ගෙන තිබූ විනය ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ද හෙළිදරව් කර නොතිබුණි. එම අයදුම්පත්‍රයේ සඳහන් කරුණු මත පදනම්ව වර්ෂ 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම 2017 නොවැම්බර් 30 දින තීරු බදු සහන යටතේ වාහනයක් ආනයනය කිරීමේ බලපත්‍රය නිකුත් කර තිබුණි. ඒ සඳහා ආනයනය කළ වාහනය වෙනුවෙන් 2018 අගෝස්තු 09 දින ශ්‍රී ලංකා රේගුව විසින් රු.4,868,500 ක බදු සහනයක් ලබාදී තිබුණි.

### නීති විරෝධීව මත්පැන් නිෂ්පාදනය කළ ස්කාගාරයට වාසිදායක වන පරිදි සුරා බදු ගණනය කිරීම

මත්පැන් නිෂ්පාදනය කරන පෞද්ගලික සමාගමක් විසින් 2012, 2013 හා 2014 වර්ෂවලදී නීති විරෝධී ලෙස එතනෝල් ස්පිතු (NES) ලීටර් 518,600 ක් ආනයනය කර ඇති බව ශ්‍රී ලංකා රේගුව විසින් හඳුනාගෙන තිබුණි. එම එතනෝල් ස්පිතු ප්‍රමාණයෙන් නිෂ්පාදනය කළ හැකි අරක්කු ප්‍රමාණය ලීටර් 313,880 ක් ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පත්කළ කමිටුව විසින් ගණනය කර තිබුණි. එම කමිටු වාර්තාව අනුව සුරාබදු ආඥා පනත යටතේ වූ නියෝග හා සුරාබදු අත්පොතෙහි සඳහන් නිර්ණායකයන් නොසලකා පරීක්ෂණ කමිටුව විසින් නීති විරෝධීව මත්පැන් නිෂ්පාදනය කළ ස්කාගාරයට වාසිදායක වන පදනමක් භාවිතා කර එතනෝල් ස්ප්‍රිතු මගින් නිෂ්පාදන කළහැකි අරක්කු ප්‍රමාණය ගණනය කර අයකළ යුතු සුරාබද්ද අඩුවෙන් ගණනය කර තිබුණි. එම පදනම අනුව නිෂ්පාදනය කළ අරක්කු ප්‍රමාණය නීතිවිරෝධීව ආනයනය කළ ස්ප්‍රිතු ප්‍රමාණයට වඩා අඩු කර දක්වා තිබුණි. මෙම සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් නීතිවිරෝධි ලෙස ආනයනය කර මත්පැන් නිෂ්පාදනයට භාවිතා කර ඇති එතනෝල් සඳහා අයකළ යුතු රු.මිලියන 1,634.66 ක සුරාබද්ද රු.මිලියන 588.90 ක් ලෙස ගණනය කර තිබුණි. එම සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් අයකළ හැකිව තිබුණු රු.මිලියන 1,045.76 ක සුරා බදු අඩුවෙන් අයකිරීමට කටයුතු කර තිබුණි.

### පොරොත්තු සේවයේ සිටි නිලධාරීන් පුහුණු කළ වියදම නිෂ්ඵල වීම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරි තනතුරු සඳහා 2018 මැයි 09 දින පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව 2019 මාර්තු 18 හා 19 යන දෙදින තුළ සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණි. අංක 559 දරන අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව තනතුරු පුරප්පාඩු 08 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමටත්, 13 දෙනෙකු පොරොත්තු ලේඛනයේ රඳවා ගැනීමටත්, එම සියළු අයදුම්කරුවන්ව නේවාසික පුහුණු වැඩමුළුව සඳහා සහභාගි කර ගත යුතුව තිබුණි. ඒ අනුව කටයුතු කර තිබුණු අතර පොරොත්තු ලේඛනයේ සිටි අයදුම්කරුවන් පුහුණුව සඳහා රු.532,553 ක් වැය කර තිබුණි. 2019 ජුනි 24 දින පුවත්පත් දැන්වීම් මගින් නැවත වරක් තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබීම නිසා පොරොත්තු ලේඛනයේ සිටි නිලධාරීන් වෙනුවෙන් වැය කළ රු.532,553 ක වියදම නිෂ්ඵල වී තිබුණි.

# ජාතික විගණන කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

## විෂයයන්

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් පදනම
- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
- අක්මුදල් ගැලැපුම් ගිණුම
- 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2019 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | |
| | තථ්‍ය | |
| | **2019** | **2018 සංශෝධිත** |
| | රුපියල් | රුපියල් |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| **දේපළ පිරියත හා උපකරණ** | **391,745,228** | **382,254,367** |
| **මූල්‍ය වත්කම්** | | |
| **අත්තිකාරම් ගිණුම්** | **226,919,272** | **219,416,775** |
| **මුදල් හා මුදල් සමාන දෑ** | **6,802,571** | **-** |
| **මුළු වත්කම්** | **625,467,071** | **601,671,142** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | |
| **ශුද්ධ වත්කම්** | **164,010,576** | **205,279,869** |
| **දේපළ පිරියත හා උපකරණ සංචිතය** | **391,745,228** | **382,254,367** |
| **කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය** | **585,000** | **2,730,000** |
| **ජංගම වගකීම්** | | |
| **ගෙවිය යුතු - එකතු කිරීමේ අගය මත බදු** | **-** | **4,542,134** |
| **තැන්පතු ගිණුම්** | **62,323,696** | **6,864,772** |
| **අග්‍රිම ශේෂය** | **6,802,571** | **-** |
| **මුළු වගකීම්** | **625,467,071** | **601,671,142** |

**මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇති අතර ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.**

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
**ප්‍රධාන ගණන්දීමේ නිලධාරි**
**විගණකාධිපති**

**2020 පෙබරවාරි දින.**

**එස්.එම්.සී.ලක්ෂ්මි**
**ප්‍රධාන ගණකාධිකාරී**

**2020 පෙබරවාරි දින**

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය

ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර ඇත. එම චක්‍රලේඛයේ පහත සඳහන් පදනම් යොදා ගෙන 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

## වාර්තා කිරීමේ පදනම

### වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

### අගය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

### දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

### දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

### මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 2018 සංශෝධිත

2019 ජූලි 07 දිනැති අංක SA/MA/MA-02/Assets දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව 2019 වර්ෂය දක්වා ස්ථාවර වත්කම් හඳුනාගෙන ආරම්භක ශේෂයයන් ලෙස ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව 2018 වර්ෂයට අදාළව 2019 වර්ෂයේදී හඳුනා ගත් වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2018 වර්ෂයේ ආරම්භක ශේෂයයන් ලෙස ගිණුම්ගත කර ඇත.

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|
| | **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය** | | |
| සංශෝධිත අයවැය | | තථ්‍ය | |
| 2019 | | 2019 | 2018 |
| රුපියල් | | රුපියල් | රුපියල් |
| | ආදායම් ලැබීම් | | |
| 170,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 276,697,315 | 165,030,063 |
| 170,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | 276,697,315 | 165,030,063 |
| | ආදායම් නොවන ලැබීම් | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | 1,527,971,140 | 1,603,800,000 |
| | තැන්පතු | 125,055,685 | 20,365,300 |
| 52,000,000 | අත්තිකාරම් ගිණුම් | 72,466,341 | 77,867,428 |
| - | වෙනත් ලැබීම් | 74,656,439 | 62,339,998 |
| - | එකතු කළ අගය මත බදු ලැබීම් | 50,146,355 | 26,380,610 |
| 52,000,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | 1,850,295,960 | 1,790,753,336 |
| 222,000,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ) = (අ)+(ආ) | 2,126,993,275 | 1,955,783,399 |
| | අඩුකළා :වියදම් | | |
| | පුනරාවර්තන වියදම් | | |
| 1,454,127,540 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 1,453,700,074 | 1,464,526,249 |
| 330,942,460 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 327,927,115 | 253,286,132 |
| 13,900,000 | සහනාධාර හා මාරු කිරිම් | 13,622,630 | 13,771,671 |
| 128,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 127,327 | - |
| 1,799,098,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | 1,795,377,146 | 1,731,584,052 |
| | මූලධන වියදම් | | |
| 28,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම | 26,759,417 | 12,212,631 |
| 201,400,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 23,192,765 | 14,834,169 |
| 66,500,000 | හැකියා වර්ධනය | 61,959,414 | 76,136,978 |
| 296,400,000 | මුළු මූලධන වියදම (ඉ) | 111,911,596 | 103,183,778 |
| | ප්‍රධාන ලෙජර් වියදම් | | |
| - | තැන්පතු ගෙවීම් | 69,596,760 | 24,858,261 |
| - | අත්තිකාරම් ගෙවීම් | 82,113,840 | 73,254,303 |
| - | එකතු කළ අගය මත බදු ගෙවීම | 54,688,488 | 20,714,261 |
| - | මුළු ප්‍රධාන ලෙජර් වියදම (ඊ) | 206,399,088 | 118,826,825 |
| 2,095,498,000 | මුළු වියදම (උ) = (ඈ)+(ඉ)+(ඊ) | 2,113,687,830 | 1,953,594,655 |
| - | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය (ඌ) = (ඇ)-(උ) | 13,305,445 | 2,188,744 |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අක්මුදල් ගැලපුම් ගිණුම

| | රුපියල් | රුපියල් |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ශේෂය | | 13,305,445 |
| (+) එකතු කලා | | |
| අත්තිකාරම් ගිණුමේ ගැලපුම් ශේෂය | 4,072,606 | |
| වෙනත් වැය විෂයයන්ගෙන් හර කිරීම් | 2,098,115 | 6,170,721 |
| | | 19,476,166 |
| (-) අඩු කලා | | |
| අත්තිකාරම් ලැබීම් ගැලපුම | 8,764,743 | |
| වෙනත් වැය විෂයයන් වෙනුවෙන් වියදම් | 3,908,852 | 12,673,595 |
| 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය | | 6,802,571 |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තථ්‍ය | |
|---|---|---|
| | 2019 | 2018 සංශෝධිත |
| | රුපියල් | රුපියල් |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 276,697,315 | 165,030,063 |
| ආදායම් නොවන ලැබීම් | 74,656,439 | 62,249,458 |
| අග්‍රිම ලැබීම් | 1,588,600,000 | 1,603,800,000 |
| එකතු කළ අගය මත බදු ලැබීම | 50,146,355 | 26,380,610 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | **1,990,100,109** | **1,857,460,131** |
| අඩුකළා: මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,881,997,862 | 1,817,529,287 |
| සහනාධාර හා මාරු කිරීම් | | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,908,852 | 3,335,436 |
| වෙනත් වැය ශිර්ෂ වෙනුවෙන් ගෙවූ අග්‍රිම | 6,802,571 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 60,628,860 | - |
| එකතු කළ අගය මත බදු ගෙවීම් | 54,688,488 | 20,714,261 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **2,008,026,633** | **1,841,578,984** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) – (ආ) | (17,926,524) | 15,881,147 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | 90,540 |
| අත්තිකාරම් අයකර ගැනීම | 67,699,469 | 75,405,249 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | **67,699,469** | **75,495,789** |
| අඩුකළා :මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | 23,192,765 | 14,834,169 |
| අත්තිකාරම් ගෙවීම | 82,039,105 | 72,049,806 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **105,231,870** | **86,883,975** |

| | | |
|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) – (ඊ) | (37,532,401) | (11,388,186) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඈ) +(ඊ) | (55,458,925) | 4,492,961 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| තැන්පත් ලැබීම් | 125,055,685 | 20,365,300 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඌ) | 125,055,685 | 20,365,300 |
| අඩුකළා : මුදල් වැය කිරිම් | | |
| තැන්පතු ගෙවීම් | 69,596,760 | 24,858,261 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය )එ( | **69,596,760** | **24,858,261** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) – (එ) | 55,458,925 | (4,492,961) |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31දිනට අවසාන මුදල් ශේෂය | - | - |

# 2019 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තාවලින් සම්පිණ්ඩනය කරන ලද විගණන නිරීක්ෂණ

## විෂයයන්

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යුහාත්මක ක්‍රියාකාරිත්වය සහ පාරිභෝගික ජනතාව වෙත අත්වන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආයෝජන කළමණාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව
- 2018 වර්ෂයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම උදෙසා සිදු කළ ක්‍රියාදාමය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- අනුරාධපුරය මහනගර සභා බල සීමාව තුළ අනවසර ඉදිකිරීම් නිසා වර්තමානය වන විට පැන නැගී ඇති සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම
- ලක්විජය බලාගාරයේ වැදගත්කම හා එහි පාරිසරික බලපෑම
- කොළඹ නෙළුම් කුළුණ ඉදිකිරීම පිළිබඳව විගණන වාර්තාව
- නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව
- ශ්‍රී ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය හා වෙළෙඳපළ තත්ත්වය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව
- සෞඛ්‍ය,පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව
- සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණයෙන් සංවර්ධනය කරන ලද කර්මාන්ත පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය
- විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව
- සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් 2013 හා 2014 වර්ෂයන්හිදී එළඹ තිබුණු A 350 – 900 ගුවන් යානා 08 ක් අත්පත් කර ගැනීමෙ ගිවිසුම

අවසන් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපතිවරයා විසින් සිදු කළ පරීක්ෂණයේ අවසන් වාර්තාව

- රුහුණු මහා කතරගම දේවාලයේ සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් කරන ලද ඉල්ලීමට අනුව සිදුකරන ලද පරීක්ෂණයේ වාර්තාව
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳ විශේෂ විගණනය
- ගොවි ජනතාවගේ අරමුදල් අවශ්‍යතා සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා දායකත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- මිනුම් ඒකක ප්‍රමිත සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා දෙපාර්තමේන්තුවේ වත්කම් භාවිතය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ වත්මන් ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- ශ්‍රී ලංකාවේ සිවිල් (උපත්, විවාහ හා මරණ) ලියාපදිංචිය සහ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- මාතර මහා නගර සභාවේ දේපල පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව.

# 2019 වර්ෂයේ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂය තුළදී විශේෂ විගණන වාර්තා 22 ක් නිකුත් කරන ලදී. විගණකාධිපති විසින් විගණනය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතනවලට අදාළව මෙම වාර්තා නිකුත් කර ඇත. මෙම විශේෂ විගණන වාර්තා නිකුත් කිරීමේ දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව සහ විගණිත ආයතන විසින් සිදු කරන ලද ඉල්ලීම් ද, ජාතික හා කාලින වැදගත්කම පිළිබඳ අවධානය යොමු කර මාධ්‍ය හෙළිදරව් කිරීම් හෝ මහජන නියෝජනයන් ආදී කරුණු ද සැලකිල්ලට ගෙන මා වෙත පැවරී ඇති අභිමතානුසාරි බලතල මත විශේෂ විගණන වාර්තා සඳහා විෂයයන් තීරණය කරනු ලැබේ.

පහත විස්තර දැක්වෙන පරිදි 2019 වර්ෂයෙහි නිකුත් කරන ලද සියලුම විශේෂ විගණන වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කර ඇති අතර එම වාර්තා පිළිබඳ උනන්දුවන පාර්ශවයන්ගේ පරිශිලනය සඳහා ජාතික විගණන කාර්යාල වෙබ් අඩවියෙහි ත්‍රෛයිභාෂාවෙන් පළ කිරීමට ද කටයුතු කර ඇත.

2019 වර්ෂයෙහි නිකුත් කළ විශේෂ විගණන වාර්තා පිළිබඳ තොරතුරු වගුව 03 හි දැක්වේ.

| අනු අංකය | වාර්තාවේ නම | වාර්තාවේ දිනය | වාර්තාව නිකුත් කිරීමට පසුබිම් වූ කරුණු |
|---|---|---|---|
| 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යුහාත්මක ක්‍රියාකාරිත්වය සහ පාරිභෝගික ජනතාව වෙත අත්වන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව | 2019.01.09 | ත්‍යාග මුදල් බෙදීයාම කෙරෙහි සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින ව්‍යුහාත්මක ක්‍රියාවලිය සකස් වී ඇති ආකාරය හා එහි ඵලදායීතාවය පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම |
| 02 | මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආයෝජන කළමණාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව | 2019.01.25 | භාරකාර මණ්ඩලය විසින් අරමුදලෙහි මුදල් නිසි කළමනාකරණයකින් තොරව ආයෝජනය කිරීමත්, අරමුදලෙහි භාරකාරත්වය යටතේ ආරම්භ කරන ලද මාලබේ මහපොළ කැම්පස් ආයතනයෙහි අයිතිය අරමුදලින් ගිලිහී යාමට සැලැස්වීමත් ආදී හේතූන් නිසා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල පිළිබඳ විවේචනාත්මක ලෙස සාකච්ඡාවට බඳුන් වීම හේතුවෙන් ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා |
| 03 | 2018 වර්ෂයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම උදෙසා සිදු කළ ක්‍රියාදාමය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.03.28 | 2018 පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීමේ අරමුණෙන් සීඩබ්ලිව්ජී 2018 (පෞද්ගලික) සමාගම නමින් රාජ්‍ය සමාගමක් සංස්ථාපනය කර එහි කටයුතු සඳහා රු.මිලියන 689.9 ක් රැස්කර තිබුණද, එම සත්කාරත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීමට නොහැකිවිම මත සමාගම පිහිටුවීමේ හා අරමුදල් රැස්කිරීමේ අරමුණු ඉටු වී නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| 04 | අනුරාධපුරය මහනගර සභා බල සීමාව තුළ අනවසර ඉදිකිරීම් නිසා වර්තමානය වන විට පැන නැගී ඇති සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම | 2019.03.28 | නගර සැලැසුම් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් හා අනවසර ඉදිකිරීම් සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් අනුරාධපුර නගරයට සිදුව ඇති සමාජ, ආර්ථික, පාරිසරික හා සංස්කෘතික බලපෑම පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා |
| 05 | ලක්විජය බලාගාරයේ වැදගත්කම හා එහි පාරිසරික බලපෑම | 2019.03.29 | ලක්විජය බලාගාරය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන පාරිසරික ගැටළු හා ඒවා වැලැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ද, අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත යෝජනා හා එහි ක්‍රියාකාරීත්වයද පිළිබඳ පාරිසරික විගණන වාර්තාවක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය මත |
| 06 | කොළඹ නෙළුම් කුළුණ ඉදිකිරීම පිළිබඳව විගණන වාර්තාව | 2019.04.01 | ව්‍යාපෘතිය අඛණ්ඩව ප්‍රමාද වීම ව්‍යාපෘතියෙහි පිරිවැය ඉහළයාමට මෙන්ම අපේක්ෂිත පරිදි වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සහ ආදායම් ඉපයීම ප්‍රමාද වීමට ද හේතු වී තිබුණු අතර මෙම පසුබිම මත නෙළුම් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මේ දක්වා වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු වාර්තා කිරීම සඳහා |
| 07 | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව | 2019.04.10 | නීති කෙටුම්පත් සම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම, කෙටුම්පත් නිරන්තරයෙන් සංශෝධනයන්ට ලක්කිරීම, පවත්නා නීති කාලීනව යථාවත් නොවීම ආදි කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවෙහි කාර්යසාධනය පිළිබඳව ඇගැයීමක් සිදුකිරීමේ අවශ්‍යතාවය මත |
| 08 | ශ්‍රී ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය හා වෙළෙඳපළ තත්ත්වය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව | 2019.04.22 | මෑත කාලීනව ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කිරීම ක්‍රමයෙන් ඉහළ යාමත්, දේශීය වෙළඳපල තුළ ගම්මිරිස් සඳහා ලබා දුන් මිල ගණන් පහළ යාමත් හේතුවෙන් ආර්ථික මෙන්ම සමාජයීය වශයෙන් ගැටළු රාශියක් ඇති වීම හේතුවෙන් එම තත්ත්වයන් හඳුනා ගැනීම සඳහාත්, ඒ සඳහා අවශ්‍ය විසඳුම් හඳුනාගැනීම සඳහා |
| 09 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.04.22 | අමාත්‍යාංශයට අයත් වාහන 1,794 ක පමණ භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකිවී තිබුණු අතර, මෙම තත්ත්වය මත අමාත්‍යාංශය සතු වාහනවල අයිතිය, පැවැත්ම, ලේඛනගත කිරීම, භාවිතය හා නඩත්තු කිරීම, වාහන පරිපාලන ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනය ඇතුළු වාහන කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම සඳහා |
| 10 | භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව | 2019.04.22 | 1968 වර්ෂය වන විට රටේ භාණ්ඩ ප්‍රවාහන වෙළඳපොළ කොටසින් සියයට 38 ක් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පැවැති අතර වාර්තාවේ දිනය වන විට එය සියයට 0.3 ක් දක්වා පහත වැටී තිබිම. |

| | | | |
|---|---|---|---|
| 11 | සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණයෙන් සංවර්ධනය කරන ලද කර්මාන්ත පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.04.22 | මහ මේ සම්බන්ධයෙන් ජනතාව හා මාධ්‍ය හෙළිදරව් කර තිබුණු කරුණු ද, විගණනය විසින් හඳුනාගන්නා ලද කරුණු ද සැලකිල්ලට ගනිමින් අදාළ කාර්යයේදී රජයේ මුදල් අවභාවිත කළේද හා එම මුදල් යෙදවීම නිෂ්කාර්යය ද යන්නත් පරීක්ෂා කිරීම සඳහා |
| 12 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය | 2019.04.22 | ශ්‍රී ලංකා ජනරජයේ ණය කළමනාකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම |
| 13 | විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව | 2019.07.23 | විදේශ රැකියා ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා |
| 14 | සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් 2013 හා 2014 වර්ෂයන්හිදී එළඹ තිබුණු A 350 – 900 ගුවන් යානා 08 ක් අත්පත් කර ගැනීමේ ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපතිවරයා විසින් සිදු කළ පරීක්ෂණයේ අවසන් වාර්තාව | 2019.06.17 | 2017 සැප්තැම්බර් 20 දින සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ කටයුතු පරීක්ෂාව සඳහා පැවැති පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමට ගුවන් යානා මිලදී ගැනීමේ ගනුදෙනුවට අදාළ ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විගණකාධිපති වෙත කරන ලද ඉල්ලීම |
| 15 | රුහුණු මහා කතරගම දේවාලයේ සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් කරන ලද ඉල්ලීමට අනුව සිදුකරන ලද පරීක්ෂණයේ වාර්තාව | 2019.10.31 | 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 38(1) දරන වගන්තිය පරිදි බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙතින් කරන ලද ඉල්ලීම |
| 16 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳ විශේෂ විගණනය | 2019.10.23 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළව විෂයයන් පහක් පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම සඳහා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වගන්තිය ප්‍රකාරව වාර්තාවක් නිකුත් කිරීම |
| 17 | ගොවි ජනතාවගේ අරමුදල් අවශ්‍යතා සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා දායකත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.12.05 | මහජන මුදල් ලෙස ගොවි බැංකුවල පවත්නා වත්කම් හා එම ගනුදෙනුවලට අදාළ නෛතික රාමුවක් සැකසී නොමැතිවීමත්, මේ දක්වාම ස්වශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය කෙරෙන මූල්‍ය ශක්තිය රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කිරීම සඳහා ගොවි ජනතාව සංවිධානය කිරීම හා සවිබල ගැන්වීම සඵලදායි ලෙස සිදු කිරීමට ගොවිජන බැංකු ආරම්භයේ සිට 2019 වර්ෂයේ අවසාන කාර්තුව දක්වාම කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වීම. |

| | | | |
|---|---|---|---|
| 18 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.12.11 | 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් කර තිබුණු ස්ථාවර තැන්පතු සම්බන්ධව පුළුල් විගණනයක් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් හඳුනාගන්නා ලද නිරීක්ෂණ ඇතුළත්ව මෙම වාර්තාව නිකුත් කිරීම |
| 19 | මිනුම් ඒකක ප්‍රමිත සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා දෙපාර්තමේන්තුවේ වත්කම් භාවිතය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.12.31 | දෙපාර්තමේන්තුවෙන් මහජනතාව වෙත ලබාදිය හැකි උපරිම සේවය කුමක්ද යන්නත්, ඒ තුළින් ජනතාවට විවිධ ආකාරයෙන් සැලසිය යුතු ආරක්ෂාවන් සැලසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කෙරෙහි අදාළ බලධාරීන්ගේ සැලකිය යුතු අවධානයක් යොමු කිරීමේ අපේක්ෂාවෙන් වාර්තාව නිකුත් කිරීම |
| 20 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ වත්මන් ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.12.31 | රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ වර්තමාන ක්‍රියාවලිය පිළිබඳව පුළුල් පරීක්ෂාවක් සිදු කිරීම |
| 21 | ශ්‍රී ලංකාවේ සිවිල් (උපත්, විවාහ හා මරණ) ලියාපදිංචිය සහ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2019.12.31 | උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයේ කාර්යක්ෂමතාවය ඇගයීම ද, සම්බන්ධිත පාර්ශවයන්හි වගකීම නිසි පරිදි ඉටු කර මහජන සේවාව ඉටුකර ඇති ආකාරය ද, හඳුනාගැනීම සහ ඇගයීම |
| 22 | මාතර මහා නගර සභාවේ දේපල පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව. | 2019.12.31 | මහා නගර සභා ආඥා පනත හා අනෙකුත් මූල්‍ය රීතීන් අනුව සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි ඵලදායීව සහ කාර්යක්ෂමව යොදා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව දක්වා තිබුණද සභාව විසින් මෙම ඉඩම් හා ගොඩනැඟිලි ඵලදායීව යොදා නොගැනීමේ අවදානමක් පවතින බව නිරන්තරයෙන් සිදු කරනු ලබන විගණනයේ දී නිරීක්ෂණය වීම. |

රූපසටහන 03 -2019 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තා

2019 වර්ෂයේදී නිකුත් කරන ලද වාර්තා සම්පිණ්ඩනය කර මෙම පරිච්ඡේදයේ දක්වා ඇත.

## "සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යුහාත්මක ක්‍රියාකාරීත්වය සහ පාරිභෝගික ජනතාව වෙත අත්වන ප්‍රතිලාභ" සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව

1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධානවලට අනුව ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීමේ කාර්ය සඳහා ලොතරැයි පැවැත්වීම, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන කාර්යය විය. එලෙස උත්පාදනය වන මුදල් ජනාධිපති අරමුදලෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වභාර අරමුදලට ප්‍රේෂණය කරනු ලබයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය එකී කාර්යයන් ඉටු කිරීමේදී පවත්වනු ලබන සියලුම ලොතරැයි මඟින් ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව සහ ඒ එක් එක් ත්‍යාගයේ වර්ගය හා වටිනාකම නියමිත පරිදි විය යුතුවේ. ඒ අනුවම එම ත්‍යාගයන් නිවසක්, මෝටර් වාහනයක්, යම් භාණ්ඩයක් හෝ මුදල් ප්‍රමාණයක් යනාදියෙන් සමන්විත

විය හැකිය. සංවර්ධන ලොතරැයි පත් මිලදී ගැනීම සඳහා මහජනතාව නැඹුරු වීම කෙරෙහි ප්‍රදානය කරනු ලබන ත්‍යාගවල වටිනාකම හා ප්‍රමාණයන් ප්‍රධාන වශයෙන් හේතු වේ.

කෙසේ වුවද, පසුගිය කාලපරිච්ඡේදය තුළ ලොතරැයි අලෙවි ආයතන හා ඒවායේ ලොතරැයි පිළිබඳ ලොතරැයි පාරිභෝගික ජනතාව තුළ විශ්වාසයක් පැවති අතර ඊට හේතු වූයේ, ලොතරැයි අලෙවි වටිනාකමට හා ප්‍රමාණයට සාපේක්ෂව පෙර වර්ෂයන් වලදී වැඩි ත්‍යාග ප්‍රමාණයක් මෙන්ම සුපිරි ජයමලු, ලක්ෂපතීන් හා කෝටිපතීන් වැඩි සංඛ්‍යාවක් බිහිකර තිබීම බවට වූ ලොතරැයි වෙළඳපොල පාරිභෝගිකයා තුළ අදහසක් පැවතීමයි.

පසුගිය කාලපරිච්ඡේදය තුළ සංවර්ධන ලොතරැයි පත් මිලදී ගන්නා පාරිභෝගික ජනතාවට ප්‍රමාණවත් පරිදි ත්‍යාග හිමි නොවීමත් සුපිරි ජයමල්ල පිරිනැමීමක් නොකර දිගින් දිගටම දිනුම් වාර බොහෝ ඉදිරියට ගෙනයාමත් හේතුවෙන් වර්තමානය වන විට එම පාරිභෝගික ජනතාවගේ අපේක්ෂාවන් බිඳවැටී ඇති බවට හෙළිදරව් වී ඇත. මේ හේතුවෙන් ලොතරැයි වෙළඳපොල විශ්වාසය බිඳවැටීම කෙරෙහි ලොතරැයි ත්‍යාග ව්‍යුහයේ හා දිනුම් ඇදීමේ ක්‍රියාවලිය කෙතෙක් දුරට බලපා තිබේද යන්න පිළිබඳව මෙම වාර්තාව තුළින් පරීක්ෂාවට ලක් කර වාර්තා කිරීම අරමුණු විය.

එක් එක් ලොතරැයි වර්ගයන්ට අදාළව පවත්වනු ලබන දිනුම් වාර ගණන, ත්‍යාග ව්‍යුහය හා ත්‍යාග ප්‍රතිශතය, දිනුම් ඇදීමේ යන්ත්‍රයට ඇතුළත් කළ යුතු පන්දු සංඛ්‍යාව ආදී ලොතරැයි පැවැත්වීම පිළිබඳව නිශ්චිත නිර්නායකයන් නොමැති බව නිරීක්ෂණය විය. එසේම දිනුම් ඇදීමේ යන්ත්‍රයට ඇතුළත් කරනු ලබන පන්දු සංඛ්‍යාව හා එහි ප්‍රමිතය පිළිබඳව, දිනුම් වාරයක් පැවැත්වීමට ප්‍රථම පරීක්ෂාවක් සිදුවන බවට නිසි සහතික වීමක් සිදු නොවන බවද පැහැදිලි විය.

රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන සූදු ක්‍රමයක් ලෙස ලොතරැයි පැවැත්වීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කර තිබුණද, රාජ්‍ය ආයතනයක් වශයෙන් ද කාර්ය භාර්යක් ඉටු කළ යුතු වේ. ඒ අනුව ලොතරැයි මිලදී ගැනීම සඳහා පෙළඹී සිටින දුගී හා පහළ මධ්‍යම පන්තියේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ත්‍යාග ව්‍යුහය සකස් කිරීම වැදගත් වේ. මණ්ඩලය විසින් අරමුදල් උත්පාදනය හා එය වර්ධනය කිරීම පමණක් අරමුණු කර සිය කාර්යයන් මෙහෙයවා තිබුණි.

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආයෝජන කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව

යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සලසාදීම ඇතුළු අරමුණු හා පරමාර්ථ පහක් ඉටුකර ගැනීම සඳහා 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත යටතේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පිහිටුවා ඇත. පනතේ 3(1) වගන්තිය අනුව අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය හා පාලනය භාරකාර මණ්ඩලයකට පැවරී ඇත. භාරකාර මණ්ඩලය ප්‍රාරම්භක, අග්‍ර විනිශ්චයකාරවරයා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා, අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා, වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා හා ප්‍රාරම්භක විසින් අවුරුදු පහක කාලයක් සඳහා පත්කරනු ලබන පුද්ගලයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. පනතේ 6 (1) වගන්තිය අනුව අරමුදලේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමේලා අවශ්‍ය හිතකර වන හෝ අනුශාංගික වන සියලු දේ කිරීමේ බලය භාරකාර මණ්ඩලයට පැවරී ඇත. තවද වඩාත් වාසි සැලසෙන පරිදි භාර අරමුදල්

උත්පාදනය හා කළමනාකරණය කිරීම භාරකරුවන් විසින් කළයුතු වේ.

කෙසේ වුවද, පසුගිය කාල පරිච්ඡේදය තුළදී භාරකාර මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණ මහපොළ අරමුදලට හිතකර හා වාසිදායක නොවන අයුරින් ගෙන තිබුණි. මෙම තත්ත්වයන් පරීක්ෂා කිරීම සඳහා අදාළ අනපනත්, ගිවිසුම්, අමාත්‍ය මණ්ඩල තීරණ , අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මෙන්ම ප්‍රසම්පාදන ලියවිලි ද පරීක්ෂා කරන ලදී. එම පරීක්ෂා කිරීම්වලදී අනාවරණය වූ කරුණු අනුව විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන් හට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනයට අවස්ථාව ලබාදීමේ අරමුණින් මහපොළ භාර අරමුදලට අයත් මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩමක, මහපොළ අරමුදලින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම (SLIIT) සමග 2003 මාර්තු 19 දින එළඹ තිබූ ගිවිසුමෙන් මහපොළ භාර අරමුදලට තිබූ වාසිදායක කොන්දේසි 2005 නොවැම්බර් 14 හා 2015 මැයි 12 යන දිනයන්හිදී එළඹි ගිවිසුම් මඟින් ඉවත්කර මහපොළ භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමිකර බඳුකුළී ගිවිසුමක තත්ත්වයට පත්කර තිබුණි. තවද එතෙක් ලැබිය යුතුව තිබූ ආදායම්ද මහපොළ අරමුදල වෙත ලබාදී නොතිබුණි. ජනාධිපති අරමුදල හා මහපොළ භාර අරමුදලේ සම ප්‍රාග්ධන දායකත්වයෙන් පිහිටුවා තිබූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් සියයට 50 ක හිමිකමක් මහපොළ භාර අරමුදලට තිබුණද 2012 වර්ෂයේ සිට ඊට අඩු ලාභ කොටසක් ජනාධිපති අරමුදලින් භාර අරමුදලට ලැබී තිබුණි.

භාර අරමුදලින් පිහිටවූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමනාකරණය කරන ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන මහපොළ භාර අරමුදලේ ආයෝජන කළඹ කළමනාකරණය නිසි පරිදි අධීක්ෂණය නොකිරීමෙන් සහ එම සමාගමේ පරිපාලිත සමාගමක් වන නැට්වෙල්ත් සිකියුරිටීස් ආයතනය විසින් සිදුකරනු ලබන රජයේ සුරකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන්ද නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම නිසා එම සමාගම් පසුගිය කාල පරිච්ඡේදවලදී පාඩු ලබමින් හෝ ප්‍රමාණවත් ලාභ නොලබමින් පැවතුණි. තවද අරමුදල් රැස්කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ලොතරැයිකරුවකු තෝරාගෙන සිදුකර තිබූ මංගත ලොතරැයිය තුළින් උපයාගත් ලාභ භාර අරමුදල වෙත ලැබී නොතිබුණි. මෙම කරුණු අනාවරණය කිරීම තුළින් මහපොළ අරමුදලට බලපා ඇති අහිතකර තත්ත්වයන් සඳහා වගකිව යුතු පාර්ශවයන් කවුරුන්ද යන්න අනාවරණය කර, භාර අරමුදල පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩාත් වාසිදායක නිවැරදි ආයෝජන තීරණ ගැනීමට වගකිවයුතු පාර්ශවයන් එයට යොමු කරවීම මෙම වාර්තාව නිකුත් කිරීමේ පරමාර්ථය වේ.

ඒ අනුව මෙම ගැටළු අවම කර ගැනීම සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ සඳහන් විධිවිධාන මැනවින් අධ්‍යයනය කර අරමුදලේ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීමට අවශ්‍ය නිවැරදි තීරණ ගැනීම භාරකාර මණ්ඩල රැස්වීම්වලදී බහුතරයේ එකඟතාවය මත සිදුකළ යුතු බවටත්, භාර අරමුදල් පනතේ සංශෝධනයන් කාලීනව සිදුකළ යුතු බවටත්, ගිවිසුම්වලට එළඹීමට පෙර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බවටත් මූලික වශයෙන් හඳුනා ගන්නා ලදී.

මහපොළ භාර අරමුදල් පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය හා පාලනය භාරකාර මණ්ඩලයට පැවරී තිබුණද, භාරකාර මණ්ඩලය 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අරමුදලට වාසිදායක ලෙස හා ඵලදායි ලෙස තීරණ නොගැනීමත් පැවරී ඇති අධිකාරිය අභිබවා

කටයුතු කිරීමත් හේතුවෙන් අරමුදලට මූල්‍ය හා මූල්‍ය නොවන අවාසින් සිදු වී ඇති බව නිගමනය කරමි.

## 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීම සඳහා 2010 වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි. මේ සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු ඉදිරිපත් කිරීමේ කටයුතු සඳහා සීඩබ්ලිව්ජී 2018 (පෞද්ගලික) නමින් රාජ්‍ය සමාගමක් සංස්ථාපනය කර තිබුණි. එම සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 51 ක් රජය සහ සියයට 49 ක් රාජ්‍ය ආයතනවලින් දැරීමට අපේක්ෂා කර තිබුණි. ඒ අනුව ආරම්භක ප්‍රාග්ධනයෙන් රු.මිලියන 110 ක් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන්ද, රු.මිලියන 18 ක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන්ද සපයා දී තිබුණි. ඊට අතිරේකව පෞද්ගලික ආයතන හා පුද්ගලයන්ගෙන්ද මුදල් පරිත්‍යාග ලබාගැනීමට කටයුතු කර තිබුණි. මෙලෙස රු.මිලියන 689.9 ක අරමුදල් රැස්කර සමාගම පිහිටුවනු ලැබුව ද ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීමට නොහැකි විය. තවද එලෙස සම්පාදිත මුදල නිසි මූල්‍ය පාලනයකින් හා විනිවිදභාවයකින් තොරව වියදම් කර ඇති බවත්, සමාගමේ පාලන කටයුතු අදාළ නීති හා රීතිවලට අනුකූලව සිදුකර නොමැති බවත්, පොත්පත් වාර්තා, පනත් හා විවිධ ලිපිගොනු ලේඛන පරීක්ෂා කිරීමේදී හා සම්මුඛ සාකච්ඡා හා ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී හඳුනාගැනීමට හැකි විය. ඒ අනුව 2010 වර්ෂයේ සමාගම පිහිටුවීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පරීක්ෂා කිරීමද, 2013 මැයි 31 දින දක්වා සමාගමට ලැබුණු පරිත්‍යාග හා සිදු කර ඇති වියදම් ද සමාගමෙහි ගිණුම් ඉදිරිපත් කිරීම මෙන්ම ඇවර කිරීමට අදාළ තොරතුරුද පරීක්ෂා කරන ලදි. ඒ අනුව සමාගම සංස්ථාපනය කිරීමේ කටයුතු අමාත්‍ය මණ්ඩල තීරණවලට පටහැනි ලෙස සිදු කිරීමත්, රාජ්‍ය අංශයේ කොටස් ප්‍රාග්ධනය සඳහා නීත්‍යානුකූලව කොටස් සහතික නිකුත් නොකිරීමත්, ලංසු සකස් කිරීම සඳහා උපදේශක සමාගම තෝරාගැනීමත් ගිවිසුම්ගත වීම හා උපදේශකයන් තෝරාගැනීමත් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශකයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණු බවට නිරීක්ෂණය විය. තවද අපනයන සංවර්ධන මණ්ඩලය එහි අරමුණුවලින් පරිබාහිරව මෙම සමාගමෙහි මුදල් ආයෝජනය කර තිබීමත්, සමාගම නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා නොතිබීමත්, අදාළ සත්කාරකත්වය ලබාගැනීමට නොහැකි වීමෙන් පසුවද සමාගම් පනත ප්‍රකාරව මෙම සමාගමෙහි ඇවර කටයුතු සිදු නොකිරීමත්, නිසි මූල්‍ය පාලනයකින් තොරව පෞද්ගලික පාර්ශවයන්ගෙන් අරමුදල් රැස්කිරීමත් සිදුකර ඇති බවද හෙළිදරව් විය.

මෙවැනි රාජ්‍ය සමාගම් අදාළ අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ නිසි අධීක්ෂණයක් යටතේ පැවතිය යුතු බවත්, අමාත්‍ය මණ්ඩලයට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි තොරතුරු කල්වේලා ඇතිව ලබාදීමට කටයුතු කිරීමත්, රාජ්‍ය සමාගම්වල කාර්යයන් ඉටුකිරීමේදී මුදලට අගය සංකල්පය රැකෙන පරිදි මූල්‍ය කටයුතු මෙහෙයවීමත්, අදාළ නීති, රීති හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීමත් අවශ්‍ය බව හඳුනාගන්නා ලදි.

ඒ අනුව 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනිම සඳහා රැස්කරන ලද මුදල් කාර්යක්ෂමව හා ඵලදායී පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් මූල්‍යමය වශයෙන්

රු.මිලියන 689.9 ක මූල්‍යමය අලාභයක් සිදුවී ඇති බව නිගමනය කෙරේ.

## අනුරාධපුර මහා නගර සීමාව තුළ සිදුකරන ලද අනවසර ඉදිකිරීම් හේතුවෙන් ඇති වී තිබෙන බලපෑම පරීක්ෂා කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

ප්‍රධාන කෘෂි අලෙවි හා සේවා මධ්‍යස්ථානයක් හා ඓතිහාසික වටිනාකමකින් යුක්ත ලෝක උරුම නගරයක් වන වත්මන් අනුරාධපුර නගරය වර්ග කිලෝමීටර් 42.18 ක භූමි ප්‍රමාණයක් පුරා විහිදී යන අතර නගරය මැදින් ගලායන මල්වතු ඔයෙන් බටහිර කොටස පූජනීය නගරය ලෙසද නැගෙනහිර කොටස නව නගරය ලෙසද හඳුන්වයි. ග්‍රාම නිලධාරි වසම් 22 කින් සමන්විත නව නගරය හා පූජා නගරය යන දෙකම අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශ සීමාවට අයත්ය.

පූජනීය නගරය සංරක්ෂණය කිරීමටත්, පූජනීය නගරයේ ජනතාව නව නගරය තුළ පදිංචි කිරීමටත්, සැලසුම් කළ අනුරාධපුර ප්‍රථම නගර සංවර්ධන සැලැස්ම 1949 දී සකස් කරන ලදි. නැවත 2007 වර්ෂයේදී විවිධ භාවිතයන් සඳහා ඉඩම් වෙන් කිරීම් කලාප 11 ක් යටතේ වර්ගීකරණය කර “කලාපීයකරණය සැලැස්ම” ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු නියමතා හා කලාපීයකරණ රෙගුලාසි හඳුන්වාදීමට කටයුතු කර තිබුණි. තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් “නගර සංවර්ධන සැලැස්මකට” අනුව කටයුතු කළ යුතුය.

උක්ත සංවර්ධන සැලසුම් සකස් කර අනුමත කර තිබුණද එම සැලසුම්වලට පරිබාහිරව වැව් රක්ෂිත ප්‍රදේශවලද, වාරි කටයුතු සඳහා ජලය සපයන වාරිමාර්ග අවහිර වන පරිදිද, විජි මධ්‍යයේ සිට ගොඩනැගිලි රේඛාවට තිබිය යුතු අවම දුර නොසලකා හැරීමෙන්ද, අනවසර ඉදිකිරීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. කලාපීයකරණය සැලැස්ම හා කලාපීයකරණ රෙගුලාසි සැලැසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූලව අනුමත භාවිතයන් අනුගමනය කරමින් කටයුතු නොකිරීම නිසා හා තහනම් භාවිතයන් උපයෝගී කරගෙන සිදු කරනු ලබන අවභාවිතයන් හේතුවෙන් නාගරික සංවර්ධන සැලැස්ම වියවුල් වී ඇති අතර ඒ හේතුවෙන් නාගරික ප්‍රජාවගේ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද, ගමනාගමන අවහිරතා හා සාමකාමී ජන ජීවිතයට විශාල සමාජ ප්‍රශ්නයක් බවට පරිවර්තනය වී ඇත. එම ගැටළු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග තුළින් මෙම කාර්යය කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකමය මෙහෙවරක් බවට පත් කිරීමට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි කඩිනමින් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය සලකා මෙම විගණනය සිදුකරන ලදී.

## ලක්විජය බලාගාරයේ මෙහෙයුම් කටයුතු හා එහි පාරිසරික බලපෑම

වයඹ පළාතේ කල්පිටිය - නොරොච්චෝලේ ප්‍රදේශයේ පිහිටුවා ඇති මෙගාවොට් 900 ක ධාරිතාවයකින් යුත් ලංකා විදුලි බල මණ්ඩලයට අයත් ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම ගල් අඟුරු තාප බලාගාරය ලක්විජය ගල් අඟුරු තාප බලාගාරය වේ. 2006 වර්ෂයේදී මෙගාවොට් 300 කින් යුතු ප්‍රථම අදියරද, 2010 වර්ෂයේදී මෙගාවොට් 600 කින් යුත් දෙවන අදියරද ආරම්භ කරන ලද අතර 2011 හා 2014 වර්ෂයන්හි දී පිළිවෙලින් ප්‍රථම හා දෙවන අදියරවලින් මෙගාවොට් 900 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු වී ඇත. ශ්‍රී ලංකාවේ වර්තමාන විදුලිබල උත්පාදනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ප්‍රධාන බලාගාර 26 කින් (පුද්ගලික බලාගාර හැර) හා මුළු උප පොලවල් 247 ක් දායකත්වයෙන් සිදු කෙරේ. 2017 වර්ෂයේදී එසේ නිෂ්පාදනය කරන ලද මුළු නිෂ්පාදනය

ගිගාවොට් පැය 14,671.2 ක් වූ අතර මෙම නිෂ්පාදනය සඳහා ලක්විජය බලාගාරයේ දායකත්වය සියයට 34.78 ක් විය. විදුලිබල නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන මූලාශ්‍ර වන ජලය, ඉන්ධන හා ගල් අඟුරු අතුරින් ගල් අඟුරු මඟින් විදුලිය නිපදවීම දෙවන අවම සාමාන්‍ය ඒකක පිරිවැය සහිත මූලාශ්‍රය බව නිරීක්ෂණය විය.

මෙම බලාගාරයේ මෙහෙයුම් කටයුතු හා එහි පාරිසරික බලපෑම හඳුනාගැනීම අරමුණු කරගෙන මෙම වාර්තාව පිළියෙල කරන ලදී. 2015 වර්ෂයේදී වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් ලක්විජය තාප බලාගාරය සඳහා ප්‍රථම පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර තිබුණු අතර මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ මැදිහත් වීමක් සිදු කර නොතිබුණි. 2017/2018 වර්ෂය සඳහා බලපත්‍රය අළුත් කිරීම සඳහා බලාගාරය විසින් 2017 ජුනි 14 දින පළාත් පරිසර අධිකාරිය වෙත අයදුම්පත ඉදිරිපත් කර තිබුණද, 2018 මැයි 10 දින වන විටත් පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර නොතිබුණි. පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා බලාගාරයේ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳව පළාත් පරිසර අධිකාරියේ අවධානය ප්‍රමාණවත් පරිදි යොමු වී නොතිබීමත්, ඒ සඳහා වගකිව යුතු අනෙකුත් ආයතනවල අකාර්යක්ෂමතාවයත් හේතුවෙන් අහිතකර පාරිසරික බලපෑම් ඇති වී තිබුණු බවත් නිරීක්ෂණය විය.

ලක්විජය බලාගාරය මඟින් විදුලිය නිෂ්පාදන කාර්යයේදී යොදාගනු ලබන ප්‍රධාන අමුද්‍රව්‍ය වූ ගල් අඟුරුවල පැවතිය යුතු ගුණත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර නොතිබීම ද, ඇති වී තිබූ පාරිසරික ගැටළුවලට ප්‍රධාන හේතුවක් වී තිබුණි. එසේම ගල් අඟුරු දහනයේදී නිෂ්පාදනය වන පියාසර අළු හා යටි අළු වශයෙන් වූ අතුරු ඵල බැහැර කිරීමේ ක්‍රමවේදය ව්‍යාපෘති සැලැසුම් අදියරේදී හඳුනාගෙන තිබුණද, එම ක්‍රියාවලිය ප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පාරිසරික ගැටළු ඇති වීමත්, එම ගැටළු පාලනය සඳහා ක්‍රියාමාර්ග ගැනීමේදී බලාගාරය විසින් දැරිය යුතු පිරිවැය ඉහළයාමක් සිදුවන බවත්, නිරීක්ෂණය විය. පාරිසරික වශයෙන් ගැටළුවක් වූ පියාසර අළු අංගනයේ තැන්පත් කිරීම වෙනුවට, කඩිනම් ක්‍රියාමාර්ගයකින් අංගනයෙන් ඉවත් කර හඳුනාගත් වෙනත් නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් යෙදවීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. පළාත් පරිසර අධිකාරිය විසින් ප්‍රසිද්ධ කරන ලද සංසරණ වායු තත්ත්ව පිළිබඳ ප්‍රමිතවලට අනුකූලව බලාගාරයේ මෙහෙයුම් කටයුතු සිදුවන්නේද යන්න පළාත් පරිසර අධිකාරිය විසින් අඛණ්ඩව අධීක්ෂණය කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

ගල් අඟුරු දහනයේදී විමෝචනය වන පරිසර තත්වයන්ට හානිකර වායූන් හා බැර ලෝහ බැහැර කිරීමේ ක්‍රියාවලිය, බලාගාරයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සඳහා උපයෝගී කරගන්නා මුහුදු ජලය පිරිපහදුවෙන් පසු නැවත මුහුදට බැහැර කිරීමේ ක්‍රියාවලිය හා භූගත ජලය අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය. තවද විමෝචක වායු සම්බන්ධයෙන් විමෝචක වායු ගෙන්දගම් වියුක්තකයේත් පියාසර අළු සම්බන්ධයෙන් ස්ථිති විද්‍යුත් අවක්ෂේපකයේත් කාර්යක්ෂමතාවය අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු බව නිරීක්ෂණය විය. බලාගාරයේ නඩත්තු කටයුතු සැලැස්මකට අනුව සිදු කිරීම හා ගල්අඟුරු අංගනයේ ඇති දූවිලි අංශු සුළඟ සමඟ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ගල් අඟුරු අංගනය වටා දැනට පවතින සුළං බාධකය පුළුල් කිරීමත්, දැනට අංගනයේ ගොඩ ගසා ඇති අළු ගම්මානය දෙසට ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සිදුකළ යුතුය.

බලාගාරයේ ක්‍රියාකාරකම් තුළින් ධීවර ජනතාවට වන බලපෑම අවම කිරීමත්, මුහුදු

පතුල සමීක්ෂණ කටයුතු සිදුකිරීම මගින් ගල් අඟුරු තැන්පත් වී ඇති ප්‍රමාණයත්, එම තැන්පත්වීම් අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සැලැසුම් කිරීමත් කළ යුතු වේ. වෙරළ ඛාදනය අවම කිරීම හා වෙරළ තීරයේ ආරක්ෂාවට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කළ යුතු බව නිරීක්ෂණය කෙරෙන අතර ඉහත සඳහන් සියළු ක්‍රියාමාර්ග ගැනීමෙන් පාරිසරික හානිය අවම කරගනිමින් පරිසර හිතකාමී කර්මාන්තයක් ලෙස හා ජාතික ආර්ථිකයට එකතු කළ වටිනාකමක් සහිත විදුලිබල නිෂ්පාදන කර්මාන්තයක් වශයෙන් දායකත්වයක් ලබාදීමේ හැකියාව ඇති බව නිරීක්ෂණය කෙරේ.

## කොළඹ - නෙළුම් කුළුණ ඉදිකිරීම පිළිබඳව විගණකාධිපති විශේෂ වාර්තාව

විනෝද උයනක් ආශ්‍රිතව මීටර් 350 ක් උසැති බහුකාර්ය රූපවාහිනී හා විදුලි සංදේශ කුළුණක් ඉදිකිරීම සහ නිමකිරීම නමැති 2010 ඔක්තෝබර් 13 දින ඉදිරිපත් කරන ලද අංක PS/CP/44/2010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව පෑලියගොඩ ප්‍රදේශයේ හෙක්ටයාර් 8.0 ක වපසරියකින් යුතු භූමියක විනෝද උයනක්ද සමඟ මීටර් 350 ක් උසැති බහුකාර්ය විදුලි සංදේශ කුළුනක් ඉදිකිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබුණි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය සියළු සැලැසුම් සඳහා උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාගෙන තිබුණි.

ව්‍යාපෘතිය කොළඹ නගරයේ සංචාරක කේන්ද්‍රස්ථානයක් වෙත රැගෙන යාමේ හැකියාව සලකා බලමින් ව්‍යාපෘතිය පිහිටුවීම සඳහා වන භූමිය වශයෙන් කොළඹ 10, බේරේ වැවට මුහුණලා පිහිටි හෙක්ටයාර් 2.59 ක ප්‍රමාණයෙන් යුතු ඉඩමක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව නව ව්‍යාපෘති භූමියෙහි සංවර්ධන හැකියාව සැලකිල්ලට ගෙන අළුතින් සිදුකරන ලද සංශෝධන සහිතව අවසන් ඉදිකිරීමේ පිරිවැය එ.ජ.ඩොලර් 104,300,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ අතර ව්‍යාපෘතියෙහි මුල් සංකල්පය නොවෙනස්ව තබා ගනිමින් කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය (Colombo Lotus Tower Project) වශයෙන් නැවත නම් කර තිබුණි.

2012 නොවැම්බර් 12 දින ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය දින 912 කින් අවසන් කිරීමට නියමිතව තිබුණ අතර කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2017 ඔක්තෝබර් දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටද එහි ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවතුණි. එහිදී ව්‍යාපෘතිය ආරම්භයේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම, ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ඉඩම් කොටස් විධිමත්ව පවරා නොගැනීම, විදුලි සෝපාන සහ තරප්පුපෙල සඳහා වන උප කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ක්‍රියාවලියේ අවිධිමත් බව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීම සහ ගිවිසුම් ගත ණය මුදල සීමා වීම, ව්‍යාපෘතිය වාණිජකරණයට ලක් කිරීමේ ක්‍රියාවලියෙහි අවිනිශ්චිත බව හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන තිබූ මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම අඛණ්ඩව ප්‍රමාද වීම සඳහා සියළුම සම්බන්ධිත පාර්ශවයන්ගේ අවධානය යොමු විය යුතු බවට හඳුනා ගන්නා ලදී.

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් විශේෂ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 පරිච්ඡේදයේ 75 වන ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යවස්ථාදායකයේ බලය ලෙස දක්වා ඇත්තේ "අතීතයට බලපාන්නා වූ නීති හා ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයන් පරිච්ඡින්න කරන්නා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යම් විධිවිධානයන් එකතු කරන්නා වූ හෝ නීති ඇතුළුව නීති පැනවීමේ බලය පාර්ලිමේන්තුව සතු බවයි." මෙකී රජයේ ව්‍යවස්ථාදායක වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම පහසු කිරීම් සඳහා මූලික (නව) නීති (පනත්) කෙටුම්පත් කිරීම සහ සංශෝධනය කිරීම අනුනීති කෙටුම්පත් කිරීම හා ප්‍රතිශෝධනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වේ. අමාත්‍ය මණ්ඩල තීරණවල අන්තර්ගත වන රජයේ ප්‍රතිපත්තීන් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් රජයේ ව්‍යවස්ථාදායක වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය පහසු කිරීම සඳහා අවශ්‍ය දේශීය නීති රාමුව සැකසීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වේ. අමාත්‍ය මණ්ඩල තීරණවල අන්තර්ගත වන රජයේ ප්‍රතිපත්තීන් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් රජයේ ව්‍යවස්ථාදායක වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය පහසු කිරීම සඳහා අවශ්‍ය දේශීය නීතිරාමුව සැකසීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වේ.

මේ අනුව නීති කෙටුම්පත් සම්පාදනය යනු රටක සුවිශේෂී වූ ක්ෂේත්‍රයකි. එවැනි සුවිශේෂී ක්ෂේත්‍රයක කටයුතු කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක හා එකී කාර්ය මණ්ඩලවලට නීති සම්පාදන කුසලතා, දැනුම මෙන්ම අනෙකුත් නීති ක්ෂේත්‍රයන් පිළිබඳ දැනීමද අත්‍යාවශ්‍ය වේ. දේශිය හා විදේශීය නීති ක්ෂේත්‍රයන්හි සිදුවන්නා වූ වෙනස්වීම් පිළිබඳව යාවත්කාලීන වීම අත්‍යවශ්‍ය වනුයේ යම් නීතියක් කෙටුම්පත් සම්පාදනයේදි අදාළ යෝජිත නීතිය හා ඒ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් හා අවබෝධයක් නීති කෙටුම්පත් සම්පාදකවරයා සතුවීම වැදගත් වන හෙයිනි.

එසේම නීතියක් කෙටුම්පත් කිරීමේ මූලික අවස්ථාවේ සිට එය පාර්ලිමේන්තුවේ සම්මත වීම දක්වා වන ක්‍රියාවලිය තුළදී ඊට සම්බන්ධිත අනෙකුත් ආයතනවල සම්බන්ධතාවය ද ඒ හා සමානව වැදගත්ය.

නීති කෙටුම්පත් සම්පාදන කාර්යයන්හි ලා අත්දැකීම් හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් වර්තමානය දක්වාම සම්පූර්ණ කර ගැනිමට නොහැකි වී තිබීම, රාජ්‍ය ප්‍රතිපත්ති පනතක් ලෙස කෙටුම්පත් කිරීමට අදාළ අමාත්‍යංශවලින් පනවනු ලබන ඉල්ලීම්වල ප්‍රතිපත්ති වරින්වර වෙනස් කිරීම හා අවසාන ප්‍රතිපත්තියක් නොමැති වීම, කුසලතා දැනුම හා අත්දැකීම් සපිරි පළපුරුදු නීතිඥවරුන්ගේ සේවය කොන්ත්‍රාත් පදනම මත හෝ ලබාගැනීම සඳහා ඇති බාධා, සමාන සේවා අතර වැටුප් පිළිබඳ පවතින විෂමතා, පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ලක අවශ්‍යතාව, දේශීය හා විදේශීය පුහුණු වීම් සඳහා වැඩි අවස්ථා ලබාදීම, කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පතක් වශයෙන් භාරදී නීතිපති හා අනෙකුත් දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුව ලබාදෙන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම වැනි ගැටළු වෙනුවෙන් සාධනීය අවධානය යොමුවිය යුතුය.

නීතිය කාලීනව යථාවත්වීම වර්තමානයේදි දැඩි සමාජ අවශ්‍යතාවයක් ව පවතී. නව නීති ප්‍රකාශයට පත්කිරීම සහ රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයේ වර්තමාන අවශ්‍යතා සපුරාලීමට අනුකූල නොවන පවත්නා නීති අතිවිශාල ප්‍රමාණයක් සංශෝධනය විය යුතු වීම මෙකී සමාජ අවශ්‍යතාවයයි. එසේම රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කර පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම දැඩි කාලීන අවශ්‍යතාවයක්ව පවතින පසුබිමක නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ

කාර්යසාධන ප්‍රගතියේ දුර්වලතාවය එකී සමාජ අවශ්‍යතාවය කාලීනව ඉටු කිරීමේ බලාපොරොත්තු බිඳ දමා ඇත.

රට තුළ සමාජ, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහිලා කාලීනව සකස් විය යුතු, සංශෝධනය විය යුතු, නීතින් සම්පාදනය වීමේ ප්‍රමාදයක් වේ නම් එය හඳුනා ගැනීම සඳහා අදාළ පියවර ගැනීමට ඒ ඒ සම්බන්ධිත අංශයන් වෙත පණිවිඩයක් ලබාදීම මෙම විගණනයේ අරමුණ විය.

### ශ්‍රී ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය හා වෙළෙඳපොළ තත්ත්වය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාවේ කළු ගම්මිරිස් සඳහා ලෝක වෙළඳපලේ ඉහළ ඉල්ලුමක් පවතින අතර මේ හේතුවෙන් අනෙකුත් රටවල ගම්මිරිස්වලට සාපේක්ෂව ඉහළ මිලක් ශ්‍රී ලංකා ගම්මිරිස් සඳහා ලැබුණි. ශ්‍රී ලංකාවේ ගම්මිරිස්වල අඩංගු පිපරයින් (Peparine) රසායනිකය වෙනත් රටවල කළු ගම්මිරිස්වලට වඩා වැඩි ප්‍රමාණයක් අන්තර්ගත වී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. එබැවින් යුරෝපීය රටවලින් හා මැදපෙරදිග රටවලින් වැඩි ඉල්ලුමක් ශ්‍රී ලංකාවේ කළු ගම්මිරිස් සඳහා පැවති අතර මෑත කාලීනව දේශීයව ගම්මිරිස් මිල ගණන් සීඝ්‍රයෙන් පහළ වැටී තිබුණි. එය 2015 වර්ෂයේදී දේශීයව ගම්මිරිස් කිලෝ ග්‍රෑමයක් රු. 1,200 ක සිට රු.1,400 ක් දක්වා පරාසයක මිලක් නියම වී තිබුණ ද, 2016 වර්ෂයේ සිට එම මිල සීඝ්‍රයෙන් පහළ බැසීමට පටන් ගෙන තිබුණි. වර්තමානයේ කිලෝ ග්‍රෑමයක මිල රු.600 ක සිට රු.800 ක් දක්වා වූ පරාසයක වූ අතර විදේශීය වෙළඳපල තුළ ද 2015 වර්ෂයේදී රු.1,200 ක සිට රු.2,300 ක් දක්වා මිල පරාසයක් පැවතියද, 2018 වර්ෂයේදී එම මිල ගණන් රු.800 ක සිට රු.1,200 දක්වා මිල පරාසයක් දක්වා පහත වැටී තිබුණි.

එබැවින් නව ගම්මිරිස් නිෂ්පාදකයින් වෙළඳපලට ප්‍රවේශවීමට අකැමැති වූ අතර වර්තමාන නිෂ්පාදකයින් මුහුණ දී ඇති ගැටළු හේතුවෙන් නිෂ්පාදනයෙන් ඉවත් වීමටද කටයුතු කරන ලදී. එලෙස දේශීය වෙළඳපල තුළ ගම්මිරිස් මිල පහළ යාමට හේතු පරීක්ෂා කිරීමටත්, එසේ පහළ යාම හේතුවෙන් ඇති වූ ආර්ථික හා සාමාජයීය ගැටළු හඳුනාගැනීම සඳහාත් මෙම වාර්තාව පිළියෙල කරන ලදී. මේ සඳහා රේගු දෙපාර්තමේන්තුව සතු ආනයන හා අපනයන දත්ත, වාණිජ මණ්ඩලය සතු දත්ත සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සතු දත්ත භාවිතා කරන ලද අතර අදාළ පාර්ශව සමඟ පළමුව සාකච්ඡා පැවත් වීම ද කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාව භාවිතා කර ඇති භූමි ප්‍රමාණයට සාපේක්ෂව ලබාගන්නා නිමවුම ප්‍රමාණවත් නොවීම, අස්වනු නෙලන කාලය තුළ දී අඩු මිල ගණන් යටතේ රටවල් කිහිපයකින් පමණක් වැඩි වශයෙන් ගම්මිරිස් ආනයනය කිරීම, ඉහළ මිලක් ලබා දෙනු ලබන මැද පෙරදිග හා බටහිර රටවලට කරන ලද අපනයන සීමා කර අඩු මිල ගණන් ලබා දෙන ඉන්දියාවට මුලු අපනයනයෙන් සියයට 85 ක් පමණ අපනයනය කිරීම හා දේශීය ගොවීන්ට ගම්මිරිස් කිලෝ ග්‍රෑම් එකක් සඳහා ලබාදුන් මිල ගණන් සීඝ්‍රයෙන් පහළ යාම මෙම ගැටළුවලට හේතු වී ඇති බව හඳුනා ගන්නා ලදී.

ගම්මිරිස් ආනයනයේදී ලබාදුන් බදු සහන අත්හිටුවීමට කටයුතු කිරීම, රට තුළ ගම්මිරිස් නිෂ්පාදනය, පරිභෝජනය අපනයන හා අතිරික්තය පිළිබඳව සලකා බලා ආනයන ප්‍රතිපත්තිය තීරණය කිරීම, අඩු මිල ගණන් යටතේ ගුණත්වයෙන් පහළ ගම්මිරිස් රටවල් කිහිපයකින් පමණක් ආනයනය කිරීම අත්හිටුවීම හා ගම්මිරිස් වෙළඳපල සඳහා ශ්‍රී ලංකාවට ඉහළ මිල ගණන් ලබාදුන් වෙළඳපොල කොටස නැවත අත්පත් කර ගැනීමට කටයුතු කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම තුළින් මෙම තත්ත්වය මඟහරවා ගත හැකි බව හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද,

පසුගිය කාලපරිච්ඡේදය තුළ ගම්මිරිස් ආනයනය සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබීමත්, ඉහළ මිලක් ලබාදෙන රටවලට සිදුකරනු ලබන අපනයනයන් පහළ ගොස් තිබීමත් සම්බන්ධයෙන් රජයන් විසින් හෝ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන විධිමත් කිරීම සඳහා ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුකර නොමැති බව නිගමනය කරමි.

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමින්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් විවිධ තනතුරු නාම නමින් ලියාපදිංචි කළ වාහන 5,556 ක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව තහවුරු වූ අතර අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව එම ප්‍රමාණය 5,792 ක් විය. තවද, අමාත්‍යාංශයේ වාහන ලේඛනයේ ඇතුළත් වාහන 1,794 ක භෞතික පැවැත්ම තහවුරු කරගැනීමට ද අමාත්‍යාංශයට නොහැකිවී තිබුණි. මෙම තත්ත්වය මත අමාත්‍යාංශය සතු වාහනවල අයිතිය, පැවැත්ම, ලේඛනගත කිරීම, භාවිතය හා නඩත්තු කිරීම, වාහන පරිපාලන ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනය ඇතුළු වාහන කළමණාකරන ක්‍රියාවලිය පිළිබඳ විගණන නිරීක්ෂණ ඉදිරිපත් කිරීම මෙම වාර්තාව නිකුත් කිරීමේ අරමුණ විය. අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය භාරව කටයුතු කරන අධ්‍යක්ෂ (ප්‍රවාහන) ගෙන් හා අදාළ කාර්ය මණ්ඩලයෙන් ලබා ගත් ලිඛිත තහවුරු කිරීම් විශ්ලේෂණය කිරීම හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද වාහන පිළිබඳ තොරතුරු විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීම සිදු කරන ලදී. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ නමුත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන ලේඛනයේ නොමැති වාහන 202 කින් භෞතික පැවැත්ම සනාථ නොවූ මෝටර් රථ හා යතුරු පැදි සංඛ්‍යාව 171 ක් විය. එසේම බාහිර පාර්ශව වෙත පවරා තිබුණු බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විගණනය විසින් තහවුරු කරගත් මෝටර් රථ හා යතුරු පැදි 259 ක්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු නමින් ලියාපදිංචි කර ඇති මෝටර් රථ හා යතුරු පැදි 158 ක් හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී නොමැති බවට විගණනය විසින් අනාවරණය කරගත් මෝටර් රථ 11 ක් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුළත්ව පැවතුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකිවූ මෝටර් රථ 679 ක් හා යතුරුපැදි 1,115 ක් වශයෙන් මුළු වාහන 1,794 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විධිමත් භෞතික පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර අමාත්‍යාංශය සතුව පවතින බවට ලේඛන ගතකර තිබුණු මෝටර් රථ හා යතුරු පැදිවලින් මෝටර් රථ 1,239 ක හා යතුරු පැදි 2,795 ක ස්ථාන ගත කිරීම් හඳුනා ගැනීමට විගණනයටද නොහැකි විය. තවද අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරයාට හිමි ඉන්ධන දීමනාව ඉක්මවා 2017 වර්ෂය තුළදී අමාත්‍යවරයාට හා එම කාර්යාලයට වෙන්කළ වාහන සඳහා රු.2,360,550 ක ඉන්ධනද, නියෝජ්‍ය අමාත්‍යවරයාට හා එම කාර්යාලයට වෙන් කළ වාහන සඳහා රු.4,266,280 ක ඉන්ධනද, අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණි.

වාහන 1,794 ක් අස්ථානගතවී තිබීම, අමාත්‍යාංශය සතුව පැවති බාහිර පාර්ශව වෙත පවරා තිබුණු වාහන 177 ක පැවරීම්වල නීත්‍යානුකූලභාවය තහවුරු නොවීම හා හිඟ වාහන 202 කින් වාහන 171 ක පැවැත්ම හෝ වෙන්දේසි කළ බව තහවුරු නොවීම හේතුවෙන් නිශ්චිතව ගණනය කළ නොහැකි

අලාභයක් සිදුවී ඇති බවත්, අමාත්‍යාංශය සතුව පවතින 5,792 ඉක්මවූ වාහන ඇණිය කළමනාකරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් හඳුන්වාදීමට හා ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබීම හේතුවෙන් එවැනි අලාභ තවදුරටත් සිදුවෙමින් පවතින බවත්, විෂයභාර අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හා අදාළ කාර්ය මණ්ඩලයට චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වාහන හා ඉන්ධන ලබාදීම මගින් රජයේ වාහන බැහැර කිරීමේ ක්‍රියාදාමයට පටහැනිව වාහන විකිණීම මගින් රජයට පාඩු සිදුකිරීම පිළිබඳවත් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, ප්‍රවාහන අංශය භාරව සිටි නිලධාරීන් හා ඒ සම්බන්ධයෙන් අදාළ අනෙකුත් පාර්ශවයන් වගකිව යුතු වනු ඇත. ඒ අනුව මෙම තත්ත්වය කළමණාකරනය කිරීම සඳහා හා රජයට සිදු වූ අලාභයන් පියවා ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම මෙම වාර්තාවේ නිර්දේශ මගින් පෙන්වා දී ඇත.

### භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය භාවිතා ඇගැයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

1885 අංක 26 දරන දුම්රිය ආඥා පනත, 1902 අංක 09 දරන ආඥා පනත හා එම පනතෙහි සංශෝධනයන්ට අනුව දුම්රිය දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදු කරනු ලබන අතර එම කාර්යය ආරම්භ කර 2018 වර්ෂය වන විට වර්ෂ 151 ක් ගත වී ඇත.1867 වර්ෂයේ සිට 1934 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී දුම්රිය දෙපාර්තමේන්තුවෙහි සමස්ත ආදායමෙන් භාණ්ඩ ප්‍රවාහනය මගින් සියයට 57 ක ආදායමක් උපයා තිබුණු අතර එය 2017 වර්ෂය වන විට සියයට 9.3 දක්වා පහළ වැටී තිබුණි. තවද 1968 වර්ෂය වන විට භාණ්ඩ ප්‍රවාහන වෙළඳපොල කොටසින් සියයට 38 ක් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පැවති නමුත් වර්තමානය වන විට එය සියයට 0.3 දක්වා පහළ වැටී තිබුණි. තවද භාණ්ඩ ප්‍රවාහනය සඳහා මාර්ග පද්ධතිය භාවිතා කිරීම හේතුවෙන් පාරිසරික ගැටළු ද මතු වී ඇති බව හඳුනාගන්නා ලදී. ඒ අනුව දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂමවත්, ඵලදායිවත් සිදු නොවීම හේතුවෙන් ආදායමට වූ බලපෑම මෙන්ම පාරිසරික, සමාජ හා ආර්ථික බලපෑම ඇගයීම සඳහා මෙම වාර්තාව සකස් කරන ලදී. මෙම වාර්තාව සකස් කිරීමේදී අදාළ අණපනත් හා චක්‍රලේඛ ඇතුළු ලේඛන පරීක්ෂා කිරීම ද, පදනම් වූ දත්ත විශ්ලේෂණය කිරීම හා භෞතික පරීක්ෂා මගින් තොරතුරු රැස්කර ගන්නා ලදී.

පළමු පන්තියේ හා දෙවන පන්තියේ භාණ්ඩ ප්‍රවාහනය සියයට 80 ක් පමණ අත්හැර දමා තිබීම, භාණ්ඩ ප්‍රවාහනයට අදාළ නීති අවශ්‍ය පරිදි සකස් නොවීම, ප්‍රාදේශිය අවශ්‍යතාවයන්ට අනුව ඉන්ධන ප්‍රවාහනය නොකිරීමත්, ඉන්ධන ප්‍රවාහනයෙන් සියයට 60 ක වෙළඳපොල කොටස අත්හැර තිබීම, මහාමාර්ග මගින් භාණ්ඩ ප්‍රවාහනය හේතුවෙන් පාරිසරික ගැටළු ඇති වී ඇති බව හඳුනාගත හැකි විය. ඒ අනුව භාණ්ඩ ප්‍රවාහනය සඳහා සේවාස්ථ පහසුකම් ස්ථාපනය කිරීමට ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම ඇතුළු වාර්තාවේ 10 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති ක්‍රියාමාර්ග ගත යුතු බව හඳුනාගන්නා ලදී.

### සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණයෙන් සංවර්ධනය කරන ලද කර්මාන්ත පිළිබඳ විශේෂ විගණන වාර්තාව.

1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ පිහිටුවා ඇති සබරගමුව පළාත් සභාව අමාත්‍යාංශ 05 කින් සහ දෙපාර්තමේන්තු ඇතුළත් වැය ශීර්ෂයන් 27 කින් සමන්විත වේ. අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට පසුව වාර්ෂිකව වැඩිම

ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් හිමි අමාත්‍යාංශය ලෙස පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වී තිබුණි.

මෙම අමාත්‍යාංශය සබරගමුව පළාතට අයත් රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා, සංචාරක සහ යෞවන කටයුතු සංවර්ධනය මූලික කරගනිමින් තම කාර්යයභාරයන් සැලැසුම් කර අදාළ පරිදි ක්‍රියාකාරී ආයතන 65 ක අධීක්ෂණය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. යථෝක්ත කර්තව්‍යන් ඉටුකිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී පළාත් නිශ්චිත කාර්යය ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන, සාමූහික ප්‍රදාන සහ පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.මිලියන 1,535.42 ක් (රු.මිලියන 695.88 ක අවිච්ඡේද ව්‍යාපෘති 541 ක් ඇතුළත්ව) වෙන්කර තිබූ අතර එයින් රු.මිලියන 664.12 ක ප්‍රතිපාදන එනම්, සියයට 43 ක ප්‍රතිපාදන ඇඹිලිපිටිය බල ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් වෙන්කර තිබුණි. එම වටිනාකම තුළ ඇතුළත් රු.මිලියන 566.34 ක් එනම්, සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් යොදවා ව්‍යාපෘති 380 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත වගකීම පවරා තිබුණි. එම වටිනාකම 2017 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා වෙන්කරන ලද රු.මිලියන 79.87 ක සමස්ථ ප්‍රතිපාදනයෙන් දෙගුණයකට අධික වන අතර රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 44 ක ප්‍රමාණයකි.

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍රයන් වෙනුවෙන් විශේෂ හඳුනාගැනීමකින් තොරව ව්‍යාපෘති සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබුණි. එය අවධානම් ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගැනීම මෙම වාර්තාව පිළියෙළ කිරීම සඳහා මූලිකව හේතු වූ අතර එම ව්‍යාපෘතිවලින් ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 112.09 ක් වූ ව්‍යාපෘති 57 ක කටයුතු භෞතික පරීක්ෂාවට භාජනය කෙරුණි.

පළාත් මාර්ග අමාත්‍යාංශය ක්‍රියාකාරි ආයතනවල භෞතික සහ මානව සම්පත් ධාරිතාවය පිළිබඳ ඇගයීමකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පවරා දී තිබීම එම අවභාවිතාවන් සහ අකාර්යක්ෂමතා සඳහා හේතු වී තිබුණි. ඒ අනුව රු.මිලියන 17.87 ක සාවද්‍ය ගෙවීම්ද, රු.මිලියන 4.16 ක නිෂ්කාර්ය වියදම්ද මෙම වාර්තාව මඟින් නිරීක්ෂණය කර ඇත. එමෙන්ම රු.මිලියන 6.81 ක ගෙවීම් විගණන නිරීක්ෂණ හේතුවෙන් අත්හිටුවා ඇත. පළාත් මාර්ග අමාත්‍යාංශයේ මෙහෙවරට අනුගත වෙමින් පළාත තුළ ජනතාවට සමානාත්මතාවයෙන් යුක්තව පහසුකම් සැපයීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රමවත් අධීක්ෂණයකට සහ පසුවිපරමකට ලක්කළ යුතු බව හඳුනාගන්නා ලදී.

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ විශේෂ වාර්තාවක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පෙනී ගිය අතර, ඒ අනුව ඉහත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවට අමතර වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ වාර්තාවක් 2018 පෙබරවාරි 02 දින නිකුත් කරනු ලැබීය. මෙම වාර්තාවේ අරමුණ 2005 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයේ ශ්‍රී ලංකා ජනරජයේ ණය

කළමනාකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වේ. එසේම විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව, එම වාර්තාවේ ඇතුළත් කරුණුවලට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

- උක්ත මූල්‍ය ප්‍රකාශන ජනරජයේ මූල්‍ය ප්‍රකාශන ලෙස නම් කර තිබුණද, තවදුරටත් මෙම මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ අරමුදලේ ගනුදෙනුවලට පමණක් සීමාවී තිබුණි. ඒ අනුව, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය ව්‍යවසායන් සහ ජනරජයට අයත් හෝ රජයේ පාලනය යටතේ පවතින වෙනත් ආයතනවලට අයත් ගනුදෙනු හා සිද්ධීන් සහ වත්කම් හා වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම.

- විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවීමට තිබූ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය ආසන්න වශයෙන් රු.මිලියන 11,467,254 (රු.මිලියන 11,467,254 = මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ණය ශේෂය රු. මිලියන 11,276,281 + මහ බැංකු අත්තිකාරම් රු.මිලියන 198,633 - කල්බදු ණය හිමියන් රු.මිලියන 7,660) ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශනවලට අනුව ගිණුම්ගතකර තිබූ මුළු වත්කම්වල වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 1,911,617 ක් පමණ විය. මුළු ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණවත් ලෙස හා ඇස්තමේන්තුගත පරිදි ආයෝජන කාර්යයන් සඳහා උපයෝජනය නොකිරීම හා ඉන් ජනිත වන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම ආදිය මීට ආසන්න හේතුව වී තිබීම.

- රටේ ණය බර ඉතා සීඝ්‍රයෙන් ඉහළ යමින් තිබුණද, ඊට සාපේක්ෂව මූල්‍ය නොවන වත්කම් ඉහළ ගොස් නොතිබීම.

- රජය විසින් ලබාගනු ලබන මුළු ශුද්ධ ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් දෛනික අවශ්‍යතා (පුනරාවර්තන ස්වරූපයේ වැය) සඳහා භාවිතා කර තිබීම.

- ඒකපුද්ගල ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වීම.

- සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව සත්‍ය මූල්‍යකරණය (අයවැය හිඟය පියවීම) අඩු වීම හා ඊට අනුරූපීව 2018 වර්ෂයේ අපේක්ෂිත මුළු ණය ගැනීම් පහළ යාම.

- මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැති ණය ශේෂ පැවතීම.

- උපලබ්ධි වූ නමුත් ප්‍රතිපාදන නොමැතිවීම මත ගිණුම්ගත නොකළ විදේශ ණය පැවතීම.

ඉහත කරුණු හේතුවෙන් දීර්ඝ කාලයක් මුළුල්ලේ රාජ්‍ය ණය කළමනාකරණය ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය වූ අතර, රාජ්‍ය ණය ශේෂය ඉහළ යාම පාලනය කර ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස හඳුනාගත හැක. තවද, ලබා ගනු ලබන රාජ්‍ය ණය කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකභාවයෙන් යුතුව භාවිතා කිරීම හා එසේ භාවිතා කරන බව සහතික කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම කළමනාකරණයේ වගකීමක් වේ.

එසේම, රජය විසින් සිදුකරනු ලබන සියලුම දේශීය හා විදේශ ණය ගැනීම් හා රජයට ලැබෙන අනෙකුත් ලැබීම් මධ්‍යගත

ආයතනයක අනුමැතිය යටතේ සිදු කිරීම සහ ඕනෑම මොහොතක රාජ්‍ය ණය ශේෂය නිවැරදිව, සම්පූර්ණ ලෙස, නිවැරදි වර්ගීකරණයන් යටතේ හා නිවැරදි ගිණුම් කාලපරිච්ඡේදයන් අනුව හඳුනාගත හැකි පරිදි ගිණුම්ගත කිරීම සඳහා සුදුසු ගිණුම් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයක් හඳුන්වා දීමේ වගකීම කළමණාකරණය සතුවේ.

## විදේශ රැකියා ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්ත්වය අධ්‍යයන කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට සාපේක්ෂව ඉහළ දායකත්වයක් හිමි කරගෙන තිබෙන විදේශ රැකියා ක්ෂේත්‍රය වර්තමානය වනවිට ගැටළු රාශියකට මුහුණ දී ඇත. එබැවින් විදේශ රැකියා ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්ත්වය අධ්‍යයන කිරීම සඳහා විශේෂ විගණනයක් සිදු කරන ලද අතර එම කරුණු මත පදනම්ව මෙම විගණන වාර්තාව සකස් කරන ලදී. මෙම විගණනය දේශිය රැකියා වෙළෙඳපළේ ඇති සීමාකරී සාධක විදේශ රැකියා වෙළෙඳ පළේ ඇති වාසිදායක තත්ත්වයන් අත්කර ගැනීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම සහ ශ්‍රී ලංකික වෘත්තිකයන් විදේශ රැකියා සඳහා යොමු වීමට පෙළඹවීම අධෛර්යමත් කරන විදේශ රැකියා ක්ෂේත්‍රයේ පවතින ගැටළු, සීමාවන් හා ඌනතාවයන් පිළිබඳ ගැඹුරින් අධ්‍යනය කර ඒ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකිවන ආකාරයකට සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා අවශ්‍යය තොරතුරු ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ පාර්ශවයන් හා ආයතනවලින් මෙන්ම ප්‍රසිද්ධ කරන ලද සහ නොකරන ලද මාර්ගවලින් ලබා ගන්නා ලදී. ඊට අමතරව පොත්පත් පරිශීලනය,සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ භෞතික පරීක්ෂාවන් ද සිදු කරන ලදී. එම පරීක්ෂාවන්ට අනුව රැකියා ඇණවුම්වල මෙන්ම රැකියාගත කිරීම්වලද පසුගිය කාල පරිච්ඡේදය මුළුල්ලේ විශාල බිඳවැටීම් නිරීක්ෂණ වූ අතර සමස්ථයක් ලෙස ගත්විට සියලුම ක්ෂේත්‍රවල අවම වශයෙන් සියයට 55 කට වැඩියෙන් රැකියා අවස්ථා ශ්‍රී ලංකාවට අහිමි වී තිබුණි. තවද විදේශ රැකියා ඉපැයීම් සංයුතිය, දායකත්වය සහ ජාතික සංඛ්‍යා දත්තවලට ඇතුළත් නොවූ විදේශ විනිමය ඉපයීම් විස්තර කර ඇති අතර දේශීය වෙළඳපොලේ පවතින පුහුණු ශ්‍රමබලකායෙහි ඌනතාවය ජාත්‍යන්තර රැකියා වෙළඳපොලේ වාසිදායක තත්ත්වයන් ශ්‍රී ලංකාවට අත්කර ගැනීමට බාධාවක්ව පවතින බව මෙන්ම විදේශ රැකියා වෙළෙඳපළ තුළ පවතින ගැටළු රාශියක් වාර්තාව මඟින් හඳුනා ගන්නා ලදී.

මෙම ගැටළු සඳහා ප්‍රධාන වූ සාධකය දේශීය වෙළඳපොල තුළ පුහුණු ශ්‍රම බලකාය වර්ධනය කර අතිරික්ත ශ්‍රමය අපනයනය කිරීමෙන් රටතුළ පුහුණු ශ්‍රම බලකාය තුලිත කර ගැනීමටත්, බිහිකරනු ලබන අතිරික්ත පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රම බලකාය විදේශ වෙළඳපොල වෙත යොමු කර සමාජගත ගැටළු අවම කිරීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරූ හා නායකත්වය ලබා දෙන රාජ්‍ය ආයතනයක් නොමැති වීමත් බව හඳුනා ගන්නා ලදී.

තවද, සෞඛ්‍ය, හෝටල්, ඉදිකිරීම්, ඉංජිනේරු වැනි ක්ෂේත්‍ර සඳහා වෘත්තිය පුහුණු අවස්ථා පුළුල් කිරීම තුළින් එම අංශයන්ගෙන් විදේශ රැකියා සඳහා යොමු කරන වෘත්තිකයන් පිරිස ඉහළ නැංවීමට සැලසුම් කිරීම,දේශීය මෙන්ම විදේශ රැකියා සඳහාද ගැළපෙන පරිදි වෘත්තිය පුහුණු වැඩසටහන් සකස් කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, විදේශගතවන්නන්ගේ ආරක්ෂාව තහවුරුවන පරිදි 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම, විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමනය ස්වාධීන

ආයතනයකට පැවරීම, විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් තෝරාගැනීම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුකිරීම ඇතුළු එම වාර්තාවේ 08 වන පරිච්ඡේදයේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ.

## සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් 2013 හා 2014 වර්ෂයන්හිදී එළඹ තිබූ A350-900 ගුවන්යානා 08ක් අත්පත් කර ගැනීමේ ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් සිදු කළ පරීක්ෂණයේ අවසන් වාර්තාව

2008 වර්ෂයේදී එමිරේට්ස් සමාගම විසින් ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමේ කළමනාකරණයෙන් ඉවත්වන විට සමාගමේ මෙහෙයුම් අලාභය රු. මිලියන 4,428 ක් විය. ඒ අවස්ථාව වන විට සමාගම විසින් A 320 වර්ගයේ ගුවන්යානා 05 ක්, A 330-200 වර්ගයේ ගුවන්යානා 04 ක් හා A 340-300 වර්ගයේ ගුවන්යානා 05 ක් ලෙස මුළු ගුවන්යානා 14 ක් ධාවනයේ යොදවමින් පැවතුණි.

සමාගම විසින් 2011 වර්ෂයේදී 2010/2011 වර්ෂයේ සිට 2014/2015 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාල සීමාව සඳහා වූ ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම සැලැස්මෙහි එක කාර්යභාරයක් ලෙස සමාගම සතුව පැවති 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ජීවිත කාලය ඉකුත් වීම නිසා භාවිතයෙන් ඉවත් කිරීමට නියමිත වූ පටු බඳ ගුවන්යානා 13 ක් වෙනුවට වෙනත් ගුවන්යානා ලබා ගැනීමේ අවශ්‍යතාවය දක්වා තිබුණු අතර එය ගුවන්යානා ප්‍රතිස්ථාපන වැඩසටහන (Re-fleeting Programme) ලෙස හඳුන්වා දී තිබුණි.

එහිදී, සමාගමේ කළමනාකරණය විසින් 2013 වර්ෂයෙ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ඉවත් කරන ගුවන්යානා 13 ක් වෙනුවට අලුත්ම පුළුල් බඳ ගුවන්යානා 14 ක්, ධාවනයට එකතු කර ගැනීමට තීරණය කර තිබුණි. මේ යටතේ A 330-300 වර්ගයේ නව ගුවන්යානා 06 ක් හා 2013 වර්ෂයේදී අළුතෙන්ම හඳුන්වා දෙන ලද A 350-900 වර්ගයේ ගුවන්යානා 04 ක් මෙහෙයුම් කල්බදු පදනම මත ලබා ගැනීමටත් තවත් එම වර්ගයේම ගුවන්යානා 04 ක් නිෂ්පාදකයා වෙතින් මිලදී ගෙන නැවත විකුණා මෙහෙයුම් කල්බදු පදනම මත ලබා ගැනීමටත් තීරණය කර තිබුණි. මේ අනුව A 330-300 වර්ගයේ ගුවන්යානා 06 2014/2015 වර්ෂයේදී විකිණීම හා ආපසු මෙහෙයුම් කල්බදු ලබා ගැනීම් පදනම මත ලබාගෙන තිබුණි. තවද සමාගම විසින් නිෂ්පාදක සමාගම සමඟ A 350-900 වර්ගයේ ගුවන්යානා 04 ක් මිලදී ගැනීම සඳහා 2013 ජුනි 28 දින ගිවිසුමකට එළඹ තිබූ අතර එම වර්ගයේ තවත් ගුවන්යානා 04 ක් මෙහෙයුම් කල්බදු පදනම මත ලබාගැනීම සඳහා 2013 සැප්තැම්බර් 27 දින හා 2014 නොවැම්බර් 12 දින ගිවිසුම් වලට එළඹ තිබුණි.

2015 වර්ෂයේදී සමාගම විසින් ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් නැවත සකස් කර 2015 ජුනි 24 දින අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරගෙන තිබුණි. එම සැලැස්ම අනුව ගුවන් සේවා සමාගම වෙත ඒ වන විට මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබූ A 350-900 ගුවන්යානා 08 ධාවනයට එකතුකර නොගැනීමට යෝජනා කර තිබුණි. මේ අනුව මෙහෙයුම් පදනම මත ලබා ගැනීමට නියමිත A 350-900 වර්ගයේ ගුවන්යානා 04 සඳහා ගිවිසුම්ගතව තිබූ කල්බදු සමාගම් සමඟ සාකච්ඡා පවත්වා යම් සාධාරණ විසඳුමකට පැමිණීමට උපදේශන

සමාගම්වල සහාය ලබා ගැනීමට 2015 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම කාර්යය සඳහා සමාගම විසින් විදේශීය උපදේශන සමාගමක සහාය ලබා ගෙන තිබුණු අතර ඊට අමතරව මුදල් අමාත්‍යාංශය විසින් අනුයුක්ත කරන ලද විදේශීය උපදේශන සමාගමක සහායද ලබාගෙන තිබුණි. මේ අනුව ගුවන්යානා ප්‍රතිස්ථාපන වැඩසටහන යටතේ උපදේශකවරුන්ගේ සහායද සහිතව මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලබා ගැනීමට ගිවිසුම්ගත වුවද, A 350-900 වර්ගයේ ගුවන්යානා 04 හි අවශ්‍යතාවයක් වර්තමානය වන විට නොමැති බැවින් 2016 වර්ෂයේදී සමාගම විසින් අවසන් කිරීමේ ගිවිසුම්වලට කල්බදු සමාගම සමඟ ගිවිසුම්ගත වූ අතර වන්දි මුදල ලෙස ඇමරිකන් ඩොලර් මිලියන 171.77 ක් ගෙවීමට එකඟ වී තිබුණි. කෙසේ නමුත් මෙහෙයුම් කල්බදු සමාගම සමඟ එළඹ තිබූ අවසන් කිරීමේ ගිවිසුම ප්‍රකාර කොන්දේසිවලට යටත්ව ඇමරිකන් ඩොලර් මිලියන 56ක් ඉවත් කරගෙන මුළු වන්දි මුදල ලෙස ඇමරිකන් ඩොලර් මිලියන 115.77 ක් එනම් රු.මිලියන 16,924 ක් 2016 හා 2017 වර්ෂවලදී සමාගම විසින් ගෙවා තිබුණි. තවද සමාගම විසින් 2015 වර්ෂයේදී A 330-300 වර්ගයේ ගුවන්යානා 02 කට සවි කිරීමට එකඟව සිටි VIP කට්ටල ගිවිසුම ද අවලංගු කර තිබුණි.

එමෙන්ම, A 350-900 වර්ගයේ ගුවන්යානා 04 ක් නිෂ්පාදකයාගෙන් සෘජුවම මිලදී ගැනීම සඳහා එළඹ තිබූ ගිවිසුම අවසන් කිරීමේ සාකච්ඡා වාර්තාවේ දින වන තෙක් සිදු කෙරෙමින් පවතින අතර නිෂ්පාදකයා විසින් අදාළ ගුවන්යානා නිෂ්පාදනය නවතා වෙනත් ගුවන්යානා වර්ගයක් (A 321 Neo) ලබාදීම සඳහා යෝජනා කර තිබුණි.

## රුහුණු මහා කතරගම දේවාලයේ සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් කරන ලද ඉල්ලීමට අනුව සිදුකරන ලද පරීක්ෂණයේ වාර්තාව

රුහුණු මහා කතරගම දේවාලය අනාදිමත් කාලයක සිට සර්වාගමික ශ්‍රී ලාංකික ජනතාව විසින් පුද සිරිත් සහ වන්දනා මාන පැවැත්වීම සඳහා වර්ෂය පුරා පැමිණෙන පුදබිමක් වන අතර මෙම දේවාලය 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 4 (1) විධිවිධාන ප්‍රකාරව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පාලනයට යටත් වන අතර එහි 43 වන වගන්තිය අනුව දේවාලයේ පාලන කටයුතු සඳහා බෞද්ධ කටයුතු විෂයභාර අමාත්‍යවරයාට ව්‍යවස්ථා පැනවිය හැක. තවද එහි 25, 35 (1) හා 35 (2) යන වගන්ති ප්‍රකාරව දේවාලයේ මූල්‍ය හා වත්කම් පාලන කටයුතු සඳහා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නියමයන් පැනවිය යුතුවේ.

මෙම දේවාලයේ 2017 අගෝස්තු 22 දින සිදුවූ බවට සැලකෙන ප්‍රශ්න සහගත සිද්ධියක් සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ ඉල්ලීම මත විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයකු විසින් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත නිකුත් කර තිබුණු අතර, නීතිපතිවරයා විසින් එම වාර්තාව සලකා බැලීමෙන් පසු "චෝදනා පත්‍රයක් ගොනු කිරීමට පෙර ගිණුම් සම්බන්ධයෙන් සිදුවී ඇති අක්‍රමිකතා තහවුරුකර ගැනීමට විගණකාධිපතිවරයා විසින් විගණනයක් හෝ ව්‍යවහාරික විගණනයක් සිදුකර විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම උචිත බවට" මතයක් ප්‍රකාශකර තිබුණි.

ඒ අනුව, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ අංක බෞකො/විභාදේ 123 ජී 31(1) 32 දරන 2018 මාර්තු 26 දිනැති " රුහුණු මහා කතරගම දේවාලයේ සිදුවූ අක්‍රමිකතා

සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීම" යන මැයෙන් විගණකාධිපති වෙත ලිපියක් යොමුකර තිබුණු අතර, 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 38 (1) වගන්තිය ප්‍රකාරව මා විසින් මේ සම්බන්ධයෙන් විශේෂ විගණන පරීක්ෂාවක් සිදුකරන ලදි.

එම පරීක්ෂාවන්ට අනුව කතරගම දේවාලයේ මූල්‍ය පාලනය විධිමත් අයුරින් සිදු නොවන බවත්, ඉඩම්,වාහන,රත්‍රන් භාණ්ඩ වැනි වත්කම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය ශක්තිමත් නොවන බවත්, අදාළ කාලය තුළ හිටපු බස්නායක නිලමේවරයා විසින් සිදුකර ඇති ඇතැම් ගනුදෙනු විනිවිදභාවයකින් තොර බවත් හඳුනා ගන්නා ලදී.

දේවාලයේ මූල්‍ය හා අනෙකුත් පාලන කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් අදාළ පනත ප්‍රකාරව ව්‍යවස්ථා පැනවීම සහ දේවාලයට ලැබෙන සියලු ලැබීම් හා සිදුකරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් සාර්ථක අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම, දිගුකාලීන සංවර්ධන කටයුතු සඳහා බැංකු අයිරා වැනි මූල්‍ය සම්පාදන ක්‍රමවේද යොදා ගැනීමේදී බෞද්ධ කොමසාරිස් ජනරාල්වරයා විසින් විධිවිධාන යෙදවීමේ අවශ්‍යතාවය මෙන්ම වත්කම් නිසි ලෙස පාලනය නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට වගකීම් පැවරීම සිදු කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළව විෂයයන් පහක් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් විශේෂ විගණන වාර්තාව නිකුත් කරනු ලබයි. වාර්තාව පරිච්ඡේද හයකින් සමන්විත වන අතර පළමු පරිච්ඡේදයෙන් වාර්තාව පිළිබඳව පොදු හැඳින්වීමකුත්, දෙවන පරිච්ඡේදයේ සිට හයවන පරිච්ඡේදය දක්වා එක් එක් විෂයන් පිළිබඳව වෙන් වෙන්ව සාකච්ඡා කරනු ලැබේ.

දෙවන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් ක්‍රිකට් ක්‍රීඩකයින් පුහුණු කිරීම සඳහා උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රිකට් විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට අදාළ කටයුතු පරීක්ෂාවට භාජනය කරන ලදි. විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා ඊට අවශ්‍ය විධිමත් අධ්‍යනයකින් හා අනෙකුත් අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පසු ඊට අනුකූලව නෛතික අවශ්‍යතාවයන් ඉටුකළ යුතු අතර එකී අවශ්‍යතාවයන් තීරණය කළ පසු ඊට අදාළවන ස්ථානයක් තෝරාගත යුතු වේ. එසේ වුවද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමට අත්‍යාවශ්‍ය මූලික කටයුතු විධිමත් පරිදි ඉටුකිරීමකින් තොරව මහනුවර මල්වතු මහාවිහාර පාර්ශවය යටතේ පවතින මහනුවර නගර සීමාව තුළ පිහිටි මහනුවර ගංගාරාම විහාරස්ථානයට අයිති වළකුඹුරවත්ත නම් ඉඩමෙන් කොටසක් වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබුණි. මෙකී ඉඩම බදු පදනම මත ලබාගැනීමට ගිවිසුමකට එළඹ තිබුණ ද, වසර තුනක් යනතෙක් එකී බදු මුදල් ගෙවා නොතිබුණු අතර මල්වතු පාර්ශවයේ ව්‍යාපෘතියකට හා මහනුවර ගංගාරාම විහාරයට රු.මිලියන 25 බැගින් ආධාර ලෙස ලබාදීමට විධායක කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 25 ක් පමණක් මල්වතු මහා විහාරයේ මහානායක හිමිගේ නමට ලියන ලද චෙක්පතකින් ගෙවා තිබුණද, ඉතිරි රු.මිලියන 25 පිළිබඳව මහානායක ස්වාමීන් වහන්සේ හෝ ගංගාරාම විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ හෝ දැනුවත් කර නොතිබුණි. මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමට අදාළ විධිමත් අධ්‍යනයකින් තොරව ඉඩම බදු පදනම මත අත්පත් කරගෙන ඇති

බවත් මෙම ඉඩම මෙතෙක් නිෂ්කාර්යව පවතින බවත් ඒ අනුව මේ දක්වා දරන ලද සියළුම වියදම් නිෂ්කාර්ය වියදම් බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

තෙවන පරිච්ඡේදය මඟින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ජාත්‍යන්තර රූපවාහිනී විකාශනය, ගුවන් විදුලි ප්‍රචාරය, ජංගම (රැහැන් රහිත) හා අන්තර්ජාල විකාශනය සහ අනුග්‍රාහකත්ව ආදී අයිතීන් (Internationa TV Broadcast, Radio Internet, Mobile and Sponsorship Rights) අලෙවිකිරීමට අදාළ ගිවිසුම් ගතවීම, ආදායම් එකතු කිරීම හා ඊට අනුශාංගික කරුණු පරික්ෂාවට භාජනය කරන ලදි. විකාශන අයිතිය විකිණීමට අදාළ අරමුදල් එකතු කිරීම් හා ඉන්වොයිස් කිරීමේ ක්‍රියාවලිය ක්‍රිකට් ආයතනයේ ඊමේල් පද්ධතිය හරහා සිදුකර තිබූ අතර ඊට අදාළ තාක්ෂණික තහවුරු කිරීම් ලබාගැනීම සඳහා විශේෂිත තාක්ෂණික සහාය ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයෙන් (Sri Lanka CERT) ලබාගන්නා ලදි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලයට රූපවාහිනී විකාශන අයිතිය පැවරීමට අදාළ අවම ලංසුවක් ඉදිරිපත් කළ Taj TV වෙත ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් ඇ.ඩො.18,242,411 ක මූල්‍ය අවාසියක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත සිදු වී ඇති බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයද පිළිගෙන තිබුණි. එකී ගිවිසුම ප්‍රකාරව එකඟ වූ වටිනාකමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත (සෑම ලිත් වර්ෂයක් සඳහාම) වර්ෂය ආරම්භවීමට දින 30 කට පෙර ගෙවිය යුතු සියළුම ගෙවීම් ආවරණය කරමින් අවලංගු කළ නොහැකි කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් (Bank Guarantee) ලබාදිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. 2018 වර්ෂයේ ගෙවීම් ප්‍රමාද වූ අවස්ථා 03 කදී ඇ.ඩො. 108,257.30 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉන්වොයිස් නිකුත්කර හෝ නොතිබුණි. 2018 ජූලි 12 දින සිට අගෝස්තු 14 දින දක්වා දකුණු අප්‍රිකානු ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයේ විකාශන අයිතිය විකිණීමේ ගිවිසුම අනුව දෙවන අයකිරීම වන (35%) ඇ.ඩො.436,541 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් විගණනයට ඉදිරිපත් කළ නිල බැංකු ගිණුම්වලින් පරිබාහිර ගිණුමකට හුවමාරු කිරීමට උත්සාහ දරා තිබූ අතර මෙම සංචාරයේ තෙවන අයකිරීම වන (15%) ඇමරිකානු ඩොලර් 187,084.70 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් නමින් යැයි සැලකෙන Bbva Compass බැංකුව වෙත ගෙවා ඇති බව Sony Pictures Network India (Pvt) Ltd ආයතනය මඟින් තහවුරු කර තිබුණි. එසේම 2018 ඔක්තෝබර් 10 දින සිට නොවැම්බර් 27 දින දක්වා එංගලන්ත ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයට අදාළ විකාශන අයිතිය විකුණුම් ආදායම ඇ.ඩො.11,128,809 ක් ගිණුම් අංක 788-796894-883 දරන Fanya Silu Co. නමින් වූ ගිණුමකට යැවීමට උත්සහ දරා තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධතියට අදාළ අභ්‍යන්තර පාලනයෙහි දුර්වලතා හේතුවෙන් විකාශන අයිතිය විකිණීමට අදාළව ලැබිය යුතු මෙම මුදල් වෙනත් ගිණුම් වෙත හුවමාරු කිරීම සහ හුවමාරු කිරීම සඳහා උත්සාහ කිරීම සිදුවී ඇති බව නිරීක්ෂණය වන අතර CERT වාර්තාවේ තාක්ෂණික තහවුරු කිරීම් අනුව ඒ පිළිබඳව ශ්‍රී ලංකා ක්‍රිකට් හි නිලධාරීන් දැන නොසිටි බවට තහවුරු නොවුණි. විගණනයට ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් 15 අතරින් ගිණුම් 04 ක් කවර අරමුණක් සඳහා ආරම්භ කරන ලද්දේ ද යන්න විගණනයේදී තහවුරු නොවූ අතර විගණනයට ඉදිරිපත් නොකරන ලද ශ්‍රී ලංකා ක්‍රිකට් තුළින් වූ තවත් විදේශ බැංකුවල පවතින ගිණුම් 03 ක් නිරීක්ෂණය විය. එසේම එවැනි බැංකු ගිණුම් තවදුරටත් පැවතීමේ අවදානමක්ද නිරීක්ෂණය විය.

සිව්වන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සඳහා ජාතික ප්‍රධාන පුහුණුකරුවෙකු බඳවා ගැනීම පිළිබඳව පරීක්ෂාවට භාජනය කෙරුණි. නව

පුහුණුකරුවෙකු බඳවාගැනීමට අදාළව තීරණ ගැනීම සඳහා විධායක කමිටුව මගින් යම් නිලධාරියෙකුට විධිමත් අනුමැතියක් ලබාදී ඇති බවට තහවුරු නොවූ අතර කොන්දේසි, නියමයන්, එකඟතාවයන් හා පාරිශ්‍රමිකයන් පිළිබඳව විධායක කමිටුව වෙත දැනුවත් කිරීමකින් තොරව ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ 10 වගන්තිය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සාපේක්ෂව පුහුණුකරුට ඉතාමත් වාසි සහගතව ගිවිසුමෙන් බැහැරවීමේ කොන්දේසි ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. පුහුණුකරු වෙනුවෙන් රු.15,537,700 ක උපයන විට ගෙවීමේ බදු ගෙවීමට එකඟවීම මත අතිරේක වියදමක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දරා තිබූ අතර, බදු ගණනයේදී ඇතැම් ආදායම් නොසලකා හැරීම හේතුවෙන් එකතුව රු.1,593,455 ක උපයන විට ගෙවීම් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් පැහැර හැර තිබුණි.

පස්වන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ පිළිබඳ දේශීය ගුවන් විදුලි විකාශන අයිතිය අලෙවි කිරීම පිළිබඳව පරීක්ෂාවට භාජනය කරන ලදි. මෙහිදී ගුවන් විදුලි විකාශන අයිතිය අලෙවියේදී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකර නිල ඊමේල් ගිණුම වෙනුවට ආයතනයේ නිලධාරියෙකුගේ පෞද්ගලික ඊමේල් ගිණුම මගින් ගනුදෙනු සිදුකර තිබුණි. බැංකු ඇපකර ලබාගෙන නොතිබූ අතර ගෙවීම් පැහැර හැර ඇති අවස්ථා නිරීක්ෂණය විය. මෙහිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එකම සමාගම් ජාලයක් සමඟ විවිධ කාලවලදී විවිධ නම්වලින් පෙනී සිට ගනුදෙනු කර තිබුණු බව නිරීක්ෂණය වේ.

හයවන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පුණ්‍යාධාර හස්තය ලෙස Cricket Aid (Guarantee) Ltd නමින් ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවීමට අදාළ කටයුතු පිළිබඳව පරීක්ෂාවට භාජනය කරන ලදි. මෙම සමාගම ලියාපදිංචි කිරීමට පෙර විධායක කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර සමාගම ආරම්භක අවස්ථාවේදී නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන් සඳහා ආධාර කිරීමට ප්‍රධාන අරමුණ සහිතව "Cricket Aid Charity Event at Lords Lounge Room" මැයෙන් වැඩසටහනක්ද ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො.54,000 එංගලන්තයේ වාසයකරන පාර්ශවයක් වෙත යවා තිබූ අතර එකී පාර්ශව වෙත විදේශ ගිණුම් ආරම්භ කිරීම සඳහාද අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, එම වියදම් කළ ආකාරය හෝ එහිදී රැස්කරන ලද අරමුදල් පිළිබඳ නිශ්චිත වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විවිධ අනුග්‍රාහකත්ව ගිවිසුම්වලට අදාළව ලැබිය යුතු මුදල් මෙම සමාගම වෙත ගෙවන ලෙස ගිවිසුම් ගත වී තිබුණු අතර ඒ අනුව 2018 වර්ෂයේදී රු.මිලියන 14 ක් සමාගම වෙත ගෙවා තිබුණි. එසේ වුවද, මේ දක්වා වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීමක් හෝ විධිමත් වැඩපිළිවෙලක් හෝ සකස් කර නොතිබුණි. තවද, සමාගමේ කළමනාකරුට සමාගම මේ දක්වා පුණ්‍යාධාර කටයුතු සඳහා ගෙවා ඇති වියදමද ඉක්ම වූ මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. සමාගම විසින් විදේශයකින් ආධාර ලෙස බෙදාදීමට ලබාදුන් ආහාර තොගයක් වරායෙන් නිදහස්කර ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් රු.1,285,885 ක් නිෂ්කාර්යව වියදම් කර තිබූ අතර විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණද, ගිණුම් හා විගණන කටයුතු ලෙස එකතුව රු.694,654 වියදම් කර තිබුණි. සමාගමේ ගිණුම් විගණකාධිපති මගින් විගණනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා නොතිබූ අතර වෙනත් බාහිර වෘත්තීය විගණකයෙකු මගින් හෝ විගණනය කර තිබූ බවට තහවුරු නොවුණි. ඒ අනුව මෙම

පූර්ණායාධාර හස්තය ලෙස ස්ථාපිත ආයතනය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

## ගොවි ජනතාවගේ අරමුදල් අවශ්‍යතා සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා දායකත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 99 (2) (ආ) වගන්තිය සමග කියවෙන 1999 අංක 04 දරන ගොවිජන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 46 (1), 46 (2), 46 (3) හා 46 (4) වගන්ති ප්‍රකාර ගොවිජන සේවා කාරක සභාව වෙත පැවරී ඇති කාර්යයන් පහසුවෙන් ඉටු කිරීම පිණිස ගොවිජන සංවර්ධන/ගොවිජන සේවා කාරක සභාවේ උප ඒකකයක් ලෙස ස්ව ශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩනැංවීමේ අරමුණින් 1998 වර්ෂයේ දී මෙම ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය ආරම්භ කළ අතර මේ වන විට වර්ෂ 20කට ආසන්න කාලයක් සිය සේවා පවත්වා තිබුණි.

ගොවිජන බැංකුවේ පවතින අරමුණු සියල්ල කැටිකර ගත් විට, එහි මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ගොවි ජනතාවගේ දිළිඳුකම තුරන් කර, ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීම හා ගොවි ආර්ථිකය ප්‍රසාරණය කිරීම යි. රත්නපුර දිස්ත්‍රික්කය තුළ වූ ගොවිජන බැංකු 30 ක් මගින් මෙම අරමුණ ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා ලබා දී ඇති දායකත්වය කෙතෙක් දුරට ලැබී ඇත් ද යන්න මෙම වාර්තාව තුළින් සමාලෝචනය කෙරේ.

කෘෂිකර්මය තුළින් පෙරට යන ගොවිජන ජීවිතයේ සමෘද්ධිය උදෙසා තවදුරටත් පුළුල් වූ සේවා සපයමින් දේශීය ගොවිජන සංවර්ධනයේ නිල බැංකුකරු බවට පත් කිරීම සඳහා ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය සංවර්ධනාත්මක ප්‍රවේශයකට යොමුගත කිරීමට උපාය මාර්ගික සැලැසුම් පසුගිය වර්ෂ 20 තුළ ක්‍රියාත්මක කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අපොහොසත් වීම තුළ රත්නපුර දිස්ත්‍රික්කයෙහි ගොවිජන බැංකු ක්‍රියාකාරිත්වයේ පවතින පහත දැක්වෙන අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පිළියම් යෙදීම අවශ්‍ය වේ.

- රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඉලක්කගත ගොවි ජනතාව වෙත සමීප විය යුතු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ගොවිජන බැංකු ක්‍රමය පිළිබඳව නිසි පරිදි දැනුවත් නොවීම හා ඔවුන්ගෙන් ග්‍රාමීය නායකත්වයක් නොලැබීම.

- රත්නපුර දිස්ත්‍රික්කයෙහි ගොවිජන බැංකු නිසි අධීක්ෂණයක් හෝ සුපරීක්ෂණයක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපාර ඒකකයක් ලෙස ක්‍රියාත්මක වෙමින් ඉලක්කගත ප්‍රජාව වෙත සේවා සැපයීම වෙනුවට පොත්පත් හා ලේඛන සහ ලිපිගොනු පවත්වාගෙන යන කාර්යාලයක ස්වභාවයෙන් බැංකු ක්‍රියාත්මක වීම.

- ගොවිජන බැංකුව පිළිබඳව ප්‍රමාණවත් සන්නිවේදනයක් දිස්ත්‍රික්කයෙහි ගොවීන් වෙත ලැබී නොමැති වීම.

- ගොවි සංවිධාන, ගොවීන් නඟා සිටුවීමේ කාර්ය කෙරෙහි මැදිහත් වී ගොවිජන බැංකු ක්‍රමයට දායකවීම අත්‍යවශ්‍ය වුවද, දිස්ත්‍රික්කය තුළ ගොවි සංවිධානවලින් ප්‍රමාණවත් දායකත්වයක් නොලැබීම.

- ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන රජයේ සහනාධාර යෝජනා ක්‍රම මෙන්ම වෙනත් සුභසාධන යෝජනා ක්‍රම හා ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම රජයේ

වාණිජ බැංකුවලින් ක්‍රියාත්මක වන විට ගොවි ජනතාවට සමීපව කටයුතු කළ හැකි ගොවිජන බැංකුව දිස්ත්‍රික්කය තුළ අකර්මණ්‍යව පැවතීම.

- ග්‍රාමීය ගොවි ජනතාවගේ ඉතිරිකිරීම් නැමියාව වර්ධනය හා ඔවුනට අවශ්‍ය මූලධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස දිස්ත්‍රික්කය තුළ කටයුතු නොකිරීම.

- රත්නපුර දිස්ත්‍රික්කයෙහි ගොවිජන බැංකුවල ක්‍රියාකාරිත්වය රජය වෙත අමතර වැය බරක් පමණක් වන සේවක වැටුප් හා දීමනා ගෙවමින් පවත්වා ගෙන යන නිෂ්ක්‍රීය ආයතනයක් වීම.

ඒ අනුව ගොවිජන බැංකුව මගින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගනිමින් ගොවීන් වෙත ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම මගින් අවිධිමත් මූල්‍ය ගනුදෙනුවලින් රත්නපුර දිස්ත්‍රික් ගොවි ජනතාව මුදවා ගත යුතුය. යැපුම් කෘෂිකර්මයෙන් ඔබ්බට වූ වාණිජ කෘෂි ආර්ථිකයක් ගොඩ නංවා ශක්තිමත් ගොවි පරපුරක් බිහි කරලීමට සහ තිරසර කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය යන අරමුණු පෙරදැරිව තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය දර්ශකයන් වෙත ළඟාවීම සඳහා දිස්ත්‍රික්කයෙහි ගොවි ජනතාව මෙහෙයවීමේ ප්‍රධාන ආයතනයක් ලෙස ගොවිජන බැංකු මෙහෙයවිය යුතුය. තවද මෙම බැංකු මූල්‍ය ආයතන නියාමනය කරනු ලබන ආයතනයක නියාමනයට යටත් නොවන බැවින් එම ආයතන සම්බන්ධයෙන් විධිමත් නියාමනයක් හා පසුවිපරමකින් යුතු ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගැනීමත්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ පාර්ශවයන්ගේ පූර්ණ මැදිහත් වීමක් සහිත විශේෂ අවධානයක් යොමු විය යුතු බවත් හඳුනා ගන්නා ලදී.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 හා 214 වගන්තිවල දැක්වෙන විධිවිධාන පරිදි පිහිටුවා තිබුණු අතර, පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් ඒ සඳහා ගාස්තු අයකරනු ලබන අතර එය පීඨයේ ආදායම වේ. එලෙස රැස්කරන ලද ආදායමෙහි අතිරික්තය ආයතනය විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර එම ආයෝජන නිදහස් කර ගැනීමේ දී ඒ සම්බන්ධව විගණන අවදානමක් පවතින බව පරීක්ෂණවලදී හඳුනාගන්නා ලදී.

එබැවින්, 2005 වර්ෂයෙහි සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සිදුකරන ලද ස්ථාවර තැන්පතු සම්බන්ධව පුළුල් විගණනයක් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් හඳුනාගන්නා ලද නිරීක්ෂණ ඇතුළත්ව මෙම වාර්තාව නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම ආයෝජන නිදහස් කර ගැනීමේදී එම කාලච්ඡේදය තුළ සේවය කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයා විසින් රු.50,338,159 ක් වංචා කර ඇති බවත්, රු.5,000,000 ක මුදලක් මාස 06 ක පමණ කාලයකදී අයථා පරිහරණය කර ඇති බවත්, උක්ත ගනුදෙනු හේතුවෙන් ආයතනයට හිමිවීමට තිබුණු රු.24,346,723 ක පමණ පොළී මුදලක් අහිමි වී තිබුණ බවද නිරීක්ෂණය විය.

මූල්‍යාධිකාරිවරයා විසින් අනුමැතියකින් තොරව හා අවශ්‍යතාවයකින් තොරව ස්ථාවර තැන්පතු නිදහස් කර තිබුණු අතර එම මුදල් හා පොළී මුදල් නිසි පරිදි බැංකු ගත කිරීමට හෝ ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, නිසි පරිදි අධීක්ෂණ

කටයුතු සිදුකිරීමට සම්බන්ධිත පාර්ශව කටයුතු කර නොතිබුණු අතර බැංකුව විසින්ද තම වගකීම නිසි පරිදි ඉටුකිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා දෙපාර්තමේන්තුවේ වත්කම් භාවිතය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

මිනුම් මත පදනම් වූ සේවා සහ නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙන්දන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයින්ගේ සමානාත්මතාවය හා යුක්තිය තහවුරු කිරීමේ ප්‍රධාන අරමුණු සහිතව 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත ප්‍රකාරව මිනුම් ප්‍රමිති ඒකක සේවා දෙපාර්තමේන්තුව හා ජාතික මිනුම් පර්යේෂණාගාරය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කරන ලදි. එසේ වුවද පසුගිය කාලපරිච්ඡේදයේදී මිනුම් ප්‍රමිති ඒකක දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අනුව එම අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු වී නොමැති බවට හඳුනාගැනීම හේතුවෙන් මෙම වාර්තාව නිකුත් කිරීමට කටයුතු කරන ලදි. දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරයත්, එහි වත්කම් පාලනය පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරමින් විගණනය සිදුකරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවට උක්ත පනත මගින් ලබාදී ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමත්, දෙපාර්තමේන්තුවට අයත් ජාතික මිනුම් පර්යේෂණාගාරය ඵලදායී ලෙස පර්යේෂණ සඳහා යොදා නොගැනීමත්, වාර්ෂික වැටලීම් හා සත්‍යාපන පරීක්ෂණයන් නිසි පරිදි ඉටු නොකිරීමත්, ප්‍රසම්පාදන පටිපාටින් නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීමත්, වත්කම් ඵලදායී ලෙස භාවිතයට නොගැනීම ඇතුළු විවිධ අඩුපාඩු හේතුවෙන් දෙපාර්තමේන්තුවෙහි මහජනතාවට ඉටුවිය යුතු සේවය ඵලදායී ලෙස ලබා දීමට කටයුතු කර නොමැති බව හඳුනාගැනීමට හැකි විය. ප්‍රමිතියෙන් තොර කිරුම් මිනුම් උපකරණ රට තුළට ඒම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමත්, දෙපාර්තමේන්තුවට 1995 අංක 35 දරන මිනුම් ප්‍රමිති ඒකක පනත මගින් ලබාදී ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීමත්, දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුකරනු ලබන මිනුම් කටයුතු විධිමත් කිරීමත්, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීමත්, දෙපාර්තමේන්තුව සතු වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගැනීමත් ඇතුළුව දෙපාර්තමේන්තුවෙන් මහජනතාවට කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවන පරිදි කාර්යයන් සැලැසුම් කළ යුතු බවත් නිර්දේශ කෙරේ.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ වත්මන් ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

1951 අංක 17 දරන මෝටර් වාහන පනත අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබූ අතර එහි අනිකුත් ප්‍රධාන කාර්යයන් අතරින් එක් ප්‍රධාන කාර්යයක් ලෙස මෝටර් රථ වාහන සඳහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දක්වා තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් 1989 වර්ෂය දක්වා රියදුරු බලපත්‍ර පොත් - Driving License Books (DLB) නිකුත් කර තිබූ අතර 1989 වර්ෂයේදී DLB වෙනුවට රියදුරු බලපත්‍රය ලෙස කාඩ්පතක් (Driving License Cards) හඳුන්වා දී තිබුණි. පසුව එම රියදුරු බලපත්‍ර සඳහා ආරක්ෂිත උපක්‍රමයක් වශයෙන් Holographic Security Devices and Magnetic Tape තීරුවක් ඇතුළත් කරන්නට පියවර ගෙන තිබුණි. පැවති රියදුරු බලපත්‍ර ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීමට ඇති හැකියාව , නව තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගනිමින් ඉතා ආරක්ෂිතව හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සහිත නව රියදුරු බලපත්‍රයක් මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවය සහ රියදුරු නියාමනයට

සම්බන්ධ නීති වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණු සහිතව 2009 මාර්තු 27 දින සිට ස්මාර්ට් කාඩ් වර්ගයේ මෙම නව රියදුරු බලපත්‍රය හඳුන්වාදීමට කටයුතු කර තිබුණි.

නව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන පරිගණක පද්ධතියක් සහ පරිගණක තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමත්, පසුව එම පද්ධතීන් දෙපාර්තමේන්තුවට පැවරීම සඳහාත් (BOT පදනම මත) ගිවිසුම්වලට එළඹීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය මත 2006 නොවැම්බර් 27 දින මෙට්‍රෝපොලිටන් ඇඩ්වාන්ස් ටෙක්නොලිජීස් ආයතනය සමඟ වසර 07 ක කාලයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ගිවිසුම අනුව "ස්මාර්ට් කාඩ් වර්ගයේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන පරිගණක පද්ධතියක් සහ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම, වසර 07 ක කාල සීමාව තුළ ගිවිසුම්කරු විසින් එම පද්ධතීන් ක්‍රියාත්මක කිරීම සහ පසුව එම පද්ධතිය දෙපාර්තමේන්තුව වෙත පැවරීම" යන කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු මුදල, සමාගම විසින් ගිවිසුම් කාලය තුළ මුද්‍රණය කර නිකුත් කරනු ලබන ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රයක පිරිවැයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම හේතුව මත ස්මාර්ට් කාඩ් පත්‍රයක මිල රු.1,340 + VAT ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

වර්තමානය වන විට රියදුරු බලපත්‍ර මුද්‍රණය හැර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අනිකුත් සියලුම කාර්යයන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන අතර රියදුරු බලපත්‍රය මුද්‍රණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු වත්කම් ගිවිසුමේ කාලය අවසන් බැවින් දෙපාර්තමේන්තුවට හිමිවිය යුතු වේ. එම වත්කම් පවරාගෙන රියදුරු බලපත්‍ර මුද්‍රණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් කරගෙන යාම පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය නිර්මාණය කිරීමේ එක් ප්‍රධාන අරමුණක් වූ රියදුරු නියාමනයට අවශ්‍ය තොරතුරු සැපයීම මගින් රථ වාහන නීතිය ක්‍රියාත්මක කරන පොලිස් නිලධාරීන් එම කාර්යය කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම මේ දක්වා සිදු වී නොමැත. එසේම ගිවිසුම් කාලය දීර්ඝ කිරීමේදී, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අයත් විය යුතු වත්කම් යළි පරිහරණය සඳහා සමාගමටම ලබාදීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මූල්‍ය ප්‍රතිලාභ පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබුණි. තවද සැපයුම්කරු ගිවිසුම් කාලය තුළ (එනම් 2016 මාර්තු මාසය වන විට) යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ආයෝජනය කළ මුදල සම්පූර්ණයෙන්ම උපයාගෙන තිබීම හේතුවෙන් තවදුරටත් කොන්ත්‍රාත්කරුට පැවරීම සඳහා ගෙවන ගාස්තුව නිෂ්කාර්ය වියදමක් ලෙස හඳුනාගැනීමට හැකි විය. වර්තමානය වන විට නව තාක්ෂණික දියුණුව නිසා ඉලෙක්ට්‍රොනික් චිපය සහිත ස්මාර්ට් කාඩ්පත් උපරිම ගුණාත්මකභාවයකින් යුතුව ඉතා ඉහළම ලේසර් පිලිස්සුම් තාක්ෂණය යටතේ රු.300 ක සිට රු.500 ක් දක්වා පරාසයක උපරිම මිලකට මුද්‍රණය කර ගැනීමට හැකි බව නිරීක්ෂණය වී තිබේ. එම නිසා ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍ර වෙනුවෙන් ජනතාව මත අමතර වශයෙන් පවරා ඇති අධික මිල කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු බව හඳුනාගන්නා ලදී.

### ශ්‍රී ලංකාවේ සිවිල් (උපත්, විවාහ හා මරණ) ලියාපදිංචිය සහ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මහජනතාවගේ සිවිල් ලියාපදිංචි කිරීම, උප්පැන්න, විවාහ හා මරණ සම්බන්ධ ලේඛන භාරකාරත්වය හා සංරක්ෂණය කිරීම සහ සහතික පිටපත් නිකුත් කිරීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව නව තාක්ෂණය භාවිතයෙන් මෙම කාර්යයන් කාර්යක්ෂම කිරීමේ ක්‍රමවේදයක් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හඳුන්වා දී තිබුණි.මේ සඳහා තොරතුරු තාක්ෂණය භාවිතයෙන් උපත්, විවාහ හා මරණ සහතික නිකුත් කිරීමේ වැඩසටහන (e- BMD) සහ උපත් හා මරණවලට අදාළ දත්ත ඉලෙක්ට්‍රෝනික ආකාරයෙන් ගොනු කිරීම, නිර්මාණය කිරීම, සුරක්ෂිතව රඳවා තබා ගැනීම හෝ නිකුත් කිරීම සඳහා
ඉ - ජනගහන රෙජිස්ට්‍රර් වැඩසටහන (e - Population) වශයෙන් ව්‍යාපෘති දෙකක් ඇතුළත් වී තිබුණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සෙවීමට ගතවන දීර්ඝ කාලය අවම කිරීම, මහජන සේවාව කඩිනම් කිරීම, සහතික ඇතුළත් ලිපිගොනු ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් අවම කිරීම, සහතික සඳහා ස්වාභාවික ආපදා හා භෞතිකව සිදුවන හානිය අවම කිරීම යනාදිය අපේක්ෂා කර තිබුණි.

මෙම ඊ වැඩසටහන් මගින් උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කටයුතුවල කාර්යක්ෂමතාවය ඇගයීම ද, සම්බන්ධිත පාර්ශවයන්හි වගකීම නිසි පරිදි ඉටු කර මහජන සේවාව ඉටුකර ඇති ආකාරය හඳුනාගැනීම ද මෙම වාර්තාව නිකුත් කිරීමට පසුබිම් වූ අතර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, මධ්‍යම ලේඛනාගාරය සහ කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක සිදුකළ ස්ථානීය පරීක්ෂාව ආශ්‍රයෙන් මෙම වාර්තාව සඳහා තොරතුරු රැස්කරන ලදී.

උක්ත අරමුණු ඇතිව මෙම වැඩසටහන ආරම්භ කළද, 1960 වර්ෂයේ සිට 2018 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාළව තවදුරටත් පරිලෝකනය කිරීමට ඇති මුළු උපත්, විවාහ හා මරණ සහතිකපත් ප්‍රමාණය 3,423,590 ක් බව නිරීක්ෂණය වූ අතර, සමස්ත දිවයිනම ආවරණය වන පරිදි සහතිකපත් නිකුත් කිරීමේ අවසරය (මහනුවර හා මුලතිව් දිස්ත්‍රික්ක හැර) ලබා දී තිබුණි. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක LGN පහසුකම් නොමැති වීමත් , ලබා දී තිබුණු LGN පහසුකම් බිඳවැටීම හා ක්‍රියාකාරිත්වයේ මන්දගාමී වීම , 2012 ජූලි 10 දින සිට බලාත්මක වන ලෙස ඉ- ජනගහන රෙජිස්ට්‍රර් පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු වුවද, වර්ෂ 06 ක් ඉක්මවා ගියද ඉ-ජනගහන රෙජිස්ට්‍රර් පද්ධතිය නිසිලෙස ක්‍රියාත්මක වී නොතිබීම ඇතුළු ගැටළු රාශියක් හේතුවෙන් එම අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

### මාතර මහා නගර සභාවේ දේපළ පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව.

අංක 1152/21 දරන හා 2000 ඔක්තෝබර් 06 දිනැති ගැසට් නිවේදනය මඟින් 2001 අප්‍රේල් 15 වන දින ස්ථාපිත කරන ලද මාතර මහා නගර සභාව “අභිමානවත් මාතොට වැසියන්ගේ සංවර්ධනයට උරදුන් සෞභාග්‍යමත් වාණිජ පුරවරයක්” යන දැක්ම යටතේ මාර්ග සංවර්ධනය, පොදු සෞඛ්‍ය පහසුකම්, පොදු උපයෝගී සේවා සහ සුභසාධක සේවා හා සුබවිහරණය යන හර විෂයයන් මූලික කොටගත් කාර්ය භාරයක නිරතවී සිටී.

මාතර මහා නගර සභාව සතුව ඉඩම් අක්කර **106** පර්චස් **32.245** ක්ද, ගොඩනැඟිලි **51** ක්ද, පැවති අතර මහා නගර සභා ආඥා පනතේ හා අනෙකුත් චක්‍රලේඛ හා උපදෙස් ලිපි ප්‍රකාරව ඉඩම් හා ගොඩනැඟිලි ඉතා ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීම අත්‍යාවශ්‍ය කාරණාවක් වුවද සභාව සතු දේපල නිෂ්ක්‍රීයව පැවතීමත් හා පෞද්ගලික පාර්ශවයන් විසින් අවිධිමත් ලෙස පරිහරණය කිරීමත් හේතුවෙන් ඉඩම් හා ගොඩනැඟිලි ඵලදායීව යොදා නොගැනීමේ අවදානමක් නිරන්තරයෙන් සිදුවීම මෙම වාර්තාව පිළියෙල කිරීම සඳහා මූලිකව හේතු වූ අතර ඒ හේතුවෙන් සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි නියැදියක් භෞතිකව පරීක්ෂාවකට ලක් කරන ලදී.

අදාල ලේඛන හා භෞතික පරීක්ෂාවන්වලදී මහා නගර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂික සමීක්ෂණය නොකිරීම, නිසි පරිදි ලේඛනගත නොකිරීම, අවිධිමත් ලෙස පෞද්ගලික පාර්ශවය පරිහරණය කිරීම, දේපල නිෂ්ක්‍රීයව පැවතීම, දේපල තක්සේරු නොකිරීම, ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හා බදු කුලී නිසි පරිදි අය නොවීම මෙම වාර්තාව මගින් නිරීක්ෂණය කර ඇත. මාතර මහා නගර සභාවේ දැක්මට අනුගත වෙමින් සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව මේ තුළින් හඳුනා ගන්නා ලදී.

# ඒකාබද්ධ අරමුදල

## නිරීක්ෂණ

- රාජ්‍ය ආදායම
- බදු ආදායම
- රාජ්‍ය ආදායම හා අයවැය හිඟය
- පුනරාවර්තන වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම
- අයවැය හිඟය
- අයවැය හිඟය මූල්‍යනය කිරීම
- රාජ්‍ය ණය
- පාර්ලිමේන්තුව පනවා තිබුණු ණය සීමාව ඉක්මවා ණය ලබා ගැනීම
- උපරිම බැරකම් සීමාව ඉක්මවීම
- ඒක පුද්ගල ණය ප්‍රමාණයේ වැඩිවීම
- රාජ්‍ය ණය ශේෂය තුළ විදේශීය ණය නියෝජනයේ වර්ධනය
- දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොලී ගෙවීම් සහ රාජ්‍ය ආදායම
- රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම
- ණය වාරික හා පොලිය ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම
- ලබාගත් ණය ප්‍රමාණය ඉක්මවා ණය වාරික හා පොලී ගෙවීම
- ලබා ගත් ණය සංවර්ධන ව්‍යාපෘතිවලට උපයෝජනය කිරීමට නොහැකිවීම
- රජයේ මූල්‍ය ප්‍රකාශනවල රු.බිලියන 152 ක ණය අඩුවෙන් ගිණුම්ගත කිරීම

## ඒකාබද්ධ අරමුදල

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත.

2019 වර්ෂය සඳහා රාජ්‍ය වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2019 අංක 6 දරන විසර්ජන පනතින් සළසා තිබුණි. ඒ අනුව, ලබා දී තිබුණු අතිරේක ප්‍රතිපාදන ඇතුළුව රජයේ සැපයුම් හා සේවා සඳහා රු.බිලියන 4,728.19 ක ප්‍රතිපාදන සලසා තිබුණි. විස්තර වගුව 04 හි දැක්වේ.

| මූලය | මූලධන ප්‍රතිපාදන | පුනරාවර්තන ප්‍රතිපාදන | එකතුව |
|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන |
| සැපයුම් හා සේවා සඳහා විසර්ජන පනත මගින් සලසා තිබුණු ප්‍රතිපාදන | 844.29 | 1,275.77 | 2,120.06 |
| පවත්නා නීති මගින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන | 1,300.86 | 931.14 | 2,232.00 |
| සැපයුම් හා සේවා සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු) | 147.55 | 205.39 | 352.94 |
| විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන | 0.16 | 23.03 | 23.19 |
| එකතුව | 2,292.86 | 2,435.33 | 4,728.19 |

වගුව 04- රජයේ සැපයීම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය
මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2019 අංක 6 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 2.3.3 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.බිලියන 176.10 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදනවලින් රු.බිලියන 159.77 ක් වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.බිලියන 16.33 ක් ඉතිරි වී තිබුණි. විස්තර වගුව 05 හි දැක්වේ.

| වියදමේ ස්වභාවය | ශුද්ධ ප්‍රතිපාදනය | ප්‍රතිපාදන වෙනත් ශීර්ෂවලට මාරුකිරීම | ඉතිරිවීම | ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු .බිලියන | |
| පුනරාවර්තන | 70.40 | 69.54 | 0.87 | 1.23 |
| මූලධන | 105.70 | 90.23 | 15.47 | 14.63 |
| එකතුව | 176.10 | 159.77 | 16.33 | 9.28 |

වගුව 05 - පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වන ප්‍රතිපාදනය හා මාරුකිරීම්
මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

සමාලෝචිත වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.බිලියන 4,728.19 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය රු.බිලියන 4,297.83 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 430.36 ක් හෙවත් සියයට 10.01 කින් වැඩි කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.බිලියන 4,075.83 ක් උපයෝජනය කර තිබුණු අතර රු.බිලියන 652.36 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 13.80 ක් ඉතිරි කර තිබුණි.

පුනරාවර්තන වියදම් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.බිලියන 2,416.74 ක් වී තිබුණු අතර ඉන් රු.බිලියන 2,321.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.බිලියන 95.12 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.94 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා රු.බිලියන 1,011.45 ක ප්රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.බිලියන 637.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 37.00 ක් හෙවත් රු.බිලියන 374.23 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා රු.බිලියන 1,300.00 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.බිලියන 1,116.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 14.08 ක් හෙවත් රු.බිලියන 183.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයට අදාළව ණය ගෙවීම් හැර, මූලධන ප්‍රතිපාදනය රු. බිලියන 1,011.45 ක් වූ අතර ඉන් රු. බිලියන 637.22 ක් හෙවත් සියයට 63.00 ක් උපයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂයේ මූලධන ප්‍රතිපාදන උපයෝජනය වූ රු.බිලියන 625.31 ක මුදල සමග සැසඳීමේදී එය රු.බිලියන 11.91 කින් වැඩි වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන 2,416.74 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.බිලියන 2,321.62 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 96.06 ක් උපයෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම වූ රු.බිලියන 2,108.96 ක් සමඟ සැසඳීමේදී රු.බිලියන 212.66 කින් වැඩිවී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයේ රු.බිලියන 2,734.27 ක් වූ මුළු වියදම (ණය ගෙවීම් හැර) සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 2,958.84 ක් දක්වා රු.බිලියන 224.57 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ණය ගෙවීම් හැර මුළු වියදම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18.97 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 05 ක රාජ්‍ය වියදම හා දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පහත වගුව 06 හි දැක්වේ.

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම (රු.බිලියන) | 1,370 | 1,673 | 1,771 | 1,946 | 2,109 | 2,322 |
| මූලධන වියදම (රු.බිලියන) | 596 | 684 | 594 | 657 | 625 | 637 |
| මුළු වියදම (ණය ගෙවීම් හැර ) (රු.බිලියන) | 1,966 | 2,357 | 2,365 | 2,603 | 2,734 | 2,959 |
| දළ දේශීය නිෂ්පාදනය (රු.බිලියන) | 9,785 | 11,183 | 11,839 | 13,289 | 14,200 | 15,600 |
| මූලධන වියදම මුළු වියදමේ (ණය ගෙවීම් හැර) ප්‍රතිශතයක් ලෙස | 30 | 29 | 25 | 25 | 23 | 22 |
| මුළු වියදම (ණය ගෙවීම් හැර ) දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස | 20 | 21 | 20 | 20 | 19 | 19 |

වගුව 06. - පුනරාවර්තන හා මූලධන වියදම් සහ දළ දේශීය නිෂ්පාදනය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන සහ මහ බැංකුවේ වාර්ෂික වාර්තා

2014 වර්ෂයේදී ණය ගෙවීම් හැර මූලධන වියදම රු.බිලියන 596 ක් වී තිබුණු අතර එය වර්ෂයේ රු.බිලියන 1,966 ක් වූ මුළු වියදම (ණය ගෙවීම් හැර ) සමඟ සැසඳීමේදී සියයට 30 ක් වි තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිශතය සියයට 22 ක් දක්වා සියයට 8 කින් අඩු වී තිබුණි. 2014 වර්ෂයේදී රු.බිලියන 1,966 ක් මුළු වියදම (ණය ගෙවීම් හැර) එම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිශතය සියයට 19 ක් දක්වා අඩු වී තිබුණි. ඉකුත් වර්ෂ 5 ක කාලය තුළ එම ප්‍රතිශතයන් පිළිබඳ විස්තර රූප සටහන 01 හි දැක්වේ.




රූපසටහන 01 - මුළු වියදම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන හා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

සමාලෝචිත වර්ෂයේදී දේශීය හා විදේශීය ණය සඳහා පොලී, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම් ගෙවීම වෙනුවෙන් එකතුව රු.බිලියන 888.79 ක් පොලී වශයෙන් වැය කර තිබුණි. එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 38.21 ක ප්‍රමාණයක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 36.60 කින් ඉහළ

සියයට 4.29 කින් වැඩිවී තිබුණි. මීට අමතරව පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු.බිලියන 528.79 ක්ද, ප්‍රදානයන් හා සහනාධාර වෙනුවෙන් රු.බිලියන 703.51 ක්ද, අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් සඳහා රු.බිලියන 199.83 ක්ද වැයකර තිබුණි. මුළු පුනරාවර්තන වියදම කෙරෙහි ඉහත වියදම් ඉහළ දායකත්වයක් ගෙන තිබුණු අතර, සමස්ථ පුනරාවර්තන වියදම පියවා ගැනීම සඳහා වර්ෂය තුළ රැස් කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මුළු රජයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.බිලියන 414.43 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 240.56 කින් හෙවත් සියයට 138.35 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 05 ක පුනරාවර්තන වියදම, රජයේ ආදායම හා රජයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම පිළිබඳ තොරතුරු වගුව 07 හි දැක්වේ.

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන |
| රජයේ ආදායම | 1,127.63 | 1,394.24 | 1,698.76 | 1,845.02 | 1,935.09 | 1,907.20 |
| පුනරාවර්තන වියදම | 1,370.05 | 1,672.92 | 1,770.88 | 1,945.57 | 2,108.96 | 2,321.62 |
| රජයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම | 242.42 | 278.68 | 72.12 | 100.55 | 173.87 | 414.42 |

වගුව 07: රජයේ ආදායම, පුනරාවර්තන වියදම හා රජයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම

මූලාශ්‍ර :- රජයේ මූල්‍ය ප්‍රකාශන

එසේම, මූලධන වියදම් සඳහාද සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 637.22 ක් වැයකර තිබුණු අතර, පුනරාවර්තන වියදමේ කොටසක්, රාජ්‍ය ආයෝජන සහ ණය වාරික ගෙවීමට දේශීය ණය, විදේශ ණය හා ආධාර ලබා ගැනීමට සිදුවී තිබුණි. ඒ අනුව වාර්ෂික ණය වාරික හා පොලී ලෙස විශාල මුදලක් ගෙවීමට සිදුවී තිබුණු අතර එම පිරිවැය වාර්ෂිකව වර්ධනය වෙමින් පැවතුණි.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම්, රාජ්‍ය ආයෝජන සහ ණය ආපසු ගෙවීම්වල එකතුව රු.බිලියන 4,075.83 ක් වී තිබුණු අතර එම සමස්ථ වියදමින් සියයට 27.41 ක් ණය ගෙවීම සඳහාද, සියයට 21.81 ක් ණය පොලී හා වට්ටම් ගෙවීම සඳහාද වැයකර තිබුණි. විස්තර රූපසටහන 02 හි දැක්වේ.




රූපසටහන 02 – 2019 වර්ෂයේ පුනරාවර්තන, රාජ්‍ය ආයෝජන හා ණය ගෙවීම්
මූලාශ්‍රය - රාජයේ මූල්‍ය ප්‍රකාශන 2019

**2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 4.6 ඡේදය යටතේ රජයේ කාර්යභාරය අංශ 42 ක් පොකුරු 13 ක් යටතේ වර්ගීකරණය කර තිබුණි. රජයේ සමස්ථ වියදම එම පොකුරු 13 යටතේ බෙදීගිය ආකාරය රූපසටහන 03 හි දැක්වේ**




රූපසටහන 03- පොකුරු 13 ක් යටතේ සමස්ථ වියදම බෙදී ගිය ආකාරය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2019

සමස්ථ වියදමෙන් රු.බිලියන 2,140.47 ක සේවා ආර්ථිකය සඳහා වියදම් කර තිබුණත්, ඉන් රු.බිලියන 1,116.98 ක් දේශීය හා විදේශීය ණය වාරික ගෙවීමටත්, රු.බිලියන 888.79 ක් පොලී ගෙවීමටත් වැය කර තිබුණි. ඒ අනුව සේවා ආර්ථිකය වෙනුවෙන් වූ වියදම තුළ වූ ණය වාරික හා පොලී ගෙවීම රූපසටහන 04 හි දැක්වේ.




රූපසටහන 04 - මුළු සේවා වියදම හා ණය වාරික හා පොලී ගෙවීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2019

## රාජ්‍ය ආදායම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, බදු ආදායම, බදු නොවන ආදායම හා වෙනත් ආදායම් ලෙස ඇස්තමේන්තු කළ රජයේ ආදායම රු.බිලියන 2,360.60 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ වූ රු.බිලියන 2,233.10 ක ඇස්තමේන්තුගත ආදායම සමඟ සැසඳීමේ දී රු.බිලියන 127.50 ක් හෙවත් සියයට 5.71 ක වැඩි වීමක් විය. ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 1,907.19 ක ආදායම් රැස් කර තිබුණු අතර එය ඇස්තමේන්තුගත ආදායමට වඩා රු. බිලියන 453.40 ක් හෙවත් සියයට 19.21 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයේ රැස්කළ රු.බිලියන 1,935.09 ක ආදායම සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.බිලියන 27.90 ක් හෙවත් සියයට 1.44 කින් අඩු වී තිබුණි. රජයේ ආදායම් දළ දේශීය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී ඉකුත් වර්ෂයේදී සියයට 13.62 ක් වී තිබුණත්, එය සමාලෝචිත වර්ෂයේදී සියයට 12.23 ක් දක්වා අඩු වී තිබුණි. 2016 වර්ෂයේදී එම අනුපාතය සියයට 14.3 ක් වාර්තා වී තිබුණු අතර ඉන් පසු වර්ෂවල අනුපාතය ක්‍රමිකව අඩුවෙමින් පැවතුණි. විස්තර රූපසටහන 05 හි දැක්වේ.




රූප සටහන 05 - රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ආදායම "බදු ආදායම හා බදු නොවන ආදායම" ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකක් යටතේ වාර්තා වී තිබුණු අතර, බදු ආදායම නැවත "ආදායම් බදු, දේශීය භාණ්ඩ හා සේවා මත බදු හා ජාත්‍යන්තර වෙළඳාම මත බදු වශයෙන් වර්ග කර රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වශයෙන් රු.බිලියන 385.00 ක් රැස් කිරීමට අපේක්ෂා කර තිබුණ ද, එම ඉලක්කය රු.බිලියන 42.7 ක් හෙවත් සියයට 11.09 කින් ඉක්මවා රු. බිලියන 427.70 ක ආදායම් රැස් කර තිබුණි. දේශීය භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 1,291.36 ක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, ඉන් රු.බිලියන 973.84 ක් පමණක් රැස් කිරීමට සමත් වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 400.64 ක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.බිලියන 333.38 ක් රැස් කර තිබුණි. මේ අනුව, බදු ආදායම්වලින් රු.බිලියන 2,077.00 ක් රැස් කිරීමට අපේක්ෂා කර තිබුණත්, ඉන් සියයට 83.53 ක් හෙවත් රු.බිලියන 1,734.92 ක් පමණක් රැස් කර ගැනීමට හැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී බදු නොවන අනෙකුත් ආදායම්වලින් රු.බිලියන 283.60 ක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, ඉන් රු.බිලියන 172.27 ක ආදායම් පමණක් රැස් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ආදායම් වර්ගීකරණය හා එම වර්ගීකරණය අනුව ඇස්තමේන්තු කළ රජයේ ආදායම හා රැස් කළ ආදායම පහත දැක්වෙන රූප සටහන 06 හි දැක්වේ.




රූපසටහන 06 - ඇස්තමේන්තුගත හා තථ්‍ය රජයේ ආදායම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන - 2019

## බදු ආදායම

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු. බිලියන 1,734.92 ක් වූ අතර එය මුළු රජයේ ආදායමෙන් සියයට 90.97 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයේදී බදු ආදායම රු.බිලියන 1,712.32 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 1.32 කින් හෙවත් රු.බිලියන 22.60 කින් වැඩි වී තිබුණි.

## ආදායම් බදු

ඉකුත් වර්ෂයේ දී රු.බිලියන 310.45 ක් වූ බදු ආදායම සමාලෝචිත වර්ෂයේදී සියයට 37.77 කින් හෙවත් රු.බිලියන 117.25 කින් වැඩි වී රු.බිලියන 427.70 ක් වී තිබුණි. එය මුළු බදු ආදායමින් සියයට 24.65 ක් ද, මුළු රජයේ ආදායමෙන් සියයට 22.43 ක් ද නියෝජනය වී තිබුණි. මෙසේ ආදායම් බදු වර්ධනය වීම කෙරෙහි ආදායම් බදු යටතේ වන සංස්ථාපිත බදු ආදායම රු.බිලියන 101.35 කින් හා සංස්ථාපිත නොවන මුළු බදු ආදායම රු.බිලියන 15.90 කින් වර්ධනය වීම බලපා තිබුණි.

## දේශීය භාණ්ඩ හා සේවා මත බදු

සමාලෝචිත වර්ෂයේ දී රැස් කර තිබුණු බදු ආදායමින්, දේශීය භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු මුදල රු.බිලියන 973.84 ක් හෙවත් මුළු බදු ආදායමින් සියයට 56.13 ක් ද, මුළු රජයේ ආදායමින් සියයට 51.06 ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී එය මුළු බදු ආදායමින් සියයට 61.91 ක් ද, මුළු රජයේ ආදායමින් සියයට 54.79 ක් ද වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, දේශීය භාණ්ඩ හා සේවා යටතේ වන එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලින් සියයට 26.98 කට වඩා වැඩි දායකත්වයක් මුළු රජයේ ආදායමට සපයා තිබුණි. සුරා බදු ආඥා පනත යටතේ සුරාබදුවලින් රු.බිලියන 115.38 ක ආදායමක් රැස්කර තිබුණු අතර එය මුළු රජයේ ආදායමෙන් සියයට 6.05 ක් නියෝජනය විය. නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු යටතේ සිගරට්, මත්පැන්, පෙට්‍රෝලියම් නිෂ්පාදන, මෝටර් රථ වාහන හා අනෙකුත් ආදායම් වශයෙන් රු.බිලියන 284.09 ක ආදායමක් රැස්කර

තිබුණු අතර එය සමස්ථ රජයේ ආදායමෙන් සියයට 14.90 ක නියෝජනයක් වී තිබුණි.

### ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු

රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් රු.බිලියන 333.38 ක් රැස් කර තිබුණ අතර එය මුළු බදු ආදායමින් සියයට 19.22 ක් ද, සමස්ත රජයේ ආදායමින් සියයට 17.48 ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් ආදායම් රැස් කිරීම රු.බිලියන 8.33 කින් එනම් සියයට 2.44 කින් අඩුවී වී තිබුණි.

ඉහත සඳහන් පරිදි රාජ්‍ය ආදායම් ව්‍යුහය තුළ වක්‍ර බදු සේ සැලකිය හැකි ආදායමේ ඉහළ දායකත්වය සහ වර්ධනය සඳහා පහත සඳහන් සාධකයන් ගෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර තිබුණු අතර එම බලපෑම්වල මූල්‍යමය වටිනාකම ගණනය කිරීම සඳහා ආදායම් එකතු කරන දෙපාර්තමේන්තු විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම් රැස්කරන දෙපාර්තමේන්තුවල සැබෑ කාර්යසාධනය මැනීම සඳහා රැස්කරන ආදායමේ වර්ධනය පමණක් සැලකිල්ලට ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ.

- රජය විසින් ඉහළ බදු අනුපාතයන් නියම කිරීම.
- විශේෂ අවස්ථාවලදී සිදුවන ආනයනයන්ගේ වර්ධනය හේතුවෙන් ඇතිවන බදු ආදායමේ වර්ධනය.
- භාණ්ඩ හා සේවාවල විදේශීය වෙළඳපල මිල ගණන් ඉහළ යාම නිසා සිදුවන බදු ආදායමේ වර්ධනය.
- විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුවෙන් ඇතිවන ආනයන පිරිවැය වර්ධනය මත බදු ආදායම වර්ධනය වීම.

තවද, විදේශීය වෙළඳ ගිවිසුම් සහ වෙනත් නීතීන් මත සිදු කරනු ලබන බදු අත් හැරීම්, ලිහිල් කිරීම් සහ බදු නිදහස් කිරීම් හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදුවන බලපෑම සම්බන්ධ විස්තරාත්මක තොරතුරුද අදාළ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය මැනීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### බදු නොවන ආදායම

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ආදායම් ව්‍යුහය තුළ බදු නොවන ආදායමේ සාපේක්ෂ දායකත්වය සියයට 9.03 ක් වැනි පහළ අගයක් ගෙන තිබුණ අතර එය ඉකුත් වර්ෂයේ දී සියයට 11.51 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ බදු නොවන ආදායම රු.බිලියන 50.51 කින් හෙවත් සියයට 22.67 කින් පහළ වැටී තිබුණි.

### රාජ්‍ය ආදායම හා අය වැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශවලට අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.බිලියන 1,067.59 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු.බිලියන 239.23 ක් හෙවත් සියයට 28.88 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, තථ්‍ය අයවැය හිඟය රු.බිලියන 1,051.64 ක් වූ අතර එය ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු.බිලියන 15.95 ක් හෙවත් සියයට 1.49 ක අඩු වීමකි. එසේ වුවද, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු.බිලියන 252.47 කින් හෙවත් සියයට 31.59 කින් වැඩි වී තිබුණි.

රාජ්‍ය ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය රජයේ ආදායමින් සියයට 55.14 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අගය සියයට 41.29 ක් වී තිබුණි. 2015 වර්ෂයේ සිට රජයේ ආදායමට සාපේක්ෂව අයවැය හිඟය සම්බන්ධ විස්තර රූපසටහන 07 හි දක්වා ඇත.




රූපසටහන 07 - ආදායමට සාපේක්ෂ ආවැය හිඟය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2019

## පුනරාවර්තන වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන වියදම රු.බිලියන 2,321.62 ක් හා රජයේ මූලධන වියදම රු.බිලියන 637.22 ක් වී තිබුණි. එහෙත් රජය විසින් උපයා තිබුණ සමස්ත ආදායම රු.බිලියන 1,907.19 ක් වීම හේතුවෙන් එම ආදායම වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමස්ත රජයේ ආදායම රු. බිලියන 414.43 කින් ඉක්මවා පුනරාවර්තන වියදම් කර තබුණි.

## අයවැය හිඟය

"2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම" ආණ්ඩුව විසින් අනුගමනය කළයුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදකවූ පරමාර්ථයක් ලෙස 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තියෙහි දක්වා තිබුණි. එසේ වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත අයවැය හිඟය පිළිවෙලින් රු.බිලියන 828.37 ක් හා රු.බිලියන 1,067.59 ක් වී තිබුණි. එමෙන්ම එම වර්ෂවලට අදාළ අයවැය හිඟය

ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් පිළිවෙලින් සියයට 5.83 ක් හා සියයට 6.85 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය කළමනාකරණ වගකීම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට භාණ්ඩාගාරය අපොහොසත් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු.බිලියන 1,05.64 ක් වී තිබුණු අතර, එය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6.74 ක් වී තිබුණි. එම අනුපාතය ඉකුත් වර්ෂයේදී සියයට 5.62 ක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මුළු රජයේ ආදායම රු.බිලියන 1, 907.19 ක් වූ අතර සමස්ථ රජයේ වියදම (පුනරාවර්තන වියදම + රාජ්‍ය ආයෝජන) රු.බිලියන 2,958.84 ක් වී තිබුණි. ඒ අනුව අයවැය හිඟය රු.බිලියන 1,051.64 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 7 ක රාජ්‍ය ආදායම, වියදම හා අයවැය හිඟය පිළිබඳ විස්තර රූපසටහන 08 හි දැක්වේ.




රූපසටහන 08 - රජයේ මුළු ආදායම, මුළු වියදම හා අයවැය හිඟය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

## අයවැය හිඟය මූල්‍යනය කිරීම

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අයවැය හිඟය රු. බිලියන 252.46 කින් එනම් සියයට 31.59 කින් වැඩිවී තිබුණු අතර ශුද්ධ විදේශ ණය ගැනීම් රු.බිලියන 464.59 සිට රු.බිලියන 362.76 ක් දක්වා රු. බිලියන 101.83 කින් එනම් සියයට 21.92 කින් අඩු වී තිබුණි. ශුද්ධ දේශීය ණය ගැනීම් රු.බිලියන 169.92 ක සිට රු.බිලියන 523.03 ක් දක්වා රු.බිලියන 353.11 කින් එනම් සියයට 207.81 කින් වැඩි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය ණය ගැනීම් මගින් ඉහළ දායකත්වයක් ලබා ගෙන තිබුණු අතර, එය සමස්ථ මූල්‍යනයෙන් සියයට 49.73 ක් වී තිබුණි. ඊට අමතරව ශුද්ධ විදේශ ණය ගැනීම් සියයට 34.49 ක්ද, උප ණය අයකර ගැනීම් සියයට 1.74 ක්ද සහ තැන්පතු ගිණුම් හා වගකීම්වල ශුද්ධ වෙනස්වීම සියයට 8.37 ක් වී තිබුණි.

## රාජ්‍ය ණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ණය ඇතුළු සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතුවන අතර ජනරජයේ සියළු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුවේ. ඒ අනුව, 2019 අංක 6 දරන විසර්ජන පනතේ 2.1(අ) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව ණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා දී තිබුණි.

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශිය ණය රු.බිලියන 935 ක්ද, දේශීය බැංකු නොවන ණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.බිලියන 1,068 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 2,002.78 ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබා ගෙන තිබුණු රු.බිලියන 1,870.87 ක ණය ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) සමඟ සැසඳීමේදී, රු.බිලියන 132 කින් හෙවත් සියයට 7.05 කින් වැඩි වී තිබුණි. රජය දේශීය ණය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වා තිබුණත් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේදී ලබාගෙන තිබුණු (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.බිලියන 1,099.26 ක දේශීය ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී එය රු.බිලියන 31 කින් හෙවත් සියයට 2.87 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා ගත් ණය ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සසඳා වගුව 08 හි දැක්වේ.

| විස්තරය | 2019 | 2018 |
|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන |
| විදේශ ණය ගැනීම් | 935.10 | 771.61 |
| දේශීය ණය ගැනීම් | | |
| භාණ්ඩාගාර බිල්පත් )ශුද්ධ( | 138.87 | 34.09 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 768.00 | 763.02 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | 67.94 | 62.38 |
| සංවර්ධන බැඳුම්කර | 61.86 | 234.09 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ( ව්‍යාපෘති නොවන) | 1.01 | 5.68 |
| භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රීය වගකීම් කළ පනත) | 30.00 | - |
| මුළු දේශීය ණය ගැනීම් | 1,067.68 | 1,099.26 |
| වර්ෂය තුළ ලබාගත් මුළු ණය ප්‍රමාණය | 2,002.78 | 1,870.87 |

වගුව 08 - ලබාගත් ණය වර්ගීකරණය

මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / රජයේ මූල්‍ය ප්‍රකාශන

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය (මහ බැංකු අත්තිකාරම් හා බැංකු අයිරාව හැර) රු. බිලියන 12,187.86 ක් වූ අතර, එය 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.බිලියන 11,276.28 ක් වූ මුළු රාජ්‍ය

ණය ශේෂය (මහ බැංකු අත්තිකාරම් හා බැංකු අයිරාව හැර) සමග සැසඳීමේදී රු.බිලියන 911.58 කින් හෙවත් සියයට 8.08 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තරයක් වගුව 09 හි දැක්වේ.

| විෂය | දෙසැම්බර් 31දිනට ශේෂය | |
|---|---|---|
| | 2019 | 2018 |
| | රු .බිලියන | රු .බිලියන |
| භාණ්ඩාගාර බිල්පත් | 897.67 | 758.80 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 4,338.28 | 4,999.93 |
| රුපියල් ණය | 24.09 | 24.09 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 560.23 | 614.22 |
| විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය | 168.01 | 100.51 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකය (ව්‍යාපෘති) | 17.70 | 19.51 |
| සුහුරුපාය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් ණය | 6.26 | 6.82 |
| භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රිය වගකීම් කළමනාකරණ පනත) | 30.00 | - |
| විශ්‍රාම පාරිතෝෂික ණය | 61.13 | - |
| කල්බදු ණය හිමියන් | 2.88 | 7.66 |
| මුළු දේශිය ණය | 6,106.25 | 5,531.55 |
| විදේශීය (ව්‍යාපෘති) | 3,105.83 | 3,194.16 |
| විදේශ මුදලින් කාලීන ණය පහසුකම් | 242.19 | 330.17 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2,733.59 | 2,220.41 |
| මුළු විදේශිය ණය | 6,081.61 | 5,744.74 |
| මුළු රාජ්‍ය ණය ශේෂය | 12,187.86 | 11,276.28 |
| ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතය | 15,600.00 | 14,200.00 |
| මුළු රාජ්‍ය ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස | 78.13 | 79.41 |

වගුව 09වර්ගීකරණය කරන ලද වර්ෂය අවසානයට පැවැති ණය ශේෂය

මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / රජයේ මූල්‍ය ප්‍රකාශන

### පාර්ලිමේන්තුව පනවා තිබුණු ණය සීමාව ඉක්මවා ණය ලබා ගැනීම

2019 අංක 6 දරන විසර්ජන පනතේ 2(1) (ආ) වගන්තිය ප්‍රකාරව, 2019 මුදල් වර්ෂය තුල ලබාගනු ලබන ණය මුදල් වලින් පැන නගින ඉතිරි ශේෂය 2019 මුදල් වර්ෂය තුළ කවර හෝ අවස්ථාවකදී හෝ වර්ෂය අවසානයේදී රු.බිලියන 2,079 ක් නොඉක්මවිය යුතුව තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පනතේ විධිවිධාන ප්‍රකාරව ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය රු.බිලියන 2,158 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට පාර්ලිමේන්තුව විසින් නියම කර තිබුණු ණය සීමාව රු.බිලියන 79 කින් ඉක්මවා තිබුණි. විස්තර වගුව 10 හි දැක්වේ.

| විස්තරය | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන |
|---|---|---|---|
| විදේශ ණය ගැනීම | | 935.10 | |
| 2019 වර්ෂය තුල උපලබ්ධි වූ නමුත් ගිණුම්ගත නොකළ විදේශ ණය | | 176.84 | |
| ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබන ලද විදේශ ණය -වර්ෂය තුළ ලැබීම් | | 8.12 | |
| දේශීය ණය ගැනීම් | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 768.00 | |
| විදේශ ව්‍යවහාර බැංකු ඒකක (ව්‍යාපෘතිනොවන) | | 67.94 | |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | | 61.86 | |
| විදේශ ව්‍යවහාර බැංකු ඒකක (ව්‍යාපෘති) | | 1.01 | |
| භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් | 1,719.33 | | |
| භාණ්ඩාගාර බිල්පත සඳහා ගෙවීම් | 1,580.45 | 138.88 | |
| 2019 වර්ෂය තුළ ලබා ගත් මුළු ණය | | | 2,157.75 |
| 2019 අංක 6 දරන විසර්ජන පනතට අනුව 2019 වර්ෂය වෙනුවෙන් ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය | | | 2,079.00 |
| 2019 වර්ෂයේදී ණය සීමාව ඉක්මවීම | | | 78.75 |

වගුව 10 - ණය සිමාව ඉක්මවීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2019

### උපරිම බැරකම් සීමාව ඉක්මවීම

2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 නොඉක්මවිය යුතුය. විගණනයට ඉදිරිපත් කළ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම සීමාවන්ට අනුගතව කටයුතු කර තිබුණි. නමුත් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත නොකළ විදේශ ණය, භාණ්ඩාගාර බැඳුම්කර හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා තිබුණු විවිධ රාජ්‍ය ව්‍යවසායවලට අදාළ බැරකම්, මහ බැංකු අත්තිකාරම් හා බැංකු අයිරා වශයෙන් රු.බිලියන 1,035 ක

බැරකම් සැලැකිල්ලට ගත් විට රජයේ සමස්ථ බැරකම රු.බිලියන 13,493 ක් වී තිබුණි. එය 2019 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 86.49 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ සඳහන් උපරිම බැරකම් සීමාව ඉක්මවා තිබුණි. විස්තර වගුව 11 හි දැක්වේ.

| බැරකම් | 2019දෙසැම්බර් 31 දිනට බැරකම්* |
|---|---|
| | රු.බිලියන |
| බැංකු අයිරාව | 194.52 |
| මහ බැංකු අත්තිකාරම් | 236.61 |
| රාජ්‍ය ණය (රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව) | 12,187.86 |
| මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත නොකළ බැරකම්: | |
| - ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබන විදේශ ණය | 345.45 |
| - භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම | 318.25 |
| - ගිණුම්ගත නොකළ විදේශ ණය | 210.19 |
| මුළු බැරකම | 13,493.88 |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | 15,600.00 |
| මුළු බැරකම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 86.49 |

වගුව 11 - උපරිම බැරකම් සීමාව ඉකිමවීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය පුකාහන

- මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 858 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශන වල ඇතුළත් රු. බිලියන 165 ක වටිනාකම්ද ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

## ඒක පුද්ගල ණය ප්‍රමාණයේ වැඩිවීම

මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රු.264,824 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය 2019 දෙසැම්බර් 31 දින වන විට රු.558,999 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම එය 2018 දෙසැම්බර් 31 දිනට පැවැති රු.520,364 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.38,635 කින් හෙවත් සියයට 7.42 කින් වැඩි වී තිබුණි. ඒක පුද්ගල ණය ප්‍රමාණය වැඩිවීම රූපසටහන 09 හි දක්වේ.




රූපසටහන 09- ඒක පුද්ගල ණය ප්‍රමාණය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන/ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

## රාජ්‍ය ණය ශේෂය තුළ විදේශීය ණය නියෝජනයේ වර්ධනය

මුළු රාජ්‍ය ණය ශේෂයෙන් සියයට 49 ක් විදේශ ණයවලින් සමන්විත වේ. රුපියල අවප්‍රමාණය වීම නිසා විදේශ ණය ශේෂයේ රුපියල් වටිනාකම වැඩිවීම නිසා ගෙවිය යුතු විදේශ ණය ශේෂය අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොළී ගෙවීම් සහ රාජ්‍ය ආදායම

2019 වර්ෂයේදී දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොළී ගෙවීම් සහ රාජ්‍ය ආදායම ඉකුත් වසර 05 සමඟ සසඳා වගුව 11 හි දැක්වේ.

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු.බිලියන | රු. බිලියන | රු. බිලියන |
| වර්ෂය තුළ ලබාගත් දේශීය ණය* | 2,020.23 | 2,793.43 | 2,517.78 | 2,548.63 | 2,718.43 | 2,648.13 |
| වර්ෂය තුළ ලබාගත් විදේශ ණය | 422.54 | 556.37 | 574.25 | 601.31 | 771.61 | 935.10 |
| ලබාගත් දේශීය හා විදේශ ණය එකතුව | 2,442.77 | 3,349.80 | 3,092.03 | 3,149.93 | 3,490.04 | 3,583.33 |
| දේශීය ණය වාරික ගෙවීම** | 1,583.77 | 2,265.48 | 2,072.67 | 2,340.15 | 2,548.51 | 2,125.10 |
| විදේශීය ණය වාරික ගෙවීම | 106.98 | 187.11 | 145.12 | 219.35 | 307.01 | 572.34 |
| දේශීය ණය සඳහා පොළී ගෙවීම් | 376.46 | 450.05 | 509.82 | 597.02 | 667.66 | 654.82 |
| විදේශීය ණය සඳහා පොළී ගෙවීම් | 69.93 | 77.17 | 101.08 | 138.55 | 184.53 | 233.97 |
| ණය වාරික හා පොළී ගෙවීම් එකතුව | 2,137.14 | 2,979.82 | 2,828.68 | 3,295.06 | 3,707.72 | 3,586.23 |
| රාජ්‍ය ආදායම | 1,127.03 | 1,394.24 | 1,698.75 | 1,845.02 | 1,935.09 | 1,907.20 |
| රාජ්‍ය ආදායම ඉක්මවූ ණය වාරික හා පොළී ගෙවීම් ප්‍රමාණය | 1,010.11 | 1,585.58 | 1,129.92 | 1,450.04 | 1,772.62 | 1,679.03 |
| දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය | 6,577.48 | 7,684.95 | 8,793.96 | 9,588.10 | 11,276.28 | 12,187.86 |

වගුව 11 - දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොළී ගෙවීම් සහ රාජ්‍ය ආදායම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

* වර්ෂය තුළ ලබාගත් දේශීය ණය තුළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් ලබාගත් මුදල ඇතුළත් වේ. [සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත් වටිනාකම + (මූල්‍ය ප්‍රකාශන සටහන 13 අනුව සමාලෝචිත වර්ෂයේ ලබාගත් දේශීය ණය + භාණ්ඩාගාර බිල්පත් මගින් ශුද්ධ ණය ගැනීම)]
[උදා:- සමාලෝචිත වර්ෂයේ රු. බිලියන 1,719.33 + (1,067.68 – 138.87) = 2,648.13]

** දේශීය ණය වාරික ගෙවීම් තුළ භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය තුළ කරන ලද ගෙවීම් ඇතුළත් වේ.
(මූල්‍ය ප්‍රකාශන සටහන 14 අනුව සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවූ දේශීය ණය + සමාලෝචිත වර්ෂය තුළ ආපසු ගෙවූ භාණ්ඩාගාර බිල්පත් වටිනාකම)
(උදා:- සමාලෝචිත වර්ෂයේ රු. බිලියන 544.65 + 1,580.45 = 2,125.10)

## රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොළී ගෙවීම වැඩිවීම

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම්වල එකතුව රු.බිලියන 27.90 කින් එනම් සියයට 1.44 කින් අඩු වී තිබුණ අතර, ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව රු.බිලියන 453.40 කින් හෙවත් සියයට 19.21 කින් අඩු වී තිබුණි. එසේම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ණය ගැනීම් (දේශීය හා විදේශීය) රු. බිලියන 251.29 කින් වැඩි වී තිබුණු අතර ණය සඳහා පොලී ගෙවීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී

රු.බිලියන 36.60 කින් හෙවත් සියයට 4.29 කින් වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 10 හි දැක්වේ.




රූපසටහන 10- රජයේ ආදායම අඩු වී ණය වාරික හා පොලිය වැඩිවීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

### ණය වාරික හා පොලිය ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.බිලියන 1,907.20 ක් වී තිබුණත්, ගෙවිය යුතුව තිබුණු ණය වාරික හා පොලිය රු.බිලියන 3,586.23 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතුව තිබුණු ණය වාරික හා පොලියෙන් සියයට 53.18 ක් පමණක් ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් විය. ඒ අනුව, ගෙවිය යුතු ණය වාරික හා පොලීවලින් සියයට 46.82 ක් එනම්, රු.බිලියන 1,679.03 ක් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දේශීය හෝ විදේශීය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි.

### ලබාගත් ණය ප්‍රමාණය ඉක්මවා ණය වාරික හා පොලී ගෙවීම

ඉකුත් වර්ෂයේ සම්පූර්ණ ණය වාරික හා ණය පොලී ගෙවීම්, වර්ෂය තුළ ලබාගත් මුළු ණය වලින් සියයට 106.23 ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේදී සියයට 100.08 ක් විය. ඒ අනුව වර්ෂය තුළ ලබාගත් මුළු ණය, වර්ෂයේ ණය වාරික හා ණය පොලී ගෙවීම් සඳහාවත් ප්‍රමාණවත් වී නොතිබුණි. මේ අනුව, වර්ෂය අවසානයට වූ මුළු රාජ්‍ය ණය ශේෂය වසර ගණනාවක් තිස්සේ අඛණ්ඩව වර්ධනය වී තිබූ බව නිරීක්ෂණය විය.

### ලබා ගත් ණය සංවර්ධන ව්‍යාපෘතිවලට උපයෝජනය කිරීමට නොහැකිවීම

2019 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 12,187.86 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය, රු.බිලියන 15,600 ක් වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 78.13 ක් වී තිබුණි. මේ අනුව, දීර්ඝ කාලයක් මුළුල්ලේ රජය විසින් ලබාගනු ලබන දේශීය හා විදේශීය ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් ණය වාරික හා පොලී ආපසු ගෙවීම සඳහා යොදා ගෙන තිබීම නිසා අපේක්ෂිත පරිදි සංවර්ධනාත්මක ව්‍යාපෘති

සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් කිරීමට නොහැකි වී තිබුණි.

## රජයේ මූල්‍ය ප්‍රකාශනවල රු.බිලියන 152 ක ණය අඩුවෙන් ගිණුම්ගත කිරීම

- විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2019 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු රාජ්‍ය ණය ශේෂය රු..බිලියන 12.19 ක් වී තිබුණත්, නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් පරිදි රු.බිලියන 701 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

  - රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ සිට නිවැරදිකර තිබූ අතර, ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී ඒවායේ ශුද්ධ අගය වෙනුවට මුහුණත අගයට ගිණුම්ගත කිරීම ආරම්භකර තිබුණි .එසේ වුවද, 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකම තවදුරටත් ගිණුම්වලට ගැලපුම් නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාල මුළු බැරකම රු.බිලියන 318 ක් අඩුවෙන් දක්වා තිබුණි.

  - 2019 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ලබා ගත් ණයවලින් රු.බිලියන 172.72 ක ණය ශේෂයක් ගෙවිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් 2017 ජූලි 20 දින වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා 2017 අගෝස්තු 04 දින අමාත්‍ය මණ්ඩල විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ණයවලින් තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් බාර ගෙන තිබුණත් එම ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි.

  - ණය අංක 2012033 - හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II යටතේ, 2019 වර්ෂයේදී ලැබී තිබුණු රු.බිලියන 8.16 ක් වූ විදේශ ණය මුදල, රජයේ මූල්‍ය ප්‍රකාශනවලහෝ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි.

  - 2019 වර්ෂයේදී උපලබ්ධි වූ විදේශ ණය ගිවිසුම් 129 කට අදාළව රු. බිලියන 176.84 ක් හා විදේශ ණය ගිවිසුම් 19 කට අදාළව 2018 වර්ෂයේදී හෝ ඊට පෙර උපලබ්ධි වූ රු.බිලියන 33.34 ක් ලෙස එකතුව රු.බිලියන 210.19 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත්, විදේශ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව, 2019 වර්ෂයේදී විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකම රු. බිලියන 572.34 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 (විදේශ

ණය ශේෂ ප්‍රකාශනය) අනුව 2019 වර්ෂයේදී විදේශ ණය ගෙවීම් වටිනාකම රු.බිලියන 565.82 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඊට අදාළ සටහන් සමඟ සැසඳීමේදී විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකමෙහි රු.බිලියන 6.52 ක වෙනසක් පැවැතුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට මුළු රාජ්‍ය ණය ශේෂය රු.බිලියන12,187.86 වී තිබුණත්, ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරුවලට අනුව එදිනට රාජ්‍ය ණය ශේෂය රු.බිලියන 13,301.41 ක් වී තිබුණි. ඒ අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන හා මහ බැංකුව පවත්වාගෙන යනු ලබන තොරතුරු අනුව වූ රාජ්‍ය ණය ශේෂ අතර රු.බිලියන 843.55 ක වෙනසක් පැවැතුණි.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 විදේශ ණය ශේෂ ප්‍රකාශනය සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනට විදේශ ණය ගිවිසුම් 04 කට අදාළව රු.මිලියන 341 ක් අඩුවෙන් හා විදේශ ණය ගිවිසුම් 05 කට අදාළව රු. මිලියන 2,049 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර විදේශ ණය ගිවිසුම් 02 කට අදාළව රු. මිලියන 01 ක වෙනසක් පැවැතුණි.

# රාජ්‍ය ව්‍යවසාය

## නිරීක්ෂණ

- කාර්යසාධනය ඇගයීම
- මූල්‍ය කාර්යසාධනය
- තිරසර සංවර්ධනය
- මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය
- තත්ත්වාගණනය නොකළ මතය
- තත්ත්වාගණනය කළ මතය (හැර මතය)
- අහිතකර මතය
- මතය ව්‍යාචනය කිරීම
- ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම
- වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම
- රජය සතු සීමිත වගකීම් සමාගම්
- ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

# රාජ්‍ය ව්‍යවසායන්

රාජ්‍ය සතු ව්‍යවසායන් යනු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ රජයට පවරා ඇති ආයතනය සහ වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති, රජයට බහුතර හිමිකාරිත්වයක් ඇති සමාගම් වේ. ඒ අනුව රාජ්‍ය ව්‍යවසායනට තම නමින් ගිවිසුම්ගත වීමට, ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට මූල්‍ය හා මෙහෙයුම් අධිකාරයක් පවරා ඇති අතර ලාභයක් සහිතව හෝ සම්පූර්ණ පිරිවැය ආවරණය කරගන්නා පරිදි සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ අනෙකුත් අස්ථිත්වයන්ට භාණ්ඩ හා සේවා විකිණීම් කරනු ලබන සහ රාජ්‍ය අංශයේ අස්ථිත්වයක් මගින් පාලනය වන ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය හැකිය.

තවද රාජ්‍ය සතු ව්‍යාපාර ව්‍යවසායන් යනු භාණ්ඩ හෝ සේවා විකිණීම මගින් ව්‍යාපාර කටයුතුවල නියැලීමින් සහ ඒ අනුව ආදායම් උපයන රාජ්‍ය හිමිකාර ව්‍යාපාර වේ. උපයෝගීතා සේවා සපයන වෙළෙඳ ව්‍යවසායන් සහ මූල්‍ය ආයතන වැනි මූල්‍ය ව්‍යවසායන් ද රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් යටතට අයත් වේ. සමහර රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් ප්‍රජා සේවා සැපයීම පිළිබඳව වගකීමක් සහිතව ඇතැම් පුද්ගලයන්ට සහ ජන කොටස්වලට හා සේවා මිල අයකිරීමකින් තොරව හෝ සැළකිය යුතු පරිදි අවම ගාස්තු පදනමක් මත භාණ්ඩ හා සේවා සැපයීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වුවත්, සාමාන්‍යයෙන් ලාභයක් ඉපයීම සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව එහි වත්කම් මත ප්‍රතිලාභයක් ඉපැයීම අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. නියාමන, ප්‍රවර්ධනාත්මක හා අධ්‍යාපනික රාජ්‍ය ව්‍යවසායන් සම්ප්‍රදායානුකූලව වාණිජ අංශයන්ට අයත් නොවන අතර එම ව්‍යවසායන් ලාභ නොලබන සංවිධාන ලෙස සැලකෙන අතර, ලාභදායීත්වය හැර වෙනත් නිර්ණායකයන් භාවිතා කරමින් ඒවායේ කාර්යසාධනය පරික්ෂා කළ යුතු වේ. පහත සඳහන් ශීර්ෂයන් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.

- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්
- ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
- රජය සතු සීමිත වගකීම් සමාගම්
- නියාමන හා අධීක්ෂණ ආයතන
- විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ වෙනත් පුහුණු ආයතන
- වෙනත් සංවර්ධන හා ලාභ නොලබන ආයතන

2019 දෙසැම්බර් 31 දිනට ජාතික විගණන කාර්යාලය යටතේ විගණනයට භාජනය වූ රාජ්‍ය ව්‍යවසායන් 416 ක සංයුතිය පහත රූපසටහන 11 හි දැක්වේ.




රූපසටහන 11 – 2019 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි සංයුතිය

ඒ අනුව බලන විට ආර්ථිකයේ වැදගත් අංශයන් මෙහෙයවනු ලබනේ රාජ්‍ය ව්‍යවසායන් මගිනි. විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදිත, විදුලි සංදේශ හා ගුවන් ප්‍රවාහන, වරාය ආදී ආර්ථිකයේ උපාය මාර්ගිකව ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජ්‍ය අංශයේ සෘජු මැදිහත්වීම මඟින් මෙහෙයවනු ලැබේ. ආර්ථිකයේ සමස්ත හිමිකම් සහ තරඟකාරිත්වය කෙරෙහි සියළු රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය ඉතා වැදගත් වේ.

## කාර්යසාධනය ඇගයීම

රාජ්‍ය ව්‍යවසායන් විගණනය මූල්‍ය හා අනුකූලතා විගණනයට පමණක් සීමා නොවන අතර අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමතාවය, ආර්ථික බව හා ඵලදායීතාවය කෙරෙහිද අවධානය කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලාදායීතාවය පිළිබඳ විගණනය සමහර ප්‍රමිතින් හා නිර්නායකයන් මත පදනම්ව සිදු කරනු ලැබේ. ලාභය කාර්යසාධනයේ ප්‍රධාන නිර්නායකය නොවන අතරම රාජ්‍ය අරමුදල් ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමව යොදා ගැනීමේ කළමනාකරණයේ කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩාත් ඵලදායී වේ. ව්‍යවසායෙන් ව්‍යවසායට අරමුණු වෙනස් වේ. විගණනයේ එක් ප්‍රමුඛ කාර්යයක් වනුයේ ව්‍යවසායක කාර්යසාධනය ඇගයීම සඳහා නිර්නායකය හඳුනාගැනීමයි. නිෂ්පාදන ව්‍යවසායක, උදාහරණයක් වශයෙන්, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ගත් විට, අරමුණු සහ ආයෝජනයේ පදනම, ධාරිතාවය, පිරිවැය හා කාල සැලැසුම්, පරිභෝජන නියමයන්, ඉපැයීම්, ඵලදායීතාවය, පිරිවැය, ප්‍රතිලාභ අනුපාතය ආදිය කාර්යසාධනය මැනීමේ මිනුම් දඬු වේ. ව්‍යවසායක් වෙත ඇති දිගු හා කෙටි කාලීන ප්‍රාග්ධනය හා මෙහෙයුම් සැලැසුම් කාර්යසාධනය තක්සේරු කිරීමේ වෙනත් ආශ්‍රිත ලක්ෂණයන් වේ.

භෞතික කාර්යසාධනය ඇගයීම අදාළ වන අවස්ථාවක ඒකකයක තක්සේරු කළ ධාරිතාවය පිළිගත හැකි මිණුම් ලකුණක් වේ. අනුපාතික ධාරිතාවය උපයෝජනය යනු අමු ද්‍රව්‍ය සහ උපයෝගීතා පරිභෝජනය සඳහා සම්මතයන් ඉපැයීම් හා ප්‍රතික්ෂේපිතයන් මෙන්ම වියදමත් නඩත්තුව හා උපකරණ සේවා කිරීම සඳහා අවශ්‍යතාවයන් සමඟ තක්සේරු කිරීමයි. කාර්යසාධනය ඇගයීම

සඳහා අනෙක් වැදගත් පදනම වන්නේ පිරිවැය කාර්යක්ෂමතාවයයි. ධාරිතා උපයෝජනය, පරිභෝජනයන්, ඵලදායීතාවය, ඉපයීම් ආදිය පිළිබඳ සම්මතයන් මත පදනම්ව ප්‍රමිති හා පිරිවැය ඉලක්කයන් තීරණය කරනු ලැබේ. ආයතනික පාලනය, සාමාන්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, ඉදිකිරීම් කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායයක් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ ව්‍යවසායයක කාර්යසාධනය හා පද්ධති ඇගයීම් කිරීම සඳහා වෙනත් පදනමක් වේ. අභ්‍යන්තර හා බාහිර විශේෂඥයින් විසින් සිදුකරන වෙනත් තාක්ෂණික අධ්‍යයනයන් හා ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශයට පදනම් වන වෙනත් නිර්නායකයන් වේ.

කාර්යසාධන විගණනය කාලීන අවශ්‍යතාවයකි. මූල්‍ය විගණයේදී මූල්‍ය පාලනය හා ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳ සහතිකවීමක් සිදුකරයි. නමුත් සම්පත් ආර්ථිකබවින්, කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම කාර්යසාධන විගණනයෙන් අපේක්ෂා කෙරේ.

## මූල්‍ය කාර්යසාධනය

ලැබී ඇති තොරතුරුවලට අනුව රාජ්‍ය අංශයන්හි මෙහෙයුම් ප්‍රතිපල විශ්ලේෂණය කිරීමේදී ආර්ථික දියුණුවට ඉතා වැදගත් වන ක්ෂේත්‍රයන්හි නියතු රාජ්‍ය ව්‍යවසායයන්හි බොහොමයක් අලාභ ලබන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂනය වේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබී ඇති තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායන් 254 ක ලාභ අලාභ තත්වයන්හි විශ්ලේෂණය රූපසටහන 12 හි දැක්වේ.




රූපසටහන 12 – 2019 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ අලාභ තත්ත්වයන්හි විශ්ලේෂණය

ඉහත තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායයන්හි මුළු අලාභ ප්‍රමාණය රු බිලියන 102 වන අතර, මුළු ලාභ ප්‍රමාණය රුපියල් බිලියන 260 කි. ඒ අනුව රාජ්‍ය ව්‍යවසායයන්හි 2019 වර්ෂයේ සමස්ත ශුද්ධ ලාභය රුපියල් බිලියන 158 කි. මූල්‍ය තොරතුරු ඉදිරිපත් කළ ආයතන 254 කින් ආයතන 92 මූල්‍ය ඌනතාවයක් සහිත ආයතන වූ අතර 162 අතිරික්ත තිබුණි. ඒ අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කළ ආයතන අතර, සැලකිය යුතු මූල්‍ය ඌනතාවයක් සහිත ආයතන වුයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම හා විශ්වවිද්‍යාල විද්‍යාතන ඇතුළුව ආයතන 25ක් අන්තර්ගත විය.

2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායයන් මගින් පාලනය වන මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 11,354 වන අතර, 2018 වර වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 489 වැඩිවීමකි.එක් එක් වර්ගයන්හි රාජ්‍ය ව්‍යවසායන් 254 ක මුළු වත්කම්වල සංයුතිය ඉකුත් වර්ෂය අවසානය සමඟ සසඳා රූපසටහන 13 හි දැක්වේ.




රූපසටහන 13 – 2018 හා 2019 වර්ෂවල රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම්

## තිරසර සංවර්ධනය

ස්වභාවික සම්පත් සීඝ්‍රයෙන් පරිභෝජනය කිරීම හේතුවෙන් අනාගත පරපුර සඳහා සම්පත් හිඟවීමේ අවධානමකට මුහුණ දීමට සිදුවන ආකාරය හඳුනාගත හැකිය. එසේම සම්පත් පරිභෝජනයේ අතුරුඵලයක් වන අපද්‍රව්‍ය මගින් පරිසරයේ දරාගැනීමේ හැකියාව ඉක්මවා යන ආකාරයක්ද හඳුනාගත හැකිව තිබේ. අනිවාර්යයෙන්ම විය යුතු ආර්ථික සංවර්ධනයක් පරිසරයේ තිබිය යුතු තිරසාර බවත් යන දෙකෙහිම අත්‍යාවශ්‍ය වූ ඒකාබද්ධ කිරීමත් තිරසර සංවර්ධන සංකල්පයේ කේන්ද්‍රගත වූවකි. ආර්ථික සංවර්ධනය හා පාරිසරික සංරක්ෂණය එකිනෙකින් පෝෂණය වන තත්ත්වයක් ඇති කළ යුතු බවත් ඒ සඳහා ලෝකය පුරා දැනුවත් බවක් ඇති කළ යුතු බව අවධාරණය වේ.

පරිසර සංවර්ධනය කිරීමේ ලෝක සංවිධානය දක්වන ආකාරයට තිරසර සංවර්ධනයේ මූලික අරමුණ වන්නේ මූලික මිනිස් අවශ්‍යතාවයන් තෘප්ත කිරීමත්, ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකබව වැඩිදියුණු

කිරීමත්, පරිසර ආරක්ෂා කිරීමත් සමඟ නිෂ්පාදනය වර්ධනය කිරීමත්ය. ඒ අනුව අනාගත පරපුරට සිය අපේක්ෂාවන් හා අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට පවතින විභවතාව පවත්වාගෙන යන අතරම වත්මන් පරපුරට ඉහළම ප්‍රතිලාභ ලැබෙන අන්දමට මිනිසා විසින් ජෛව ගෝලය පරිහරණය කිරීම හා කළමනාකරණය තිරසාර සංවර්ධනය වේ.

ආර්ථික, සමාජීය, පාරිසරික ආදී ක්ෂේත්‍රයන්හි විවිධ කාලයන්හි පසුවන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සාමාජික රාජ්‍යයන් 2030 වසර වන විට එකම කාලයකට ගෙනඒමේ අපේක්ෂාවෙන් තිරසර සංවර්ධන අරමුණු හඳුන්වා දී ඇති අතර මේ පිළිබඳව 2015 සැප්තැම්බර් මාසයේදී පැවති එක්සත් ජාතීන්ගේ තිරසර සමුළුවේදී රැස් වූ රාජ්‍ය නායකයන් එකඟ වී තිබේ. තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය මේ සඳහා අදාළ කරගෙන ඇති අතර එය මිනිසා, පෘථිවිය සහ සෞභාග්‍ය ඉලක්ක කර ගත් සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශනයක් වේ. ශ්‍රී ලංකාවද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් බැවින් මෙම විශ්වීය ප්‍රකාශනය ශ්‍රී ලංකාව තුළද ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී. ඒඅනුව 2017 වර්ෂයේ සිට විගණනය කරනු ලබන ආයතන තුළින් මෙම සංකල්පය ක්‍රියාත්මක වීම පිළිබඳව සොයා බලනු ලබන අතර තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා රාජ්‍ය ආයතනවල සූදානම් තත්ත්වය හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය විගණනයක් සිදුකිරීමේදී හා වාර්තා කිරීමේදී අවධානයට ලක්වන විශේෂිත වූ නිරීක්ෂණයක් ලෙස තිරසර සංවර්ධනය හඳුනාගෙන තිබේ.

## මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

### තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයක් නොමැති විටෙක.

### තත්ත්වාගණනය කළ මතය (හැර මතය)

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් ඇතත් ඒවා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල විකෘති කර දැක්වීමට තරම් පෘථුල නොවන විටක,

### අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට නොහැකිවන ලෙස විෂය පථය සීමාකර ඇති විට.

### මතය ව්‍යාචනය කිරීම

තෝරාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඒවා ව්‍යවහාර කරන ලද ක්‍රමය හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව යනාදී කරුණු පිළිබඳව කළමනාකරණය හා විගණනය අතර ප්‍රමාණාත්මක/පෘථුල නොඑකඟතාවයන් හා වරදවා දැක්වීම් ඇතිවිට.

මූල්‍ය ප්‍රකාශන සඳහා මතයක් ප්‍රකාශ කිරීමේදී එය වඩාත් සාධාරණීකරණය වීම උදෙසා මූල්‍ය විගණනයේදී භාවිතා කළ හැකි පරිගණක විගණන මෘදුකාංගයක උපකාරයද ඉවහල් කර ගනු ලැබීය. ගිණුම් පරීක්ෂා කරමින් තෝරා ගන්නා ලද නියැදියක් ආශ්‍රයෙන් හා සමස්ථ ප්‍රමාණාත්මකභාවයට ප්‍රතිශතයක් ලෙස නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් එකතුව ගලපා එම ප්‍රතිඵලය මත විගණන මතය තීරණය කරනු ලබයි.

2019 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 416 කට අදාළව ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන වාර්තාවල ඇතුළත් විගණන මතය හා තොරතුරු ඉදිරිපත් නොකළ ආයතන ද ඇතුළත්ව ඉකුත් වර්ෂය සමඟ සසඳා වගුව 12 හි දැක්වේ.

| විගණන මතයේ ආකාරය | 2019 | 2018 |
|---|---|---|
| තත්ත්වාගණනය නොකළ | 62 | 90 |
| තත්ත්වාගණනය කළ | 110 | 176 |
| ව්‍යාචනය කළ | 7 | 17 |
| අහිතකර | 4 | 8 |
| මෙතෙක් තීරණය නොකළ | 71 | 14 |
| තොරතුරු ඉදිරිපත් නොකළ | 162 | 111 |

වගුව 12 - රාජ්‍ය ව්‍යවසායන් 416 කට අදාළ තොරතුරු

### ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම

දේපළ පිරියත හා උපකරණ යනු නිෂ්පාදනයේදී හා සේවා සැපයීමේ දී භාවිතා කරනු ලබන සහ වෙනත් අයට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය කටයුතු සඳහා තබාගෙන ඇති වත්කම් වන අතර එම වත්කම් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම් වේ. තවද ජංගම වත්කම් ලෙස හඳුන්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන හෝ වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව මාස දොළහක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා

කරන වත්කම් වේ. සෑම ස්ථාවර වත්කමක්ම නිවැරදිව අංකනය කිරීමක් හා ස්ථාවර වත්කම් ලේඛන නිසිපරිදි නඩත්තු කිරීම නොකරන්නේ නම් වත්කම් නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වන අතර ඒවා පිළිබඳ භෞතික සත්‍යාපනය අසාර්ථක කාර්යයක් බවට පත්වන බව නිරීක්ෂණය විය. එක් එක් ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීමේ ක්‍රියාමාර්ගය වත්කම් පාලනය තහවුරු වීම හා වත්කම් සාවද්‍ය පරිහරණයෙන් වලක්වා ගැනීම තහවුරු කර ගැනීමට ආයතනයකට පහසුකම් සලසයි. ක්ෂය ගණනය කිරීම, බදු සඳහා සහ රක්ෂණ කාර්යයන් සඳහා ඉඩ සැලසෙන වත්කම්වල නිවැරදි වටිනාකම තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක්ද වේ. ස්ථාවර වත්කම් ලේඛනය කළමනාකරණ අවශ්‍යතාවලට ගැලපෙන සම්පූර්ණ සහ නිවැරදි වාර්තා ජනනය කරයි. ගණන්දීමේ නිලධාරීන් විසින් රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල්, බඩුබාහිරාදී උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වා ගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාපනය කරනු ලබන බවටත්, නියමිත රෙගුලාසි හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවටත් සෑහීමකට පත්විය යුතු වුවද, බොහෝමයක් ආයතන චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් ලේඛන පවත්වාගෙන නොයන අතර මුදල් රෙගුලාසි අංක 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

බොහෝ රාජ්‍ය ආයතනවල භාවිතයෙන් ඉවත්කරන ලද වත්කම් නිෂ්ක්‍රීයව පවතින අතර එම වත්කම් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ආයතනවල අපහරණය කළ යුතු භාණ්ඩ සහ වත්කම් නියමිත පරිදි අපහරණය නොකිරීමෙන් එම භාණ්ඩ සහ වත්කම් විකිණීමෙන් ලබාගත හැකි ආදායම රජයට අහිමි වන අතර එම භාණ්ඩ ආරක්ෂා කිරීම හා ගබඩා කිරීම සඳහා අමතර පිරිවැයක්ද දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත දී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. 2019 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 162 ක මූල්‍ය ප්‍රකාශන 2020 සැප්තැම්බර් 30 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා එම රාජ්‍ය සංස්ථාවේ හෝ සමාගමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

## වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම

වාණිජමය තීරණ ගැනීමේදී හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීමේ දී බලපාන විවිධ අනුමත කිරීමේ අවශ්‍යතාවයන් අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රියාකාරීත්වයන්ටද අහිතකර ලෙස බලපානු ලබයි. මෙම සීමා කිරීම හේතුවෙන් බොහෝ ව්‍යවසායන් ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමින් වෘත්තිකයන් බඳවා ගැනීම සිදුකරන බව නිරික්ෂණ විය. පුද්ගලික අංශය සමඟ සැසඳීමේදී ඉතා අඩු වැටුප් ව්‍යුහයක් හේතුවෙන් විශේෂයෙන් ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන් හා තක්සේරුකරුවන් ආදී තනතුරු සඳහා බඳවා ගැනීමට හා වෘත්තීමය සුදුසුකම්ලාභීන් රඳවා ගැනීමට රාජ්‍ය ව්‍යවවසායන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

## රජය සතු සීමිත වගකීම් සමාගම්

රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය සතු සීමිත වගකීම් සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත කර තිබු අතර මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි ඇතිවන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

රාජ්‍ය ව්‍යවසායයන්හි ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වරින් වර පිරිඩී චක්‍රලේඛ ඉදිරිපත් කර ඇති අතර එහි යම් යම් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සමාගම් මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගතයුතු නමුත් එවැනි එකඟතාවයන් ලබාගැනිමකින් තොරව තීරණ ක්‍රියාත්මක කර ඇති අවස්ථා නිරීක්ෂණය විය.

## ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

මෙම ව්‍යවසායන් නියාමන හා අධික්ෂණ ආයතන, විශ්වවිද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන හා වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතනයන්ගෙන් සමන්විත වන අතර ආයතනවල ප්‍රධාන ලක්ෂණය නම් වාර්ෂික රජයේ ප්‍රදාන හෝ සමහර භාණ්ඩ හා සේවා මත රජය පනවන ලද බදු එම ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවය වීමයි.

## පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ගණන

| පළාත් පාලන ආයතන වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| මහා නගර සභා | 24 |
| නගර සභා | 41 |
| ප්‍රාදේශීය සභා | 276 |
| එකතුව | 341 |

# පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 කින් මහා නගර සභා 24 ක් මහා නගර සභා ආඥා පනතේ (පරි.252) විධිවිධාන මගින්ද, නගර සභා 41 ක් නගර සභා ආඥා පනතේ (පරි.255) විධිවිධාන මගින්ද, ප්‍රාදේශීය සභා 276 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මගින්ද පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පළාත් පාලන ආයතනයන්ගේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිකුත් කළ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් වගුව 13 හි දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | ගිණුම් ඉදිරිපත් කළ යුතු සභා ගණන | 2020.08.15 දිනට විගණනයට ඉදිරිපත් කළ ගිණුම් ගණන | විගණන වාර්තා නිකුත් කළ සභා ගණන | 2020.08.15 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ | මතය වාවතය | අහිතකර මතය |
| මහා නගර සභා | 24 | 24 | 19 | 16 | - | - | 03 |
| නගර සභා | 41 | 40 | 37 | 37 | - | - | - |
| ප්‍රාදේශීය සභා | 276 | 275 | 264 | 251 | 04 | 01 | 08 |
| එකතුව | 341 | 339 | 320 | 304 | 04 | 01 | 11 |

වගුව 13 - පළාත් පාලන ආයතන විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන හා නිකුත් කළ විගණන මතයන්
මූලාශ්‍රය - ජාතික විගණන කාර්යාලය

පළාත් පාලන බලමණ්ඩල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාවලින් අනාවරණය කර ඇති වැදගත් නිරීක්ෂණ කිහිපයක් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ රු.මිලියන 1.30 ක් වටිනා කැබ්රථයක් හා රු.මිලියන 2.65 ක් වටිනා ට්‍රැක්ටරයක් වර්ෂ 4 ක පමණ කාලයක සිටද, රු.මිලියන 6.22 ක් වටිනා ගාබේජ් කම්පැක්ටරයක් වර්ෂයක පමණ කාලයක සිටද, ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ නිෂ්ක්‍රීයව පැවැතුණි.

- 2011 වර්ෂයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් මහනැගුම ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති 07 හි කටයුතු ප්‍රජාපාදක සංවිධාන මගින් ක්‍රියාත්මක කර තිබුණි. එම ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය කුට්ටිගල් සැපයීමේ කොන්ත්‍රාත්තුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සභා අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමකට පවරා ඒ සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි. අදාළ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රජාපාදක සංවිධාන වෙත කුට්ටිගල් සපයා තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් කොන්ත්‍රාත්කාර සමාගම වෙත රු.මිලියන 2.09 ක් ගෙවිය යුතුව තිබුණි. කර්මාන්ත 04 කට සැපයූ කුට්ටි ගල් වෙනුවෙන් රු.මිලියන 1.31 ක් නොගෙවීම හේතුවෙන් අදාළ සමාගම විසින් සභාවට විරුද්ධව නුගේගොඩ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. එම කර්මාන්ත 04 ක්‍රියාත්මක කළ ප්‍රජාමූල

සංවිධාන විසින් කර්මාන්ත නිම කර අවසන් බිල්පත් ඉදිරිපත් කර තිබුණු අතර, සභාව විසින් එම බිල්පත් හා රැඳවුම් මුදල්ද ප්‍රජාපාදක සංවිධාන වෙත ගෙවා තිබුණි. එම කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්කාර සමාගම විසින් සපයා තිබුණු කුට්ටිගල්වල වටිනාකම එම බිල්පත් වටිනාකම්වලින් අඩු කර ගෙන නොතිබුණි.

- ඇලහැර ප්‍රාදේශීය සභාව විසින් දුරගමන් බස් නැවතුම්පලක් හා වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව කළු ගලක් කඩා ඉවත් කිරීම සඳහා රු.මිලියන 15.67 ක නිෂ්කාර්ය වියදමක් කර තිබුණි.

- හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාව කල්බදු පහසුකම් යටතේ ලබාගෙන තිබූ කැබ් රථයක් 2015 වර්ෂයේදී අනතුරට ලක් වී තිබුණි. වාහනය සඳහා රු.මිලියන 6.30 ක පූර්ණ රක්ෂණ වන්දියක් ලැබිය යුතුව තිබුණි. ඉන් රක්ෂණ ආයතනය විසින් රු.මිලියන 3.30 ක රක්ෂණ වන්දි සභාවට ගෙවා තිබුණු අතර, සභාව විසින් එම මුදල කිසිදු ප්‍රතිලාභයකින් තොරව බැංකු ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි. වාහන අනතුර වෙනුවෙන් රක්ෂණ ආයතනයෙන් ලැබිය යුතු රු.මිලියන 3.00 ක රක්ෂණ වන්දිය ලබා ගෙන නොතිබුණි.

- හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ නව වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 24 කින් සමාලෝචිත වර්ෂය සඳහා අය කළ යුතුව තිබුණු රු.මිලියන 1.95 ක් වූ කුලී ආදායම හිඟහිටව පැවැතුණි. එම කඩ කාමර සඳහා ලබා ගෙන තිබුණු රු.627,978 ක ඇප මුදලද ඉක්මවා ආදායම හිඟහිටව පැවැතීම නිසා ඇප මුදල් මගින් හිඟහිටි ආදායම් ආවරණය කරගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

- මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ දිවුලන්කඩවල සතිපොළ රු.මිලියන 2.25 ක් වැය කර ඉදිකර තිබුණි. වර්ෂ 5 ක කාලයක් මුළුල්ලේ එම සති පොළ නිෂ්කාර්යව පැවැතුණි.

- වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ කඩ කාමර 16 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ මාසික කුලී තක්සේරුව අනුව කුලී අය නොකිරීම නිසා 2018 මැයි මාසයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා රු.910,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

- බුත්තල ප්‍රාදේශීය සභාවේ සතිපොළ, ගවමස් කඩ, එළුමස් කඩ හා කුකුල් මස් කඩ ඇතුළු දේපල 06 ක් 1988 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 1.18 ක් අයකර නොතිබුණි.

- බුත්තල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 182 ක් සඳහා ඉකුත් වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.819,100 ක් අයකර නොතිබුණි.

- මැදගම ප්‍රාදේශීය සභාවේ දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 142 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන කටයුතු කර නොතිබුණි. මේ නිසා 2019 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රු.මිලියන 11.06 ක ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි.

- තණමල්විල ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ, මාළු කඩ හා සතිපොළ බදුදීම වෙනුවෙන් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.768,277 ක හිඟ බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

- මහව පොදු වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර 2016 සැප්තැම්බර් 22 දින කුරුණෑගල මහා නගර සභාවට භාර දී තිබුණි. නගර සභාව විසින් එම කඩ කාමරවල අඩුපාඩු සම්පූර්ණ කර 2019 දෙසැම්බර් 31 දින වන විටත් බදු දීමට කටයුතු නොකිරීම නිසා අවම වශයෙන් රු.මිලියන 2.58 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

- මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන ලබා ගෙන කුරුණෑගල මහා නගර සභාව විසින් රු.මිලියන 8.00 ක් පමණ වැයකර, පසු භාවිත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. 2012 වර්ෂයේදී ප්ලාස්ටික් කැබලිවලට කැපීම හා ප්ලාස්ටික් උණු කිරීම සඳහා යන්ත්‍ර 02 ක් සවිකර තිබුණි. 2014 වර්ෂයේදී එම යන්ත්‍ර අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණු අතර, නැවත අළුත්වැඩියා කර තිබුණි. නගර සභාව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

- 2014 වර්ෂයේදී බාහිර ආයතනයක් විසින් සිදු කළ රු.මිලියන 3.05 ක ප්‍රදානයක් උපයෝගී කර ගෙන කුරුණෑගල මහා නගර සභාව විසින්, සභාවේ පොළ භූමියේ ඝන මීටර් 70 ක ධාරිතාවයෙන් යුත් ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණි. 2020 මැයි 31 දින වන විටත් එම ඒකකයෙන් කිසිදු ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු නොකර නිෂ්ක්‍රියව පැවැතුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට කුරුණෑගල මහා නගර සභාවේ හිඟහිටි ජල ආදායම රු.මිලියන 61.00 ක් වී තිබුණි. එම හිඟහිටි ආදායමෙන් රු.100,000 කට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 27 දෙනෙකුගෙන් රු.මිලියන 13.54 ක ආදායම් හිඟහිටව පැවැතුණි.

- නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී පුද්ගලයින් 04 දෙනෙකු වෙත ලබාදුන් රු.600,000 ක් එම පුද්ගලයින්ගෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 ඔක්තෝබර් 13 දින පැවැති පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අදාළ ගෙවීම් කිරීමට සම්බන්ධ වූ නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගන්නා ලෙස උපදෙස් ලබාදී තිබුණද, 2020 මැයි 31 දින වන විටත් එම මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

- වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 4.24 ක් වැයකර ඉදිකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ කසළ කළමනාකරණ කටයුතු 2018 වර්ෂයේ සිට මුළුමණින්ම නවතා තිබුණි.

- කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු.මිලියන 5.00 ක් වැයකර ඉදිකළ නීලබැම්ම නිවාඩු නිකේතනයද, 2014 වරෂයේදී රු.මිලියන 10.00 ක් හා රු.මිලියන 3.00 ක් වශයෙන් වැයකර ඉදිකර තිබුණු සතිපොළ ගොඩනැගිලි ද 2014 වර්ෂයේ සිට කිසිදු උපයෝජනයක් නොකර නිෂ්ක්‍රීයව පැවැතුණි. 2018 වර්ෂයේදී ඉදිකර තිබුණු ජල පිරිපහදු ඒකකයද නිෂ්කාර්යව පැවතුණි.

- සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජල පාරිභෝගිකයින් 75 දෙනෙකුගෙන් ජල ගාස්තු වශයෙන් රු.මිලියන 75.11 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- 2015 වර්ෂයේදී රු.මිලියන 9.98 ක් වටිනා කටුවන සති පොළ ගොඩනැගිල්ල කටුවන ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. එම ගොඩනැගිල්ල හා කිරම බස් නැවතුම්පලේ කඩ කාමර වර්ෂ 05 ක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව පැවැතුණි.

- 2016 වර්ෂයේදී නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 44.46 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල, සතිපොල හා වැසිකිළි පද්ධතිය ඉදිකළ දින සිටම භාවිතයට ගෙන නොතිබුණි.

- 2015 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් කරන්දෙණිය ප්‍රාදේශීය සභාව වෙත රු.මිලියන 24.93 ක් වටිනා මෝටර් ග්‍රේඩරයක් පිරිනමා තිබුණි. එය ලැබුණු දින සිට 2020 මැයි 31 දින වන විටත් ඉන් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

- 2005 වර්ෂයේදී හික්කඩුව නගර සභාව විසින් රු.මිලියන 30 ක් වැයකර ඉදිකළ පොදු වෙළඳපොල උඩුමහලේ කඩ කාමර 17 ක් හා කඩ බක්කි 08 ක්, ඉදිකළ දින සිටම ඒවා නිෂ්ක්‍රීයව පැවතුණි.

- 2006 වර්ෂයේදී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය විසින් හික්කඩුව නගර සභාව වෙත ලබා දී තිබුණු රු.මිලියන 3.00 ක් වටිනා ගලිබවුසරය 2013 වර්ෂයෙන් පසුව මෙහෙයුම් කටයුතුවල යොදාවා ගෙන නොතිබුණි.

- ගාල්ල මහා නගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියේ එකඟත්වය මත සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකිව තිබූ රු.මිලියන 10.20 ක මුදලක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදවා නොගෙන ඉතුරුම් ගිණුමක රඳවාගෙන තිබුණි.

- ගාල්ල මහා නගර සභාව විසින් 2013 ජූලි 02 දින වන විට වැඩ අවසන් කිරීමේ අරමුණින් භූගෝලීය තොරතුරු පද්ධතිය සැකැසීමේ කාර්යභාරය සිදු කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.මිලියන 4.08 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි.

- මොරටුව මහා නගර සභාව විසින් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 188(1) උපවගන්තියේ සඳහන් කාර්යයන් යටතට නොගැනෙන, හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් ඇති කර තිබුණි. සභිකයින් 27 දෙනෙකු වෙනුවෙන් එම රක්ෂණාවරණය ඇති කර තිබුණු අතර, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 0.95 ක් හා රු.මිලියන 1.09 ක් වශයෙන් එකතුව රු.මිලියන 2.04 ක් සභාව විසින් වැය කර තිබුණි. එම රක්ෂණාවරණය සඳහා සභිකයින් විසින් දායක මුදල් සභාවට ගෙවිය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 1.70 ක දායක මුදල් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

- මොරටුව මහා නගර සභාවේ කම්පැක්ටර් රථය 1999 අගෝස්තු 10 දින අනතුරට

පත් වී තිබුණු අතර, එම අනතුරින් අගතියට පත් පාර්ශවයට චූදිත වූ සභාවේ රියදුරු විසින් රු.මිලියන 3.00 ක් ගෙවිය යුතුව තිබුණි. රියදුරු විසින් ගෙවිය යුතු වූ එම මුදල සභා අරමුදලින් ගෙවා තිබුණු අතර 2019 පෙබරවාරි 28 දින වන විට ඉන් රු.112,205 ක් පමණක් රියදුරුගෙන් අයකරගෙන තිබුණි. 2019 මාර්තු මාසයේ සිට අදාළ රියදුරුගෙන් අය කර ගැනීම් නතර කර තිබුණු බැවින් ඒ අනුව සභාවට තවදුරටත් රු.මිලියන 2.89 ක් අයකර ගත යුතුව තිබුණි. එම රියදුරු 2020 නොවැම්බර් 26 දින සේවයෙන් විශ්‍රාම යාමට නියමිතව තිබුණත්, අදාළ හිඟහිටි මුදල් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

- 2019 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් මිශ්‍ර ආදායම්, වරිපනම් හා සැලසුම් අංශවල මහජන සේවා සැපයීමෙන් උපයන ලද රු.මිලියන 1.18 ක ආදායම්, මහා නගර සභා ආඥා පනතේ 185(2)(ඉ) අනුව සභා අරමුදලට බැර කළ යුතුව තිබුණි. සභාව විසින් එම ආදායම සභා අරමුදලට බැර නොකර නිලධාරීන් 27 දෙනෙකු අතර විධිමත් අනුමැතියකින් තොරව බෙදා ගෙන තිබුණි.

- කොළඹ මහා නගර සභාව විසින් 2001 වර්ෂයේදී උත්සව ශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර 2007 වර්ෂයේදී නිම කර තිබුණි. සභාව විසින් ඒ සඳහා රු.මිලියන 5.42 ක් වැය කර තිබුණු අතර, 2015 වර්ෂය දක්වා එම උත්සව ශාලාව නිෂ්කාර්යව පැවතුණි. 2015 වර්ෂයේදී එම උත්සව ශාලාව කඩා ඉවත් කර, 2019 දෙසැම්බර් 31 දින වන විට එම ස්ථානයේ රු.මිලියන 42.88 ක් වැය කර නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. 2020 ජුනි 30 දින වන විටත් එම ගොඩනැගිල්ල භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

- 2016 වර්ෂයේදී කොළඹ මහා නගර සභාව විසින් රු.මිලියන 1.66 ක් වැය කර පිළිකා රෝග විනිශ්චය කිරීම සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. 2016 වර්ෂයෙන් පසු පිළිකා රෝග විනිශ්චය සඳහා පරීක්ෂණ සිදු කර නොතිබුණු බැවින් රු.මිලියන 1.49 ක රසායනික ද්‍රව්‍ය නිෂ්කාර්යව පැවැතුණි.

- කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නිලධාරීන් හා සේවකයන් 23 දෙනෙකු ස්ථාන මාරුවීම් හා විශ්‍රාම යාම ආදී කරුණු නිසා රජයේ නිවාසයක් භාවිතා කිරීමට ඇති සුදුසුකම අහෝසි වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම නිලධාරීන් රජයේ නිවාසවලින් ඉවත් නොවී එම නිල නිවාස භුක්ති විඳිමින් පැවැතුණි. බදු කාලය ඉක්මවී තිබුණු නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව පදිංචි කාලපරිච්ඡේදය වෙනුවෙන් දණ්ඩන කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 ජුනි මාසය වන විට නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගතයුතු ගණනය කරන ලද දණ්ඩන කුලිය රු.මිලියන 27.10 ක් වී තිබුණි.

- කොළඹ මහා නගර සභාවට අයත් පොදු වෙළඳපොලවල් 18 ක වෙළඳ සැල් 3046 කින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 122.02 ක වෙළඳසැල් බදු කුලී අය විය යුතුව තිබුණි. එදින වන විට බදු දී නොතිබුණු වෙළෙඳ සැල් 384 ක් නිෂ්කාර්යව පැවැති අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට හිඟ වෙළඳ

සැල් කුලිය රු.මිලියන 1.00 ක් ඉක්ම වූ වෙළඳසැල් හිමියන් 30 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 87.20 ක කුලි ආදායමක් හිඟ හිටව පැවතුණි.

- වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල වෙළඳ සංකීර්ණයේ උත්සව ශාලාව සඳහා 2014 වර්ෂයේදී ලැබී තිබුණු රු.974,800 ක් වටිනා චෙක්පත අගරු වී තිබුණත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම චෙක්පතට අදාළව ලැබිය යුතු මුදල අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

- අනුරාධපුර මහා නගර සභාවේ 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වී තිබුණු රු.මිලියන 47.17 ක මූල්‍ය අක්‍රමිකතාවයන් දෙකක් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- අනුරාධපුර මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේ වෙනත් ආයතනයකට ස්ථාන මාරු වී ගිය සේවකයෙකුට එදින සිට 2018 ජූනි මාසය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ගෙවා තිබුණු රු.මිලියන 1.82 ක වැටුප් සහ දීමනා පියවා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- 2017 වර්ෂයේදී තලාව ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 9.50 ක් වැය කර ඉදි කරන ලද තඹුත්තේගම සතිපොළ ගොඩනැගිලි පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන වල් බිහිවීමට ඉඩහැර තිබුණි.

- රඹෑව ප්‍රාදේශීය සභාවට අයත් රු.මිලියන 6.39 ක් වටිනා කැබ් රථයක් 2019 මැයි 16 දින අනතුරකට ලක් වී රු.මිලියන 1.58 ක අලාභහානි සිදු වී තිබුණි. මෙම අනතුර සම්බන්ධ තොරතුරු සාවද්‍ය වීම සහ අවභාවිතය පදනම්ව රක්ෂණ හිමිකම් ප්‍රතික්ෂේප වී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත් වාහනය, දේශීය නියෝජිතයාගේ ප්‍රාදේශීය අළුත්වැඩියා මධ්‍යස්ථානයක රඳවා තිබුණි.

# විදේශාධාර ව්‍යාපෘති

## විගණන නිරීක්ෂණ

- විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම
- කෘෂිකාර්මික අංශය
- සමාජ සුභසාධන අංශය
- විදුලිබල අංශය
- උසස් අධ්‍යාපනය අංශය
- ජල සම්පාදන අංශය
- පොදු නිරීක්ෂණ

# විදේශ ආධාර ව්‍යාපෘති

2019 වර්ෂය සඳහා වූ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේදී සමස්ථ අයවැය හිඟය වූ රු.බිලියන 1,016.5 ක් පියවීම සඳහා රජය දේශීය මූලාශ්‍රවලින් රු.බිලියන 702.4 ක් හා විදේශීය මූලාශ්‍ර වලින් රු.බිලියන 314.1 ක් ණය වශයෙන් ලබාගෙන තිබුණි. ඉකුත් වර්ෂයේදී විදේශ මූලාශ්‍රවලින් ලබාගෙන තිබුණු රු.බිලියන 324 ක ශුද්ධ විදේශ ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විදේශ ණය ගැනීම්වල පහළයාමක් දැකිය හැකිය.

සමාලෝචිත වර්ෂයේදී රජය විදේශ සංවර්ධන පාර්ශවකරුවන්ගෙන් සහ ණය දෙන නියෝජිත ආයතන සමඟ නව විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 41 කට එළඹ තිබුණු අතර එමගින් ඉදිරි වර්ෂ වලදී එ.ජ.ඩො.මිලියන 3,378.8 ක් ලබාගැනීමට නියමිතව තිබුණි. ණය එකඟතා ගිවිසුම් මඟින් ලබාගැනීමට බලාපොරොත්තු වූ එ.ජ.ඩො.මිලියන 3,312.5 ක් හා ප්‍රදාන ආධාර මඟින් ඉදිරි වර්ෂවලදී ලැබීමට නියමිතව තිබුණු එ.ජ.ඩො.මිලියන 66.3 කින් එය සමන්විත විය. මෙම ණය හා ආධාර මුදල් ප්‍රධාන වශයෙන් මාර්ග හා මහාමාර්ග, පාලම්, නාගරික සංවර්ධනය, විදුලිබල, අධ්‍යාපනය හා පුහුණු, පරිසරය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක සහ සමාජ යටිතල පහසුකම් අංශයන් සඳහා උපයෝජනය කිරීමට නියමිත විය.

## විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විදේශ ආධාර ව්‍යාපෘති 163 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ඒ අතරින් විදේශ ආධාර ව්‍යාපෘති 122 ක වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ඉන්දියානු ණය ක්‍රමය චීන රජයේ ආධාර සහ වෙනත් ද්වීපාර්ශවයික ණය යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘතිවලට අදාළ ණය ගිවිසුම්වල, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාගේ පරීක්ෂණයට භාජනය විය යුතු බව සඳහන් කොන්දේසි අනිවාර්ය අවශ්‍යතාවයන් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. 2019 වර්ෂයේ විදේශ සංවර්ධන පාර්ශවකරුවන් සහ ණය දෙන නියෝජිත ආයතන මඟින් ක්‍රියාත්මක කර තිබුණු විදේශ ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් රූපසටහන 14 හි දැක්වේ.




රූපසටහන **14 -** විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරිම

## කෘෂිකාර්මික අංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ වැවිලි භෝග සහ වැවිලි නොවන භෝග යන අංශ දෙකකින් සමන්විතවන අතර 1980 වර්ෂයේ සිට කෘෂිකර්මාන්තයේ සමස්ථ, ඵලදායීතාවය දල වශයෙන් සියයට 0.60 ක් පමණ ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ වර්ධන වේගය අනෙකුත් දකුණු ආසියාතික රටවල කෘෂිකර්මාන්තයේ වර්ධන වේගයට වඩා අඩු මට්ටමක පවතී. එම තත්වය මහහරවා ගොවි ජනතාවගේ හා රටේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික ආදායම වර්ධනය, ඵලදායීතා වර්ධනය, විවිධාංගීකරණය යන කරුණු සඵලකර ගැනීමේ පරමාර්ථයෙන් යුතුව කෘෂිකාර්මික අංශ නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි.

ව්‍යාපෘතිය ඇගයීමේ ලේඛණය හා ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබුණු සංරචකය මගින් අන්තර් ජාතික සේවා සපයන්නෙකුගේ සහාය ඇති ව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙන් ඉහල ලෙස හඳුනාගත් යාපනය, මුලතිව්, අනුරාධපුරය,මඩකලපුව, මොණරාගල, මාතලේ හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 7 කේන්ද්‍ර කර ගනිමින් නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන 7ක් පිහිටුවීම හා එම උද්‍යාන ආශ්‍රිතව බිහිවන නව ගොවි සංවිධාන හා කෘෂි ව්‍යාපාරවල ගොවි නිෂ්පාදනවල අගය දාමය සංවර්ධනය කිරීම සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති සංරචකය මගින් ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලෙස මූල්‍ය ආධාර ලබාදීම මූලිකව සැලසුම් කර තිබුණි.

කෙසේවෙතත්, අන්තර් ජාතික සේවා සපයන්නෙකු තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු වල පැවති දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උක්ත කෘෂි උද්‍යාන පිහිටුවීමට ව්‍යාපෘතියට නොහැකිවී තිබුණු අතර ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සැලසුම් කළ අරමුණුද ලඟාකර ගත නොහැකි වී තිබුණි. තවද ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වන සංරචක මගින් හඳුනාගත් දිස්ත්‍රික්ක හා

මූලික අරමුණු වලින් බැහැරව දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක 14 ක ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් ප්‍රදාන ලෙස රු.මිලියන 1,410.38 ක මුදලක් ලබා දීමට අනුමත කර තිබුණි. මේ හේතුවෙන් ජාත්‍යන්තර සංවර්ධන සමායතනය මගින් ලබාදීමට එකග වු එ.ජ.ඩො.මිලියන 123 කට සමාන රු.මිලියන 18,243.75 ක ණය මුදලින් සියයට 23.77කට සමාන එ.ජ.ඩො මිලියන 29.72 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දිනට රේඛීය අමාත්‍යශය 02 ක මගින් උපයෝජනය කර තිබුණි.

## සමාජ සුභසාධන අංශය

ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය සහ ආයු අපේක්ෂාව වැනි මානව සංවර්ධන දර්ශක කලාපයේ අනෙකුත් රටවලට වඩා ඉහල අගයක් ගැනීම තුලින් පසුගිය දශකය තුල අධික දරිද්‍රතාවය අඩු කිරීම මෙන්ම සම්පත් සමව ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු වර්ධනයක් ලගාකරගෙන තිබුණි. පුළුල් ලෙස ක්‍රියාත්මක වුවද ශ්‍රීලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය විසිරුණු ස්වභාවයක් ගන්නා බැවින් වර්තමානයේ නිසි සම්බන්ධීකරණයකින් තොරව ක්‍රියාත්මක වීමක් දක්නට ලැබේ.

නිසි සමාජ ආරක්ෂණ පද්ධතියක් තුළින් අධික දරිද්‍රතාවයෙන් පෙලෙන්නන් සහ සමාජයේ දරිද්‍රතා සීමාවේ ඇති පුද්ගලයින් ඉලක්ක කර සහනාධාර ලබාදීම මෙන්ම ඔවුන් ආර්ථික ක්‍රියාවලිය තුලට ඇතුලත් කර ගැනීම ද සමාජයේ අස්ථාවර පුද්ගලයින් අනපේක්ෂිත ආර්ථික කම්පනයන්ගෙන් ආරක්ෂා කිරීම සහ අවිධිමත් ආර්ථික කටයුතු වල නිරතවන්නන් වෙත සිය විශ්‍රාම සමය තුල දිරිදීමනා ලබාදීමට හෝ ඒ සඳහා අවස්ථා සැලසීමට අදාල ක්‍රමවේදය සකස් කිරීම අරමුණු කරගෙන සමාජයේ දිළිඳු සහ අස්ථාවර පුද්ගලයන්ට ප්‍රතිලාභ සැලසීමේ වැඩපිළිවෙල වඩා සාධාරණව, කාර්යක්ෂමව සහ විනිවිදභාවයකින් යුක්තව ක්‍රියාත්මක කිරීම පිණිස “සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය” ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර 2022 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කරන ලද අතර මේ සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එ.ජ.ඩො. මිලියන 75 ක මුදලක් ණය ආධාර වශයෙන් ලබා දීමට එකඟ වී ඇත. සමාජ ජාලයන්හි කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම තුළින් එම වියදම් වඩා තිරසාර බවට පත් කිරීම මගින් සැලසුම්කර ඇති මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතා වැඩ පිළිවෙල වෙත ඇතිවිය හැකි දරිද්‍රතා බලපෑම අවම කිරීම අපේක්ෂා කළ අතර, මෙමගින් ශ්‍රී ලංකා රජය වෙත දැනට පවතින සමාජ ආරක්ෂණ වැඩ සටහන් කාලානුරූපව සමාලෝචනය කිරීමට, නැවත සකස් කිරීමට ඉඩ සැලසෙන අතර ක්‍රමයෙන් වියපත් වන ජනගහනයක් තුළින් ඇතිවන්නා වූ රාජ්‍ය මූල්‍ය අභියෝගයන්ට මුහුණ දීමද මෙමගින් අපේක්ෂා කරන ලදී. කෙසේවෙතත්,2022 මාර්තු වන විට නිම කිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘතියේ කටයුතු අතුරින් සමාජ සුභ සාධන ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම පමණක් ඉටුකර තිබුණු අතර අදාල සමාජ සුභ සාධන ප්‍රතිලාභ පනත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්මත කර නොතිබුණි. ව්‍යාපෘතිය ආරම්භ වී මාස 36 ක් ගතවී තිබුණද දුර්වල කාර්යසාධනය හේතුවෙන් ජාත්‍යන්තර සංවර්ධන සමායතනය ලබාදීමට එකග වූ එ.ජ.ඩො මිලියන 75 මුදලින් 2019 දෙසැම්බර් 31 වන විට සියයට 4.67 කට සමාන එ.ජ.ඩො.මි.3.5 පමණක් උපයෝජනය කර තිබුණි. එම නිසා සමාජයේ දිලිදු ජනයාට ලැබිය යුතු ප්‍රතිලාභ කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් යුතුව ලබාදීම සඳහා වු මේ ව්‍යාපෘතියේ අරමුණ මුළුමනින්ම ඉටු වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## විදුලිබල අංශය

විශ්වාසදායී ලෙස විදුලිය බෙදා හැරීමත් විදුලිබල සැපයුමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහාත් විදේශ ආධාර ව්‍යාපෘති ලංකා විදුලිබල මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් විදේශ ආධාර ව්‍යාපෘති මෙන් එක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක් යටතේ ක්‍රියාත්මක නොවූ අතර විදුලිබල මණ්ඩලයේ සහ සුනත්‍ය බලශක්ති අධිකාරියේ විවිධ අංශ යටතේ එකම ව්‍යාපෘතියක සංරචක වශයෙන් වෙන වෙනම ක්‍රියාත්මක කර තිබුණි. මේ හේතුවෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා තිබුණු නමුත් මෙම ව්‍යාපෘති හා විදුලිබල මණ්ඩලයේ කටයුතු අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා නොතිබුණි. තවද, විදුලිබල අංශයේ ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත් පිරිනැමීමේ කටයුතු සඳහා ව්‍යාපෘති කටයුතු ආරම්භ වී වර්ෂ 2කට වඩා වැඩි කාලයක් ගතවී තිබීමත් ඒ හේතුවෙන් ව්‍යාපෘති කාලය තුල කොන්ත්‍රාත් කටයුතු නිම කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත් පොදු කරුණු වශයෙන් නිරීක්ෂණය විය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ප්‍රදේශ වලින් කුලී පදනම මත වෙනම කාර්යාල පහසුකම් ලබාගෙන තිබුණි. මේ අනුව, විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් 2017 ජනවාරි සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුල කාර්යාල කුලී ලෙස රු.මිලියන 8.9 ක මුදලක් ගෙවා තිබුණි. එම ව්‍යාපෘතිය මගින් මෝටර් වාහන මිලදී ගැනීම සඳහා රු.මි.176.9 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණු අතර එම මිලදීගත් වාහන අතර රු.මිලියන 23.4 ක් වටිනා අධි සුඛෝපභෝගී කාර් රථයක් තිබුණු බවද නිරීක්ෂණය විය.

තවද, 2016 දෙසැම්බර් ආරම්භකර තිබුණු විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා අවශ්‍ය වාහන බාහිර කොන්ත්‍රාත්කරුවෙකු හරහා කුලී පදනම මත 2017 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 69.11 ක් ගෙවා තිබුණි.

විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති මගින් 2019 දෙසැම්බර් 31 දිනට තොග විෂයයන් වශයෙන් රු.මිලියන 3,374.48 මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම තොග සම්බන්ධ සෝදිසි විගණන පරීක්ෂාවේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ ගබඩා වල ඒ සම්බන්ධ තොග වාර්තා නිසි පරිදි නඩත්තු කර නොතිබුණු බවත් ඒ අනුව අදාල තොග විෂයයන් ව්‍යාපෘති වලින් ලද තොග විෂයයන් ලෙස වෙනම හඳුනා ගත නොහැකි විය.

## උසස් අධ්‍යාපනය අංශය

පහල මධ්‍යම ආදායම් ලබන සමාජ තත්ත්වයක සිට ඉහල මධ්‍යම ආදායම් ලබන සමාජ තත්ත්වයක් දක්වා වූ මාර්ගයේ සංවර්ධනයේ කේන්ද්‍රීය ක්ෂේත්‍රයක් ලෙස උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය හඳුනාගෙන ඇත. ලෝක බැංකුවේ ණය ආධාර මත උසස් අධ්‍යාපන අංශයට සහාය වීමට උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 මාර්තු ආරම්භ කර 2023 ජූනි මස අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත යන විශේෂයෙන් හඳුනාගත් ප්‍රමුඛ විෂයයයන්ට අදාලව විශ්ව විද්‍යාල ප්‍රවේශ අවස්ථා පුලුල් කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතිය අරමුණ වී තිබුණු අතර මේ සඳහා

එ.ජ.ඩො. මිලියන 100 ක ණය මුදලක් ලබා දීමට ලෝක බැංකුව එකඟ වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කටයුතු කිරීම සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාල 15 කට හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත රු. මිලියන 80.8 ක මුදලක් අත්තිකාරම් මුදල් ලෙස ලබා දී තිබුණු නමුත් එම අත්තිකාරම් මුදලින් රු. මිලියන 15 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අදාල කටයුතු සඳහා වියදම් නොකොට එම ආයතනවල ජංගම ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත යන උපාධි පාඨමාලා සඳහා විශ්ව විද්‍යාල සිසුන්ගේ ප්‍රවේශය වර්ධනය කිරීම අරමුණු කරගෙන එම පීඨයන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය අධ්‍යාපනික උපකරණ ප්‍රසම්පාදනය වෙනුවෙන් රාජ්‍ය විශ්ව විද්‍යාල 06 ක් සඳහා ලබාදුන් රු. මිලියන 760.54 ක මුදලින් රු. මිලියන 86.2 ක මුදලක් වර්ෂයකට ආසන්න කාලයක් භාවිතා කිරීමෙන් තොරව අදාල ආයතනවල බැංකු ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණු අතර මේ යටතේ ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 35.3 ක් වටිනා අධ්‍යාපනික උපකරණ එම කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණු බව සෝදිසි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

## ජල සම්පාදන අංශය

කොළඹ නගරයේ ජල සැපයුම් සහ අපජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම හා කළමණාකරනය තුලින් සියයට 49 ක් තරම් වූ ආදායම් නොලබන ජලය 2020 වන විට සියයට 18 ක් දක්වා අඩු මට්ටමක පවත්වාගෙන යාම, කොළඹ නගරයේ පැය 24 පුරා ගුණාත්මක ජල සැපයුමක් ලබාදීම අරමුණු කරගනිමින් මහ කොළඹ ජල හා අපජල කළමාණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති 03ක් යටතේ 2013 වර්ෂයේදී සැලසුම්කර ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය සූදානම් කිරීමේ කටයුතුවල ප්‍රමාදයන්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් මූලික සැලසුම් පසුව වෙනස් කිරීම, මාර්ග පලුදු කිරීම වෙනුවෙන් අදාළ ආයතනවලින් පූර්ව අවසර ගැනීමේ ප්‍රමාදයක් වැනි සාධක හේතුවෙන් ව්‍යාපෘති 03 හි කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි. මේ හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සැලසුම්කල කාලය තුල නිම කිරීමට අපොහොසත් වී තිබුණු අතර එම කටයුතු සඳහා මාස 40 සිට මාස 48 ක කාල පරාසයකට කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. තවද අරමුදල් ඌන උපයෝජනය මත බැඳීම් ගාස්තු වශයෙන් රු.මිලියන170.28 ගෙවීමට සිදුවී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතුවල සැලකිය යුතු ප්‍රමාද හේතුවෙන් වර්ෂ 7ක් ගතවී ඇතත් 2012 වර්ෂයේ පැවති සියයට 49 ක්වූ ආදායම් නොලබන ජල ප්‍රමාණය 2019 අවසානය වන විටත් සියයට 40.8 ක් දක්වා පමණක් අඩු වී තිබුණි.

## පොදු නිරීක්ෂණ

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන්ගේ වියදම් ආවරණය කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ලේඛණවලට නව වගන්ති එකතු කිරීම තුළින් ව්‍යාපෘතියට අදාල නොවන කටයුතු වෙනුවෙන් ණය අරමුදල් යොදා ගැනීම හා කොන්ත්‍රාත්කරුවන්ට එකඟ වූ මුදලට අමතරව ලාභාන්තිකය සහ පොදු කාර්ය වියදම් ආවරණය සඳහා වන ප්‍රතිශතාත්මක අගයක් දැරීමටත් ව්‍යාපෘති වලට සිදු වී තිබීම විගණනයේදී නිරීක්ෂණයවූ පොදු අඩුපාඩු විය. තවද, ව්‍යාපෘති විසින් මෝටර් වාහන මිලදී නොගෙන එම අවශ්‍යතාවය කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රමාණ බිල්පත්වල විෂයයක් ලෙස ඇතුලත් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සෘජුව මෝටර් වාහන මිලදී ගැනීමට වඩා

වැඩි මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවීම හා අදාල වාහනවල හිමිකාරත්වය කොන්ත්‍රාත් සමාගමේ නමින් පැවැතීමත් නිසා ව්‍යාපෘති කාලය අවසානයේදී අදාල මෝටර් වාහනවල හිමිකාරත්වය රේඛීය අමාත්‍යාංශයට හෝ රාජ්‍ය ආයතනයන්ට නොලැබීමේ අවදානමක් පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කවලට පසුපසින් පැවතීම හේතුවෙන් ණය මුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතීම හා ව්‍යාපෘතිවල ඉලක්ක සපුරාගැනීම සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් වියපැහැදම් නොවූ ණය මුදල් මත බැඳීම් ගාස්තු වශයෙන් විශාල පිරිවැයක් දැරීමට ශ්‍රී ලංකා රජයට දැරීමට සිදුවී තිබුණි.

තවද, මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ අවසන් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳව විධිමත් උපදෙස් ලබා දී නොතිබීම හේතුවෙන් විදේශාධාර ව්‍යාපෘතිවල ක්‍රියාකාරි කාල සීමාව අවසාන වීමෙන් පසුවද ව්‍යාපෘති කළමණාකරණ ඒකක විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

# බැංකු අංශය

## රාජ්‍ය බැංකු

- ශ්‍රී ලංකා මහ බැංකුව
- ලංකා බැංකුව (BoC)
- මහජන බැංකුව
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

# බැංකුකරණය

2019 වර්ෂය අවසාන වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු (Licensed Commercial Banks)(LCBs) 26 කින්ද බලපත්‍රලාභී විශේෂිත බැංකු (Licensed Specialized Banks) (LSBs) 6 කින්ද වශයෙන් බැංකු 32 කින් මෙරට බැංකු ක්ෂේත්‍රය සමන්විත වී තිබුණි. විදේශීය බැංකු 13 ක්, බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) 26 තුළ විදේශීය බැංකු 13 ක් අඩංගු වූ අතර ඉන් විදේශීය බැංකු 2 ක්, ඒවායේ ප්‍රධාන කාර්යාල මඟින් ගනු ලැබූ තීරණ මත පදනම්ව ඒවායේ වසා දැමීමේ ක්‍රියාපටිපාටි (closing procedures) ආරම්භ කර තිබුණි. 2019 වර්ෂයේදී ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කරන ලද අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින්, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSBL) (Sri Lanka Savings Bank Limited) පරිපාලිතයක් ලෙස අත්පත් කර ගන්නා ලදී. විස්තර වගුව 14 හි දැක්වේ.

| 2019 වර්ෂය අවසානයට බැංකු, බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකකවල ව්‍යාප්තිය. | | | | | |
|---|---|---|---|---|---|
| කාණ්ඩය | | බැංකු | ශාඛා | ශිෂ්‍ය ඉතිරි කිරීමේ ඒකක | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) |
| බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) | දේශීය බැංකු | 13 | 2,857 | 3,783 | 5,158 |
| | විදේශීය බැංකු | 13 | 50 | | |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) | ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු | 1 | 262 | | 413 |
| | නිවාස මූල්‍ය ආයතන | 2 | 64 | | |
| | වෙනත් බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) | 3 | 371 | | |

වගුව 14. - 2019 වර්ෂය අවසානයට බැංකු, බැංකු ශාඛා හා වෙනත් බැංකුකරණ මධ්‍යස්ථානවල ව්‍යාප්තිය.
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

බැංකුකරණ කටයුතු වැඩිදියුණු කිරීම, බැංකු ජාලය පුළුල් කිරීම හා තාක්ෂණය මත පදනම් වූ නිෂ්පාදන/ සේවා හඳුන්වාදීම මඟින් බැංකු පද්ධතිය ආර්ථිකයේ මූල්‍ය අතරමැදිකරණයට සහාය දක්වා ඇත. 2019 වර්ෂයේදී බැංකු ශාඛා 42 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) 564 ක් ස්ථාපිත කර තිබුණු අතර බැංකු ශාඛා 11 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) 13 ක් වසා දමා තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය අවසන් වන විට බැංකුකරණ මධ්‍යස්ථාන ගණන හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) ගණන පිළිවෙලින් 7,387 ක් හා 5,571 ක් දක්වා වැඩි වී තිබුණි.

2019 වර්ෂය අවසාන වන විට බලපත්‍රලාභී බැංකු (බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු), මූල්‍ය අංශයේ රු.බිලියන 20,159.4 ක මුළු වත්කම්වලින් සියයට 62 ක් හෙවත් රු.බිලියන 12,522.7 ක දායකත්වයක් ලබා දී තිබුණි. 2019 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය වෙත සියයට 9.5 ක් හෙවත් රු.බිලියන 1,919.4 ක දායකත්වයක් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.බිලියන 1,509.8 ක විදේශ සංචිත ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම්වල ඇතුළත් වී තිබුණි. බැංකු අංශයේ මුළු වත්කම් පිළිබඳ තොරතුරු රූපසටහන 15 හි දැක්වේ.




වගුව 15- බැංකු අංශයේ මුළු වත්කම් පිලිබඳ තොරතුරු
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

## වත්කම්

සමාලෝචිත වර්ෂයේදී වත්කම් සියයට 6.2 කින් හෙවත් රු.බිලියන 728.7 කින් ඉහළ යාමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වල වත්කම් පදනම, 2019 වර්ෂය අවසාන වන විට රු.ට්‍රිලියන 12.5 ක් ඉක්මවා තිබුණි. කෙසේ වෙතත්, 2019 වර්ෂයේ වාර්තාගත වර්ධන වේගය 2018 වර්ෂයේ සියයට 14.6 ක් වූ වර්ධන වේගයට වඩා පහළ මට්ටමක පැවතුණි. බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වල වත්කම් සංයුතිය රූපසටහන 16 හි දැක්වේ.




රූපසටහන 16 - බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වල වත්කම්වල සංයුතිය.
මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

2019 වර්ෂය අවසානයට ප්‍රදානය කර තිබුණු මුළු ණයවලින් සියයට 91 ක් හෙවත් රු.බිලියන 7,362 ක් බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) විසින්ද, ඉතිරි සියයට 9 හෙවත් රු.බිලියන 760 ක් බලපත්‍රලාභී විශේෂ බැංකු (LSBs) විසින්ද ප්‍රදානය කර තිබුණි. 2018 වර්ෂයේදී ණය ප්‍රදානය කිරීම්වල සියයට 19.6 ක වැඩිවීමක් සිදු වී තිබුණත්, එය 2019 වර්ෂයේදී එය සියයට 5.6 ක් දක්වා අඩු වී තිබුණි. 2019 අප්‍රේල් මාසයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය හා 2019 වර්ෂයේදී ඇතිවූ දේශපාලන අස්ථාවරත්වය මෙම අඩුවීමට හේතු වී තිබුණි.

ණය සඳහා වන අවම ඉල්ලුම බැංකුවල අරමුදල් වැඩි වැඩියෙන් ආයෝජනය කෙරෙහි යොමු කිරීමට හේතු වී තිබුණි. ඒ අනුව, 2018 වර්ෂය අවසානයට ආයෝජනවල වර්ධනය සියයට 4.6 ක සිට 2019 වර්ෂය අවසානයට සියයට 12.2 ක් දක්වා වර්ධනය වී තිබුණි. 2019 වර්ෂය තුළදී කල්පිරීම තෙක් රඳවා ගන්නා කළඹේ ආයෝජනය (Held to Maturity Portfolio) සියයට 18.1 කින් ඉහළ ගිය අතර වෙළඳ කළඹේ (Trading Portfolio) සියයට 7.3 කින් අඩු වී තිබුණි.

## අක්‍රීය ණය (NPL)

සමාලෝචිත වර්ෂයේ පැවති අහිතකර ව්‍යාපාර තත්ත්වයන් හේතුවෙන් බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතය (NPL ratio) 2018 වර්ෂය අවසානයට පැවැති සියයට 3.4 ක සිට 2019 වර්ෂය අවසානයට සියයට 4.7 දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව, 2018 වර්ෂයේදී රු.බිලියන 102.5 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වර්ෂයේදී සමස්ත අක්‍රීය ණය ප්‍රමාණය රු.බිලියන 118.5 කින් වැඩි වී තිබුණි. අක්‍රීය ණය අනුපාතය රූපසටහන 17 හි දැක්වේ.




රූපසටහන 17- අක්‍රීය ණය අනුපාතය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

## බැරකම් හා ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැරකම් රු.බිලියන 1,919.4 ක් වී තිබුණු අතර ඊට ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර රජයන්ගෙන් හා ජාත්‍යන්තර ආයතනවල රු.බිලියන 613.8 ක තැන්පතු, වාණිජ බැංකුවල රු.බිලියන 254.6 ක තැන්පතු හා 2019 වර්ෂය අවසාන වන විට නිකුත් කරන ලද රු.බිලියන 678 ක මුදල් නෝට්ටු ඇතුළත් වී තිබුණි.

බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs)වල 2019 වර්ෂය අවසාන වන විට මුළු බැරකම්වලින් සියයට 73.2 ක ප්‍රමාණයක් තැන්පතු විය. 2018 වර්ෂයේදී තැන්පතු පදනම රු.ට්‍රිලියන 1.1 ක වර්ධනයක් සිදු වී තිබුණු අතර 2019 වර්ෂයේදී ඊට අනුරූපී තැන්පතු පදනම රු.බිලියන 669.8 ක වර්ධනයක් සමඟ, 2019 වර්ෂය අවසානයට රු.බිලියන 9,162.3 ක් කරා ළඟා වී තිබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වගකීම් පිළිබඳ විස්තර රූපසටහන 18 හි දැක්වේ.




රූපසටහන 18 - බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වගකීම්
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

## තැන්පතු

2018 වර්ෂය අවසාන වන විට තැන්පතුවල සියයට 14.8 ක වර්ධනයක් පැවැතුණු අතර ඊට සාපේක්ෂව 2019 වර්ෂය අවසානවන විට එය සියයට 7.9 ක වර්ධනයක් දක්වා අඩු වී තිබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වල කාල තැන්පතු රු.බිලියන 6,092.5 ක් වූ අතර එය 2019 වර්ෂය අවසානයට මුළු තැන්පතුවලින් සියයට 66.5 ක් ලෙස වාර්තා කර තිබුණි. ඉතුරුම් තැන්පතු හා ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් සියයට 25.6 ක් හා සියයට 5.8 ක් ලෙස වාර්තා කර තිබුණි. විස්තර රූපසටහන 19 හි දැක්වේ.




රූප සටහන 19 - බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වල තැන්පතු වල සංයුතිය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

## ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරන මුදල් නීති පනත හා එහි සංශෝධනයන් අනුව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් කිරීමේ පද්ධතියෙහි පරිපාලනය, අධීක්ෂණය හා නියාමනය සඳහා වගකීම් දරන ප්‍රධාන අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කර තිබුණි. ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය දිරිගැන්වීමට හා ප්‍රවර්ධනය කිරීමට, ආර්ථික හා මිල ස්ථාවරත්වය හා මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය තහවුරු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වේ.

දේශීය මුදල්වල ස්ථාවරත්වය සඳහා වන දේශීය මුදල් ප්‍රතිපත්තියක් තීරණය කිරීමට, මුදල් නීති පනත මගින් බලයලත් ඕනෑම ක්‍රියාමාර්ගයක් තහවුරු කිරීම සඳහා මුදල් සැපයුම හා පිරිවැය නියාමනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය උත්සාහ දැරිය යුතුය. මුදල් සැපයීමේදී සිදුවන වෙනස්වීම්, මිල ස්ථාවරත්වය සඳහා බලපාන ප්‍රධානතම හේතු කාරකය වේ. පුළුල් මුදල් සැපයීමේ සිදුවන වෙනස්කම්වලට ගුණකය මගින් බලපෑම් කර මිල ස්ථාරත්වයට පත්කරනු ලබයි.

මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය සංචිත මුදල් වේ. ප්‍රතිපත්ති පොලී අනුපාත ප්‍රතිපත්ති, වෙළඳපොළ මෙහෙයුම් (OMO) හා වාණිජ බැංකු තැන්පතු බැරකම් මත ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (statutory reserve requirement) (SRR) වර්තමානයේදී භාවිතා වන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති මෙවලම් වේ. 2019 මැයි 31 දින සිට 2020 අප්‍රේල් 03 දින දක්වා කාලය තුළදී පොලී අනුපාතවල සමස්ත අඩුවීම පදනම් අංක (Basis points) 200 ක් වූ අතර, එය ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (Standing Deposit Facility Rate) (SDFR) හා ස්ථාවර ණය දීමේ පහසුකම් අනුපාතය (Standing Lending Facility Rate) (SLFR) 2020 අප්‍රේල් 03 දින වන විට පිළිවෙලින් සියයට 6.00 ක් සහ සියයට 7.00 ක් යන අගයන් වල පැවතුණි. ආර්ථිකයෙහි වේගවත් යළි නැගීසිටීමක් සඳහා සහාය දැක්වීමට, ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) හා ස්ථාවර ණයදීමේ පහසුකම් අනුපාතය (SLFR) 2020 ජූලි 09 දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙලින් සියයට 4.50 ක් හා සියයට 5.50 ක් දක්වා අඩු කර වී තිබුණි.

2018 වර්ෂය අවසානයට වාර්තා වූ සියයට 2.3 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වර්ෂය අවසාන වන විට, සංචිත මුදල්, සියයට 3.0 කින් අඩු විය. සමස්තයක් ලෙස, පෙර වර්ෂයෙහි වූ රු.බිලියන 21.3 ක පුළුල්වීමට සාපේක්ෂව, 2019 වර්ෂයේදී රු.මිලියන 932.6 ක් දක්වා රු.මිලියන 28.5 කින් අඩු වී තිබුණි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) 2019 මාර්තු මාසය වන විට සියයට 5.00 ක් දක්වා අඩුවීමත් සමඟ, 2019 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා මහ බැංකුව සතු වාණිජ බැංකුවල තැන්පතු රු.බිලියන 254.6 ක් දක්වා රු.බිලියන 65.5 කින් අඩුවී තිබුණි. 2020 මාර්තු 16 දින සිට බලපැවැත්වෙන පරිදි, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (Statutory Reserve Ratio) (SRR) සියයට 5.00 ක සිට සියයට 4.00 ක් දක්වා තවදුරටත් අඩු කර තිබුණු අතර, 2020 ජූනි 16 දින සිට බලපැවැත්වෙන පරිදි එය, සියයට 4 ක සිට සියයට 2 ක් දක්වා අඩුකර තිබුණි.

ශුද්ධ දේශීය වත්කම් (Net Domestic Assets)(NDA) හා ශුද්ධ විදේශීය වත්කම් (Net Foreign Assets)(NFA) වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත මුදල්වල වත්කම් අංශය සමන්විත වේ. 2018 වර්ෂයේදී රු.බිලියන 116.9 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වර්ෂය අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් (NDA) රු.බිලියන 36.6 ක් දක්වා රු.බිලියන 173.9 කින් අඩු වී තිබුණි. ඊට ප්‍රතිරූපීව, 2018 වර්ෂයේදී රු.බිලියන 95.6 ක පිරිහීමට සාපේක්ෂව, 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් (NFA) රු.බිලියන 145.5 කින් වැඩි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී විනිමය අනුපාතය තීරණය කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් නම්‍යශීලීභාවය පවත්වා ගෙන ගොස් තිබුණි. 2018 වර්ෂයේදී සැළකිය යුතු ක්ෂය වීමක් වාර්තා කරනු ලැබූ ශ්‍රී ලංකා රුපියල, 2019 වර්ෂයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 0.6 කින් ආන්තිකව වැඩිවීමකට ලක්විය. විනිමය අනුපාතයෙහි මෙම සාපේක්ෂ ස්ථාවරත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් වෙළඳ හිඟයෙහි සංකෝචනය බලපා තිබුණි.

ප්‍රධාන වශයෙන්ම ආර්ථික කටයුතු යටපත් වීම හා පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවය හා මෙම වර්ෂය තුළ පැවති දේශපාලනික අස්ථාවරත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන්, පෙර වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී මූල්‍ය අංශයේ වර්ධනය හා ක්‍රියාකාරීත්වය මන්දගාමී වී තිබුණි.

වත්කම්වල ගුණාත්මකභාවයේ පිරිහීම, මෙහෙයුම් පිරිවැයෙහි ඉහළ යාම හා බදුවල වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව, බැංකු අංශයේ ලාභදායීත්වය පිරිහීමට පත් විය. බැංකු අංශයේ වත්කම්

පදනම සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 728.7 කින් හෙවත් සියයට 6.2 කින් වැඩි වී තිබුණු අතර 2019 වර්ෂය අවසානයේදී එය රු.ට්‍රිලියන 12.5 ක් ඉක්මවා තිබුණි. කෙසේවුවද, 2018 වර්ෂයේදී වර්ධන වේගය සියයට 14.6 ක් වශයෙන් වාර්තා වී තිබුණි. 2019 වර්ෂය අවසානයට බැංකු අංශයේ බැරකම්වලින් සියයට 73.2 ක් නියෝජනය කරමින් තැන්පතු, අරමුදල් සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රය බවට පත් වූ අතර, ණයට ගැනීම් සියයට 13.4 ක් ලෙස වාර්තා වී තිබුණි. අක්‍රීය ණය අනුපාතය (NPL) 2018 වර්ෂය අවසානයට පැවැති සියයට 3.4 ක සිට 2019 වර්ෂය අවසානයට සියයට 4.7 ක් බවට පත් වීමෙන්, බැංකු අංශයෙහි ණයවල ගුණාත්මකභාවය 2019 වර්ෂය තුළදී තවදුරටත් පරිහානියට ලක් වී තිබුණි.

2019 වර්ෂය අවසානයට බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (Licensed Finance Companies)(LFCs) අංශය හා විශේෂිත ලීසිං සමාගම් (Specialized Leasing Companies)(SLCs) අංශය, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFCs) 42 කින් හා විශේෂිත ලීසිං සමාගම් (SLCs) 4 කින් සමන්විත විය. මෙම අංශයේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFCs) කිහිපයක් විසින් මුහුණ පා ඇති ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා අධීක්ෂණ ගැටළු සහිත සමාගම්වල ව්‍යාපාර මෙහෙයුම් පුනර්ජීවනයට වැඩි සැලකිල්ලක් ලබා දෙමින් මෙම අංශයෙහි ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා විචක්ෂණශීලී පියවර අඛණ්ඩව ගන්නා ලදී. කෙසේ වෙතත්, දුර්වල ප්‍රාග්ධන මට්ටම, වත්කම්වල ගුණාත්මකභාවයේ ඇති දුර්වලතා, දිගින් දිගටම සිදුවන පාඩු හා ඉල්ලූ විට හෝ කල් පිරීමේදී තැන්පතුකරුවන්ගේ මුදල් ආපසු ගෙවීමට අසමත් වීම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 සැප්තැම්බර් 19 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සමාගමක බලපත්‍රය අවලංගු කර තිබුණු අතර, පිරිහෙමින් පවතින මූල්‍ය තත්ත්වය හා උග්‍ර ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් තවත් මූල්‍ය සමාගමක බලපත්‍රය 2020 මැයි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර තිබුණි.

එම සමාගම්වල තැන්පතුකරුවන්, ශ්‍රී ලංකා තැන්පතුකරුවන්ගේ රක්ෂණ හා ද්‍රවශීලතා සහායක යෝජනා ක්‍රමයෙන් රු.600,000 දක්වා වන්දි ලබාගැනීමට හිමිකම් ලබා දී තිබුණි.

## බලපත්‍රලාභී වාණිජ බැංකු

### ලංකා බැංකුව (BoC)

1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත යටතේ ලංකා බැංකුව 1939 අගෝස්තු 01 දින ස්ථාපිත කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් කටයුතු කරනු ලබයි.

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟාකරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩනැංවූ වඩාත් කාර්යක්ෂමවූත් නවීන තාක්ෂණවේදයක් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශවයන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම ලංකා බැංකුවේ මෙහෙවර වේ.

මෙම මෙහෙවර ඉටු කිරීම සඳහා ශාඛා 581ක්, සීමිත සේවා ශාඛා 62ක්, ජංගම ශාඛා 11ක්, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM) 164 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)/ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) යන්ත්‍ර 1,033 ක්, ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන 14 ක් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන (SME Centers) 15 ක් හරහා, 2019 වර්ෂය අවසන් වන විට ලංකා බැංකුව සිය සේවාවන් ව්‍යාප්ත කර තිබුණි. මීට අමතරව, මේ සඳහා කාර්ය මණ්ඩලයේ 8,503 දෙනෙකුගේ දායකත්වය ගබා ගෙන තිබුණි.

ස්ථාවර දැක්මක්ද සමගින් 2019 සැප්තැම්බර් මාසයේදී ෆිච් රේටින්ග්ස් සමාගම (Fitch Ratings Lanka Ltd) විසින් "AA+(1ka)" යන ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීමකට ලංකා බැංකුව ලක්කර තිබුණි. තවද, අයිසීආර්ඒ ලංකා සමාගම (ICRA Lanka Ltd) විසින් 2019 ඔක්තෝබර් මාසයේදී කරන ලද ශ්‍රේණිගත කිරීම් අනුව ලංකා බැංකුව (SL) AAA යන ඉහළම ශ්‍රේණිගත කිරීමෙහි පවතින බව නැවත වරක් තහවුරු කර තිබුණි. "නිශේධනාත්මක" යන තත්ත්වය ප්‍රතිශෝධනය කිරීමේ දැක්මක් සහිතව "ස්ථාවර" යන තත්ත්වය ළඟා කර ගනිමින්, ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස එහි ඉහළ පද්ධතිගත වැදගත්කම පිළිඹිබු කරමින්, අර්ධ ස්වෛරී තත්ත්වයකදී, රජයෙහි හා එහි පූර්ණ අයිතිය යටතේ ප්‍රධාන ණය දායකයෙකු ලෙස කටයුතු කිරීම තුළින් එම තත්ත්වය ලබා ගෙන තිබුණි.

## මහජන බැංකුව

1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ රජයට අයත් බැංකුවක් වශයෙන් මහජන බැංකුව ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර තිබුණු අතර එය බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස පිහිටුවා තිබුණි. පනතේ 4 වන වගන්තිය හා ඊට අදාල සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සමූපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකුකරණය, කෘෂිකර්මාන්තය හා කර්මාන්ත දියුණු කිරීම හා ඊට සහයෝගය දැක්වීම හා වාණිජ බැංකුවක්, උකස් කරුවකු හා වෙළඳ බැංකුවක් සිදුකරනු ලබන කටයුතු පවත්වාගෙන යාම මහජන බැංකුවේ අරමුණු වශයෙන් දක්වා තිබුණි.

මහජන බැංකුව 2019 වර්ෂය අවසාන වන විට දිවයින පුරා ශාඛා 739 ක් හා ඊට අමතරව ATM යන්ත්‍ර 755 ක් CDM යන්ත්‍ර 270 ක් KISOK යන්ත්‍ර 222 ක් හා ස්වයං බැංකු සේවා ඒකක 239 ක් මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කර තිබුණි. මහජන බැංකු (සංශෝධන) පනතේ කෙටුම්පත 2019 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර එමගින් නියාමන ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා සාපේක්ෂව පහසුවෙන් ණයකර නිකුත් කිරීමට බැංකුවට හැකි වී තිබේ. සංශෝධනයෙන් පසුව බැංකුව රු.බිලියන 10 ක් බාසල් III, ස්ථර II අනුකූලතා ණයකර නිකුත් කරනු ලැබිණි.

ඩිජිටල් වේදිකාවේ බැංකුවේ සාර්ථකත්වය, ඒෂියන් බැන්කර් සඟරාව සහ ඒෂියා මනී යන දෙකෙන්ම හොඳම ඩිජිටල් බැංකුව 2019 ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් ලැබුණු සම්මාන රාශියක් තුළින් සහ 2019 සඳහා ඒෂියන් බැන්කර් සඟරාව විසින් හොඳම ජංගම බැංකුකරණ යෙදුම ලෙස පිළිගැනීම තුළින් පෙන්නුම් කෙරුණි.

එසේම තොරතුරු ආරක්ෂණය හා ආරක්ෂාව සඳහා ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතනය - ISO/IEC 27001:2013 සහතිකයද බැංකුව ලබා ගෙන තිබුණි. තවද, බැංකුව බොහෝ සම්මාන සහ ප්‍රශංසා ලබාගෙන තිබූ අතර ඒ අතරට SLIM NIELSON PEOPLES AWARDS – 2019, LANKAPAY TECHNOVATION AWARDS – 2019, ADB TFP AWARDS – 2019, THE ASIAN BANKER AWARD – 2019, ASIAN MONEY AWARDS 2019, හා EUROPEAN GLOBAL BANKING and FINANCE AWARDS – 2019 ඇතුළත් වේ. ෆිච් ශ්‍රේණිගත කිරීම අනුව බැංකුවට ජාතික දිගුකාලීන "AA+ (lka)" ශ්‍රේණිගත කිරීමක්ද ඇත.

වර්ෂය පුරා තැන්පතු බලමුළුගැන්වීමේ ව්‍යාපාර කිහිපයක් දියත් කර තිබූ අතර විවිධ පාරිභෝගික කොටස් සඳහා ණය නිෂ්පාදන රාශියක් ලබා දී තිබුණි.

## බලපත්‍රලාභී විශේෂිත බැංකු

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

එවකට ජනතාව වෙත මූල්‍ය සේවාවන් සපයමින් සිටි ආයතන හතරක් එක් කරමින් 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් 1972 වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව පිහිටුවීය. 1988 අංක 30 දරන බැංකුකරණ පනත ප්‍රකාරව මෙම බැංකුවට අවසරලත් විශේෂිත බැංකුවක තත්ත්වය ලබා දි තිබුණි.

මෙම බැංකුවේ මෙහෙවර වනුයේ සියළු පාර්ශවකරුවන්ගේ අපේක්ෂා මුදුන් පමුණුවාලන අතරතුර ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන ප්‍රශස්ත ලෙස සපුරාලීම සඳහා අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් සැපයීමයි.

උක්ත මෙහෙවර ඉටු කර ගැනීම සඳහා බැංකුව ශාඛා 256 ක්, තැපැල් හා උප තැපැල් කාර්යාල 4,063 ක් හා CDM, ATM, CRM යන්ත්‍ර 334 ක් මගින් තම සේවාවන් බෙදාහරිනු ලබයි. ඊට අමතරව බැංකුව දිවයින පුරා 4,715 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් යොදවා ඇත.

විශාල බැංකු තුල්‍ය කණ්ඩායම් සම්බන්ධයෙන් කලින් කලට කරනු ලබන සමාලෝචනය අනුව පිච් රේටින් වෙතින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට AAA (lKa) දීර්ඝ කාලීන ජාතික ශ්‍රේණිගත කිරීම් ලබාදී තිබුණි. එසේම එයට Long Term Issuer Default Ratings (IDRS) B+ තත්ත්වය ලබා දී තිබුණි.

### සමූහය

ජාතික ඉතිරි කිරීමේ බැංකු අරමුදල් කළමනාකරණ සමාගම හා ශ්‍රී ලංකා ඉතිරි කිරීම් බැංකුව යන අනුබද්ධිත ආයතන දෙක සමූහයට ඇතුළත් වේ. 2016 වර්ෂයේ රජයේ අයවැය යෝජනාවට අනුව බැංකුව විසින් 2019 ඔක්තෝබර් 11 දින සිට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් මුළුමනින්ම අත්පත් කර ගෙන තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට අත්පත් කරගත් ආයතන වෙනුවෙන් කරනු ලැබූ ආයෝජනය රු.බිලියන 1.7 ක් වූ අතර 2019 වර්ෂය අවසානයට එය රු.බිලියන 4.8 ක් දක්වා වැඩි වී තිබුණි.

### ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව වගකීමෙන් සීමිත රාජ්‍ය සමාගමක් වශයෙන් සංස්ථාපනය කර තිබුණු අතර 2007 අංක 07 දරන සමාගම් පනත් යටතේ ලියාපදිංචි කර තිබුණි. තවද, එය 1988 අංක 30 දරන බැංකුකරණ පනත යටතේ අවසරලත් විශේෂ බැංකුවක් ලෙස ස්ථාපිත කර තිබුණි.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ආදායම් උත්පාදනය, ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් වඩාත් විශ්වාසදායක සහ ආකර්ශනීය මූල්‍ය පහසුකම් සැපයීම සහ ඔවුන්ගේ ඉතිරිකිරීම් පුරුද්ද වැඩි දියුණු කිරීම වෙනුවෙන් කැපවීම බැංකුවේ මෙහෙවර වේ.

පවත්නා ගැටළුකාරී තත්ත්වය නිරීක්ෂණයට යටත්ව ICRA ලංකා ආයතනය විසින් (SL) BBB -නිකුත් කිරීම් ශ්‍රේණිගත කිරීම ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙත ලබාදී තිබුණි. ඒ අනුව බැංකුව මූල්‍යමය වගකීම් නිසිකලට ඉටුකිරීමේදී මධ්‍යස්ථ ණය අවධානමක් හා මධ්‍යස්ථ සුරක්ෂිතතාවයක් පවත්වාගෙන තිබුණි.

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කර තිබුණු

අතර එය රජයට අයත් බැංකුවක් වේ. එම පනත හා ඊට පසුව සිදු කළ සංශෝධන පනත්වල විධිවිධාන අනුව මූල්‍යමය හා වෙනත් සහයෝගයන් ලබාදී කෘෂිකාර්මික, කර්මාන්ත හා නිවාස යන අංශ සංවර්ධනය කිරීම මෙම බැංකුවේ අරමුණු වේ.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මෙහෙවර වනුයේ ජාතියේ ප්‍රමුඛතම නිවාස බැංකුව ලෙස දිගින් දිගටම රැඳී පැවතීම හා සංවර්ධන බැංකු පාරිභෝගිකයන් ව්‍යාපාරිකයින්, රැකියාලාභීන්, කොටස් ගැනුම්කරුවන්, තාක්ෂණයේ හා සමාජය තුළ වටිනා සහකරුවෙක්වීම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මෙහෙවර වේ. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ශාඛා 25 ක් මඟින් තම සේවාවන් සපයා ඇත.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

2003 අංක 15 පනතින් හා 2011 අංක 45 දරන පනත මගින් සංශෝධිත 1997 අංක 17 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව රාජ්‍ය බැංකුවක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර තිබුණු අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් 1998 අංක 39 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

පනතේ 12(අ) වගන්තිය හා ඊට අදාල සංශෝධනයන්ට අනුව ශ්‍රී ලංකාවේ සැමට සෙවන ලබාදීමේ සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නිවාස මූල්‍ය පහසුකම් සැපයීමේ වෙළෙඳ පොල නායකයා බවට පත්වීම මෙම බැංකුවේ අරමුණ වී තිබුණි. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් 2019 වර්ෂය අවසන් වන විට ශාඛා කාර්යාල 39 ක් ස්ථාපිත කර තිබුණු අතර 2019 එයට BB+ (lka) ණය ඇගැයුම ලැබී තිබුණි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකු 6 ක් ඒකාබද්ධ කර රජයට අයත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර තිබුණි. පනතේ 6 වන වගන්තියට අනුව ප්‍රධාන වශයෙන් සූක්ෂම මූල්‍ය ආයතන සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍යමය සහය ලබා දෙමින් සංවර්ධනය, අභිවෘද්ධිය, ධිවර කටයුතු ප්‍රවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ථ කළාපීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලැසීම බැංකුවේ අරමුණ වේ.

සංවර්ධන ණය වෙනුවෙන් කැපවූ ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රටේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම උදෙසා විශාල කාර්ය භාරයන් දිගින් දිගටම සිදුකර තිබුණි. මෙම බැංකුව රටේ බොහෝ සංවර්ධන වැඩසටහන්වලදී මුදල් සම්පාදකයකු වශයෙන් මූලික වී කටයුතු කර තිබුණි. තම පාරිභෝගිකයන් සවිබල ගැන්වීමට කැපවී සිටින අතර එමගින් දිවයින පුරා ඇති 276 ක් වූ තම ශාඛා ජාලය හරහා ජාතිය සංවර්ධනය කිරීමට කැපවී තිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලංකා පුත්‍ර බැංකුවේ සීයයට සීයයක් කොටස් හිමිකාරීත්වය 2018 දෙසැම්බර් 31 වන දා වන විට ලබා ගෙන තිබුණි. 2016 වර්ෂයේ රජයේ අයවැය යෝජනාවක් අනුව ලංකා පුත්‍ර බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2018 පෙබරවාරි 14 දින අනුමැතිය ලබා දී තිබුණි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ සම්පූර්ණ කොටස් හිමිකාරීත්වය රු.බිලියන 4.176 කට අත්පත් කර ගෙන තිබුණු අතර එම මුදල මහා භාණ්ඩාගාරය නමින් උක්ත වටිනාකමට නව කොටස් නිකුතුවක් වශයෙන් 2018 දෙසැම්බර් 31 දින සිට

බලපැවැත්වෙන පරිදි සිදුකර තිබුණි. ලංකා පුත්‍ර බැංකුවේ මෙහෙයුම් කටයුතු 2019 අප්‍රේල් 01 දින සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කර ගෙන තිබුණු අතර 2019 අප්‍රේල් 30 දින ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කර තිබුණි.

## ප්‍රධාන විගණන සොයා ගැනීම්

### ලංකා බැංකුව

#### බැංකුව

- 2019 වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව බැංකුවේ මුළු පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්‍ෂව සියයට 12.8 කින් වැඩි වී රු.බිලියන 220.5 ක් වී තිබුණු අතර පොලී වියදම සියයට 11.9 කින් වැඩි වී රු.බිලියන 145.3 ක වී තිබුණි. ඒ අනුව ශුද්ධ පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 14.6 කින් වැඩි වී තිබුණි. හානිකරණ ගාස්තු 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 3.6 කින් හෙවත් සියයට 23.6 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සේවක වියදම් සියයට 5.8 කින් වැඩි වී තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේදී බදුවලට පෙර ලාභය රු.බිලියන 43.0 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 6.5 කින් හෙවත් රු.බිලියන 2.8 කින් අඩු වී රු.බිලියන 40.2 ක් වී තිබුණි.

- කෙසේ වෙතත්, 2018 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ ලාභය සියයට 10 කින් වැඩි වී රු.බිලියන 23.1 ක් වී තිබුණි. 2018 අප්‍රේල් 01 දින සිට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළින් උපයා ගන්නා පොලී ආදායම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ඉවත් කිරීම නිසා ආදායම් බදු වියදම් අඩුවීමෙන් මෙම වර්ධනය සිදු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය හා සාමාන්‍ය ස්කන්ධ මත ප්‍රතිලාභය පිළිවෙලින් සියයට 18.75 කින් හා සියයට 2.9 කින් අඩු වී තිබුණි.

- ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසානයට දළ ණය හා අත්තිකාරම් රු.බිලියන 138.3 කින් හෙවත් සියයට 9.2 කින් වැඩි වී රු.බිලයන 1,648.8 ක් වී තිබුණි. ඉහත වැඩිවීමට උකස් ණය, නිවාස ණය හා ව්‍යාපෘති යටතේ ණය වැඩිවීමද බලපා තිබුණි. දිගුකාලීන ණය, උකස්, නිවාස ණය හා විවිධ ව්‍යාපෘති යටතේ ණය පිළිවෙලින් සියයට 21 කින්, සියයට 19 කින්, සියයට 13 කින් හා සියයට 12 කින් වැඩි වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අයිරා, කල්බදු හා වෙනත් ණය පිළිවෙලින් සියයට 9 කින්, සියයට 18 කින් හා සියයට 31 කින් අඩුවී තිබුණි.

- සමස්ත කර්මාන්තය පුරාවට ආයෝජන කළඹේ වූ කඩා වැටීම නිසා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු අක්‍රීය ණය හා අත්තිකාරම් රු.බිලියන 24.3 කින් හෙවත් සියයට 44 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හානිවීම් ගාස්තු ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 27 කින් වැඩිවීම තුළින් මෙම පිරිහීම පිළිබිඹු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අක්‍රීය ණය අනුපාතය සියයට 3.62 සිට සියයට 4.79 දක්වා වැඩි වී තිබුණත් එය කර්මාන්තයේ සාමාන්‍යයට අනුකූල වී තිබුණි.

- බැංකුවේ සමස්ත තැන්පතු ප්‍රමාණය රු.බිලියන 1,771 ක සිට සියයට 13.2 කින් වැඩි වී සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.බිලියන 2,005.2 ක් වී තිබුණි.

- 2019 වර්ෂය සඳහා අදියර 1 ප්‍රාග්ධනය හා සමස්ථ ප්‍රග්ධනයේ අවම අවශ්‍යතාවය පිළිවෙලින් සියයට 10 ක් හා 14 ක් වූ අතර, 2019 වර්ෂය අවසන් වන විට එම අවම අවශ්‍යතාවය අභිබවමින් පිළිවෙලින් සියයට 11.2 ක් හා සියයට 15.6 ක ප්‍රමාණයෙන් පවත්වා ගැනීමට බැංකුවට හැකි වී තිබුණි. ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය), ද්‍රවශීල ආවරණ අනුපාතය (ශ්‍රී ලංකා රුපියල්) හා ද්‍රවශීල ආවරණ අනුපාතය (සියළු විනිමයන්) සම්බන්ධයෙන් පිළිවෙලින් සියයට 20 ක්, සියයට 100 ක් හා සියයට 100 ක් වශයෙන් අවමව පැවැතිය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අනුපාත පිළිවෙලින් සියයට 24.6 ක්, සියයට 188.2 ක් හා සියයට 125.6 ක් වශයෙන් ඉක්මවා පැවැතුණි.

- කොවිඩ් 19 වසංගතය බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කෙරෙහි ප්‍රබල ලෙස බලපා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට බැංකුව විසින් කොවිඩ් 19 වසංගතයේ සත්‍ය බලපෑම තක්සේරු කර නොතිබුණු අතර කොවිඩ් 19 වසංගතයෙන් ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා ලබා දී තිබුණු සහන කාලයේ බලපෑම කොපමනද යන්න තක්සේරු කරමින් පැවැතුණි.

## සමූහය

2019 වර්ෂයේදී කණ්ඩායම ලැබූ බඳු වලට පෙර ශුද්ධ ලාභය රු. බිලියන 41.5 ක් වී තිබුණත්, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.2 ක අඩුවීමක් වී තිබුණි. කණ්ඩායමේ සමස්ත වත්කම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයට රු. බිලියන 2,462.5 ක් වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.7 කින් වර්ධනය වී තිබුණි. 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දළ ණය හා අත්තිකාරම් සහ මුළු තැන්පත් ප්‍රමාණය පිළිවෙලින් සියයට 8.9 කින් හා සියයට 13.1 කින් වර්ධනය වී තිබුණි.

## මහජන බැංකුව

- 2019 වර්ෂයේදී බැංකුවේ දළ අලාභය රු.බිලියන 197 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8.7 ක වර්ධනයකි. බැංකුවේ පොලී ආදායම රු.බිලියන 184 ක් දක්වා සියයට 10.6 කින් සහ පොලී වියදම රු.බිලියන 125.5 ක් දක්වා සියයට 13 කින් 2019 වර්ෂයේදී ඉහළ ගොස් තිබේ. කෙසේ වෙතත් බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 5.6 කින් හෙවත් රු.බිලියන 3.1 කින් වර්ධනය වී තිබුණි. හානිකරණ අලාභය 2018 වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 3.2 කින් හෙවත් සියයට 121 කින් වැඩි වී තිබුණි. බදු ගෙවීමට පෙර ලාභය රු.බිලියන 19.7 ක් ලෙස වාර්තා වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 19.3 කින් අඩු වීමකි.

- සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ සමස්ත තැන්පතු ප්‍රමාණය රු.බිලියන 68 කින් වැඩිවී තිබුණු අතර 2019 වර්ෂය අවසාන වන විට එය රු.බිලියන 1,491 ක් වී තිබුණි. 2019 වර්ෂය අවසන් වන විට දළ ණය හා අත්තිකාරම් රු.බිලියන 1,413.6 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 47 ක් හෙවත් සියයට 3.4 ක වර්ධනයක් සිදු වී තිබුණි. 2019 වර්ෂය අවසන් වන විට බැංකුව

සතු සමස්ත වත්කම් ප්‍රමාණය රු.බිලියන 1,873 ක් වී තිබුණි.

- බැංකු මට්ටමින් සලකා බලන විට ඉකුත් වර්ෂයේ අවසානයට රු.බිලියන 31.5 ක් වූ සමස්ත අක්‍රිය ණය ප්‍රමාණය වර්ෂය තුළදී රු.බිලියන 43.6 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවේ හානිකරණ අලාභය (impainment charges) සියයට 121 කින් වැඩි වී තිබුණි. 2019 දී කර්මාන්තය පුරා අක්‍රිය ණය ඉහළ ගොස් තිබියදීත් බැංකුවේ අක්‍රිය ණය අනුපාතය සියයට 3.3 ක් ලෙස පවත්වා ගෙන තිබුණු අතර එය 2019 දෙසැම්බර් 31 දිනට පැවැති සාමාන්‍ය අගය වූ සියයට 4.7 කට වඩා බෙහෙවින් අඩු අගයක් ගෙන තිබුණි.

- මුළු I ස්ථරයෙහි ප්‍රාග්ධන අනුපාතය සහ මුළු ප්‍රාග්ධන අනුපාතය පිළිවෙලින් සියයට 10.68 (අවම සියයට 9.50) හා සියයට 14.66 (අවම සියයට 13.50) පැවැතුණි. තවද, බැංකුව එහි නියාමන ප්‍රාග්ධන මට්ටම්වලට සහයවීම සඳහා සාධාරණ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලියක ස්ථිරව හා අඛණ්ඩව නියැලී සිටී. 2020 සැලැස්ම තුළ ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය කිරීම, බාසල් III ස්ථර II අනුකූල ණයකර තුළ රු.බිලියන 8 ක අවමයක් නිකුත් කිරිම, ලාභාංශ ගෙවීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාමටද ඇතුළත් වේ.

## සමූහය

- කණ්ඩායම රු.බිලියන 25.66 ක් පූර්ව බදු ලාභයක් 2019 වර්ෂය සඳහා වාර්තා කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17.7 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. 2019 වර්ෂය අවසානයේදී කණ්ඩායමේ මුළු වත්කම් පදනම පෙර වර්ෂයේ පැවති රු.බිලියන 1,908 කට සාපේක්ෂව රු. බිලියන 2,050 දක්වා වර්ධනය වී තිබුණි.

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

- ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ ලාභය රු.බිලියන 7.9 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එය රු.බිලියන 10.5 ක් වී තිබුණි. 2019 වර්ෂයේ බැංකුවේ මුළු පොලී ආදායම රු.බිලියන 110.5 ක සිට රු.බිලියන 118.7 ක් දක්වා සියයට 7 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2019 වර්ෂයේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ හා සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 17 කින් හා සියයට 4.37 කින් වැඩි වී තිබුණි.

- බැංකුවේ තැන්පතු පදනම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 836.6 ක සිට සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 1,016.6 ක් දක්වා සියයට 21 කින් වැඩි වී තිබුණි. සමස්ත තැන්පතුවලින් කාලීන තැන්පතු අනුපාතය 2018 වර්ෂයේ පැවැති සියයට 76 සිට 2019 වර්ෂයේදී සියයට 78 දක්වා වැඩි වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී බැංකු දළ ණය හා අත්තිකාරම් රු.බිලියන 31.9 කින් හෙවත් සියයට 7 කින් වැඩි වී තිබුණි. ඊට හේතුව වන්නේ සිල්ලර ණයදීමේ කළඹ සියයට 15.29 කින් වැඩිවීමත් ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ආයතනික ණයදීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 3.69 කින් අඩුවීමත් දැක්විය හැකිය.

- බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය 2018 වර්ෂයේදී සියයට 1.44 ක සිට 2019 වර්ෂයේදී සියයට 1.57 ක් දක්වා වැඩි වී තිබුණි. පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු ණය අයකිරීමේ අපහසුතා සහ රට තුළ

පැවති වෙනත් අභියෝගාත්මක තත්ත්වයන් මෙයට හේතු වූ බව කළමනාකාරීත්වයේ අදහස වී තිබුණි.

- 2018 දෙසැම්බර් 31 දිනට සියයට 13.08 ක්ව පැවැති බැංකුවේ පොදු ස්කන්ධ අදියර I (Tier) අනුපාතය 2019 දෙසැම්බර් 31 දින වන විට සියයට 12.02 ක් දක්වා අඩු වී තිබුණි. තවද, ඉකුත් වර්ෂය අවසානයට පැවති සියයට 15.90 ක් වූ මුළු ප්‍රාග්ධන අනුපාතය සමාලෝචිත වර්ෂය අවසානය වන විට සියයට 14.35 දක්වා අඩු වී තිබුණි. කෙසේ වෙතත් පොදු ස්කන්ධ අදියර අනුපාතය සියයට 8.5 ක් හා මුළු ප්‍රාග්ධන අනුපාතය සියයට 12.5 ක් වශයෙන් පැවැති අවම නියාමන අවශ්‍යතාවය 2019 වර්ෂයේදී බැංකුව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

- සමූහය විසින් සමාලෝචිත වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය රු.බිලියන 13.1 ක් වාර්තා කර තිබුණු අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 65 ක වර්ධනයකි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ ණය හා අත්තිකාරම් සහ මුළු තැන්පත් පිළිවෙලින් සියයට 8 කින් හා සියයට 21 කින් වැඩිවී තිබුණි.

## ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

- ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ දළ ණය හා අත්තිකාරම් රු.බිලියන 197 කින් හෙවත් සියයට 5 කින් අඩු වී තිබුණි. ශුද්‍ර මූල්‍ය ණය රු.මිලියන 91 කින් හෙවත් සියයට 7 කින් හා පුද්ගල ණය රු.මිලියන 67 කින් හෙවත් සියයට 19 කින් පහත වැටී තිබීම ඉහත අඩුවීම කෙරෙහි බලපා තිබුණි. තවද, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමස්ත අක්‍රීය ණය හා අත්තිකාරම් රු.මිලියන 106 කින් හෙවත් සියයට 7 කින් වැඩි වී තිබුණි.

- බැංකුවේ සමස්ත තැන්පතු ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.මිලියන 12 කින් හෙවත් සියයට 1 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු රු.මිලියන 20 ක් හෙවත් සියයට 4 කින් පහත වැටීම ඉහත අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

- සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව බැංකුවේ ප්‍රධාන අරමුණ වන්නේ චිරස්ථායි ආදායම් උත්පාදන අවස්ථා හඳුනාගැනීම, වැඩිදියුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම, සහාය දීම සහ ඵලදායී ස්වයං රැකියා ශුද්ධ ව්‍යාපාර හා ග්‍රාමීය කටයුතු ඇතුළු ක්‍රියාකාරකම් සමූහයක් සඳහා මූල්‍ය සහන හා සේවාවන් සැපයීම තුළින් දිළිදු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම වේ. කෙසේ වෙතත්, ඉහත කී ප්‍රධාන අරමුණු සැලකිල්ලට ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයේදී බැංකුව එහි මුළු ආයෝජනවලින් සියයට 72 කට ආසන්න ප්‍රමාණයක් ස්ථාවර තැන්පතුළ මූල්‍ය උපකරණ, ස්කන්ධ උපකරණ ආදියෙහි ආයෝජනය කර තිබුණි.

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2020 සැප්තැම්බර් 01 දින වන විටත් සංශෝධිත මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් ඉදිරිපත් කර නොතිබුණි.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

- බැංකුව විසින් 2018 වර්ෂයේදී රු.බිලියන 37.9 ක ණය ලබා දී තිබුණු අතර 2019 වර්ෂයේදී එය සියයට 8.6 කින් වර්ධනය වී රු.බිලියන 41.2 ක් දක්වා ප්‍රසාරණය වී තිබුණි. එබැවින්

ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු රු.බිලියන 6.7 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්සයේදී සියයට 15 කින් වර්ධනය වී රු.බිලියන 7.7 ක් දක්වා වැඩි වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී බැංකුව තම තැන්පතු පදනම රු.බිලියන 37.02 ක සිට සියයට 14.8 කින් වැඩි වී රු.බිලියන 42.5 ක් දක්වා ප්‍රසාරණය වී තිබුණි.

- බැංකුවේ සමස්ත වත්කම් 2018 වර්ෂයේ රු.බිලියන 49.3 ක සිට රු.බිලියන 55.95 ක් දක්වා රු.බිලියන 6.7 කින් වැඩි වී තිබුණි. බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2018 දී සියයට 20.46 ක සිට 2019 වර්ෂයේදී සියයට 25.26 කින් වැඩි වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ පූර්ව බදු ලාභය රු.මිලියන 774 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 23.17 කින් වැඩි වී තිබුණි. තවද, 2018 වර්ෂය සමඟ සැසඳීමේදී බැංකුවේ ශුද්ධ පොලී ආදායම රු.මිලියන 661 කින් හෙවත් සියයට 29.55 කින් වැඩි වී තිබුණි.

- ප්‍රාග්ධන ප්‍රමාණතාව හා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, කොටස්කරුවන් සඳහා වටිනාකම් ඇතිකිරීම කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවයක් ලැබුණු අතර 2019 වසරේදී කොටස් හිමි අරමුදල් සියයට 7.6 කින් වර්ධනය විය. 2019 වසරේදී කොටසක් සඳහා වන වත්කම් වටිනාකම රු.73.51 සිට රු.79.11 දක්වා වැඩි වූ අතර එය සියයට 7.6 වන වර්ධනයකි. කෙසේ වෙතත්, ලාභදායීත්වය පහත වැටීම හේතුවෙන් 2019 වසර තුළ කොටසක් සඳහා ඉපයීම රු.8.72 සිට රුපියල් 7.35 දක්වා අඩු විය. මූලික ප්‍රාග්ධන අනුපාතය අදියර I (Tier I) සහ මුළු ප්‍රාග්ධන අනුපාතය අදියර II (Tier II) අවම අවශ්‍යතා අනුපාතයට ඉහළින් පැවති අතර සියයට 7, සියයට 8.5 හා සියයට 12.50 ක නියාමන අවශ්‍යතාවට පරස්පරව අවම අවශ්‍යතා සියයට 18.21 හා 19.14 ලෙස පැවතුණි. කෙසේ වෙතත්, 2014 ජනවාරි 17 දිනැති, මුල්‍ය අංශයේ ඒකාබද්ධ ප්‍රධාන සැලැස්ම සමඟ නිකුත් වූ මහ බැංකු උපදෙස් අංක 02/17/402/0073/002 ප්‍රකාරව 2016 ජනවාරි පළමු දිනට බැංකුව එහි Core ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 5,000 ක් ලෙස පවත්වාගත යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව 2015 ජූලි 30 දිනැති ලිපිය මගින් කාලීන ක්‍රියාකාරී සැලැස්මකින් අවම ආයෝජන සපුරා ගැනීමට කාලයේ දිගුවක් ලබා දෙන ලදි. ඒ අනුව 2017 ජනවාරි 01 වන විට බැංකුව රු.මිලියන 4,000 ක ප්‍රාග්ධන සහ 2018 ජනවාරි 01 වන විට රු.මිලියන 5,000 ක ප්‍රාග්ධන සපුරා ගත යුතුව තිබුණි. බැංකුවේ ඉල්ලීම පරිදි රු.මිලියන 5,000 සම්පූර්ණ අවශ්‍යතාවය සපුරා ගැනීමට මහ බැංකුව 2019.06.30 දක්වා වැඩිපුර දිගුවක් ලබාදෙන ලදි. 2019 වසරේදී භාණ්ඩාගාරය වෙත නිකුත් කළ ATI ඇපකරය මගින් අමතර ප්‍රාග්ධන අත්පත් කර ගනිමින් බැංකුව දැනට රු. බිලියන 5 ක් ප්‍රාග්ධන ප්‍රමාණ අවශ්‍යතාව සපුරා ගැනීමේ අවශ්‍යතාවයෙන් සිටී.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- 2019 වර්ෂය අවසන් වන විට බැංකුවේ මුළු තැන්පතු වටිනාකම රු.බිලියන 149.6 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට වඩා රු.බිලියන 8 කින් හෙවත් සියයට 5.7 කින් වැඩි වී තිබුණි. 2019 වර්ෂය අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් රු.බිලියන 23 කින් හෙවත් සියයට 13 කින් වැඩි වී රු.බිලියන 199.99 ක් ඉක්මවා තිබුණි. වත්කම්වල මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් ලංකා

පුත්‍ර සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධවීමෙන් සහ ආයෝජන හා ණය ඉහළ යාම නිසා ඇති වී තිබුණි.

- බැංකුවේ බදුවලට පෙර ලාභය රු.බිලියන 1.2 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 41.8 කින් අඩු වී තිබුණි. හානිකරණ වියදම් (Impairmant) වැඩිවීම ලාභය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. පොලී ආදායම රු.බිලියන 1.5 ක් හෙවත් සියයට 6 කින් වැඩි වී තිබූ අතර පොලී වියදම රු.මිලියන 944 කින් හෙවත් සියයට 7 කින් වැඩි වී තිබුණි. ඒ අනුව ශුද්ධ පොලී ආදායම රු.මිලියන 547.6 ක් හෙවත් සියයට 5 කින් පමණක් වැඩි වී තිබුණි.

- පසුගිය වර්ෂය අවසාන වන විට සියයට 5.40 ක අක්‍රිය ණය අනුපාතය 2019 දෙසැම්බර් 31 දින වන විට සියයට 9.48 ක් දක්වා සීඝ්‍ර ලෙස වැඩිවීම නිසා එය වත්කම්වල අහිතකර ප්‍රවණතාවයක් ඇති කිරිමට බලපා තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට පැවති මුළු දළ ණය ප්‍රමාණයෙන් රු.බිලියන 14.1 ක් අදියර 3 යටතේ වර්ගීකරණය කර තිබුණු අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 86 ක වැඩිවීමකි. තවද, මුළු ණයවලින් සියයට 18 ක් අයකර ගැනීමේ හැකියාවේ අවධානම ඉහළ මට්ටමක පැවැති අතර වර්ෂය අවසානය වන විට ඒවා අදියර 2 යටතේ වර්ගීකරණය කර තිබුණි.

- සියයට 55.4 ක් වූ ආංශික අනුපාතය සමඟ සැසඳීමේදී 2019 වසරේ මෙහෙයුම් වියදම් සඳහා වන කාර්ය මණ්ඩල පිරිවැය සියයට 74.55 ක් වී තිබුණි. වත්කම් මත ප්‍රතිලාභ හා ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාත ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2019 දෙසැම්බර් 31 වන විට තවදුරටත් පිළිවෙලින් සියයට 0.26 ක් දක්වා හා සියයට 3.33 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 වන විට බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය පවත්වා ගෙන තිබුණි.

# ජාතික ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරිම

## අංශ

ජාතික ආරක්ෂාව

අභ්‍යන්තර කටයුතු

අධිකරණ හා බන්ධනාගාර කටයුතු

## නිරීක්ෂණ

- එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් කටයුතු
- බලපත්‍ර අදායම් රැස්කිරීම්
- නිකුත් කළ ගිනි අවි බලපත්‍ර අළුත්කිරීම
- හිඟහිටි ණය ශේෂ
- උපාය මාර්ගික ආරක්ෂක සංනිවේදන ජාල ව්‍යාපෘතිය
- අනුමැතිය ඉක්මවා ගෙවීම් කිරීම
- ගස් කැපීම සඳහා භාවිතා වන යාන්ත්‍රික කියත් ලියාපදිංචි කිරිම
- නිවාඩු නිකේතන හා උත්සව ශාලා ආදායම්
- ගෙවීම් වවුචර් පිළියෙල නොකිරිම
- ත්‍රිකුණාමලය නෞකා තටාකාංගණ ජැටිය ඉදිකිරීම
- අභ්‍යන්තර අරමුදල් පවත්වා ගැනීම
- හෙලිටුවර්ස් සමාගම රාජ්‍ය සමාගමක් බවට පත් කිරිම
- ගුවන් යානා කුලී ආදායම
- රණවිරු සුභසාධනය
- පිරිවැඩියා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරිම
- පාඩු හා අලාභහානි
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ශික්ෂණ රෝහල
- රථවාහන අනතුරු වැළැක්වීම
- අපරාධ විසදීම

- නිද්‍රාජනක ද්‍රව්‍ය පාලනය
- ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.
- අලාභහානි සම්බන්ධයෙන් කටයුතු නොකිරීම
- අනාර්ථික ගනුදෙනු
- නඩු තීන්දු සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරිම
- රජයේ මුදල් අවභාවිතා කිරිමට අවකාශ සැලැසීම
- වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති
- ව්‍යාපෘති අතර මඟ අතහැර දැමීම
- හිඟහිටි ආදායම්
- හිඟහිටි අත්තිකාරම් ණය
- නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය
- නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු නොපිරවීම
- බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීමේ
- බන්ධනාගාරයන් තුළ පවතින අධික තදබදය
- සේවය ස්ථිර කළ බවට විධිමත් පත්වීම් ලිපි නිකුත් නොකිරීම
- රජයේ රස පරීක්ෂක වාර්තා ඉදිරිපත් කිරීම
- පවුල් ඒකකවල බිඳ වැටීම වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය සැලසුම් සකස් කිරීම

# ජාතික ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහතික කිරීම සහ ගුවන්, මුහුදු සහ ගොඩබිම ආරක්ෂාව පවත්වා ගෙනයාම සඳහා පහත සඳහන් කාර්යභාරය ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු හතක් හා ව්‍යවස්ථාපිත ආයතන හතක් විසින් ඉටුකළ යුතුව පැවතුණි.

- ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව සහතික කිරීම
- ගුවන්, මුහුදු සහ ගොඩබිම කළාපයන්හි ආරක්ෂාව පවත්වා ගෙනයාම
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙහෙයවීම
- ශ්‍රී ලංකාවේ අභිමානය හා පෞඩත්වය පවත්වා ගෙනයාම සඳහා සහයවීම
- ආරක්ෂක කටයුතු සම්බන්ධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් පිළිබඳව ප්‍රතිපත්ති සැකැසීම හා ක්‍රියාත්මක කිරීම
- නීතිය හා සාමය පවත්වා ගෙන යාම
- සමාජ විනය තහවුරු කරන පුළුල් ප්‍රතිසංස්කරණ කිරිම
- සමාජ ව්‍යවසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධි ක්‍රියා වැලැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම
- රථවාහන ගමනාගමනය පාලනය කිරීම
- අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීම හා පාලනය
- නවීන තාක්ෂණය භාවිතයෙන් කළමනාකරණ පද්ධති හා ක්‍රියා පටිපාටීන් වැඩි දියුණු කිරීම මගින් විශ්වාසනීය හා ආරක්ෂිත මුද්‍රණ සේවාවක් ජනතාවට ලබාදීම

ඉහත සඳහන් කාර්යභාරයයන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙක තුළදී පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 1,131,929 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 1,060,711 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 6.29 ක් හෙවත් රු.මිලියන 71,218 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. විස්තර රූපසටහන 20 හි දැක්වේ.




රූපසටහන 20 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපදනය උපයෝජනය කිරිම
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් කටයුතු

ශ්‍රී ලංකා යුද්ධ හා ගුවන් හමුදා බටපිරිස් රටවල් 5 ක එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී සිදුකරමින් පැවැතුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 3,850 ක ඇස්තමේන්තුගත අදායමක් අපේක්ෂා කර තිබුණත්, ඉන් රු.මිලියන 1,681.41 ක් හෙවත් සියයට 43.67 ක් පමණක් රැස්කර තිබුණි. ලෙබනන් සහ සුඩාන් රාජ්‍යන්හි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදු කළ මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන 219.79 ක්ද, මධ්‍යම අප්‍රිකාව සහ දකුණු සුඩානයෙ හි ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ මෙහෙයුම් කටුයුතු වෙනුවෙන් රු.මිලියන 2,184.56 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 2,404.35 ක ආදායම් හිඟහිටව පැවැතුණි. ඉන් මධ්‍යම අප්‍රිකාවේ මෙහෙයුම් රජකාරී වෙනුවෙන් ලැබිය යුතු රු.මිලියන 280.07 ක ආදායම හිඟහිට වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී තිබුණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මාලි රාජ්‍යයෙහි 2017 දෙසැම්බර් 24 දින සිට එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී සිදුකරමින් තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එම රාජකාරී වෙනුවෙන් එ.ජ.ඩොලර් 6,604,752 ක් හෙවත් රු.මිලියන 1,197.96 ක ආදායම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල හා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍යයෙහි ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා 2016 මැයි 11 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 300 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් සියයට 29.6 ක් හෙවත් රු.මිලියන 88.79 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 880.73 ක් වැය කර උපකරණ මිලදී ලෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම උපකරණ කඳවුරක ගබඩා කර තිබුණි. 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ අණදෙන නිළධාරීන් විසින් රාජකාරී සඳහා වාර්තා කරන නිලධාරීන් සඳහා පුහුණු සැසි පවත්වා තිබුණු අතර එකසත් ජාතීනගේ සාමසාධක රාජකාරී කටයුතු 2020 අගෝස්තු මාසය වන විටත් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

## බලපත්‍ර අදායම් රැස්කිරීම

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් බලපත්‍ර ගාස්තු ආදායම් වශයෙන් රු.මිලියන 22.77 ක් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 1.13 ක ආදායම් හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 304 ක ආදායම් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි.

2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී/04/08/01/59 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් අය කරණු ලබන ගාස්තු කාලානුරූපීව සංශෝධනය කළ යුතුව තිබුණද, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත අනුව වූ තුවක්කු

බලපත්‍ර ශාස්තු දීර්ඝ කාලයක සිට සංශෝධනය කර නොතිබුණි.

## නිකුත් කළ ගිනි අවි බලපත්‍ර අළුත්කිරීම

ජීවිත හා දේපලවල ආරක්ෂාව සඳහා සහ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා දිස්ත්‍රික්ක 21 ක පුද්ගලයන් වෙත පිස්තෝල හා රිවෝල්වර 1,351 ක් වෙනුවෙන් ගිනි අවි බලපත්‍ර නිකුත් කර තිබුණි. විගණන පරීක්ෂණ දිනය වූ 2019 පෙබරවාරි 28 දින වන විට දිස්ත්‍රික්ක 14 ක ගිනි අවි 111 ක් වෙනුවෙන් නිකුත් කර තිබුණු බලපත්‍ර 2019 වර්ෂය සඳහා බලපත්‍ර අළුත් කර ගෙන නොතිබුණි.

තවද, අමාත්‍යාංශය විසින් තුවක්කු ආඥා පනතට අනුව, කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා නිකුත් කළ ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා තිබුණි. දිස්ත්‍රික්ක 04 ක ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 81 ක බලපත්‍ර අළුත් කිරීම සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේදී බෝර 12 සහ 16 ගිනි අවි 9,421 කින් ගිනි අවි 2,288 ක් 2019 පෙබරවාරි මාසය වන විටත් බලපත්‍ර අළුත් කරගෙන නොතිබුණි. ඉන් දිස්ත්‍රික්ක දෙකක වර්ෂ 05 කට වැඩි කාලයක් ගිනි අවි 188 ක් සඳහා බලපත්‍ර අළුත් කරගෙන නොතිබුණි.

නිකුත් කර තිබුණු ගිනි අවි බලපත්‍ර සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක සහ 2018 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම නිලධාරී වසම්වල සමීක්ෂණයන් සිදු කර තිබුණි. එම සමීක්ෂණ වාර්තා අනුව ගිනි අවි බලපත්‍ර ලාභියා මියගිය, බලපත්‍රලාභීන් මියගියද දරුවන්ද පදිංචිය හැර ගිය, අවිය සොයාගත නොහැකිවීම්, පැවැරීම විධිමත්ව තහවුරු නොවූ, සොරකම් කළ බව සඳහන්, ගිනි අවිය විකුණා ඇති වසම තුළ ගෘහ අංකය/ලිපිනය නොමැති අවිය අස්ථාන ගතවීම, ලිපිනය අයත් නොවීම, විදේශගත වීම, තොරතුරු සොයාගත නොහැකි ආදී හේතූන් අනාවරණය වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද නිවැරදි කර නොතිබුණි.

## හිඟහිටි ණය ශේෂ

2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සේවයේ නිරතව සිට ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් සහ වෙනත් නිලධාරීන් 150 දෙනකුගෙන් එකතුව රු.මිලියන 8.87 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. එම ණය ශේෂයෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් මුළුල්ලේ රු.මිලියන 3.23 ක ණය ශේෂයක් හිඟහිටව පැවැතුණි.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් විගණනයට ඉදිරිපත් කළ සේවක ණය කාල විශ්ලේශනය අනුව රු.මිලියන 22 ක් (නාවික හමුදාවේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් හැර) වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟහිටව පැවතුණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මිය ගිය නිලධාරීන්ගෙන්,විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් සහ සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.මිලියන 62.06 ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු නමුත් එම ණය ශේෂ අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

## උපාය මාර්ගික ආරක්ෂක සංනිවේදන ජාල ව්‍යාපෘතිය

ජාතික ආරක්ෂාව සඳහා එල්ලවන වර්තමාන තර්ජනයන්ට මුහුණ දීම උදෙසා ආරක්ෂක සේවාවන් අතර පොදු සන්නිවේදනය යාන්ත්‍රණයක් ඇති කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලිස් සේවාවන්හි ඉදිරි වර්ෂ 10 ක

සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක් මුළුල්ලේ විහිදුනු සන්නිවේදන අවශ්‍යතා සැපයීමට සැලැසුම් කර තිබුණි. ඒ සඳහා කථන, දත්ත, රූප සහ දත්ත මූල ආධාරක ජාලයක් සඳහා රු.මිලියන 1,192 කට නව සන්නිවේදන කුලුණු 11 ක් ඉදිකිරීමට හා පවත්නා කුලුණු 10 ක් මගින් දිවයිනේ ස්ථාන 21 ක් හරහා මයික්‍රෝ තරංග ගුවන් විදුලි මාර්ග 37 කින් සමන්විත ප්‍රතියෝජක පද්ධතියක් ස්ථාපිත කිරීමට 2013 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

2016 වර්ෂයේදී නිම කිරීමට සැලැසුම් කර තිබුණු එම ව්‍යාපෘතිය 2019 වර්ෂය වන විට වර්ෂ තුනක අතිරේක කාලය ලබාගෙන තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකිව ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පැවතුණි. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන 04 ක විධිවිධානවලට අනුකූලව ව්‍යාපෘති ස්ථාන තෝරාගැනීම්, මූලික අනුමැතීන් ලබාගැනීමේදී සන්නිවේදන කුලුණු 11 හි ප්‍රසම්පාදන කටයුතු සහ කුලුණු ඉදිකිරීම් කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයකන් සිදු වී තිබුණි. ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධතිය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සඳහා වර්ෂ 05 ක කාලයක් තුළ අවස්ථා තුනකදී ලංසු කැඳවා ඇගයීම් කර අවලංගු කර තිබුණු අතර කුළුණු සඳහා මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් 2017 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.

## අනුමැතිය ඉක්මවා ගෙවීම් කිරීම

යුධ සමයේ ත්‍රස්තවාදීන් සතුව තිබුණු වාහන ආරක්ෂක හමුදාවන් විසින් අත්පත් කර ගෙන පසුව එම වාහන, උපයෝජනය කිරීමේදී ඇතිවී තිබුණු විවිධ ගැටළු හේතුවෙන් එකී වාහන විධිමත් පරිදි ත්‍රිවිධ හමුදාවට අත්පත් කර ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර තිබුණි. එම සමීක්ෂණ කටයුතුවල නිරතවූ නිලධාරීන් සඳහා ඒක් සාමාජිකයකුට රු.50,000 බැගින් ගෙවීම් කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් අනුමැතිය ලබාදී තිබුණි. අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී එම අනුමත සීමාව ඉක්මවා රු.මිලියන 3.08 ක් ගෙවා තිබුණි.

## ගස් කැපීම සඳහා භාවිතා වන යාන්ත්‍රික කියත් ලියාපදිංචි කිරීම

පරිසර සංරක්ෂණය සහ රටේ වන ගහනය ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වූ ජාතික වැඩසටහනට සමගාමීව ජංගම යාන්ත්‍රික කියත් උපයෝගි කර ගනිමින් අනවසර ගස් කැපීම නිසා වන විනාශය වැලැක්වීමේ අරමුණු කරගෙන අමාත්‍යාංශය විසින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරණය සඳහා රු.මිලියන 3.29 ක් හා ලිපිලේඛන මුද්‍රණය සඳහා රු.මිලියන 1.45 ක් වශයෙන් එකතුව රු.මිලියන 4.74 ක් අමාත්‍යාංශය විසින් වියදම් කර තිබුණි. දිවයිනේ පොලිස් කොට්ඨාශ 42 ක් යටතේ ඇති පොලිස් ස්ථාන 484 ක යාන්ත්‍රික කියත් 82,614 ක් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි කර තිබුණද 2019 මැයි 31 දිනෙන් පසු එම ජාතික වැඩ සටහන ස්ථිර වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

## නිවාඩු නිකේතන හා උත්සව ශාලා ආදායම්

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික විධාන 06 ක නිවාඩු නිකේතන 08 ක් හා උත්සව ශාලා 06 ක් පවත්වා ගෙන යනු ලබන අතර, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා නාවික නිලධාරීන් සහ සෙසු නිලයන් අනුයුක්ත කර තිබුණි. එම නාවික නිලධාරීන්ගේ සහ සෙසු නිලයන්ගේ වැටුප් හා දීමනා ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබුණු අතර එමගින් රැස්කරන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

අදාළ නිවාඩු නිකේතන හා උත්සව ශාලා සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එම කටයුතු සම්බන්ධයෙන් සිදු කර තිබුණු අභ්‍යන්තර විගණනවලට අදාළ වාර්තාවල පිටපතද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

එමෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික විධාන 07 ආවරණය වන පරිදි නාවික කඳවුරු 17 ක අක්කර 122 කට අධික භූමි ප්‍රමාණයක භෝග වගා කර තිබුණි. භෝග වගාව සඳහා ඒකාබද්ධ අරමුදලින් වැටුප් ලබන නාවිකයින් 111 ක් දායක වී තිබුණු අතර, භෝග වගාවෙන් ලැබුණු රු.මිලියන 8.8 ක ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර නාවික හමුදා කෘෂිකර්ම අරමුදලට බැර කර තිබුණි.

## ගෙවීම් වවුචර් පිළියෙල නොකිරීම

මුදල් රෙගුලාසි 225(1) ප්‍රකාරව සියළුම ගෙවීම් සඳහා වවුචර් නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පිළියෙල කර ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ගෙවීම් වවුචර් පිළියෙල නොකර එකතුව රු.මිලියන 305.5 ක ගෙවීම් කර තිබුණි.

## ත්‍රිකුණාමලය නෞකා තටාකාංගණ ජැටිය ඉදිකිරීම

ත්‍රිකුණාමලය නෞකා තටාකාංගණ ජැටිය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියන 1000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 136.8 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 13.68 ක් වැනි අවම මට්ටමක පැවැතුණි.

## අභ්‍යන්තර අරමුදල් පවත්වා ගැනීම

2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදාපතිගේ අංක 5 දරන ගුවන් හමුදා නියෝගය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් 97 ක් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් කරනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 (අ) ව්‍යවස්ථාව අනුව කිසියම් ලිඛිත නීතියක් යටතේ දක්වා නොමැති, ජනරජයට ලැබෙන සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් , එම අරමුදල් මගින් උත්පාදනය කරන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## හෙලිටුවර්ස් සමාගම රාජ්‍ය සමාගමක් බවට පත් කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගී කර ගනිමින් පෞද්ගලික සමාගමක් වශයෙන් හෙලිටුවර්ස් සමාගම පවත්වා ගෙන යනු ලබයි. 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 10ක කාලයක් තුළ රු.මිලියන 57.4 ක ලාභයක් සමාගම විසින් උපයාගෙන තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ලබා දුන් උපදෙස් හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ අනුව එම පෞද්ගලික සමාගම රාජ්‍ය සමාගමක් බවට පරිවර්තනය කර එහි කොටස් අයිතිය මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීමට කටයුතු කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ සිදු කර නොතිබුණි.

## ගුවන් යානා කුලී ආදායම

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රැස්කරනු ලබන ගුවන් යානා කුලී ආදායම්වලින් රු.මිලියන 13.17 ක ආදායම් හිඟහිට පැවතුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 10.82 ක ආදායම් වර්ෂ 4 ක සිට වර්ෂ 15 ක් දක්වා කාලයක සිට පැවත එන ශේෂයයන් විය. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## රණවිරු සුභසාධනය

ආබාධිත රණවිරුවන් සඳහා රෝද පුටු 354 ක්, අත්වාරු 583 ක්, කෘතිම පාද 472 ක් හා උපැස් යුගල් 165 ක් ඉල්ලුම් කර තිබුණි. නමුත් රණවිරු සේවා අධිකාරිය විසින් රෝද පුටු 25 ක්, අත්වාරු 29 ක්, කෘතිම පාද 9 ක් ලබා දී තිබුණු අතර, උපැස් යුගල් කිසිවක් ලබා දී නොතිබුණි. මේ අනුව රණවිරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමේ පරමාර්ථයට ඉටු කිරීමට අධිකාරිය අපොහොසත්
වී තිබුණි. එසේම මේ සඳහා 2019 ජූලි 11 දින අපි වෙනුවෙන් අපි අරමුදලින් රු.මිලියන 10 ක් මේ වෙනුවෙන් ලබා දී තිබුණත්, අධිකාරිය විසින් සහාය උපකරණ මිලදී ගැනීමට එය උපයෝජනය කර නොතිබුණි.

## පිරිවැඩියා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

පිරිවැඩියා මධ්‍යස්ථානයක් ස්ථාපිත පිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා රු.මිලියන 297.85 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදු නොකිරීම නිසා සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වර තිබුණි.

## පාඩු හා අලාභහානි

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිද්ධි 172 කට අදාළ රු.මිලියන 143,368.75 ක පාඩු හා අලාභහානි පැවතුණි. මෙම පාඩු හා අලාභහානි වර්ෂ 1 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු අතර එම පාඩු හා අලාභහානි අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැර දැමීමට හෝ අපොහොසත් වී තිබුණි.

## ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්විද්‍යාලය ශික්ෂණ රෝහල

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයින්ට ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා ශික්ෂණ රෝහල 2017 මැයි මාසයේදී නිල වශයෙන් විවෘත කර රෝහල් මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. මෙම රෝහල සලදහා ඒ.ජ.ඩොලර් මිලියන 177.329 ක විදේශීය මුදල්ද හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් රු.මිලියන 3,165.12 ක්ද යොදවා මෙම ශික්ෂණ රෝහල ඉදිරි කර තිබුණි. විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල තුළ ස්ථාපිත දන්ත ඒකකය, විධායක පරීක්ෂණ ඒකකය, වකුගඩු ඒකකය, 5 වන මහලේ වෛද්‍ය වාට්ටු, 7 වන මහලේ ඇස, කන, විකලාංග ඒකකය සහ 8 වන මහලේ හෘද සැත්කම් ඒකකවල මෙහෙයුම් කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට කාර්යය මණ්ඩල හිඟය සහ අනෙකුත් අඩුපාඩු නිසා සමස්ත ධාරිතාවයෙන් සියයට 30ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## අපරාධ විසඳීම

රට තුළ නීතිය හා සාමය ආරක්ෂාවීමේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට

තුළ අපරාධ වාර්තාවීම් වල නිරපේක්ෂ ප්‍රමාණය සහ වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී තිබුණු පැමිණිලිවලින් විසඳනු ලැබූ පැමිණිලි ප්‍රමාණයේ ප්‍රතිශතය පිළිබඳ තොරතුරු වගුව 15 හි දැක්වේ.

| | අපරාධ වර්ගය | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ ප්‍රමාණය | විසඳනු ලැබූ ප්‍රමාණය | විසඳූ ප්‍රතිශතය | වාර්තා වූ ප්‍රමාණය | විසඳනු ලැබූ ප්‍රමාණය | විසඳූ ප්‍රතිශතය |
| 01 | බල අපරාධ | 36,355 | 28,246 | 77.69 | 34,578 | 25,612 | 74.07 |
| | ළමයින්ට එරෙහි බල අපරාධ | 3,344 | 1,572 | 47.01 | 3,065 | 1,742 | 56.84 |
| | කාන්තාවන්ට එරෙහි බල අපරාධ | 775 | 326 | 42.06 | 638 | 248 | 38.87 |
| 02 | සුළු අපරාධ<br>සුළු වැරදි - පුද්ගලයන්ට එරෙහි | 41,888 | 27,831 | 66.44 | 39,463 | 25,405 | 64.38 |
| | සුළු වැරදි - දේපළවලට එරෙහි | 31,415 | 14,143 | 45.02 | 29,490 | 12,760 | 43.27 |
| 03 | විවිධ පැමිණිලි | 971,617 | 971,617 | 100.00 | 959,015 | 893,373 | 93.16 |
| 04 | සුරා සම්බන්ධ වැරදි | 129,813 | 104,048 | 80.15 | 112,414 | 103,741 | 92.28 |
| 05 | නිද්‍රා ජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි | 124,940 | 120,052 | 96.09 | 129,765 | 124,166 | 95.69 |
| 06 | දූෂණ වැරදි | 954 | 868 | 90.99 | 1,274 | 1,182 | 92.78 |
| 07 | ව්‍යවස්ථාපිත වැරදි | 40,607 | 38,102 | 93.83 | 36,629 | 34,530 | 94.27 |

වගුව 15 - ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී තිබුණු පැමිණිලිවලින් විසඳනු ලැබූ පැමිණිලි ප්‍රමාණයේ ප්‍රතිශතය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසියේ පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශයේ තොරතුරු වාර්තාව

වගුව 15 හි සඳහන් අපරාධ වර්ග 07 කින් අපරාධ වර්ග 04 ක් සම්බන්ධයෙන් විසඳුම් ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි.

## රථවාහන අනතුරු වැළැක්වීම

ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සලසන පරිදි ගමනා ගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම ශ්‍රී ලංකා පොලීසියේ කාර්යයකි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු රිය අනතුරු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී 5,323 කින් අඩු වී මාරක අනතුරු සංඛ්‍යාව සියයට10 කින් හා බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව සියයට 9 කින් අඩු වී තිබුණි. 2017-2019 කාල පරිච්ඡේදය තුළ රටේ සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව වගුව 16 හි දැක්වේ.

| අනතුරු වර්ගය | අනතුරු ප්‍රමාණය දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| මාරක අනතුරු | 2,962 | 2,953 | 2,645 |
| බරපතල අනතුරු | 8,666 | 8,475 | 7,718 |
| සුළු තුවාල අනතුරු | 13,102 | 12,264 | 10,679 |
| අලාභ අනතුරු | 12,866 | 12,064 | 9,391 |
| එකතුව | 37,596 | 35,756 | 30,433 |

වගුව 16 - රටේ සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසියේ පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශයේ තොරතුරු වාර්තාව

## නිද්‍රාජනක ද්‍රව්‍ය පාලනය

අන්තරාකාරී ඖෂධ භාවිතය හා සංසරණය වැළැක්වීම ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයකි. ඒ අනුව නිද්‍රා ජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තා වීම 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී 4,825 කින් වැඩි වී තිබුණු අතර හෙරොයින් අත්අඩංගුවට ගත් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 1,380 කින් හා හෙරොයින් සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් පුද්ගලයන් 8,672 කින් වර්ධනය වී තිබුණි. විස්තර වගුව 17 හි දැක්වේ.

| වර්ගය | 2018 වර්ෂය | | | | | | 2019 වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාර්තා වූ ප්‍රමාණය | නඩු පවරනු ලැබූ ප්‍රමාණය | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | අත් අඩංගුවට ගත් ප්‍රමාණය | | | වාර්තා වූ ප්‍රමාණය | නඩු පවරනු ලැබූ ප්‍රමාණය | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | අත් අඩංගුවට ගත් ප්‍රමාණය | | |
| | | | | කි.ග්‍රෑම | ග්‍රෑම | මි.ග්‍රෑම | | | | කි.ග්‍රෑම | ග්‍රෑම | මි.ග්‍රෑම |
| ගංජා | 71,505 | 69,886 | 63,603 | 8,884 | 457 | 162 | 63,585 | 62,024 | 56,231 | 15,389 | 235 | 934 |
| අබිං | 3 | 1 | 1 | - | 8 | 380 | 169 | 141 | 147 | 9 | 583 | 198 |
| හෂීස් | 199 | 189 | 161 | 82 | 291 | 597 | 603 | 597 | 536 | 10 | 164 | 637 |
| හෙරොයින් | 47,355 | 44,346 | 36,356 | 721 | 363 | 175 | 56,482 | 52,553 | 44,983 | 2,101 | 691 | 246 |
| මොෆින් | 254 | 187 | 165 | - | 194 | 784 | 18 | 18 | 18 | - | 1 | 950 |
| කොකේන් | 74 | 62 | 45 | 9 | 859 | 780 | 133 | 122 | 119 | 24 | 725 | 653 |
| වෙනත් | 5,550 | 5,381 | 4,770 | 556 | 389 | 26 | 8,775 | 8,711 | 7,907 | 480 | 845 | 576 |
| එකතුව | 124,940 | 120,052 | 105,101 | 10,254 | 563 | 904 | 129,765 | 124,166 | 109,941 | 18,016 | 246 | 194 |

වගුව 17 - නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි පිළිබඳ තොරතුරු

මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලීසියේ පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශයේ තොරතුරු වාර්තාව

## ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.

2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීම, 2017 මැයි මාසයේදී වාර්තාව භාරදී තිබූ "පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම" ක්‍රියාත්මක කිරීම, 2015 වර්ෂයේ සිට හඳුනාගෙන තිබූ ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම හා 2014 වර්ෂයේ සිට සැලැසුම් කරමින් පවතින ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමය ස්ථාපිත කිරීම යන ප්‍රධාන කාර්යයන් 2019 වර්ෂය අවසාන වනවිටත් ඉටු කර නොතිබුණි.

# අධිකරණ හා බන්ධනාගාර කටයුතු

පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම හා අර්ථවත් ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා අධිකරණ මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු මඟින් දායකත්වයක් ලබා දීමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, සිවිල් අභියාචනාධිකරණ, මහාධිකරණ, විශේෂ මහාධිකරණ, දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් අධිකරණ හා ළමා මහේස්ත්‍රාත් අධිකරණ වල ගොනු කරනු ලැබ තිබූ නඩු සඳහා අවසන් තීන්දු හා නිගමන ලබා දීමට කටයුතු කර තිබුණි.

අධිකරණ මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පාලනය වන බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රාරම්භක යුගයේදී සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දුන්නද වර්තමානයේ ඉන් ඔබ්බට යමින් සිරකරුවන් මනා පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරවන සමාජ ශෝධනාගාරයක් බවට පත්ව ඇත. මේ අනුව දිවයින පුරා විසිරී ආරක්ෂිත බන්ධනාගාර 03 ක්, රිමාන්ඩ් බන්ධනාගාර 19 ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02 ක්, වැඩ කඳවුරු 09 ක්, විවෘත වැඩ කඳවුරු 02 ක්, සිර මැදිරි 20 ක් හා බන්ධනාගාර පාසල් 01 ක් බන්ධනාගාර අධිකාරීවරුන් යටතේ පාලනය වේ.

මෙම අංශ සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. බිලියන 59.38 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද, එම වර්ෂ 03 සඳහා එකතුව රු. බිලියන 53.95 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම වර්ෂ 03 තුළ පාර්ලිමේන්තුව සලසා දී තිබූ ප්‍රතිපාදනවලින් රු. බිලියන 5.43 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 21 හි දැක්වේ.




රූපසටහන 21 - ඇස්තමේන්තුගත ආදායම හා වියදම
මූලාශ්‍රය - භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

### අලාභහානි සම්බන්ධයෙන් කටයුතු නොකිරීම

අධිකරණ, මානව සම්පත් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සතු කැබ් රථයක් 2017 මාර්තු 08 දින අනතුරකට පත් වී එදින සිට බාහිර ස්ථානයක රඳවා තබා වර්ෂ 2 කට වැඩි කාලයකට පසුව අමාත්‍යාංශ පරිශ්‍රයට රැගෙන විත් තිබුණි. එම වාහන අනතුර සම්බන්ධයෙන් 2017 ජූනි 07 දින පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණු අතර, කමිටුව විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව 2019 දෙසැම්බර් මාසය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### අනාර්ථික ගනුදෙනු

- අමාත්‍යාංශය යටතේ වූ ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය 2013 වර්ෂයේ සිට කුලී පදනමක් මත ලබාගත් ස්ථානයක ස්ථාපිත කර තිබුණි. 2019 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලය වෙනුවෙන් රු.මිලියන 18.82 ක කුලී වශයෙන් ගෙවා තිබුණි. මෙම මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් මාසයේ සිට ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර තිබුණත්, සමාගමට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය පිළිබඳව තීරනයක් ගෙන නොතිබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයක්ද පත් කර නොතිබීම නිසා සමාගම අක්‍රීය වී තිබුණි. මේ අනුව 2013 වර්ෂයේ සිට වර්ෂ 06 ක කාලයක් ගත වී තිබුණත්, මෙම මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක පිහිටුවීමට අධිකරණ අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණු අතර පිහිටුවන ලද සමාගමද අක්‍රීය වීම නිසා 2019 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 18.82 ක කුලිය අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි. 2019 ජුලි මාසයේ සිට මෙම මධ්‍යස්ථානය අධිකරණ අමාත්‍යාංශය යටතේ වන කාර්ය භාරයෙන් ඉවත් කර තිබුණි.

- අමාත්‍යාංශය විසින් රු.මිලියන 1.28 ක් වැය කර ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද 2010 වර්ෂයේ සිට 2016 වර්ෂයේ I වෙළුම දක්වා නීති වාර්තා පිටපත් 66,171 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව අමාත්‍යාංශයේ රඳවාගෙන තිබුණු බැවින් ඒ සඳහා වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

- වර්ෂ 03 ක වගකීම් කාලයක් සහිතව 2016 වර්ෂයේදී රු.මිලියන 1.35 කට මිලදී ගෙන තිබුණු වයිරස් ආවරණ සහිත පරිගණක 14 ක්, මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු අනෙකුත් උපාංග 2017 මාර්තු 23 දින මීගමුව බන්ධනාගාරයට ලැබී තිබුණි. 2020 මැයි 31 දින වන විට වර්ෂ 03 ක වගකීම කාලය ඉක්මවා තිබුණත්, එදින වන විටත් එම පරිගණක හා උපාංග අපේක්ෂිත කාර්යයට උපයෝගී කර ගෙන නොතිබුණි.

### නඩු තීන්දු සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම

අමාත්‍යාංශය විසින් අධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දු සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා 2004 අගෝස්තු 01 දින සිට පරිවර්තන ඒකකයක් ආරම්භ කර තිබුණත්, 2020 අගෝස්තු මාසය වන විටත් එම පරිවර්තන ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ වනවිට 2004 වර්ෂයේ I වෙළුම සිට 2011 වර්ෂයේ I වෙළුම දක්වා නීති වාර්තා සිංහල භාෂාවට පරිවර්තනය හා සංස්කරණය කිරීමට රු.මිලියන 4.06 ක් වියදම් කර තිබුණත්, ඒවායේ මුද්‍රණ කටයුතු අවසන් කර නොතිබුණි. 2004 වර්ෂයේ I වෙළුමෙහි කොටස් 03 ක් දෙවන සෝදුපත් කියවීම සඳහා පිටපතක් ලබා ගැනීමට රජයේ මුද්‍රණාලයට භාරදී තිබුණත් ඒවා ආපසු ලැබී නොතිබුණි.

## රජයේ මුදල් අවභාවිතා කිරීමට අවකාශ සැලැසීම

විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත නොකිරීම නිසා 2019 සැප්තැම්බර් 04 දින නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට ලැබී තිබුණු රු.223,916 ක් 2020 ජනවාරි 20 දින වන විටත් බැංකුවේ තැන්පත් නොකර අතරඳවා ගැනීමෙන් සහ 2018 හා 2019 වර්ෂවල දී පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ දඩ මුදල්, ඇප මුදල් හා වාරික අයකිරීම්වලින් රු.1,190,071 ක් ව්‍යාජ ලේඛන භාවිතා කරමින් අවභාවිතා කිරීමට අවකාශ සැලැසී තිබුණි.

## වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති

නාවලපිටිය මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් මාසයේදී රු.මිලියන 5.47 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණත්, 2020 මැයි 31 දින වන විටත් එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි. මේ අනුව මාස 06 කට අධික කාලයක් බාහිර පාර්ශ්‍වයකට රජයේ මුදල් අයථා පරිහරණය කිරීමට අවස්ථාව ලැබී තිබුණි.

## ව්‍යාපෘති අතර මඟ අතහැර දැමීම

2010 වර්ෂයේදී බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට ලබාදී තිබුණු පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එම වර්ෂයේදී බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා දී තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් එම කොන්තාත්තුව අතර මඟ නවතා තිබුණි. ඒ වන විට ගෙවා තිබුණු අත්තිකාරම්වලින් රු.254,691 ක් හා කාර්කසාධන ඇපකරයෙන් රු.339,595 ක් වශයෙන් එකතුව රු.594,286 ක් අය කරගත යුතුව තිබුණත්, 2020 පෙබරවාරි 06 දින වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.

## හිඟහිටි ආදායම්

නීතිපති දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන සහ විශ්වවිද්‍යාල වැනි රාජ්‍ය ආයතන සඳහා ගාස්තු අය කිරීමේ පදනම මත නෛතික සේවාවන් සහ නීති උපදෙස් ලබා දී තිබුණි. එම සේවාව වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 269.69 ක ආදායම් හිඟහිටව පැවතුණි. එම හිඟහිටි ආදායමෙන් සියයට 65 ක් පමණ රු.මිලියන 173.94 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි.

## හිඟහිටි අත්තිකාරම් ණය

අමාත්‍යාංශය විසින් රජයේ නිලධාරින් සඳහා ලබා දී තිබුණු ණය අත්තිකාරම්වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 23.06 ක අත්තිකාරම් ණය හිඟහිටව පැවතුණි. එම හිඟහිටි ණය ශේෂයෙන් සියයට 35 ක් පමණ රු.මිලියන 7.96 ක ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

## නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය

2014 මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් 2014 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර එය 2017 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතුව තිබුණි. එම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් 2018 ජනවාරි 01 දින සිට තවත් වර්ෂ 06 ක කාලයක් දක්වා දීර්ඝ කරන ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් වර්ෂ 03 ක් දක්වා පමණක් කාල දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය නිම කළ යුතුව තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින

දක්වා කාලය තුළ රු. මිලියන 11.68 ක් පමණක් වැය කර තිබුණි. එම කාල පරිච්ඡේදයට අදාළව රු.මිලියන 185 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් සියයට 6.3 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

## නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු නොපිරවීම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එම කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන කාර්ය මණ්ඩලයේ ( ජ්‍යෙෂ්ඨ මට්ටම හා තෘතීයික මට්ටම ) 2019 දෙසැම්බර් 31 දින වන විට අනුමත තනතුරු සංඛ්‍යාව 70 ක් වී තිබුණි. එදින වන විට එම තනතුරුවලින් 33 ක පුරප්පාඩු පැවැතුණි. ඉකුත් වර්ෂය අවසානයට එම පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් වී තිබුණි. ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 08 කින් 07 ක්ම පුරප්පාඩුව පැවැතුණි. සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ වර්ෂ 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් උසස් වීම මඟින් ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සම්පූර්ණ කරන නමුත් 2020 මැයි 31 දින වන විට එම සේවා කාලය සම්පූර්ණ කර තිබුණු නිලධාරීන් සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ නොමැති වීම නිසා ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර තවදුරටත් පුරප්පාඩු වී පැවතුණි. එසේම සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියද සංශෝධනය කර නොමැති වීම නිසා එම තනතුරේ පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනිමට නොහැකි වී තිබුණි.

## බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීමේ

බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීමේ කාර්යය ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 07 ක කාලයක් ගත වී තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 101කට ආසන්න වියදමක් කර තිබුණි .බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේ දී වැලිකඩ බන්ධනාගාරය ජාලගත කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත භාර දී ඒ සඳහා රු.957,978 ක් වැය කර තිබුණි. බන්ධනාගාර ආයතන 12ක් ජාලගත කිරීම සඳහා 2018 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව භාරදී රු.මිලියන 30.51 ක් ගෙවා තිබුණි. තවත් ආයතන 16 ක් ඉදිරියේ දී ජාලගත කිරීමට නියමිතව පැවතුණි .කෙසේ වුවද , සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම තොරතුරු පද්ධතිය සමස්ථ බන්ධනාගාර පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

## බන්ධනාගාරයන් තුළ පවතින අධික තදබදය

බන්ධනාගාරයේ ඉඩ පහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා තබාගත යුතුව තිබුණි. මීගමුව හා කළුතර බන්ධනාගාරයන් තුළ පවතින අධික තදබදය හේතුවෙන් එසේ වර්ග කර රැඳවීමට නොහැකිව තිබුණි. සිදු කළ නියැදි පරීක්ෂාව අනුව මීගමුව බන්ධනාගාරයේ වාට්ටු 16 ක වර්ග අඩි 18,853 ක් තුළ ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාව 350 දෙනෙක් වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,695 දෙනෙකුගේ සිට 1,843 දෙනෙකු දක්වා

පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. කළුතර බන්ධනාගාරයේ වාට්ටු 22 ක වර්ග අඩි 17,126 ක් තුළ බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව රැඳවියහැකි රැඳවියන් සංඛ්‍යාව 317 දෙනෙකු වී තිබුණත්, 2019 වර්ෂයේ අවස්ථා 06 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,159 දෙනෙකුගේ සිට 1,415 දෙනෙකු දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### සේවය ස්ථිර කළ බවට විධිමත් පත්වීම් ලිපි නිකුත් නොකිරීම

බන්ධනාගාර ආයතන 30 කින් බන්ධනාගාර ආයතන 17 ක සමස්ථ නිලධාරීන් 437 දෙනෙකුගෙන් නිලධාරීන් 251 දෙනෙකු විසින් 1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ තනතුරු ස්ථිර කිරීමට අදාළ සුදුසුකම් සපුරා තිබුණි. 2020 මැයි 31 දින වන විට එම නිලධාරීන් සේවයේ ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. බන්ධනාගාර ආයතන 05 ක 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ පත්වීම් ලද නිලධාරීන් 53 දෙනෙකු ස්ථිර කිරීමට අදාළව කටයුතු කළ යුතුව තිබුණත්, එම නිලධාරීන්ගේ ලිපිගොනු යාවත්කාලීන කර නොතිබීම නිසා පත්වීම් ස්ථිර කිරීමට නොහැකි වී තිබුණි. බන්ධනාගාර ආයතන 11 ක 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ පත්වීම් ලද නිලධාරීන් 34 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර නොතිබීම හා සේවය ස්ථිර කිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ලබා නොදීම නිසා ඔවුන්ගේ තනතුර ස්ථිර කිරිමට නොහැකි වී තිබුණි. බන්ධනාගාර ආයතන 11 ක 2005 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් 37 දෙනෙකුගේ ලිපිගොනු යාවත්කාලීන කර නොතිබීම නිසා එම නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරිම සඳහා පත්වීම් බලධරයා වෙත යොමු කිරීමට නොහැකි වී තිබුණි.

### රජයේ රස පරීක්ෂක වාර්තා ඉදිරිපත් කිරීම

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන අංශ දෙකෙන් ලබා දෙන විශේෂඥ සාක්ෂි අධිකරණයේ නඩු විසඳීම වේගවත් කිරීම ඉතා වැදගත් වේ. 2019 වර්ෂයේදී එවැනි විශේෂඥ වාර්තා 40,745 ක් අධිකරණ වෙත නිකුත් කිරීමට හැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වාර්තා 14,171 ක් අධිකරණ වෙත වාර්තා කිරීමට නොහැකි වී තිබුණි.

### පවුල් ඒකකවල බිඳ වැටීම වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය සැලසුම් සකස් කිරීම

දිළිඳුකම හේතුවෙන් නීතියේ පිලිසරණ ලබා ගැනීමට නොහැකි ජනතාවට යුක්තිය කරා ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවට අයත් දිවයින පුරා පිහිටි නීති ආධාර මධ්‍යස්ථාන 83 ක් වෙත 171,858 දෙනෙකු පැමිණ තිබුණි. ඒ අයවලුන්ට අදාළව අධිකරණ ඉදිරියේ විභාග කරන ලද නඩු 45,963 ක් සඳහා නීතිඥ සේවය නොමිලේ ලබා දීමට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව කටයුතු කර තිබුණි. එම නඩු වලින් සියයට 72 ක් හෙවත් නඩු 32,980 ක් දික්කසාද සහ නඩත්තු ඉල්ලා පැවරා තිබුණු නඩු කටයුත් වී තිබුණත්, පවුල් ඒකකවල බිඳ වැටීම වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය සැලැසුම් සකස් කිරීමට කොමිෂන් සභාව දායක වී නොතිබුණි.

# මූර්ථ ආර්ථිකය

## අංශ

කෘෂිකර්මය

පශු සම්පත්

වැවිලි කර්මාන්ත

ධීවර හා ජලජ සම්පත්

කර්මාන්ත

ඉඩම් කටයුතු

## නිරීක්ෂණ

- කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා බඳු පදනම මත ලබාගත් ගොඩනැඟිල්ල
- ආනයනය කළ පොහොරවල ගුණාත්මකභාවය
- කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
- රක්ෂණ වගකීම් වටිනාකම වැඩියෙන් තක්සේරු කර ප්‍රතිරක්ෂණයට එළඹීම.
- වගා හානි තක්සේරු කිරීම සඳහා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය
- ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
- හිඟහිටි විශ්‍රාම වැටුප් නොගෙවීම
- තොරතුරු යාවත්කාලීන නොකිරීම
- දීර්ඝ කාලීන ණයගැති ශේෂය
- සැලැසුම් කළ ව්‍යාපෘති ආරම්භ නොකිරීම
- ගෙවිලියන්ගේ වී නිෂ්පාදනය
- කාෂිකාර්මික යාන්ත්‍රීකරණ හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය

- කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිළිබඳ පර්යේෂණ
- දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරිම හා වාර්ෂික ප්‍රකාශන පල නොකිරීම
- කිරි ගවයින් ආනයනය කිරිම
- කිරි නිෂ්පාදකයින් සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- උපයෝජනය නොවන ඉඩම්
- උපයෝජනය නොවන ගව ආහාර නිපදවීමේ යන්ත්‍ර
- සත්ව ආහාර නිෂ්පාදනය කිරිම
- යන්ත්‍රවල ධාරිතාවයට සරිලන කිරි නිෂ්පාදනයක් නොවීම
- කිරි ඵලදාව අඩුවීම
- කිරි ගව ආහාර වියදම වැඩිවීම
- වාර්ෂික කල් බදු කුලිය ආදායම
- ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය අඩුවීම
- ගෝලීය තේ වෙළෙඳපොළ කොටස පහළ යාම
- තේ නැවත වගා කිරිම
- තේ ඉඩම්වල භාවිතය සඳහා මුල්ලු මිලදී ගැනීම
- අවම නිෂ්පාදන මට්ටම පවත්වා නොගැනීම
- නිෂ්පාදන ධාරිතාවට වඩා අඩු ක්‍රියාකාරීත්වය
- බැංකු අයිරා ශේෂය වර්ධනයවීම
- සමස්ථ රබර් නිෂ්පාදනය අඛන්ඩව අඩුවීම
- අමු රබර් අපනයන ආදායම අඩුවීම
- රබර් නැවත ඉලක්කගත වගා කිරිම
- කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ
- වාර්ෂික ඵලදාව අඩුවීම
- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය
- පොල් හිඟයක් පැවැතීම වැව්ලි සවිය ශ්‍රමික බලකා ව්‍යාපෘතිය
- වැවිලි සවිය ශ්‍රමික බලකා ව්‍යාපෘතිය
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය
- බීජ පොල් නිෂ්පාදනය වැඩි කිරිම
- පොල් මයිටාගෙන් සිදුවන හානිය
- සීනි කර්මාන්තය රට තුළ නිසි පරිදි ස්ථාපිත නොවීම
- උක් වගාවේ සුදු පත්‍ර රෝගය මර්ධනය කිරිම
- උක් සැපයුම අඩුවීම
- නිෂ්කාර්ය වත්කම්
- සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය

- සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
- විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීම
- සේවක අර්ථසාධක අරමුදලේ දායක නොගෙවීම
- ඉඩම්වල අයිතිය පවරා නොගැනීම
- ධීවර ප්‍රජාව බලගැන්වීම
- වෙරළ පුනරුත්ථාපනය සහ සම්පත් කළමනාකරණය කිරීමේ වැඩසටහන
- මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ගම්මාන වැඩිදියුණු කිරීම
- වැවක් සහිත ගමක් වැඩසටහන
- කලපු 10 ක් පවිත්‍ර කිරීම
- මිනින්දෝරු සැලැසුම් හා කලපුවල භෞතික සීමා සලකුණු කිරීම
- කලපුවලට මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම හා මොදා කූඩු සෑදීමට ද්‍රව්‍ය සැපයීම
- කෘතිම ඇම දැල්ලන් නිෂ්පාදනය
- උතුරු පළාත් තිරසර සංවර්ධන ව්‍යාපෘතිය
- ධීවර වරායන් සහ නැංගුරම්පළවල් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය
- මහල් 3 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම
- ඉරණමඩු අභිජනනාගාරය සඳහා ක්‍රමවත් ජල සැපයුමක් ලබා ගැනීම
- වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම
- මත්ස්‍ය පොකුණු වල ආරක්ෂාව
- පොකුණු 04 ක් සහ ගඩොල් ටැංකි 04 ක් ඉදිකිරීම
- ජල සැපයුම් පද්ධතියක් සපයා සවි කිරීම
- උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානය
- තිලාපියා සඳහා මත්ස්‍ය ආහාර ඒකකයක් පිහිටුවීම
- යන්ත්‍ර මිලදී ගැනීම
- මත්ස්‍ය අපතය භාවිතයෙන් ඇමිනෝ අම්ලය (Peptides) නිස්සාරණය කිරීම සහ වර්ගීකරණය කිරීම
- අධිශීතකරණ සහිත බහුදින ධීවර යාත්‍රාවල මසුන්ගේ ගුණත්වය පරීක්ෂා කිරීම
- තනතුරු සඳහා බඳවා ගැනීම්
- කර්මාන්තපුර
- දෙමහල් ගොඩනැගිල්ල ඵලදායි කාර්යයට භාවිතා නොකිරිම
- අරමුදල් ඵලදායි කාර්යයක නොයෙදීම
- මහන මැෂින් නිෂ්කාර්යව පැවැතීම
- හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරිම
- ශිල්පීන් වෙත යන්ත්‍ර හා උපකරණ බෙදාදීම
- ආයෝජනය වෙනුවෙන් ප්‍රතිලාභ නොලැබීම

- හුණුගල් නිධිය බදුදීමේ ගිවිසුම
- සංස්ථාවට අයත් ඉඩමක් බැංකුවට උකස් තැබීම

- බිම් සවිය වැඩසටහන
- පනත් සංශෝධනය කිරිම
- ඉඩම් අත්පත් කිරීම
- රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය
- ඉඩම් බදු ආදායම් කළමනාකරණය කිරීම
- ඉලක්ක කරා ලඟා නොවීම
- ඉඩම් බදුදීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම
- ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම
- අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම
- මැනුම් අවශ්‍යතාවය ඉටු කිරිමට අපොහොසත්වීම
- මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි

## කෘෂිකර්මය



රට තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරිම උදෙසා ආහාර නිෂ්පාදනය වැඩි කිරිම මෙම අංශයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග සහ ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත ආයතන 11 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- දේශීය ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරිම.
- කුඹුරු ඉඩම් සම්බන්ධ සියළු කටයුතු ඉටු කිරිම.
- ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම හා සමාජ ආරක්ෂණ කටයුතු.
- කාබනික පොහොර නිෂ්පාදනය හා වස විසෙන් තොර ගොවිතැන ප්‍රචලිත කිරිම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 181,266.57 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 162,922.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 10.12 ක් හෙවත් රු.මිලියන 18,343.58 ක ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 22 හි දැක්වේ.




රූපසටහන 22 - පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

### කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා බදු පදනම මත ලබාගත් ගොඩනැඟිල්ල

පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපිත කර ඇති "ගොවිජන මන්දිරය" යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රාජගිරියේ මහල් 09 කින් යුතු පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැඟිල්ලක් 2016 අප්‍රේල් 08 දින සිට

මාසයකට රු.මිලියන 21 ක බදු කුලියක් හා රු.මිලියන 6 ක සේවා ගාස්තු ගෙවීමේ පදනම මත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 සහ 3.2.2 මාර්ගෝපදේශවල සඳහන් විධිවිධාන අනුගමනය නොකර ලබා ගෙන තිබුණි.

සමස්ථ කාර්ය මණ්ඩලය 300 ක් පමණ වූ කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිලි අවශ්‍යතාවය වර්ග අඩි 66,500 ක් වුවද, බදු පදනම මත ලබාගෙන තිබූ මහල් 09 කින් යුතු ගොඩනැඟිල්ලේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 103,000 ක් විය. තවද මුදල් රෙගුලාසි 835(2) (ඉ) ප්‍රකාර බදු කාලසීමාව උපරිමය වර්ෂ 03 ක් විය යුතු වුවද, බදුකරුගේ ඉල්ලීම මත එය අවුරුදු 05 ක් ලෙස දක්වා තිබීම හා වර්ෂ 03 කින් පසු බදු කුලිය සියයට 15 කින් වැඩි කිරීමට හා වර්ෂ 02 ක බදු කුලිය වූ රු.මිලියන 504 ක මුදල එකවර ගෙවීමේ කොන්දේසි පිළිගෙන තිබුණි.

එසේම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ, තක්සේරුවට අනුව ගොඩනැඟිල්ලේ වෙළඳපළ කුලිය මාසිකව රු.මිලියන 13.5 ක් වුවද, එය ඉක්මවා රු.මිලියන21 ක කුලියක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන1,229.58 ක බදු මුදල් (VAT හා NBT) ඇතුළුව, සේවා ගාස්තු රු.මිලියන 229.20 ක්, විදුලි බිල්පත් සඳහා රු.මිලියන 63.64 ක් සහ ජල බිල්පත් සඳහා රු.මිලියන 2.02 ක් ලෙස එකතුව රු.මිලියන1,524.44 ක් වැයකර තිබුණි. ඊට අමතරව මෙම ගොඩනැඟිල්ල කාර්යාල සංකීර්ණයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මිලියන 342.7 ක්ද වැය කර තිබුණි. මෙසේ ගෙවීම් කර තිබුණද ගිවිසුම් ගත දිනයේ සිට මුල් මාස 15 තුළ අවශ්‍ය කාර්යාලීය පහසුකම් (කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම ) නොමැති වීම මත ගොඩනැඟිල්ල කාර්යාලීය කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. එහෙත් කාරක සභා ක්‍රමය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා "ගොවිජන බැංකුව" පූර්ණ වශයෙන් යොදාගෙන නොමැති බැවින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2020 ජනවාරි 31 දින සිට නැවතත් අමාත්‍යාංශය පැරණි කාර්යාල සංකීර්ණය වූ "ගොවිජන මන්දිරය" වෙත රැගෙන ගොස් තිබුණද 2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා ගිවිසුම ප්‍රකාරව රු.මිලියන 28.05 ක මුදලක් බදු කුලී හා සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. එමෙන්ම 2021 අප්‍රේල් 01 දින දක්වාම ගිවිසුම ප්‍රකාරව බදු කුලී හා සේවා ගාස්තු ගෙවීමට අමාත්‍යාංශය බැඳී පවතී.

### ආනයනය කළ පොහොරවල ගුණාත්මකභාවය

ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ජාතික පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගුණාත්මක පොහොර ආනයනය කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් වී සඳහා පොහොර අවශ්‍යතාවය තීරණය කිරීමේදී ඉකුත් කන්නයේ ඉතිරි පොහොර තොග, යාවත්කාලීන පොහොර නිර්දේශ සැලැකිල්ලට නොගැනීම හා යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමක් සිදුකර නොමැති වීම,
- තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව රසායනික පොහොර ආනයනය කිරීම සඳහා සමාගම් තෝරාගෙන තිබීම,
- ආනයනික රසායනික පොහොරවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම සඳහා නියැදි ලබාගැනීම වරාය තුළදී සිදු කළ යුතු වුවද, පොහොර ආනයනය කරනු

ලබන සමාගම් සතු විවෘත ගබඩාවලින් නියැදි ලබා ගෙන තිබීම,

- ආනයනික රසායනික පොහොර පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර තෝරා ගැනීම, රසායනාගාර වෙත සාම්පල් යැවීම, රසායනාගාර වාර්තා භාරගැනීම, පරීක්ෂා කිරීම හා වෙළඳ අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳව පොහොර ලේකම් කාර්යාලයේ විධිමත් හා ප්‍රමාණවත් නියාමනයක් හා සුපරීක්ෂණයක් සිදු කර නොතිබීම.
- ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් 2018 හා 2019 වර්ෂයේ ආනයනික රසායනික පොහොරවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ලබාගනු ලබන නියැදිවලට අදාළ රසායනාගාර වාර්තාවලට අනුව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ව්‍යාජ ලෙස සකස් කරන ලද රසායනාගාර වාර්තා 55 කට ආසන්න ප්‍රමාණයක් පැවැති අතර ඒ අනුව පොහොර වර්ග 9 කට අදාළ මෙ.ටො.81,655 ක ගුණාත්මකභාවයෙන් අඩු ප්‍රමිතියෙන් තොර පොහොර වෙළෙඳපලට නිකුත්කර තිබීම.

## කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 83.97ක් වැය කර තිබුණි. මෙම වැඩසටහන කහත්තෙවෙල ගම්මානයේ ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මහජන මුදල් වැයකර රාජකාරී උත්සව පැවැත්වීම සීමා කළයුතු බවත්, වියදම අවම වන සේ එම උත්සව සංවිධානය කළ යුතු බවටත් උපදෙස් දී තිබුණත්, මෙම වැඩසටහන හඳුන්වාදීමේ උත්සවය වෙනුවෙන් රු.මිලියන 1.49 ක් වැය කර තිබුණි.
- ගොවි සංවිධාන කිහිපයක එකමුතුවකින් ඉතා සංවිධානාත්මක කෘෂි සමාගමක් බිහිකරගත හැකි වුවද, කහත්තෙවෙල ලිමිටඩ් නමින් අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීමකින් හා අධීක්ෂණයකින් තොරව මෙම වැඩසටහන මෙහෙයවීම සහා ජනතා සමාගමක් පිහිටුවා තිබුණි. එම සමාගම පිහිටුවීමේ අරමුණින් කිහිපදෙනෙකුගේ එකතුවෙන් 2018 වර්ෂයේදී ගොවි සංවිධානයක් පිහිටුවාගෙන තිබුණද, එම ගොවි සංවිධානය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.
- සමාගමේ කාර්යාලීය ලී බඩු සහ යන්ත්‍රෝපකරණ සඳහා රු.මිලියන 1.41 ක් හා ගොවීන් සඳහා රු.මිලියන 45.91 ක් වැයකර ආරක්ෂිත ගෘහ ලබා දී තිබුණි. එම ආරක්ෂිත ගෘහවල වටිනාකමින් සියයට 50 ක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
- එමෙන්ම රු.770,000 ක වටිනා විද්‍යුත් පරිපථ 35 ක් ජනතා සමාගම වෙත ලබාදී තිබූ අතර එක් විද්‍යුත් පරිපථයක් වෙනුවෙන් මසකට රු.1,000 කට ගොවීන්ට කුලී පදනම මත ලබාදී ආදායමක් ලබාගත යුතුව තිබුණු අතර එම ආදායමද රැස්කර නොතිබුණි. යන්ත්‍ර සූත්‍ර ගබඩා කිරීමට හා එළවළු සහ පළතුරු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහිතව ආදර්ශ ගොවිපලක් ලෙස වැඩි දියුණු කළ සංඝරාජ පිරිවෙන් පරිශ්‍රය මාසයකට රු.1,000 ක් වැනි අඩු කුලියකට ජනතා ගොවි සමාගම වෙත

බදු පදනම මත ලබාදීමට කටයුතු කර තිබුණි.

- එසේම රු.මිලියන 10 කට ආසන්න වටිනාකමක් ඇති ආරක්ෂිත ගෘහ, පළතුරු පැල, කෘෂි උපකරණ හා මී මැසි පාලනය සහ උපකරණ ඉහත ජනතා ගොවි සමාගමේ කොටස්කරුවන් වෙත නොමිලේ කිසිදු පදනමකින් තොරව ලබාදී තිබුණි.

## රක්ෂණ වගකීම් වටිනාකම වැඩියෙන් තක්සේරු කර ප්‍රතිරක්ෂණයට එළඹීම.

2018 යල හා 2018/2019 මහ කන්නයන්හි සිදුවිය හැකි හානි වෙනුවෙන් වන්දි ගෙවීමට ක්‍රියාත්මක වූ නොමිලේ රක්ෂණය හේතුවෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, මැලේසියානු ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹීමේදී, වගකීම වැඩියෙන් තක්සේරු කර තිබුණි. එම කන්නයන්හි ප්‍රතිරක්ෂණ වගකීම ඉක්මවා හානි වාර්තා නොවූ අතර එවැනි අවස්ථාවකදී, කෘෂිරක්ෂණ මණ්ඩලයට ප්‍රතිලාභ හිමිකර ගැනීමට අදාළ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු බැවින් කිසිදු ප්‍රතිලාභයක් ලබාගැනීමට මණ්ඩලයට නොහැකිවීමෙන් විදේශ ආයතනයකට ගෙවන ලද රු.මිලියන 473 ක ප්‍රතිරක්ෂණ වාරික මුදල නිෂ්කාර්ය වී තිබුණි.

## වගා හානි තක්සේරු කිරීම සඳහා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය ආයතනය සමග එක්ව 2016 මැයි 05 දින සිට 2019 මැයි මාසය අතර කාලය තුළ දිස්ත්‍රික්ක 6 ක දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාවට නැංවීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. 2018/2019 මහ කන්නයේදී වවුනියාව, අනුරාධපුරය, කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල පර්යේෂණ මට්ටමින් එය ක්‍රියාත්මක කර තිබුණි. හානි තක්සේරුව සඳහා නවීන ක්‍රම හඳුන්වාදීමට දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මෙම ක්‍රමය යටතේ වන්දි ගණනය කර තිබුණි.

## ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ගොවීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ගොඩනැංවීම, ශ්‍රී ලංකාව සඳහා ගොවිබිම් හඳුනා ගැනීම හා ඒවා පරිගණක ගත කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති දත්ත පාදම යොදාගැනීමට අපේක්ෂා කළද, මණ්ඩලය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එම දත්ත පද්ධතිය ඍජුවම අදාළ කර ගැනීමට නොහැකි වී තිබුණි. කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින්ගෙන් ඇතිවූ විරෝධතා හා මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 26 ක ඉඩම් කැබලි 80,006කින් ඉඩම් කැබැලි 10,825 ක් පමණක් සිතියම් ගත කර තිබුණි. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 10 ක ඉඩම් කැබලි 27,139 කින් ඉඩම් කැබැලි 9,995 ක පමණක් සිතියම් ගත කර අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මාස 07 ක පමණ කාලයක් තුළදී පමණක් ක්‍රියාත්මක කර අතරමග ව්‍යාපෘතිය නතර කළ හොත්

වැය කර තිබුණු රු.මිලියන 9.61 ක වියදම නිෂ්කාර්ය විය හැකිව තිබුණි.

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

මහළු වයසේ දී හෝ දුබලතාවයක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණ සැලසීම, ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම, ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන්උනන්දු කර වීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම පිණිස ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසාන වන දිනට යෝජනා ක්‍රමයේ ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදලෙහි සෘණ ශේෂය රු.මිලියන 3,288.94 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයට වඩා සියයට 11.58 කින් වැඩි වී තිබුණි. මේ හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි එය අහිතකර ලෙස බලපා තිබුණි. තවද ඉදිරි වර්ෂයන් තුළදී මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය විය හැකි බැවින් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ආයතනය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## හිඟහිටි විශ්‍රාම වැටුප් නොගෙවීම

වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බව සඳහන් වුවද, ඊට පටහැනිව ආයතනය විසින් විශ්‍රාම වැටුප් සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබුණි. 2017 අප්‍රේල් මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා ගොවීන් 27,049 දෙනෙකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් එකතුව රු.මිලියන 584.36 ක් පැවතිණි. එසේම මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2012 – 2013 කාලපරිච්ඡේදයට අදාළව ගොවීන් 90,573 දෙනෙකුට හිමි විශ්‍රාම වැටුප් රු.මිලියන 3,033.33 ක්ද ගෙවා නොතිබුණි.

## තොරතුරු යාවත්කාලින නොකිරීම

2012 වර්ෂය අවසන් වන විට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ සක්‍රීය දායකයින් සංඛ්‍යාව 959,254 දෙනෙක් වූ අතර, 2012 වර්ෂයෙන් පසු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ, බෙලහීන වූ , මියගිය සංඛ්‍යාව හා වාරික නොගෙවීම මත ඉවත් වීම් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සක්‍රීය සාමාජික සංඛ්‍යාව, වාර්ෂිකව එකතු වන දායකය හා ගෙවිය යුතු නිවැරදි විශ්‍රාම වැටුප් වටිනාකම කොපමණද යන්න ගණනය කිරීමට නොහැකිව පැවතුණි.

## දීර්ඝ කාලීන ණයගැති ශේෂය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 26.03 ක්වූ ණයගැති ශේෂ අයකර ගැනීමකින් තොරව වර්ෂ 03 ක සිට වර්ෂ 18 ක් දක්වා වූ කාල පරාසයක් හිඟහිටව පැවැතුණි.

## සැලැසුම් කළ ව්‍යාපෘති ආරම්භ නොකිරීම

ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා සහ සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා අරමුදල ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 755.00 ක් ස්ථාවර තැන්පතුවලද රු.මිලියන 93.51ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර පොළී ආදායම ලෙස රු.මිලියන 131.78 ක් උපයා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 826.40 ක පිරිවැය ඇස්තමේන්තු කළ

ව්‍යාපෘති 78 ක් ආරම්භ කිරීමට කටයුතු කර තිබුණි. ඉන් පිරිවැය රු.මිලියන 197.40 ක් වූ ව්‍යාපෘති 32 ක් පමණක් ආරම්භ කර ඒ සඳහා සංවර්ධන වියදම් වශයෙන් රු.මිලියන 40.30 ක් පමණක් වැය කර තිබුණි.

### ගෙවිලියන්ගේ වී නිෂ්පාදනය

පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3000 ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වර්ෂයේදී වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතිකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගම ස්ථාපිත කර තිබුණි. පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු.මිලියන 5.9 ක පොළී රහිත ණයක්, වර්ෂයක කාල සීමාවකින් ගෙවීමේ පදනම මත එම සමාගම වෙත නිදහස් කර තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මාසය වන විට ගෙවිලියන්ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP (Good Agriculture Practice) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළද, 2020 ජූනි මාසය වන විටත් එකදු ගෙවිලියක් හෝ අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි. අරමුදල ලබා දුන් ණය මුදලද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

### කාෂිකාර්මික යාන්ත්‍රීකරණ හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය

විදේශ පශ්චාත් උපාධි සඳහා යොමුකිරීමේ වැඩසටහන යටතේ පුහුණුව ලබන පර්යේෂකයින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතු බව කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් දක්වා තිබුණි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කළ යුතු යැයි හඳුනාගෙන ඇති කාෂිකාර්මික යාන්ත්‍රීකරණ හා කාබනික කාෂිකාර්මික ක්ෂේත්‍රය පශ්චාත් උපාධිය සඳහා තෝරාගෙන තිබූ නිලධාරීන් සංඛ්‍යාව ඉතා පහල මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සැලසුම් සහගත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිළිබඳ පර්යේෂණ

කෘෂිකාර්මික පරයේෂණ ප්‍රතිපත්ති සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂෙත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණි. නමුත් කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය, වර්තමානයේ වෙළඳපළේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ 2017 වර්ෂයේ සිටම සිදුකර නොතිබුණි.

### දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හා වාර්ෂික ප්‍රකාශන පල නොකිරීම

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව, පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම, පර්යේෂක (Research officer ), විද්‍යාඥ( Scientist) හා අනෙකුත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු සහ ආයතන සතු භෞතික සම්පත් පිළිබඳවත් තොරතුරු සමාලෝචිත වර්ෂය දක්වා රැස්කර තිබුණද, 2016 වර්ෂයෙන් පසු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම (Information for Agricultural Research

**Managers) හා 2010 වර්ෂයෙන් පසු එම තොරතුරු ඇතුළත් වාර්ෂිකව නිකුත් කළ යුතු ප්‍රකාශන නිකුත් කර නොතිබුණි.**

## පශු සම්පත්

පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයිමට සහ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම යන කාර්යභාරය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තුවකින් හා ව්‍යවස්ථාපිත ආයතන 03 ක් මගින් ඉටු කළ යුතුව තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 22,257.32 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 16,387.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් එම කාලපරිච්ඡේදය වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 26.37 ක් හෙවත් රු.මිලියන 5,870.31 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 23 හි දැක්වේ.




රූපසටහන 23 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ ස්ථාපිත කර ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### කිරි ගවයින් ආනයනය කිරිම

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමිය සංවර්ධන අමාත්‍යාංශය විසින් කිරි ගවයින් 20,000 ක් ආනයනයට සංශෝධිත ගිවිසුම අනුව ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමටත්, එහිදී එකගවී ඇති ඇණවුම් කාලසටහන අනුව ඉන් පලමු අදියර යටතේ සතුන් 5,000 ක් ආනයනය මාස 7ක් තුළ නිම කිරීමටත්, ඒ අනුව පළමු සතුන් සාර්ථක නම්, දෙවන අදියර යටතේ අත්තිකාරම් ලබාදී මාස 12 ක් තුළ සතුන් 15,000 ක් ආනයනය කිරීමට එකඟවී තිබුණි. නමුත් 2017 මැයි 16 දින අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපිය මගින් ඒ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණි. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ලබා දෙන ප්‍රතිපාදන අනුව 2018 වර්ෂයේදී සතුන් 2,500ක්ද 2019 වර්ෂයේදී සතුන් 7,500ක් ද හා 2020 වර්ෂයේදී සතුන් 5,000

ක් ද වශයෙන් ආනයනය කිරිමට සැලැසුම් කර තිබුණි.

විගණනය විසින්, ගොවිපොළ මඟින් ලබාගත් වාර්තා අනුව හා ප්‍රසිද්ධ ජනමාධ්‍ය විසින් පෙර ගෙනා සතුන් අසාර්ථක බව පෙන්වා දී තිබුණද, ඒ පිළිබඳව අවධානය යොමු නොකර 2018 වර්ෂය තුළ ඒ සඳහා පාර්ලිමේන්තු ප්‍රතිපාදන නොතිබියදී ඉතිරි සතුන් 15,000 ක් ආනයනය කිරීම සඳහා වූ එ.ජ.ඩොලර් 55,465,541 ක මුදලින් සියයට 20 ක අත්තිකාරම් වශයෙන් 2018 මැයි 08 දින එ.ජ.ඩොලර් 11,093,108 ක් හෙවත් රු.මිලියන 1,749.67 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ කිසිදු කිරි ගවයෙකු 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු 31 දින වන විටත් ආනයනය කර නොතිබුණි.

මෙම සතුන් ආනයනය කිරිම සඳහා එළඹ තිබුණු ගිවිසුම අවලංගු කිරීම සඳහා නීතිපතිගෙන් උපදෙස් විමසා තිබුණු අතර අත්තිකාරම් ගෙවා තිබීම හේතුවෙන් එම ගිවිසුම අවලංගු කළ නොහැකි බව 2019 මැයි 03 දින නීතිපති විසින් දන්වා තිබුණි. අත්තිකාරම් ගෙවීම විදේශීය බැංකුවකින් ලබා ගත් ණය මුදලකින් ගෙවා තිබුණු බැවින් ඒ සඳහා වන පොලිය සහ විදේශ විනිමය අවප්‍රමාණය වීමේ අලාභයද ශ්‍රී ලංකා රජයට දැරිමට සිදු වී තිබුණි. එම ව්‍යාපෘතියේ අසාර්ථකභාවය පැහැදිලිව තිබියදී අත්තිකාරම් ගෙවීම නිසා රජයේ මුදල් වෙනත් පාර්ශවයක් විසින් අවභාවිතාවීමක් සිදු වී තිබුණි.

### කිරි නිෂ්පාදකයින් සමුපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

කිරි නිෂ්පාදන ගොවීන්ට තරගකාරී වෙළෙඳපොලක් ලබාදීම තුළින් ගොවීන්ගේ ආදායම් ඉහළ නගා සිටුවීම හා කිරි එකතු කිරීම, ශිත කිරීම, කිරි ප්‍රවාහනය ආදීය පිළිබඳ ගොවීන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රංශ රජය යටතේ සියයට 0.0016 ක වාර්ෂික පොලිය යටතේ අවුරුදු 10 කට පසු ආරම්භ කර අවුරුදු 34 ක් ඇතුළත නැවත ගෙවීමට යටත්ව යුරෝ මිලියන 11.4 සහන ණය ආධාර යටතේ හා රු. මිලියන 15 ක රජයේ ප්‍රතිපාදන හා රු.මිලියන 50 ක ප්‍රතිලාභීන්ගේ දායකත්වය මත කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති 12 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාවලිය 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණි. 2018 සැප්තැම්බර් 28 දින ගිවිසුම්වලට එළඹීමේදී ඉහත සඳහන් පොලී අනුපාතය යටතේම යුරෝ මිලියන 13.9 ක ප්‍රංශ සහන ණය ආධාර ලබා දීමට එකගවී තිබුණි. 2018 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රතිලාභීන් විසින් ලබාදෙන ණය මුදලින් සියයට 50 ක් එකඟ වූ කාලය තුළ නැවත ලබා ගැනීමටත්, අදාල ආනයන උපකරණ සඳහා බදු සහන ලබාදීමටත් අනුමැතිය දී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර එනම්, 2017 වර්ෂයේදී පිළිවෙලින් විදේශ ණය යටතේ රු.මිලියන 400 ක් හා දේශීයව රු. මිලියන 40 ක් ද, 2018 වර්ෂයේදී විදේශ ණය යටතේ රු.මිලියන 900 ක් හා දේශීයව රු.මිලියන 300 ක්ද වශයෙන් ප්‍රතිපාදන සළසා තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් සියයට 99 ක්ම ඉතිරි කර තිබුණි. 2019 වර්ෂය සඳහා ද ඉහත ව්‍යාපෘතියට විදේශ ණය යටතේ වූ රු.මිලියන 2,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර දේශීය ප්‍රතිපාදන යටතේ රු මිලියන 65 කින් සියයට 99% ක ද ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## උපයෝජනය නොවන ඉඩම්

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සි/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම හා සි/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම යන සමාගම් තුනට හෙක්ටයාර් 12,617.43 ක භූමියක් අයත් අතර 2019 මැයි මාසය අවසන් වන විට පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හෙක්ටයාර් 2,266.05 ක්ද , මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ හෙක්ටයාර් 9.7 ක්ද , ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ හෙක්ටයාර් 35.6 ක් ද වශයෙන් එකතුව හෙක්ටයාර් 2,311.35 භූමිය උපයෝජනය නොකර නිෂ්ක්‍රීයව පැවැතුණි.

## උපයෝජනය නොවන ගව ආහාර නිපදවීමේ යන්ත්‍ර

එක් වරකදී දිනකට ගව ආහාර ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක පැවැතුණි. ඒ අනුව මාසයකට එක් යන්ත්‍රයකින් ගව ආහාර මෙට්‍රික් ටොන් 900 (3.75*දින 30* පැය 8) ක් නිෂ්පාදනය වන අතර වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ හැකිව තිබුණි. එවැනි නිෂ්පාදන ධාරිතාවක් පැවැති යන්ත්‍ර වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ ගොවිපළ 22 ක ගවයින් 10,088 ක් සිටින අතර එම ගවයින් සඳහා 2018 වර්ෂයේදී මාසයකට ගව ආහාර මෙට්‍රික් ටොන් 1,198.75 ක් අවශ්‍ය වේ. ඒ අනුව වාර්ෂික මෙට්‍රික් ටොන් 14,385 ක අවශ්‍යතාවයක් වෙනුවෙන් රු. මිලියන 876.72 ක් පුද්ගලික ආයතන 3 කට වැය කර තිබුණි. ගොවිපළ 04 ක ගිණුම් අනුව ආනයනික ගවයින් සඳහා එම ගොවිපලවල සත්ව ආහාර වියදම කිරි ආදායමින් සියයට 69 ක් වී තිබුණි.

## සත්ව ආහාර නිෂ්පාදනය කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොල 3 ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 05 ක් පැවැතුණි. ඊට අමතරව මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍රයක්ද, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 2ක්ද පැවැතුණි. එම යන්ත්‍රවලින් කුකුළු ආහාර මාසයකට මෙට්‍රික් ටොන් 2,580 (10.75*දින 30* පැය8) ක් වශයෙන් වර්ෂයකට මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පැවැතුණි. නමුත් 2019 වර්ෂයේ අවසානය වන විට එම යන්ත්‍ර 8 මගින් නිෂ්පාදනයන් සිදු නොකර වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් නිෂ්කාර්යව පැවැතුණි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපල 12 කට මෙට්‍රික් ටොන් 2,319 ක් ද, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන ( පුද්ගලික) සමාගමට මෙට්‍රික් ටොන් 559.6 ක් ද, මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමට මෙට්‍රික් ටොන් 1,674.7ක් ද, වශයෙන් වර්ෂයකට මෙට්‍රික් ටොන් 4,553.3 ක් කුකුළු ආහාර අවශ්‍යතාවයක් පැවැතුණි. මෙම කුකුළු ආහාර සැපයීම වෙනුවෙන් මණ්ඩලය හා සමාගම් දෙකට එකතුව රු.මිලියන 248.77 ක් පුද්ගලික ආයතන 3කට ගෙවා තිබුණි. මෙම වියදම එක් එක් ආයතනවල දළ ආදායමින් පිළිවෙලින් සියයට 39 ක්, සියයට 64 ක් හා සියයට 54 ක් විය.

මෙම ගොවිපලවල් විශාල ලෙස අලාභ ලබන බැවින් මෙම අලාභය අවම කර ගැනීමට ඉහත යන්ත්‍ර උපයෝගී කර ගෙන, උපයෝජනය නොකරන භූමිය භාවිතා කර සත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය වගා කළ හැකි මූලික අමුද්‍රව්‍ය නිෂ්පාදනය කර හා සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ

නිලධාරීන්ගේ දැනුම හා පරීක්ෂණ උපයෝගී කරගෙන තත්ත්වයෙන් උසස් සත්ව ආහාර නිෂ්පාදනයෙන් සත්ව ආහාර වියදම අවම කර ගැනීමෙන් ගොවිපල ලාභදායිත්වය ඉහළ නංවා මෙම ආයතන ලාභදායිව පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## යන්ත්‍රවල ධාරිතාවයට සරිලන කිරි නිෂ්පාදනයක් නොවීම

2017 දෙසැම්බර් 31 දිනට මිල්කෝ (පුද්ගලික) සමාගමේ කර්මාන්තශාලා නවීකරණය පිණිස රු.මිලියන 5,854.66 ක් වැය කර කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය නිම කර තිබුණි. ඊට අමතරව බඩල්ගම කිරි සැකසුම් පිරියත ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 9,932.71 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ගිවිසුම්වලට එළඹී 2017 දෙසැම්බර් 31 දින වන විට ඒ වෙනුවෙන් රු.මිලියන 8,083.22 ක් වැය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි. සමාගමේ කළමණාකරණ හා කාර්යසාධන වාර්තා අනුව නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර තිබුණු කිරි පිටි නිෂ්පාදනය කරන අඹේවෙල කර්මාන්තශාලාවේ 2018 හා 2019 වර්ෂවලදී යන්ත්‍ර ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 26 ක් හා සියයට 25 පමණක් භාවිතා කිරිමට ප්‍රමාණවත් කිරි ලැබී තිබුණි. වර්තමානයේ බඩල්ගම කර්මාන්තශාලාවේ සිදු කරන ඉදිකිරීම් නිම වීමෙන් පසුව යන්ත්‍රවල ධාරිතාවය වැඩිවීමෙන් දිනකට සමාගමට කිරි ලීටර් 600,000 ක් අවශ්‍ය වන බවට වාර්තා කර තිබුණි. නමුත් වාර්තමානයේ ආයතනයට එකතු කළ හැකි දෛනික කිරි ලීටර් ප්‍රමාණය 200,000 ක් පමණ වී තිබුණි. ඒ අනුව ප්‍රමාණවත් පරිදි කිරි සැපයුමක් නොමැති වීම නිසා කිරි සැපයුම වැඩි කර ගැනීම පිණිස අවධානය යොමු නොකිරිම නිසා මෙම යන්ත්‍රවල සම්පූර්ණ ධාරිතාවය භාවිතා කිරිමට නොහැකි වී තිබුණි.

## කිරි එලදාව අඩුවීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් 2012/2013 වර්ෂයේදී රු.මිලියන 1,655 ක් විදේශ ණය වැයකර කිරි ගවයින් 2,000 ක් හා 2015 වර්ෂයේදී රු.මිලියන 2,807 ක් විදේශ ණය වැයකර කිරි ගවයින් 2,495 ක් ආනයනය කර තිබුණි. එම කිරි ගවයින් රඳවා සිටි ගොවිපොළ 04 ක් ඇතුළුව ගොවිපල 20 ක සිටින සියළුම කිරි ගවයින්ගෙන් 2016 වර්ෂයේදි කිරි ලීටර මිලියන 24.75 ක් ද, 2017 වර්ෂයේ දි කිරි ලීටර මිලියන 20.10 ක් හා 2018 වර්ෂයේ දී කිරි ලීටර මිලියන 20.03 ක් වශයෙන් කිරි නිෂ්පාදනයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වාර්ෂිකව කිරි නිෂ්පාදනය අඩුවන පරිදි සැලැසුම් සකස් කර තිබුණි. අපේක්ෂිත කිරි එලදාව අඩුවන පරිදි සැලසුම් කර තිබියදීත් එම කිරි එලදාවද ළඟාකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. ඒ අනුව 2016, 2017 හා 2018 වර්ෂවලදී සත්‍ය කිරි නිෂ්පාදනය පිළිවෙලින් කිරි ලීටර මිලියන 17.15 ක්ද, කිරි ලීටර් මිලියන 14.37 ක් හා කිරි ලීටර් මිලියන 14.00 ක් වී තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ කිරි නිෂ්පාදනය 2016 හා 2017 වර්ෂවල සත්‍ය නිෂ්පාදනය සමග සැසදීමේ දී සියයට 18 කින් හා සියයට 2.5 කින් තවදුරටත් අඩු වී තිබුණි.

## කිරි ගව ආහාර වියදම වැඩිවීම

ජාතික පශු සම්පත් මණ්ඩලයේ අපේක්ෂිත කිරි එලදාව අඩුවී තිබූ නමුත් මැණික්පාලම, බෝපත්තලාව, ඩයගම හා රිදියාගම ගොවිපොලවල් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී ගව ආහාර වියදම 2017 වර්ෂයේ දී රු.මිලියන 780.21 ක් හා 2018 වර්ෂයේ දී රු.මිලියන 735.99 ක් වි තිබුණි. කිරි ආදායමේ ප්‍රතිශතයක් ලෙස කිරි ගව වියදම පිළිවෙලින් සියයට 68 ක් හා සියයට 69 ක් වී තිබුණි. කිරි ව්‍යාපෘතියේ ඍජු වියදම් අඩුකිරීමෙන් පසු 2017 වර්ෂයේ දී රු.මිලියන 220.04 ක් හා 2018 වර්ෂයේ දී

රු.මිලියන **411.53**ක් වශයෙන් අලාභයන් වාර්තා වි තිබුණි.

# වැවිලි කර්මාන්තය

රටේ සීඝ්‍ර ආර්ථික සංවර්ධනය වෙනුවෙන් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් ප්‍රධාන වැවිලි බෝගයන්ගේ ඵලදායිතාවය, ලාභදායකත්වය හා තිරසාරභාවය වර්ධනය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂා ඉටු කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 22 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වැවිලි බෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව සඳහා අන්තර්ජාතික තරඟකාරිත්වය ඉහළ නැංවීම.
- වැවිලි බෝග මත පදනම් වූ එකතු කළ වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම.
- තේ අපනයනය සඳහා අවසරපත් නිකුත් කිරීම.
- තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය.
- බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 41,974.14 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 30,727.83 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 29.79 ක් හෙවත් රු.මිලියන 11,246.31 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 24 හි දැක්වේ.




රූපසටහන 24 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

## වාර්ෂික කල් බදු කුලිය ආදායම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 1992 වර්ෂයේදී වැවිලි සමාගම් 23 ක් වෙත ලබා දී තිබූ රජයට අයත් එකතුව අක්කර 617,486 ක් වූ වතුවලින්, අක්කර එකකින් ලැබෙන වාර්ෂික බදු කුලී ආදායම රු.456 ක සිට රු.3,067 ක් දක්වා පරාසයක අඩු වටිනාකමක් සහිත ආදායමක් වී තිබුණි. වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම සළකා බලා අය කරනු ලබන බදු කුලිය සංශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

1992 වර්ෂයේදී රජයට අයත් ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දීමේදී, බදු කුලිය ගණනය කිරීම සඳහා ශුද්ධ වත්කම් වටිනාකම රු.මිලියන 200 ඉක්මවා තිබිය යුතුය. ඒ අනුව එදිනට එම වටිනාකමට අඩු වූ වැවිලි සමාගම් 03 ක් වෙත ඉඩම් හෙක්ටයාර් 20,757 ක් බදු කුලී රහිතව ලබා දී වසර 27 ක කාලයක් ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට ඉන් සමාගම් දෙකක ශුද්ධ වත්කම් රු.මිලියන 200 ක් ඉක්මවා තිබුණු බැවින් එවැනි අවස්ථාවලදී ක්‍රියා කළයුතු ආකාරය සම්බන්ධ ප්‍රතිපාදන බදු ගිවිසුම්වල නොමැතිවීම නිසා බදු කුලී අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

## ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය අඩුවීම

ලෝකයේ අනභිබවනීය තේ නිෂ්පාදකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව ලෝක තේ වෙළඳපල තුළ ප්‍රමුඛ පෙළේ ස්ථානයක් හිමිකර ගෙන තිබුණි. වර්තමානය වන විට එම තත්ත්වය ක්‍රමිකව පහළ යමින් පැවතුණි. තේ කර්මාන්ත ශාලා පිහිටුවීම හා පවත්වා ගෙනයාම විධිමත් කිරීම මණ්ඩලයේ කාර්යභාර්ය වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මණ්ඩලයේ ලියාපදිංචි තේ කර්මාන්තශාලා ගණන 920 ක් වී තිබුණි. එම කර්මාන්තශාලා ගණනින් 190 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි. ඒ අනුව ලියාපදිංචි තේ කර්මාන්ත ශාලාවලට සාපේක්ෂව ක්‍රියාකාරී නොවන කර්මාන්තශාලා ගණන සියයට 21 ක් වී තිබුණි. ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව පහළ යමින් පැවැතුණි.

## ගෝලීය තේ වෙළෙඳපොළ කොටස පහළ යාම

ශ්‍රී ලංකාවේදි හා ඉන් පිටතදී තේ අලෙවි කිරීමට සහය වීම, ධෛර්යදීම සහ ලෝක වෙළඳපල තුළ තේ සඳහා වූ ඉල්ලීම හා තේ පර්යේෂණ වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යභාර්යක් වී තිබුණි. 2011 වර්ෂයේදි ශ්‍රී ලංකාවේ තේ සඳහා ගෝලීය තේ වෙළඳපළ කොටස සියයට 18 ක්ව පැවැතුණි. ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත අපනයනකරුවන්ගෙන් රැස්කරගන්නා බදු මුදලින් රු.බිලියන 8 ක් යොදවා පස් අවුරුදු උපායමාර්ග වැඩසටහන සැලැසුම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද, පස් අවුරුදු කාල සීමාව ඉක්මවා වර්ෂ දෙකක් අවසන් වී තිබුණත්, එම සැලැස්ම කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. මණ්ඩලය විසින් වාර්ෂිකව සිදුකරන ප්‍රවර්ධන වියදම් වැඩි කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගෝලීය තේ වෙළඳපළ තුළ ශ්‍රී ලංකාවේ කොටස සියයට 15 දක්වා අඩු වී ඇති බව ජාත්‍යන්තර තේ කමිටුවෙහි සංඛ්‍යානමය දත්ත අනුව අනාවරණය වේ. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා අපනයනය අඩුවීම රූපසටහන 25 හි දැක්වේ.




රූපසටහන 25 - ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා අපනයනය
මූලාශ්‍රය - ජාත්‍යන්තර තේ කමිටු වාර්තා

## තේ නැවත වගා කිරීම

උපරිම ඵලදාවක් ලබමින් තේ වගා බිම් ප්‍රමාණය ස්ථායීව පවත්වාගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තිමය වශයෙන් කුඩා තේ භූමි ප්‍රමාණයෙන් සියයට 2 ක භූමි ප්‍රමාණයක තේ නැවත වගා කළ යුතුය යන අරමුණ ඇතිව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අදියර පහක් යටතේ තේ නැවත වගා කිරීමේ සහනාධාරය වශයෙන් රු.මිලියන 1,744.67 ක් ගෙවා තිබුණි. තේ නැවත වගා සහනාධාරයෙන් පළමු අදියර තුන සඳහා පමණක් රු.මිලියන 918.11ක් ලබාගත් ගොවීන්, ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීමට හා තේ නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණි. පසුගිය වර්ෂ 5 ක කාලය තුළ දෙන ලද නැවත වගා සහනාධාර මුදලින් සියයට 50 ක් අපේක්ෂිත අරමුණු වෙත යොමු කිරීමට කුඩා වතු සංවර්ධන අධිකාරියට නොහැකි වී තිබුණි. එසේ වුවද, එම සහනාධාරලාභීන් නැවත තේ වගාවට යොමුකරවා ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි.

## තේ ඉඩම්වල භාවිතය සඳහා මුල්ලු මිලදී ගැනීම

තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව තේ ඉඩම්වල භාවිතය සඳහා උණුකළ ලෝහ අච්චුවක දමා තල සහ මිට එකට සාදාගත් මුල්ලුව වඩාත්ම යෝග්‍ය මුල්ලුව වී තිබුණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් මුල්ලු මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. ඒ සඳහා පිරිවිතරයක් සඳහන් කර නොතිබුණි. මේ නිසා යකඩ මිට සහ තලය ලෝහ පෑස්සීමෙන් නිපදවනු ලැබූ මුල්ලු 9,450 ක් රු.මිලියන 27.15 ක් වැය කර මිලදී ගෙන තිබුණි. ඒ අනුව ගොවියාට තේ කර්මාන්තය සඳහා භාවිතා කළ හැකි වඩාත්ම යෝග්‍ය මුල්ලුව මිලදී ගෙන නොතිබුණි.

## අවම නිෂ්පාදන මට්ටම පවත්වා නොගැනීම

තේ මණ්ඩලයේ නිර්ණායක අනුව යෙදවූ අමු තේ දළු කිලෝ ග්‍රෑම් 100 කින් අවම වශයෙන් නිමි තේ කිලෝ ග්‍රෑම් 21.5 ක නිෂ්පාදන මට්ටමක් පවත්වාගත යුතුව තිබුණි. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම සමාලෝචිත වර්ෂයේදී සමාගමට අයත් තේ කම්හල් 04

හි නිෂ්පාදනය එම ප්‍රශස්ත මට්ටමට ළඟා වී නොතිබුණි. එමනිසා අමු තේ දළු මත රු.මිලියන 24.10 ක් අනාර්ථික වියදමක් කර තිබුණි. ගුණාත්මක බවින් ඉහළ අමු තේ දළු නිෂ්පාදනය සඳහා යොදා නොගැනීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ගුණාත්මක බවින් ඉහළ අමු තේ දළු නිෂ්පාදනය සඳහා ලබාගැනීමට සුපිරි දළු සංකල්පය යටතේ රු.මිලියන 1.57 ක් වැයකර තිබුණද, අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

## නිෂ්පාදන ධාරිතාවට වඩා අඩු ක්‍රියාකාරීත්වය

සමාගමට අයත් තේ කර්මාන්තශාලා සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන ධාරිතාවයට වඩා පහල මට්ටමක ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වන අතර හිනිදුම හා මැණික්දිවෙල කර්මාන්තශාලා පිළිවෙලින් සියයට 71 හා සියයට 72 ක ඌණ උපයෝජන තත්ත්වයක පැවතුණි. එය තේ කිලෝවක් මත අන්තර්ගත ස්ථාවර පිරිවැය ඉහල යාමට හේතු වන බැවින් නිමි තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඉහල යාමට බලපා තිබුණි. හිනිදුම හා දැරංගල තේ කර්මාන්තශාලා නිෂ්පාදනය ඉහල නංවා ගැනීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ දී දළු සැපයුම්කරුවන්ට අමු දළු දිරිදීමනා ලෙස පිළිවෙලින් රු.1,531,453 ක් හා රු.1,543,417 ක් ගෙවා තිබුණද අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

## බැංකු අයිරා ශේෂය වර්ධනයවීම

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා 2015/16 වර්ෂයේදී ස්ථාවර තැන්පතු ඇප ලෙස තබා අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර එම වර්ෂය අවසානයේ රු.මිලියන 63.07 ක බැංකු අයිරාවක් පැවැතුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය රු.මිලියන 87.06 ක් දක්වා වර්ධනය වී තිබුණි. බැංකු අයිරාව වැඩිවීම නිසා 2019/20 වර්ෂයේදී අයිරාව සඳහා රු.මිලියන 13.51 ක් පොලී වශයෙන් ගෙවා තිබුණු අතර ශුද්ධ මූල්‍ය ආදායම ඍණ ශේෂයක් ගැනීම එයට හේතුවී තිබුණි. සමාගමේ මූල්‍ය තත්ත්වය යහපත් අන්දමින් පවත්වා ගෙන යාමට කළමණාකාරිත්වය අපොහොසත් වී තිබුණි.

## සමස්ථ රබර් නිෂ්පාදනය අඛන්ඩව අඩුවීම

රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීමට සහ රබර් වගා බිම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සහනාධාර වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණි. නමුත් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමස්ථ රබර් නිෂ්පාදනය අඛණ්ඩව අඩු වෙමින් පැවති අතර 2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 83,070 ක් වූ රබර් නිෂ්පාදනය 2018 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 82,560 ක් දක්වා අඩු වූ අතර එය 2019 වර්ෂයේ මෙට්‍රික් ටොන් 74,753 දක්වා අඩු වී තිබුණි. විස්තර රූපසටහන 26 හි දැක්වේ.




රූපසටහන 26 - සමස්ථ රබර් නිෂ්පාදනය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2019

## අමු රබර් අපනයන ආදායම අඩුවීම

**2018 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 13,982 ක් වූ රබර් අපනයනය 2019 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 13,003 ක් දක්වා සියයට 7 කින්ද, 2018 වර්ෂයේ රු. මිලියන 5,088 ක් වූ රබර් අපනයන ආදායම 2019 වර්ෂයේ දී රු.මිලියන 4,321 දක්වා සියයට 18 කින්ද අඩු වී තිබුණි. විස්තර රූපසටහන 27 හි දැක්වේ.**




රූපසටහන 27 - රබර් අපනයන ප්‍රමාණය හා ආදායම
මූලාශ්‍රය -වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2019

## රබර් නැවත ඉලක්කගත වගා කිරීම

**සමාලෝචිත වර්ෂයේදී කුඩා රබර් වතුහිමියන්ගේ ඉඩම් හෙක්ටර්යාර 870 ක් හා වැවිලි සමාගම්වල ඉඩම් හෙක්ටර්යාර 900 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙලින් ඉඩම් හෙක්ටර්යාර 578 ක හා හෙක්ටර්යාර 463 ක පමණක් රබර් නැවත වගාකර තිබුණි. ඒ අනුව රබර් නැවත**

වගා කිරීමට අපේක්ෂා කර තිබුණු ඉඩම් ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 34 ක හා සියයට 49 ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගා කිරීමට නොහැකි වි තිබුණි.

එමෙන්ම සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව ඉඩම් හෙක්ටයාර් 350 ක රබර් වගා කිරීමට සැලසුම්කර තිබුණද, ඉන් ඉඩම් හෙක්ටර්යාර 215 ක පමණක් රබර් වගා කර තිබුණි. ඒ අනුව සැලැසුම් කළ ප්‍රමාණයෙන් සියයට 39 ක ප්‍රමාණයක රබර් වගා කර නොතිබුණි.

## කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන කටයුතු සඳහා බැඳුම්කර අත්සන් කර වැටුප් සහිත නිවාඩු ලබා නිලධාරින් 04 දෙනෙකු විදේශගත වි තිබුණි. එම නිලධාරින් එකඟවූ පරිදි බැඳුම්කර කොන්දේසි කඩ කිරීම නිසා රබර් පර්යේෂණ මණ්ඩලයට රු.මිලියන 3.51 ක් අයවිය යුතුව තිබුණි. එම හිඟහිටි මුදල වර්ෂ 2 ක සිට වර්ෂ 28 දක්වා කාලපරාසක සිට පැවැත එමින් තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## වාර්ෂික ඵලදාව අඩුවීම

ජාතික රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම රබර් පර්යේෂණ මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වි තිබුණි. ඒ අනුව වාර්ෂික ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1500 ක සිට කිලෝග්‍රෑම් 3,000 ක් දක්වා පරාසයක පැවැතිය යුතුව තිබුණි. උසස් ගණයේ ක්ලෝන සමූහයක් 2009 වර්ෂය වන විට හඳුන්වාදී තිබියදීත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව වාර්ෂික ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 780 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

## කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය

- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් 2017 හා 2018 වර්ෂවලදී දිස්ත්‍රික්ක 06 ක හෙක්ටයාර් 729.77 ක තේ වගාව සඳහා ප්‍රතිලාභින් 3,331 දෙනෙකුට මූලික සහනාධාර ලෙස එකතුව රු.මිලියන 109.26 ක් ගෙවා තිබුණි. ඉඩම් මැනීමේ ප්‍රමාදය, මාන සිටුවීමේ ප්‍රමාදය, ගොවීන් සහනාධාර ක්‍රමයෙන් ඉවත්වීම හා තේ වගා මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම වැනි හේතුන් නිසා ඉදිරි සහනාධාර ගෙවීම් නතර වී තිබුණි.

- සැලැසුම් පූර්ණ කිරීමේ වාර්තාව අනුව, 2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වු කාල පරාසය තුළ දිස්ත්‍රික්ක 2 ක එකතුව හෙක්ටයාර 3,000 ක රබර් වගා කිරීමට සැලැසුම් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය විසින් ඉඩම් හෙක්ටයාර් 5,295 ක් හඳුනාගෙන තිබුණු අතර, එයින් හෙක්ටයාර් 2,575 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබුණි. ගොවීන් ව්‍යාපෘති ක්‍රියාවලියෙන් ඉවත්වීම හා වෙනත් වගාවන්වලට මාරුවීම වැනි හේතු නිසා 2019 වර්ෂය අවසන් වන විට අපේක්ෂිත ඉලක්කයෙන් හෙක්ටයාර් 2,094 ක් පමණක් වගා කිරීමට හැකි වී තිබුණි.

- සැලසුම් පූර්ණ කිරීමේ වාර්තාව අනුව, තේ නැවත වගා කිරීමේ හා නව රබර් වගාවේදී පිළිවලින් තේ දළු නෙළන තුරු හා රබර් කිරි කපන තුරු ගොවීන් වෙත අහිමි වන ආදායම් ආවරණය කර ගැනීම සඳහා වෙනත් කෙටිකාලීන ආදායම් ජනිත කර ගැනීමට අවශ්‍ය කරන මූල්‍ය

පහසුකම් සපුරා ගැනීම සඳහා රු.මිලියන 422.6 ක ණය පහසුකම් ලබාදීමේ වැඩපිළිවෙලක් සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## පොල් හිඟයක් පැවැතීම

2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් පැළ බෙදාදීම, සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාප්ති සේවා වෙනුවෙන් රු.බිලියන 6.38 ක් වැය කර තිබුණි. නමුත් රට තුළ වාර්ෂිකව ගෙඩි මිලියන 625.29 ක (සාමාන්‍ය) පොල් හිඟයක් පැවැතුණි.

## වැවිලි සවිය ශ්‍රමික බලකා ව්‍යාපෘතිය

පොල් කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රම බලකායක් පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ඉටු කර ගැනීම සඳහා වැවිලි සවිය ශ්‍රමික බලකා ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එහි ව්‍යාපෘති යෝජනාව අනුව ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් සියයට 76 ක් පුහුණු කිරීමේ කටයුතු සඳහාද, සියයට 24 ක් ක්ෂේත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා උපයොජනය කිරිමට අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පුහුණු කටයුතු වෙනුවෙන් සියයට 21 ක්ද, ක්ෂේත්‍ර උපකරණ හා ටැබ්ලට් පරිගණක මිලදී ගැනීම සඳහා සියයට 79 ක්ද වශයෙන් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි ලෙස ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

## පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය

ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන විදේශ වෙළඳපල තුළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරින් විදේශ ගත වීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 130.77 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට අපනයන කර තිබු පොල් ආශ්‍රිත නිෂ්පාදන 37 කින් නිෂ්පාදන 16 කට අදාළ අපනයන ප්‍රමාණය අඩු වී තිබුණි. ඒ අනුව අධිකාරිය පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය වැඩි කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## බීජ පොල් නිෂ්පාදනය වැඩි කිරිම

පොල් පර්යේෂන මණ්ඩලය විසින් 2004, 2012 සහ 2013 යන වර්ෂවලදී කප්රුවන, කප්සෙත හා කප්සුවය යන පොල් ප්‍රභේද හඳුන්වා දී තිබුණි. 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එම ප්‍රභේදවල බීජ පොල් නිෂ්පාදනය ගෙඩි 97,097 ක් වී තිබුණි. එය එම කාලය තුළ මණ්ඩලයේ සමස්ත බීජපොල් නිෂ්පාදනයෙන් සියයට 1.22 ක් තරම් අඩු ප්‍රතිශතයක් වී තිබුණි. ඒ අනුව මෙම විශේෂ පොල් ප්‍රභේද සඳහා බීජ පොල් උයන් ස්ථාපිත කර එමඟින් බීජ නිෂ්පාදනය වැඩිකර ජනතාව අතර ව්‍යාප්ත කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි..

## පොල් මයිටාගෙන් සිදුවන හානිය

වර්ෂයකදී ජාතික පොල් ඵලදාවෙන් ආසන්න වශයෙන් සියයට 10 ක සිට සියයට 15 ක් දක්වා පරාසයක ප්‍රමාණයකට පොල් මයිටාගෙන් හානියට ලක්වන බව ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ හා පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් වතුවල සත්‍ය පොල් ඵලදාවෙන් පිළිවෙලින් සියයට 9 ක හා සියයට 6 ක පමණ ප්‍රමාණයක් හානියට පත් වී තිබුණි. පොල් පර්යේෂණ මණ්ඩලය විසින් 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මයිටා උවඳුර මර්දනය

කිරීම සඳහා වූ පර්යේෂණ වෙනුවෙන් රු.මිලියන 13.77 ක වැය කර තිබුණි. එම පර්යේෂණ මඟින් ලබා දී තිබූ නිර්දේශ (විලෝපික මයිටා යෙදීම, පාම්/ එළවළු තෙල් මිශ්‍රණය යෙදීම හා දැව් තෙල් මිශ්‍රණය යෙදීම) ක්‍රියාත්මක කිරීමේදී ක්ෂේත්‍රයේදී ඇති වන ප්‍රායෝගික අපහසුතා හේතු කොට ගෙන මයිටා උවදුර අවම කර ගැනීමට නොහැකි වී තිබුණි.

## සීනි කර්මාන්තය රට තුළ නිසි පරිදි ස්ථාපිත නොවීම

1981 අංක 75 දරන උක් පර්යේෂණ පනත මගින් වාණිජ වශයෙන් උක් වගා කිරීම, දේශීය සීනි කර්මාන්තයට අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම, දේශීය සීනි කර්මාන්තය නියාමනය කිරීම සහ හඳුන්වා දෙන උක් ප්‍රභේද වල වාණිජ අනුවර්තිතාවය (Commercial Adoption) තීරණය කිරීම යනාදිය සඳහා උක් පර්යේෂණ ආයතනයට බලතල පවරා නොතිබුණි. ආයතනය පිහිටුවා අවුරුදු 35 ක කාලයක් ගත වී තිබුණත් සීනි කර්මාන්තය රට තුළ නිසි පරිදි ස්ථාපිත වී නොතිබුණි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව දේශිය සීනි අවශ්‍යතාවයෙන් සියයට 92 ක සීනි ප්‍රමාණයක් ආනයන කරන බව සඳහන් කර තිබුණි.

## උක් වගාවේ සුදු පත්‍ර රෝගය මර්ධනය කිරීම

උක් පර්යේෂණ ආයතනය විසින් උක් වගාවේ රෝගවලට ප්‍රතිරෝධී උක් ප්‍රභේද හඳුන්වාදීම, ජාන ප්ලාස්ම සංචිතයේ පවතින ප්‍රතිරෝධී ප්‍රභේද තෝරා එම ප්‍රභේද ඉදිරි අභිජනන කටයුතු සඳහා යොදා ගැනීම, රෝග වාහක පත්‍ර කීඩැවා හඳුනා ගැනීම සහ එම කෘමියා මර්ධනයට අවශ්‍ය නිර්දේශ ලබා දීම, උණුදිය ප්‍රතිකාර ඒකක ස්ථාපනය කිරීම, රෝග හා පළිබෝධ පාලනය සම්බන්ධව ගොවීන් දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපදෙස් පත්‍රිකා බෙදාහැරීම, ප්‍රාථමික තවාන් ස්ථාපනය කිරීම ආදී පියවර රෝග මර්ධනය සඳහා සිදුකර තිබුණද 1972 වර්ෂයේ හඳුනාගෙන තිබූ සුදු පත්‍ර රෝගය 2019 දෙසැම්බර් වන විටද මර්ධනය කිරීමට අසමත් වී තිබුණි. .

## උක් සැපයුම අඩුවීම

සෙවනගල සීනි කර්මාන්තායතනයට අයත් උක් වගා කළ හැකි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 4241 ක් වී තිබුණත්, 2018 වර්ෂය වන විට සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම විසින් හෙක්ටර්යාර 3355 ක භූමි ප්‍රමාණයක උක් වගා කර තිබුණි. ඒ අනුව කර්මාන්තශාලාවේ මෙහෙයුම් උපරිම ධාරිතාවයෙන් යුක්තව පවත්වාගෙන යාමට අවශ්‍ය උක් සැපයුම ලබාගැනීමට ප්‍රමාණවත් ඉඩම් සමාගම සතුව තිබුණ ද, එම ඉඩම්වල උක් වගා කර කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ දැමීමට සමාගම කටයුතු කර නොතිබුණි. එසේම උක් සැපයුම අඩු වීම හේතුවෙන් සමාගමේ කර්මාන්තශාලා වල උපරිම ධාරිතාවය වන උක් මෙට්‍රික් ටොන් 897,500 කින් සියයට 34 ක් ධාරිතාවයක් සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගෙන නොතිබුණි.

## නිෂ්කාර්ය වත්කම්

2013 වර්ෂයේදී රු.මිලියන 128.91 ක් වටිනා කල්බදු පහසුකම් යටතේ මිලට ගත් ක්‍රේන් යන්ත්‍රය සැපයුම්කරු විසින් සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම එකඟ වූ පරිදි කර්මාන්තායතනය තුළ ස්ථාපිත කර නොතිබුණි. මේ නිසා යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි. එසේම මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් තවදුරටත් ගෙවිය යුතු කල්බදු වාරික මුදල රු.මිලියන 11.81 ක් වී තිබුණි.

## සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය

අඛණ්ඩව වසර 25 ක් පමණ කාලයක සිට දේශීය සීනි නිෂ්පාදනය සඳහා කිසිදු දායකත්වයක් ලබාදීමට අපොහොසත් වූ රජයට පූර්ණ හිමිකාරීත්වයක් පැවති කන්තලේ සීනි කර්මාන්තශාලාව 2015 වර්ෂයේදී ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා තීරණය කර තිබුණි. නමුත් ප්‍රතිව්‍යහගත කිරීමෙන් අපේක්ෂා කළ අරමුණු සාර්ථක ලෙස ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් කර්මාන්ත ශාලාවේ පැවති වත්කම්වල අයිතිය රජයෙන් ඉවත් වී තිබුණි. තවද පෞද්ගලික පාර්ශ්වයක් වෙත සිංගප්පූරු ඩොලර් 894,516.83 හා ඇමරිකානු ඩොලර් 211,913.93 ක වන්දි මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය සියයට 15 කින් ඉහළ යාම සිදුවී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ද අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර දේශීය සීනි නිෂ්පාදනය සිදු කිරීමට නොහැකි වී තිබුණි.

## සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.මිලියන 1,817.58 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. එදින වන විට සමාගමේ මුළු වත්කම් ඉක්මවා රු.මිලියන 6,234.98 ක වගකීම් ප්‍රමාණයක් පැවැති බැවින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වී තිබුණි. සමාගම විසින් 2014/2015 ගිණුම් වර්ෂය අවසාන වන විට රු.මිලියන 2,177 ක ණය ශේෂයක් පැවැතුණි. එම වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 529 ක පොලියක් ගෙවා තිබුණි. 2018/2019 ගිණුම් වර්ෂය වන විට ලබාගෙන තිබූ ණය ප්‍රමාණය රු.මිලියන 7,400 ක් දක්වා සියයට 239 කින් වැඩි වී තිබුණි. ඒ අනුව රු.මිලියන 1,803 ක පොලියන් ගෙවා තිබුණු බැවින් ණය පොලිය 2014/2015 වර්ෂයේදී ගෙවා තිබුණු පොලියට සාපෙක්ෂවසියයට 240 කින් වැඩි වී තිබුණි. සමාගමේ මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් දිගින් දිගටම ණය ලබාගැනීම හේතුවෙන් සමාගමේ මූල්‍ය තත්ත්වය අයහපත් තත්වයකට පත්ව තිබුණි.

## විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීම

කුරුණෑගල වැවිලි සමාගමේ නිලධාරීන් තිස්හය දෙනෙකු සඳහා හා හලාවත වැවිලි සමාගමේ නිලධාරීන් විසි අට දෙනෙකු සඳහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කම්කරුවන් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ලබා දෙන දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 13.24 ක් හා රු.මිලියන 9.89 ක් ගෙවා තිබුණි.

## සේවක අර්ථසාධක අරමුදලේ දායක නොගෙවීම

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10(2) වගන්තිය ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීමේදී අදාළ මාසයේ දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතුව තිබුණි. ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් 2019 මැයි, ජූනි හා ජූලි මාසවලට අදාළ එකතුව රු.මිලියන 4.96 ක දායක මුදල් 2020 ජූනි 30 දින වන විටත් ගෙවා නොතිබුණි.

## ඉඩම්වල අයිතිය පවරා නොගැනීම

2012 ජූලි 24 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සංස්ථාවට නීත්‍යානුකුල අයිතිය නොතිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ශ්‍රී ලංකා කජු සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණි. සංස්ථාව සතු කජු වතු 09 ක හා බීජ

**උද්‍යාන 04 කට අයත් අක්කර 12,044 ක් වූ ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත ලබා ගැනීමට 2020 ජූනි 30 දින විටත් අපොහොසත් වී තිබුණි.**

# ධීවර හා ජලජ සම්පත්

මත්ස්‍ය පරිභෝජනය වැඩිකිරීම මගින් ඉහළ පෝෂණ මට්ටමක් සහිත ජනතාවක්, ඉහළ විදේශ විනිමය ඉපයීමක් හා ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වැඩි කිරීමෙන් ධීවර ප්‍රජාවට උසස් ජීවන මට්ටමක් ලබාදීමත් මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වී තිබුණි. එම ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 4 ක් විසින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කළ යුතුව තිබුණි.

- සමුද්‍ර, කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත සංවර්ධනය හා කළමනාකරණය.
- රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය හා මෙහෙයවීම.
- අනන්‍ය ආර්ථික කළාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරිම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ පුළුල් කිරිම .

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 25,655.05 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 15,759.76 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 38.57 ක් හෙවත් රු.මිලියන 9,895.29 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 28 හි දැක්වේ.




රූපසටහන 28 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා වියදම
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා ව්‍යාවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ධීවර ප්‍රජාව බලගැන්වීම

ධිවර කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතියේ ධිවර ප්‍රජාව බලගැන්වීම සඳහා 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් අමාත්‍යාංශය වෙත රු.මිලියන 100 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඒ වෙනුවෙන් රු.මිලියන 62 ක් වැය කර තිබුණ ද, 2019 වර්ෂය තුළ හඳුනාගත් කාර්යයන් 76 කින් කාර්යයන් 11 ක් පමණක් ඉටුකර තිබුණි. 2017 හා 2018 වර්ෂවලට අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන යොදවා තිබුණි.

## වෙරළ පුනරුත්ථාපනය සහ සම්පත් කළමනාකරණය කිරීමේ වැඩසටහන

ඉහත සඳහන් වැඩසටහන වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 70 ක ප්‍රතිපාදන සළසා තිබිණි. මත්ස්‍ය රැකුම් හල් (Hatchery) ඉදිකිරීම ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර අධිකාරිය විසින් ඒ වෙනුවෙන් රු.මිලියන 57.29 ක් වැය කර තිබුණි. මෙම වැඩසටහන සඳහා පසුගිය වර්ෂවලදී සළසා තිබුණු ප්‍රතිපාදනයන් ඒ වෙනුවෙන් උපයෝජනය නොකර වෙනත් කාර්යයන්වලට අඛණ්ඩව යොදවා තිබුණි.

## මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ගම්මාන වැඩිදියුණු කිරීම

හම්බන්තොට, යාපනය සහ මඩකලපුව ඇතුළත් මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ගම්මාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම කර නොතිබුණි. එම ප්‍රතිපාදනය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුව හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේ දී ආරම්භ කළ දියවර පියස ධීවර නිවාස හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ ආධාර වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ වෙනුවෙන් රු.මිලියන 46.3 ක් වැයකර තිබුණි.

## වැවක් සහිත ගමක් වැඩසටහන

වැවක් සහිත ගමක වැඩසටහන යටතේ සමෝධානිත මිරිදිය ධීවර ගම්මාන පිහිටුවීම වෙනුවෙන්
2019 වර්ෂය සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම වැඩසටහන යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා දෙපාර්මේන්තුව විසින් හඳුනාගෙන තිබුණු සංවර්ධන ව්‍යාපෘති 102 ක් අතරින් ව්‍යාපෘති 62 ක් ක්‍රියාත්මක කර රු.මිලියන 92 ක් වැයකර තිබුණි. එසේ නිම කළ යුතුව තිබුණු ව්‍යාපෘතිවලින් 18 ක් 2018 වර්ෂයේදී නිමකළ යුතුව තිබුණු ව්‍යාපෘති විය.

## කලපු 10 ක් පවිත්‍ර කිරීම

2019 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රධාන සංවර්ධන සැලැසුම් (Master Plans) සකස් කිරීම යටතේ තෝරාගත් කලපු 10 ක් පවිත්‍ර කිරිම සඳහා රු.මිලියන 60 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.මිලියන 23.60 ක්

වැයකර තිබුණු අතර ළගා කරගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 70 ක් වී තිබුණි. එසේම 2019 වර්ෂයේදී කලපු ධාරිතාව (caring capacity) ප්‍රමාණනය කිරීමට ජාතික ජලජ සම්පත් පර්යේෂණය පවත්වා වාර්තාවක් පිළියෙල කිරිම සඳහා රු.මිලියන 9.8 ක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර, එම වාර්තාව පිළියෙල කර නොතිබුණි. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.5 ක් වෙනත් කාර්යයන් 2 ක් සඳහා වැයකර තිබුණි. එසේම යාපනය, පානම සහ ආරුගබ්බේ කලපු පවිත්‍ර කිරීම හා රොන්මඩ ඉවත් කිරීම (dredging) වෙනුවෙන් රු.මිලියන 40 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්ය නිම කිරිමට නොහැකි තිබුණි.

### මිනින්දෝරු සැලැසුම් හා කලපුවල භෞතික සීමා සලකුණු කිරීම

කලපු සඳහා මිනින්දෝරු සැලසුම් හා කලපුවල භෞතික සීමා සලකුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී රු.මිලියන 25 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 22 ක් වැයකර තිබුණු අතර අපේක්ෂිත ඉලක්කය සපුරාගෙන නොතිබුණි.

### කලපුවලට මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම හා මොදා කූඩු සෑදීමට ද්‍රව්‍ය සැපයීම

ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කලපුවලට මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම හා මොදා කූඩු සෑදීමට ද්‍රව්‍ය සැපයීම යන ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.මිලියන 48 ක් වැය කර තිබුණි. 2019 වර්ෂයේ දී ද, ඒ වෙනුවෙන් රු.මිලියන 157 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 68 ක් වැයකර තිබුණි. 2019 වර්ෂයේ සැලැසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

### කෘතිම ඇම දැල්ලන් නිෂ්පාදනය

පුද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කර තිබුණු කෘතිම ඇම දැල්ලන් නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් පදනම් කරගෙන එය ක්‍රියාත්මක කිරිම සඳහා අමාත්‍යාංශය විසින් 2018 ඔක්තෝබර් 03 දින ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය වෙත රු.මිලියන 2.50 ක් ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. නියෝජිතායතනය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කරමින් කෘතිම ඇම දැල්ලන් 1,500 ක් නිෂ්පාදනය කර භාරදීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණු අතර 2018 ඔක්තෝබර් 16 දින එම මුළු මුදලම සමාගම වෙත ගෙවා තිබුණි. අදාල භාණ්ඩ එකඟ වී තිබුණු පිරිවිතරවලට හා ප්‍රමාණයට සපයා නොතිබුණි. ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය සිදු කළ පර්යේෂණය මත පදනම්ව 2019 අගෝස්තු 30 දින නිකුත් කර තිබුණු පර්යේෂණ වාර්තාවේ නිගමනය අනුව එම කෘතිම ඇම දැල්ලන් වෙතට මසුන් ආකර්ශණය නොවීම හේතුවෙන් රජය වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

### උතුරු පළාත් තිරසර සංවර්ධන ව්‍යාපෘතිය

2017 මාර්තු 20 දින ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව උතුරු පළාත් තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර 2018 ජුනි

01 දින වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රු.මිලියන 24,035 ක් වී තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2020 මැයි 31 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරගෙන තිබුණි.

පේදුරුතුඩුව හා පේසාලේ ධීවර වරායන් ඉදිකිරීම් කටයුතු සැලැසුම් කිරීම ව්‍යාපෘති කාර්යයක් වී තිබුණි. පේසාලේ ධීවර වරාය ඉදිකිරිම වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 18.6 ක් වැය කර තිබුණත් 2019 වර්ෂයේ දී එය ව්‍යාපෘතියේ විෂය පථයෙන් ඉවත් කර තිබුණි. ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව, 2019 දෙසැම්බර් 31 දිනට මුළු ව්‍යාපෘති වියදම රු.මිලියන 185.4 ක් වූ අතර රු.මිලියන 24,035 ක් වූ මුළු ව්‍යාපෘති පිරිවැය හා සැසැඳීමේ දී ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 0 .77 ක් වැනි අවම මට්ටමක පැවැතුණි.

2020 ජනවාරි 08 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් මත ව්‍යාපෘති කටයුතු නවතා තිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට බලපෑමක් වී තිබුණි. සමාජීය විරෝධතා හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය සඳහා ණය දීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර ව්‍යාපෘතිය 2020 මැයි 31 දින නවතා තිබුණි.

### ධීවර වරායන් සහ නැංගුරම්පළවල් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය

2019 වර්ෂය සඳහා ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඉදිකිරීම ඇතුළු ක්‍රියාකාරකම් 20 ක් ඉටු කිරීම සඳහා රු.මිලියන 1,586.57 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ධීවර වරායන් 05 ක් ඉදිකිරීම ඇතුළුව ක්‍රියාකාරකම් 11 ක් සඳහා රු.මිලියන 1,066.78 ක් වැය කර තිබුණි.

වෙල්ලමංකර නව ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2,355 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2019 වර්ෂයේ දී ඒ වෙනුවෙන් රු.මිලියන 639.7 ක් වැය කර තිබුණි. මුළු ඉදිකිරීම් වියදම රු.මිලියන 1,003 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට දියකඩනය ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 40 ක් පමණක් වී තිබුණි.

කළමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භකර 2017 වර්ෂයේ දී අවසන් කළ යුතුව තිබුණි. 2019 වර්ෂයේ දී ඒ සඳහා රු.මිලියන 105.24 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය නිම කළ යුතුව තිබුණු දින සිට වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණ ද, ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි.

2017 වර්ෂයේදී අවසන් කළ යුතුව තිබුණු හලාවත හරිත ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී රු.මිලියන 27.82 ක් වැය කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

මිරිස්ස හරිත ධීවර වරාය ඉදිකිරීමේ ඉතිරි වැඩ වෙනුවෙන් රු.මිලියන 350 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු අතර එම ව්‍යාපෘතිය 2018 ජූනි මාසයේදී අවසන් කළ යුතුව තිබුණි. 2019 වර්ෂයේදී මේ සඳහා රු.මිලියන 18 ක ප්‍රතිපාදන සළසා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

2019 මැයි මාසය වන විට අවසන් කළ යුතුව තිබුණු මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 392 ක් වූ මයිලිඩ්ඩි වරාය, ධීවර වරායක් බවට පත්කිරීමේ හා අවශ්‍ය පහසුකම්

ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේ දී රු.මිලියන 87.74 ක් වැය කර තිබුණි. දියකඩනය ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් එහි ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.

ගාල්ල ජැටිය ධීවර වරාය ඉදිකිරීම හා පැරැලිය නැංගුරම්පළ ඉදිකිරීම යන ව්‍යාපෘති පිළිවෙලින් 2018 ජුනි මාසයේදී හා 2017 ජූලි මාසයේදී අවසන් කළ යුතුව තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 21.72 ක් හා රු.මිලියන 17.00 ක් වැය කර තිබුණි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉදිකිරීම් අවසන් කර භාරදීම සිදු කර නොතිබුණි.

කරෙයිනගර් යාත්‍රාංගනය ඉදිකිරීම අදියර I, II, III වන ව්‍යාපෘති 2018 ජනවාරි මාසයේදී අවසන් කළ යුතුව තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 39 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 13 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි.

මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර 2019 මාර්තු මාසයේදී ආරම්භ කර 2019 දෙසැම්බර් මාසයේදී අවසන් කළ යුතු ව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 63.24 ක් වැය කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විට එහි සම්පූර්ණ ප්‍රගතිය සියයට 38 ක් පමණ වී තිබුණි.

## මහල් 3 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම

ධිවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණු මහල් 6 කින් යුත් නව මහලේකම් ගොඩනැගිල්ලෙහි අමාත්‍යාංශය පවත්වාගෙන යාමට ඉඩකඩ පිළිබඳ විශාල තදබදයක් තිබෙන බවට තොරතුරු ඉදිරිපත් කරමින් අංක අමප/17/1318/718/077/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණු අතර, අමාත්‍යාංශය වෙනුවෙන් පිරිවැය රු.මිලියන 242.5 ක් වූ මහල් 03 කින් යුත් වර්ග අඩි 29,000 ක ගොඩනැගිල්ලක් ඉදිකිරිමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන හා කොන්ත්‍රාත් ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචිය අනුව නුසුදුසු කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. 2019 ඔක්තෝබර් 30 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 68 ක් ගෙවා තිබුණත්, සමාලේචිත වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා තිබුණි.

## ඉරණමඩු අභිජනනාගාරය සඳහා ක්‍රමවත් ජල සැපයුමක් ලබා ගැනීම

ජලජීවි වගා සංවර්ධන අධිකාරිය යටතේ වන ඉරණමඩු අභිජනනාගාරයෙහි ක්‍රමවත් ජල සැපයුමක් ලබා ගැනීමට සයිපන් ව්‍යුහයන්හි අත්‍යාවශ්‍ය වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 16.60 ක වටිනාකමක් මත 2018 ජූලි 25 දින පෞද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම කොන්ත්‍රාත්තුව නිම කිරිමට වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණත්, වැඩ නිම කර නොතිබුණි. මේ සඳහා විචල්‍ය නියෝග මඟින් වැය කර තිබූ රු.368,081 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

මන්නාරම දිස්ත්‍රික්කයේ වෙඩිතලතිව් පිහිටි වනජීවී ප්‍රේරණ කළාපයට අයත් ඉඩමක වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන 2016 අගෝස්තු මාසයේ සිට 2018

අගෝස්තු මාසය දක්වා කාලය තුළ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විටත් පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා වාර්තා, අවධානම් තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා ජලය හා විදුලිය ලබා ගැනීම සඳහා රු.මිලියන 25.19 ක් වැය කර තිබුණි.

## මත්ස්‍ය පොකුණු වල ආරක්ෂාව

උඩවලව තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ මත්ස්‍ය පොකුණුවල ආරක්ෂාව වෙනුවෙන් ඉඩම වටා පිහිටි වැට පිළිසකර කිරීම සඳහා අතිරේක වැඩ සමඟ රු.මිලියන 4.52 ක් වැයකර තිබුණි. අතිරේක වැඩ සඳහා රු.මිලියන 1.65 ක් වැය කිරීම හේතුවෙන් මීටර් 550 ක් දිගින් යුතුව සකස් කිරීමට ඇස්තමේන්තු කර තිබූ වැට අදාළ ප්‍රතිපාදන සීමාව තුළ මීටර් 343.45 ක් පමණක් ඉදිකර තිබුණි. මත්ස්‍ය පොකුණු ආවරණය වන පරිදි වැට ඉදි නොකිරීමත්, ඉදිකර තිබුණු වැටෙහි ඇතැම් ස්ථානවල හිදැස් පිහිටීමත් නිසා මත්ස්‍ය පොකුණුවල ආරක්ෂාව සැලසී නොතිබුණු අතර රු.මිලියන.4.52 ක් වැයකර තිබූ කර්මාන්තයේ අරමුණ ඉටුවී නොතිබුණි.

## පොකුණු 04 ක් සහ ගඩොල් ටැංකි 04 ක් ඉදිකිරීම

උඩවලව තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ පොකුණු 04 ක සහ ගඩොල් ටැංකි 04 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 17.07 ක් වැයකර තිබුණි. 2019 ජුනි 18 දින විගණනය විසින් සිදු කරන ලද භෞතිකව පරීක්ෂාව අනුව ඉදිකරන ලද පොකුණු 04 කින් 03 කද, ගඩොල් ටැංකි 4 කින් 02 කද මසුන් නොමැති විය.

## ජල සැපයුම් පද්ධතියක් සපයා සවි කිරීම

උඩවලව නව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල සැපයුම් පද්ධතිය සපයා සවි කිරීමේ කර්මාන්තය සඳහා රු.මිලියන 8.63 ක් වැයකර 2018 පෙබරවාරි 11 දින වැඩ නිම කර තිබුණි. 2019 ජුනි 19 දින වන විටත් පොම්පාගාරය සඳහා විදුලිය ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.මිලියන 8.63 ක් වැයකර ඉදිකරන ලද ව්‍යාපෘතියෙන් උපරිම කාර්යක්ෂමතාවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

## උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානය

උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානයේ නිල නිවාස ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ කම්කරු පියස ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 2.46 ක් සහ රු.මිලියන 14.06 ක් වැය කර 2018 ජූලි 03 දින වැඩ අවසන් කර තිබුණි. 2019 ජුනි 19 දින වන විටත් නිල නිවස සහ කම්කරු නිවාස 02 ක් පදිංචියකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

## තිලාපියා සඳහා මත්ස්‍ය ආහාර ඒකකයක් පිහිටුවීම

තිලාපියා සඳහා මත්ස්‍ය ආහාර ඒකකයක් පිහිටුවීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ගුණාත්මක තත්ත්වයෙන් යුත් ආහාර අවම නිෂ්පාදන පිරිවැයකට අධිකාරිය විසින් නිෂ්පාදනය කිරීමටත්, වර්ෂයකදී අවම වශයෙන් මත්ස්‍ය ආහාර වෙනුවෙන් කරනු ලබන වියදමෙන් රු.මිලියන 05ක් පමණ ඉතිරි කර ගැනීමටත් සැලැසුම් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස ඉල්ලීමක් කිරීමට පෙර ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳව තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ පිළිබඳ තක්සේරුව සහ ව්‍යාපෘතියට අදාළ වෙනත් සියලු

ප්‍රසම්පාදනයට පෙර සූදානම් වීමේ කටයුතු සිදුකර නොතිබුණි. එසේ නොකර තිලාපියා උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානයේ මත්ස්‍ය ආහාර නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 10.23 ක් වැය කර තිබුණි. යන්ත්‍රය සවිකිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල සූදානම් නොකිරීම, විදුලිබලය ලබා නොගැනීම, යටිතල පහසුකම් නොමැතිවීම හේතුකොට ගෙන 2019 අගෝස්තු මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වාම යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් මත්ස්‍ය ආහාර සඳහා සමාලෝචිත වර්ෂයේදීද රු.මිලියන 57.79 ක් වැය කිරීමට සිදුවී තිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය තුළ යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවති අතර රු.මිලියන 10.23 ක් වැය කරන ලද ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

### යන්ත්‍ර මිලදී ගැනීම

ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් කලපු සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 161.40 ක් වටිනා වල්පැළැටි සහ සුන්බුන් ඉවත් කිරීමේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එම මිලදී ගැනීම සඳහා අධිකාරිය විසින් 2018 ජූලි 13 දින රු.මිලියන 42.57 ක් අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාජ බැඳුම්කර ලියවිලි ඉදිරිපත් කර තිබුණු අතර ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව ඔහු වෙත අත්තිකාරම් ගෙවා තිබුණි. අත්තිකාරම් ගෙවීමට වගකිය යුතු නිළධාරීන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය අනුව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අවිධිමත් ලෙස ගෙවූ රු.මිලියන 42.57 ක මුදල මාස 06 ක කාලයක් පෞද්ගලික පරිහරණයට ඉඩ හැර ආපසු අයකර තිබුණි. තවද නිලධාරීන් 4 දෙනෙකු මෙම යන්ත්‍ර පරීක්ෂා කිරීම සඳහා විදේශ ගතවී තිබුණු අතර ඒ සඳහා රු.363,504 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

### මත්ස්‍ය අපතය භාවිතයෙන් ඇමිනෝ අම්ලය (Peptides) නිස්සාරණය කිරීම සහ වර්ගීකරණය කිරීම

ටූනා මසුන් සැකසුම්කර අපනයනය කරන කර්මාන්තශාලා වලින් බැහැර කරන මත්ස්‍ය අපතය නිසි ප්‍රයෝජනයකට නොගෙන බැහැර කිරීම හේතුවෙන් සිදුවන පරිසර දූෂණය අවම කිරීම සඳහා මත්ස්‍ය අපතය භාවිතයෙන් ඇමිනෝ අම්ලය (Peptides) නිස්සාරණය කිරීම සහ වර්ගීකරණය කිරීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් රු.මිලියන 1.75 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ සඳහා රු.771,569 ක් වැය කර තිබුණි. පර්යේෂණයෙහි මූලික අරමුණක් වන ඇමිනෝ අම්ලය (Peptides) වර්ගීකරණය කිරීම සිදුකර නොතිබුණු බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. මෙම ව්‍යාපෘතිය තෝරාගැනීමේ පදනම ලෙස කර්මාන්තශාලා වලින් බැහැර කරන මත්ස්‍ය අපතය නිසි ප්‍රයෝජනය නොගැනීම වශයෙන් දක්වා තිබුණත්, දැනටමත් මෙම අපතය මත්ස්‍ය ආහාර නිපදවීම සඳහා භාවිතා කරන බැවින්, නිසි ඇගයීමකින් තොරව ව්‍යාපෘතිය තෝරාගෙන තිබුණි.

### අධිශීතකරණ සහිත බහුදින ධීවර යාත්‍රාවල මසුන්ගේ ගුණත්වය පරීක්ෂා කිරීම

අධිශීතකරණ සහිත බහුදින ධීවර යාත්‍රාවල මසුන්ගේ ගුණත්වය පරීක්ෂා කිරීම සඳහා රු.මිලියන 3 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට යථෝක්ත පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 3.61 ක් වැයකර තිබුණි. මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ

අධිශීතකරණ පද්ධති සහිතව දියුණුකරන ලද බහුදින යාත්‍රා වල මසුන්ගේ ගුණත්වය ඇගයීම් මෙම ව්‍යාපෘතියේ අරමුණ වී තිබුණත්, නියෝජිතායතනය විසින් අඩි 50 කට වැඩි අධිශීතකරණ රහිත බහුදින යාත්‍රාවල මසුන්ගේ ගුණත්වය තක්සේරු කිරීම සිදුකර තිබුණු බව කාර්යසාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී අනාවරණය විය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් 2017 වර්ෂයට පෙරද අධිශීතකරණ රහිත බහුදින යාත්‍රාවල මත්ස්‍ය අස්වැන්නෙහි පසු අස්වනු හානිය සියයට 40 ක් පමණ වන බව සොයාගෙන තිබුණු අතර පසු අස්වනු හානිය අවම කිරීම සඳහා කටයුතු සිදුකිරීම වෙනුවට තවදුරටත් පසු අස්වනු හානිය තක්සේරු කිරීම සඳහා 2018 හා 2019 වර්ෂ වලදී එකතුව රු.මිලියන 7.49 ක් වැයකර පර්යේෂණ කර තිබුණි.

බහුදින යාත්‍රාවල මත්ස්‍ය අස්වැන්නෙහි ගුණත්ව හානිය අවම කිරීමේ අරමුණින් රු.950,130 ක් වැයකර අධිශීතකරණ පද්ධතියක් සහිතව බහුදින යාත්‍රාවක් නිර්මාණය කිරීම සඳහා උපදේශන වාර්තාවක් 2017 වර්ෂයේදී මොරටුව විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන තිබුණද, එම වාර්තාව ඵලදායී ලෙස යොදාගෙන බහුදින යාත්‍රාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### තනතුරු සඳහා බඳවා ගැනීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු කෙනෙකු ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය අධ්‍යක්ෂක මූල්‍ය තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. එම නිලධාරියා වෙත 2017 මැයි මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 5.44 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු නිලධාරියෙකු ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පර්යේෂණ සහකාර තනතුරට 2014 මැයි මාසයේ සිට බඳවා ගෙන 2019 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 2.89 ක් ගෙවා තිබුණි.

# කර්මාන්ත

ගෝලීය වශයෙන් තරඟකාරී සහ වාසිදායක ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීන අවතැන් පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවසථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය
- ව්‍යවසායකත්වය ජාතික ආර්ථික ප්‍රවාහය හා බද්ධ කිරීමට ක්‍රමෝපායන් සැකැසීම
- ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 42,219.94 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 21,820.27 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාරිමේන්තුව විසින් කාලපරිච්ඡේදය වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 48.32 ක් හෙවත් රු.මිලියන 20,399.67 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 29 හි දැක්වේ.




රූපසටහන 29 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### කර්මාන්තපුර

2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්මාන්තපුර යටතේ ව්‍යාපෘති 25 ක් වෙනුවෙන් රු.මිලියන 212.74 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ව්‍යාපෘති 23 කින් කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණු අතර, ව්‍යාපෘති 02 ක සියයට එකක පමණ ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි. ඒ අනුව ඉහත සඳහන් ව්‍යාපෘති 25 ක් වෙනුවෙන් සළසා තිබුණු සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 199.48 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

අමාත්‍යාංශය විසින් රු.මිලියන 279.28 ක් වැය කර කර්මාන්තපුර 02 ක කර්මාන්තශාලා ගොඩනැගිලි 05 ක් ඉදිකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ගොඩනැගිලි නිෂ්කාර්යව පවතුණි. එසේම දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින කර්මාන්තපුර 17 ක් තුළ කර්මාන්තපුර සඳහා වෙන්කර තිබුණු මුළු භූමි ප්‍රමාණය අක්කර 634.92 වූ අතර එයින් අක්කර 235.58 ක් හෙවත් මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 37.1 ක් 2019 ජුනි 30 දින වන විට භාවිතයට ගෙන නොතිබුණි.

"නංවමු ලංකා" ව්‍යාපෘතියට අදාළ බැරකම් වටිනාකම රු.මිලියන 136.16 ක් වූ අතර බැඳීම් වටිනාකම රු.මිලියන 4.32 ක් වී තිබුණි. එම බැරකම් හා බැඳීම් කුමන වියදම් වර්ගවලින් සමන්විත වී තිබේද යන්න පිළිබඳ තොරතුරු 2020 ජුනි 30 දින වන විටත් අමාත්‍යාංශය සතුව නොතිබුණි. ඇඟළුම් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘතියක මූලික කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේදී පාර්ශවයන් 3 කට රු.මිලියන 167.9 ක් ගෙවා තිබුණද ඉඩම් අත්කර ගැනීම සම්බන්ධ ගැටළු හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර දමන ලද අතර 2020 ජුලි 01 දින වන විටත් එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### දෙමහල් ගොඩනැගිල්ල ඵලදායි කාර්යයට භාවිතා නොකිරීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 60.12 ක් වැය කර නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එම ගොඩනැගිල්ලේ වායු සමීකරණ සවි නොකිරීම නිසා එය 2020 මැයි මාසය වන විටත් ඵලදායි කාර්යයකට භාවිතා කර නොතිබුණි. එසේම එම ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු 2020 මැයි 30 දින වන විටත් පරිහරණය කළ හැකි තත්ත්වයක් දක්වා සම්පූර්ණ කර නොතිබුණි. එම හේතුවෙන්, මධ්‍යස්ථානයේ අධ්‍යාපන අංශය පවත්වාගෙන යාමට මාසයකට රු.84,975 ක කුළී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. ඒ වෙනුවෙන් 2019 වර්ෂයේදී එකතුව රු.මිලියන 1.02 ක්ද, 2020 අගෝස්තු දක්වා රු.339,900 ක්ද කුළී ලෙස ගෙවා තිබුණි.

### අරමුදල් ඵලදායි කාර්යයක නොයෙදීම

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වය යටතේ 2014 දෙසැම්බර් මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා වූ වර්ෂ 02 ක කාලයක් තුළ ශිල්පීන්ගේ තාක්ෂණික හැකියාව සංවර්ධනය සහ උපදේශක සහාය ලබාදීමේ ව්‍යාපෘතියක් ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබුණි. 2019 වර්ෂය වන විට මෙම ව්‍යාපෘති කාලය අවසන් වී වර්ෂ 03 ක් ගතවී තිබුණද, එම ව්‍යාපෘතිය සඳහා ලද අරමුදල්වලින් 2019 වර්ෂයේදී රු.මිලියන 2.32 ක් පමණක් වැය කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියෙන් ලද අරමුදල් අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ඵලදායි කාර්යයකට යොදා නොතිබුණු අතර,

එම අරමුදල්වලින් රු.මිලියන 2.32 ක් වෙනත් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.

### මහන මැෂින් නිෂ්කාර්යව පැවැතීම

ජාතික ශිල්ප සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන පොල්ගොල්ල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2016 දෙසැම්බර් 28 දින එකතුව රු.459,900 ක් වැයකර මහන මැෂින් 10 ක් සහ මෝටර් 01 ක් මිලදී ගෙන තිබුණි. එම මැෂින් 10 ට අමතරව සාමාන්‍ය මහන මැෂින් 04 ක් සහ සිග්සැග් මැෂින් 04 ක් ඇතුළුව එකතුව මහන මැෂින් 18 ක් මිලදී ගෙන තිබුණි. ශිල්පීන්ගේ අවශ්‍යතා සඳහා බෙදා හැරීම හෝ ශිල්පීන් පුහුණුව සඳහා භාවිතා කිරීමකින් තොරව, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 03 ක පමණ කාලයක් පුරා එම මහන මැෂින් පොල්ගොල්ල පළාත් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු අංශය තුළ කිසිඳු ඵලදායී කාර්යයකට භාවිතා නොකර ඒවා ඇසුරුම් කළ පෙට්ටි තුළම නිෂ්කාර්යව ගොඩ ගසා තිබුණි.

### හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීම

ජාතික ශිල්ප සභාව විසින් ශිල්පීන් 600 කට ප්‍රතිලාභ ලබාදීමේ අපේක්ෂාවෙන් හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීමට පහසුකම් සැපයීම (අමුද්‍රව්‍ය/ උපකරණ) යටතේ රු.මිලියන 2.30 ක් වාර්ෂික අයවැය ප්‍රතිපාදන සළසා තිබුණි. 2019 වර්ෂයේදී ඉන් රු.629,000 ක් වැය කර ප්‍රතිලාභීන් 31 දෙනෙකු වෙත ප්‍රතිලාභ ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සියයට 27 ක් වූ අතර, භෞතික කාර්යසාධනය සියයට 5 ක් වැනි අවම මට්ටමක පැවැතුණි.

### ශිල්පීන් වෙත යන්ත්‍ර හා උපකරණ බෙදාදීම

ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන වෙනුවෙන් 2019 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1.29 ක් ජාතික ශිල්ප සභාව විසින් වැය කර මන්නාරම තාරපුරම් ගම්මානයේ ශිල්පීන් වෙත බෙදා දීම සඳහා අත් යන්ත්‍ර මැෂින්, මහන මැෂින් හා උපකරණ මිලදී ගෙන තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව එම උපකරණ සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් වෙත බෙදා දිය යුතුව තිබුණි. 2020 ජුනි මාසය වන විටත් එම භාණ්ඩ ප්‍රතිලාභීන් වෙත බෙදාදීම අවසන් කර නොතිබුණි.

### ආයෝජනය වෙනුවෙන් ප්‍රතිලාභ නොලැබීම

2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් මහවැලි මෙරින් සිමෙන්ති පුද්ගලික සමාගමේ එකතුව රු.මිලියන 6.40 ක් කොටස් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කර තිබුණි. එම ආයෝජන සඳහා 2014 වර්ෂයේදී පමණක් ප්‍රතිලාභ ලැබී තිබූ අතර, ඉන් පසුව කිසිඳු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම ගිණුම්ගත කළ ආකාරය සහ ආයෝජනයට අදාළ කොටස් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

### හුණුගල් නිධිය බඳුදීමේ ගිවිසුම

1996 අගෝස්තු 23 දින හොල්සිම් සමාගමට හුණුගල් නිධිය බදුදීම සඳහා ශ්‍රී ලංකා සිමේන්ති සංස්ථාව අංක 495 දරන බදු ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ කොන්දේසි කිහිපයක් 2019 නොවැම්බර් 07 දින අත්සන් කළ අංක 268 දරන අතිරේක බදු ගිවිසුමෙන් සංශෝධනය කර තිබුණි. ඒ අනුව සංශෝධිත බදු කුළිය ලෙස

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව එකතුව රු.මිලියන 58.02 ක් වාරික දෙකකින් ලබාගෙන තිබුණි. භාණ්ඩාගාරයෙන් ලිඛිත අනුමැතිය රහිත එළඹි මෙම අතිරේක බදු ගිවිසුම නිසා 1993 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලයට අදාළව වැඩි විය යුතු එ.ජ.ඩොලර් මිලියන 1.37 ක බදු කුළිය සංස්ථාවට අහිමි වී තිබුණි. අවාසි දායක වූ සංශෝධිත බදු ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී නොතිබුණි.

## සංස්ථාවට අයත් ඉඩමක් බැංකුවට උකස් තැබීම

2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව සතු කොල්ලුපිටියේ පිහිටි ඉඩමක් බැංකුවකට උකස් කර ලබාගෙන රු.මිලියන 97.70 ක ණය මුදලක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලබා ගෙන තිබුණි. එම ණය මුදල 2018 ජූනි 25 දින බැංකුව විසින් උපලේඛන ගත කර තිබූ අතර, එම ණය වෙනුවෙන් 2019 වර්ෂය තුළ ණය වාරික ලෙස එකතුව රු.මිලියන 24.00 ක් ද, ණය පොළී ලෙස රු.මිලියන 11.54 ක් ද ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 73.70 ක හිඟ ණය මුදලක්ද ගෙවිය යුතුව තිබුණි. එසේ හිඟ ණය පියවීමට තිබියදී 2019 දෙසැම්බර් 31 දින රු.මිලියන 19.26 ක් සහ 2020 ජනවාරි මාසයේ රු.මිලියන 51.50 ක් ණය පොළියට වඩා අඩු පොළී ආදායම් ලබා ගැනීම සඳහා ලිඛිත අවසරයකින් තොරව එම මුදල් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

# ඉඩම් කටයුතු

තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් සම්පත ප්‍රසස්ථ ලෙස භාවිතා කිරීම ඉඩම් අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ඉටු කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 04ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල 02 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටුකළ යුතුව තිබුණි.

- ඉඩම් විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තිරසර සංවර්ධනය උදෙසා ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සිදුකරනු ලබන අධ්‍යයනයන් මත අදාළ අංශ සඳහා උපදෙස් දීම.
- රජයේඉඩම් පරිපාලනය සහ කළමනාකරණය.
- නීතියෙන් නිශ්චය කොට දක්වා ඇති පරිදි ඉඩම් අන්සතු කිරීම.
- ජාතික අවශ්‍යතාවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.
- රජයේ ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා දීමනා පත්‍ර ලබාදීම.
- සංවර්ධන සහ නේවාසික අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් දීර්ඝ කාලීනව සහ කෙටිකාලීනව බදුදීම.
- ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා හිමිකම් සහතික ලියාපදිංචි කිරීම.
- ජාතික සැලැසුම්කරණය ඉලක්ක කරගෙන ඉඩම් මැනීම, සිතියම් සකස් කිරීම හා අනුරේඛණ සම්පාදනය කිරීම.
- රජයේ සියලුම ඉඩම් පිළිබඳව තොරතුරු පද්ධතියක් සකස් කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.මිලියන 26,585.71 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 22,492.68 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15.40 ක් හෙවත් රු.මිලියන 4,093.03 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 30 හි දැක්වේ.




රූපසටහන 30 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත සභා විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම පිළිබඳව සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

## බිම් සවිය වැඩසටහන

2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ දක්වා තිබුණු යෝජිත ක්‍රියාකාරකම්වලින් පහත ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

- ඉඩම් සංවර්ධන අංශයේ ප්‍රචාරක වැඩසටහන්හි නිරවුල් ඉඩම් හිමිකම් ලබා ගැනීම පිළිබඳ අත් පත්‍රිකා සහ අත්පොත් 50,000ක් පිළියෙල කිරීම සහ බෙදාහැරීම.
- විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සම්මුඛ සාකච්ඡා 05 ක් පැවැත්වීමද, කෙටි දැන්වීම් 05ක් පළ කිරීමද, බිම් සවිය වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්හි හිමිකම් විමර්ශන නිලධාරීන්, නීති නිලධාරීන්, බැංකු නිලධාරීන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළුව නිලධාරීන් 600 ක් සඳහා වැඩසටහන් 04 ක් පැවැත්වීම.
- පළාත් පාලන ආයතන ප්‍රධානීන් 100 ක් සඳහා වැඩසටහන් 02 ක් පැවැත්වීම, ග්‍රාම නිලධාරීන් ඇතුළු අදාළ අනෙකුත් ක්ෂේත්‍රගත නිලධාරීන් 500 ක් සඳහා වැඩසටහන් 04 ක් පැවැත්වීම හා පරිගණක සහ ජාලගත තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම පහසුකරණය යටතේ හිමිකම් සහතිකයක් නිකුත් කිරීම සම්බන්ධ රාජකාරි ඉටු කරන අමාත්‍යාංශයේ අදාළ අංශ සඳහා අතවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

## පනත් සංශෝධනය කිරීම

ඉඩම් ප්‍රතිපත්ති අංශයේ අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් සහ නීති කෙටුම්පත් හා නීතිපති නිරීක්ෂණ ලබා ගෙන ඉඩම් සංවර්ධන ආඥා පනත, සභාධිපත්‍ය පනත, රජයේ ඉඩම් බැංකු පනත හා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති පනත සංශෝධනය කිරීම සහ ගැසට් පත්‍ර යේ පල කරනු ලබන නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම සිදු කර නොතිබුණි.

## ඉඩම් අත්පත් කිරීම

1950 අංක 09 දරන ඉඩම් පනතේ 38(අ) අතුරු විධාන ආඥාව පරිදි රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉඩම් පුද්ගලික අංශයෙන් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය ඉඩම් අමාත්‍යාංශය, සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කරන ආයතනය, තක්සේරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඊට අදාළ අනෙකුත් ආයතනයන්හි සාමූහික ප්‍රතිඵලයක් වන අතර ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සහ කාල වකවානු හඳුනා ගැනීමෙන් සිදුකළ යුතුව තිබුණි. එවැනි වැඩ පිළිවෙලක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එසේ අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 38(අ) ආඥාව හා 38(අ) අතුරු ආඥාව නිකුත් කර අවසන් කර තිබුණු ගොනු 1,311 කින්
ගොනු 315 ක් වැනි අඩු සංඛ්‍යාවක කටයුතු නිම කර තිබුණි. ඒ අනුව,1980 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අත්පත් කරගෙන තිබූ ඉඩම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වන්දි පොළී ලෙස රු.මිලියන 920.54 ක් ගෙවා තිබුණි. මෙවැනි විශාල මුදලක් වන්දි පොලිය ලෙස ගෙවීමට අත්පත් කර ගැනීමේ පනතේ සඳහන් අදාළ

කාර්යයන් අමාත්‍යාංශයේ නිලධාරින් සහ සම්බන්ධිත ආයතන වල නිලධාරීන් විසින් කාර්යක්ෂම ලෙස ඉටු නොකිරීම හේතු වී තිබුණි. ඒ බව

- වර්ෂ 18 ක් ගතවුවත්, වලතර කණිටු විදුහලට ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් නොවීම,
- වර්ෂ 12 ක් ගත වුවත්, මහාමාළිය රජයේ කණිටු විදුහලට ක්‍රීඩා පිටියක් හා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඉඩම අත්කර ගැනීමේ කටයුතු අවසන් නොවීම,
- තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරිමේ ව්‍යාපෘතිය සඳහා 2001 වර්ෂයේ සිට වර්ෂ 18ක කාලයක් ගත වී තිබුණත් වන්දි නොගෙවීම,
- මතුගම ආනන්ද ශාස්ත්‍රාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2004 වර්ෂයේ සිට වර්ෂ 15 ක් ගත වී තිබුණත් වන්දි නොගෙවීම හා
- හඟුරන්කෙත ආනන්ද ශාස්ත්‍රාලයේ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වන්දි ගෙවීමට වර්ෂ 05 ක් ගත වීම,

ආදිය නියැදි විගණන පරීක්ෂණවලින් තහවුරු විය.

### රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය

තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කර 2013 වර්ෂයේ සිට පවත්වාගෙන යන අතර ඒ සඳහා 2019 වර්ෂය දක්වා රු.මිලියන 129.98 ක වියදමක් කර තිබුණි. බදු දී ඇති සියළු ඉඩම් සම්බන්ධ තොරතුරු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පද්ධතියට ඇතුළත් කර නොතිබුණු බැවින් බදු අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මෙම පද්ධතියෙන් ලබා ගැනීමේ හැකියාවක් නොතිබුණි.

### ඉඩම් බදු ආදායම් කළමනාකරණය කිරීම

අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන්හි ඉඩම් බදු ආදායම් රැස් කිරීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර එම ආදායම් එකතු කිරීමට අදාළ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 28.75 ක ආදායමක් අයකර ගෙන නොතිබුණි.

අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන් හැර සෙසු ප්‍රදේශවල බදු ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර එම ප්‍රදේශවල රජයේ ඉඩම් පරිපාලනය හා පරිපාලනය සම්බන්ධ නිලධාරීන් අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලතල රජයේ ඉඩම් ආඥා පනතේ 91 වගන්තිය, 2010 පෙබරවාරි 03 දිනැති අංක එස් පී/ ආර් ඩී /02 /10 දරන රාජ්‍ය ඉඩම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබුණි. එසේ වුවද, බදු දීමේ ක්‍රියාවලියේ හා බදු මුදල් අය කිරීමේ අධීක්ෂණ කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 2,913.07 ක ආදායමක් හිඟව පැවතුණි.

### ඉලක්ක කරා ළඟා නොවීම

බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂයේදී අවසන් කිරීමට මූලිකව සැලසුම් කර තිබුණත්, 2019 වර්ෂය අවසන් වනවිට වර්ෂ 17 ක කාලයක් ගතවී තිබුණත්, එම වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 කට අයත් මුළු ග්‍රාම

නිලධාරී කොට්ඨාශ 3621 කින් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 1359 ක මිනුම් කටයුතු අවසන් කර තිබුණි. ඒ අනුව සියයට 46 ක ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි.

හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාව අතරතුර 2019 වර්ෂයේ දී ලිපිගොනු 34,660 ක් පසෙක තබා ඇති අතර 2019 දෙසැම්බර් 31 දිනට පසෙක තබන ලද සමස්ත ලිපිගොනු සංඛ්‍යාව 449,203 ක් වී තිබුණි. නමුත් 2019 වර්ෂය තුළ පසෙක තැබූ ලිපිගොනුවලින් 10,508 ක පමණක් ගැටළු නිරවුල් කර හිමිකම් ප්‍රකාශ නිකුත් කර තිබුණි. ඒ අනුව පසෙක තැබූ ගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රගතිය සියයට 30 ක් වී තිබුණි.

## ඉඩම් බදුදීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කාර්මික අංශයට බදු පදනම මත ඉඩම් පැවරීමේදී රජයේ තක්සේරුවෙන් සියයට 6 ක බදු ප්‍රතිශතයක් අයකිරීම සභාවේ සාමාන්‍ය ක්‍රමවේදය වී තිබුණි. ලේලන්ඩ් වත්ත ඉඩමෙන් කාර්මික කටයුත්තක් සඳහා බදු ලබාදීමේදී තක්සේරුවෙන් සියයට 4 ක් වාර්ෂිකව අයකිරීම මත රු.මිලියන 17.20 ක් සභාවට අහිමි වී තිබුණි. එසේම ලේලන්ඩ් වත්ත ඉඩමෙන් අක්කර 06 ක් 2005 සැප්තැම්බර් 09 දින බදු පදනමට බදුකරුට ලබාදී තිබුණද, වර්ෂ 14 ක කාලයක් ගත වී තිබුණත්, බදු ගිවිසුමක් ලබාදී නොතිබුණි. ටෙම්පල්බර්ග් වත්ත ඉඩමෙන් පර්චස් 80 ක් 2003 දෙසැම්බර් 19 දින බදු පදනම ලබාදීමට වර්ෂ 16 ක් ගත වී තිබුණත්, බදු ගිවිසුමක් ලබාදී නොතිබුණි. කොටගල වත්ත ඉඩමෙන් අක්කර 75 ක් තිස් අවුරුදු බදු පදනමට ලබාදී සමාලෝචිත වර්ෂය වන විට බදු ගිවිසුම අවසන් වී වර්ෂ 10 ක් ගත වී තිබුණද, නව බදු ගිවිසුමකට එළඹීමට හෝ පැරණි බදු ගිවිසුම අළුත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති සඳහා ඉඩම් බදු පදනම මත ලබා දීමේදී බදුකරු සමඟ බදු ගිවිසුමකට එළඹිය යුතු වුවත්, එලෙස බදු ගිවිසුම් නොමැතිව ඉඩම් ලබාදුන් අවස්ථා නිරීක්ෂණය විය.

## ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම

1972 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ එම ඉඩම්වල අක්කර ගණන එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැර කිරීම්වලට අදාළ සියලුම විස්තර ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණි. ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 676.17 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

## අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම

2002 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීමේ ක්‍රමවේදයට පරිබාහිරව ඉඩම් අන්සතු කර තිබූ අතර 2004 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් එම ක්‍රියාවලිය තහනම් කර තිබුණි. එම ඉඩම් භුක්තියට පවරාදීමක් හා භුක්තියට පවරාදීමක් සිදු නොකරන ලද ලෙස විධි 02 කින් ලැයිස්තු ගත කර තිබුණි. භුක්තියට පවරා දෙන ඉඩම් අතරින් අක්කර 760 පර්චස් 31 ක් ආපසු බාරදී නොතිබුණි. භුක්තිය භාර නොදුන් අක්කර 1689 ක් සඳහා ලබා දී තිබූ අත්තිකාරම් මුදල් එම ඉල්ලුම්කරුවන්ට ආපසු ලබා දීමට කටයුතු

කර නොතිබුණු අතර එම ඉඩම් පිළිබඳ පසුවිපරම් කටයුතු ද සිදුකර නොතිබුණි.

### මැනුම් අවශ්‍යතාවය ඉටු කිරීමට අපොහොසත්වීම

මිනින්දෝරු දෙපාර්තමේන්තුව වර්ෂ 37කට පමණ කාලයක සිට දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකු මාසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20ක් වී තිබුණි. මෙම සම්මතය වර්තමාන මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන පරිදි සමාලෝචනය නොකිරීම නිසා වර්ෂ 10 කටත් අධික කාලයක සිට පවතින බිම් කැබලි මිලියන 3.6 ඉක්මවූ රජයේ මැනුම් අවශ්‍යතාවය සහ දෙපාර්තමේන්තුවට සමාලෝචිත වර්ෂය අවසානයට ලැබී තිබුණු මැනුම් නියෝග 38,879 කින් මැනුම් නියෝග 25,809 ක් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

### ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීම හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

2010 මැයි 20 දිනැති අංක 1654/21 දරන (අති විශේෂ) ගැසට් පත්‍රයේ පලකල නිවේදනය මඟින් ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ මූලික අරමුණ ඇතිව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමට හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සකස්කර නොතිබුණි.

### මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි

2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යාවහාරයන් ක්‍රමවත්ව පවත්නා ගන්නා බවටත්, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තීය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බවටත් තහවුරු කිරීම අරමුණු කරගෙන ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාව විසින් ඉදිරිපත් කර තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 103 කින් සභාව විසින් පැමිණිලි 54 ක් හෙවත් පැමිණිලිවලින් සියයට 52 ක් පමණක් විසඳා තිබුණි. සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදු කරන පුද්ගලයින් සම්බන්ධව සොයා බැලීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගද අනුගමනය කර නොතිබුණි.

| ප්‍රවාහන |
|---|
| අංශ |
| මගී ප්‍රවාහනය<br>වරාය හා නාවික කටයුතු<br>මහාමාර්ග |
| නිරීක්ෂණ |

- මාතර සිට කතරගම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- කැළණිවැලි දුම්රිය මාර්ගය
- දුම්රිය ප්‍රමාදවීම් හා දුම්රිය වාර ගණන අඩුවීම
- දුම්රිය එන්ජින් කට්ටල මිලදී නොගැනීම
- සැලැසුම් කළ කාර්යභාරයයන් ඉටු නොකිරිම
- දුම්රිය එන්ජින් හා බලවේග කට්ටල මිලදී ගැනීම
- වාහන රක්ෂණවලින් ලබන ආදායම
- ඉඩම්වල අයිතිය තහවුරු කර නොගැනීම
- බස්රථ ධාවනය කිරිම නිෂ්කාර්ය වත්කම්
- බස් ටිකට් මැෂින් මිලදී ගැනීම
- සුබෝප‍භෝගී බස්රථ සඳහා කැමරා හා ජීපීඑස් පද්ධති පවත්වා ගෙනයාම
- තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම
- මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරිම
- කිලිනොච්චිය බස් නැවතුම්පල ඉදිකිරිම
- PAS (Process Automation System) ව්‍යාපෘතිය
- අමතර කොටස් මිලදී ගැනීම
- නිෂ්කාර්ය වත්කම්
- බස් ටිකට් මැෂින් මිලදී ගැනීම
- සුබෝප‍භෝගී බස්රථ සඳහා කැමරා හා ජීපීඑස් පද්ධති පවත්වා ගෙනයාම
- වෛද්‍ය සේවා සැපයීම
- රුධිර ඝන පරික්ෂණ කට්ටල
- සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීම

- කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
- සිවිල් ගුවන් සේවා පනතට අනුකූල නොවීම
- වත්කම් තක්සේරු නොකිරීම
- ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම
- ලබාගත් ණය වෙනුවෙන් වාරික නොගෙවීම
- A 350-900 ගුවන් යානා 04 ක් මිලදී ගැනීම
- සාමූහික ගිවිසුම් යාවත්කාලින නොකිරීම
- A 330-200 වර්ගයේ 4R-ALS ගුවන්යානය ඌන උපයෝජනය
- තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟා නොවීම
- රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීම
- බහලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස
- නැව් බඩු මෙහෙයුම් කටයුතු
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම
- නැගෙනහිර බහලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම.
- හම්බන්තොට වරාය ඉදිරිකිරිම සඳහා ලබා ගත් විදේශ ණය
- පරිපාලිත සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇපවීම
- වරාය පරිශ්‍රය තුළ CCTV කැමරා පද්ධතිය සවි නොකිරිම
- රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා අභියාචනය කිරීම
- මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්
- මුදල් පනතට අනුකූල නොවීම්
- නිලධාරීන් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු අධිකාරිය විසින් ගෙවීම
- වැටුප් වැඩිකිරීම සඳහා අනුමැතිය ලබා නොගැනීම
- වත්කම් ඌන උපයෝජනය
- අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම
- කාර්ය මණ්ඩලයේ ඉංජිනේරුවරුන් වෙනත් ව්‍යාපෘතිවලට මුදා හැරිම
- අධිවේගී මාර්ගවලින් ලද ආදායම පරිබාහිර කාර්යයන්ට යෙදීම
- පොලිස් නිලධාරීන්ට පහසුකම් සැලැසීම
- ව්‍යාපෘති ආරම්භ නොකිරිම
- ඉලක්කගත වැඩ ප්‍රමාණයන් නිම නොකිරිම
- දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය
- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සහ දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන
- මධ්‍යම අධිවේගී මාර්ගය
- මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටස

- වන්දි ගෙවූ ඉඩම් කැබැලි මාර්ග සංවර්ධන අධිකාරියට පවරා නොගැනීම
- ණය අරමුදල් උපයෝජනය නොකිරීම
- විනිමය අලාභයන්
- ව්‍යාපෘති වැඩ විෂයයන් අවසන්වීමෙන් පසුව කඩිනමින් ඇවර නොකිරීම

# මගී ප්‍රවාහනය



ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම මෙම අංශයේ මෙහෙවර වී තිබුණි. එම මෙහෙවර ඉටු කර ගැනීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- නව තාක්ෂණය යොදා ගනිමින් ඒකාබද්ධ මගී සහ භාණ්ඩ දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය හා දුම්රිය සේවා සැපයීම
- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම
- පෞද්ගලික මගී සේවාවන් නියාමනය කිරීම
- නව දුම්රිය මාර්ග ඉදිකිරීම හා පවතින දුම්රිය මාර්ග පුළුල් කිරීම සහ ඊට අදාළ ඉඩම් පවරා ගැනීම
- මෝටර්රථ ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
- මෝටර් රථවාහනවලට අදාළ නීතිරීති හා මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ නියාමනය කිරීම
- ගුවන් තොටුපලවල් සංවර්ධනය හා නියාමන කටයුතු සිදු කිරීම
- ගුවන් තොටුපල් මගින් සැලසෙන සේවාවල ප්‍රගතිය, ගාස්තු හා ගුණාත්මකභාවය නියාමනය කිරීම
- ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම
- ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ ප්‍රවර්ධනය සහ නියාමනය
- දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම
- පුද්ගලික ගුවන් ගමන් සේවා අධීක්ෂණය හා නියාමනය
- ගුවන් යානා ලියාපදිංචි කිරීම
- හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මෙම අංශය වෙත රු.මිලියන 202,224.71 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද, එම වර්ෂ 03 සඳහා එකතුව රු. මිලියන 164,446.48 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම වර්ෂ 03 තුළ පාර්ලිමේන්තුව සලසා දී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 18.68 ක් හෙවත් රු.බිලියන 37,778.23 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 31 හි දැක්වේ.




රූපසටහන 31 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## මාතර සිට කතරගම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මාතර සිට කතරගම දක්වා මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 36,166 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත 2013 අගෝස්තු 01 දින ආරම්භ කර තිබුණි. 2016 ජූලි 31 දින වන විට එම ව්‍යාපෘතිය අවසන් කළ යුතුව තිබුණත්, එකී කාලය 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. 2019 වර්ෂයේදී බෙලිඅත්ත දක්වා දුම්රිය ධාවනය කිරීම ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ සඳහා රු.මිලියන 38,158 ක් වැය කර තිබුණි. මෙම මාර්ගය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීම රජයේ තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මැදිහත්වීමෙන් සිදු කළ යුතුව තිබුණි. ඊට අනුකූල නොවී ව්‍යාපෘති නිලධාරීන්ගේ මැදිහත්වීම මත අවිධිමත් ආකාරයට ඉඩම් පවරාගැනීම සිදු කිරීම නිසා පහත සඳහන් අඩුපාඩු සිදු වී තිබුණි.

- ඉඩම් හිමියන්ගේ ඉඩම් පළමුව අතරමැදි පුද්ගලයින් විසින් අඩු වටිනාකමට පවරා ගැනීමෙන් පසුව ඔවුන්ගෙන් වැඩි වටිනාකමකට පරිත්‍යාග වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් පවරා ගැනීම
- විධිමත් ආකාරයට පවරාගත් ඉඩම්වලට අමතරව පැවරුම් ඔප්පු 62 ක් යටතේ එකතුව රු.මිලියන 57.58 ක් වූ අක්කර 4 පර්චස් 31.37 ක ඉඩම් ප්‍රමාණයක් අතරමැදි ගැණුම්කරුවන්ගෙන් ලබාගෙන ඒවා නිෂ්කාර්යව පැවතීම
- පවරාගත් ඉඩම් අනවසරයෙන් පුද්ගයන් විසින් භුක්ති විඳීම

ණය ගිවිසුම් කොන්දේසි 1.3 ප්‍රකාරව ණය ගිවිසුම අත්සන් කළ දින සිට වර්ෂ 04 ක් සම්පූර්ණ වන 2017 අප්‍රේල් මාසය ඇතුළත ගිවිසුම්ගත ණය මුදල ලබාගත යුතුව තිබුණි. මාර්ගය ඉදිකිරීමේ ප්‍රමාදය මත 2017 මැයි මාසයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය වෙනුවෙන් රු.මිලියන 5.35 ක විදේශ විනාමය අලාභයක් සිදු වි තිබුණි.

## කැළණිවැලි දුම්රිය මාර්ගය

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කැලණිවැලි දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යයන, නිර්මාණ සැලැසුම් හා උපදේශනය 2018 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර එය 2020 වර්ෂයේදී නිමකළ යුතුව තිබුණි. ව්‍යාපෘතියට අදාල ණය ප්‍රදානය කිරීම සඳහා සැලැසුම් සකස් කිරීමට හා ලංසු ලේඛන පිළියෙල කිරීමට යුරෝ මිලියන 256,030 ක්, ඇමරිකානු ඩොලර් මිලියන 6.48 ක් හා රු.මිලියන 379.21 ක්වූ වටිනාකමට 2017 දෙසැම්බර් 13 දින පත්කළ උපදේශන සමාගමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට අදාළ උපදේශන සමාගම විසින් කොළඹ සිට කළුතර, කොළඹ සිට රඹුක්කන හා රාගම සිට මීගමුව දක්වා දුම්රිය මාර්ගවල අවසන් ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ මරදාන සිට පාදුක්ක දක්වා විස්තරාත්මක සැලැසුම් සහිතව ලංසු ලේඛණ සහ ප්‍රධාන මාර්ගයේ විස්තරාත්මක සැලැසුම් ඉදිරිපත් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට කැළණිවැලි මාර්ගයේ සැලැසුම් සහ ලංසු ලේඛන සියයට 60 ක ප්‍රමාණයක් සම්පූර්ණ කළ යුතුව තිබුණත්, එයද ඉටු කර නොතිබුණි. එසේම 2019 මාර්තු 15 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා රු.මිලියන 12.89 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. උපදේශන සේවා ගිවිසුමේ ඇමුණුම D අනුව උපදේශන සමාගම විසින් නිශ්චිතව දක්වා ඇති කාල රාමුවට අනුව වාර්තා ඉදිරිපත් කළ පසු ගෙවීම් සිදුකළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී උපදේශන සමාගම වෙත රු.මිලියන 390.22 ක ගෙවීමක් මාසික පදනම මත සිදු කර තිබුණි.

## දුම්රිය ප්‍රමාදවීම් හා දුම්රිය වාර ගණන අඩුවීම

සමාලෝචිත වර්ෂයේදී මගී දුම්රිය ප්‍රමාදවීම් 69,716 ක්ද, භාණ්ඩ දුම්රිය ප්‍රමාදවීම් 5,160 ක්ද සිදු වී තිබුණි. ඉන් විනාඩි 30 ඉක්මවා ප්‍රමාදවීම් පිළිවෙලින් 18,152 ක් හා 4,256 ක් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ සැලැසුම් කරන ලද මගී දුම්රිය ධාවන වාර ගණන 124,950 ක් වුවද, ධාවනය කරන ලද මගී දුම්රිය වාර ගණන 115,232 ක් වී තිබුණි. දුම්රිය වාර අවලංගුවීම් 5,710 ක් වී තිබුණු අතර එයින් සියයට 59 ක අවලංගු කිරිම් දුම්රිය වැඩ වර්ජන හේතුවෙන් සිදු වී තිබුණි.

## දුම්රිය එන්ජින් කට්ටල මිලදී නොගැනීම

2019 වර්ෂයේදී දුම්රිය එන්ජින් කට්ටල මිලදී ගැනිම සඳහා දේශීය අරමුදල් වලින් රු.මිලියන 1,600 ක්ද, විදේශීය අරමුදල්වලින් රු.මිලියන 100 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 1,700 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දුම්රිය එන්ජින් මිලදී ගැනිම සඳහා කටයුතු නොකිරිම නිසා එම ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කිරිමට නොහැකි වී තිබුණි

## සැලැසුම් කළ කාර්යභාරයයන් ඉටු නොකිරිම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දැනට ක්‍රියාත්මක කාලසටහන් හා දුම්රිය ඇණිය අනුව පවත්නා දුම්රිය මාර්ගවල අළුතින් දුම්රියන් ධාවනය කරවීම දුෂ්කර වී තිබුණි. එමහේතුවෙන් දුම්රිය මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතුව තිබුණි. ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී විදේශ ණය අරමුදල් යටතේ රු.මිලියන 4,674.86 ක් හා විදේශීය අරමුදල් හා සබැදි දේශිය අරමුදල් යටතේ රු.මිලියන 500 ක වශයෙන් එකතුව රු.මිලියන 5,174.86 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,915.54 ක් උපයෝජනය කර තිබුණි. මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ග පුළුල් කිරීම, මගී දුම්රිය මැදිරි 160 ක් මිළදී ගැනීම, මහව සිට ඕමන්ත දක්වා සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම, පොල්ගහවෙල - කුරුණෑගල දක්වා වූ ද්විත්ව දුම්රිය මාර්ග ඉදිකිරීම, රත්මලාන වැඩපළ වැඩිදියුණු කිරීම, ඩීසල් බලවේග කට්ටල 02 ක් මිලදී ගැනීම යන කාර්යයන් හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, මගී දුම්රිය මැදිරි 160 මිලදී ගැනීමට අදාළව මිල ගණන් කැඳවීම සඳහා අත්තිකාරම් මුදලක් පමණක් ගෙවා තිබුණත් 2020 ජුනි 20 දින වන විටත් අදාළ මගී මැදිරි ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

## දුම්රිය එන්ජින් හා බලවේග කට්ටල මිලදී ගැනීම

- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය එන්ජින් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඇමරිකානු මූලා පැකේජය යටතේ වූ අශ්වබල 3000 ක එන්ජිමෙහි ඇස්තමේන්තුගත මිල හා ඉන්දියානු ණය ආධාර යටතේ එම්/එස් රයිට්ස් සමාගම ඉදිරිපත් කළ මිල සඳහා ශුද්ධ වර්තමාන අගයන් සැසඳීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව සිදු කර තිබුණි. ඒ අනුව ශුද්ධ වර්තමාන අගයන් හොඳින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඇමරිකානු එන්ජින් ඉන්දීය එන්ජින්වලට වඩා ආර්ථික වශයෙන් වඩා ලාභදායී බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. නමුත් ඇමරිකානු පැකේජය අත්හැර ඉන්දීය ණය ආධාර යටතේ දුම්රිය එන්ජින් මිලදී ගැනීම නිසා එ.ජ.ඩොලර් මිලියන 10.5 ක් හෙවත් රු.මිලියන 1,905.23 ක පාඩුවක් සිදුවී තිබුණි.

- ඩොලර් ණය රේඛා ගිවිසුම යටතේ 2017 ජුනි 06 දින ඉන්දියානු Exim බැංකුව විසින් දුම්රිය මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා එ.ජ.ඩොලර් මිලියන 136 ක ණය ප්‍රතිපාදනයක් සලසා තිබුණි. එම කාර්යය සඳහා ප්‍රමුඛතාවය ලබා නොදීම සහ 2018 වර්ෂයේ දත්ත අනුව සේවයේ යෙදිය හැකි දුම්රිය එන්ජින් 111 ක්ද ඇතුළුව දුම්රිය එන්ජින් 150 ක බල ඇණියක් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පැවැතුණි. දුම්රිය ධාවනයට අවශ්‍ය අනෙකුත් අවශ්‍යතාවල වර්ධනයක් සිදු නොකර හා පවතින කාල සටහන් අවශ්‍යතා සහ ඉදිරියේදී සැලැසුම් කරන කාලසටහන් අවශ්‍යතාවයන්ද සැලැකිල්ලට ගත්විට නව දුම්රිය එන්ජන් මිලදී ගැනීම තුළින් එන්ජින් ඇණිය පමණක් වැඩිකිරීමෙන් ධාවන කාර්යසාධනය වැඩි කිරීම දුෂ්කර වී තිබුණි.

- දුම්රිය දෙපාර්තමේන්තුවට රෝලිං තොග (දුම්රිය ඇණිය) මිලදී ගැනීම සඳහා ඩොලර් ණය රේඛා ගිවිසුම යටතේ එ.ජ.ඩොලර් මිලියන 177 ක ප්‍රතිපාදනයෙන් S 13 බලවේග කට්ටල 06 ක් මිලදී ගෙන තිබුණි. එහිදී දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා රු.මිලියන 236.10 ක් වැඩියෙන් වැය කර එම බලවේග කට්ටල මිලදී ගෙන තිබුණි.

## වාහන රක්ෂණවලින් ලබන ආදායම

රක්ෂණ ආයතනවල තෙවන පාර්ශවීය වාහන රක්ෂණය කිරීම්වලින් සියයට එකක් බැගින් වන අයකර ගන්නා ආදායම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබුණි. රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන ආදායමේ නිවැරදිභාවය සනාථ කර ගැනීමට සභාව අපොහොසතක් වී තිබුණි.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම

තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රයට අනුව සියළුම මාර්ග අනතුරු අවම කිරීම හා ආරක්ෂක මාර්ග පද්ධතියක් ඇතිකිරීම යන තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීමේ ප්‍රගතියක් 2019 වර්ෂයේදී අනාවරණය වේ. 2017 වර්ෂයේදී රථවාහන අනතුරු 37,596 ක් සිදු වී තිබුණු අතර, 2019 වර්ෂය වන විට අනතුරු 30,433 ක් දක්වා අඩුකර ගැනීමට හැකි වී තිබුණි. විස්තර රූපසටහන 32 හි දැක්වේ.




රූපසටහන 32 - රටේ සිදුවන අනතුරු සංඛ්‍යාව
මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසියේ පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශයේ තොරතුරු වාර්තාව

ඉහත සඳහන් පරිදි අනතුරු වලක්වා ගැනීමේ ප්‍රගතියක් රටෙහි ඇති වී තිබුණත්, 2019 දෙසැම්බර් 31 දින වන විට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා වසර 22 ක් කාලයක් ගත වී තිබියදීත් එය කොමිෂන් සභාවක් බවට පරිවර්තනය කර ඊට අවශ්‍ය බලතල හා අධිකාරිය ලබා දී නොතිබුණු බැවින් මාර්ග ආරක්ෂාව වෙනුවෙන් සමහර කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම 1988 අංක 05 දරන මෝටර් වාහන (සංශෝධිත) පනතේ 05 වන වගන්තිය ප්‍රකාරව වාර 04 ක් සභාව රැස් වී තිබුණද, සාමාජිකයන් 18 දෙනාම රැස් වී සභාවේ කාර්යසාධනය පිළිබඳව සාකච්ඡා කර නොතිබුණි.

## මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට මගී සේවා අවසර පත්‍ර 3103 ක් නිකුත් කර තිබුණි. ඉන් අවසර පත්‍ර 223 ක් ටෙන්ඩර් ක්‍රමවේදය අනුව නිකුත් කර තිබුණි. බලපත්‍ර 2880 ක් ටෙන්ඩර් ක්‍රමවේදයට පෙර නිකුත් කර ඇති බලපත්‍ර වන අතර ඒවා වාර්ෂිකව රු.3,000 ක් හා රු.15,000 ක් ගෙවීම මත අළුත්කරනු ලබන බලපත්‍ර වේ. මේ අනුව කොමිෂන් සභාව අනුමත ක්‍රියාපරිපාටියකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම විවිධ ක්‍රම යටතේ සිදුකර තිබුණි.

- අධිවේගී මාර්ගයේ දිනකට අවම තාක්ෂණික අගය මත මගී සේවා අවසර පත්‍ර 61 ක්ද, රු.2500 ක ගාස්තු මත මගී සේවා අවසර පත්‍ර 16 ක්ද ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණි. බස් රථ හිමියන් විසින් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවක් හේතුවෙන් දිනකට රු.2,500 ගාස්තු අය කිරීමට තීරණය කර තිබුණු අතර, 2020 ජනවාරි මාසය වන විටද නඩු තීන්දුව ප්‍රකාශයට පත් වී නොතිබුණි.

- 2019 වර්ෂයේදී මගී සමීක්ෂණ සිදු කිරීම මගින් නව මාර්ග හඳුනාගැනීම් සිදු කර තිබුණද, කොමිෂන් සභාව විසින් නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, විශාල මගී ඉල්ලුම් සහිත අවස්ථාවලදී දිනකට රු.2,000 ක්, රු.1,000 ක් හා රු.1,500 ක් වශයෙන් දෛනික ගාස්තු අයකිරීම මත තාවකාලික මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමටද කටයුතු කර තිබුණි.

## කිලිනොච්චිය බස් නැවතුම්පල ඉදිකිරීම

කිලිනොච්චි බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 29 දින ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2016 දෙසැම්බර් 29 දින පුද්ගලික සමාගමක් සමග කොන්ත්‍රාත්තුව මාස 12 කින් නිම කිරීමට රු. මිලියන 48.77 ක කොන්ත්‍රාත් වටිනාකම ක් මත ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම පැහැර හැරීම් නිසා කොමිෂන් සභාව විසින් ගිවිසුම අවලංගු කර තිබුණි. නිම කරන ලද වැඩ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 16.47ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු තාක්ෂණික හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් බව ප්‍රසම්පාදන කමිටුව සහතික කර තිබුණු අතර, කොන්ත්‍රාත්කරු අසාර්ථකවීම නිසා ඔහුගේ මනාපය පරිදි කොන්ත්‍රාතුව අවසන් කර ඔහුට වාසිදායක වන පරිදි ගිවිසුම් කොන්දේසි සඳහා අනුගතවීමට කටයුතු කර තිබුණි. මේ නිසා ගිවිසුම් ප්‍රකාරව එකඟවූ වටිනාකම මත නිශ්චිත කාලය තුළදී අවසන් කළ යුතුව තිබුණු මෙම ඉදිකිරීම, කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකභාවය මත සියයට 50 ක පමණ ඉදිකිරීම් කටයුතු කර අතරමග නතර කිරීම නිසා බස් නැවතුම්පල නිෂ්කාර්යව දිරාපත් වෙමින් පැවැතුණි. කොන්ත්‍රාත් ගිවිසුම පරිදි අදාල ක්‍රියාමාර්ග නොගැනීම නිසා ආයතනයට රු. මිලියන 16.47 ක මූල්‍යමය අලාභයක්ද සිදුවී තිබුණි.

## PAS (Process Automation System) ව්‍යාපෘතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් PAS (Process Automation System) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ රු.මිලියන 31.74 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් මත 2017 දෙසැම්බර් 31 දින ගිවිසුමකට එළඹ තිබුණි. අදාල ව්‍යාපෘතිය 2018 නොවැම්බර් 15 දින වන විට නිමකර කොමිෂන් සභාව වෙත භාරදීමට නියමිතව තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විටද නිමකර භාරදී නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට අදාළ ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර අදාළ කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 23.06 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 72 ක් වී තිබුණි.

## අමතර කොටස් මිලදී ගැනීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ගබඩාවට රු.මිලියන 6.65 ක් වටිනා අමතර කොටස් මිලදී ගෙන තිබුණි. එම අමතර කොටස් පරීක්ෂණ කණ්ඩායම් විසින් පරීක්ෂා කිරීමෙන් පසු අදාළ පිරිවිතර

හා නොගැලපීම නිසා ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ වුවද, එම අමතර කොටස් අදාළ ආයතන වෙත ආපසු යවා නොතිබුණු අතර 2019 ජුනි මාසය වන විට වර්ෂ දෙකක කාලයක් ගබඩාවේ රඳවා ගෙන තිබුණි. එම කොටස් භාවිතයට ගත නොහැකි වන පරිදි දිරාපත්ව තිබුණු අතර ඒ හේතුවෙන් ගබඩා ඉඩකඩද ඇහිරී තිබුණි. තවද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කරන ලද පුද්ගලික සමාගමකින් මිලදී ගන්නා ලද අමතර කොටස්වලින් රු.මිලියන 5.83 ක් වූ අමතර කොටස් අදාළ පිරිවිතර හා එකඟ වී නොතිබුණි. එම අමතර කොටස් 2018 ඔක්තෝබර් 26 දින වන විට අදාළ සමාගම් වෙත ආපසු භාරදී තිබුණි. 2018 නොවැම්බර් 26 දින නැවතත් එම අමතර කොටස් භාරගෙන තිබුණි.

## ඉඩම්වල අයිතිය තහවුරු කර නොගැනීම

ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ 114 ක්, ප්‍රාදේශීය කාර්යාල 12 ක්, රියදුරු පුහුණු පාසල් 19 ක් හා ප්‍රාදේශීය වැඩපොලවල් 12 ක් මණ්ඩලය විසින් අත්පත් කරගත් හෝ බදු පදනම යටතේ ලබා ගන්නා ලද ඉඩම්වල ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉඩම්වල ප්‍රමාණය, වටිනාකම් හා අයිතියද පිළිබඳ තොරතුරු ගබා ගෙන නොතිබුණි. තවද මණ්ඩලය විසින් දැනට පවත්වාගෙන යනු ලබන ඉඩම් පිළිබඳ ලේඛනය අනුව මණ්ඩලයේ ඩිපෝ පවත්වාගෙන යනු ලබන ඉඩම් අක්කර 160 කට ආසන්න භූමි ප්‍රමාණයක අයිතිය තහවුරු කරගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## බස්රථ ධාවනය කිරීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව 2015 වර්ෂය අවසානය බස් 7,779 ක් පැවැතුණු අතර එය 2019 වර්ෂය අවසාන වන විට බස්රථ 7,012 ක් දක්වා අඩු වී තිබුණි. එම බස්රථවලින් 2015 වර්ෂයේදී බස්රථ 6,268 ක් ධාවන තත්ත්වයේ තිබුණු අතර, 2019 වර්ෂය වන විට එය 6,098 ක් දක්වා අඩු වී තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට ධාවනය කළ නොහැකි තත්ත්වයේ බස්රථ 1,511 ක් පැවැති අතර එය 2019 වර්ෂය අවසාන වන විට බස්රථ 914 ක් දක්වා අඩු වී තිබුණි. ඒඅනුව 2015 වර්ෂයේදී පැවැති බස්රථවලින් සියයට 24 ක් ධාවනය කළ නොහැකි මට්ටමේ පැවැති අතර, 2019 වර්ෂය අවසාන වන විට එය සියයට 14.98 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර රූපසටහන 33 හි දැක්වේ.




රූපසටහන 33 - ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ගණන
මූලාශ්‍රය - ප්‍රවාහන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය

## නිෂ්කාර්ය වත්කම්

- 2018 අගෝස්තු 24 දින සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය ගබඩාවේ රු. මිලියන 1.85 ක් වූ බස් රථ අමතර කොටස් 2005 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි. අවශ්‍යතාවයට අනුකූල වන පරිදි මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි.

- 2018 ජනවාරි 12 දින රු.මිලියන 5.69 කට මිලදී ගෙන තිබුණු වර්ට්‍රල් බෝරිෆ්න් මිලින්ග් යන්ත්‍රයක් හා 2018 අගෝස්තු 16 දින රු.මිලියන 3,14 කට මිලදී ගෙන තිබුණු සිලින්ඩර් ලයින් බෝරින්ග් යන්ත්‍රයක් මිලදීගත් දින සිට 2019 සැප්තැම්බර් 10 දින දක්වා කාලය තුළ උපකරණ (tools )නොමැතිවීම හා එන්ජින් කැපීමේදී මිනුම් දෝෂ පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කුරුණෑගල ප්‍රාදේශීය වැඩපලෙහි නිෂ්කාර්යව පැවතුණි.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පළාත් නවය තුළ වාහන වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය රු.මිලියන 89.84 ක ඇස්තමේන්තුගත පිරිවැය වූ උපකරණ කට්ටල වෙනුවෙන් 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් රු.මිලියන 22.48 කට මිලදී ගෙන තිබුණි. මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ කිසිදු අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව ඉදි කිරීම් ආරම්භ කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන අතරින් කුරුණෑගල හා මැදවච්චිය යන මධ්‍යස්ථාන ඉදිකිරීම් නිමකර විවෘත කර තිබුණද, නීතිමය ගැටලුවක් නිසා අක්‍රියව වසා දමා තිබුණි.

## බස් ටිකට් මැෂින් මිලදී ගැනීම

2018 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඉලෙක්ට්‍රොනික් බස් ටිකට් මැෂින් 1,000 ක් රුපියල් මිලියන 35 ක් වැයකර මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. 2018 පෙබරවාරි 19 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම මගින් ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. නමුත් මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 22 දින ටිකට් මැෂින් 2,000 ක් රු. මිලියන 75.90 කට මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් නිකුත් කර තිබුණු පිරිවිතරයන්වල දැනට භාවිතා කරනු ලබන ටිකට් මැෂින්වල යෙදවුම් (application) වලට අදාළ මැෂින් එකඟ විය යුතු යැයි සඳහන් කර තිබීම නිසා පැරණි සැපයුම්කරුට මිල ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසී තිබුණි. මෙම මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීමක් හෝ මිල ගණන් ඇගයීමක් සිදු නොකර අදාළ පැරණි සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත මෙම යන්ත්‍රය මිලදී ගැනීමේදී වටිනාකමින් සියයට 35 ක් භාණ්ඩ සැපයීමට පෙර ගෙවිය යුතුය යන කොන්දේසියට එකග වී තිබුණු අතර භාණ්ඩ සැපයීම මාස 2 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. මැෂින් සැපයුම්කරු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර, ලංසු ලේඛන ලබාගත් අනෙකුත් ආයතන මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්තව සිදු කර නොතිබුණි. මෙම ටිකට් යන්ත්‍රවල යතුරු පුවරුව අලෝකමත් නොවීම, ටිකට් නිකුත් කිරීමේ මන්දගාමී බව, බැටරි ආයු කාලය ඉතා කෙටිවීම හා ටිකට් රෝල් සකස් කිරීමේ බොත්තම නොමැතිවීම යනාදි හේතු නිසා

විගණනයේදී පරීක්ෂා කරන ලද ඩිපෝ 10 කින් ඩිපෝ 03 ක ලැබුණු නව ටිකට් යන්ත්‍ර සියල්ලම එනම් යන්ත්‍ර 55 ක් භාවිතා කර නොතිබුණි.

## සුඛෝපභෝගී බස්රථ සඳහා කැමරා හා ජීපීඑස් පද්ධති පවත්වා ගෙනයාම

- මණ්ඩලයේ සුඛෝපභෝගි බස් රථ 125 ක් සඳහා කැමරා හා ජීපීඑස් (GPS) පද්ධතිය පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පුද්ගලික සමාගමක් සමග රු.මිලියන 33.63 ක ගිවිසුමකට එළඹ තිබුණි.

- මණ්ඩලයේ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කළමනාකරු විසින් මෙම ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබූ අතර සුඛෝපභෝගි බස් රථවල සිදුවන වංචා හා අක්‍රමිකතා ඒ සඳහා හේතු වශයෙන් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට පෙර මූලික ශක්‍යතා අධ්‍යනයක්, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය හා ප්‍රතිඵල පුරෝකථනය කරන ආකාරය පිළිබඳව අධ්‍යනයක් සිදු කර නොතිබුණි.

- මෙම කැමරා පද්ධතිය හා ජීපීඑස් පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ හෝ ඩිපෝ නිලධාරින් යොදා නොතිබුණු අතර ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

- සුඛෝපභෝගි බස් රථ 125 ක් සඳහා කැමරා හා උපාංග 2018 ඔක්තෝබර් 25 දින මිලදී ගෙන තිබුණද, මණ්ඩලය සතු බස් රථ ප්‍රමාණය 112 ක් පමණක් විය. විගණිත දිනය වූ 2019 අප්‍රේල් 27 වන විට රු. මිලියන 7.26 ක් වටිනා කැමරා උපකරණ 27 ක් ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබුණි.

- අදාල ගිවිසුම්ගත ආයතනය 2019 මැයි 10 දින වන විටත් සේවාදායක පරිගනකය (server) සැපයීම හා ස්ථාපිත කිරීම තාක්ෂණික පිරිවිතර හා සමස්ථ පද්ධතිය පරීක්ෂා කිරීම හා මණ්ඩලයේ නිලධාරීන්ට පුහුණුව ලබාදී සමස්ථ පද්ධතිය නීත්‍යානුකූල පැවරීමක් සිදුකර නොතිබුණි.

- සුඛෝපභෝගි බස් රථ 125 ක් සඳහා ජීපීඑස් (GPS) මෘදුකාංග සහ උපාංග සවිකිරීමේදී අදාල ප්‍රසම්පාදන ගිවිසුමෙහි 8 වන වගන්තිය අනුව අයකළ යුතු ප්‍රමාද ගාස්තු වන රු.මිලියන 3.36 ක් අයකර ගෙන නොතිබුණි.

## වෛද්‍ය සේවා සැපයීම

- 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 (අ) වගන්තිය ප්‍රකාරව බර වාහන ඇතුළු සියලු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට සහ ධාවකයින්ට වෛද්‍ය සේවා සැපයීම සහ ආධාර සැලසීම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කර්තව්‍යයන් ලෙස දක්වා තිබුණි. ආයතනය පිහිටුවීමේ පනත අනුව වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනවල සේවකයින් සඳහා වෛද්‍ය පහසුකම් සැපයීම හෝ ඖෂධ ලබාදීමේ කටයුතු ඉටුකිරීමේ නීතිමය තත්වයක් ඇති කර නොතිබුණි. එසේ වුවද, වෛද්‍ය ආයතනය පනතට පටහැනිව රජයේ හෝ පෞද්ගලික ආයතන සඳහා වෛද්‍ය පහසුකම්, ණය පදනම යටතේ ලබාදීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2019 නොවැම්බර් මාසය දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සේවකයින් සඳහා පිළිවෙලින් රු.මිලියන 1.63 ක හා රු.මිලියන 0. 21 ක වෛද්‍ය පහසුකම් හා ඖෂධ සපයා තිබුණි.

- 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 9.12 ඡේදය ප්‍රකාරව ආයතනයේ සියලු සේවකයින් සඳහා වර්සයකට රු.6,000 ක සීමාවකට යටත්ව ඖෂධ නිකුත් කර තිබුණි. දීර්ඝ කාලීන අසනීප (රුධිර පීඩනය, දියවැඩියාව, හෘදයාබාධ) සහිත සේවකයින්හට මාසිකව රු.2,000 ක සීමාවක් තුළ ඖෂධ නිකුත් කරනු ලැබේ. මේ සඳහා සභාපතිතුමාගේ අනුමැතිය පමණක් ලබාගෙන තිබුණු අතර අනුව සුභසාධන ව්‍යාපෘති වෙනුවෙන් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත්, ආයතනය එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 වර්ෂයේදී සේවකයන් වෙත ඖෂධ ලබාදීම සඳහා ආයතනය රු. මිලියන2.84 ක් වැය කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාවට අනුව නිලධාරින් 4 දෙනෙකු වාර්ෂිකව රු.6,000 ක සීමාව ඉක්මවා ඖෂධ ලබාගෙන තිබුණි.

## රුධිර සන පරීක්ෂණ කට්ටල

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් 2017 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු සිදු කර 2017 අගෝස්තු 17 දින සිට 2018 අගෝස්තු 16 දින දක්වා රුධිර සන පරීක්ෂණ කට්ටල 21600 ක් රු.මිලියන 21.73 කට (බදු සහිත) මිලදී ගැනීම සඳහා ගිවිසුම්ගත වී තිබුණි. එමෙන්ම ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් මේ සඳහා රු. මිලියන 1.85 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණු අතර එහි වලංගු කාලය 2018 අගෝස්තු 16 දිනෙන් අවසන් වී තිබුණි. මේ පිළිබඳව කළමණාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණු අතර ගිවිසුම් ගත ප්‍රමාණය අවසන් වීමෙන් පසුවද, 2019 ඔක්තෝබර් මාසය දක්වා එම ආයතනයෙන්ම රුධිර සන පරීක්ෂණ කට්ටල 10,800ක් රු.මිලියන 10.87 කට මිලදී ගෙන තිබුණි. 2019 වර්ෂය සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදනය අවලංගු කර 2018 වර්ෂයේ මිලදී ගත් ආයතනයෙන්ම මිලදී ගැනීමට හේතු විගණනයේදී පැහැදිලි නොවුණු අතර, ඒ සඳහා සභාපතිතුමාගේ අනුමැතිය ලබාගෙන තිබුණද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීම

ජාතික වෛද්‍ය ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ආයතනය තුළ ක්‍රියාත්මකව පැවතුණි. ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීට කටයුතු කර නොතිබුණි. ආයතනය වෙළඳ පොළ රක්ෂණ ආයතන අතර තරගකාරීත්වයක් ඇති කර මිල ගණන් සැසඳීමකින් තොරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් මෙම රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණු අතර 2019/2020 වර්ෂ වෙනුවෙන් රක්ෂණ වාරික වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 8.82 ක් ගෙවීමට එකඟවී තිබුණි.

## කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

- 2009 වර්ෂයෙන් පසුව රට තුළ ඇතිවූ යහපත් වාතාවරණය මත වැඩි වූ ගුවන් මගීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පෞද්ගලික) සමාගම සැලැසුම් කර තිබුණි. එම ව්‍යාපාතිය යටතේ “නව ගුවන් ගමන් පරියන්ත ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත ඉදිකිරිම් “ පැකේජය A ලෙස හා “නව ගුවන් යානා

යාත්‍රාංගනය සහ සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය" පැකේජය B ලෙස කොටස් දෙකක් යටතේ හඳුනාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ 3 ක් ඇතුළත එනම් 2015 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. විවිධ හේතු මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද කර තිබුණි. ඒ අනුව පළමුවෙන්ම "බී" පැකේජය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර එය 2017 අප්‍රේල් 25 දින ආරම්භ කර 2020 පෙබරවාරි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2020 ජුනි 21 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 78.42 ක් පමණක් වී තිබුණි.

- ඉහත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 92 ක් නියෝජනය වන ප්‍රධාන ඉදිකිරීම් ඇතුළත් "ඒ" පැකේජය සඳහා 2020 මාර්තු 12 දින කොන්ත්‍රාත්කරු සමඟ ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පෞද්ගලික) සමාගම ගිවිසුමකට එළඹ තිබුණි.

- කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ "ඒ" පැකේජය යටතේ නව ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පෞද්ගලික ) සමාගම විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් (JICA) එකතුව ජපන් යෙන් මිලියන 74,397 ක විදේශ ණය මුදලක් ලබා ගැනීම සඳහා පිළිවෙලින් 2012 මාර්තු 28 දින හා 2016 මාර්තු 24 දින ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2020 අප්‍රේල් 20 දින වන විට JICA ආයතනය වෙත විදේශ ණය ඌන උපයෝජනය හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 290.3 ක් ගෙවීමට සිදු වී තිබුණි.

### සිවිල් ගුවන් සේවා පනතට අනුකූල නොවීම

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් ගුවන්තොටුපල කළාප ස්ථාපනය හෝ සංවර්ධනය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### වත්කම් තක්සේරු නොකිරීම

2006 අප්‍රියෙල් 28 දිනැති අංක : PE/COMC/33/02 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් රජයට අයත් ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් චංචල හා නිශ්චල වත්කම් තක්සේරු කිරීමෙන් තොරව වගකීම් පමණක් පවරාගෙන තිබූ අතර ශුද්ධ වත්කම් පැවරීම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අලාභය රු.මිලියන 44,022.67 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.මිලියන 230,890.07 ක් විය. එදිනට සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.මිලියන 186,339.26 ක් ද මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් රු.මිලියන 177,725.40 ක් ද විය. ඒ අනුව ශ්‍රී ලන්කන්

ගුවන් සේවා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙනී ගියද 2019 අගෝස්තු 24 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා රජයේ සහය ශ්‍රී ලන්කන් ගුවන් සමාගම වෙත ලබා දෙන බව තහවුරු කරමින් භාණ්ඩාගාර ලේකම්ගේ 2019 සැප්තැම්බර් 16 දිනැති ලිපිය පරිදි මුල්‍ය ප්‍රකාශන දිගුකාලීන පැවැත්මක් ඇත යන උපකල්පනය මත සකස් කර තිබුණි.

### ලබාගත් ණය වෙනුවෙන් වාරික නොගෙවීම

2016/2017 වර්ෂය තුළ මහා භාණ්ඩාගාර ඇපමත ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කෙටිකාලීන මුදල් අවශ්‍යතා සඳහා එ.ජ.ඩොලර් මිලියන 200 ක් (ආසන්න වශයෙන් රු.මිලියන 31,115 ක් ) හා රු.මිලියන 26,250 ක් වූ රුපියල් ණය පහසුකම් රාජ්‍ය බැංකු 02 ක් මඟින් ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය මුදල්වල මූලික ණය කිසිවක් ගෙවා නොතිබුණි.

### A 350-900 ගුවන් යානා 04 ක් මිලදී ගැනීම

2020 හා 2021 වර්ෂවලදී ලැබීමට නියමිත A 350-900 ගුවන් යානා 04 ක් වෙනුවට A 330-900 වර්ගයේ ගුවන් යානා 04ක් හෝ A 321 Neo වර්ගයේ ගුවන් යානා 08 ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා එයාර් බස් සමාගම අතර සාකච්ඡා 2020 මාර්තු 31 දින වන විටත් අවසන් වී නොතිබුණු අතර ඒ සඳහා ලැබීමට පෙර ගෙවීම් ලෙස රු.මිලියන 2,528.12 ක් (එ.ජ.ඩො. මිලියන 19.21 ක් ) 2019 මාර්තු 31 දින වන විට ගෙවා තිබුණි.

### A 330-200 වර්ගයේ 4R-ALS ගුවන්යානය ඌන උපයෝජනය

2016 වර්ෂයේදී මෙහෙයුම් කල්බදු ලබා ගැනීමට ගිවිසගෙන තිබූ A 350-900 ගුවන්යානා 03 ක ගිවිසුම් අවසන් කිරීමේදී වන්දි මුදල් අඩුකර ගැනීම සඳහා ඉන්ටර්නැෂනල් ලීස් ෆිනෑන්ස් සමාගම සමඟ එළඹි ගිවිසුමෙහි ඇතුළත් වූ කොන්දේසියක් අනුව A 330-200 වර්ගයේ 4R-ALS ගුවන් යානය 2017 වර්ෂයේ සිට වර්ෂ 10 ක් සඳහා මෙහෙයුම් කල්බදු පදනම මත ලබාගෙන තිබුණි. මෙම ගුවන් යානය සඳහා මාසිකව කල්බදු වාරික වශයෙන් මුල් මාස 72 සඳහා එ.ජ..ඩොලර් 485,000 ක් බැගින්ද, ඉතිරි කාලය සඳහා එ.ජ.ඩොලර් 485,000 ක් බැගින්ද කල්බදු වාරික ගෙවීමට එකඟ වී තිබුණි. මේ අතර මෙම ගුවන් යානය 2018 සැප්තැම්බර් මාසය දක්වා Hi fly Transporter සමාගම වෙත මාසිකව එ.ජ.ඩොලර් 490,000 යටතේ අතුරු බදු ලබා දී තිබුණි. 2018 ඔක්තෝබර් මාසයේදී අතුරු බදු කාලය අවසන් වීමෙන් පසු ගුවන් යානය සමාගමට ආපසු ලැබී තිබූ අතර 2018 ඔක්තෝබර් මාසයේ සිට 2019 ජනවාරි මාසය දක්වා යානය ධාවනයට යොදාගෙන නොතිබුණි. 2019 පෙබරවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා ධාවනය කර තිබූ පැය ගණන 169 ක් පමණක් වී තිබුණි. (මෙම වර්ගයේ ගුවන් යානයක දිනක සාමාන්‍ය ධාවන පැය ගණන 12 ක් වේ.) අතුරු බදු කාලය අවසන් වීමෙන් පසු, 2018 ඔක්තෝබර් 02 දින ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරයා විසින් ගුවන් යානය පිළිබඳව සිදු කරන ලද තාක්ෂණික පරීක්ෂණය අනුව බදුකරු විසින් අදාළ නඩත්තු කටයුතු ප්‍රමාණවත් පරිදි සිදුකර නොමැති බැවින් යානය තාක්ෂණික වශයෙන් පිළිගත නොහැකි බව දන්වා තිබුණි.

### සාමූහික ගිවිසුම් යාවත්කාලීන නොකිරීම

ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් 2014 ජුනි 01 දින සිට 2017 මැයි 31 දින දක්වා වූ කාලය සඳහා වෘත්තීය සමිති 05ක් සමඟ සාමූහික ගිවිසුම් 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 සැප්තැම්බර් 12 දින ගිවිසුම් වලට එළඹ තිබුණි. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගිවිසුම්ගත දිනෙන් වර්ෂයක කාලයකට පසුව 2015 සැප්තැම්බර් 21 දින ලබා දී තිබුණි. මෙම සාමූහික ගිවිසුම් වල වලංගු කාලය 2017 මැයි 31 දිනෙන් අවසන් වි තිබුණද , 2019 නොවැම්බර් 30 දින වන විටත් ඒවා යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම ගිවිසුම් සඳහා 2019 නොවැම්බර් 30 දින වන විට ද අදාළ අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ එකඟත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

# වරාය හා නාවික කටයුතු

බාධාවකින් තොරව සමුද්‍රීය වරාය පහසුකම් නිර්මාණය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වරාය හා නාවික ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- වාණිජ වරායන් සංවර්ධනය හා කළමනාකරණය කිරීම
- අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලන කටයුතු
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය
- නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවක් පැනවීම
- නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහාය වීම
- බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම
- නාවික කටයුතු සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම;
- නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු
- වෙරළාසන්න මගී ප්‍රවාහනය

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 8,869.39 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 4,033.96 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 54.52 ක් හෙවත් රු.මිලියන 4,835.43 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 35 හි දැක්වේ.




රූපසටහන 35. - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා නොවීම

තරුණ තරුණියන් ඇතුළුව කාන්තාවන් හා පිරිමින් සඳහා ඵලදායි රැකියා අවස්ථා හා යහපත් කාර්යය අවස්ථා ළඟාකර ගැනීමේ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්කය මත පදනම්ව 2019 වර්ෂයේදී ජීව ලක්ෂණ එකතු කිරීම මඟින් ILO සම්මුතියට අනුකූලව සියළුම ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා අනන්‍යතා ලියවිල්ලක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 53.46 වැයකර තිබුණු අතර 2019 වර්ෂය සඳහා ජීව දත්ත සහතික නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණත් 2020 ජූලි 31 දින වන විටත් ජීව ලක්ෂණ සහිත (biometric features ) අනන්‍යතා ලියවිල්ලක් නිකුත් කිරීමට නොහැකිව තිබුණි.

## රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීම

රාජ්‍ය සමාගමක් වූ සී/ස ලංකා නැව් සංස්ථාව වාණිජමය හා මූල්‍යමය වශයෙන් ස්වාධීන ආයතනයක් ලෙස ස්වශක්තිය මත පවත්වාගෙන යා හැකිවන පරිද්දෙන් රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයනයේදී ප්‍රමුඛත්වය ලබා දීමට 2004 දෙසැම්බර් 21 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ අතර ඒ අනුව සියළු රාජ්‍ය ආයතන දැනුවත් කරමින් 2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කර තිබුණි. එහෙත් රාජ්‍ය ආයතන ඒ අනුව කටයුතු නොකිරීම නිසා 2016 ජනවාරි 13 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත තීරණය නැවත තහවුරු කර තිබුණි. ඒ අනුව හා ඉහත සඳහන් චක්‍ර ලේඛ විධිවිධාන තරයේ අනුගමනය කළ යුතු බවට නැවත අවධාරණය කරමින් 2016 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛ ලිපි අංක 03 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර තිබුණි.

රාජ්‍ය අංශයේ ආනයන කටයුතුවල යෙදෙන ආයතන අතරින් 2018 වර්ෂයේදී රාජ්‍ය ආයතන 34 ක් විසින් හා 2019 ඔක්තෝබර් 30 දින වන විට රාජ්‍ය ආයතන 24 ක් විසින් ආනයන කටයුතු සේවාව සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සිදු කර තිබුණි. කෙසේ වුවද, විශාල වශයෙන් ආනයන කටයුතුවල යෙදෙන රාජ්‍ය ආයතන විසින් සමාගමේ සේවාව ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාගම විසින් වැඩි වශයෙන්ම සේවා සපයා තිබුණු රාජ්‍ය ආයතන ගණන 14 ක් වී තිබුණි. එම රාජ්‍ය ආයතන 14 විසින් 2018 ජනවාරි 01 දින සිට 2019 ඔක්තෝබර් 30 දින දක්වා කාලය තුළ මෙ.ටොන් 9,461,406 ක භාණ්ඩ ආනයනය කර තිබුණත්, එම ආනයනවලින් මෙ.ටො.45,331 ක් හෙවත් සියයට 0.48 ක ප්‍රමාණයක් පමණක් නැව් සංස්ථාව විසින් ආනයන සේවාව ලබා දී තිබුණි. එම සංස්ථාව විසින් ආනයන සේවාව ලබා දුන් සමස්ථ ආනයනවලින් සියයට 85 ක රාජ්‍ය ආයතන 14 න් රාජ්‍ය ආයතන 05 ක් විසින් සිදු කර තිබුණි. එසේම, ඇතැම් රාජ්‍ය ආයතන වෙනත් විදේශීය නැව් සමාගම් මගින් ආනයනයන් සිදු කර ගැනීම සඳහා විවිධ හේතු දක්වමින් ඉල්ලීම්කර තිබුණු බව අනාවරණය වූ අතර 2018 වර්ෂයේදී අවස්ථා 557 කදීද 2019 ඔක්තෝබර් 30 දක්වා අවස්ථා 398 කදීද එවැනි ඉල්ලීම් කර තිබුණු අතර සමාගම විසින් අත්හැරීමේ නිවේදන (waivers) නිකුත් කර තිබුණි.

මේ අනුව රාජ්‍ය ආයතන විසින් සිදුකරනු ලබන භාණ්ඩ ආනයනය කිරීම් හා සම්බන්ධ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රශස්ත ලෙස උපයෝගී කරගෙන සමාගමේ වෙළඳපල කොටස පුළුල් කර ගැනීම සඳහා සලසා තිබුණු රාජ්‍ය අනුග්‍රහයන් උපයෝජනය සඳහා සමාගම සුදුසු ක්‍රමවේදයන් ක්‍රියාවට නංවා නොතිබුණි.

## බහලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස

සමාලෝචිත වර්ෂයේදී ජාත්‍යන්තර නාවික කටයුතු සඳහා කොළඹ වරාය ප්‍රධාන පර්යන්ත 03 ක් ක්‍රියාත්මකව පැවති අතර එයින් ජයබහළු පර්යන්තය පමණක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය හා කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය පෞද්ගලික සමාගම් දෙකක් වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබුණි. මෙම පර්යන්ත අතරින් ,වර්තමාන ප්‍රවණතාවය වන විශාල බහළුම් නැව් පැමිණිය හැකි ගැඹුර මීටර් 18 ක් වූ එකම පර්යන්තය කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය පමණක් වේ. තවද මීටර් 18 ක් ගැඹුරැති නැගෙනහිර බහළුම් පර්යන්තයේ I වන පියවර 2016 වර්ෂයේදී ඉදිකර නිමකර තිබුණත්, 2020 අගෝස්තු 31 දින වන විටත් එම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

2019 වර්ෂය සඳහා ලෝක වරාය පිළිබඳව ඇල්ෆාලයින් සංවිධානය විසින් නිකුත් කරන ලද ඇල්ෆාලයිනර් වාර්තාව (Alpha liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 7,228,337 ක මෙහෙයුම් සිදු කරමින් 2019 වර්ෂයේදී බහළුම් මෙහෙයුම් කටයුතු අතර ලෝකයේ 22 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර, 2018 වර්ෂයට සාපේක්ෂව එම කටයුතුවල සියයට 2.6 ක වර්ධනයක් ළගා කර ගෙන තිබුණි.

## නැව් බඩු මෙහෙයුම් කටයුතු

කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2016 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 5,023 ක් වී තිබුණත්, එය 2019 වර්ෂය වන විට 4,708 ක් දක්වා අඩු වී තිබුණි. නමුත් මෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම්

ඒකක ගණන 2014 දී මිලියන 4.9 ක සිට 2019 වර්ෂයේදී මිලියන 7.2 ක් දක්වා වැඩි වී තිබුණි. තවද මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2016 වර්ෂයේදී මෙ.ටො.මිලියන 7.81 ක සිට 2019 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 6.6 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර වගුව 18 හි දැක්වේ.

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,298 | 4,760 | 5,023 | 4,942 | 4,933 | 4,708 |
| මෙහෙයවන ලද විසිසම )TEUs ( (000 ඒකක) බහලුම් ඒකක ගණන | 4,908 | 5,185 | 5,735 | 6,209 | 7,047 | 7,228 |
| මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (000 ටොන්.මෙ) | 6,339 | 7,156 | 7,811 | 7,735 | 7,438 | 6,673 |

වගුව - 18 ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී කොළඹ වරාය වෙත බහලුම්ගත යාත්‍රා පැමිණීම යාත්‍රා 133 කින් හෙවත් සියයට 3.1 කින් අඩු වී තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී කොළඹ වරාය වෙත බහලුම් යාත්‍රා පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කළත් 2019 වර්ෂයේදී බහාලුම් යාත්‍රා පැමිණීමේ අඩු වීමක් පැවැතුණි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2001 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා වර්ෂ දහනවයක කාලය තුළ බහලුම් මෙහෙයුම් දායකත්වය මුළු බහලුම් හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී සියයට 81 ක සිට සියයට 32 ක් දක්වා සීඝ්‍ර ලෙස පහත වැටී තිබුණි. මේ අතර කොළඹ වරාය තුළ තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගම් දෙකෙන් 2013 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කළ සමාගම 2019 වර්ෂය අවසාන වන විට සියයට 40 ක් දක්වා දායකත්වයක් ලබා දී තිබුණි. අනෙක් සමාගම 2001 වර්ෂයේදී සියයට 19 ක් වූ සිය වෙළඳපල කොටස 2019 වර්ෂය වන විට සියයට 28 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. පසුගිය වර්ෂ දහනවයක බහලුම් හැසිරීම පිළිබඳ විස්තර රූපසටහන 36 හි දැක්වේ.




රූපසටහන 36 - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2019 කාර්යසාධනය සමාලෝචන වාර්තාව

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපොළ කොටස ක්‍රමානුකූලව පහත වැටී ඇති බවත් අධිකාරියට උපරිම පර්යන්ත ධාරිතාවයට ළඟාවීමට නොහැකිවී තිබුණි.

## නැගෙනහිර බහලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම.

කොළඹ වරායේ දැනට බහාළුම් හැසිරවීම සඳහා ක්‍රියාත්මක පර්යන්ත අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25 ට වඩා වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (C.I.C.T) පමණක් වන අතර එහි ධාරිතාවය වසරකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2019 වර්ෂයේ දී එම පර්යන්තය වෙත ගැඹුර මීටර් 14.25 ට වැඩි නැව් 374 ක් පැමිණ තිබූ අතර මුළු බහාළුම් ඒකක මිලියන 2.6 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. එය උපරිම ධාරිතාවයද අභිබවා ගිය තත්ත්වයක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2018 වර්ෂයට සාපේක්ෂව එම පර්යන්තයේ බහාළුම් හැසිරවීම සියයට 8 ක වර්ධනයක් සිදුව තිබුණි. 2011 වර්ෂයේදී ස්කොට් හා විල්සන් සමාගම විසින් සිදුකර තිබූ අධ්‍යනයක් අනුව 2015 වර්ෂය වන විට කොළඹ වරායේ පවත්නා පර්යන්ත ධාරිතාවය උපරිමයට ළඟා වන බවත් ඒ වන විට ඇතිවන ඉල්ලුමට මුහුණ දීම සඳහා නැගෙනහිර පර්යන්තය ක්‍රියාකාරී තත්වයට පත් කළ යුතු වන බවත් පෙන්වා දී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැගෙනහිර පර්යන්තය මෙහෙයුම් කටයුතු සඳහා විවෘත කර නොතිබූ අතරම පර්යන්ත සේවා ඉල්ලුම පිළිබඳ පිළිගත් සංඛ්‍යා ලේඛන නොමැති වීම නිසා අහිමිවී ගිය පර්යන්ත ඉල්ලුම හා ඒ අනුව වරායක් වශයෙන් අහිමි වූ ආදායම් පිළිබඳ ගණනය කල නොහැකි විය.

කෙසේ වුවද කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව රු.මිලියන 11,168 ක් වැයකර මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති බහාළුම් ඒකක 800,000 ක වාර්ෂික ධාරිතාවයක් සහිත නැගෙනහිර බහාළුම් පර්යන්තයේ I අදියරේ ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණි.නැව් බඩු මෙහෙයවීම සඳහා අවශ්‍ය ග්‍රැන්ට් දොඹකර ඇතුළු උපකරණ සපයා ගෙන මෙම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2020 මැයි 30 දින දක්වාද අධිකාරිය කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, 2019 මැයි 28 දින මෙම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව හා ජපානය ඒකාබද්ධව සහයෝගිතා ගිවිසුමකට (Memorandum of Corporation) එළඹ තිබුණි.

## හම්බන්තොට වරාය ඉදිරිකිරීම සඳහා ලබා ගත් විදේශ ණය

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණයවලින් 2017 නොවැම්බර් 30 දිනට අධිකාරියේ ගිණුම්වල ඉතිරිව පැවති රු.මිලියන 147,746 ක් වූ ණය ශේෂය මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබූ අතර ඒ හේතුවෙන් රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුළත්ව නොතිබුණි. කෙසේ වුවද 2017 ජූලි 20 දිනැති අංක MPS/SEC/2017/32 දරන "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල විසින් ලබා දුන් අනුමැතිය මගින් ඉහත ණය ශේෂය ආපසු ගෙවීමේ වගකීම මහා භාණ්ඩාගාරය වෙත පවරා තිබුණි. මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට එම ණය ශේෂය රු.මිලියන 178,628 ක් වී තිබුණි.

තවද, ඉහත ණය මුදලට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත විදේශ විනිමය පරිවර්තන අලාභය රු.මිලියන 58,442 ක්ද, මහා භාණ්ඩාගාරයෙන් හෝ අධිකාරියේ ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඉහත විදේශ විනිමය පරිවර්තන අලාභය ඇතුළත් ණය ශේෂය ගිණුම්ගත කිරීම පිළිබඳ මහා භාණ්ඩාගාරය හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර එකඟතාවයකට එළඹ නොතිබුණි.

එසේම 2020 ජූලි 06 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය අනුව 1971 අංක 38 දරන මුදල් පනතේ 12 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වත්කම් සහ ණය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වලට ඇතුළත් කරන ලෙස නියෝග කර ඇති බවත්, ඒ අනුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට අවශ්‍ය ගැලපීම් සිදු කරන ලෙසත් අධිකාරියේ සභාපතිවරයා වෙත දැනුම් දී තිබුණි.

## පරිපාලිත සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇපවීම

2017 නොවැම්බර් මාසයේ සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් 2014 වර්ෂයේදී පුද්ගලික බැංකුවකින් ලබාගෙන තිබූ එ.ජ.ඩොලර් මිලියන 24 ක් වූ ණය මුදලින් එ.ජ.ඩොලර් 22.3 ක් පියවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබුණි. මේ අතර, ණය මුදල සඳහා ඇපකරු වශයෙන් සහ මව් සමාගම වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව හිඟ ණය ශේෂය වූ එ.ජ.ඩොලර් මිලියන 22.3 ක් අයකර ගැනීම සඳහා නඩු පවරන බවට අදාළ බැංකුව විසින් එන්තරවාසියක් 2019 අප්‍රේල් 02 දින අධිකාරිය වෙත යොමු කර තිබුණි. කෙසේ වුවද, අධිකාරිය විසින් මේ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

## වරාය පරිශ්‍රය තුළ CCTV කැමරා පද්ධතිය සවි නොකිරීම

අධි ආරක්ෂිත කළාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 හා 2018 වර්ෂවල ප්‍රාග්ධන අයවැය තුළින් සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 60 ක් හා රු.මිලියන 150 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට සැලැසුම් කර තිබුණි. 2019 වර්ෂයේදි ඒ සඳහා රු.මිලියන 150 ක් වෙන් කර තිබුණු අතර අපේක්ෂිත පරිදි අදාළ කාර්යය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් කර නොතිබුණි.

මේ හේතුවෙන් මෙම අධි ආරක්ෂිත කළාපයේ ආරක්ෂාව පිළිබඳ ගැටළුවකදී අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකිවීමේ අවධානමක් පැවැතුණි.

## රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා අභියාචනය කිරීම

2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබු රු.මිලියන 1,580 ක් වු රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශණයක තීන්දුවක් මත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදු කළ හැකිව තිබුණත් අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 1,577.7ක අසම්භාව්‍ය බැරකම් වෙන්කර තිබුණි. ඉහත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව නිශ්ප්‍රභා කොට තිබු අතර ඉන් පසු එම නියෝගයට එරෙහිව අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණි.

## මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්

හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය වෙනුවෙන් වාරික මුදලක් ලෙස අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ගෙවා තිබුණු රු. මිලියන 4,777 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 372 ක් ද ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,149.9 ක් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම වාර්තාවේ දිනය වන විටත් එම මුදල් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් අධිකාරිය විසින් කැඳවා තිබුණද, මහා භාණ්ඩාගාරය විසින් එම ශේෂ සනාථ වන බව තහවුරු කර නොතිබුණි. 2019 වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙසද මෙම මුදල දක්වා නොතිබුණි.

## මුදල් පනතට අනුකූල නොවීම්

1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද 2016 සිට 2019 දක්වා වර්ෂවලදී අධිකාරිය ලබා තිබු එකතුව රු.මිලියන 30,253 ක් වු ශුද්ධ ලාභ වලින් ඒකාබද්ධ අරමුදලට රු.මිලියන 600 ක් පමණක් බැර කර තිබුණි. තවද ඉහත ලාභ තුළ දීර්ඝ කාලින බදු පදනම මත පෞද්ගලික අංශය වෙත ලබා දී තිබුණු දකුණු ආසියාතික පිවිසුම් පර්යන්තය (SAGT) හා කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය යන (CICT) පර්යන්තවල මෙහෙයුම් කටයුතුවල නිරතව සිටින සමාගම් දෙකෙන් අධිකාරිය විසින් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 8,514 ක් වූ බදුකුලි හා එම කාලය වෙනුවෙන් රාජ්‍ය භාගය ලෙස අයකර ගත් රු.මිලියන 11,250 ක්ද, ඇතුළත් වී තිබුණි. එම ආදායම් වරායේ සෘජු මෙහෙයුම් ආදායම් නොවන බව තවදුරටත් අනාවරණය විය.

## නිලධාරීන් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු අධිකාරිය විසින් ගෙවීම

2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව උපයන විට ගෙවීම් බදු ,පුද්ගලික වැටුපෙන් අඩු කර ගෙවිය යුතු වුවද, අධිකාරියේ නිලධාරීන් සඳහා වූ එම මුදල් අධිකාරියේ අරමුදල්වලින් ගෙවා තිබුණි. 2019 වර්ෂය සඳහා එසේ ගෙවන ලද රු.මිලියන384 ක් ද, ඇතුළුව 2012/2011

තක්සේරු වර්ෂයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා එකතුව රු. මිලියන 3,166 ක උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අධිකාරියේ අරමුදල්වලින් ගෙවා තිබුණි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු 2015 ජූලි 06 දිනැති අංක එස් ඊ සී/2015/05 දරන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් වෙත ප්‍රසාද මුදල් ගෙවීමේදී ඒ මත උපයන විට බදු අඩු කළ යුතුව තිබුණි. නමුත් 2019 වර්ෂය සඳහා වන එම බදු නිලධාරීන්ගෙන් අයකිරීමකින් තොරව අධිකාරියේ අරමුදල්වලින් රු.මිලියන 52 ක් ගෙවා තිබුණි.

## වැටුප් වැඩිකිරීම සඳහා අනුමැතිය ලබා නොගැනීම

2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සාමූහික ගිවිසුම යටතේ සිදු කරනු ලබන වැටුප් වැඩි කිරීමට අමතරව 2018 වර්ෂයේ සිට අධිකාරියේ විධායක නිලධාරීන් 560 දෙනෙකුට තනතුරු අනුව මාසිකව රු.15,225 ක සිට රු.31,150 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් වැටුප් වැඩිකර තිබුණි. ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබා ගෙන නොතිබුණි.

## වත්කම් ඌන උපයෝජනය

අධිකාරිය සතු කොළඹ වරාය පරිශ්‍රය තුළ පිහිටි මෙට්‍රික් ටොන් 6,400 ක ධාරිතාවයකින් යුත් පැරණි තෙල් ටැංකි 10 ක් 2015 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුනි.

## ඉඩම් ඌණ උපයෝජනය

නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර) ගේ 2020 ජූලි 13 දිනැති අංක 1/1/156 දරන ලිපිය අනුව 2019 දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරියට අයත් කොළඹ වරායේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් අතරින් රු.මිලියන 2,284.42 ක වටිනාකමකින් යුතු ඉඩම් අක්කර 36 රූඩ් 2 පර්චර්ස් 26.43 ක් ඌණ උපයෝජිතව පැවැතුණි.

## ඉඩම් බදු දීම්

නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර) ගේ 2020 ජූලි 13 දිනැති අංක පරිශ්‍ර /1/1/156 දරන ලිපිය මගින් ලද තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් අක්කර 236, පර්චර්ස් 32.74 ක් හා වර්ග මීටර් 375.44ක්වූ ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකමක් ලබා නොගෙන බදු දී තිබුණි.

# මහාමාර්ග

ඉහළ සංසරණ පද්ධතියක් ඇති කිරීම තුළින් ගමන් කාලය සහ පිරිවැය, අවම වන අන්දමින් ආරක්ෂිත සහ සුවපහසු මාර්ග සංචලතාවය හා ප්‍රවේශතාව සහතික කිරීම සහ පරිසර හිතකාමී බව ආරක්ෂා කරමින් මාර්ග භාවිතාකරන්නන්ගේ සමාජ ආර්ථික හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි.

එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා, මාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය යන ප්‍රධාන ව්‍යවස්ථාපිත ආයතන 2 මඟින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ජාතික සංවර්ධන ඉලක්කයන් කෙරෙහි ළඟාවිය හැකි වන පරිදි මහාමාර්ග විෂයට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- තිරසර සංවර්ධනයට දායකවන ආකාරයට මාර්ග ජාලයට සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය, ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයකින් යුක්ත වන පරිදි මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ථ තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙය වීම

මහා මාර්ග ජාලය රටක වඩාත් වටිනාම සහ වඩාත් සුවිශාල වූ සමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික, සමාජයීය, සංස්කෘතිකමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද සමාජ සුභසාධනය උදෙසා ඉතා වැදගත්වූ අංගයක් ලෙස පිළිගෙන ඇත. ශ්‍රී ලංකාව වර්ග කි.මී. 65,610 ක වපසරියකින් ද මිලියන 21 කට ආසන්න වූ ජනගහනයකින් ද යුක්ත රටක් වන අතර වර්ග කි.මීටරයකට කි.මී. 1.76 ක මාර්ග ඝනත්වයකින් ද සමන්විත වේ. මෙම මාර්ග ඝනත්වයන් බොහෝ දකුණු ආසියානු රටවල් අභිබවා යාමට වත්මන් ශ්‍රී ලංකාවට හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය, ප්‍රමුඛතම ප්‍රවාහන මාර්ගය බවට පත්ව ඇති අතර මඟී ප්‍රවාහනයෙන් සියයට 94 ක් ද, භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 98 ක් ද මහා මාර්ග ඔස්සේ සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ජාතික මහා මාර්ග ජාලය 2019 වර්ෂය අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී. 12,438 කින් යුක්ත වන අතර එය ඒ ශ්‍රේණියේ මහාමාර්ග දුර කි.මී. 4,215 කින් ද, බී ශ්‍රේණියේ මහාමාර්ග දුර ආසන්න වශයෙන් කි.මී.8,005 කින් ද, අධිවේගී මාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 217 කින්ද, සමන්විත වේ. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී අධිවේගී මාර්ග දුර කි.මී.48 ක් පමණක් ජාතික මහාමාර්ග ජාලයට අළුතින් එකතු වී තිබුණි. තවද, ප්‍රධාන වශයෙන් වර්ෂය තුළ ඉලක්කගත මාර්ග වැඩි දියුණු කිරීම් ප්‍රමාණය කි.මී.518.41 ක් වූ අතර වර්ෂය අවසානය වන විට එම මාර්ග දුර ප්‍රමාණයෙන් කි.මී.150.34 ක් පමණක් වැඩි දියුණු කිරීමේ කටයුතු නිමකර තිබුණි.

මෙම කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් විවිධ ශිර්ෂයන් යටතේ සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 659,456 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 515,416 ක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 144,040 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. විස්තර රූපසටහන 34 හි දැක්වේ.




රූපසටහන 34 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශන

මෙම කාර්යභාරයන් ඉටු කිරීමේදී අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය හා මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණයවූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලයේ පඩිනඩි වෙනුවෙන් රු.මිලියන 11,866.02 ක් වැයකර තිබුණි. එම වියදමෙන් රු. මිලියන 6,500 ක් රජයේ ප්‍රදාන මගින් මූල්‍යනය කර තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 1,298 කට පඩිනඩි ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අතිරික්ත 395 දෙනෙකුගෙන් යුත් සෘජු කම්කරුවන් ඇතුළුව සෘජු කම්කරුවන් වෙනුවෙන් රු.මිලියන 2,886.38 ක් වැය කර තිබුණි. ඊට අමතර මාර්ග නඩත්තු කම්කරුවන් පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් ලබා ගෙන තවත් රු.මිලියන 482.963 ක් වැය කර තිබුණි.

## කාර්ය මණ්ඩලයේ ඉංජිනේරුවරුන් වෙනත් ව්‍යාපෘතිවලට මුදා හැරීම

2019 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයෙන් ඉංජිනේරු සේවයේ පුරප්පාඩු 82 ක් සහ තාක්ෂණික සේවයේ පුරප්පාඩු 116 ක් පැවතුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත මාර්ග ඉදිරිකිරීම් සහ නඩත්තුව බැවින් එකී ක්ෂේත්‍රයට සෘජු බලපෑමක් ඇති කරවන උක්ත පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම මහජනතාවට ඵලදායී හා කාර්යක්ෂම සේවයක් ලබාදීම කෙරෙහි සෘජු බලපෑමක් සිදු වී තිබුණි. එමෙන්ම, ඉංජිනේරු කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පවතින තත්ත්වයක් යටතේ අධිකාරියේ

සේවයේ නිරත ඉංජිනේරු කාර්ය මණ්ඩලයෙන් සියයට 32 ක් වූ ඉංජිනේරුවන් 213 දෙනෙකු අධිකාරියේ වෙනත් ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත මුදා හැර තිබුණි.

### අධිවේගී මාර්ගවලින් ලද ආදායම පරිබාහිර කාර්යයන්ට යෙදීම

2019 දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් රු. මිලියන 45,236 ක ආදායමක් රැස්කර තිබුණු අතර ඉන් රු.මිලියන 38,770 ක් වියදම් කර රු.මිලියන 6,466 ක් ආයෝජන හා අත ඉතිරි මුදල් ලෙස පැවැතුණි. 2015 අප්‍රේල් 27 දිනැති අංක 1912/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයේ 10 වෙනි ඡේදය ප්‍රකාරව එකතු කරනු ලබන මුදල් මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය. ජාතික මහාමාර්ග සංවර්ධනය කර පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා එම මුදල් භාවිතා කළ යුතුය. එසේ රැස්කර තිබුණු ආදායමෙන් රු. මිලියන 15,657 ක් අධිවේගී මාර්ග නඩත්තු හා මෙහෙයුම් කටයුතු වලින් පරිබාහිරව මාර්ග සංවර්ධන අධිකාරියේ පොදු වියදම්, වැටුප් ගෙවීම්, ව්‍යාපෘතිවලට ගෙවීම් කිරිම හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරිම ආදිය සිදු කර තිබුණි.

### පොලිස් නිලධාරීන්ට පහසුකම් සැලැසීම

අධිවේගී මාර්ග පද්ධතියේ රාජකාරි සිදුකරන ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා විශේෂ කාර්ය බලකායේ නිලධාරින්ට පහසුකම් සැපයීමට, වත්කම් මිලදී ගැනීමට හා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් අධිවේගී මාර්ග ආදායමෙන් රු.මිලියන 492 ක් වැයකර තිබුණි. එම වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුව තිබියදී එසේ නොකර එක් රාජ්‍ය ආයතනයක් තවත් රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් වියදම් කර තිබුණි.

### ව්‍යාපෘති ආරම්භ නොකිරිම

මාර්ග සංවර්ධන අධිකාරියේ සැලැසුම් අංශය විසින් 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරිම් යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,941.01 ක් වූ ව්‍යාපෘති 113 ක් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. විගණනයට ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාව අනුව එම ව්‍යාපෘති 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

### ඉලක්කගත වැඩ ප්‍රමාණයන් නිම නොකිරිම

2019 දෙසැම්බර් 31 දිනට නිමකළ යුතු ඉලක්කගත වැඩ ප්‍රමාණයෙන් සියයට 50 කට අඩු භෞතික ප්‍රගතියක් වාර්තා වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,272.38 ක් වූ ව්‍යාපෘති 40 ක් පැවැතුණි. එම ව්‍යාපෘතිවලින් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 791.99 ක් වූ ව්‍යාපෘති 25 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවලට අදාළ ව්‍යාපෘති වී තිබුණි. එම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 10 ක් හෙවත් රු.මිලියන 80.29 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

### දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය

### අධිවේගී මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ, තාක්ෂණික පිරිවිතරයේ 401.7.1 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, අධිවේගී මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය කිලෝමීටරයකට මීටර් 1.5 - 2.3 ක

පරාසයක පැවතිය යුතුව තිබුණි. තාක්ෂණික පරීක්ෂණ වාර්තාවන්හිදී කොන්ත්‍රාත්කරුවන් විසින් එම දර්ශකයන් වෙත ළඟා කර ගෙන තිබුණි. කෙසේවුවත්, භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි අධිවේගී මාර්ගයේ සමහර කොටස්වල මාර්ගයේ සුමටතාවය ධාවනය වන මෝටර් රථවල යහපත් ධාවන තත්ත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වී නොතිබුණි.

### සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා වාර්තාවේ 8.33 වගන්තියට අනුව, සේවා ප්‍රදේශයන් කිහිපයක් හඳුනාගෙන තිබුණද, සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිඳු සැලැස්මක් හෝ වැඩ ප්‍රමාණ පත්‍ර මඟින් මූල්‍ය ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණි. ඒ අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ 46 වන කිලෝමීටරයෙහි පිහිටි වැලිපැන්න සේවා මධ්‍යස්ථානයෙන් අනතුරුව කි.මී.173 ක් වූ අධිවේගී මාර්ගයේ අවසානය දක්වා භාවිතා කරන මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සහ දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන

### ලංසු ලියවිලි විධිමත් පරිදි ඇගැයීම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 හා 2.6 මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීමේ කමිටුව විසින් ලංසු ලියවිලි විධිමත් පරිදි ඇගයීමක් සිදුකළ යුතුව තිබුණි. දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ කොන්ත්‍රාත් පැකේජ 02 ක් මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ලියවිලි විධිමත් පරිදි ඇගයීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු පත්‍ර සහ වැඩ ප්‍රමාණ පත්‍ර අතර රේට විෂමතා සහ වැඩ විෂයයන් සඳහා වන වැරදි අර්ථ නිරූපණ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28.73 ක අලාභයක් ව්‍යාපෘතියට සිදුවී තිබුණි.

### කැපකරු කොමිස් ගෙවීම නිෂ්කාර්යවීම

2019 දෙසැම්බර් 31 දිනට නිකුත් නොකරන ණය මුදල් ප්‍රභවය මත ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට අදාළව රු.මිලියන 1,180.44 ක් හා දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට අදාළව රු.මිලියන 206.03 ක් කැපකරු කොමිස් ලෙස ණය සැපයුම් නියෝජිතායතනය වෙත ගෙවා තිබුණි. ඒ අනුව එකතුව රු. මිලියන 1,386.47 ක නිෂ්කාර්ය වියදමක් සිදු කර තිබුණි.

### මධ්‍යම අධිවේගී මාර්ගය

අදියර 4 කින් සමන්විත මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම පිණිස ඕස්ට්‍රේලියානු සමාගමක් වෙත රු.මිලියන 1,759 ක් ගෙවා තිබුණි. එකී සමාගමෙන් අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන වාර්තාවන් ලබාගැනීමට කටයුතු නොකර තවදුරටත් සම්බන්ධිත ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම සඳහා දේශීය ආයතන කිහිපයක් සමඟ රු.මිලියන 97 ක ගිවිසුම්වලට එළඹී තිබුණි.

### මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටස

පොතුහැර සිට ගලගෙදර දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටසෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2018 මැයි 04 දින කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය නිකුත් කර තිබුණි. ජපාන කොන්ත්‍රාත්කරු සමඟ එකඟවූ ක්‍රියාවලිය සහ ටෝකියෝ මිට්ෂුබිෂි යූඑෆ්ජේ ලිමිටඩ් බැංකුව සමඟ පැවති මූල්‍ය සම්පාදන එකඟත්වය අවසන් කිරීම සඳහා 2020 මාර්තු 01 දින අමාත්‍ය මණ්ඩලයේ

අනුමැතිය ලැබී තිබුණි. තවද, ව්‍යාපෘති අධ්‍යක්ෂගේ 2019 ජූලි 12 දිනැති ලිපිය මඟින් උපදේශක සමාගම සමඟ පැවති ක්‍රියාවලියද අවසන් කර තිබුණි. මේ අනුව එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## වන්දි ගෙවූ ඉඩම් කැබැලි මාර්ග සංවර්ධන අධිකාරියට පවරා නොගැනීම

1986 අංක 13 දරන ඉඩම් ආඥා පනතේ 44 වගන්තියට අනුව මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කර ගන්නා ඉඩම්වලට අදාළ වන්දි මුදල් ගෙවා අවසන් වූ පසු එම ඉඩම්වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට ක්‍රියාකළ යුතුව තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති 5 ක ඉඩම් කැබලි 12,980 ක් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු. මිලියන 19,819.86 ක් වන්දි මුදල් ගෙවා තිබුණි. එම ඉඩම් කැබලිවලින් 412 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ නමට ලියාපදිංචිකර තිබුණි.

## ණය අරමුදල් උපයෝජනය නොකිරීම

මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ලබා ගන්නා විදේශ ණය අරමුදල් අදාළ ණය ගිවිසුම් කාළය තුළ උපයෝජනය කර සැලසුම් කළ ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතුව තිබුණි. ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් ලබාගත් ණය අරමුදල්වලින් රු.මිලියන 28,829.53 ක් වූ අරමුදල් ගිවිසුම් කාලය තුළ උපයෝජනය කර නොතිබුණු බැවින් එම අරමුදල් ණය ලබා දුන් ආයතනය වෙත ආපසු යැවීමට සිදුවී තිබුණි. මේ නිසා සැලැසුම් කළ ඉදිකිරීම් කටයුතුවලින් කොටසක් නිමකිරීමට නොහැකිවීම මෙන්ම භාවිතා නොකරන ලද ණය අරමුදල් වෙනුවෙන් බැදීම් ගාස්තුද ගෙවීමට සිදු වී තිබුණි.

## විනිමය අලාභයන්

පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියර III සඳහා 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 9,527 ක විනිමය අලාභයක් සිදුවී තිබුණි. එය උපයෝජනය කර තිබූ රු.මිලියන 62,702 කින් සියයට 15 ක් වී තිබුණි. ඩොලරයට සාපේක්ෂව රුපියල වේගයෙන් අවප්‍රමාණය වීම, කොන්ත්‍රාත් ගිවිසුම්වල අහිතකර ගෙවීම් කොන්දේසි, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම, මුළු ණය මුදලින් ආසන්න වශයෙන් සියයට 50 ක් පමණ ණය ගිවිසුම කල්පිරෙන 2019 වර්ෂය තුළදී උපයෝජනය කර තිබීම යන හේතු බලපා තිබුණි. එම බලපෑම් පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## ව්‍යාපෘති වැඩ විෂයයන් අවසන්වීමෙන් පසුව කඩිනමින් ඇවර නොකිරිම

විදේශ අරමුදල් මඟින් ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කළමනාකරණ ඒකක අදාළ වැඩ විෂයන් අවසන් වූ පසු කඩිනමින් ඇවර කළ යුතුව තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන විදේශ අරමුදල් ව්‍යාපෘති 05 ක ඉදිකිරීම් කටයුතු නිම වී අදාළ වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණද, එම ව්‍යාපෘතිවල වගකීම් අධිකාරිය වෙත පවරා නොදී ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් වර්ෂ 2 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක් තුළ පවත්වාගෙන යමින් තිබුණි.

# විදුලිබල හා බලශක්ති

## අංශ

පුනර්ජනනීය බලශක්තිය

ඛනිජ තෙල්

### නිරීක්ෂණ

- උපයන විට බදු ගෙවීම.
- කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම
- ලැබිය යුතු ගිණුම්
- පාරිභෝගිකයන්ගෙන් තැන්පතු වෙනුවෙන් පොලී ගෙවීම
- විදුලිබල පනතට පටහැනිව මිලදීගැනීම්
- ජනන සැලැස්මට  පටහැනිව මිලදීගැනීම්
- උසාවි තීන්දුවට පටහැනිව වැටුප් ගෙවීම.
- මොරගොල්ල ජල විදුලි බලාගාරයඉදිකිරීම
- ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය
- බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය
- ඉන්ධන පිරවුම්හල් පිළිබඳ අමාත්‍යාංශයේ අධීක්ෂණය දුර්වලවීම
- ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය
- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ඉලක්ක සඳහා සූදානම් වීම
- මානව සම්පත් කළමනාකරණය
- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්ත්වය
- දේශීය ඛනිජතෙල් වෙළඳපොල
- ණයගැතියන්ගේ ශේෂය වැඩිවීම
- සංස්ථාවේ ශුද්ධ වත්කම් සෘන අගයක් ගැනීම
- ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)

- තෙල් ප්‍රවාහනය නල මාර්ග ජාලය
- ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය
- නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම.
- අන්තර් සමාගම් ගනුදෙනු ශේෂයන් සහ ගිවිසුම්

# විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය

පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ආශ්‍රයෙන් විදුලිබල උත්පාදනය වැඩි කිරීම මඟින් බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත්කිරීමේ අපේක්ෂාවෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කළ යුතුව තිබුණි.

- විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම
- විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මඟින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලැසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය
- ග්‍රාමීය විද්‍යුතය
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙක කාල පරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 11,894 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 10,339 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාල පරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 13 ක් හෙවත් රු.මිලියන 1,555 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 37 හි දැක්වේ.




රූපසටහන 37 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## උපයන විට බදු ගෙවීම.

2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2009 වර්ෂයේ වැටුප් සංශෝධනය මගින් සේවකයින්ගෙන් අයකර ගත යුතු උපයන විට ගෙවීමේ බදු එසේ අයකිරීමකින් තොරව, ලංකා විදුලි බල මණ්ඩලය විසින්ම ගෙවා තිබුණි. මේ හේතුව නිසා 2010 වර්සයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 4,919 ක අතිරේක වියදමක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

## කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

2007 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය වෙනුවෙන් විවිධ දීමනා ලෙස රු.මිලියන 1,712 ක් ගෙවා තිබුණි.

## ලැබිය යුතු ගිණුම්

වර්ෂ 05 කට වඩා කාලයක සිට හිඟ හිටිව පවතින රු.මිලියන 3,322.20 ක වෙළඳ ණයගැතියෝ හා අනිකුත් ලැබීම් ශේෂ අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## පාරිභෝගිකයන්ගෙන් තැන්පතු වෙනුවෙන් පොලී ගෙවීම

ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයින් සතු තැන්පතු වෙනුවෙන් 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ 28(3) උප වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,592 ක පොලී ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ හතරක් සඳහා එකතුව වූ රු. මිලියන 5,118 ක පොලීය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## විදුලිබල පනතට පටහැනිව මිලදීගැනීම්

2013 අංක 31 දරන (සංශෝධිත) විදුලිබල පනතේ 43 වන වගන්තියට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර 2016 අප්‍රේල් මාසයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ ගි.වො පැය 2,165 ක විදුලිය වෙනුවෙන් රු.බිලියන 54 ක් වැය කර ජනන බලපත්‍ර නොමැති බලාගාරවලින් හදිසි මිලදී ගැනීම සිදු කර තිබුණි.

## ජනන සැලැස්මට පටහැනිව මිලදීගැනීම්

දිගු කාලීන ජනන සැලැස්මට (2018-2037) අනුව 2019 වර්ෂය තුළ තාප හා පුනර්ජනනීය මූලාශ්‍රයන්ගෙන් මෙ.වො 370ක සහ 287ක විදුලිය පිලිවෙලින් පද්ධතියට එකතුවීමට නියමිතව තිබුණි. වර්ෂය තුලදී පුනර්ජනනීය බලශක්තිය ලෙස මෙ.වො 25.2ක් පද්ධතියට එකතු වී තිබුණු අතර ජනන සැලැස්මෙන් බැහැරව මෙ.වො 222 ක විදුලිය එකතු වී තිබුණි. මේ හේතුවෙන් රු. බි. 22.2 ක වටිනාකමින් යුත් ගි.වො පැය 735 ක හදිසි විදුලි මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## උසාවි තීන්දුවට පටහැනිව වැටුප් ගෙවීම.

අංක CA/WRIT/193/2015 දරන උසාවි නඩු තීන්දුවට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවයකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 38,508 ක වැටුප් ගෙවා තිබුණි.

## මොරගොල්ල ජල විදුලි බලාගාරයඉදිකිරීම

මෙගා වොට් 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාත්මක මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ

ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. වර්ෂ 3 ක ප්‍රමාදයකින් පසුව ව්‍යාපෘතියේ වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,780 ක් වී තිබුණු අතර ඉන් රු.මිලියන 14,851 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 31 ක් වී තිබුණි. ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ කිරීමට නොහැකි වීම නිසා ලබාගත් ණය වෙනුවෙන් රු.මිලියන 28 කට ආසන්න එ.ජ.ඩොලර් 177,931 ක් දණ්ඩන ලෙස (Commitment Charges) ගෙවීමට සිදු වී තිබුණි .

## ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 23,720 ක් ලැබී තිබුණු අතර එය 2015 ජනවාරි මාසයේ ආරම්භ කර 2018 ජනවාරි මාසයේදී නිම කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ උපදේශනය සඳහා වූ විෂයපථය JICA ආයතනය සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමට ප්‍රමාද වීම, කොන්ත්‍රාත් කරුවන්ගේ පූර්ව සුදුසුකම් (PQ) සඳහා JICA අනුමැතිය ලබාගැනීමට හා ප්‍රසම්පාදන ලේඛන සඳහා JICA අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම යන හේතු නිසා ව්‍යාපෘතිය නියමිත දිනට නිම කිරීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 2 ක් පමණ වී තිබුණි.

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය

මෙ.වො.35 ක් වූ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කර 2017 අගෝස්තු මාසයේදී නිම කිරීමට සැලැසුම් කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම හා සමාජීය ගැටළු උද්ගත වීම නිසා ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාද වී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 9,424 ක් ලැබී තිබුණු අතර ඉන් රු. මිලියන 6,426 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි. එදින වන විට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 69 ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 74 ක් වී තිබුණි. 2019 වර්ෂයට අදාළව ව්‍යාපෘතිය වෙනුවෙන් කිසිදු වියදමක් කර නොතිබුණි.

# බලශක්තිය

දේශීය ඛනිජතෙල් හා ස්වභාවික වායු ප්‍රශස්ත නිෂ්පාදනය සමඟ ශ්‍රී ලංකාව බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත්කිරිම බලශක්ති අංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ඛනිජතෙල් සම්පත් සංවර්ධනය පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරිම හා ඇගැයීම
- ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරිම, බෙදාහැරිම සහ අලෙවි කිරිම
- ඛනිජතෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
- ඛනිජතෙල් ගවේශණය හා ඒ ආශ්‍රිත කටයුතු
- ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම
- ඉන්ධන සැපයීම හා බෙදාහැරිමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකක් වෙනුවෙන් එකතුව රු.මිලියන 911.84 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් එකතුව රු.මිලියන 756.69 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ දෙකකදී හා සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 17.02 ක් හෙවත් රු.මිලියන 155.15 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 38 හි දැක්වේ.




රූපසටහන38- පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේ අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## රෙගුලාසිවලට අනනුකූල ලෙස දැන්වීම් පල කිරීම

2019 අගෝස්තු 20 දිනැති අංක EC/EDR/01/2019 දරන මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ චක්‍රලේඛය මඟින් මැතිවරණ කාලසීමාවේ දී හා ඡන්ද විමසීම් නිවේදනයට පූර්වාසන්නයෙන් වූ කාලසීමාව තුළ මහජන මුදල් අධික ලෙස වැය කරමින් විවිධ ව්‍යාපෘති හෝ වෙනත් සංවර්ධන කටයුතු පිළිබඳව හෝ කාරණා සම්බන්ධයෙන් ප්‍රචාරක දැන්වීම් මුද්‍රිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් පළකිරීමට හා එමඟින් දේශපාලඥයින්ගේ ප්‍රතිරූප ඔසවා තැබීමට කටයුතු නොකරන ලෙස දන්වා තිබුණි. නමුත් ඊට අනුගත නොවී ඛනිජතලේ සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පුවත්පත් දැන්වීම් (ඛනිජතෙල් ගවේෂණ සඳහා ගිවිසුම් අත්සන් කළ බව දැක්වෙන) පළකිරීම සඳහා රු.මිලියන 5.55 ක් වැය කර තිබුණි.

## සැලැසුම් කළ කාර්යයන් ඉටු නොකිරීම

ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 09 කින් සමන්විත ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එම ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මිලියන 60 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ක්‍රියාකාරි සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් අතරින් රු. මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණු ක්‍රියාකාරකම් 05 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවත් ක්‍රියාකාරකම් දෙකක් වෙනුවෙන් රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ක්‍රියාකාරකම් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළ අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

## දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) අතර 2015 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2018 සැප්තැම්බර් 28 දින වන විට මෙම ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත්තු වටිනාකම වූ රු.මිලියන 37.16 ක් නාරා ආයතනය වෙත ගෙවා තිබුණි. ව්‍යාපෘතියෙන් රැස් කර ගත් දත්ත ඇතුළත් කරමින් සකස් කරන ලද දත්ත පද්ධතිය හා වෙබ් අඩවිය ඇතුළත් කරන වෙබ් සර්වර් යන්ත්‍රයේ රු.මිලියන 1.20 ක පිරිවැයද එම කොන්ත්‍රාත්තුවේ වටිනාකමට ඇතුළත් වී තිබුණි. නමුත් දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිලධාරින් නොමැති වීම හා අවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය තුළ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි. මෙම වෙබ් සර්වර් යන්ත්‍රයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු නාරා ආයතනය විසින් දැනට සිදු කළ ද එළඹ තිබුණු ගිවිසුම අනුව එම ක්‍රියාකාරකම ඇතුළත් වී නොතිබුනි. එම ක්‍රියාකාරකම් ඇතුළත් කර වෙනම උප ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

### ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ ගවේශනය සඳහා වූ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ JS 5 සහ JS 6 බිම් කොටස්වල ගවේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශයේ ටොටාල් සමාගම 2016 පෙබරවාරි 18 දින ඒකාබද්ධ ගවේෂණ ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම 2018 පෙබරවාරි 18 දින අවසන් වී තිබුණි. නමුත් 2019 අගෝස්තු 27 දින දක්වා වූ වර්ෂ 1 ½ ක කාලය විධිමත් ගිවිසුමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2016 පෙබරවාරි 18 දින ගිවිසුමට එළඹීමේදී සපුරා තිබිය යුතු පූර්ව අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා 2019 අගෝස්තු 27 දින නැවත සංශෝධිත ඒකාබද්ධ ගිවිසුමකට ඇතුළත් වී තිබුණි.

### ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා බටහිර අක්වෙරළ තීරය ආශ්‍රිතව ද්වීමාන හා ත්‍රිමාන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා බටහිර අක්වෙරළ තීරය ආශ්‍රිතව ද්වීමාන හා ත්‍රිමාන දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික වශයෙන් විශේෂිත ව්‍යාපෘතියක් වන බැවින් ප්‍රමුඛතා පදනම මත කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ආර්ථික කළමනාකරණය සඳහා වූ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් උපදෙස් ලබා දී තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹීම ට වර්ෂ 1 ½ කට වැඩි කාලයක් ප්‍රමාද කර 2018 මැයි 30 දින ගිවිසුම්වලට එළඹ තිබුණි.

### මන්නාරම් ද්‍රෝණියේ $M_2$ ගවේෂණ බිම් කොටසේ ඛනිජතෙල් ගවේෂණ කටයුතු ව්‍යාපෘතිය

මන්නාරම් ද්‍රෝණියේ $M_2$ ගවේෂණ බිම් කොටසේ ඛනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා 2007 වර්ෂයේදී ජාත්‍යන්තර ලංසු කැඳවීමේ වටයකින් පසු කෙයාර්න් ලංකා (පුද්ගලික) සමාගම තෝරා ගෙන තිබුණි. 2011 වර්ෂයේදී සිදු කරන ලද කැණීම්වලින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. මෙම සමාගම මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ කටයුතු අතරමඟ නවතා 2015 ඔක්තෝබර් 15 දින ගිවිසුම අවසන් කර තිබුණි. එදින සිට මෙම බිම් කොටසේ ගවේෂණ කටයුතු වර්ෂ 04 ක පමණ කාලයක් මුළුල්ලේ කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණු අතර එය අතරමඟ නවතා තිබුණි. තවද ආයෝජකයන් විසින් ගවේෂණ කටයුතු අතරමඟ නවතා දැමීම හේතුවෙන් නැවත නැවතත් ලංසු කැඳවීමේ වට ක්‍රියාත්මක කිරීමට සිදු වීමත්, එම හේතුවෙන් අධික වශයෙන් අලෙවි ප්‍රවර්ධන වියදමක් දැරීමට සිදු වී තිබුණි.

### මන්නාරම් ද්‍රෝණියේ $M_2$ බිම් කොටසේ ගවේෂණ කටයුතු හා ස්වාභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

මන්නාරම් ද්‍රෝණියේ $M_2$ බිම් කොටසේ ගවේෂණ කටයුතු හා ස්වාභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේ දී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් අයි.එච්.එස්. ග්ලෝබල් සමාගම (IHS Global) තෝරා ගෙන තිබුණි. ඒ සඳහා 2016 දෙසැම්බර් සිට 2018 අගෝස්තු දක්වා අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා එ.ජ. ඩොලර් 300,000 ක් හෙවත් රු.මිලියන 46.61 ක් වැ කර තිබුණි.

නමුත්එම අලෙවි ප්‍රවර්ධන කටයුතු අසාර්ථක වී තිබුණි.

### මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන්ගතව සිදු කරන ගුරුත්ව හා චුම්භක සමීක්ෂණ මඟින් දත්ත රැස් කිරීමේ ව්‍යාපෘතිය

මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන්ගතව සිදු කරන ගුරුත්ව හා චුම්භක සමීක්ෂණ මඟින් දත්ත රැස් කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු, 2012 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය වර්ෂ 07 ක කාලයක් මුළුල්ලේ ලංසු කැඳවීම, ලංසුකරුවන් තෝරා ගැනීම ආදී කටයුතු හැර වෙනත් කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

### ඉන්ධන පිරවුම්හල් පිළිබඳ අමාත්‍යාංශයේ අධීක්ෂණය දුර්වලවීම

ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමේ එක් අරමුණක් වේ. මේ සඳහා අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ එක් කාර්යයක් වේ. ඉන්ධන අලෙවි කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් 1461 ක් පැවති අතර ඉන් 1254 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් වන අතර ඉතිරි ඉන්ධන පිරවුම්හල් 207 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් වේ. 2017 ජනවාරි 25 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ දී විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් යොදවා ප්‍රාදේශීය අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණ කටයුතු පිළිබඳව සොයා බැලීමට කටයුතු යොදන ලෙස අමාත්‍යාංශයට නිර්දේශ කර තිබුණි. එම නිර්දේශයට අනුව ඉන්ධන පිරවුම්හල්වල ඉන්ධන නිකුත් කරන යන්ත්‍රවල නිවැරදි ප්‍රමාණයට ඉන්ධන නිකුත් වේදැයි පරීක්ෂා කිරීම සහ ප්‍රාදේශීය අධීක්ෂණ නිලධාරින්ගේ අධීක්ෂණ කටයුතු සොයා බැලීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ විශේෂ අධීක්ෂණ කණ්ඩායමක් විසින් 2018 වර්ෂයේදී ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් 1461 අතරින් ඉන්ධන පිරවුම්හල් 73 ක් පරීක්ෂා කර තිබූ අතර ඉන් පිරවුම්හල් 28 ක් හෙවත් සියයට 38 ක් දුර්වල තත්ත්වයක පැවතුණි. තවද, 2018 වර්ෂයේදී ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් පිරවුම්හල් 207 ක් අතරින් 03 ක් පමණක් භෞතිකව පරීක්ෂා කර තිබූ අතර ඉන් පිරවුම්හල් 02 ක් සාමාන්‍ය තත්ත්වයේ හා දුර්වල තත්ත්වයේ පැවතුණි. විගණනය විසින් නියැදි පදනමක් මත ගම්පහ හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ඉන්ධන පිරවුම්හල් 24 ක් සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේ දී එයින් ඉන්ධන පිරවුම්හල් 21 කම ඉන්ධන සැපයුම් සේවාවේ ප්‍රමාණාත්මක අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ අනුව ඉන්ධන පිරවුම්හල් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ අධීක්ෂණ කටයුතු පුළුල් කිරීමේ අවශ්‍යතාවය දැඩිව පවතින තත්ත්වයක් තුළ 2019 වර්ෂයේදී ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් ඉන්ධන පිරවුම්හල් කිසිවක් පරීක්ෂා කර නොතිබුණි.

### ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය

#### 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීම

2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තය ද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ නියාමනයට ලක් කෙරෙන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම්

මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු 2006 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් එය නිම කර නොතිබුණි.

### ජාතික වායු ප්‍රතිපත්තිය සැකසීම

2015 සැප්තැම්බර් 21 දින අතිවිශේ�ෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මගින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබා දී තිබුණි. 2018 ජුනි මාසය වන විට සකස් කර අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

### නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම

කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව සතු භූමියේ පිහිටුවා ඇති තෙල් තොග ගබඩාව, එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙස 2011 වර්ෂයේ දී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා තිබුණි. නව තොග ගබඩාවක් ස්ථාපනය කිරීම සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීමට නොහැකි වීම නිසා පවතින තෙල් තොග ගබඩාවම නවීකරණය හා පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාම සඳහා 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය විසින් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 142.98 ක හිඟ මුදල ගෙවා නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

### තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ඉලක්ක සඳහා සූදානම් වීම

- 2017 ජුලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට ඍජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණ ලෙස “දැරිය හැකි පිවිතුරු බලශක්තිය” හඳුනාගෙන තිබුණ ද, එම තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට 2019 වර්ෂයේදී කිසිදු ව්‍යාපෘතියක් සැලැසුම් කර හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

- අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය මෙහෙයවීම සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මඟපෙන්වීමක් නිකුත් කර නොතිබුණි. ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

- අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ දී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හා දර්ශක නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තව ද ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ සඳහා නිලධාරියෙකු යොදවා නොතිබුණි.

- ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ

සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.

## මානව සම්පත් කළමනාකරණය

### අත්‍යාවශ්‍ය තනතුරුවල සැලකිය යුතු පුරප්පාඩු පැවතීම

තාත්ත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 04 ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 18 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් ද, වශයෙන් පුරප්පාඩු 32 ක් පැවතුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආයතනයේ පුරප්පාඩු සංඛ්‍යාව ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී සියයට 33 ක් පමණ වන බව නිරීක්ෂණය විය.

### මානව සම්පත් සංවර්ධනය නිසිපරිදි සැලසුම් නොකිරීම

2018 ජනවාරි 24 දිනැති අංක 02 / 2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අංශය විසින් පහත සඳහන් මානව සම්පත් සංවර්ධනය අදාළ සැලැසුම් නිසි පරිදි සිදු කර නොතිබුණි.

- සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබීම.
- වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කාර්යමණ්ඩලය යොදවන ලබනු ආකාරය පිළිබඳ සැලැසුම් සකස් නොකිරීම.
- එක් එක් නිලධාරින්ගේ නිපුණතා වෙන් වෙන්ව හඳුනා ගැනීමක් සිදු කර නොතිබුණ අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.
- 2019 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 22 ක් අතරින් පුහුණු වැඩසටහන් 14 ක් පමණක් ක්‍රියාත්මක කිරීම.
- 2019 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වෙන් කර තිබු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 79 ක් උපයෝජනය නොකිරීම.

## දේශීය ඛනිජතෙල් වෙළඳපොල

2019 වර්ෂයේ දේශීය ඛනිජ තෙල් වෙළඳපොලෙන් සියයට 87 ක සැපයුම ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මගින් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමස්ථ ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 3,677 ක් වැය කර තිබුණි. සමස්ත ඛනිජ තෙල් වෙළඳපොලේ වෙනස්වීම් වල ප්‍රතිපලයක් ලෙස, 2019 වර්ෂයේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඉකුත් වර්ෂයේ පැවති එ.ජ. ඩොලර් 76.25 මිලට සාපේක්ෂව එ.ජ. ඩොලර් 68.80 ක් දක්වා සියයට 9.8 කින් අඩු වී තිබුණි. ආනයනය කළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත මෙට්‍රික් ටොන් එකක් සඳහා සාමාන්‍ය මිල 2018 වර්ෂයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් 592 ට සාපේක්ෂව 2019 වර්ෂයේදී එ.ජ. ඩොලර් 571 ක් දක්වා සියයට 3.6 කින් අඩු වී තිබුණි.

## ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්ත්වය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 4,260.66 ක දළ ලාභයක් වාර්තා කර තිබූ අතර එය ඉකුත් වර්ෂයේදී වාර්තා කළ දළ අලාභය වූ රු.මිලියන 4,124.21 ට සාපේක්ෂව රු. මිලියන 8,384.87 ක වර්ධනයක් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 11,835.6 ක බදු පෙර ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණු අතර ඉකුත් වර්ෂයේදී රු.මිලියන 106,140.4 ක අලාභයක් ලබා තිබුණි. 2019 වර්ෂයේ මැද භාගය වන තෙක් සංස්ථාවේ ඛනිජතෙල් නිෂ්පාදන සඳහා අමාත්‍ය මණ්ඩලයේදී අනුමැතිය ඇතිව මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් දළ ලාභයක් වාර්තාකර තිබුණද, එකී මිල සූත්‍රයට පරිබාහිරව විශේෂයෙන්ම පෙට්‍රල් (92 ඔක්ටේන්), ඩීසල් සහ භූමිතෙල් යන ප්‍රධාන ඛනිජතෙල් නිෂ්පාදනවල මිල සංශෝධනය කිරීමේදී නිෂ්පාදන පිරිවැයට අඩුවෙන් මිල නියම කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ මූල්‍ය තත්ත්වය තවදුරටත් දුර්වල මට්ටමක පැවතීමට හේතු වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංස්ථාවේ බදු පෙර අලාභය රු.මිලියන 94,304.8කින් අඩුවීමට ඉකුත් වර්ෂයේ රු.මිලියන 82,717.29 ක්ව පැවති විනිමය අනුපාත විචලනයේ අවාසිය රු.මිලියන 8,397.55 ක වාසිදායක තත්වයක් බවට පත්වීම මූලිකවම බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 5 මූල්‍ය ප්‍රතිඵලයේ වෙනස්වීම් රූපසටහන 39 හි දැක්වේ.




රූපසටහන 39-සංස්ථාවේ ලාභය/(අලාභය )

මූලාශ්‍රය - ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

## ණයගැතියන්ගේ ශේෂය වැඩිවීම

විගණනයට ඉදිරිපත් කරන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට මුළු වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු. මිලියන 153,221.9 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම වූ රු. මිලියන 86,652.1 ක වටිනාකමට සාපේක්ෂව සියයට 76.82 කින් වැඩි වී

තිබුණි. මෙම ණයගැති ශේෂය රාජ්‍ය අංශයේ ණයගැතියන් රු.මිලියන 135,335.8 කින් හා පෞද්ගලික අංශයේ ණය ගැතියන් රු.මිලියන 17,886.1 කින් සමන්විත විය. ඉන් ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙතින් සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල පිළිවෙලින් රු. මිලියන 85,911.5 ක් හා රු. මිලියන 48,385.3 ක් වී තිබුණි.

## සංස්ථාවේ ශුද්ධ වත්කම් සෘන අගයක් ගැනීම

ඉකුත් වර්ෂයේ රු.මිලියන 281,462.4 ක්ව පැවති සංස්ථාවේ සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 293,213.5 දක්වා රු.මිලියන 11,751.1 කින් තවදුරටත් වැඩි වී තිබුණි. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සහ මූල්‍ය වියදම්වල වැඩිවීම, මෙම සමුච්චිත අලාභය ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව මතභේදයට තුඩු දී තිබුණි.

## ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පු යටතේ එ.ජ.ඩො. මිලියන 60 ක් (රු. මිලියන 7,613 ක්) ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබූ අතර, එ.ජ.ඩො. මිලියන 27 ක් (රු. මිලියන 3,881ක්) ඩොයිෂ් බැංකුවට 2016 අගෝස්තු 04 දින ගෙවා තිබුණි. ලැබී තිබුණු තොරතුරුවලට අනුව 2019 වන විට මෙම ගනුදෙනු හේතුවෙන් සංස්ථාව විසින් රු. මිලියන 13,641 ක පාඩුවක් ලබා තිබුණි. සංස්ථාවේ ඉදිරි සුරකුම් ගනුදෙනුව (හෙජින්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති වියදම් වශයෙන් රු.මිලියන 941.2 ක් වැය කර තිබුණි. එයින් රු.මිලියන 370.6 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරා තිබූ අතර රු.මිලියන 567 ක් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සංස්ථාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රතිපූර්ණය කර නොතිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 3.1 ක් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. තවද, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ ඉහළ වාණිජ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2019 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

## තෙල් ප්‍රවාහනය නල මාර්ග ජාලය

දශක ගණනාවකට පෙර ස්ථාපිත කරන ලද නල මාර්ගයන් ඔස්සේ කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් පර්යන්තය දක්වා ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කරන අතර එම නල මාර්ග අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. ඉන් නල මාර්ග කිහිපයක් අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවැතීම හේතුවෙන් දැනටමත් අතහැර තිබුණි. දැනට භාවිතයේ ඇති අඟල් 10 සහ අඟල් 14 ඉන්ධන නල කිහිප වාරයක් කාන්දු වීම් වාර්තා වී තිබුණි. එබැවින් මෙම නල මාර්ග ප්‍රතිසංස්කරණය හෝ නවීකරණය කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයක් වී තිබුණි.

මේ අතර, මුතුරාජවෙල තෙල් පර්යන්තය සහ කොලොන්නාව තෙල් පර්යන්තය අතර කිසිදු අන්තර් සම්බන්ධයක් නොමැති අතර එම බාධකය හේතුවෙන් එම පර්යන්තවල ප්‍රශස්ත උපයෝජනයට බාධාකාරී වී තිබුණි. තවද 2012 සැප්තැම්බර් 13 දින "රට හරහා

නල ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

දශක 05 කට පමණ පෙර කොළඹ වරාය (දකුණු ජැටිය) සිට කොලොන්නාව අතර ඉන්ධන ප්‍රවාහනය සඳහා ස්ථාපනය කර තිබුණු අඟල් 12 ක විෂ්කම්භයකින් යුත් නලය දශකයකට ආසන්න කාලයක් වැඩ කරන තත්වයේ නොපැවතුනි. මෙම ඉන්ධන නලය 2011 වර්ෂයේදී මහවත්ත ප්‍රදේශයේ මීටර් 300 පමණ ප්‍රමාණයක් නවීකරණය කර තිබුණද, සම්පූර්ණ ක්‍රියාකාරී මට්ටමට ගෙන නොතිබුණි. 2015 පෙබරවාරි 13 දින CPSTL ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් නල මාර්ග නවීකරණය කිරීම සඳහා රු. මිලියන 260 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රු.මිලියන 120 ක වියදමින් මීටර් 2,171 ක් සහ 2016 වර්ෂයේදී රු.මිලියන 153 ක වියදමින් මීටර් 2,573 ක් නිමකර තිබුණි. එසේ වුවද ඉන්ධන නල මාර්ගය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා නවීකරණය කිරීමට ඉතිරිව ඇති දුර ප්‍රමාණය මීටර් 1000 කට වඩා අඩු වුවද, රට තුළ ඉන්ධන සැපයුම් ක්‍රියාවලිය අවහිරවීමට ඇති අවදානම වළක්වා ගැනීම සඳහා නල මාර්ගයේ නවීකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා වූ කඩිනම් ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන නොතිබුණි.

### ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය

භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේම අවධානය යොමුවී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම ස්වාභාවික වරාය වන ත්‍රිකුණාමල වරාය තුළ 1930 ගණන් වල ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය සණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. රටේ පසුභාග ඛනිජතෙල් ක්ෂේත්‍රයේ ප්‍රධාන මෙහෙයුම්කරු වශයෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට, ගබඩා පහසුකම්, කාර්යක්ෂම ගොඩබෑමේ පහසුකම්, ප්‍රවාහන නල පද්ධති සහ අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබාදීම තුළින් ලාභදායී විකල්ප ව්‍යාපාරික අවස්ථා හා විකල්ප වෙළඳාම් වන තාර, ලිහිසි තෙල් සහ ද්‍රවීකෘත වායු මෙහෙයුම් යනාදී ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමට මෙම ටැංකි සංවර්ධනය හා පුනරුත්ථාපනය කර භාවිතා කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ. දැනට පවතින 99 ක් වූ මුළු ටැංකි ප්‍රමාණයෙන් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරන අතර අතහැර දමා තිබෙන ඉතිරි ටැංකි නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 වන දින ආරම්භ කර තිබුණ ද, ඒ පිළිබඳව අවසන් තීරණයකට එළඹ නොමැති බැවින් නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී තිබුණි.

### නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම.

යුද්මය වාතාවරණයෙන් පසු සීඝ්‍රයෙන් වර්ධනය වූ උතුරෙහි ජනතාවගේ හා ආරක්ෂක අංශවල ඉන්ධන අවශ්‍යතාවය ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් පවත්වාගෙන යන තෙල් තොග ගබඩාව මඟින් සපුරා තිබුණි. එම තොග ගබඩාව කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව පිහිටි භූමියේ පිහිටා තිබෙන අතර සිමෙන්ති සංස්ථාව විසින් මෙම තෙල් තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙස 2011 වර්ෂයේ දී ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්තය සමාගම වෙත දන්වා තිබුණි.

දැනට තෙල් තොග ගබඩාව පවතින සිමෙන්ති සංස්ථාවට අයත් භූමියේම අවශ්‍ය නවීකරණය හා පුළුල් කිරීම සිදුකර ඉන්ධන ගබඩාව පවත්වාගෙන යනු ලැබේ. 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉඩමේ අයිතිය නිරවුල් කර විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් පසු මෙම ගබඩාව පවත්වා ගෙන යාමටත්, යම්කිසි හිඟ බදු මුදලක් වෙතොත් එය සිමෙන්ති සංස්ථාව වෙත ගෙවීමටත් තීරණය කර තිබුණද, එම තීරණයට අනුකූලව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## අන්තර් සමාගම් ගනුදෙනු ශේෂයන් සහ ගිවිසුම්

රාජ්‍ය සංස්ථාවක් විසින් යම් නිශ්චිත අරමුණක් උදෙසා ස්ථාපිත කර ඇති උප සමාගම්වල කටයුතු විධිමත්ව අධීක්ෂණය කිරීමට සහ මග පෙන්වීම ඉතා අත්‍යාවශ්‍ය කටයුත්තක් වී තිබුණි. එසේ වුවද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් එහි පරිපාලිත සමාගම වූ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි කටයුතු විධිමත්ව සමාලෝචනය කර නොතිබුණි. 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 ( ආ) ඡේදයට අනුව මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අර්ධ වර්ෂයකට වරක් හෝ උප සමාගම්වල කාර්යසාධනය සමාලෝචනය කර කාර්යසාධන වාර්තාවක් පිළියෙළ කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. තවද එකී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගනු ලබන තීරණ පිළිබඳව විධිමත් දැනුවත්භාවයක් සංස්ථාව සතුව නොතිබුණි. උදාහරණ ලෙස සංස්ථාව මගින් සිදු කරනු ලබන ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් වන නැව් සඳහා ඉන්ධන සැපයීමේ ව්‍යාපාරය, එම උපසමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ක්‍රියාත්මක කර තිබුණද, ඒ පිළිබඳව සංස්ථාව කිසිදු දැනුවත් වීමක් සිදු වී නොතිබුණි. එමෙන්ම , අන්තර් සමාගම් ගනුදෙනු පිළිබඳ විධිමත් සම්බන්ධීකරණයක් ආයතන දෙක අතර නොතිබීම හේතුවෙන් දීර්ඝ කාලයක් මුළුල්ලේ දෙපාර්ශවයේ ජංගම ගිණුම් අතර සැලකිය යුතු වෙනස්කම් පැවැතුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී එය රු. මිලියන 1,623.13 ක වෙනසක් පැවැතුණි.

# වාරිමාර්ග

## නිරීක්ෂණ

- තිරසර සංවර්ධන අරමුණු කරා ලගා වීම
- ආක්‍රමණශීලි ශාකවල ව්‍යාප්තිය
- අපේක්ෂිත නිමවුම් මට්ටම ලගාකර නොතිබීම
- නිලධාරියෙකුගේ වන්දි දෙපාර්තමේන්තුව විසින් ගෙවීම
- නිෂ්කාර්ය වත්කම්

# වාරිමාර්ග හා ජල සම්පත්

1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 1 වන කොටසේ 3 වන වගන්තිය ප්‍රකාරව පනතේ විධිවිධාන ක්‍රියාත්මක කෘෂිකාර්මික කාර්යයන් සඳහා අවශ්‍ය කරන වාරි ජලය පැවතීම, සහතික කිරීම මෙමෙ අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධක අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරිම.
- වාරිමාර්ග හා ජලාප්‍රවාහන පද්ධති ඉදිකිරිම,ක්‍රමවත්ව නඩත්තුව මගින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සැපයුම ක්‍රමානුකූලව ලබා ගැනීම.
- ජල පෝෂක ප්‍රදේශ හා ගංගා දෝණි නිශ්චිත වශයෙන් තීරණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ජල දූෂණය පාලනය කිරිම හා ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරිම සඳහා ක්‍රමෝපායයන් සකස් කිරිම.
- වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරිම සඳහා වැඩසටහන් ව්‍යාපෘති සම්පාදනය කිරිම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 173,732.76 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 117,341.42 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32.46 ක් හෙවත් රු.මිලියන 56,391.34 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 40 දැක්වේ.




රූපසටහන 40 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## තිරසර සංවර්ධන අරමුණු කරා ලගා වීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා "බලයලත් නිලධාරීන් 24 දෙනෙකු 2017 මාර්තු 30 දින පත් කර තිබුණි. 2015 වර්ෂයෙන් පසුව වාරි පද්ධතිය තුළ ආක්‍රමණශීලී ශාකවල ව්‍යාප්තිය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. නමුත් 2015 වර්ෂයට සාපේක්ෂව වර්තමානය වන විට එහි ව්‍යාප්තිය වැඩි වී තිබුණි. ඒ අනුව පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පත් කරන ලද බලය ලත් නිලධරයන් විසින් ප්‍රමාණවත් පරිදි අපේක්ෂිත අරමුණු ඉටුකර නොතිබුණි.

## ආක්‍රමණශීලි ශාකවල ව්‍යාප්තිය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පිහිටි මහා වාරි කළාපවල සැල්වීනියා හා ජපන් ජබර ව්‍යාප්තිය පාලනය කිරිම සඳහා පැලැටි සංරක්ෂණ සේවය මගින් ජෛව පාලන ක්‍රමීන් හඳුන්වා දි තිබුණි. ජපන් ජබර ශාකය සඳහා එම ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක නොවන බව එම ආයතනය විසින් ප්‍රකාශ කර තිබුණි. ජපන් ජබර ව්‍යාප්තිය පාලනය කිරිම සඳහා වර්ෂ 30 කට ආසන්න කාලයකට පෙර සිට ක්‍රමීයා හඳුන්වා දී තිබුණත්, එය සාර්ථක වී නොතිබුණි. ඒ වෙනුවට පර්යේෂණ මගින් හෝ වෙනත් ක්‍රමවේද මගින් එම ජපන් ජබර ව්‍යාප්තිය මැඩලීම සඳහා ආර්ථිකභාවයකින් යුතු සාර්ථක ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ වගකිවයුතු ආයතන විසින් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

## අපේක්ෂිත නිමවුම් මට්ටම ලගාකර නොතිබීම

වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු රු.මිලියන 196.88 ක ප්‍රතිපාදනවලින් ආරම්භ කරන ලද ව්‍යාපෘති 6 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. එම ව්‍යාපෘති ආරම්භ කර දීර්ඝ කාලයක් ගත වී තිබුණත් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රදේශයේ ගොවි ජනතාවට ලැබීම ප්‍රමාද වී තිබුණි. තවද, පොතුපිටිය වැවේ වැව් බැම්ම වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 28.99 ක් වූ පිරිවැය ඇස්තමේන්තුවක් මත සුළු කොන්ත්‍රාත් වශයෙන් සලකා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම වැව්වල වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර, නිම නොකළ වැඩ වල වටිනාකම රු.මිලියන 15.55 ක් වී තිබුණි.

## නිලධාරියෙකුගේ වන්දි දෙපාර්තමේන්තුව විසින් ගෙවීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඉංජිනේරුවෙකු විසින් විධිමත් පරිදි අනුමැතිය ලබා නොගෙන දෙපාර්තමේන්තුව සතු වාහනයක් ධාවනය කර 2003 සැප්තැම්බර් 15 දින අනතුරකට ලක් වී යතුරුපැදිකරුවෙකු ජීවිතක්ෂයට පත් වී තිබුණි. අදාළ ඉංජිනේරුවරයා වරදකරු වී වර්ෂ 02 ක සිර දඬුවම වර්ෂ 03 කට අත්හිටුවා තිබුණි. එම අනතුර නිසා අගතියට පත් පාර්ශවය විසින් වන්දි ඉල්ලා පවරන ලද නඩුවේ නියෝගය අනුව දෙපාර්තමේන්තුව වාණිජ බැංකුවක පවත්වාගෙන ගිය ජංගම ගිණුමකින් අවස්ථා දෙකකදී රු.මිලියන 3.91 ක් අධිකරණය විසින් අයකරගෙන තිබුණු අතර ඉන් රු.90,000 ක් අදාළ ඉංජිනේරුවරයාගෙන් අයකර ගෙන තිබුණි. එසේ බැංකුව විසින් ගෙවා තිබුණු රු.මිලියන 3.82 ක වටිනාකම දෙපාර්තමේන්තුවේ නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. එම ශේෂය නිරවුල්

කිරිමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### නිෂ්කාර්ය වත්කම්

- 2016 වර්ෂය සමග සැසදීමේදී නළ ළිං ඉදිකිරීමේ කටයුතුවල පහළ යාමක් තිබියදී එම තත්ත්වය පිළිබඳ නොසළකා අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 280 ක් වැයකර ජලසම්පත් මණ්ඩය විසින් නව විදුම් යන්ත්‍රයක් හා උපකරණ මිලදී ගෙන තිබුණි. මණ්ඩලය සතුව භාවිතයට ගත හැකි විදුම් යන්ත්‍ර කිහිපයක් නිෂ්කාර්යව ගබඩා කර තිබියදී මෙම විදුම් යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. එම විදුම් යන්ත්‍රය මිලදී ගත් දින සිට මාස 08 පමණ කාලයක් නිෂ්කාර්යව පැවැතුණි.

- 2009 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු අගල් 1 ½ ජල පොම්ප 50 ක් භාවිතා කිරීමකින් තොරව සහ එම යන්ත්‍රවල සක්‍රිය බව හෝ අක්‍රිය බව පරීක්ෂා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව රදවාගෙන තිබුණි.

# ජල සැපයුම් හා සනීපාරක්ෂාව

## නිරීක්ෂණ

- නල ජල සහ නල මලාපවහන පහසුකම් ආවරණය
- ජල නිෂ්පාදනය හා පරිභෝජනය
- ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය
- මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන (ව්‍යාපෘති I සහ II)
- මහ කොළඹ පුනරුත්තාපන ජල ව්‍යාපෘතිය
- කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - පැකේජ අංක 01 හා අංක 03
- ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය

## ජල සම්පාදනය

සුරක්ෂිත පානීය ජලය සහ වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් සැමට සැපයීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- නගර සැලසුම් සහ ජල සම්පාදන විෂයයන් හා සම්බන්ධ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම හා අදාළ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂය පථය යටතට ගැනෙන ඒ හා සම්බන්ධ විෂයයන් අධීක්ෂණය සහ ඇගයීම.
- විශේෂ නගර සැලසුම් හා සංවර්ධන කාර්යයන්
- නාගරික සංවර්ධන කටයුතුවලදී ජාතික භෞතික සැලසුම් පදනම් කොට ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම.
- සියලු පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය සැපයීම තහවුරු කිරීම පිණිස ක්‍රියාමාර්ග ගැනීම.
- ජල සැපයුම් සේවා, මලාපවහන ක්‍රම සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, ඉදිකිරීම, මෙහෙය වීම හා නඩත්තු කිරීම.
- ප්‍රජා ජලසම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමට මෙම අංශය සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකක කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 124,896.30 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 109,274.15 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මෙම කාල පරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12.51 ක් හෙවත් රු.මිලියන 15,622.15 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 41 හි දැක්වේ.




රූපසටහන 41 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## නල ජල සහ නල මලාපවහන පහසුකම් ආවරණය

ජල සැපයුම හා සනීපාරක්ෂාව අරමුණු කර ගනිමින් ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මහා පරිමාණ ජලසම්පාදන විදේශාධාර ව්‍යාපෘති 22 ක් ද, මහාපරිමාණ අපවහන විදේශාධාර ව්‍යාපෘති 03 ක් ද, දේශීය මූල්‍යනය යටතේ ජලසම්පාදන ව්‍යාපෘති 17 ක් ද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 03 ක්ද, ජල ආංශික ප්‍රජා පහසුකම් සඳහා යෝජනා ක්‍රම 06 ක්ද සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. ඊට අමතරව අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ලෝක බැංකු ආධාර යටතේ රත්නපුර, කෑගල්ල, බදුල්ල, මොනරාගල, නුවරඑළිය, කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය තුළින්ද අමාතයාංශයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරමින් සිටියි.

ජාතික ජලසම්පාදන මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට නල ජල සහ නල මලාපවහන පහසුකම් ආවරණය පිළිවෙලින් සියයට 53.2 ක් සහ සියයට 2.24 ක් කරා ළඟා වීමට අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය වශයෙන් පිළිවෙලින් සියයට 51.8 ක් සහ සියයට 2.07 ක් ප්‍රගතියක් පමණක් ළඟා කර ගෙන තිබුණි. තවද 2016 – 2020 වර්ෂයන් ආවරණය මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේදී මුළු නල ජල ආවරණය සියයට 60 ක් දක්වා ඉහළ නැංවීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු නල ජල ආවරණය සියයට 51.8 ක් පමණක් ළඟා කර ගෙන තිබුණි. 2020 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට ඇති හැකියාව පිළිබඳව දැඩි අවිනිශ්චිතතාවක් පවතී. මහා පරිමාණ අපවහන ව්‍යාපෘති තුනක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මකව පැවතියද, මුළු ජනගහණයෙන් සියයට 2.07 කට මලාපවහන ආවරණයක් පමණක් සැලසීමට මණ්ඩලයට හැකියාව ලැබී තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂයේ දී ලබා දී තිබූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාව 108,850 ක් වූ අතර එය පසුගිය වර්ෂයේදී ලබා දුන් 109,482 ක ජල සම්බන්ධතා සංඛ්‍යාව සමඟ සසඳන විට සියයට 0.6 ක අඩු වීමකි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලබා දී තිබූ මුළු ජල සම්බන්ධතා සංඛ්‍යාව 2,437,504 ක් විය. පසුගිය වසර 07 ක කාලය තුළ මණ්ඩලයේ ජලසැපයුම් ආවරණය පිළිබඳ විස්තර රූපසටහන 42 හි දැක්වේ.




රූප සටහන 42 - පවතින හා නව සම්බන්ධතා ගණන
මූලාශ්‍රය - 2019 වර්ෂයේ කාර්යසාධන වාර්තාව

## ජල නිෂ්පාදනය හා පරිභෝජනය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පිරිපහදු කළ ජල නිෂ්පාදනය, පරිභෝජනය හා ආදායම් නොලබන ජලය පිළිබඳව පසුගිය වර්ෂ 05 තුළ දත්ත රූපසටහන 43 හි දැක්වේ.




රූපසටහන 43 - පිරිපහදු නල ජල නිෂ්පාදනය, පරිභෝජනය හා ආදායම් නොලබන ජලය
මූලාශ්‍රය - කාර්යසාධන වාර්තාව 2019

ඉකුත් වර්ෂයේ සියයට 24.93 ක්ව තිබුණු රට පුරා සමස්ත ආදායම් නොලබන ජල අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 24.95 දක්වා වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 41.65 ක් ව පැවති කොළඹ නගරයේ ආදායම් නොලබන ජල අනුපාතය ද සමාලෝචිත වර්ෂයේදී සියයට 41 කට ආසන්න ප්‍රතිශතයක් ගෙන තිබුණි. කොළඹ නගරය තුළ ආදායම් නොලබන ජල ප්‍රතිශතය අවම කිරීම අරමුණු කර ගනිමින්

ක්‍රියාත්මකව පවතින මහකොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් I හා II හි කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් අපේක්ෂිත කාල වකවානුවන්හිදී නිම කිරීමට අපොහොසත් වී තිබුණු අතර ඒ වෙනුවෙන් කාල දිගුවන් ද ලබා දී තිබුණි. කොළඹ නගරය හැරුණු විට ගාල්ල, කෑගල්ල, රත්නපුර, හම්බන්තොට, බණ්ඩාරවෙල, මහනුවර, ත්‍රිකුණාමලය යන ප්‍රාදේශිකයන්හි සියයට 25 කට වඩා වැඩි ආදායම් නොලබන ජල ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂයේ වාර්තා වී තිබුණි. නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා පැවතීම, වර්ෂ 70 කට වඩා පැරණි ජල නල ප්‍රතිස්ථාපනය කිරීමට පියවර නොගැනීම, මනුකියවන්නන්ගේ විෂමාචාර ක්‍රියාවන්, ආදායම් නොලබන ජලය කෙරෙහි සෘජුව බලපාන පාරිභෝගික පැමිණිලි කෙරෙහි කඩිනම් අවධානය යොමු කිරීමට අපොහොසත් වීම මේ සඳහා බලපා තිබූ ප්‍රධාන හේතු විය.

## ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු පැවතීම, කොන්ත්‍රාත් ප්‍රදානයන් ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුවන් විසින් අඩු ගුණත්වයකින් යුතු නල සැපයීම යනාදී හේතූන් නිසා ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණ විදේශාධාර ජල සැපයුම් ව්‍යාපෘති 08 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දින 184 ක සිට දින 1825 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදක් සිදු වී තිබුණි.

අමාත්‍යාංශයේ සෘජු මැදහත්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලබන ජලසම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යටතේ සිදු කරන ග්‍රාමීය ජලසම්පාදන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති හා නාගරික සනීපාරක්ෂක ව්‍යාපෘතීන්හි ව්‍යාපෘති කාලය, ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම නිවැරදි ලෙස තක්සේරු කිරීමේ දුර්වලතා, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු යානාදිය හේතුවෙන් ඉලක්කගත දිනයන්හිදී අවසන් කර නොතිබුණි. ඒ අනුව 2017 වර්ෂය හා 2018 වර්ෂය තුළදී ප්‍රදානය කර තිබූ පිරිවැය රු.මිලියන 3,630.41 ක් වූ නාගරික ජල සම්පාදන ව්‍යාපෘති 04 ක් 2020 මැයි 31 දිනට, දින 150 ක සිට දින 481 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. තවද, 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කෑගල්ල, බදුල්ල, නුවරඑළිය, රත්නපුරය හා මොනරාගල දිස්ත්‍රික්කයන්හි ප්‍රදානය කරන ලද වටිනාකම රු.මිලියන 776.6 ක් වූ පුනුරුත්ථාපන ව්‍යාපෘති 06 ක් ද, ග්‍රාමීය ජලසම්පාදන ව්‍යාපෘති 07 ක්ද, 2020 මාර්තු 30 දින වන විට දින 83 ක සිට දින 320 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු කර තිබුණි. එසේ ප්‍රමාද වූ ව්‍යාපෘති සඳහා වරින්වර කාල දිගුවන් ද ලබා දී තිබූ අතර නියැදි විගණන පරීක්ෂාව අනුව ජල සම්පාදන ව්‍යාපෘති 10 ක් සඳහා අවස්ථා 01 ක සිට අවස්ථා 06 ක් දක්වා කාල දිගුවක් ලබා දී තිබුණි. තවද ග්‍රාමීය සනීපාරක්ෂාව යටතේ සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැසිකිළි 25,420 ක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණද, වැසිකිළි 13,098 ක් පමණක් ඉදිකර තිබුණු අතර ආයතනික සනීපාරක්ෂක පහසුකම් සැලසීමේ ව්‍යාපෘති 31 ක් හා විශේෂ අවශ්‍යතා ඇත්තවුන් සඳහා සනීපාරක්ෂක ඒකක 491 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එවැනි එකදු ඒකකයක්වත් ඉදිකිරීමට අපොහොසත් වී තිබුණි.

## මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන (ව්‍යාපෘති I සහ II)

2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කර තිබුණු ව්‍යාපෘති අංක I හි කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා දෙකකදී කාල දිගුවන් ලබා දී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසානයට එහි භෞතික ප්‍රගතිය සියයට 75.22 ක් පමණක් වී තිබුණි. ව්‍යාපෘති අංක II ඉදිකිරීම්ද 2019 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද, එහි කොන්ත්‍රාත් කාලය 2022 ඔක්තෝබර් 15 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 46.65 ක් පමණක් වී තිබුණි.

## මහ කොළඹ පුනරුත්තාපන ජල ව්‍යාපෘතිය

2012 වර්ෂයේ ජනවාරි මාසයේ නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති කටයුතු කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 වර්ෂය දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2015 ජුනි 20 දින වන විට ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම අවසන් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවට අදාළ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 346.59 ක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුගේ ගිණුමකට මාරු කර තිබුණි.

මූලික වැඩ සැලසුම් හි ඇතුළත් නොවූ කාර්යාල ගොඩනැගිලි 02 ක් රු.මිලියන 180.41 ක් වැය කර කොලොන්නාව හා මාළිගාකන්ද ප්‍රදේශයන්හි ඉදිකර තිබුණි. බදු ගිවිසුමකට එළඹීමකින් තොරව 2018 දෙසැම්බර් 31 දින දක්වා ඉඩම් සඳහා කල් බදු කුලී ලෙස රු.මිලියන 5.17 ක් කොලොන්නාව දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිට එම ගොඩනැගිලි කොළඹ මහනගර සභා කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෙන් කර තිබුණි.

කොටිකාවත්ත, මුල්ලේරියාව යන ප්‍රදේශයන්හි ජල සැපයුම ප්‍රවර්ධන කිරීම සඳහා රු.මිලියන 258.1 ක වැය කර අඹතලේ පොම්පාගාරයක් හා ගොතටුව භූගත ජලාශයක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එය ඉදිකර නොතිබුණි.

## කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - පැකේජ අංක 01 හා අංක 03

ප්‍රමාණ පත්‍රයන්ට අනුව තාවකාලික පුනස්ථාපනයන් යටතේ ගෙවීම් කළ හැකිවනුයේ රථ වාහන ධාවන කොටසේ සිදු කරන මාර්ග පළුදු කිරීම් සඳහා පමණක් වුවද, රථ වාහන ධාවන කොටසට පිටත මාර්ග පළුදු කර ජලනල අතුරන ලද ප්‍රාදේශීය සභා මාර්ග නියදියක් පරීක්ෂා කිරීමේදී පිටතින් පස් ගෙන ඒමකින් තොරව එම හාරන ලද පස් උපයෝගී කර ගෙන නැවත පිරවුම් සිදු කළ ද ඒ සඳහා තාවකාලික පුනස්ථාපනයන් යටතේ ගෙවීම් කර තිබුණි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර ජලසම්පාදන ව්‍යාපෘතියේ පැකේජ අංක 01 හි තාවකාලික පුනස්ථාපනය සඳහා මීටර 82,448 ක් වෙනුවෙන් රු.මිලියන 225.7 ක් ද පැකේජ අංක 03 හි තාවකාලික පුනස්ථාපනය සඳහා මීටර 184,740 ක් වෙනුවෙන් රු.මිලියන 506.4 ක් ලෙස එකතුව රු.මිලියන 732.1 ක් වැඩිපුර ගෙවා තිබුණි.

පැකේජ අංක 3 සඳහා චීනයේ නිෂ්පාදිත ජල මනු 10,000 ක් 2018 වර්ෂයේදී මිලදී ගෙන

තිබුණු අතර එම ජල මනුවල සාමාන්‍ය වෙළඳපල මිල හා ජලසම්පාදන මණ්ඩලයේ වාර්ෂික මිල රේට ලේඛනයේ මිල ගණන් හා සැසඳීමේදී රු.මිලියන 79.78 ක් වැඩිපුර ගෙවා මිලදී ගෙන තිබුණි.

ජල මනුව සමඟ එහි උපාංගයක් ලෙස Brass union කොටස් ජල මනු බහාලන ඇසුරුම සමඟ සැපයීම් කරනු ලබන අතර පැකේජ අංක 01 සඳහා Brass union වෙනම ප්‍රමාණ පත්‍රයට ඇතුළත් කර මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 2.61 ක් ද, පැකේජ අංක 03 හි ලොට් A හා B සඳහා Brass union 20,000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 22.70 ක් වෙනම ගෙවීම් කර තිබුණි.

## ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය

ව්‍යාපෘති කටයුතු 2020 පෙබරවාරි 14 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල මූල්‍ය කාර්යසාධනය හේතුවෙන් හා ප්‍රමාණවත් ශ්‍රමය හා උපකරණ යෙදවීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2020 නොවැම්බර් 04 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2020 ජූලි 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 31 ක් පමණක් වී තිබුණි.

කොන්ත්‍රාත්තුව ඉංජිනේරු ඇස්තමේන්තුව වඩා සියයට 29.71 කට අඩු වටිනාකමකට ප්‍රදානය කර තිබුණද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව අනුප්‍රමාණ විශ්ලේෂණයක් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර නොතිබුණි. කලටුවාව ජලසම්පාදන යෝජනා ක්‍රමයේ සිට ජලය ලබා ගැනීමේදී මිදුම් ස්ථානය ලෙස හංවැල්ල පාලම හඳුනාගෙන තිබුණද, පාලම හරහා ජල නල එළීමට 2020 ජනවාරි 16 දින වන විටත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

අදාළ කොන්ත්‍රාත්කරුට, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේදීද ඔහු විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු කරනු ලබන කොන්ත්‍රාත් 02 ක් ද, මැදිරිගිරිය දිස්ත්‍රික්කයේ කරගෙන යනු ලැබූ කොන්ත්‍රාත්තුවක් ද අපේක්ෂිත කාල රාමුව තුළ නිමකර නොතිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුවද ඔහු වෙත පිරිනමා තිබුණි.

# නිවාස හා නාගරික සංවර්ධනය

## අංශ

නිවාස හා ඉදිකිරීම්

නාගරික පහසුකම්

## නිරීක්ෂණ

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යපෘතිය
- අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස සම්පූර්ණ කිරීමේ නිවාස ව්‍යාපෘතිය
- පැරණි නිවාස අළුත්වැඩියා කිරීමේ නිවාස ව්‍යපෘතිය
- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යපෘතිය
- අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි
- බස්නාහිර කළාපීය සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය
- මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - නගර සංවර්ධන සංරචකය (3K ව්‍යාපෘතිය)
- මහකොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

- අදියර A - කැළණිය සහ අරුවක්කාලු අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීම.
- අදියර B - අරුවක්කාලු සෞඛ්‍යාරක්‍ෂිත කසල රඳවනය ඉදිකිරීම
- අදියර C - දුම්රිය මාර්ග සම්බන්ධතාවය වැඩිදියුණු කිරිම.
- අදියර D - දුම්රිය එන්ජින් ඒකක 4 ක්, අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ක් හා බහාලුම් පෙට්ටි 94 ක් මිලදී ගැනීම.
- වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉලක්කගත අරමුණු ඉටු නොකිරිම
- මැනිං වෙළඳපොල පැලියගොඩ ප්‍රතිස්ථාපනය කිරීම
- පොදු ප්‍රවාහන සේවා ප්‍රවර්ධනය සඳහා බස් සේවාව වැඩිදියුණු කිරීම
- විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය
- බස්නාහිර කළාපීය සමුද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය

# නිවාස හා ඉදිකිරීම්

සියලුම පුරවැසියන්ට යහපත් ජීවන තත්ත්වයක් සහතික කිරීම අරමුණු කර ගනිමින් සෑම පවුලක් සඳහාම යෝග්‍ය නිවාස පහසුකම් සැපයීම මෙම අංශයෙන් අපේක්ෂා කර තිබුණු අතර එම අරමුණු ඉටු කර ගැනීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 8 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම .
- අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහ ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳව ග්‍රාමීය ජනතාවට මගපෙන්වීම.
- ප්‍රධාන වශයෙන් රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.
- අදාළ නීති, රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
- ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම සහ ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තුව පිළිබඳ පුහුණුව.
- සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
- මහජන සහාධිපත්‍ය ප්‍රතිසංකරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපර්වච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 34,497.74 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 31,815.95 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 0.78 ක් හෙවත් රු.මිලියන 2,681.79 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 44 හි දැක්වේ.




රූපසටහන 44 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මෙම වැඩ සටහන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස යෝජනා ක්‍රම 10 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 7,500 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.මිලියන 5,530 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 74 වූ අතර සමාලෝචිත වර්ෂයේදී නිවාස 25,050 ක් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණත් වර්ෂය අවසන් වන විට එම ඉලක්කයෙන් සියයට 35ක් හෙවත් නිවාස 8,908 ක් පමණක් ඉදිකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ළඟා කරගෙන තිබූ භෞතික කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි.

### අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස සම්පූර්ණ කිරීමේ නිවාස ව්‍යාපෘතිය

නිවාස යෝජනා ක්‍රම 03 ක් යටතේ මෙම නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිවාස ඉදිකිරීම් සඳහා රු.මිලියන 1,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 839 ක් හෙවත් සියයට 84 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිවාස 17,367 ක් නිම කිරීමට අපේක්ෂා කර තිබුණත්, වර්ෂය අවසන් වන විට එම ඉලක්කයෙන් සියයට 69 ක් හෙවත් නිවාස 11,973 ක් පමණක් නිමකර තිබුණි.

### පැරණි නිවාස අළුත්වැඩියා කිරීමේ නිවාස ව්‍යාපෘතිය

මෙම නිවාස වැඩ සටහන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස යෝජනා ක්‍රම 23 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 200 ක ප්‍රතිපාදන සළසා තිබුණත් ඉන් රු.මිලියන 9 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 4.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී නිවාස 4,992 ක් අළුත්වැඩියා කිරීමට අපේක්ෂා කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉලක්කයෙන් සියයට 33 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි.

### ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 1,250 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඉන් සියයට 54 ක් හෙවත් රු.මිලියන 670 ක් උපයෝජනය කර තිබුණි. එහි භෞතික ප්‍රගතිය සියයට59 ක් වී තිබුණි.

### අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි

2019 වර්ෂය ආරම්භ වන විට පෞද්ගලික ඉඩම් 64 ක පමණ ප්‍රමාණයක, අමාත්‍යාංශය යටතේ නිවාස යෝජනා ක්‍රම මගින් නිවාස ඉදිකර තිබුණි. මෙම ඉඩම අත්පත් කර ගැනීමේ පනත යටතේ වන්දි ගෙවා පවරා ගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ඉඩම් පවරා ගැනීමට රු. මිලියන 100 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත්, ඉන් රු.මිලියන 27 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී පවරා ගැනීමට ඉලක්ක ගත කළ ඉඩම් 26 කින් ඉඩම් 08 කට පමණක් වන්දි ගෙවා පවරා

**ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සියයට 31 භෞතික ප්‍රගතියක්**

**ළඟා කර ගෙන තිබුණි.**

# නාගරික පහසුකම්

බස්නාහිර කළාපය සහ අනෙකුත් මහානගර ආර්ථික, සමාජ සහ සංස්කෘතිකමය වශයෙන් දියුණු ප්‍රජාවකගෙන් සමන්විත අති නවීන වාස්තු විද්‍යානුකූල නගර ලෙස නිර්මාණය කිරීම මෙම ක්ෂේත්‍ර යෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකකින්ද හා ව්‍යවස්ථාපිත ආයතන 02 කින්ද, වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, විශේෂ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යාංශය හා බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශ විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- මහානගර හා බස්නාහිර සංවර්ධන විෂයන්ට අදාළ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජික සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු
- තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘති හා ඒ ආශ්‍රිත කටයුතු
- බස්නාහිර පළාත් මහානගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා එයට අදාළ කටයුතු
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම
- ජාතික භෞතික සැලැසුම් හා ප්‍රාදේශීය භෞතික සැලැසුම් පිළියෙල කිරීම
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයන් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලැසුම් පදනම් කරගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම
- කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළු දක්ෂිණ ආර්ථික කළාපය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම
- හම්බන්තොට ආර්ථික කළාපය, දක්ෂිණ සංචාරක සංවර්ධන කළාපය, හම්බන්තොට ගුවන්, නාවික බල සැපයුම් කේන්ද්‍රය ඇතුළු දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- හම්බන්තොට දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිහිටුවීම හා ඊට අදාළ කටයුතු
- අමාත්‍ය මණ්ඩලය විසින් හඳුනාගත් කන්ද උඩරට විශේෂ ප්‍රදේශයන්හි සමාජ හා යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වයඹ පළාත තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම හා අදාළ කටයුතු

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 168,038.10 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 111,547.07 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව අදාළ කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සලසා තිබුණු

ප්‍රතිපාදනයෙන් සියයට 33.62 ක් හෙවත් රු.මිලියන 56,491.03 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 45 හි දැක්වේ.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.




රූපසටහන 45 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## බස්නාහිර කළාපීය සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය

කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගවල පවතින අධික රථවාහන තදබදයට දීර්ඝ කාලීන විසඳුමක් ලෙස සහ කාර්යක්ෂම පොදු ප්‍රවාහන මාදිලියක අවශ්‍යතාවය සලකා අධිවේගී ප්‍රවාහන පද්ධතික් ලෙස කුළුණු මත ඉහළින් දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමන පද්ධති ජාලයක් ස්ථාපිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර ඒ සඳහා ජපන් ආධාර උපයෝගී කරගෙන තිබුණි. ව්‍යාපෘතියේ 2019 වර්ෂය සඳහා ඉලක්ක කරගෙන තිබුණු ඉඩම් අත්පත් කර ගැනීම, පරිසර ක්‍රියාකාරකම්, උපයෝගීතා විචලතාවය, පාර්ලිමේන්තු පනතක් සම්මත කර ගැනීම, සමාජ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නඩත්තු කිරීමේ ආයතනයක් පිහිටුවීම, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය සැලැසුම් කිරීම, ඉදිකිරීම අධීක්ෂණය සඳහා ප්‍රසම්පාදන සහයෝගය ලබාගැනීම යන කාර්යභාරයන් ඉටුකර තිබු අතර 2019 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් JICA අරමුදල්වලින් රු.මිලියන 1,791 ක්ද භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.මිලියන 573 ක් වශයෙන් රු.මිලියන 2,364 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර තිබුණු බැවින් කර තිබුණු වියදම් නිශ්ඵල වී තිබුණි.

### මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - නගර සංවර්ධන සංරචකය (3K ව්‍යාපෘතිය)

කොළඹ නගරයේ අධික රථවාහන තදබදයට විසඳුමක් සැපයීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර 2007 වර්ෂයේ අන්තර්ජාතික ජපන් බැංකුව (JICA) හා ශ්‍රී ලංකා රජය අතර ඇති කර ගත් පූර්ණකාලීන ණය ගිවිසුමක් අනුව මෙම ව්‍යාපෘතිය මූල්‍යනය කරමින් පැවති අතර 2015 මැයි මාසයේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ වන විට JICA ආයතනයේ සැපයීමට එකඟ ව තිබූ මුළු මුදල උපයෝජනය කර තිබුණි. ඒ අනුව 2015 මැයි මාසයෙන් පසු මුළුමනින්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය පත් වී තිබුණි. ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාරිත්වය මත තවදුරටත් එහි නිම කිරීමේ කාලය දීර්ඝ කරමින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම කාලය තුළ පරිපාලන හා මෙහෙයුම් වියදම් ලෙස දළ වශයෙන් මාසයකට රු.මිලියන 2 කට වඩා වැඩි මුදලක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුළ නිම නොකිරීම මත පසුගිය වර්ෂ 4 ½ ක කාලය තුළ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.මිලියන 110 කට අධික මුදලක් ව්‍යාපෘතියේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු සඳහා වැයකර තිබුණි. 2019 වර්ෂය සඳහා රු.මිලියන 700 ක ප්‍රතිපාදිතයෙන් රු.මිලියන 596.7 ක් වැයකර තිබුණු අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 81 ක් වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ 2019 වර්ෂය සඳහා ඉලක්කගත මා කුඹුර බහු මාධ්‍ය මධ්‍යස්ථානයෙහි අතිරේක වැඩ, බහු මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා පහසුකම් සැපයීම MMC හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සූර්ය විදුලිබල පද්ධතිය සවිකිරීම, O&M ගොඩනැගිල්ල ඉදිකිරීම, උපකරණ ප්‍රසම්පාදනය කර ගැනීම, MMC සඳහා නඩත්තු කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය විදේශීය උපදේශන සේවා සැපයීම සහ නියාමක ධාවන සංවර්ධන සහ ප්‍රවාහන පද්ධතිය නඩත්තු කිරීම වැනි සීමිත කාර්යභාරයන් පමණක් ඉටුකිරීමට නියමිතව පැවති අතර සමාලෝචිත වර්ෂයේ ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 9 ක් පමණක් වී තිබුණි.

### උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

#### අනුරාධපුර

අනුරාධපුර නගරයේ පූජනීය ප්‍රදේශ හා දියුණු ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් පවත්වාගෙන යාම හා එහි සංස්කෘතික හා ස්වභාවික උරුමය ආරක්ෂා කර ගනිමින් නගරයේ ආකර්ශනීය ස්ථාන ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ 2019 වර්ෂයේ ඉලක්කගත වැඩබිම් මැනීමේ හා නිරවුල් කරගැනීමේ ඉලක්කය (Site Clearing & Land Survey) ප්‍රගතිය සියයට 1 ක් වී තිබුණි. 2019 වර්ෂය සඳහා රු.මිලියන 600 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් සියයට 9.8 ක් හෙවත් රු.මිලියන 58.80 ක් උපයෝජනය කර තිබුණි.

#### යාපනය

යාපනය මහා නගර සහා බල ප්‍රදේශය තුළ පොදු පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2019 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඉලක්කගත AB 31 මාර්ග ප්‍රතිසංස්කරණ කාර්යයේ ප්‍රගතිය සියයට 62 ක් වී තිබුණි. 2019 වර්ෂය සඳහා රු.මිලියන 970 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් සියයට 97 ක් හෙවත් රු.මිලියන 940.45 ක් උපයෝජනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසානය වන විට උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකු අරමුදලින් රු.මිලියන 9,013 ක් හා භාණ්ඩාගාර අරමුදල්වලින් රු.මිලියන 2,799 ක් වශයෙන් එකතුව රු.මිලියන 11,812 ක් උපයෝජනය කර තිබුණි.

## මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

මීතොටමුල්ල කසල කන්දෙහි හදිසි නායයාමත් සමඟ ශ්‍රී ලංකා රජය විසින් සන අපද්‍රව්‍ය තිරසාර ලෙස කළමනාකරණය කිරීම ජාතික මට්ටමේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. මේ සඳහා රජය විසින් ලෝක බැංකුවේ සහය ඉල්ලා තිබුණි. ඒ අනුව ලෝක බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන බැංකුව (AIIB) එක්ව මෙම හදිසි අවස්ථාව සඳහා රජයට සහය දැක්වීමට එකගතාවය පලකර තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ස්ථාපිත කිරීමට නියමිතව තිබුණු අතර කසල කළමනාකරණ ඒකකය ස්ථාපිත කිරීමේ මුලික සැලැසුම් කටයුතු වෙනුවෙන් AIIB මගින් එ.ජ.ඩොලර් 700,000 ක මුල්‍යමය ආධාරයක් ලබාදීමට කැමැත්ත පලකර තිබුණු අතර එයින් එ.ජ.ඩොලර් 200,000 ක් ලබාදී තිබුණි. නමුත් අරුවක්කාලු කසල රඳවනය ඉදිකිරීමට ප්‍රථම ලෝක බැංකු නිර්දේශයන් අනුව අනුගමනය කළ යුතු ක්‍රියාකාරකම් සපුරාලීමට නොහැකි වු බැවින් ශ්‍රී ලංකා රජයට ලෝක බැංකු ආධාර ලබාදීමට ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉතිරි සියළු වියදම් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත සිදු කර තිබුණි.

මහ කොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් රු.මිලියන 10,568 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 8,585.75 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රගතිය සියයට 81 ක් වී තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 වන විට සමස්ථ වියදම රු.මිලියන 12,228.75 ක් වී තිබුණි. මෙම ව්‍යාපෘතිය අදියර 4 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු අතර එම එක් එක් අදියරේ ප්‍රගතිය පහත පරිදි විය.

### අදියර A - කැළණිය සහ අරුවක්කාලු අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීම.

කැළණිය අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යයන් 2019 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ සියයට 29 ක් පමණ ප්‍රමාණයක් නිම කර තිබුණි. අරුවක්කාලු අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතුද සියයට 30 ක ප්‍රමාණයක් නිම කර තිබුණි.

### අදියර B - අරුවක්කාලු සෞඛ්‍යාරක්ෂිත කසල රඳවනය ඉදිකිරීම

අමාත්‍යාංශය විසින් මෙම කාර්යය ඉටු කිරීම සඳහා චීන සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2019 දෙසැම්බර් 31 වන විට සැලැසුම් කළ කාර්යභාරයෙන් සියයට 80 ක පමණ ප්‍රමාණයක් නිමකර තිබුණි. මෙම කසල රැඳවුමේ වැඩ අවසන් කළ කොටසකට කසල බැහැර කිරීමේ කටයුතු සිදුකර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට කසල බැහැරකිරීමේ කටයුතු තාවකාලිකව නවතා තිබුණි.

### අදියර C - දුම්රිය මාර්ග සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම.

පලාවි සිට අරුවක්කාලු දක්වා දුම්රිය මාර්ග සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ සැලැසුම් සැකසීමේ කාර්යය 2019 වර්ෂයේදී නිමකළ

යුතුව තිබුණත්, එහි උපදේශක කාර්යය පමණක් සම්පූර්ණ කර තිබුණි.

### අදියර D - දුම්රිය එන්ජින් ඒකක 4 ක්, අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ක් හා බහාලුම් පෙට්ටි 94 ක් මිලදී ගැනීම.

2019 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩොලර් 8,271,224 ක් වටිනා දුම්රිය එන්ජින් ඒකක 4 ක් ආනයනය කර තිබුණි. නමුත් එහි අවසන් ගෙවීම් කටයුතු කිරීමට අවශ්‍ය නිර්දේශයන් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර නොතිබීම නිසා එහි අවසන් බිල්පත් ගෙවීම ප්‍රමාදව පැවැතුණි. අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ක් එ.ජ.ඩොලර් 2,373,200 කට ප්‍රසම්පාදනය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රමාද වී 2019 ඔක්තෝබර් 21 දින අත්සන් කිරිම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි කිසිදු ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. බහාලුම් පෙට්ටි 94 ක් එ.ජ.ඩොලර් 844,854.23 ක කොන්ත්‍රාත් වටිනාකමකට ප්‍රසම්පාදනය කරගැනීමේ කාර්යය සඳහා 2019 අගෝස්තු 23 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයෙහි කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 82 ක් අපේක්ෂා කර තිබුණු නමුත් එහි භෞතික ප්‍රගතිය සියයට 75 ක් වී තිබුණි.

නාගරික සහ අනෙකුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම තුළින් නගරවල අහිතකර ඒක පුද්ගල පාරිසරික බලපෑම අවම කිරිම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්කය විය. නමුත් එම ව්‍යාපෘතියේ වැඩකටයුතු නිමකිරීමේ මන්දගාමී කාර්යසාධනය නිසා එම ඉලක්කය කරා ලඟාවී නොතිබුණි.

### වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

දකුණු ආසියානු කළාපය තුළ ජීවත්වීමට, වැඩකිරිමට හා ක්‍රියාකිරිමට සුදුසු පරිසරයකින් යුතු ඉතාමත් ආකර්ශනීය නගරය ලෙස කොළඹ නගරය නිර්මාණය කිරිමේ අරමුණින් හෙක්ටයාර 269 ක සමුද්‍රිය භූමි ප්‍රමාණයක් ගොඩකර කොළඹ වරාය නගරය ඉදිකිරිමට සැලැසුම් කර තිබුණි. වරාය නගර සීමාව දක්වා වැලි පිරවීමේ කාර්ය 2019 වර්ෂයේදී නිම කිරීමට ඉලක්කගත කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යෙන් සියයට 43 ක පමණ ප්‍රමාණයක් ඉටු කර තිබුණි. එදින වන විට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය සියයට 74 ක් නිම කිරිමට ඉලක්කය වී තිබුණත්, එහි ප්‍රගතිය සියයට 67 ක් වී තිබුණි. 2019 වර්ෂය සඳහා රු.මිලියන 400 ක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් සියයට 52 ක් හෙවත් රු.මිලියන 229 ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි.

### කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ ජල ද්‍රෝනියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරිම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරිම, කොළඹ නගරය අලංකාර කිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එම ඉලක්කගත කාර්යභාරය ඉටු කිරිම සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 9,197 ක් ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 8,676 ක් හෙවත් සියයට 94 ක් උපයෝජනය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් ලබා ගෙන තිබුණු ප්‍රගතිය වගුව 46 හි දැක්වේ.

| ඉටුකරනු ලබන කර්යභාරය | තථ්‍ය ප්‍රගතිය ඉලක්කගත ප්‍රගතියේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| දේවීබාලිකා විදුහල් හන්දිය අසල කාණු පද්ධතිය වැඩිදියුණු කිරිම | 7 |
| නොරිස් ඇල මාර්ගය වැඩිදියුණු කිරිම | 49 |
| මුතුරාජවෙල සහ ටොරින්ටන් ජල ප්‍රවාහන උමංමාර්ග සැලසුම් කිරිම හා ගොඩනැගීම | 0 |
| අඹතලේ පොම්පාගාරය වැඩිදියුණු කිරිම | 50 |
| ශාන්ත සෙතස්තියන් පොම්පාගාරය වැඩිදියුණු කිරිම | 38 |
| ශාන්ත සෙබස්තියන් පොම්පාගාරයේ උතුරු ඇලමාර්ගය (North Lock Gate) සැලසුම් කිරිම හා ගොඩනැගීම | 60 |
| කෝට්ටේ කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය සංවර්ධණය කිරිම | 36 |
| Establishment of Real Time Control System | 38 |
| තලංගම වැවේ පිටවාන සමග බෝක්කුව ඉදිකිරිම හා බෞද්ධලෝක මාවත පිටවාන ඉදිකිරීම | 56 |

වගුව 46 - කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවරධන ව්‍යාපෘතියේ ඉලක්කගත ප්‍රගතිය
මූලාශ්‍රය - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව 2019

එම ව්‍යාපෘතියේ යටතේ වූ උප ව්‍යාපෘති 04 ක ඉලක්කගත ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම උප ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම නිසා සමාලෝචිත වර්ෂයේදී ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

## නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉලක්කගත අරමුණු ඉටු නොකිරිම

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරිම සඳහා ඒකාබද්ධව සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම, ප්‍රවර්ධනය කිරිම හා ඊට සම්බන්ධව අනුසාංගික කරුණු සඳහා විධිවිධාන සැලැසීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ. එම අරමුණු ඉටු කිරිම සඳහා 2019 වර්ෂයේදී සැලැසුම් කළ ඉලක්කගත කාර්යභාරයන් ඉටු කිරිම සඳහා රු.මිලියන 1,584.54 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනයෙන් සියයට 61 ක් හෙවත් රු.මිලියන 1,009 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉලක්කගත කාර්ය භාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රගතිය පහත දැක්වේ.

- බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය කිරිම අදියර IV සඳහා රු.බිලියන 40 ක් ප්‍රතිපාදනය සලසා තිබුණත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම මුලතිව් ටවුන් සෙන්ටර් - යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පාර්ලිමේන්තු ක්‍රිඩා පිටිය - යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම හා කැලිඩෝ වෙරළ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන කාර්යන් වල කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

- නාවල නාගරික චතුරශ්‍රය හා සන්නිවේදන ශාලාව ඉදිකිරීම සම්පූර්ණ කිරීමේ කාර්ය ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 45 ක්ද, බොරලැස්ගමුව වැව අවට සංවර්ධන වැඩසටහනේ අදියර II ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 20 ක්ද, සාලාව - කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය - අදියර ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 20 ක් ද වශයෙන් අඩු ප්‍රගතියක් අනාවරණය විය.

### මැනිං වෙළඳපොල පැලියගොඩ ප්‍රතිස්ථාපනය කිරීම

2019 වර්ෂය සඳහා පැලියගොඩ මැනිං වෙළඳපොල ගොඩනැගිල්ලේ උපරි ව්‍යුහය සකස් කර අවසන් කිරීමේ ඉලක්කගත කාර්යභාරය සඳහා රු. මිලියන 1,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 1,263.87 ක් හෙවත් සියයට 84 ක් උපයෝජනය කර තිබුණි. නමුත් ඉලක්කගත කාර්යභාරය අවසන් කිරීමට නොහැකි වී (Work in Progress) තිබුණි.

### පොදු ප්‍රවාහන සේවා ප්‍රවර්ධනය සඳහා බස් සේවාව වැඩිදියුණු කිරීම

පොදු ප්‍රවාහනය පුළුල් කිරීම මඟින් සියළු දෙනා හට ආරක්ෂිත, දැරිය හැකි මිලකට ලබාගත හැකි, පහසුවෙන් ලඟාවිය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධතියකට ප්‍රවේශවීමට අවස්ථාව ලබාදීම සහ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2019 වර්ෂයේදී එහි කාර්යසාධනය පහත පරිදි විය.

- බස් ප්‍රවාහන මංතීරු ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 800 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එයින් රු.මිලියන 571.14 ක් හෙවත් සියයට 71 ක මූල්‍ය කාර්යසාධනයක් පෙන්වා තිබුණි.
- පොදු ප්‍රවාහන සේවාවේ ධාවන කාලය අඩුකිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරුණු වැඩසටහනෙහි 2019 වර්ෂයේදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ඇතුළත බස් ප්‍රවාහන මංතීරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම ඉලක්ක කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් කි.මි. 40 ක ධාවන මංතීරු සඳහා පමණක් ක්‍රියාත්මක කිරීමට හැකිවී තිබුණි.
- කඩවත බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම - අදියර 2 අවසන් කිරීම සඳහා රු.මිලියන 172.77 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ආයතනයකට භාරදීමේ කටයුතු පමණක් සිදු කර තිබුණි.
- පොල්දූව අතුරු මාර්ගය ඉදිකිරීම අදියර III සඳහා රු.මිලියන 445.72 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ව්‍යාපෘතියේ වැඩකටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි.

### විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය

විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාලඹේ, හෝමාගම, කඩුවෙල අතුරුගිරිය යන නගර සංවර්ධනය කිරීමට යෝජිතව තිබුණු අතර ජාතික අධ්‍යාපන කළාපය, විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන කළාපය, තාක්ෂණ ව්‍යවසායික කළාපය, නැනෝ තාක්ෂණ, ජෛව තාක්ෂණ ප්‍රදර්ශනාගාර කළාපය ලෙස කළාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය 2017 මාර්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය හා කොරියානු රජයේ ඉඩම් යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය සමග අවබෝධතා

ගිවිසුමකට 2016 මැයි 24 දින එළඹ තිබුණු අතර ශක්‍යතා අධ්‍යනයක් එකී ආයතනයෙන් ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, තාක්‍ෂණ නගර ව්‍යාපෘතිය සඳහා පිහිටුවා තිබුණු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කාර්යමණ්ඩල වැටුප් හා දීමනා සහ අනෙකුත් මෙහෙයුම් වියදම් ලෙස 2017 හා 2018 වර්ෂවලදී එකතුව රු.මිලියන 66.21 ක් වැය කර තිබුණු අතර 2019 වර්ෂයේදී තවත් රු.මිලියන 48.23 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් විද්‍යා හා තාක්‍ෂණික නගරයේ පොදු පහසුකම් වර්ධනය කිරීම මූලික අරමුණ වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණි.

## බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය

බස්නාහිර කළාපයේ මහනගර සැලසුම් කිරිමේ ව්‍යාපෘතිය 2015 මැයි මාසයේදී ආරම්භ කර තිබුණි. 2017 සැප්තැම්බර් මාසය අවසානය වන විට පුරා වර්ෂ 02 කට වැඩි කාලයක් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 330.23 ක් වැයකර තිබුණි. කෙසේවුවද, 2018 වර්ෂයේදී රු.මිලියන 10.22 ක් හා 2019 වර්ෂයේදී රු.මිලියන 19.45 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත වැටුප් හා දීමනා, මෙහෙයුම් වියදම් වශයෙන් වැය කර තිබුණි. එම ව්‍යාපෘතිය බස්නාහිර කළාපීය සැලැසුම් ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර පැරණි ව්‍යාපෘතියම ඉදිරියට කර ගෙන යමින් පැවතුණි. නව වියාපෘතිය නිමකරන කාල රාමුවක් හෝ ව්‍යාපෘතිය මඟින් සිදුකළ යුතු විශේෂ කාර්යයන් දක්වා නොතිබුණි.

## බස්නාහිර කළාපීය සමුද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය

මිගමුව වෙරළ තීරයේ සිට කළුතර කැලිඩෝ වෙරළ තීරය දක්වා මුහුදු වෙරළ තීරය කොටස් 03 කට වෙන්කර කොල්ලුපිටියේ සිට දෙහිවල දක්වා විනෝදාස්වාද මුහුදු තීරයක් ලෙසද, කොළඹ වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා බ්ලුමැන්ඩල් කිඹුලා ඇල ප්‍රදේශයද , වැලිසර නාවික හමුදා මූලස්ථානය පිහිටි ප්‍රදේශය සැපයුම් හා සේවා ජාලයක් බිහිකිරිමේ අරමුණින් විශේෂ ව්‍යාපෘතියක් 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 සහ 2018 වර්ෂවලදී එකතුව රු.මිලියන 47.2 ක් වැයකර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම මගින් සිදුවන පරිසරයට වන බලපෑම තක්සේරු කිරිමේ වාර්තාවක් ලබාගැනීමෙන් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2019 වර්ෂය තුළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප් සහ අනෙකුත් ව්‍යාපෘති කාර්යාල මෙහෙයුම් වියදම් වෙනුවෙන් රු.මිලියන 30.01 ක් වැයකර තිබුණි.

## ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය

මහානගර හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගුවන් නගර ව්‍යාපෘතිය හා පරිපාලන නගර ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙකෙහි කාර්යමණ්ඩල වැටුප් හා වෙනත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 80.7 ක් හා 2019 වර්ෂයේදී රු.මිලියන 29.13 ක් වැයකර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට පෙර එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් ශක්‍යතා අධ්‍යනයක් හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ තක්සේරු වාර්තා ලබාගෙන

නොතිබුණි. එසේම ව්‍යාපෘති 02 කින් සැලැසුම් කළ කාර්යයන් කිරිම සදහා ආයෝජකයින් සොයාගෙන නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිද මුළුමණින්ම භාණ්ඩාගාරයේ අරමුදල් මත යැපෙමින් පැවතුණි. නිශ්චිත සැලැසුම් නොමැතිව ඉතා මන්දගාමි ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

# මානව සම්පත් සංවර්ධනය

## අංශ

සංස්කෘතික හා කලාව

අධ්‍යාපනය

උසස් අධ්‍යාපනය

කුසලතා වර්ධනය

කම්කරු හා වෘත්තීය සබඳතා

සෞඛ්‍යය

ක්‍රීඩා කටයුතු

යෞවන කටයුතු

## නිරීක්ෂණ

- බදුකුලී අයකර ගැනීම
- රීති සම්පාදනය නොකිරීම
- නිල වාහන දීමනා ගෙවීම
- ආයෝජන ආපසු ලබා ගැනීම
- කැණීම් සංරක්ෂණ ක්‍රියාකාරකම් ආරම්භ නොකිරිම
- දහම් පාසල් 332 ක් ඉදිකර පරිත්‍යාග කිරිම
- පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය
- සිසුන් දක්‍ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීමේ වැඩසටහන
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව
- ක්‍රීඩා පාසල් ආරම්භ කිරිම
- අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කිරීම
- පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම
- පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම
- වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත්කිරීම
- ගුරු තුලනය, ස්ථාන මාරු හා කාර්යභාරයන් පැවරීම
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන්හි ප්‍රතිඵල හා ගුරු සක්‍යතා
- ගුරු අත්පොත් බෙදාහැරීම

- විනය හා විමර්ශන
- මානව සම්පත් කළමනාකරණය
- ගුරු  වැටුප් ගෙවීම
- ප්‍රසම්පාදනයන්
- තිරසර සංවර්ධන අරමුණු
- ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා ටර්න් කී යන්ත්‍රයක් මිලදී ගැනීම
- නිර්මාණාත්මක වෙබ් අඩවියක් නිර්මාණය කිරීම
- ආයතනික විභාග සංවිධානය කිරීම, ඇගයීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම
- තැන්පතු අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකිරිම.
- ව්‍යාපෘතිවල ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම.
- රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිළිබඳ ඒකකයක් පිහිටුවීම
- රත්නපුර රෝහලේ ස්ථාපිත කෙරෙන මහාචාර්ය ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය
- විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය
- නවක වදය අවම කිරීම
- රත්නපුර රෝහලේ ස්ථාපිත කෙරෙන මහාචාර්ය ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- පාඨමාලා පිළිබඳ දැනුවත්භාවය
- පාඨමාලා සංවර්ධනය
- වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය වර්ධනය වී නොතිබීම
- පුහුණු අවස්ථා වර්ධනය නොවීම
- අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු අවම කිරීම හා උපදේශකවරුන් පුහුණු කිරීම
- ගෝලීය රැකියා අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව පාඨමාලා සංවර්ධනය කිරීම
- වෘත්තීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් පිළිබඳව පසු විපරම් කිරීම
- නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ කාර්යසාධනය
- ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර
- ලෝක තරුණ නිපුණතා දිනය
- කින්නියා ප්‍රදේශයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ඉදිකිරීම
- ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම
- සාගර විශ්වවිද්‍යාලය ඉඩකඩ සහිත පරිශ්‍රයක පිහිටුවීම
- මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අමාත්‍යාංශ ලේකම් වෙත වාහනයක් ලබා ගැනීම
- ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය
- ආධුනිකයින් ඇගැයීම් කිරීමේ ප්‍රමාදය
- ජාතික නිපුනතා සම්මතයන් යාවත්කාලින නොකිරිම
- උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදංචිය
- ගොඩනැගිලි කුලිය
- නිෂ්කාර්යව පැවැති වත්කම්

- අභංගම සංචාරක හෝටලය නිෂ්කාර්යව පැවැතිම
- කරෛනගර් හෝටල් පාසල් පරිශ්‍රය නිෂ්කාර්යව පැවැතිම
- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ සංයුතිය
- සේවක ප්‍රතිලාභ නිරවුල් කිරීමේ කාර්යක්ෂමතාවය
- රඳවාගත් සේවක අර්ථසාධක අරමුදල් සේවකයන් වෙත නිරවුල් නොකිරිම
- සේවක වන්දි නිරවුල් නොකිරීම
- යැපෙන්නන් සොයා ගැනිමට අපෙහොසත්විම
- වයස් පූර්ණත්වයට පත්වූ බාල වයස්කරුවන්ට ප්‍රතිලාභ නිදහස් නොකිරිම
- මහජන රැකියා සේවා මධ්‍යස්ථාන
- ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන්
- රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
- වාහන පාලනය
- සාමාජිකයින් හඳුනාගෙන ප්‍රතිලාභ නිරවුල් නොකිරිම
- අනාර්ථික වියදම්
- සේවක අර්ථසාධක අරමුදල විසින් නිරවුල් නොකරන ලද දායක මුදල් හා ප්‍රතිලාභ
- සාමාජික ශේෂය පිරික්සීමේ යන්ත්‍රවල (Kiosk) ක්‍රියාකාරිත්වය
- වංචා සහගත ලෙස ප්‍රතිලාභ මුදල් නිදහස් කර ගැනීම
- විදේශ රැකියා ක්ෂේත්‍රය
- රැකියා සඳහා විදේශගතවීම් අඩුවීම
- කාර්යාංශයේ ලියාපදිංචිව විදේශ රැකියා සඳහා යොමුවන ප්‍රමාණය අඩුවීම
- ශ්‍රම කාණ්ඩ අනුව රැකියා සඳහා විදේශගතවීම්
- විදේශ දූත මණ්ඩල වල පිහිටි කම්කරු සුභසාධන අංශවල පරිපාලන කටයුතු විධිමත් නොවීම.
- තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම
- ශ්‍රමික සංක්‍රමණය සම්බන්ධයෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම මන්දගාමීවීම
- රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම.
- විදේශ රැකියා වෙළඳපල විශ්ලේෂණය හා අධ්‍යයනය කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරිම
- රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීමේ කරඟ විභාගය
- සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය
- වෛද්‍යවරුන්ගෙන් හා හෙද සිසුන්ගෙන් රජයට අයවිය යුතු මුදල්
- කොන්ත්‍රාත් පරිපාලනය
- බඳු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්
- අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම
- අනුමත ප්‍රතිපාදනය ඉක්මවා වියදම් කිරීම
- රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම
- Coronary stent bare metal ශල්‍ය අයිතමය කල් ඉකුත්වීම

- Depogestin I ඖෂධය තත්ත්වයෙන් අසමත්වීම හා කල්ඉකුත්වීම
- ත්‍රිපෝෂ නිෂ්පාදනය
- ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම
- කිරිපිටි සඳහා ගෙවීම් කිරීම
- සැලැසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු නොකිරීම
- අමාත්‍ය මණ්ඩලයේ තීරණයට පටහැනිව කටයුතු කිරීම
- වකුගඩු නිවාරණයට අදාළව රාජකාරී පැවැරීම
- රෝගී සත්කාරක සේවාවන්ට බාධාකාරීවීම
- බෝනොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය
- පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීම
- බොරැල්ල ආයුර්වේද රෝහලේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම
- විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම
- Orthopedic ශල්‍යාගාරය සඳහා උපකරණ මිලදී ගැනීම
- හෘද ශල්‍ය දැඩි සත්කාර ඒකකය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම
- ඖෂධ මිලදී ගැනීම
- ව්‍යවසාය සම්පත් සැලැස්ම
- ඖෂධ නිෂ්පාදන
- බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම
- පොදු රසායනාගාරයක් හා පුහුණු පාසලක් පිහිටුවීම
- Cephalexin නිෂ්පාදනාගාරය නවීකරණය කිරීම
- හිස හා කොඳු ඇට පෙළ සම්බන්ධ රෝගීන් සඳහා අති නවීන තෘතීයික සත්කාරක මධ්‍යස්ථානය
- පටක සාම්පල් පරීක්ෂා කිරීමේ රසායනාගාරය
- විදුලි ලොන්ඩ්‍රිය
- අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් හිඟව පැවැතීම
- ඖෂධ ගබඩාකර තැබීම සඳහා ශීත කන්ටේනරයක් මිලදී ගැනීම
- කන්තලේ මූලික රෝහල සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම
- කන්තලේ මූලික රෝහල තුළ රුධිරය කාන්දු පෙරණ ඒකකයක් ඉදිකිරීම
- ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහණ.
- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම
- ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්
- අතහැර දමන ලද ව්‍යාපෘති
- යටිතල පහසුකම් උපයෝජනය කිරීම
- ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් හා බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම
- අනුග්‍රහක අයිතිය වෙනුවෙන් ලැබිය යුතු ආදායම්
- ක්‍රිකට් විද්‍යායතනයක් ස්ථාපිත කිරීම
- උපයන විට ගෙවිය යුතු බදු
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම

- ජාතික ක්‍රීඩා අරමුදල
- මුදල් වංචාව
- අභ්‍යාසලාභීන් බඳවා ගැනීම
- නව පාඨමාලා හඳුනා නොගැනීම.
- අරමුණට පටහැනි වියදම්
- මතභේදයට තුඩු දුන් ගනුදෙනු

# සංස්කෘතික හා කලා කටයුතු

රටේ සංස්කෘතික අංශයන් වැඩිදියුණු කිරීම මගින් තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය තහවුරු කිරීම මෙම අංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා නිවාස ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු හතරක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල අටක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතිය, නාට්‍ය, නැටුම්, සම්ප්‍රදායික කලා කටයුතු, කලාකරුවන් ඇතුළු සියළුම අංග අභිවර්ධනය කිරීම
- ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම
- විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පැවැත්වීම
- ප්‍රජාවන් අතර සමගිය ඇති කිරීම
- රාජ්‍ය ලේඛන ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකක් තුළදී පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 22,681.88 ක ප්‍රතිපාදන සලසා දී තිබුණු අතර, ඉන් රු.මිලියන 18,046.58 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 20.44 ක් හෙවත් රු.මිලියන 4,635.30 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 47 හි දැක්වේ.




රූපසටහන 47- ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවසථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## බදුකුලි අයකර ගැනීම

1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් ප්‍රකාරව ටවර් හෝල් රඟහල පදනම සතු සව්සිරිපාය ගොඩනැඟිල්ල හා එය පිහිටි භූමිභාගය වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතුව තිබුණි. නමුත් එම වත්කම් රජයේ තක්සේරුවකින් තොරව තිස් වසරකට පෙර අයකළ බදු කුලිය වූ රු.මිලියන 06 කට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදුදීමට ගිවිසුම්ගත වී තිබුණි. බදු ගිවිසුම 2016 මැයි 15 දින අවසන් වී තිබුණද, අතීතයට බලපාන ලෙස නැවත ගිවිසුම් ගතවීම සඳහා 2019 මාර්තු 19 දින දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. එනිසා එම කාලය වෙනුවෙන් කිසිදු බදු කුලියක්ද අයවී නොතිබුණි.

## රීති සම්පාදනය නොකිරීම

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත ප්‍රකාරව මධ්‍යම සංස්කෘතික අරමුදල ස්ථාපිත කර තිබුණි. එම පනතේ 04(උ) උපවගන්තිය අනුව පාලක මණ්ඩලය විසින් අරමුදලේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ සියලු කාරණාවලට අදාළ රීති සැකැසිය යුතුව තිබුණි. අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අරමුදල අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ඇතුළත් රීති සම්පාදනය කර නොතිබුණි.

## නිල වාහන දීමනා ගෙවීම

2015 මැයි 25 දිනැති අංක PED1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධානවලට අනුකූලව ඉන්ධන හා ප්‍රවාහන දීමනා හිමි නොවන මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන් 05 දෙනෙකු වෙත ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස රු.මිලියන 2.79 ක් ගෙවා තිබුණි.

## ආයෝජන ආපසු ලබා ගැනීම

මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 4 (ඊ) උපවගන්තිය ප්‍රකාරව අරමුදල සතු මුදල්, මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීමට සහ එම ආයෝජන ආපසු ලබා ගැනීමට, නැවත ආයෝජනය කිරීමට හා වෙනස් කිරීමට සහ ඒ ආයෝජනවලින් උපචිත වන ආදායම් ලබා ගැනීමට හැකිය. නමුත් අරමුදල විසින් ආයෝජන ආපසු ලබාගැනීමට පෙර මණ්ඩලයේ අභිමතය ලබා ගත යුතුව තිබුණි. එසේ මණ්ඩලයේ අභිමතය ලබා ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දින වන විට අරමුදල සතුව පැවැති ආයෝජනවලින් රු.මිලියන 2,058.4 ක් ආපසු ලබා ගෙන තිබුණි.

## කැණීම් සංරක්ෂණ ක්‍රියාකාරකම් ආරම්භ නොකිරිම

2019 වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 340.8 ක් වූ කැණීම් සංරක්ෂණ ක්‍රියාකාරකම් 53 ක් , 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

## දහම් පාසල් 332 ක් ඉදිකර පරිත්‍යාග කිරිම

මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් 2019 වර්ෂයේදී "සිසු දහම් සෙවන" නමින් වූ වැඩසටහන යටතේ දහම් පාසල් ගොඩනැගිලි 332 ක් ඉදිකර පරිත්‍යාග කිරීමට සැලසුම් කර තිබුණි. මෙම දහම් පාසල් ගොඩනැගිලි අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලින් ඉදිකර ගැනීමට පාලක මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මෙහි ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදු කළ යුතුව තිබුණත්, එසේ කර නොතිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක

කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය වී තිබුණි.

- ගොඩනැගිලි ඉදිකර නිමකර භාරදී නොතිබීම
- ඉදිකරන ලද ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබීම
- ඇතැම් ගොඩනැගිලි කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම
- ප්‍රතිලාභීන් විසින් අරමුදලින් ඉල්ලීම් කර නොතිබියදී ගොඩනැගිලි ඉදිකර තිබීම
- ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් එවන ලද ඉල්ලීම් ලිපි ලැයිස්තුවලට පරිබාහිරව ගොඩනැගිලි ඉදිකර තිබීම

වැනි හේතුමත අරමුදල විසින් අවශ්‍යතාවය පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

## පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය

2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදායමෙන් සියයට 25 ක් පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වෙත ලබාදිය යුතුව තිබුණි. 2019 වර්ෂයේදී අරමුදලේ ආදායම (ප්‍රවේශපත්‍ර) රු.මිලියන 3,330.9 ක් වී තිබුණු අතර, ඉන් සියයට 25 ක ප්‍රමාණය වූ රු.මිලියන 832.7 ක් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබා දිය යුතුව තිබුණත්, රු.මිලියන 658.9 ක් පමණක් ලබා දී තිබුණි.

# අධ්‍යාපනය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ, ජාතික පොදු අරමුණු ඉටුකරගැනීම උදෙසා, වෙනස්වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම දරන්නා වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව පැවතුණි.

- ශ්‍රී ලාංකික ළමා සහ යෞවන පරපුරට, ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව, ලෝක තරඟකාරීත්වයට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පවතින ජාත්‍යන්තර පාසල්ද ඇතුළුව සියළුම පාසල් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක වන බව සාක්ෂාත් කරගැනීම සඳහා ඒවා අධීක්ෂණය කිරීම.
- අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ජාතික පාසල් සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නොමිලේ පෙළපොත්, නිල ඇඳුම්, පාවහන් හා දිවා ආහාර ලබාදීම ආදී සිසු සුබසාධන සැලසීම.
- සමස්ථ අධ්‍යාපන පද්ධතිය තුළ හා සිසුන් අතර අධ්‍යාපනයෙහි ගුණාත්මක බව සහ විනය සහතික කරලීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ පරිපාලන හා පිරිස් කළමනාකරණ කටයුතු
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.
- කියවීමෙන් සිසුන් සම්පූර්ණ කරලීම සඳහා පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය.
- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂ දෙකක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 325,397.60 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 235,097.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට 27.75 ක් හෙවත් රු.මිලියන 90,303.60 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 48 හි දැක්වේ.




රූපසටහන 48 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩණය කර පහත දක්වා ඇත.

## ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය

අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. නමුත්, 2019 වර්ෂය අවසාන වන විටත් නිශ්චිත සහ ස්ථිරසාර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

එසේම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාළ 2 වන ව්‍යවස්ථාව අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණු පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර නොතිබුණි.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් 14 ත් අතර වයස් සීමාවල පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයකු විසින් පෞද්ගලික පාසල් ආරම්භ නොකළ යුතු වුවද, පනතට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් ආරම්භ කර තිබුණු අතර, ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් වී නොතිබුණි.

### සිසුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීමේ වැඩසටහන

කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී පරපුරක් දැයට දයාද කිරීම සඳහා ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා අරමුණු 7 ක් මුල් කරගෙන 2016 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 18,394.5 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර, 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු.මිලියන 250 ක, 300 ක හා 150 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම වර්ෂවල එකතුව රු.මිලියන 237.74 ක් වැයකර තිබුණි. වර්ෂ 5 ක සැලසුම් කාලයෙන් වර්ෂ 4 ක් ගතවී තිබුණද, වැඩසටහන නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

### ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

2008 සැප්තැම්බර් 24 දිනැති අංක අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණු අතර, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා පනත් කෙටුම්පතක් 2008 ඔක්තෝබර් 29 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි. කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම් කිරීම පාර්ලිමේන්තු පනතක් මගින් සිදුවිය යුතුව තිබුණු නමුත්, පනත අනුමත නොකර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදු කර තිබුණි. ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණු සම්බන්ධීකරණ නිලධාරිනියගේ පාරිශ්‍රමික වශයෙන් පමණක් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු.මිලියන 45.85 ක ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. මෙම කොමිෂන් සභාව වෙනුවෙන් වාර්ෂිකව රු.මිලියන 42 කට වැඩි මුදලක් වැය කරනු ලැබුවද, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### ක්‍රීඩා පාසල් ආරම්භ කිරීම

සිසුන්ට සියළු පහසුකම් හා නේවාසිකව ක්‍රීඩා පුහුණුවීමට ශිෂ්‍යත්ව ලබාදෙමින් ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිකිරීමේ අරමුණින් 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසල් 22 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් ක්‍රීඩා පාසල් සිසුන් සඳහා වූ නේවාසිකාගාර, ක්‍රීඩා උපකරණ සහ කාය වර්ධන උපකරණ යනාදිය ඌණ උපයෝජිතව පැවතුණි.

### අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කිරීම

අධ්‍යාපන ප්‍රමිතීන්ට අනුව ඉගෙනුම් ද්‍රව්‍ය සැපයීම තුළින් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කිරීම වෙනුවෙන් මූලිකව කටයුතු කරන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා හැර අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාවන්ගේ ප්‍රධාන විෂයයන් සඳහා පොත් මුද්‍රණය කර නොතිබුණි. එසේ වුවද, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විෂයයන්ට අදාළ අතිරේක පොත් 393,500

ක් මුද්‍රණය කර තිබුණු අතර, එම පොත් සෘජුව පාසල් වෙත බෙදා නොහැර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන මගින් පමණක් අලෙවි කර තිබුණි. එම හේතුවෙන් සියළුම උසස් පෙළ පාසල් සිසුන් වෙත එම පොත් පරිහරණය සඳහා අවස්ථාව සැලසී නොතිබුණි.

## පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම

2016 මැයි 16 දිනැති අංක 17/2016 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පන්තියක් සඳහා තෝරාගත යුතු මුළු සිසුන් සංඛ්‍යාව 39 දෙනෙක් ලෙස දක්වා තිබුණි. සෝදිසි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි මෙම සීමාවන් ඉක්මවා, 2017 වර්ෂයේදී ජාතික පාසල් 109 ක සිසුන් 6,337 දෙනෙක්ද 2018 වර්ෂයේදී පාසල් 73 ක සිසුන් 3,339 දෙනෙක්ද හා 2019 වර්ෂයේදී පාසල් 81 ක සිසුන් 6,366 දෙනෙක් වශයෙන් සිසුන් ඇතුළත් කර තිබුණි.

ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමට ඉල්ලුම්පත් කැඳවමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 ජූලි 03දින පුවත්පත් දැන්වීම් පළකර තිබුණු අතර, එම දැන්වීමෙහි එකිනෙක පාසල්වල 2019 මැයි 19 දිනට පැවතුණු පුරප්පාඩු සංඛ්‍යාව හා බඳවාගැනීමේ ක්‍රමවේදයද ඇතුළත් කර තිබුණි.

එසේ වුවද, පුරප්පාඩු නොතිබුණු වගුව 19 හි සඳහන් ජාතික පාසල්වලට සිසුන් ඇතුළත් කර තිබුණි.

| පාසල | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| මහනුවර උසස් බාලිකා විද්‍යාලය | 32 |
| මාතර රාහුල විද්‍යාලය | 33 |
| නුගේගොඩ අනුලා විද්‍යාලය | 41 |
| මහනුවර ධර්මරාජ විද්‍යාලය | 32 |
| කුරුණෑගල මලියදේව විද්‍යාලය | 62 |
| කොළඹ නාලන්දා විද්‍යාලය | 52 |
| කොළඹ විශාකා විද්‍යාලය | 28 |
| කොළඹ රාජකීය විද්‍යාලය | 54 |
| මාතර සුජාතා විද්‍යාලය | 31 |
| කොළඹ ආනන්ද විද්‍යාලය | 63 |

වගුව 19 - පුරප්පාඩු නොතිබුණු පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම

එසේම කොළඹ අවට පවතින පහත සඳහන් ජාතික පාසල්වල විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින නමුත්, එම පාසල්වලට ඇතුළත් වීමට සිසුන්ගේ තරඟකාරීත්වයක් නොපැවතුණි.

- බත්තරමුල්ල ශ්‍රී සුභූති විද්‍යාලයේ පුරප්පාඩු 466 ක් පැවති අතර, ඉන් 243 ක් 9 වසර හා 96 ක් 10 වසර සඳහා විය. අදාළ ඉල්ලුම්පත් කැඳවීම තුළින් සිසුන් 24 දෙනෙක් ඇතුළත් කර තිබුණි.
- කොලොන්නාව බාලිකා විද්‍යාලයේ පුරප්පාඩු 76 ක් පැවති අතර, අදාළ ඉල්ලුම්පත් කැඳවීම තුළින් සිසුන් 23 ක් ඇතුළත් කර තිබුණි.
- කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ පුරප්පාඩු 308 ක් පැවති අතර, ඉන් 25 ක් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර තිබුණි.
- කොටිකාවත්තේ ශ්‍රී රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ පුරප්පාඩු 163 ක් පැවති අතර, සිසුන් 09 ක් පමණක් ඇතුළත් කරගැනීමට හැකි වී තිබුණි.

- කොළඹ කොටහේන මධ්‍ය මහා විද්‍යාලයේ පුරප්පාඩු 109 ක් තිබුණු අතර, සිසුන් 08 දෙනෙක් පමණක් ඇතුළත් කරගැනීමට හැකි වී තිබුණි.

## වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ප්‍රකාරව නිත්‍ය පත්කිරීමක් සිදුකරන තෙක් තාවකාලික පදනමක් මත වැඩබැලීමේ නිලධාරියකු පත්කළ හැකිව තිබුණි. එසේ වුවද, වර්ෂ ගණනාවක සිට ජාතික පාසල් 373 කින් 278 කටම වැඩබැලීමේ පදනමට විදුහල්පතිවරු පත්කර තිබුණි. ඊට පිළියම් වශයෙන් 2020 පෙබරවාරි 27 දින සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ 102 දෙනෙක්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ 14 දෙනෙක්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල 28 දෙනෙක් සහ II විශේෂ ශ්‍රේණියේ 9 දෙනෙක් වශයෙන් ජාතික පාසල් සඳහා ස්ථිර විදුහල්පතිවරුන් 153 දෙනෙක් පමණක් පත්කර තිබුණි.

## ගුරු තුලනය, ස්ථාන මාරු හා කාර්යභාරයන් පැවරීම

2019 වර්ෂය වන විට ගුරු තුලනය නොකිරීම හේතුවෙන් ජාතික පාසල් 143 ක විෂයයන් 1,490 ක පැවති ගුරු ඌනතාවයන් 1,859 ක් හා විෂයයන් 787 ක් වෙනුවෙන් පැවති ගුරු අතිරික්තතාවයන් 1,202 ක් අවම කිරීමට නොහැකි වී තිබුණි. වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු නමුත්, තවදුරටත් ජාතික පාසල් 146 ක වර්ෂ 8 ත් 35 ත් අතර සේවා කාලයක් සහිත ගුරුභවතුන් 2,790 ක් සිටි අතර, ජාතික පාසල් 128 ක ගුරුභවතුන් 602 දෙනෙකු වෙත පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් පවරා තිබුණි. එසේම ජාතික පාසල් 107 ක පවතින විශේෂ අධ්‍යාපන ඒකක තුළ සිසුන් 1,220 ක් ඉගෙනුම ලබන අතර, එම ඒකක සඳහා ගුරුභවතුන් 305 ක් සිටිය යුතු වුවත්, තථ්‍ය වශයෙන් ගුරුභවතුන් 224 දෙනෙක් පමණක් අනුයුක්ත කර තිබීම නිසා ගුරුභවතුන් 81 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර තිබුණු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ජාතික පාසල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් පත්කළ යුතුව තිබුණත්, එම පත්කිරීම් සිදුකර නොතිබුණි. එසේම ජාතික පාසල්වල නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරුන් වෙත හා ගුරුභවතුන් වෙත ඉගැන්වීම සඳහා පිළිවෙළින් කාල පරිච්ඡේද 10 ක් 12 ක් හා 35 ක් සතියකට වෙන්කළ යුතු වුවද, 2019 වර්ෂයේදී ජාතික පාසල් 71 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 148 කටද, ජාතික පාසල් 26 ක සහකාර විදුහල්පතිවරුන් 52 කටද, ජාතික පාසල් 125 ක ගුරු භවතුන් 389 දෙනෙකුටද ඉගැන්වීමේ කාර්යයක් පවරා නොතිබුණි.

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන්හි ප්‍රතිඵල හා ගුරු සක්‍යතා

විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව, 2019 වර්ෂයේදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය හා තාක්ෂණය සඳහා විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝලය විද්‍යාව, දේශපාලන විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි හා සාමාන්‍ය ඉංග්‍රීසි යනාදි උසස් පෙළ විෂයයන් හැදෑරූ සිසුන්ගෙන් සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් අසමත් වී තිබුණි. ඉකුත් වර්ෂයන්හී සිට පැවත එන මෙම ප්‍රතිඵල අවම වීමට හේතුවූ කරුණු හඳුනාගැනීමට සහ ඒ සඳහා පිළියම් යෙදීමට සුදුසු විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු

අතර, 2019 වර්ෂයේදී සියළුම විෂය ධාරාවලින් විෂයයන් තුනම අසමත් සිසුන් සංඛ්‍යාව 23,404 ක් වී තිබුණි.

## ගුරු අත්පොත් බෙදාහැරීම

2017, 2018 හා 2019 වර්ෂවල උසස් පෙළ සඳහා මුද්‍රණය කරන ලද ගුරු අත්පොත් 388,990 කින් ගුරු අත්පොත් 232,924 ක් බෙදාහැර තිබුණු අතර, ඒවා උසස් පෙළ විෂය ඉගැන්වීම සඳහා ගුරුවරුන්ට අත්වැලක් වශයෙන් මුද්‍රණය කළද, නිසි කාල සීමාවන් තුළ බෙදා හැරීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

## විනය හා විමර්ශන

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විසඳා අවසන් නොවූ විනය ගැටළු 479 ක් පැවති අතර, ඉන් 19 ක් විද්‍යාපීඨවලටද, 72 ක් අමාත්‍යාංශයටද හා 48 ක් කොළඹ දිස්ත්‍රික් පාසල්වලට අදාළ ඒවා වී තිබුණි.

## මානව සම්පත් කළමනාකරණය

ද්විතියීක සහ පෝෂ්‍ය මට්ටමේ නිලධාරීන් 2,276 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම කළමනාකරණ තීරණ ගැනීමේදීද, 3,235 දෙනෙකුගෙන් සමන්විත වූ අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශ කටයුතු සිදුකිරීමේදීද බාධාවක් වී තිබුණි.

විවිධ සේවාවලට අයත් නිලධාරීන් 242 දෙනෙකු අවුරුදු 6 ක සිට 20 ක් දක්වා කාලයක් ස්ථානමාරු නොලබා අධ්‍යාපන අමාත්‍යාංශය තුළම සේවයේ නියුතුව සිටි අතර, විද්‍යාපීඨ 14 ක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 190 දෙනෙකුද, විද්‍යාපීඨ 15 ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 240 දෙනෙකුද, වසර 8 කට වැඩි කාලයක් ස්ථාන මාරු නොලබා එකම ස්ථානයේ සේවයේ නියුක්තව තිබුණි. එසේම විද්‍යාපීඨ 19 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 376 ක්ද පැවතුණි.

## ගුරු වැටුප් ගෙවීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ පවත්වාගෙන යන තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට පළාත් 9 හි ජාතික පාසල්වල සහ පිරිවෙන්වල ගුරුභවතුන් වෙත ගෙවිය යුතුව තිබුණු හිඟ වැටුප්වල එකතුව රු. මිලියන 411.38 ක් වී තිබුණි. පළාත් කාර්යාලවල පවත්වාගෙන යන තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට පළාත් 9 හි සියළු ගුරුභවතුන් වෙත ගෙවිය යුතුව පවතින වැටුප්වල එකතුව රු.මිලියන 828.70 ක් වී තිබුණි. එසේම දිවයිනේ කළාප 8 ක විදුහල්පතිවරු හා ගුරුභවතුන් 6,695 දෙනෙක් වෙත 2004 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වර්තමාන වැටුප් පියවරෙහි පිහිටුවා නොතිබුණි.

## ප්‍රසම්පාදනයන්

2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 10,031.48 ක මිලදී ගැනීම් 59 ක් සිදුකිරීම සඳහා අමාත්‍යාංශය සැලසුම් කර තිබුණි. ඉන් රු.මිලියන 25.5 ක හෙවත් සියයට 0.25 ක ප්‍රසම්පාදන ප්‍රමාණයක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිදුකර තිබුණි.

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට (GEM ව්‍යාපෘතියට) අදාළව රු.මිලියන 144.12 ක භාණ්ඩ ප්‍රසම්පාදන කාර්යයන් 19 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණු නමුත්, වර්ෂය අවසන් වන විට රු.මිලියන 0.71 ක ප්‍රසම්පාදන කාර්යයන් 2 ක් පමණක් සිදුකර තිබුණි.

## තිරසර සංවර්ධන අරමුණු

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, තිරසර සංවර්ධන අරමුණුවල 4.1 යටතේ 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලඟාකර ගැනීම පිණිස සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ අධ්‍යාපනයක් සම්පූර්ණ කරගැනීම සඳහා අරමුණු කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැඩ සටහන් හතරක් ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂිත ඉලක්ක තීරණය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අපේක්ෂිත ඉලක්කවලින් සියයට 20 කට වැඩි ප්‍රමාණයක් ලඟා කරගෙන තිබුණි.

## ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා ටර්න් කී යන්ත්‍රයක් මිලදී ගැනීම

2018 වර්ෂයේදී රු.මිලියන 546.26 ක් වැය කර ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා ටර්න් කී යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. එහි වගකීම් කාලය අවුරුද්දක් වැනි කෙටි කාලයක් වී තිබුණි. එම යන්ත්‍රය මගින් 2019 වර්ෂයට අදාළ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාග ප්‍රශ්න පත්‍රවලින් සියයට 08 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. දෙපාර්තමේන්තුව සතු පැරණි යන්ත්‍ර 08 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සහ ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රවලින් සියයට 100 ක් ද, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ප්‍රශ්න පත්‍රවලින් සියයට 92 ක් ද මුද්‍රණය කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී නව යන්ත්‍රය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු රු.මිලියන 26.21 ක් වටිනා අමුද්‍රව්‍යවලින් රු.මිලියන 22.22 ක් වටිනා අමුද්‍රව්‍ය භාවිතයට ගෙන නොතිබුණි.

තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් විසින් විදේශියව සිදු කරන ලද භෞතික නිරීක්ෂණයෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය අංගයක් ලෙස නම් කර නිර්දේශ කර තිබුණු නමුත් මිලදී ගත් දින සිට රු.මිලියන 8.43 ක් වටිනා එම කොටස කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## නිර්මාණාත්මක වෙබ් අඩවියක් නිර්මාණය කිරීම

ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා 2009 දෙසැම්බර් 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර 2010 මැයි 31 දිනැති අංක SP/SB/03/10 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය මගින් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු රජයේ ආයතන විසින් මෙම ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව දන්වා තිබුණි. විභාග දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවිය නිර්මාණය , මාර්ගගත ක්‍රමයට සහතිකපත් නිකුත් කිරීම හා ප්‍රතිඵල සනාථ කිරීම ඇතුළු ඉ - සේවාවන් සිදු කිරීමේදී ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාරව තොරතුරු පද්ධතියට ප්‍රවේශවීමට පෙර අනාවරණය නොකිරීමේ ගිවිසුම්වලට එළඹීම, සියලුම කාර්ය මණ්ඩලයට පුහුණුවීම් ලබාදීම, තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම හා නියමිත වෙබ් ලිපිනය සංශෝධන කිරීම සිදුකර නොතිබුණි.

## ආයතනික විභාග සංවිධානය කිරීම, ඇගයීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම

ආයතනික විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සහ උත්තර පත්‍ර පරීක්ෂා කිරීම සඳහා නිලධාරින් තෝරා ගන්නා පදනම, නිලධාරින්ට තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්, වයස, වෘත්තිය මට්ටම සහ පළපුරුද්ද ආදිය දැක්වෙන පරිදි විවිධ කාලවලදී නොවෙනස්වන ලෙස ලිඛිතව නිශ්චිත නිර්ණායක දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

1976 අංක 17 දරන පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව පෞද්ගලික ආයතන වෙනුවෙන්

පවත්වන දේශීය හා විදේශීය විභාග සංවිධානය හා පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන දක්වා නොතිබුණි. නමුත් දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම පෞද්ගලික හා විදේශ විභාග පැවැත්වීමේ පූර්වාදර්ශය අනුගමනය කරමින් වාර්ෂිකව එම විභාග සංවිධානය කර පවත්වා තිබුණ ද අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

# උසස් අධ්‍යාපනය

උසස් අධ්‍යාපන ආයතන පද්ධතියේ කාර්යක්ෂමතාවය සහ එහි ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් සහ දේශීය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම තුළින් දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් කරා ළඟාවීමට හැකිවන අයුරින් උසස් අධ්‍යාපන අවස්ථා ඇති කරලීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි.එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා නගර සැලැසුම්, ප්‍රජා ජලසම්පාදනය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක්, විශ්වවිද්‍යාල 17 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 20 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය හා සංවර්ධනය කිරීම,
- උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කිරීම සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම,
- උසස් අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම
- සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශවීමට හැකිවන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රැකියා කළ හැකි උපාධිධාරීන් බිහිකිරීම පිණිස විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම
- විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සුරක්ෂිත කිරීම,
- පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීම
- තරුණ ප්‍රජාව උදෙසා වන උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 196,928.54 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 173,471.87 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට 11.91 ක් හෙවත් රු.මිලියන 23,456.67 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 49 හි දැක්වේ.




රූපසටහන **49** - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## තැන්පතු අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකිරීම.

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් අමාත්‍යාංශයේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමේදී එම ආයතනවල ආයතනික හා පාඨමාලා සමාලෝචන වෙනුවෙන් අමාත්‍යාංශයේ තැන්පත් කරනු ලබන මුදල් එම උසස් අධ්‍යාපන ආයතනවල අදාළ සමාලෝචන කටයුතු සඳහා උපයෝජනය කළ යුතුව තිබුණි. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 51 කට අදාළව 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අයකර ගෙන තිබූ එකතුව රු.මිලියන 24.1 ක් වූ තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## ව්‍යාපෘතිවල ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම.

2018 අප්‍රේල් 11 දින සිට මාස 36 කින් වැඩ අවසන් කළ යුතුව තිබුණු රු.මිලියන 1,300 ක පිරිවැයකින් යුත් කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ මූලික ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදුකර තිබුණි.

## රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිළිබඳ ඒකකයක් පිහිටුවීම

2018 වාර්ෂික අයවැය යෝජනා මත රු.මිලියන 943 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කෙරෙන රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිළිබඳ ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතියට අදාළ මූලික ප්‍රසම්පාදන කටයුතු 2019 මැයි 28 දින තෙක් ප්‍රමාද කර තිබුණි. මේ සඳහා කොන්ත්‍රාත්කරු වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 50.1 ක් ගෙවා තිබුණ ද

සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

### රත්නපුර රෝහලේ ස්ථාපිත කෙරෙන මහාචාර්ය ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

රත්නපුර රෝහලේ ස්ථාපිත කෙරෙන මහාචාර්ය ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරිම් කටයුතු 2019 වර්ෂයේ ආරම්භ කර මාස 48 ක කාලයක් තුළ නිම කළ යුතුව තිබුණි. ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 2,655 ක් වි තිබුණු අතර, එහි මූලික වැඩකටයුතු ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

### විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

2017 හා 2018 වර්ෂවලදී විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් රු.මිලියන 250 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත කැලණිය විශ්විද්‍යාලයේ ස්ථාපිත කිරිමට තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 39 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එදින වන විට එහි භෞතික ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවැතුණි.

### වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

රුහුණු විශ්වවිද්‍යාලයේ රු.මිලියන 1,180 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2018 ජනවාරි 17 දින රු.මිලියන 200 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. මෙම ඉදිකිරිම 2019 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලබා දී තිබුණු අත්තිකාරම් මුදල ආවරණය වන පරිදි ප්‍රමාණයක්වත් වැඩ කොටස් නිම කර නොතිබුණි.

### විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

- සුනාමියෙන් හානියට පත් පළාත්වල පිහිටි විශ්වවිද්‍යාලයන් ප්‍රතිසංස්කරණය හා නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ තවදුරටත් කුවේට් ඩිනාර් 231,626 ක ණය ශේෂයක් ඉතිරිව පැවැතුණි. එම ණය ශේෂයට අදාළව ක්‍රියාත්මක කෙරෙන තෙවන අදියරේ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට නියමිතව තිබුණ ද, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 47ක් වැනි පහළ මට්ටමක පැවතුණි.
- ශ්‍රී ලංකා රජයේ හා සෞදි රජයේ ආධාර මත රු.මිලියන 4,077 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කෙරෙන වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ දෙසැම්බර් වනවිට නිම කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මූලික ප්‍රසම්පාදන කටයුතු ද නිම කර නොතිබුණි.
- ශ්‍රී ලංකා රජයේ හා කුවේට් රජයේ ආධාර ඇතිව රු.මිලියන 6,617.5 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කෙරෙන නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨ ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කළ යුතුව තිබුණි. ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කිරීම 2019 ජුනි 01 දින දක්වා ප්‍රමාද කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘති කටයුතුවල ප්‍රගතිය සියයට 25 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

- ශ්‍රී ලංකා රජයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 26,400 ක සංශෝධිත වැය ඇස්තමේන්තුවක් මත 2018 වර්ෂයේදී ආරම්භ කර 2023 වර්ෂයේ නිම කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතියට රු.මිලියන 212.5 ක් පමණක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 16 ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

### විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය

දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිට ඉහළ Z අගයක් හිමිකර ගෙන තිබුණු අයදුම්කරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා පවත්වන යෝග්‍යතා පරීක්ෂණ අසමත්වීම හේතුවෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ඉහළ Z අගයකින් සමත් වුවද, මනාපය පළ කරන ලද පාඨමාලාවලට ඇතුළත්වීමට හෝ විශ්වවිද්‍යාලයට පිවිසීමට තිබූ අවස්ථාව අහිමිවන තත්ත්වයක් පැවැතුණි. එසේ වුවද, තවදුරටත් මෙම ක්‍රමය සංශෝධනය කිරීම හෝ අත්හිටුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණු අතර 2019/2020 අධ්‍යයන වර්ෂයේදී විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීමේදී යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය තවදුරටත් අනුගමනය කිරීමට කටයුතු කර තිබුණි.

### නවක වදය අවම කිරීම

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නවක වදය අවම කිරීම සඳහා පිහිටුවා තිබුණු Centre for Gender Equity and Equality අංශය වෙනුවෙන් 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 27 ක් පමණක් වැය කර තිබුණත්, එහි කාර්යසාධනය ඉතා පහළ මට්ටමක පැවතුණි.

### විශ්වවිද්‍යාල සිසුන් ඇතුළත් කර ගැනීම හා නව පාඨමාලා හඳුන්වාදීම

- රජයේ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්ත අනුව 2008 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී ඇතුළත් කර ගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 52 කින් වැඩි වී තිබුණි. පසුගිය වර්ෂ 05 ක කාලය තුළ විශ්වවිද්‍යාල වෙනුවෙන් වැය කර තිබූ භාණ්ඩාගාර ප්‍රතිපාදන හා උපයාගත් අරමුදල්වල එකතුව රු.මිලියන 519,326 ක් වී තිබුණත්, ඊට සාපේක්ෂව එක් එක් විශ්වවිද්‍යාලවල පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ සහ විශ්වවිද්‍යාලවල නව පාඨමාලා හඳුන්වාදීමේ කාර්යසාධනය ද ඉතා පහළ මට්ටමක පැවතුණි.

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 4 (XV) වගන්තිය අනුව කුලී සහ බදු පදනම යටතේ නේවාසිකාගාර පහසුකම් සපයා ගත හැකිව තිබුණි. විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කර තිබුණු සිසුන් 1,752 දෙනෙකු අතරින් සියයට 37 ක් හෙවත් සිසුන් 652 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. එසේම විශ්වවිද්‍යාලය සතුව දේශන ශාලා 32 ක් සහ සිසුන් 2,000 දෙනෙකුට අධික ධාරිතාවයක් සඳහා ප්‍රමාණවත් පහසුකම් පවතින නමුත් වර්ෂයකට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 110

දෙනෙකු සිට 140 දෙනෙකු අතර පරාසයක පැවැතුණි.

### දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගැනීම

HETC ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 512 ක ඇස්තමේන්තුවක් මත දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ මහල් 05 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ගොඩනැගිල්ලේ මහල් 03 ක වැඩ නිම කර 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාර දී තිබුණි. ඉතිරි මහල් 03 හි නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබයි. ඉතිරි මහල් දෙකේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. එසේම මෙම ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 113.7 ක් වැය කර තිබුණ ද ගොඩනැගිල්ලේ සවිකර තිබුණු උපකරණ වර්ෂ 04 කට ආසන්න කාලයක් භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් උපකරණ රාශියක වගකීම් කාලය භාවිතයට නොගෙනම අවසන් වී තිබුණි.

### අතහැර දමන ලද ව්‍යාපෘති

දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ සිසුන්ගේ පරිහරණය සඳහා බාහිරව වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. ඊට අමතර තවත් වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.මිලියන 2.48 ක් ගෙවා තිබුණි. එහි ඉදිකිරීම් කටයුතු අත්තිවාරම් මට්ටමේදී නතර කර තිබුණි. එසේම එම ඉදිකිරීමට ගෙන එන ලද විශාල කම්බි ප්‍රමාණයක් ආයතන පරිශ්‍රයේ දිරාපත් වෙමින් පැවැතුණි.

### දේශන ගාස්තු ගෙවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය අනුව පාඨමාලාවලට ප්‍රමාණවත් සුදුසු ආචාර්ය මණ්ඩලයක් නොමැති විට අළුත් පාඨමාලා ආරම්භ නොකළ යුතු බව දක්වා තිබුණි. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 12 ක් පුරප්පාඩු වී පැවැතුණි. එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු 24 දෙනෙකු බඳවා ගෙන ඔවුන් වෙනුවෙන් රු.මිලියන 4.6 ක් දේශන ගාස්තු ගෙවා තිබුණි.

### ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල

බෞද්ධ අධ්‍යයනයට හා පාලි භාෂාවට සීමා වූ පර්යේෂණවලට ආධාර කිරීම් සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලක් ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එම අරමුදලේ රු.මිලියන 1.3 ක ශේෂයක් පැවැතුණත්, 2017 වර්ෂයේ සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනයන් සිදු කර නොතිබුණි.

### අධ්‍යයන නිවාඩු ලබාදීම

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශය සඳහා 2016 වර්ෂයේදී කථිකාචාර්යවරියන් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එම කථිකාචාර්යවරියන් වර්ෂ 03 ක් ගතවීමටත් පෙර වර්ෂ 05 ක් දක්වා කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණි. ඒ හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු වෙනුවෙන් නැවත බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එසේ අධ්‍යයන නිවාඩු ලබාගත් කථිකාචාර්යවරියකට ප්‍රංශයේ

පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා මහෝපාධ්‍යාය අරමුදලේ නිර්ණායක වෙනස් කර රු.මිලියනයක අධ්‍යයන දීමනාවක් අනුමත කර ඉන් රු.500,000 ක් ගෙවා තිබුණි. එම කථිකාචාර්යවරිය විදේශ ගත වී නොතිබුණු අතර එම විශ්වවිද්‍යාලයේම බාහිර අංශයේ දර්ශනපති උපාධියකට පෙනී සිට තිබුණි. විශ්වවිද්‍යාලය විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### වාහන හා ඉන්ධන දීමනා ගෙවීම

2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන සහ 2016 ජනවාරි 09 දිනැති අංක 13/2015 (i) දරන ආයතන චක්‍රලේඛවලට පටහැනිව 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ යාපනය විශ්වවිද්‍යාලයේ වැඩබලන මූල්‍යාධිකාරීවරයකුගේ සේවා කාලය සඳහා රු.මිලියන 1.74 ක් වාහන දීමනා ලෙස ද, රු.710,360 ක් ඉන්ධන දීමනා ලෙස ද, ගෙවා තිබුණි.

### ඌන උපයෝජිත අරමුදල්

2019 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලය යටතේ අරමුදල් ගිණුම් 04 ක එකතුව රු.මිලියන 1.63 ක්ද, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා ලැබී තිබුණු එකතුව රු.මිලියන 6.45 ක ප්‍රදාන මුදලක්ද, One Asia Foundation වැඩසටහන වෙනුවෙන් ලද ප්‍රදානයෙන් ඉතිරි වූ රු.205,589 ක්ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද රු.මිලියන 4.15 ක්ද හා ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු සඳහා ලබාගත් මුදලින් ඉතිරි වී තිබුණු රු.මිලියන 6.91 ක් අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

2019 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයීය පාඨමාලා හා දෙපාර්තමේන්තු 35 ක සංවර්ධන අරමුදල් ගිණුම්වල එකතුව රු.මිලියන.13.14 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී නිෂ්කාර්යව පැවැතුණි. අරමුදල් ගිණුම් 27 ක එකතුව රු.මිලියන 50.47 ක් ඌන උපයෝජිතව පැවතුණි.

මොරටුව විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 4.55 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 26 ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. ශිෂ්‍යත්ව පිරිනැමීමේ නිර්නායකවල පවතින ගැටළු ඒ සඳහා හේතු වී තිබුණි.

### පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු අරමුදල්

සියලුම ආචාර්යවරුන් නිරන්තරයෙන් පර්යේෂණ කටයුතු සිදුකළ යුතුව තිබුණත්, එම පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් 29 කින් රු.මිලියන 8.10 ක් ලැබී තිබුණි. කැළණිය විශ්වවිද්‍යාලය විසින් එම රු.මිලියන 8.10 ක් වර්ෂයකට වැඩි කාලයක් උපයෝජනය නොකර රඳවා ගෙන තිබුණි.

රුහුණු විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 31.06 ක් වූ පර්යේෂණ ආධාර ශේෂය තුළ 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 2.13 ක් උපයෝජනය කර නොතිබුණි. එම ආධාර මුදල් ඵලදායීව උපයෝජනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

### විශ්වවිද්‍යාල ආචාරවරුන් විදේශගතවීම

- කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් හා ආචාර්ය උපාධි සඳහා 2011 වර්ෂයේ සිට ආචාර්යවරු 22 දෙනෙකු විදේශගත වී තිබුණු අතර නියමිත කාලයේදී නැවත සේවයට වාර්තා කර නොතිබුණි. එම

ආචාර්යවරුන් එළඹ තිබුණු බැඳුම්කර ගිවිසුම් කඩකිරීම නිසා 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 97.26 ක් අයවිය යුතුව තිබුණි. එසේම පළපුරුදු හා සුදුසුකම් ලත් ආචාර්යවරුන් විදේශගත වී නැවත නොපැමිණීම නිසා එම දැනුම විශ්වවිද්‍යාලයට ලබා ගැනීමේ අවස්ථාව ද අහිමි වී තිබුණි.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 42 දෙනෙකු පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා විදේශගත වී නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් ගිවිසුම කඩවීම මත 2020 ජුනි 30 දිනට රු.මිලියන 113.71 ක බැඳුම්කර වටිනාකමක් අයවිය යුතුව පැවතුණි.

- මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 37 දෙනෙකුගෙන් ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 76.86 ක් අයවිය යුතුව පැවතුණි. ආචාරවරු 09 දෙනෙකුගෙන් රු.මිලියන 5.83 ක් වර්ෂ 20 ක කාලයක් මුළුල්ලේ හිඟහිටව පැවැතුණි.

## පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ නොකිරීම

කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා සම්පූර්ණ වැටුප් හා දීමනා සහිතව අධ්‍යයන නිවාඩු හා ප්‍රාග්ධන ප්‍රදාන ලබා දී විදේශගත වූ ආචාර්යවරුන් 5 දෙනෙකු එම සුදුසුකම් සපුරා ගැනීමෙන් තොරව නැවත සේවයට පැමිණ තිබුණි. මේ හේතුව නිසා ආචාර්යවරුන්ගේ දැනුම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

## පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීම සඳහා 2016 මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.මිලියන 49.14 ක එකතු කළ අගය මත බදු (VAT) රහිත පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු අතර මාස 10 ක් ඇතුළත සමස්ථ ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. 2020 ජුනි 30 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

## ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරිම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 50 වන සංවත්සරය නිමිතිකොට ගෙන, ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක්, ව්‍යායාම් ශාලාවක් හා පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 618 ක ඇස්තමේන්තුවකින් යුක්ත ව්‍යාපෘතියක් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉටු කිරිමට 2014 පෙබරවාරි 13 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මූලික ප්‍රසම්පාදන කටයුතු නිමකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සිදු කර නොතිබුණි.

## ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරිම

ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2012 වර්ෂයේදී 2758 වන ස්ථානය ලැබී තිබුණ ද, වර්ෂ 07 ක් ගතවීමෙන් පසු සමාලෝචිත වර්ෂය වන විට එම ස්ථානය 2960 දක්වා පසුබැස තිබුණි. ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී පර්යේෂණ සහ උපුටා ගැනීම් වෙනුවෙන් සියයට 60 ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බැවින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රගතිය

වැඩිදියුණු නොකිරීම ඒ සඳහා හේතු වී තිබුණි.

### ශිෂ්‍යත්ව අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 101 ක් යටතේ රු.මිලියන 32 මුදලක් පැවැතුණි. එම අරමුදලින් රු.මිලියන 5 ක් පමණක් උපයෝජනය කර තිබුණි. අරමුදල් 30 ක් යටතේ වූ රු.මිලියන 20.39 ක් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය නොකර අක්‍රියව පැවැතුණි. එසේම 2019 දෙසැම්බර් 31 දින වන විට පර්යේෂණ අරමුදල් ගිණුම් 36 ක රු.මිලියන 40.07 ක මුදලක් වර්ෂ 4 කට වඩා වැඩි කාලයක් මුළුල්ලේ කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. තවත් පර්යේෂණ අරමුදල් 08 ක එකතුව රු.මිලියන 4.70 ක මුදලක් හා විශේෂ අරමුදල් ගිණුම් 15 ක් යටතේ වූ රු.මිලියන 73.07 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි.

### "BIT " පාඨමාලා පැවැත්වීම

මොරටුව විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරනු ලබන "BIT " පාඨමාලාව සඳහා පෞද්ගලික ආයතන සමග එළැඹි ගිවිසුම්වලට අනුව එක් එක් ආයතනය විසින් වර්ෂයකට 60 දෙනෙකුගෙන් යුත් අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගත යුතුව තිබුණි. කාලපරිච්ඡේදය තුළ සිසුන් 14 දෙනෙකු සිට 40 දෙනෙකු දක්වා ප්‍රමාණයක් බඳවා නොගැනීම නිසා එම පෞද්ගලික ආයතන දෙකකින් ආයතනයට රු.මිලියන 8.255 ක් අයවිය යුතුව තිබුණි. 2020 අගෝස්තු 10 දින වන විටත් එම හිඟහිට මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

මොරටුව විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ "BIT " පාඨමාලාවෙන් උපයා ගෙන තිබුණු ආදායමෙන් ගිවිසුමේ පාර්ශවකරුවෙකු නොවන සමාගමක් වෙත පරිපාලන ගාස්තු වශයෙන් රු.මිලියන 13.02 ක් ගෙවා තිබුණි.

### උද්‍යාන අලංකරණය

මොරටුව විශ්වවිද්‍යාලයේ සිදු කරන ලද උද්‍යාන අලංකරණය නිවැරදි සැලැසුමක් මත ඉටු කර නොතිබීම හේතුවෙන් පුද්ගලික කොන්ත්‍රාත් සමාගමක් වෙත ගෙවන ලද රු.මිලියන 3.09 ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

### ත්‍යාග හා පරිත්‍යාග

රුහුණු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට ත්‍යාග සහ පරිත්‍යාග ගිණුමේ රු.මිලියන 612.91 ක ශේෂ එකතුවක් පැවතුණි. එම ගිණුම් අතරින් එකතුව රු.මිලියන 12.92 ක් වූ ගිණුම් 22 ක් වර්ෂ 03 ක සිට වර්ෂ 05 ක් දක්වා පරාසයක කාලයක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

### කුරුදු පර්යේෂණ ව්‍යාපෘතිය

රුහුණු විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කළ කුරුදු පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 3.95 ක් වැයකර 2018 අප්‍රේල් 26 දින GC උපකරණය මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එම උපකරණ කිසිදු පර්යේෂණ කටයුත්තකට භාවිතා කර නොතිබුණු අතර, එය භාවිත තත්ත්වයේ ද නොපැවතුණි.

### නොගෙවූ ශිෂ්‍යාධාර

රුහුණු විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, නොගෙවූ ශිෂ්‍යාධාර රු.මිලියන 9.79 ක් වී තිබුණි. එම

ශේෂය තුළ 2011 වර්ෂයේ සිට 2015 වර්ෂයට අදාලව රු.මිලියන 9.54 ක නොගෙවූ ශිෂ්‍යාධාර ශේෂයක් පැවැතුණි. එම ශිෂ්‍යාධාර ගෙවීම සඳහා පාලන අධිකාරියේ අවධානය යොමුකර නොතිබුණි.

# කුසලතා වර්ධනය

වර්තමාන හා අනාගත ශ්‍රම බලකාය වඩාත් සංකීර්ණ ආර්ථික රටාවකට ගැලපෙන පරිදි නවීකරණය වූ අධ්‍යාපනයකින් හා කුසලතාවලින් පරිපූර්ණ පිරිසකගෙන් සමන්විත වීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා කුසලතා හා දැනුම අතර පරතරය සම්පූර්ණ කිරීමට ආර්ථිකයෙහි පවතින උසස් හා තෘතීයික අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවිය යුතුව ඇත. එම අපේක්ෂාව ඉටු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 10 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවශ්‍යතා පුළුල් කිරීමට ප්‍රතිපත්ති සැකැසීම හා පහසුකම් සැපයීම
- රැකියා වෙළෙඳපොළට උචිත ශ්‍රමබලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තෘතීයික අධ්‍යාපනය නවීකරණය කිරීම
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂ දෙකක් සඳහා රු.මිලියන 33,702.53 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 28,132.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 16.53 ක් හෙවත් රු.මිලියන 5,570.52 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 50 හි දැක්වේ.




රූපසටහන 50 - පාර්ලිමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## පාඨමාලා පිළිබඳ දැනුවත්භාවය

වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වී තිබුණත්, අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වන ඇතැම් පාඨමාලා සඳහා සිසුන් ආකර්ෂණය කරගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් සිසු සහභාගීත්වය අවම මට්ටමක පැවතුණි. ඒ අනුව වැඩි සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවයක් සහ අවශ්‍ය සියලු පහසුකම් ලබාදී තිබියදී එම සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය උපරිම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. විගණනයට ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතනවල ශිෂ්‍ය ධාරිතාවය 136,920 ක් වුවද, බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 111,642 ක් වී තිබුණි.

ඇතැම් පාඨමාලා සඳහා සිසුන්ගේ නොකැමැත්ත, පාඨමාලා සඳහා බඳවාගන්නා සිසුන්ගේ සැලකිය යුතු ප්‍රතිශතයක් පාඨමාලා හැරයාම, වඩා ප්‍රචලිත පාඨමාලා කීපයක් සඳහා පමණක් සිසුන් වැඩි වශයෙන් පෙළඹීම හේතුවෙන් රැකියා වෙළඳපොලෙහි ඉල්ලුමක් පවතින ක්ෂේත්‍ර කෙරෙහි සිසුන්ගේ යොමුවීම අවම මට්ටමක පැවැතුණි.

## පාඨමාලා සංවර්ධනය

පුහුණු සම්මත පිහිටුවීම හා විෂයමාලා සංවර්ධනය වෘත්තීය අධ්‍යාපනයට අදාළව වැදගත්ම සාධකය වී තිබුණි. ගෝලීය අවශ්‍යතා හා කර්මාන්තයේ අවශ්‍යතා පාදක කරගනිමින් පුහුණු ක්ෂේත්‍රවලට අදාළව පුහුණු සම්මත පිහිටුවීමත්, තාක්ෂණික සංවර්ධනය අනුව යමින් පාඨමාලා නවීකරණය සඳහා විෂයමාලා සංවර්ධනයත් අත්‍යාවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් වූ අවධානය අවම මට්ටමක පැවැතුණු අතර තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 2017 ජනවාරි මාසයේ සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ කර්මාන්තයේ අවශ්‍යතාවය හා ඉල්ලීම මත රැකියා අවස්ථා 317 ක් සඳහා විෂයමාලා සංවර්ධනය කර තිබුණු අතර රැකියා අවස්ථා 170 ක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා සහතිකපත් නිකුත් කර තිබුණි. එම නිකුත් කළ සහතිකපත්වලින් සියයට 21 ක් හෙවත් වැඩිම සහතික පත් සංඛ්‍යාව පරිගණක හා ඒ ආශ්‍රිත රැකියා අවස්ථාවන්ගෙන් වී තිබුණි. කෙසේ වුවද, ආයතනවල ඉල්ලීම් හා කර්මාන්තයේ අවශ්‍යතාවය මත කොමිෂන් සභාව විෂයමාලා සංවර්ධනය කර තිබුණද, නිසි ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාවට නංවා නොතිබීම හේතුවෙන් නවීන ලෝකයට ගැලපෙන රැකියා අවස්ථාවලට යොමුවීමේ ප්‍රවණතාවක් නොතිබුණි. පසුගිය වර්ෂ 3 ක් සඳහා සංවර්ධනය කර තිබුණේ පාඨමාලා 50 ක් පමණි.

## වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය වර්ධනය වී නොතිබීම

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු පාඨමාලා ලියාපදිංචි කළ යුතු අතර ගුණාත්මක පාඨමාලා ලබාදීමට එම පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදු කළ යුතුව තිබුණත්, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඇතැම් පුහුණු පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණි. උසස් තත්ත්වයෙන් යුතු දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපන හා පුහුණුව ලබාදීමට නම් පාඨමාලා ප්‍රතීතනය කිරීම අත්‍යාවශ්‍යය. විගණනයට ලද තොරතුරු අනුව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල විද්‍යායතන 06 ක් ඇතුළුව ආයතන 06 ක පවත්වනු ලබන පාඨමාලා 2566 ක් අතරින් පාඨමාලා 683 ක්

පනතෙහි විධිවිධාන ප්‍රකාරව ප්‍රතීතනය කර නොතිබුණි.

වර්තමාන රැකියා වෙළඳපොලේ ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා (NVQ) සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර එවැනි පාඨමාලා තුළින් බිහි වූ පුහුණු ශ්‍රම බලකායක් අපේක්ෂා කරනු ලබයි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවලින්ද සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රතීතනය නොකළ පාඨමාලා පවත්වාගෙන යන අතර, පෞද්ගලික අංශයේ ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය ඇතිකිරීම සඳහා පාඨමාලා ප්‍රතීතනය කෙරෙහි නිසි අවධානය යොමු විය යුතුව තිබුණි. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරුවලට අනුව 2019 වර්ෂය වන විට වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වන වලංගු ලියාපදිංචියක් සහිත පුද්ගලික අංශයේ ආයතන 729 ක් පමණක් පැවැතුණි. එසේම පුද්ගලික අංශයේ ලියාපදිංචි පාඨමාලා 2788 ක් පැවැතියද, ඉන් පාඨමාලා 613 ක් පමණක් ප්‍රතීතනය කර තිබුණි.

තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු වෘත්තීය පුහුණු පාඨාමාලා පවත්වන සියළුම ආයතන 2017 වර්ෂයේ සිට තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සහතිකයක් කොමිෂන් සභාවෙන් ලබාගත යුතු බව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2016 පෙබරවාරි 26 දිනැති අංක MSDVT/SSDP/2016-1 දරන චක්‍රලේඛයෙන් අනිවාර්ය කර තිබුණි. නමුත් වෘත්තීය පාඨමාලා පවත්වන පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ලියාපදිංචි ආයතන 2740 ක් දිවයින පුරා පිහිටා තිබුණද, 2019 නොවැම්බර් 19 දින වන විට ඉන් ආයතන 224 ක් පමණක් තත්ත්ව කළමනාකරණ සහතිකය ලබාගෙන තිබුණි.

### පුහුණු අවස්ථා වර්ධනය නොවීම

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පුහුණු මධ්‍යස්ථාන 1,368 ක් වෙත 2019 වර්ෂය වන විට ඇතුළත් කරගත හැකි මුළු ශිෂ්‍ය ධාරිතාව 136,920 ක් වී තිබුණි.

ජාතික වෘත්තීය සුදුසුකම 5, 6 පාඨමාලා හදාරණ සිසුන්ට ජාතික වෘත්තීය සුදුසුකම 7 සහිත උපාධි මට්ටමට පිවිසීමට වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ උපාධි මට්ටමේ පාඨමාලා පවත්වන රාජ්‍ය අංශයට අයත් එකම විශ්වවිද්‍යාලය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වී තිබුණි. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා NVQ 5, 6 පාඨමාලා සම්පූර්ණ කර පුහුණු ආයතනවලින් බැහැරවන උපාධි මට්ටමේ පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත සිසුන්ගේ එකතුව 7099 දෙනෙකුගෙන් විශ්වවිද්‍යාලයේ ධාරිතාවය අනුව සිසුන් 1,920 දෙනෙක් පමණක් බඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ජාතික වෘත්තීය සුදුසුකම 5, 6 පාඨමාලා හදාරණ උපාධි අපේක්ෂිත සිසුන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

විශ්වවිද්‍යාල විද්‍යායතන 6 ක දැනට ජාතික වෘත්තීය සුදුසුකම 5, 6 මට්ටමේ පාඨමාලා 22 ක් පවත්වනු ලබයි. උපාධි මට්ටමේ පාඨමාලා පවත්වනු ලබන වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඉහත පාඨමාලාවන්ට සමාන්තරව ගොඩනැගිලි සේවා තාක්ෂණය, ආහාර සැකසුම් තාක්ෂණය, සිනමාව හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය, ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව, ඉදිකිරීම් තාක්ෂණ පාඨමාලාව, හෝටල් කළමනාකරණ පාඨාමාලාව හා මෙකාට්‍රොනික්ස් පිළිබඳ උපාධි පාඨමාලා 7 ක් පමණක් පවත්වනු ලැබේ. විද්‍යායතනවල පවත්වනු ලබන අනෙකුත් පාඨමාලා 15 ක් සඳහා සමාන්තර පාඨමාලා නොමැති වීම හේතුවෙන් එම

පාඨමාලා හදාරන සිසුන්ට තමන් හැදෑරූ විෂය ධාරාවෙන් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු අවම කිරීම හා උපදේශකවරුන් පුහුණු කිරීම

ගුණාත්මකභාවයකින් යුත් වෘත්තීය පුහුණුවක් ලබා දීමට නම් අධ්‍යයන කාර්යමණ්ඩලය ඒ සඳහා ප්‍රමාණවත් දැනුමකින් යුක්ත විය යුතුය. එසේම වෘත්තීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අදාළව ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම, ඔවුන්ගේ ඉගැන්වීම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා උගන්වන විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රමාණවත් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම කළ යුතුය. කෙසේවුවද මෙහිදී පළපුරුදු උපදේශක හිඟයක් හා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන්ද නොතිබුණි.

### ගෝලීය රැකියා අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව පාඨමාලා සංවර්ධනය කිරීම

තරුණ, කාන්තා හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද කාණ්ඩ අතර පවතින ඉහළ සේවා වියුක්තිය ආර්ථිකයේ දිගින් දිගටම පවතින ගැටළුවක් බවට පත්වී ඇත. වෘත්තීය පුහුණු ආයතන තුළින් බිහිකරන වෘත්තිකයින් දේශීය සහ විදේශීය රැකියාවන්හි කර්මාන්ත අවශ්‍යතාවයන්ට නොගැලපීම, විවිධ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන විසින් හඳුන්වාදී ඇති පාඨමාලා අනුගමනය කරන පුහුණු ක්‍රමවේදයන් එම අවශ්‍යතා සඵල කිරීමට තරම් ප්‍රමාණවත් නොවීම, ප්‍රමුඛ කර්මාන්ත ඉලක්ක කර පාඨමාලා සංවර්ධනය වී නොතිබීම, රැකියා අභිමුඛ පාඨමාලා අවම වීම මෙන්ම කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය නොවීම හේතුවෙන් ශ්‍රම වෙළඳපොලෙහි රැකියා සහ නිපුණතා අතර නොගැලපීමක් ඇතිවීම, කුසලතා නොගැලපීම මෙන්ම රැකියා ඉලක්ක කරගත් පුහුණු පාඨමාලා නොමැතිවීමෙන් රැකියා වෙළඳපලට උචිත ශ්‍රම බලකායක් ඇති කර ගැනීම අපහසු වී තිබුණි.

දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන ඒ මත පදනම්ව නව පාඨමාලා ඇති කිරීම සහ විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා වූ අවධානය දුර්වල මට්ටමක පැවතුණි. ඒ අනුව 2017 වර්ෂයේදි විශ්වවිද්‍යාල විද්‍යායතන ඇතුළු ආයතන 12 ක් අතරින් ආයතන 4 ක් පමණක් නව පාඨමාලා 16 ක් හඳුන්වා දී තිබුණු අතර 2018 වර්ෂයේදී ආයතන 03 කින් පමණක් පාඨමාලා 21 ක් හඳුන්වා දී තිබුණි.

### වෘත්තීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් පිළිබඳව පසු විපරම් කිරීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යස්ථාන බොහෝ ප්‍රමාණයකින් වෘත්තීය පුහුණුව අවසන් කළ පුහුණුලාභීන්ගේ රැකියාගතවීම් සම්බන්ධව පසුවිපරම් වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම පුහුණුලාභීන් රැකියාගතවීම් පිළිබඳ දත්ත පද්ධතියන් නොමැතිවීම හේතුවෙන් දැනට පවත්වනු ලබන පාඨමාලා රැකියා පරිසරයට කොතෙක් දුරට ගැලපේද, නවීකරණය විය යුතුද යන්න පිළිබඳව ඇගයීමට අවස්ථාව අහිමි වී තිබුණි. එමෙන්ම රාජ්‍ය මට්ටමින් වෘත්තීය පුහුණු ආයතන හා විදේශ රැකියා ආයතන සම්බන්ධීකරණය, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව අවස්ථා හඳුනාගෙන සිසුන් රැකියාගත කිරීම, ස්වයං රැකියා සඳහා දායකත්වය ලබාදීම සම්බන්ධයෙන් විධිමත් පසු විපරම් වැඩපිළිවෙලක අවශ්‍යතාවයක් පැවතුණි.

## නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ කාර්යසාධනය

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කාර්මික, වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ ආයතන 11 ක් හා ඒ යටතේ දිවයින පුරා ව්‍යාප්ත වී ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ජාලය තුළින් නිපුණතාවයෙන් පිරි තරුණ පරපුරක් බිහි කිරීම සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. ඒ අනුව නිපුණතාවයෙන් පිරිපුන් ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා වූ අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කර ගැනීමට ප්‍රබල දායකත්වයක් නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි. ඒ අනුව නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 258 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 264 ක් වෙත අනුයුක්ත කර තිබුණි. නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ ප්‍රමුඛතම කාර්යය වනුයේ වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනයයි. ඒ යටතේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ඉලක්කගත කණ්ඩායම හඳුනාගැනීම, වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම, පුහුණුලාභීන් සඳහා රැකියා අවස්ථා සම්බන්ධීකරණය සහ ස්වයං රැකියා අවස්ථා සම්බන්ධීකරණ කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි. එම නිලධාරීන් විසින් තම කාර්යභාරය ඉටු කිරීමේදී පහත සඳහන් දුර්වල කාර්යසාධනයන් අනාවරණය විය.

- අනුමත කළ වාර්ෂික කාර්යසාධන සැලැස්ම අනුව 2018 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 හි අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් 3,167 ක් පැවැත්විය යුතුව තිබුණත්, ඉන් සියයට 50 ක් හෙවත් වැඩසටහන් 1,575 ක් පමණක් පවත්වා තිබුණි. එමෙන්ම අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සිසුන් සඳහා වැඩසටහන් 2,175 ක් පැවැත්විය යුතුව තිබුණත්, ඉන් වැඩසටහන් 1,617 ක් පමණක් පවත්වා තිබුණු අතර, පාසල් හැරගිය තරුණ කණ්ඩායම් සඳහා වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2,578 ක් පැවැත්විය යුතුව තිබුණත් ඉන් වැඩසටහන් 1,731 ක් පමණක් පවත්වා තිබුණි.
- එක් එක් ක්ෂේත්‍ර යටතේ හඳුනාගැනීමට අපේක්ෂිතව තිබූ ප්‍රතිලාභීන් හඳුනාගැනීම අවම මට්ටමක පැවතිණි. පාසල් හැරගිය තරුණ කණ්ඩායම් වෘත්තීය පුහුණුවට යොමුකිරීම සඳහා අපේක්ෂිත ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ ප්‍රගතිය සියයට 10 ක්ද, කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සම්බන්ධීකරණ වැඩසටහන් යටතේ හඳුනාගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභීන්ගෙන් සියයට 5 ක්ද, ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂිත තරුණ තරුණියන් හඳුනාගැනීම සියයට 1 ක මට්ටමකද පැවතුණි. කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියාගත කිරීමට අපේක්ෂිත කිසිදු ප්‍රතිලාභියෙකු හඳුනාගෙන නොතිබුණි.

## ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර

වෘත්තීය පුහුණුව සම්පූර්ණ කරන ලද සිසුන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට සහාය දීමේ අරමුණ පෙරදැරිව මුදල් අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. 2010 වර්ෂයේදී එහි පළමු අදියර ක්‍රියාත්මක කර තිබුණි. ණයලාභීන් 1,088 ක් වෙනුවෙන් රු. මිලියන 225 ක ණය ප්‍රදානය කර තිබුණි. ණය යෝජනා ක්‍රමයේ II වන අදියර 2016 මාර්තු 29 දින සිට 2019

දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා උක්ත පාර්ශවයන් විසින් එකඟතා ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. නිපුණත්වයෙන් හෙබි ශ්‍රම බලකාය ස්වයං රැකියාවන් තුළින් සවිබල ගැන්වීම ණය යෝජනා ක්‍රමයේ මූලික අරමුණ වී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන්ට ආපසු ගෙවීමේ පදනම මත සියයට 7 ක ණය පොලියක් යටතේ රු.500,000 ක ණය මුදලක් ප්‍රදානය කිරීමට අපේක්ෂා කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- එකඟතා ගිවිසුම අනුව ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 375 ක ණය ප්‍රදානයක් කිරීමට ගිවිසුම්ගත වී තිබුණි. ණය ලබාගැනීම සඳහා ඉදිරිපත් වූ ණය අයදුම්පත් සංඛ්‍යාව ඉහළ යාමත් සමඟ අවශ්‍යතාවය මත 2017 වර්ෂයේදී රු.මිලියන 50 ක් හා 2018 වර්ෂයේදී රු.මිලියන 60 ක වශයෙන් අතිරේක ප්‍රතිපාදන ආසියානු සංවර්ධන බැංකුව විසින් අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය වෙත ලබාගෙන තිබුණි. 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ණය ප්‍රදානය වෙනුවෙන් රු.මිලියන 409.67 ක් වැය කර තිබුණි.

- ජාතික වෘත්තීය සුදුසුකම් සහිත තරුණ තරුණියන් ජීවනෝපාය මාර්ගයකට යොමු කිරීම අරමුණු කරගෙන ආරම්භ කරන ලද මෙම වැඩපිළිවෙල යටතේ ණය ලබා ගැනීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම සහිත පාඨමාලාවක් හදාරා තිබිය යුතු අතර 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා පුද්ගලයින් 790 දෙනෙක් සඳහා රු.මිලියන 352.22 ක ණය ප්‍රදානය කර තිබුණි. ණය ගිවිසුමට අනුව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම්කරුවන් තෝරා ගැනීමේ වගකීම අමාත්‍යාංශයට පැවරී තිබුණද, අමාත්‍යාංශයේ මැදිහත් වීමකින් තොරව අනුමත බැංකු විසින් ණයලාභීන් තෝරාගෙන ණය ප්‍රදානය කර තිබුණි. ඒ අනුව ණයලාභීන් 618 ක් අතරින් අහඹු ලෙස තෝරාගත් ණයලාභීන් 50 දෙනෙකු පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ජාතික වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ නොකළ තිදෙනෙකුට ණය ගිවිසුමට පටහැනිව රු.මිලියන 1.50 ක ණය ලබාදී තිබුණි. එසේම ණය ගිවිසුම අනුව ස්වයං රැකියා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික උපකරණ හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය ලබාදිය හැකි වුවද, කරන ලද සමීක්ෂණය අනුව සියයට 38 කට ආසන්න ප්‍රමාණයක් ව්‍යාපාරය පුළුල් කරගැනීම සඳහා ණය ලබාගෙන තිබුණි. මේ අනුව ණය යෝජනා ක්‍රමයෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

- දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 264 ක් අනුයුක්ත කර තිබියදී ණයලාභීන් පිළිබඳ පසුවිපරම් සමීක්ෂණය එම නිලධාරීන් මගින් ඉටුකරවා ගැනීමෙන් තොරව 2006 වර්ෂයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව පෞද්ගලික ආයතනයකට රු.මිලියන 1.73 කට පවරා තිබුණි. කෙසේ වුවද, තෝරාගත් ණයලාභීන් සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී, ණයලාභීන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි.

- ණය යෝජනා ක්‍රමයේ විවිධ අසතුටුදායක තත්ත්වයන් හඳුනාගෙන

තිබුණු අතර එහිදී ණය ලබාදීමේදී බොහෝ කාලයක් ගතවීම, බැංකුව SEPI ණය කෙරෙහි අඩු අවධානයක් යොමු කිරීම, බැංකුව SEPI ණය යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් නොවීම, SEPI ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතයට වඩා වැඩි පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම වැනි අඩුපාඩු ණයලාභීන් සම්බන්ධයෙන් සිදුකළ උක්ත සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණි. එසේම සමීක්ෂණ ආයතනයේ නියැදි පරීක්ෂණයට අනුව ණයලාභීන්ගෙන් සියයට 14 කට ආසන්න ප්‍රමාණයක් අදාළ ණය මුදලින් කිසිදු ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ එම ව්‍යාපාරය දිගටම පවත්වා නොතිබුණු අතර අමාත්‍යාංශයේ මැදිහත්වීම අවම මට්ටමක පැවතීම ඊට හේතු වී තිබුණි.

## ලෝක තරුණ නිපුණතා දිනය

2019 ලෝක තරුණ නිපුණතා දිනය නිමිති කොටගෙන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාල/ වෘත්තීය පුහුණු ආයතනවල සිසුන්ගේ සහයෝගයෙන් දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. සිදුකළ යුතු ප්‍රජා සත්කාරය නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව දිස්ත්‍රික්ක 25 ක් සඳහා රු.මිලියන 4.91 ක් වැයකර තිබුණි. ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව නිපුණතාවය තුළින් සාර්ථක ජීවිතයක් යන තේමාව යටතේ රු.මිලියන 2.08 ක් වැයකර නිපුණතා දින සැමරුම් උත්සවයක් පවත්වා තිබුණද, දැනට වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ වෘත්තීය නිපුණතාවය ඇගයීමක් සිදු කර නොතිබුණි. වැය කරන ලද මුළු වියදමින් සියයට 70 ක් හෙවත් රු.මිලියන 1.42 ක් උත්සව සංවිධානය, උත්සව ශාලා ගාස්තු, නිල ඇඳුම්, දිවා ආහාර හා තේ පැන් සංග්‍රහය සඳහා වැයකර තිබුණි.

## කින්නියා ප්‍රදේශයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ඉදිකිරීම

2017 ජූනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2017 – 2019 මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ රු.මිලියන 434 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 50 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් විශ්වවිද්‍යාලය වටා තාප්පයක් ඉදිකිරීම හා විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා උපදේශනාත්මක සේවා ලබා ගැනීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීම ඇතුළු වියදම් කීපයක් වෙනුවෙන් රු.මිලියන 5.90 ක් වැය කර තිබුණි. ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටම්වල පාඨමාලා ආරම්භ කිරීම සඳහා 2020 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 20 ක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් විද්‍යායතන භූමියේ කාර්යමණ්ඩල නේවාසිකාගාරයක් ඉදිකිරීම හා උපදේශන සේවා සැපයීම සඳහා 2019 ඔක්තෝබර් 15 දින වන විට රු.මිලියන 3.03 ක් වැය කර තිබුණි.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද අවශ්‍යතා තක්සේරු වාර්තාවට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලට අමතරව අතිරේක වියදම් කිරීමට අවශ්‍ය වුවහොත් එය ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍යනය කරගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, ආංශික නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය 2020 වර්ෂයෙන් අවසන් වේ. ඒ අනුව

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබියදී අවශ්‍යා අතිරේක අරමුදල් ඉහත ව්‍යාපෘතිය හරහා ලබා ගැනීමේ හැකියාව පිළිබඳ අවදානමක් පැවැතුණි.

## ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම

කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක සමස්ථ පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. 2018 වර්ෂයේදී සළසා තිබුණු ප්‍රතිපාදනවලින් උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු.මිලියන 6.03 ක් වැයකර තිබුණු අතර, 2019 වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පමණක් සිදු කර තිබුණි. කෙසේ වුවද, අයවැය යෝජනා මගින් වෙන්කළ රු.මිලියන 200 කට අතිරේකව රැරිය යුතු වියදම් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ වැය කිරීමට අපේක්ෂා කර තිබුණත්, එම ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී අවසන්වීමට නියමිතව තිබුණි

## සාගර විශ්වවිද්‍යාලය ඉඩකඩ සහිත පරිශ්‍රයක පිහිටුවීම

සාගර විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවයෙන් යුතු උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරීම උදෙසා වඩා ඉඩකඩ සහිත පරිශ්‍රයක් ඇති කිරීමේ අරමුණින් නව විශ්වවිද්‍යාල පරිශ්‍රයක් සංවර්ධනය කිරීම සඳහා කොරියානු අන්තර් ජාතික සහයෝගීතා නියෝජිතායතනය (KOIKA) ණය පහසුකම් ලබා දීමට ඉදිරිපත් වී තිබුණි. 2017 වර්ෂයේ සිට ඒ සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. 2019 සැප්තැම්බර් 05 දිනැති ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ ලිපියකට අනුව 2019 වර්ෂය අගභාගය වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොලැබුණහොත් ව්‍යාපෘතිය අහිමි වන බව ව්‍යාපෘති නිලධාරීන් විසින් විශ්වවිද්‍යාල පරිපාලනය දැනුවත් කර තිබූ බව දක්වා තිබුණි.

## මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අමාත්‍යාංශ ලේකම් වෙත වාහනයක් ලබා ගැනීම

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යාංශ ලේකම් වෙත 2016 සැප්තැම්බර් 19 දිනැති අංක 01/2016 (i) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 06 වන ඡේදයේ උපදෙස්වලට පටහැනිව ගිවිසුමකට එළඹීම හේතුවෙන් 2016 ඔක්තෝබර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි මාස 60 ක කාල පරිච්ඡේදයක් සඳහා මසකට රු.345,230 කට (බදු රහිතව) මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහනයක් ලබා ගෙන තිබුණි. අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා විශ්‍රාමයාම හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාහනය නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව මාසයකට රු.345,230 (බදු රහිතව) ක් බැගින් මාස 14 ක් වෙනුවෙන් වැය කළ රු.මිලියන 5.62 ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

## ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය

- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011

අප්‍රේල් 27 දිනැති අංක අමප/11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 434.9 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 304.50 ක් වියදම් කර තිබුණු අතර ගිණුම් වර්ෂය අවසාන වන විටත් ශබ්දාගාරය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

- 2017 ජනවාරි 03 දින පැවති අංක අමප/16/2673/720/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සඳහා වැඩපලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ සඳහා රු.මිලියන 927.34 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2018 හා 2019 වර්ෂවලදී එකතුව රු.මිලියන 268 ක් ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා තිබුණත්, උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 23.60 ක් පමණක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

### ආධුනිකයින් ඇගැයීම් කිරීමේ ප්‍රමාදය

2018 වර්ෂයේදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පුහුණු මධ්‍යස්ථාන 13 ක පවත්වා ගෙන ගිය සංචාරක හෝටල් ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා 28 ක ආධුනිකයන්ගේ ඇගයීම් විගණන දිනය වූ 2019 දෙසැම්බර් 03 දින වන විටත් සිදු කර නොතිබුණි.

### ජාතික නිපුනතා සම්මතයන් යාවත්කාලින නොකිරිම

තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ පිහිටුවන ලද සංචාරක කාර්මාන්ත ආංශික නිපුණතා සභාව වෙත ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සඳහා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේදී රු.මිලියන 2.03 ක් වියදම් කර තිබුණි. නමුත් අරක්කැමි හා බේකරි පාඨමාලාවන් සඳහා ජාතික නිපුණතා සම්මතයන් යාවත්කාලීන කර නොතිබුණි.

### උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදංචිය

ධීවර කර්මාන්තයෙහි යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන තැනැත්තන්ගේ තාක්ෂණික හා කළමනාකරණ දක්ෂතා දියුණු කිරීම අරමුණු කරමින් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවා තිබුණි. 2015 වර්ෂයේදී උපාධි පාඨමාලා 04 ක් යටතේ සිසුන් 87 දෙනෙකු ලියාපදිංචි වී තිබුණි. 2016 වර්ෂය වන විට සිසුන් සංඛ්‍යාව 156 දෙනෙකු දක්වා වර්ධනය වී පැවතුණද, ඉන්පසුව ප්‍රමාණවත් වර්ධනයක් සිදුවී නොතිබුණි. 2019 වර්ෂය වන විට පාඨමාලා 05 ක් යටතේ සිසුන් 207 දෙනෙකු ලියාපදිංචි වී තිබුණි. 2015 වර්ෂයේදී වෘත්තීය පාඨමාලා (NVQ) 12 ක් යටතේ පාඨමාලා හදාරන සිසුන් 466 දෙනෙකු වූ අතර එහි ප්‍රමාණවත් වර්ධනයක් සිදු වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එවැනි පාඨමාලා 14 ක් යටතේ සිසුන් 604 දෙනෙකු ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව උපාධි පාඨමාලා හා වෘත්තීය පාඨමාලා සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ලියපදිංචි කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## ගොඩනැගිලි කුලිය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට, පංති කාමර, පුස්තකාල සඳහා භාවිතා කිරීමේ අරමුණින් 2017 දෙසැම්බර් මාසයේ සිට මාසික කුලිය රු.මිලියන 2.3 බැගින් වර්ග අඩි 16 800 ක පමණ වූ නව ගොඩනැගිල්ලක් කුලී පදනමට ලබාගෙන තිබුණි. මාසික කුලියට අමතරව එම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැකසීමේ කටයුතු සඳහා රු.මිලියන 22 ක් ද වැයකර තිබුණි. එහෙත් මේ තුළින් විශ්වවිද්‍යාලය සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ හෝ පවත්වනු ලබන උපාධි පාඨමාලාවන්ගේ වර්ධනයක් සිදුවී තිබුණු බව තහවුරු කිරිමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොතිබුණි. එමෙන්ම එතෙක් විශ්වවිද්‍යාලය විසින් භාවිතා කළ ගොඩනැගිලි සංකීර්ණයෙන් වර්ග අඩි 11 778 ක ප්‍රමාණයක් වර්තමානය වන විට නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

## නිෂ්කාර්යව පැවැති වත්කම්

2014 අංක 13 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ 5.1 (25) වගන්තිය ප්‍රකාරව පිහිටුවිය යුතු Sea Training Vessel Maintenance ඒකකය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිහිටුවා නොතිබුණි. 1994 සිට 2015 කාල පරාසය තුළ ලැබී තිබුණු මෙම ඒකකය සඳහා යොදාගත හැකි Inboard, Outboard සහ අධිවේගී බෝට්ටු ඇතුළු යාත්‍රා 13 ක් ප්‍රාදේශිය විද්‍යාලවල නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි.

## අහංගම සංචාරක හෝටලය නිෂ්කාර්යව පැවැතිම

1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ පනතේ අරමුණුවලට හා ඉඩම් පවරාගැනීමේ අවබෝධතා ගිවිසුමට පටහැනි ලෙස 2016 මාර්තු 11 දිනැති අංක 186/4 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා තීරණය අනුව සංචාරක හෝටලයක් ලෙස නවීකරණය කිරීම හා උපකරණ මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 148.92 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, පූර්ව සැලැසුමකින් තොරව ඉදිකරන ලද අහංගම සංචාරක හෝටලය සංචාරකයින්ගේ නවාතැන් පහසුකම් වෙනුවෙන් හා පුහුණු පාඨමාලා හදාරන ආධුනිකයන්ගේ ප්‍රායෝගික පුහුණු අවශ්‍යතා සඳහා යොදා ගැනීමෙන් තොරව 2018 මාර්තු 8 දින සිට නිෂ්කාර්යව පැවතිණි. නවීකරණ කටයුතු හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2019 මුල් අර්ධ වර්ෂය දක්වාම පුහුණු පාඨමාලා සඳහා ආධුනිකයන් බඳවා ගෙන නොතිබුණු අතර එම කාලය තුළ පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා රු.මිලියන 183.75 ක් වැය කර ඉදිකරණ ලද නව හෝටල් පාසලෙහි වැඩ 2019 ජූලි 10 දින අවසන් කර තිබුණි.

## කරෛනගර් හෝටල් පාසල් පරිශ්‍රය නිෂ්කාර්යව පැවැතිම

සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණ ඇතිව අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හා යාපනය දිස්ත්‍රික්කයේ කරෛනගර් හෝටල් පාසල් පරිශ්‍රය තුළ පිළිවෙලින් රු.මිලියන 33.89 ක් හා රු.මිලියන 57.13 ක් වැය කර වායුසමීකරණය කරන ලද අංග සම්පූර්ණ කාමර 12 ක් හා වායුසමීකරණය නොකරන ලද කාමර 10 ක් ඉදිකර තිබුණි. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය විසින් සංචාරකයින් යොමුකර ගැනීම සහ හෝටල් කාමර නඩත්තුව හා කළමනාකරණය කිරීම සඳහා සේවක මණ්ඩලය බඳවා ගැනීමේ පූර්ව සැලසුම් සකස් කර නොතිබීම යන හේතු නිසා 2017 වර්ෂයේ සිට අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

## කුච්චවේලි හා අහංගම නේවාසිකාගාර නිෂ්කාර්යව පැවැතිම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් අහංගම නව හෝටල් පාසලේ මහල් දෙකක

හා කුච්චවේලි හෝටල් පාසලේ දෙමහල් ගොඩනැගිලි **02** ක කාමර **12** කින් යුත් කාන්තා හා පිරිමි නේවාසිකාගාර ඉදිකර තිබුණි. නේවාසිකාගාර පාලක හා පාලිකා තනතුරු සඳහා බඳවා ගැනීම් සැලසුම් නොකිරීම නිසා කුච්චවේලි නේවාසිකාගාරය **2017** වර්ෂයේ සිට ද, අහංගම නේවාසිකාගාරය **2019** වර්ෂයේ සිට ද භාවිතා කිරීමට නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.

# කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා

එලදායි සහ කාර්මික ආරවුල්වලින් තොර කාර්මික සබඳතාවක් ඇතිකිරීමේ අපේක්ෂාවෙන් කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 07 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- කම්කරු හා වෘත්තිය සමිති සබඳතා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම
- ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුබසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
- වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියළුම වෘත්තිය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්රියාත්මක කිරීම
- ජාතික මිනිස්බල හා රැකී රක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- වෘත්තිය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාර්මික සබඳතා හා කාර්මික ආරවුල් නිරාකරණය කිරීම
- කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකකදී රු.මිලියන 17,618.78 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 14.308.54 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එම කාලපර්ච්ඡේදය තුළදී පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 18.79 ක් හෙවත් රු.මිලියන 3,310.24 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 51 හි දැක්වේ.




රූපසටහන 51 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ සංයුතිය

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකාය මිලියන 8.59 ක් වී තිබුණු අතර ඉන් මිලියන 8.18 ක සේවා නියුක්තියක් වාර්තා වී තිබුණි. මිලියන 0.41 ක් හෙවත් සියයට 4.77 ක සේවා වියුක්තියක් වාර්තා වී තිබුණි. විස්තර රූපසටහන 52 හි දැක්වේ.




රූපසටහන 52 - ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය
මූලාශ්‍රය - වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තා - ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

### සේවක ප්‍රතිලාභ නිරවුල් කිරීමේ කාර්යක්ෂමතාවය

කම්කරු දෙපාර්තමේන්තුව විසින් අධිකරණ මාර්ගයෙන් හා කම්කරු කාර්යාල මාර්ගයෙන් අයකරගෙන තිබූණු රු.මිලියන 394.4 ක සේවක අර්ථසාධක අරමුදල් ශේෂයක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සේවකයන් වෙත නිරවුල් කර නොතිබුණි. එයින් 2020 ජුනි 24 දින වන විට ඉන් රු.මිලියන 332.43 ක ශේෂයයක් නිරවුල් කිරිමට අපෙහොසත් වී තිබුණි.

### රඳවාගත් සේවක අර්ථසාධක අරමුදල් සේවකයන් වෙත නිරවුල් නොකිරිම

කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණු සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් රු.මිලියන 600 ක් 2019 ජුනි 30 දින වන විට නිරවුල් කිරිමට සැලැසුම් කර තිබුණි. නමුත් ඉන් රු.මිලියන 189 ක් පමණක් නිරවුල් කර තිබුණි.

### සේවක වන්දි නිරවුල් නොකිරිම

සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක අනතුරු හා මාරක නොවන අනතුරු හේතුවෙන් සේවා යෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකර ගත් වන්දිවලින් 2019 ඔක්තෝබර් මාසය වන විට අදාළ සේවකයින් වෙත නොගෙවා එකතුව රු.මිලියන 8,451.3* ක ශේෂයක් කම්කරු දෙපාර්තමේන්තුවේ රඳවා ගෙන තිබුණි. සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ නිවැරදි තොරතුරු නොමැති වීම, ප්‍රතිලාභීන්ගේ වන්දි මුදල් ගෙවීමට අදාළ ලියකියවිලිවල අඩුපාඩු හා ඒවා කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම යනාදී හේතු නිසා මෙම වන්දි මුදල් ගෙවීමට නොහැකිව පැවතුණි. එසේ නිරවුල් නොකර මාස 2 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

### යැපෙන්නන් සොයා ගැනිමට අපෙහොසත්විම

සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක අනතුරු හා මාරක නොවන අනතුරු හේතුවෙන් සේවා යෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකර ගත් වන්දි නියම යැපෙන්නන් සොයා ගැනිමට අපොහොසත්විම නිසා රු.මිලියන 1.89 ක් කම්කරු වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගිණුම් 06 ක් තුළ රඳවා ගෙන තිබුණි.

### වයස් පූර්ණත්වයට පත්වූ බාල වයස්කරුවන්ට ප්‍රතිලාභ නිදහස් නොකිරිම

රැකියාවේ නියුතුව සිටියදී සිදුවූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වයස් පූර්ණත්වයට පත් වූ පසු ඔවුන් වෙත ලබාදීම සිදුකළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වයස් පූර්ණත්වයට පත්වූවන්ගේ ගිණුම් 392 ක පැවැති රු.මිලියන 10.3 ක ප්‍රතිලාභ අදාළ පාර්ශවයන් වෙත නිදහස් කිරිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### මහජන රැකියා සේවා මධ්‍යස්ථාන

රැකියා ඇබැර්තු සඳහා රැකියා අපේක්ෂකයින්ගේ සුදුසුකම් මත ගැලැපීමක් සිදු වී තිබුණත්, රැකියා අපේක්ෂකයින්ට රැකියාගත පුහුණුවක් නොමැතිවීමෙන් රැකියා සඳහා තෝරා ගැනිම අවම මට්ටමක පැවැතුණි. රැකියා අපේක්ෂිතයින්ට රැකියාගත පුහුණුව සඳහා පහසුකම් සැපයීම් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන විසින් සිදු කරනු ලබයි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින්

*රු. මිලියන 8.4513ක් වශයෙන් සංශෝධනය විය යුතුය.

රැකියාගත පුහුණු කිරීම් සඳහා යොමු කළ පිරිස අවම මට්ටමක පැවතිණි. එම මධ්‍යස්ථාන මගින් සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් 25,864 දෙදෙනෙකුගෙන් 921 දෙනෙකු පමණක් රැකියාගත පුහුණුව ලබා දී තිබුණි. බදුල්ල, මඩකලපුව, කොළඹ, ගම්පහ, හම්බන්තොට, යාපනය, කෑගල්ල, කිලිනොච්චිය, මාතර, නුවරඑළිය, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල කිසිදු රැකියාගත පුහුණුවක් සිදුකර නොතිබුණි.

## ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන්

2019 අගෝස්තු 31 දින වන විට රැකියා නිර්මාණ ප්‍රවර්ධනය හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය විසින් දිස්ත්‍රික්ක 25 ක් සඳහා වැඩ සටහන් 362 ක් පවත්වා තිබුණි. මේ සඳහා ප්‍රතිලාභීන් 12,774 දෙනෙකු සහභාගී වී තිබුණු අතර ඉන් සියයට 7 ක් හෙවත් 911 දෙනෙකු විසින් ස්වයං රැකියා ආරම්භ කර තිබුණි. ඒ අනුව ස්වයං රැකියා වැඩසටහන් සඳහා සහභාගී වූවන්ගෙන් රැකියා සඳහා අඩු ප්‍රමාණයක් යොමු වී තිබුණි. ඉකුත් වර්ෂයන්හිදීද මෙම තත්ත්වය ඇති වී තිබුණි. මෙයට හේතු විමසා ප්‍රගතියක් ඇති වන ආකාරයට වැඩසටහන් සැලැසුම් කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

## රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පැවති ඉඩමක රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. එම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් වීමට පෙර 2017 අප්‍රේල් 07 දින ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තබා තිබුණි. ඒ සඳහා භූමිය එලිපෙහෙලි කිරීම වෙනුවෙන් 2017 මාර්තු 09 දින රු.81,400 ක් ද වැය කර තිබුණි. තවද එම උත්සවය සඳහා රු.274,400 ක වියදම් ඇස්තමේන්තුවක්ද රත්නපුර කම්කරු කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබුණි. එම ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2017 දෙසැම්බර් 14 දින රු. මිලියන 24.98 ක් ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2020 ජුනි 15 දින වන විටත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පෞද්ගලික ගොඩනැගිල්ලක කුලී පදනම මත පවත්වාගෙන යන අතර පැරණි ගොඩනැගිලි සංකීර්ණය අත්හැර දමා තිබුණි.

## වාහන පාලනය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල්ගේ නමට ලියාපදිංචි කර තිබුණු වාහන ලැයිස්තුව හා දෙපාර්තමේන්තුවේ දැනට පවතින වාහන හා සැසඳීමේදී වාහන 22 ක් භෞතිකව දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. තවද එම වාහන සම්බන්ධ ලිපිලේඛනද දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. භෞතිකව නොතිබුණු වාහන 2 ක් වෙනුවෙන් 2016 හා 2017 වර්ෂ සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර තිබුණු වාහන ලැයිස්තුව හා නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට පැවති වාහන ලැයිස්තුව සමඟ සැසඳීමේදී වාහන 09 ක් කම්කරු අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර පැවතුණද, එම වාහන භෞතිකව අමාත්‍යාංශය සතුව නොපැවතුණි. එම වාහනවල පැවැත්ම සම්බන්ධව විගණනයට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

## සාමාජිකයින් හඳුනාගෙන ප්‍රතිලාභ නිරවුල් නොකිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් 1981 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී සාමාජිකයන් 7,946 ක ගෙන් අයකර ගෙන තිබුණු රු.මිලියන 862.34 ක දායක මුදල්ද, 1995 වර්ෂයේ සිට පැවත එන හිමිකම් නොපාන ලද රු.මිලියන 14.45 ක මරණ ප්‍රතිලාභද, 2001 වර්ෂයේ සිට පැවත එන රු. මිලියන 14.86 ක රඳවාගත් ප්‍රතිලාභ ද, වශයෙන් එකතුව රු. මිලියන 891.66 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## අනාර්ජික වියදම්

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ආයතනයක නිලධාරියෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් කළ නොහැකි අතර එසේ නිදහස් කරනු ලබන කාලසීමාවට කිසිදු වේතනයක් අදාළ ආයතනයෙන් නොගෙවිය යුතුව තිබුණි. 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පළාත් පාලන ආයතන ඇතුළු රජයේ ආයතනවලට නිලධාරීන් 13 දෙනෙකු නිදහස් කර වැටුප් ලෙස රු.මිලියන 22.68 ක් ද, අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.මිලියන 1.03 ක් ද, වැඩබැලීමේ දීමනා ලෙස රු.මිලියන 0.15 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 23.86 ක් මණ්ඩලය විසින් ගෙවා තිබූ අතර එය මණ්ඩලයට අනාර්ජික වියදමක් වී තිබුණි.

## සේවක අර්ථසාධක අරමුදල විසින් නිරවුල් නොකරන ලද දායක මුදල් හා ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලේ දීර්ඝ කාලයක් මුළුල්ලේ කම්කරු කොමසාරිස් නමින් ගිණුමක් පැවැතුණි. එම ගිණුමෙහි සේවා යෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකර ගත් මුදල් පැවැති අතර 2019 දෙසැම්බර් 31 දිනට එහි රු.මිලියන 10,711 ක ශේෂයක් පැවැතුණි. නඩු පැවරීමෙන් අයකර ගෙන තිබුණු රු.මිලියන 398 ක් අදාළ පාර්ශවයන්ට නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. සාමලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් බැර කළ යුතු සාමාජිකයින්ගේ ගිණුම් හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" ගිණුමේ රඳවා තිබූ රු.මිලියන 30,435 ක්, රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 860 ක් සහ ඌන/අතිරික්ත දායක මුදල් ගිණුමේ රඳවා තිබූ රු.මිලියන 1,843 ක් සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද, එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## සාමාජික ශේෂය පිරික්සීමේ යන්ත්‍රවල (Kiosk) ක්‍රියාකාරිත්වය

සේවක අර්ථසාධක අරමුදල විසින් සාමාජිකයන්ට තම ගිණුම් ශේෂය පිරික්සීම සඳහා KIOSK යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ලංකාව පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල KIOSK යන්ත්‍ර 30 ක් ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ දී සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී KIOSK යන්ත්‍ර 27 ක් අක්‍රියව පැවති අතර ඉන් යන්ත්‍ර 5 ක් සවි කරන ලද මුල් කාලයේ සිටම විවිධ හේතු මත අක්‍රියව පැවතුණි. නිවැරදි ඇගයීම් ක්‍රියාවලියකින් තොරව මිලදීගෙන තිබීම,

යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් ලබා නොදීම, විධිමත් පුහුණුවක් ලබා නොදීම, අඛණ්ඩව ප්‍රගතිය ඇගයීමක් සිදු නොකිරීම, යන්ත්‍රයේ භාරකාරිත්වය, වගකීම නිසි අධිකාරියකට පවරා නොතිබීම හා නිවැරදි ස්ථානවල යන්ත්‍ර සවිකර නොතිබීම යනාදි කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී තිබුණි. එසේම සවිකරන ලද දින සිට වර්ෂ 5 ක්වත් ගතවීමට පෙර මෙලෙස යන්ත්‍ර භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා සිදු කර තිබුණු වියදම නිෂ්කාර්ය වී තිබුණි.

## වංචා සහගත ලෙස ප්‍රතිලාභ මුදල් නිදහස් කර ගැනීම

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමි සාමාජිකයා මියගිය විට, ඔවුන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් ප්‍රතිලාභ ලබාගැනීමට ඉදිරිපත් වීමට පෙර වෙනත් පුද්ගලයෙකු විසින් සත්‍ය සාමාජිකයා ලෙස පෙනී සිටිමින් ව්‍යාජ ලිපිලේඛන ඉදිරිපත් කර වංචා සහගත ලෙස එම ප්‍රතිලාභ මුදල් නිදහස් කරගෙන තිබුණු අවස්ථා අනාවරණය වී තිබුණි. 2004 නොවැම්බර් 04 දින සිට 2020 පෙබරවාරි 20 දින දක්වා එවැනි අවස්ථා 61 කදී රු.මිලියන 52.32 ක් අරමුදලට වැය බරක් වන ලෙස ගෙවා තිබුණි. අවස්ථා 3 කට අදාළව රු. මිලියන 3.39 ක් තවදුරටත් ගෙවීමට පැවතුණි. වංචා සහගත ලෙස මුදල් ලබාගත් අවස්ථා සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ප්‍රකාරව විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට හා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වුවහොත් ඔවුනට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

## විදේශ රැකියා ක්ෂේත්‍රය

විදේශ රැකියා ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සුවිශේෂී දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අනුව 2018 වර්ෂයේදී එම ක්ෂේත්‍ර යෙන් රු.මිලියන 1,138,124 ක් උපයා ගෙන තිබුණි. එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7.55 ක නියෝජනයක්ද,, විදේශ විනිමය ඉපයීම්වලින් සියයට 96 ක නියෝජනයක්ද වී තිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිභාවය සියයට 4.41 ක් දක්වා අඩු කිරීමටද දායක වී තිබුණි.

## රැකියා සඳහා විදේශගතවීම් අඩුවීම

අමාත්‍යාංශ කටයුතුවලදී ප්‍රමුඛ ක්ෂේත්‍රයක් (Trust Area) ලෙස විදේශ රැකියා වෙළඳපල ප්‍රවර්ධනය කිරීම සඳහන් කර තිබුණත්, පසුගිය වර්ෂ කිහිපය තුළ රැකියා සඳහා විදේශ ගතවීම් ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු වී තිබුණි. 2011 වර්ෂයේදී රැකියා සඳහා විදේශගත වීම් සංඛ්‍යාව 262,961 ක් වී තිබුණි. එය 2019 වර්ෂය වන විට 203,186 ක් දක්වා සියයට 22.73 කින් අඩු වී තිබුණි. එම අඩුවීම ස්ත්‍රී හා පුරුෂ වශයෙන්ද සිදු වී තිබුණි. ඒ පිළිබඳ විස්තර රූප සටහන 52 දැක්වේ.




රූපසටහන 52 - ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

## කාර්යාංශයේ ලියාපදිංචිව විදේශ රැකියා සඳහා යොමුවන ප්‍රමාණය අඩුවීම.

**2011** වර්ෂයේදී රැකියා සඳහා **262,961** දෙනෙකු විදේශගත වී තිබුණි. ඉන් සියයට **55.63** ක් හෙවත් **146,293** දෙනෙකු කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වී තිබුණි. රැකියා සඳහා විදේශගත වූ අයගෙන් සියයට **44.36** ක් වෙනත් මාර්ගයන්ගෙන් විදේශගත වී තිබුණි. **2019** වර්ෂය වන විට රැකියා සඳහා විදේශගත වූවන්ගෙන් සියයට **34.15** ක් හෙවත් **69,379** දෙනෙකු කාර්යාංශයෙන් ලියාපදිංචි වී විදේශගත වී තිබුණු අතර සියයට **65.85** ක් වෙනත් ආකාරයකට විදේශගත වී තිබුණි. ඒ අනුව විදේශ සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන් කාර්යාංශයේ ලියාපදිංචිවීම කෙරෙහි අඩු අවධානයක් යොමු කර තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර රූපසටහන **53** හි දැක්වේ.




රූපසටහන 53 - විදේශ රැකියා සඳහා යොමුවීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

### ශ්‍රම කාණ්ඩ අනුව රැකියා සඳහා විදේශගතවීම්

2011 වර්ෂයේදී ගෘහ සේවිකා හා නුපුහුණු ශ්‍රම කාණ්ඩ යටතේ රැකියා සඳහා විදේශගත වූ පිරිස පිළිවෙලින් 107,500 දෙනෙකු හා 63,642 දෙනෙකු වී තිබුණි. එය 2019 වර්ෂය වන විට පිළිවෙලින් 61,569 දෙනෙකු දක්වා සියයට 42.73 කින්ද හා 51,200 දෙනෙකු දක්වා සියයට 19.55 කින්ද අඩු වී තිබුණි. ගෘහ සේවිකා හා නුපුහුණු ශ්‍රම කාණ්ඩ යටතේ රැකියා සඳහා විදේශගතවීම් ප්‍රමාණය වාර්ෂිකව අඩුවෙමින් පැවැතියත්, වෘත්තීය ශ්‍රම කාණ්ඩ යටතේ රැකියා සඳහා විදේශගතවීම් සංඛ්‍යාවේ වර්ධනයක් නිරීක්ෂණය විය. 2011 වර්ෂයේදී වෘත්තීය ශ්‍රම කාණ්ඩ යටතේ රැකියා සඳහා විදේශගත වූ සංඛ්‍යාව 3,848 දෙනෙකු වී තිබුණි. නමුත් 2019 වර්ෂය වන විට එම ප්‍රමාණය 9,800 දෙනෙකු දක්වා සියයට 60.73 කින් වර්ධනය වී තිබුණි. විස්තර රූපසටහන 54 හි දැක්වේ.




රූපසටහන 54 - ශ්‍රම කාණ්ඩ අනුව විදේශගත වූ සේවක සංඛ්‍යාව
මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

### විදේශ දූත මණ්ඩල වල පිහිටි කම්කරු සුභසාධන අංශවල පරිපාලන කටයුතු විධිමත් නොවීම.

විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පසු විවිධ ගැටලුවලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා විදේශ දූත මණ්ඩල 16 ක කම්කරු සුභසාධන අංශ සහ ඒ යටතේ ක්‍රියාත්මක වන රැඳවුම් නිවාස 12 ක් ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අංශවල හා රැඳවුම් නිවාසවල අනුයුක්ත කර තිබුණු නිලධාරීන්ට වැටුප් හා දීමනා වෙනුවෙන් රු.මිලියන 693.47 ක් හා රැඳවුම් නිවාස නඩත්තුව හා අනෙකුත් යටිතල පහසුකම් වෙනුවෙන් රු.මිලියන 221.45 ක් වශයෙන් එකතුව රු.මිලියන 914.92 ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වැය කර තිබුණි. 2019 වර්ෂය නිමවන විටත් මෙම අංශ සඳහා සේවකයින් බඳවාගැනීමට අදාළව බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කර නොතිබුණි. එමෙන්ම මෙම අංශවල මූල්‍ය පරිපාලනය විධිමත් අභ්‍යන්තර පාලනයක් යටතේ පවත්වා ගැනීමට කාර්යාංශය අපොහොසත් වීම මත එම අංශවල විවිධ මූල්‍ය අක්‍රමිකතා සිදු වී තිබුණි. විගණන නියැදි පරීක්ෂාවන්ට ලක්වූ අවස්ථා තුනකදී එකතුව රු.මිලියන 3.27 ක පමණ මූල්‍ය වංචාවන් සිදු වී තිබුණි.

### තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම

තිරසර සංවර්ධන ඉලක්ක 8.8 අනුව "කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කර

ගැනීම, විශේෂයෙන් ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයන් සහ අවදානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුළත් ව වැඩ කරන සියලු දෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම" කළ යුතුව තිබුණි. එම අරමුණ කරා ළඟාවීම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සැලැසුම්වල ඍජු සම්බන්ධතාවයක් තිබිය යුතුය. එහෙත් පසුගිය කාල පරිච්ඡේදයන්ට අදාළ ක්‍රියාකාරී සැලැසුම්වල එවැනි සම්බන්ධතාවක් නොතිබුණි. විශේෂයෙන්ම තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා විදේශ රැකියා සඳහා යොමුකිරීමේ වෙනසක් එනම් නුපුහුණු, අර්ධ පුහුණු සහ ගෘහසේවිකා යන සේවා වර්ගීකරණ යටතේ විදේශ රැකියා සඳහා යොමුවන ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුකර නිපුණතාවයෙන් යුතු ශ්‍රමිකයින් වඩාත් වාසිදායක රැකියා අවස්ථා සඳහා යොමුකිරීමට සැලැසුම් සකස් විය යුතුව තිබුණි. එහෙත් කාර්යාංශය විසින් පිළියෙල කර තිබුණු තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන කාර්යයක් හෝ උපකාර්යයන් කුසලතා පරිපූර්ණ ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමුකිරීමට ඉලක්ක කර නොතිබුණි.

### ශ්‍රමික සංක්‍රමණය සම්බන්ධයෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම මන්දගාමීවීම

ශ්‍රමික සංක්‍රමණය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැසුම්වල ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලු ආයතන සම්බන්ධවන විධිමත් යාන්ත්‍රණයක් සකස් කර ඒවායෙහි අවසන් ප්‍රතිඵලය ළඟාකර ගැනීම සඳහා දිගුකාලීන දැක්මක් සහිත සංයුක්ත සැලැස්මක් හෝ ආයතනික ප්‍රතිඵල රාමුවක් (organizational results frame work) රේඛීය අමාත්‍යාංශය මැදිහත්වීමෙන් සකස් කළ යුතුව තිබුණි. එමෙන්ම ඊට අදාළ කෙටිකාලීන ක්‍රියාකාරිත්වය මැනබැලීම සඳහා වන කාර්යසාධන දර්ශක ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස් විය යුතුව තිබුණි. 2017 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංයුක්ත සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර තිබීම පාදක කර ගෙන විෂය භාර අමාත්‍යාංශය විසින් ඉහත කී ජාතික සැලැසුම් හා ප්‍රතිපත්තිවල නිමැවුම හා දිගුකාලීන ප්‍රතිලාභය ගුණාත්මකව අගය කිරීමට හැකි වන ආකාරයට සැලැසුම් සකස්කර නොතිබුණි. එමෙන්ම ඉහත ප්‍රතිපත්තිවල ඇතුළත් නිර්දේශ බිම් මට්ටමේදී ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සක්‍රීය දායකත්වය මේ සඳහා ලබා ගැනීමට හැකි වැඩපිළිවෙළක් 2019 වර්ෂය නිමවන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

### රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම.

2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සේවා වර්ගීකරණ 07 ක් යටතේ එකතුව 1,376,465 ක රැකියා අවස්ථා රටට ලැබී තිබුණි. ඉන් 473,856 ක් ගෘහසේවිකාවන් සඳහා වන අතර නුපුහුණු සේවා වර්ගීකරණය යටතේ රැකියා 280,261 ක් ලැබී තිබුණි. එමෙන්ම පුහුණුවලත් ශ්‍රමිකයින් සඳහා රැකියා අවස්ථා 542,893 ක් ලැබී තිබුණත් ඒ සඳහා 79,785 ක් හෙවත් සියයට 15 ක් පමණක් විදේශගත කර තිබුණි. ඊට සාපේක්ෂව ගෘහ සේවිකාවන් සහ නුපුහුණු ශ්‍රමිකයින් සඳහා ලැබී තිබු රැකියා අවස්ථාවලින් සියයට 32 ක් සඳහා ශ්‍රමිකයින් යොමු කිරීමට හැකි වී තිබුණි. විදේශ විනිමය උපයාදීම තුළින් විදේශ රැකියා ක්ෂේත්‍රය දේශීය ආර්ථිකයට ශක්තියක් වුවද, වර්තමානය වන විටත් මැද පෙරදිග කලාපයේ සේවය සඳහා ගොස් සිටින කාන්තා ශ්‍රමිකයින්ගෙන් මෙම

ක්ෂේත්‍රයේ පැවැත්ම තීරණය වී තිබීම සහ ඒ තුළින් පැන නැඟී ඇති විවිධ සමාජීය ප්‍රශ්න සලකා බැලීමේදී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බැලිය යුතුව තිබුණි.

## විදේශ රැකියා වෙළඳපල විශ්ලේෂණය හා අධ්‍යයනය කිරීම.

විදේශ රැකියා අමාත්‍යාංශය විසින් එහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය ප්‍රමුකතා ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන තිබුණු අතර ඊට අදාළව පර්යේෂණ පැවැත්වීම, 2017 හා 2018 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම්වලට ක්‍රියාකාරකමක් ලෙස ඇතුළත් කර තිබුණි. එහෙත් එම වර්ෂවල ක්ෂේත්‍රයට අදාළව කිසිදු පර්යේෂණයක් සිදු කර නොතිබුණි. එමෙන්ම 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම ක්‍රියාකාරකම ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීමට වැදගත් වූ කටයුත්තක් අමාත්‍යාංශයේ සැලැසුම්වලින් ඉවත්වී තිබුණි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි සඳහන් ප්‍රතිපාදන අනුව ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදු කළ යුතුය. ඒ අනුව කාර්යාංශය විසින් ස්ථාපිත කර තිබූ පර්යේෂණ අංශය විසින් 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පර්යේෂණ 17 ක් සිදුකර තිබුණද, විදේශ ශ්‍රම වෙළඳපොල හැසිරීම පිළිබඳව සහ රටට වාසිදායක රැකියා අවස්ථා හඳුනා ගැනීමට අදාළ පර්යේෂණ එමගින් සිදුකර නොතිබුණි.

# සෞඛ්‍යය

දේශයේ ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීම සෞඛ්‍ය අංශයේ දැක්ම වේ. ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින් සාමූහිකව ක්‍රියාකරමින්, පරිපූර්ණ ඉහළම මට්ටමේ ගුණාත්මක සමාන ඵලදායි සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකා වාසී ජනතාවට ලබාදීම මගින්, අත්කර ගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම සෞඛ්‍ය අංශයේ මෙහෙවර වේ.

එම මෙහෙවර ඉටු කිරීම පිණිස ක්‍රියාමත කළ යුතු ප්‍රධාන කාර්යයන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ දක්වා තිබුණි. ඒ අනුව

- සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම
- මානව සම්පත් සංවර්ධනය
- කළමනාකරණය, සැලැසුම්කරණය සහ පද්ධති සංවර්ධනය
- සම්පත් බෙදාහැරීම, වැඩසටහන් හා ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ඇගයීම
- ප්‍රධාන රෝහල් පරිපාලනය
- පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය
- ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනට අදාළ කටයුතු
- මහජන සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය අංශයේ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම
- වසංගත, බෝවන රෝග සහ බෝ නොවන රෝග පැතිරීම පාලනය, වැළැක්වීම සහ නිවාරණයට අවශ්‍ය පියවර ගැනීම
- ජාත්‍යන්තර නිරෝධායන සහ සනීපාරක්ෂණයට අදාළ නීති, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ඖෂධ වර්ග නිෂ්පාදනය, ආනයනය සහ බෙදාහැරීම සම්බන්ධ කටයුතු
- වතු අංශයේ සෞඛ්‍ය කටයුතු
- පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම
- ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය කිරීම හා නියාමනය කිරීම

මෙම කාර්ය භාරය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 04 ක් හා රාජ්‍ය ව්‍යාපාර 04 කින් සමන්විත ආයතනවලින් ඉටු කිරීමට අපේක්ෂා කර තිබුණි.

එම ආයතන යටතේ මහජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රජයේ හා පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන රෝහල් හා ආයතන පිළිබඳ තොරතුරු වගුව 20 හි දැක්වේ.

| රෝහල් හා ආයතන | අමාත්‍යාංශය යටතේ පවතින සංඛ්‍යාව | පළාත් සභා යටතේ පවතින සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| ජාතික රෝහල් | 2 | 0 | 2 |
| ශික්ෂණ රෝහල් | 23 | 1 | 24 |
| පළාත් මහ රෝහල් | 2 | 0 | 2 |
| දිස්ත්‍රික් මහ රෝහල් | 10 | 9 | 19 |
| මූලික රෝහල් ඒ හා බී වර්ග | 7 | 74 | 81 |
| දිසා රෝහල් ඒ, බී හා සී වර්ග | 3 | 471 | 474 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක සමඟ මාතෘ නිවාස | - | 499 | 499 |
| වෙනත් ආයතන | 73 | 226 | 299 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල | - | 350 | 350 |
| එකතුව | 120 | 1,630 | 1,750 |

වගුව 20. - 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය හා පළාත් සභා යටතේ පවතින රෝහල් හා ආයතන
මූලාශ්‍රය - සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දුන් තොරතුරු අනුව

ඉහත සඳහන් රෝහල් හා ආයතනවලින් මහජනතාවට අවශ්‍ය සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට 139,487 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. විස්තර වගුව 21 හි දැක්වේ.

| සෞඛ්‍ය කාර්ය මණ්ඩලය | රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කාර්යමණ්ඩල සංඛ්‍යාව | පළාත් සභා යටතේ ඇති කාර්යමණ්ඩල සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරීන් | 1,774 | 737 | 2,511 |
| වෛද්‍ය නිලධාරීන් | 12,332 | 7,516 | 19,848 |
| හෙද සේවයේ නිලධාරීන් | 25,198 | 13,330 | 38,528 |
| වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් | 1,272 | 613 | 1,885 |
| ඖෂධවේදීන් | 1,140 | 713 | 1,853 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 173 | 1,676 | 1,849 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 1,113 | 7,274 | 8,387 |
| උපස්ථායක | 4,181 | 4,352 | 8,533 |
| වෙනත් | 29,520 | 26,573 | 56,093 |
| මුළු කාර්යමණ්ඩලය | 76,703 | 62,784 | 139,487 |

වගුව 21 - සෞඛ්‍ය අංශය සඳහා රජය හා පළාත් සභා විසින් අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය
මූලාශ්‍රය - සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දුන් තොරතුරු අනුව

මහජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් මෙම අංශය සඳහා 2019 වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එකතුව රු.බිලියන 556.54 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු අතර, ඉන් රු.බිලියන 499.21 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.බිලියන 57.33 ක් හෙවත් සියයට 10.30 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. විස්තර රූපසටහන 55 හි දැක්වේ.




රූපසටහන 55 - සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය
මූලාශ්‍රය - භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන

## තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම

තිරසර සංවර්ධන අරමුණුවල 3.1 යටතේ 2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000 කට 70 ක් දක්වා අඩු කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසාන වන විට එම අනුපාතිකය 33.7 ක සිට 19.2 දක්වා අඩු වී තිබුණි. එමෙන්ම තිරසර සංවර්ධන අරමුණුවල 3.2 යටතේ සියළුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවි උපත් 1000 කට 12 ක් දක්වා සහ අවුරුදු 5 ට අඩු ළමා මරණ සජීවි උපත් 1000 කට අවම වශයෙන් 25 ක් දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අළුත් උපත් සහ වයස අවුරුදු 5 අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම අරමුණ වී තිබුණි. ශ්‍රී ලංකාවේ මළ දරු උපත් අනුපාතය 2015 වර්ෂයේදී 9.16 ක සිට 2019 වර්ෂය අවසන් වන විට එය 5.9 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකාව සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අරමුණ සාක්ෂාත් කර ගෙන තිබුණි. අඩුබර උපත් අනුපාතය 2015 වර්ෂයේදී 6.94 ක්ව පැවැතුණත්, එය 2019 වර්ෂය අවසන් වන විට 16.3 ක් දක්වා වැඩි වී තිබුණි. (2019 වර්ෂයට අදාළ සංඛ්‍යාවන් පුරෝකථනය කළ අගයන් වේ.) විස්තර රූපසටහන 56 හි දැක්වේ.




රූපසටහන 56 - ළදරු මරණ අනුපාතය අඩුවීම
මූලාශ්‍රය - ........................ (සඳහන් කරන්න)

## රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත ආයතනයකින් පැවැත්විය යුතු වුවද, 2018 වර්ෂයේදී එම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදුකර ගැනීමේ හැකියාව තිබියදී කිසිදු අධිකාරී බලයකින් තොරව එකී විභාගය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විභාග අංශය මගින් පැවැත්වීමට වැඩබලන ලේකම්වරයා විසින් බලය ලබාදී තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් අනුව අමාත්‍යාංශයේ විභාග අංශය මගින් මෙම විභාගය විනිවිදභාවයකින් හා මනා අභ්‍යන්තර පාලනයකින් යුතුව සිදු කර නොතිබුණු බව අනාවරණය විය.

- කුසලතා ඇති ස්වාධීන මණ්ඩලයක් විසින් ප්‍රශ්න පත්‍ර පිළියෙල නොකිරීම
- ප්‍රශ්න පත්‍ර රාජකාරිවල රහස්‍යභාවය ආරක්ෂා නොකිරීම
- පිළිතුරුපත් ඇගයීම් කළ හා ප්‍රශ්න පත්‍ර පරිවර්තන කටයුතු සිදු කළ නිලධාරීන් විසින් ගෞරව බහුමාන සහතික අත්සන් නොකිරීම
- අමාත්‍යාංශ විභාග අංශයේ ආරක්ෂිත කැමරා පද්ධතිය නිසි අයුරින් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම
- අභියෝගතා පිළිතුරු පත්‍රය ඇගයීම අමාත්‍යාංශයේ ඉහළ කළමනාකරණයේ නිලධාරීන් විසින් සිදුකර තිබීම
- එම ඇගයීම් අධීක්ෂණ කටයුතු සිදුකළ යුතු අධ්‍යක්ෂ (විභාග) හා පරිපාලන නිලධාරී (විභාග) පිළිතුරු පත්‍ර ඇගයීමේ රාජකාරිවල නිරතවී තිබීම.

පිළිතුරු පත්‍ර ඇගයීම් කළ නිලධාරීන් විසින් නැවත වතාවක් පිළිතුරු පත්‍ර ඇගයීමට භාජනය කර නොතිබීම හා පිළිතුරු පත්‍ර වෙනත් අධීක්ෂකවරයකු විසින් නැවත පරීක්ෂා කර නොතිබීම, අයදුම්කරුවන් විසින් සපයා ඇති අවිනිශ්චිත පිළිතුරු සම්බන්ධයෙන් පිළිතුරුපත් අධීක්ෂක කමිටුවක් විසින් සාකච්ඡාවට භාජනය නොකිරීම වැනි කරුණු හේතුවෙන් පිළිතුරු පත්‍ර ඇගයීමේ වැරදි අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයෙන් අනතුරුව නැවත ප්‍රශ්නපත්‍ර පරීක්ෂා කිරීමේදී මුල් අවස්ථාවේ පත්වීමට සුදුසුකම් ලබා සිටි අයදුම්කරුවන් 54 ක් ඉන්

ඉවත්වී සුදුසුකම් ලබා නොසිටි අයදුම්කරුවන් සුදුස්සන් බවට පත්වී තිබුණි.

### සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සඳහන් මුළු පිරිවැය රු.මිලියන 121,956 ක් වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 13 ක් අතරින් මුළු පිරිවැය රු.මිලියන 5,130 ක් වූ කරාපිටිය හෙල්මට්කොල් මාතෘ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී අවසන් කළ යුතුව තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එය අවසන් කර නොතිබුණි. තවද, මුළු පිරිවැය රු.මිලියන 37,529 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 4 ක් සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත සියයට 100 ක භෞතික ප්‍රගතිය ළඟා කරගෙන නොතිබුණි. එම ව්‍යාපෘති 4 පිළිබඳ විස්තර වගුව 22 හි දැක්වේ.

| ව්‍යාපෘතිය | මුළු පිරිවැය | ළඟා කරගත් භෞතික ප්‍රගතිය |
|---|---|---|
| | රු.මිලියන | සියයට |
| අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 5,979 | 60 |
| උතුරු පළාතේ රෝහල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - (DRIVE) (ශ්‍රී ලංකා රජය - නෙදර්ලන්තය) | 14,065 | 90 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබාදීමේ ව්‍යාපෘතිය | 7,960 | 85 |
| සියලු අංගයන්ගෙන් යුත් දිස්ත්‍රික් මට්ටමින් ආඝාත මධ්‍යස්ථාන දහයක් ඉදිකිරීම සහ එම රෝහල්වල හදිසි අනතුරු ප්‍රතිකාර හා සේවා පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 9,525 | 53 |

වගුව 22 - අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟා කර නොගත් ව්‍යාපෘති
මූලාශ්‍රය - .................. (සඳහන් කරන්න)

ඊට අමතරව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 696 ක් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ජාතික රෝහල හා දකුණු කොළඹ ශික්ෂණ රෝහල වෙත ලබාදී තිබුණි. එම ව්‍යාපෘති 50 ක් අතරින් ව්‍යාපෘති 8 ක් අවලංගු කර තිබුණු අතර ඉතිරි ව්‍යාපෘති 42 ක් ආරම්භ කර හෝ නොතිබුණි.

තවද ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේදී සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂා කර තිබුණු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 4,098 ක් වූ ව්‍යාපෘති 8 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

### වෛද්‍යවරුන්ගෙන් හා හෙද සිසුන්ගෙන් රජයට අයවිය යුතු මුදල්

පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම, සේවයට වාර්තා කිරීමෙන් පසු අනිවාර්ය සේවා කාලය රජයට සේවය ලබා නොදීම හා රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම ආදී කරුණු හේතුවෙන් රජය සමඟ අත්සන් කළ ගිවිසුම් බැඳුම්කර කඩකළ වෛද්‍යවරුන් 95 දෙනෙකුගෙන් රු.මිලියන 81.91 ක් රජයට

අය විය යුතුව තිබුණි. සේවය හැර ගිය වෛද්‍යවරුන් 107 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබුණු මුදල් පිළිබඳ නිවැරදි තොරතුරු වාර්තා ගත කර නොතිබුණි.

අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු පාසල් 16 කින් ලබාගත් තොරතුරු අනුව, 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 18 ක කාලපරිච්ඡේදය තුළ බඳවාගෙන තිබුණු හෙද සිසුන් අතරින් පුහුණුව හැර ගිය සිසුන් සංඛ්‍යාව 861 දෙනෙක් වී තිබුණි. ඉන් සිසුන් 706 දෙනෙකුගෙන් අයකර ගත යුතු මුළු මුදල රු.මිලියන 281.99 ක් විය. නමුත් විගණනයට වරින්වර ඉදිරිපත්වී තිබුණු තොරතුරු අනුව මෙම කාලය තුළ පුහුණුව අතහැර ගිය හෙද සිසුන් සංඛ්‍යාව 1,000 දෙනෙකුට වඩා වැඩි බවත්, ඔවුන්ගෙන් අයවිය යුතු මුදල රු.මිලියන 325.33 ක් පමණ වන බවත් තහවුරු විය. මේ අනුව පුහුණුව හැර ගිය සිසුන් සංඛ්‍යාව හා අයකර ගත යුතු මුදල් පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි.

### කොන්ත්‍රාත් පරිපාලනය

- ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 35 ක් වූ රයිගම වතු රෝහල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, රු.මිලියන 24.91 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට ඉදිකිරීම සඳහා 2016 සැප්තැම්බර් 14 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 5.53 ක් 2016 නොවැම්බර් 04 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. නමුත් ඉදිකිරීමට යෝජිත ඉඩම රජයට පවරා ගැනීමෙන් තොරව, ඉඩම පිළිබඳ ශාක්‍යතා අධ්‍යයනයක් හා පාංශු පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරනු ලබන යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම හේතු මත වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවී තිබුණු අතර ඒ හේතුවෙන් ඇතිවී තිබුණු මිල වැඩිවීම් හා අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 7.7 කින් වැඩිකිරීමට සිදු වී තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් 2017 දෙසැම්බර් 13 දින හා 2018 ජුනි 05 දින ඉදිරිපත් කරන ලද අන්තර් බිල්පත් 2 ක් සඳහා ගෙවීම් කිරීමට අමාත්‍යාංශය විසින් කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල වෙත 2018 මාර්තු 29 දින හා 2019 පෙබරවාරි 15 දින ඉදිරිපත් කර තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 5.21 ක් නොගෙවා එම මුදල් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2017 නොවැම්බර් 11 දින සිට ඉදිකිරීම් කටයුතු අතහැර තිබුණි. එම බිල්පත් සඳහා ගෙවීම් ප්‍රමාද කිරීම පදනම් කර ගෙන කොන්ත්‍රාත් ගිවිසුම අන්‍යොන්‍යය එකගතාවයෙන් අවසන් කිරීමේ යෝජනාවක් කොන්ත්‍රාත්කරු විසින් 2018 මැයි 06 දින ඉදිරිපත් කර තිබුණි. වර්ෂ 01 මාස 07 කට පසුව 2019 දෙසැම්බර් 30 දින ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.මිලියන 1.24 ක කාර්යසාධන බැඳුම්කරය හා රු.මිලියන 5.53 ක අත්තිකාරම් බැඳුම්කරය පිළිවෙලින් 2018 ජුනි 07 දින හා 2018 සැප්තැම්බර් 01 දින කල් ඉකුත් වී තිබුණි.

මෙම රෝහල ඉදිකිරීමේ කටයුතු 2017 නොවැම්බර් 11 දින සිට අතහැර තිබුණු අතර මේ වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 12.6 ක් වී තිබුණි.

- **2017 වර්ෂයේදී මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 2,825.44 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් පෞද්ගලික සමාගමක් වෙත පිරිනමා තිබුණත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අසමත් වීම හේතුවෙන් එම කොන්ත්‍රාත් 7 හි ගිවිසුම් 2019 සැප්තැම්බර් 23 දින වන විට අවලංගු කර තිබුණි. 2020 සැප්තැම්බර් 01 දින වන විටත් ඉන් කොන්ත්‍රාත් 03 ක් සඳහා රු.මිලියන 138.2 ක අත්තිකාරම් ගෙවා තිබුණත්, එම මුදල් අයකර ගෙන නොතිබුණි. එම කොන්ත්‍රාත් 3 ට අදාළව ඉදිරිපත් කර තිබුණු රු.මිලියන 168.82 ක අත්තිකාරම් බැඳුම්කරවල වලංගු කාලය 2019 අගෝස්තු 03 දින වන විට කල් ඉකුත් වී තිබුණි. එසේම මෙම කොන්ත්‍රාත් 7 හි ඉතිරි වැඩ කොටස් 2020 සැප්තැම්බර් 01 දින වන විටත් ආරම්භකර නොතිබුණි.**

## බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව, රාජ්‍ය ආයතන විසින් කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් වෙත ගෙවනු ලබන එකතු කළ අගය මත බදු (VAT) පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතුව තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සක්‍රීය බදු ගෙවන්නෙක්ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව හා එකතු කළ අගය මත බදු පනතේ 20(1) හා 20(2) වගන්ති ප්‍රකාරව අනුක්‍රමික අංකයක් සහිත විධිමත් බදු ඉන්වොයිසියක් ලබා නොගෙන බදු මුදල් ගෙවා තිබුණි. මේ හේතුවෙන්, 2018 හා 2019 වර්ෂවලදී අමාත්‍යාංශය හා ත්‍රිපෝෂ ආයතනය විසින් සැපයුම්කරුවන් 32 දෙනෙකු වෙත අවස්ථා 162 කදී ගෙවා තිබුණු රු.මිලියන 274.670 ක එකතු කළ අගය මත බදු (VAT) හා අමාත්‍යාංශය විසින් 2016 ජූලි 07 දින සිට 2019 ජූනි 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත ගෙවා තිබුණු රු.මිලියන114.59 ක එකතු කළ අගය මත බදු (VAT) අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.**

## අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම

**ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 12 කට අදාළව අනුමත සංඛ්‍යාව ඉක්මවා 328 දෙනෙකුද, තෘතියික මට්ටමට අයත් තනතුරු 4 කට අනුමත සංඛ්‍යාව ඉක්මවා 8 දෙනෙකුද, ද්විතියික මට්ටමේ තනතුරු 36 කට අදාළව අනුමත සඛ්‍යාව ඉක්මවා 340 දෙනෙකුද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 22 කට අනුමත සංඛ්‍යාව ඉක්මවා 3,058 දෙනෙකුද, සේවයේ යොදවා තිබුණි. තවද අදාළ සේවා ස්ථානවලට අනුමත නොවූ තනතුරු 62 කට අදාළව 2,656 දෙනෙකුද සේවයේ යොදවා තිබුණි. ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක තනතුරට කොන්ත්‍රාත්, තාවකාලික හා අනියම් පදනමින් බඳවාගත් සේවකයින් 1,946 ක් ද ඒ තුළ ඇතුළත් විය.**

## අනුමත ප්‍රතිපාදනය ඉක්මවා වියදම් කිරීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 වර්ෂය සඳහා වැය විෂයයන් 9 ක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 87,608.73 ක ප්‍රතිපාදන සලසා තිබුණි. විධිමත් පරිදි ප්‍රතිපාදන සලසා නොගෙන එම ප්‍රතිපාදනය රු.මිලියන 966.16 කින් ඉක්මවා රු.මිලියන 88,574.89 ක් වැය කර තිබුණි. එමෙන්ම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉහත සඳහන් වැය විෂයයන් වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියන 1,923.53 ක බැරකම්වලටද එළඹ තිබුණි.

## රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

රෝහල්වල සනීපාරක්ෂාව හා බෝවන රෝග පාලනය කිරීමට රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය නිසි කළමනාකරණය අත්‍යාවශ්‍ය සාධකයක් වී තිබුණි. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පනවන ලද රෙගුලාසි ප්‍රකාරව, සියළු සායනික අපද්‍රව්‍ය උපද්‍රවකාරී අපද්‍රව්‍ය වන අතර එවැනි අපද්‍රව්‍ය උත්පාදනය වී පැය 48 ක් ඇතුළත ජීවානුහරණය කර බැහැර කිරීම කළ යුතු වේ. සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා Meta Mizer යන්ත්‍ර 20 ක් හා Incinerator යන්ත්‍ර 15 ක් සපයා සවිකර වර්ෂ 5 ක කාලයක් නඩත්තු කිරීම සඳහා එ.ජ ඩොලර් මිලියන 21.11 ක් හෙවත් රු.මිලියන 452.25 ක් වූ ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය දිවයිනේ සියළුම පළාත් ආවරණය කරමින් පොකුරු 06 කට වෙන් කරන ලද රජයේ රෝහල් 134 ක සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීමට සැලසුම් කර තිබුණි.

නමුත් සැපයීමට යෝජිත Incinerator යන්ත්‍ර 15 ක් වෙනුවට යන්ත්‍ර 05 ක් දක්වා අඩුකර, යන්ත්‍ර සඳහා ගිවිසුම්ගත එ.ජ ඩොලර් මිලියන 18.45 ක්වූ වටිනාකම එ.ජ ඩොලර් මිලියන 16.19 ක් දක්වා අඩුකර තිබුණු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් ගාස්තුව (Operating fee) වෙනස් කර නොතිබුණි.

අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය, සංවර්ධන අංශය හා පාරිසරික අංශය යන අංශ තුනෙහිම නිලධාරීන් හා අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත්ව එළඹ තිබුණු මෙම ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘති ගිවිසුම 2013 වර්ෂයේදී අත්සන් කර තිබුණි. එම ව්‍යාපෘතිය මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි රෝහල් 134 ක් පොකුරු 06 කට බෙදා වෙන්කර එම එක් එක් පොකුරෙහි සායනික අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකිව තිබුණි. 2014 වර්ෂයේදී අමාත්‍යාංශ නිලධාරීන් විසින් බස්නාහිර, දකුණ හා මධ්‍යම පළාත්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට වෙනත් පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘතියට වාසිදායක වන අයුරින් කටයුතු කර තිබුණි. ඒ අනුව ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන බස්නාහිර, දකුණ හා මධ්‍යම පළාත්වල ස්ථාපිත කිරීමට ගිවිසගෙන තිබුණු Meta Mizer යන්ත්‍ර 10 ක් හා Incinerator යන්ත්‍ර 08 ක් එම ව්‍යාපෘතියෙන් ඉවත් කර එම පළාත් 03 හි සායනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට එම පෞද්ගලික සමාගමට ඉඩකඩ සැලසෙන පරිදි කටයුතු කර තිබුණි.

අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් සෘජුව හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධ වී බස්නාහිර, මධ්‍යම හා දකුණු පළාත්වල සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනත් පෞද්ගලික සමාගමකට ලබාදීමේ අරමුණින් කටයුතු කරමින් හා එම සමාගමට

වාසිදායක වන ලෙස වාණිජ ගිවිසුමකට එළඹීමටත්, ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතියේ විෂය පථයෙන් සියයට 50 කට වඩා ආවරණය වූ පළාත් 03 ක වෙනස් කිරීමෙන් පොකුරු සැලැස්ම අඩාල කිරීමටත්, උතුරු, නැගෙනහිර, උතුරු මැද, වයඹ, සබරගමුව හා ඌව පළාත්වල පමණක් සායනික අපද්‍රව්‍ය සම්බන්ධ කටයුතු කිරීමට ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘති ගිවිසුම සංශෝධනය කරවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය මගින් ලබා ගෙන තිබුණු ණය වාරික හා පොලී ගෙවීමට අමතරව ඉහත පළාත් 03 හි පිහිටි විගණන පරීක්ෂාවට ලක්කළ රෝහල් 21 ක සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුළදී එම පෞද්ගලික සමාගමට සහ වෙනත් ආයතන වෙත ගෙවීමට සිදුවී තිබුණු මුළු මුදල රු. මිලියන 384.12 ක් වූ අතර එය රජයට අමතර වැය බරක් වී තිබුණි.

මෙම තත්ත්වය තුළ ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය යටතේ සායනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ අරමුණ ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය යටතේ සපයා තිබුණු Meta Mizer යන්ත්‍ර හා Incinerator යන්ත්‍ර පිරිවිතරවල සඳහන් ධාරිතාවයෙන් ක්‍රියාත්මක වී නොතිබුණු අතර යන්ත්‍රවලින් බැහැරවන ද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීමට සුදුසු තත්ත්වයට පත්ව ඇති බවට ස්වාධීන පරීක්ෂණයක් මගින් තහවුරු කරද නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වූ රෝහල් කිහිපයක සායනික අපද්‍රව්‍ය එක් ස්ථානයකදී අපහරණය කිරීමේ ක්‍රියාවලිය (Cluster System) මුළුමනින්ම අසාර්ථක වී තිබුණි. තවද මෙම යන්ත්‍ර මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය විධිමත් පරිදි පළාත් පාලන අධිකාරීන් හරහා බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් දිවයින පුරා ක්‍රියාත්මක කර නොතිබුණි.

### වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම

වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව කිසිම වෛද්‍ය සැපයීමක් මිලදී නොගත යුතු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට භාවිතයේ පවතින වෛද්‍ය සැපයීම් අයිතම 20,698 ක් අතරින් ඖෂධ අයිතම 483 ක්, ශල්‍ය ද්‍රව්‍ය අයිතම 4,611ක් හා රසායනාගාර ද්‍රව්‍ය අයිතම 2,043 ක් වශයෙන් මුළු අයිතම 7,137ක් හෙවත් සියයට 34 ක් වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිතා කරමින් පැවතුණි.

වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිතා කරන වෛද්‍ය සැපයීම් අයිතම 190 ක් 2019 වර්ෂය වෙනුවෙන් ඇණවුම් කර තිබුණු අතර ඒ සඳහා 2020 ජූලි 09 දින වන විට රු.මිලියන 1,711.21 ක් ගෙවා තිබුණි. එසේම 2020 ජුනි 29 දින වන විට 2020 හා 2021 වර්ෂ සඳහා වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිතා කරන ඖෂධ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.මිලියන 3,507.28 ක් හා රු.මිලියන 564.79 ක් වූ ඇණවුම් නිකුත් කර තිබුණි.

### Coronary stent bare metal ශල්‍ය අයිතමය කල් ඉකුත්වීම

2012 වර්ෂයේ ඖෂධ ප්‍රසම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ඖෂධයක, ශල්‍ය අයිතමයක හෝ වෙනත් වෛද්‍ය සැපයීමක ඉල්ලුම වෙනස් වන්නේ නම් හෝ සෙමින් චලනය වන (Non-moving/Slow moving) අයිතමයක් වන්නේ

නම් ඒ පිළිබඳව වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර (Formulary Revision Committee) එම අයිතමය භාවිතයෙන් ඉවත් කරන්නේද නැද්ද යන්න තීරණය කළ යුතුව තිබුණි. එසේම නව තාක්ෂණය හේතුවෙන් සිදුවන ඉල්ලුමේ වෙනස්වීම් සඳහා කාලීනව පිරිවිතර වෙනස් කිරීමටත්, ඒ සඳහා ස්වාධීන පිරිවිතර පාලන අංශයක් පිහිටුවීමටත්, වට්ටෝරු සමාලෝචන කමිටු නියමිත කාලයට රැස් කිරීමටත්, පිරිවිතර වෙනස්වීම මත ඇතිවන තොග අතිරික්තවීම් හා තොග කල්ඉකුත්වීම් වැළැක්වීමටත්, එමගින් නවීන තාක්ෂණය තුළ ඉල්ලුමේ සිදුවන අඩු වැඩි වීම් පිළිබඳ ක්ෂණිකව හඳුනාගෙන අදාළ ඇණවුම් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමටත් හැකියාව තිබුණි. ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 44.84 ක් වූ හදවත් රෝග ආශ්‍රිත ශල්‍ය කර්ම සඳහා භාවිතා කරනු ලබන coronary Stent bare metal ශල්‍ය අයිතමයන් 2019 වර්ෂයේ හා 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළදී කල් ඉකුත්වී තිබුණි.

## Depogestin I ඖෂධය තත්ත්වයෙන් අසමත්වීම හා කල්ඉකුත්වීම

ගැබ් ගැනීම වළක්වන ඖෂධයක් ලෙස නිරෝගී කාන්තාවන්ට ලබා දෙන Depogestin I (Depot Medroxy Progesterone Acetate) ඖෂධයෙන් ඒකක 1,200,000 ක් මිලදී ගැනීමට 2011 මාර්තු 30 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ගැනුම් අධියාචනාවක් නිකුත් කර තිබුණි.

මීට පෙර අවස්ථාවන්හිදී ද වෙනත් සැපයුම්කරුවන් විසින් සපයන ලද මෙම ඖෂධය භාවිතා කිරීමෙන් පුද්ගල මරණ ඇතුළුව විවිධ සංකූලතාවයන් ඇතිවී තිබුණු බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයකු විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිව දැනුවත් කර තිබුණි. නමුත් ඒ පිළිබඳව හෝ ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කරන ලද තාක්ෂණික පිරිවිතර තුළ ඇතුළත්ව තිබුණු ඇණවුම් කොන්දේසි පිළිබඳව සැලකිල්ලට නොගෙන, ප්‍රතිචාරාත්මක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුට මුළු වටිනාකම රු.මිලියන 87.03 ක් වූ ඇණවුම ප්‍රදානය කිරීම සඳහා 2011 නොවැම්බර් 21 දින රැස්වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණි.

පළමු ඒකක 600,000 ක තොගය 2012 මාර්තු 13 දින වරායෙන් නිෂ්කාශනය කර තිබුණු අතර තොගය බෙදාහැරීමෙන් පසු පළමු සතිය තුළදීම එම ඖෂධය භාවිතා කිරීම නිසා දැඩි අසංරක්ෂිත ප්‍රතික්‍රියා (severe anaphylactic reaction) සිදුවූ බව වාර්තාවී තිබුණි. ඒ හේතුවෙන් එම නිෂ්පාදන කාණ්ඩය භාවිතයෙන් ඉවත් කිරීමටත් (withdraw) ඉතිරි 600,000 ක තොගයේ ප්‍රසම්පාදනය නැවැත්වීමටත්, ජාත්‍යන්තරව පිළිගත් නිෂ්පාදනයක් ලබාදීම සිදුකරන ලෙසත් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය ලේකම් වෙත නිර්දේශ කර තිබුණි.

මෙම ඇණවුමට හා මීට පෙර ඇණවුමකට අදාළව තත්ත්වයෙන් අසමත්වීම මත භාවිතයෙන් ඉවත් කරන ලද ඒකක 1,131,800 ක් වෙනුවෙන් සිදු වූ අලාභය වූ රු.මිලියන 96.4 වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අයකර තිබුණද, ඉන් රු.මිලියන 60.4 ක් සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ගෙවීම පැහැර හැර තිබුණි. ඒ හේතුවෙන් 2016 ඔක්තෝබර් 17 දින අදාළ සැපයුම්කරු සමඟ ගනුදෙනු කිරීම අත්හිටුවීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තීරණය කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 01 දින වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.

2012 දෙසැම්බර් 12 දින රැස්වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ (Good Manufacturing Product)) වාර්තාව මත තාක්ෂණික උපදේශක කමිටුවේ තීරණය ලබා ගැනීමට නිර්දේශ කර තිබියදී ඒ අනුව කටයුතු නොකර 2013 අප්‍රේල් 02 දින රැස්වූ ප්‍රසම්පාදන B කමිටුව විසින් සියළු කරුණු සලකා බැලූ බවට සඳහන් කරමින් ඇණවුමේ ඉතිරි ඒකක 600,000 ගෙන්වීම අවලංගු කිරීමේ තීරණය සැපයුම්කරුගේ විරෝධය හමුවේ ඉවත් කරගෙන එම සැපයුම්කරුටම ඉතිරි ඒකක 600,000 සඳහා වූ ඇණවුම ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. එහිදී රෝගී ජීවිත අවදානමට ලක්කරමින් ඖෂධ ප්‍රසම්පාදනයේ මූලික අරමුණ වූ නිරෝගී කාන්තාවන් සඳහා ලබා දෙන මෙම එන්නතෙහි ගුණාත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂ බව (quality, safety, efficacy) පිළිබඳව තාක්ෂණික ඇගයීමේදී සැලකිල්ලට නොගෙන මෙම ඖෂධය නැවත පණගැන්වීමේ පහසුකම් සහිත (resuscitation facilities) රෝහල් වෙත නිකුත් කිරීමටත් සමීප අධීක්ෂණයක් පවත්වා ගැනීමටත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව 2013 අප්‍රේල් 02 දින අනුමැතිය ලබා දී තිබුණි.

දෙවනුව ඇණවුම් කළ ඒකක 600,000 ක තොගය 2013 අගෝස්තු 05 දින පවුල් සෞඛ්‍ය කාර්යාංශයට ලැබී තිබුණි. නමුත් මෙම ඖෂධයේ පැවති ව්‍යාකූලත්වය පිළිබඳව 2012 සැප්තැම්බර් 18 හා 19 යන දිනයන්හි සිදු කර තිබුණු යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ නිරීක්ෂණ (GMP Inspection Report) වාර්තාවෙන්ද, 2014 සැප්තැම්බර් 09 දිනැති පවුල් සෞඛ්‍ය ජාතික කමිටුවේ 16 වන රැස්වීමේදීද, 2016 ජනවාරි 22 දිනැති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ තුන්වන ආරක්ෂිත හා අවදානම් ඇගයීම් උප කමිටු (Safety & Risk Evaluation sub committee) රැස්වීමේදීද සහ 2018 අප්‍රේල් 24 දිනැති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 25 වන ඖෂධ ඇගයීම් කමිටු රැස්වීමේදීද මෙම ඖෂධය භාවිතයෙන් ඉවත් කිරීමට දැනුම් දී තිබුණි.

අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම තොගය කල් ඉකුත් වීමට පෙර, තත්ත්වයෙන් අසමත් කළ බව දැක්වෙන චක්‍රලේඛය නිකුත් කිරීම හිතාමතා හෝ නොසැලකිලිමත් ලෙස පැහැර හැර තිබුණි. 2018 ජූනි මාසයේදී පවුල් සෞඛ්‍ය කාර්යාංශය තුළදීම බෙදා නොහැර මෙම තොගය කල් ඉකුත් වීමෙන් මාස 14 ක කාල ප්‍රමාදයකින් යුතුව වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක විසින් 2019 ජූනි 17 දිනැති චක්‍රලේඛය නිකුත් කරමින් මුළු නිෂ්පාදනයම භාවිතයෙන් ඉවත් කර තිබුණි. මේ හේතුවෙන් සැපයුම්කරුගෙන් අදාළ පාඩුව අයකිරීමේ හැකියාව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට අහිමි වී තිබුණි. මෙම මිලදී ගැනීම තුළින් රජයට සිදුවූ පාඩුව රු.මිලියන 91 ඉක්මවා තිබුණි.

## ත්‍රිපෝෂ නිෂ්පාදනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ගැබිණියන්, කිරි දෙන මව්වරුන් හා ළදරුවන්ට නොමිලයේ නිකුත් කිරීමේ අරමුණින් 2017, 2018 හා 2019 වර්ෂ තුන තුළදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 12,239 ක්, මෙට්‍රික් ටොන් 11,913 ක් හා මෙට්‍රික් ටොන් 11,712 ක් වශයෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 2.66 කින් හා 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට1.68 කින් ත්‍රිපෝෂ නිෂ්පාදනය අඩු කර තිබුණි. එසේ වුවද, වාණිජ පරමාර්ථයෙන් වෙළඳපලට හඳුන්වා දී තිබුණු සුපෝෂ නිෂ්පාදනය එම වර්ෂ 03 තුළදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1, 230 ක්, මෙට්‍රික් ටොන් 2,610 ක් හා මෙට්‍රික් ටොන් 3,717 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට

සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 112.19 කින් හා 2019 වර්ෂයේදී සියයට 42.41 කින් සුපෝෂ නිෂ්පාදනය වැඩි කර තිබුණි. ඒ අනුව සමාජ සුභසාධන පරමාර්ථය යටපත්වී වාණිජ පරමාර්ථය ඉස්මතුවී තිබුණු බව නිරීක්ෂණය විය.

## ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරිම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය සියළු අමුද්‍රව්‍ය වියදම් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වෙත ලබා දී තිබුණි. ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත් කරන අපතය විකිණීමෙන් ලබන ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ අපතය විකිණීමෙන් රු.මිලියන 23.84 ක ආදායම් රැස්කර තිබුණත්, එම ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ වර්ෂ 09 ක කාලපරිච්ඡේදය තුළදී එසේ රු.මිලියන 139.91 ක ආදායම් රැස්කර තිබුණත්, එම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

## කිරිපිටි සඳහා ගෙවීම් කිරීම

අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කිරිපිටි මිල්කෝ පුද්ගලික සමාගම වෙතින් පමණක් මිලදී ගෙන තිබුණි. ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් 2017, 2018 සහ 2019 වර්ෂවල දී කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා පිළිවෙළින් රු.810 ක්, රු.798 ක් හා රු.800 ක් වශයෙන් මිල්කෝ පුද්ගලික සමාගම වෙත ගෙවා තිබුණි. එසේ වුවද, එම වර්ෂ 03 හි දීම මිල්කෝ පුද්ගලික සමාගම විසින් ත්‍රිපෝෂ සමාගමේ අලෙවි සැලට සමාගමේ නියෝජිතයකු මඟින් කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් රු.690 කට සපයා තිබුණි. ඒ අනුව මිල්කෝ පුද්ගලික සමාගමෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් රු.690 කට මිලදී ගත හැකිව තිබියදී ඒ වෙනුවට එම වර්ෂ 03 හිදී කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 කට පිළිවෙලින් රු.120 ක්, රු.108 ක් හා රු.110 ක් වශයෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි. ඒ අනුව අදාළ වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 77.76 ක්, රු.මිලියන 64.80 ක් හා රු.මිලියන 66 .00 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## සැලැසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු නොකිරිම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් 2018/2019 කාල පරිච්ඡේදය සඳහා බඩ ඉරිඟු අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 12,000 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2018 මැයි 23 දින ආරම්භ කර තිබුණි. ඊට මාස 08 කට පසුව එනම් 2019 ජනවාරි 22 දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, බඩ ඉරිඟු කිලෝ ග්‍රෑම් 1 ක් රු.55.90 බැගින් සපයා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2018 මැයි 23 දින සිට 2019 ජනවාරි 22 දින දක්වා මාස 08 ක කාලපරිච්ඡේදය තුළ අවස්ථා 04 කදී, බඩ ඉරිඟු අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 12,000 කින්, මෙට්‍රික් ටොන් 3,100 ක් රු.59.50 බැගින්ද, මෙට්‍රික් ටොන් 2,775 ක් රු.59 බැගින්ද, මෙට්‍රික් ටොන් 1,250 ක් රු.58.50 බැගින්ද හා මෙට්‍රික් ටොන් 1,875 ක් රු.66 බැගින්ද වශයෙන් එකතුව මෙට්‍රික් ටොන් 9,000 ක් තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි සැලැසුමකට අනුව සිදු නොකිරීම හේතුවෙන් බඩ ඉරිඟු මිලදී ගැනීම සඳහා රු.මිලියන 41.95 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## අමාත්‍ය මණ්ඩලයේ තීරණයට පටහැනිව කටයුතු කිරීම

2014 වර්ෂයේදී ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වර්ෂ 5 ක අනිවාර්යය සේවා කාලයකට යටත්ව ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 308 දෙනෙකු 2014 ඔක්තෝබර් 01 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, බස්නාහිර, මධ්‍යම හා සබරගමු පළාත් සඳහා එම වෛද්‍යවරු අනුයුක්ත නොකළ යුතුව තිබුණි. නමුත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දින වන විට ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහකාර නිලධාරීන් 285 දෙනෙකුගෙන් නිලධාරීන් 164 දෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව බස්නාහිර, මධ්‍යම හා සබරගමු පළාත්වලට අනුයුක්ත කර තිබුණි.

## වකුගඩු නිවාරණයට අදාළව රාජකාරී පැවරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු වකුගඩු නිවාරණ වැඩසටහන සඳහා 2018 හා 2019 වර්ෂවලදී වැටුප් හා දීමනා වශයෙන් පිළිවෙලින් රු.මිලියන 197.28 ක් හා රු.මිලියන 228.22 ක් ගෙවා තිබුණි. නමුත්, මෙම නිලධාරීන් වෙත වකුගඩු රෝග නිවාරණයට අදාළව රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. තවද, 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 5 ක කාලපරිච්ඡේදය තුළදී වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් මෙම නිලධාරීන් ඵලදායීව දායක කර ගැනීමට, ප්‍රගතිය සමාලෝචනය කිරීමට හා කාර්යසාධන ඇගයීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## රෝගී සත්කාරක සේවාවන්ට බාධාකාරීවීම

බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ පවතින කණිෂ්ඨ කාර්යය මණ්ඩල ඌනතාවය රෝගී සත්කාරක සේවාවන්ට බාධාවක්ව පැවතුණි. කණිෂ්ඨ කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හඳුන්වාදී නොතිබුණි. එම හේතුවෙන් සේවකයින්ගේ අත්‍යාවශ්‍ය සේවය නොසලකා හරිමින් ඔවුන්ගේ අභිමතය පරිදි නිවාඩු ලබාගෙන තිබුණි.

## බෝනොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය

බෝනොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය පිළිබඳ පර්යේෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා සෘජුවම දායක කර ගත යුතු කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණි. ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එම තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර හා අවශ්‍ය විද්‍යාගාර පහසුකම්ද සම්පූර්ණ කර නොතිබුණි. 2013, 2014 හා 2015 වර්ෂවලදී එකතුව රු.මිලියන 164.96 ක් වැය කර පර්යේෂණ උපකරණ මිලදී ගෙන තිබුණි. එම උපකරණ නිෂ්කාර්යව පැවැතී තිබුණත්, 2016 වර්ෂයේදී රු.මිලියන 38.05 ක් වැය කර පර්යේෂණ උපකරණ මිලදී ගෙන තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම උපකරණවලින් රු.මිලියන 65.07 ක් වූ උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණු අතර, රු.මිලියන 137.94 ක් වූ උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

## පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිවයින පුරා සිටින සෑම පාරම්පරික

වෛද්‍යවරයෙකුම සතු දැනුම සංරක්ෂණය කිරීමට හා ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු විශ්ව කේන්ද්‍රයක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 23.55 ක් වැයකර එම ඒකකයට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. එම ඒකකයේ කටයුතු කරගෙන යාමට සෘජුවම අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයභාර නිලධාරි, වැඩසටහන් නිෂ්පාදක, තාක්ෂණ නිලධාරි, වීඩියෝ සංස්කාරක, ශබ්ද සංස්කාරක හා සහායක, පරිගණක ක්‍රියාකරු යන තනතුරු 07 ක් සහ කැමරා ශිල්පී තනතුරු 03 ක් 2020 අගෝස්තු 31 දින වන විටත් අනුමත කර ගෙන බඳවාගෙන නොතිබුණු බැවින් අදාළ උපකරණ නිෂ්කාර්යව පැවතිණි.

## බොරැල්ල ආයුර්වේද රෝහලේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම

බොරැල්ල ආයුර්වේද රෝහලේ නව ගොඩනැගිල්ල රු.මිලියන 1,164.13 ක් වැය කර ඉදිකර 2018 දෙසැම්බර් 31 දින වන විට ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. එම ගොඩනැගිල්ල පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉදිකිරීමේ සැලැසුම්වලට හා ඉංජිනේරු ඇස්තමේන්තුවට ප්‍රධාන ජල ටැංකිය (water sump) හා පල්දෝරු පද්ධතිය ඇතුළත් කර නොතිබුණු බැවින්, එම අයිතම දෙක සම්පූර්ණ නොකිරීම නිසා 2020 මාර්තු 31 දින වන විටත් ගොඩනැගිල්ල උපයෝජනය කර නොතිබුණි.

- මුළු පිරිවැය රු.මිලියන 7.37 ක් වූ රූපවාහිනී යන්ත්‍ර 200 ක්, වතුර රත් කරන ගීසර් (water geezers) 108 ක් හා වායු සමීකරණ යන්ත්‍ර 161 ක් සවිකර තිබුණු නමුත් ඒවායේ වගකීම් කාලය ඉකුත් වන විටත් ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, නියමිත කාලය තුළදී කොන්ත්‍රාත්කරුගෙන් වැඩ ඉටුකරවා ගෙන නොතිබුණි. ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට හැකිවන පරිදි 2015 වර්ෂයේ සිට ඒ ඒ වර්ෂ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු බිල්පත් නියමිත කාලය තුළදී ගෙවීම් කිරීමට අපොහොසත්වී තිබුණි. බිල්පත් සඳහා ගෙවීම් කිරීම ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 27.91 ක ප්‍රමාද ගාස්තු සඳහා ඉල්ලීම් කර තිබුණි.

## විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට, දත්ත Scan කිරීමට, සමාජ මාධ්‍යගතකරණයට හා කාර්යමණ්ඩල දීමනා ආදිය සඳහා 2016 වර්සෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 21.5 ක් වැය කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් මෙම පරිගණක පද්ධතිය භාවිතකර නොතිබුණු බැවින් ඒ සඳහා කරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද මෙම පද්ධතිය භාවිතයෙන් ඇඳ ඉහපත් හා රෝගී පරීක්ෂණ වාර්තා පරිශීලනය කර රෝග නිර්ණයන් සිදු කිරීමටත්, අදාළ තොරතුරු හා දත්ත පද්ධතිය තුළ ගබඩා කිරීමටත්, සායන රෝගී සත්කාර කටයුතු පවත්වා ගෙන යාමටත් 2018 ඔක්තෝබර් 03 දින රු.මිලියන 2.82 ක් වැය කර Laptop පරිගණක 25 ක් මිලදී ගෙන තිබුණි. එම පරිගණක 2020 ජුනි 30 දින වන විටත් අදාළ කාර්ය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

## Orthopedic ශල්‍යාගාරය සඳහා උපකරණ මිලදී ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ Orthopedic ශල්‍යාගාරය සඳහා Arthroscopy set with Full HD Camera System උපකරණයක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 1.5 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 12.96 කින් ඉක්මවා රු.මිලියන 14.46 කට එම උපකරණය මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. එසේම අනිවාර්ය අවශ්‍යතා ලෙස හඳුනාගෙන තිබුණු පිරිවිතරවලින් තොර උපකරණයක් මිලදී ගෙන තිබුණි. තවද, මෙම උපකරණයෙහි ඇතුළත් උපාංග ආනයනය කිරීම සඳහා අදාළ ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලබා ගෙන තිබුණු බලපත්‍ර 11 ක් ලංසු විවෘත කරන දිනය වන විට කල් ඉකුත් වී තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි C 23 ප්‍රකාරව, උපකරණ සැපයීමේ ප්‍රමාදවන සති එකකට කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට එකක් බැගින් රු.144,558 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## හෘද ශල්‍ය දැඩි සත්කාර ඒකකය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය විසින් 2018 ජූලි 06 දින රු.මිලියන 18.24 ක් වැයකර හෘද ශල්‍ය දැඩි සත්කාර ඒකකය සඳහා Maquet Servo වර්ගයේ Ventilator යන්ත්‍ර 02ක් මිලදී ගෙන තිබුණි .රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1හා 2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව, තෝරා ගත් ලංසුකරු අදාළ උපකරණය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබා ගෙන නොතිබුණු අතර තෝරාගත් ලංසුකරු දේශීය නියෝජිතයා ලෙස කටයුතු කිරීමට අධිකාරි බලයද ලබා ගෙනද නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.2 මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කරමින් එම ලංසුකරුට වාසිදායක වන අයුරින් පිරිවිතර සකස්කර තිබුණි. ඒ හේතුව මත අවම ලංසුව ප්‍රතික්ෂේප කර වැඩිම ලංසුව තෝරා ගැනීම නිසා මණ්ඩලය රු.මිලියන 12.3 ක අතිරේක වියදමක් සිදු කර තිබුණි. යන්ත්‍රය ක්‍රියාකරවීමට අවශ්‍ය පුහුණුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමු කර නොතිබුණු අතර, යන්ත්‍රය සඳහා EDI Catheters භාවිතා කරන්නේ නම් අමතර පිරිවැයක් දැරිය යුතු බවද තවදුරටත් අනාවරණය විය. මෙම යන්ත්‍ර මිලදී ගෙන වර්ෂයකට වැඩිකාලයක් ගතවී තිබුණද, ඒවා ඌන උපයෝජිතව පැවැතුණි.

## ඖෂධ මිලදී ගැනීම

- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2018 සහ 2019 වර්ෂවල අවස්ථා 14 කදී වෛද්‍ය සැපයීම් අංශය සඳහා රු.මිලියන 891.18 ක් වැය කර වෙළඳ නාමය Herticad නමින්වූ Trastuzumab injection 440mg with solvent in 20ml vials 8,945 ක් දේශීය වෙළඳපලේ එක් සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදන අවස්ථා 14 කින් අවස්ථා 13 ක ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 50 ක් ඉක්මවා තිබුණු බැවින්, තාක්ෂණික ඇගයීමට විශේෂඥ වෛද්‍යවරුන් 02 දෙනෙකු ඇතුළු 05 දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කළ යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සංස්ථාව

විසින් පත්කර තිබුණි. එම තාක්ෂණික ඇගයීම් කමිටුවට කිසිදු විශේෂඥ වෛද්‍යවරයෙකු පත්කරද නොතිබුණි.

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේද සභාපතිවරයා වූ සංස්ථාවේ සභාපතිවරයා විසින්, තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නමක් නිර්දේශ කර තිබීම පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටු 13 ක් සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ සහාය පමණක් ලබා ගෙන තිබුණි. එම විශේෂඥ වෛද්‍යවරයා විසින් ලබාදී තිබුණු නිර්දේශය පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව තම නිර්දේශය ඉදිරිපත් කර තිබුණි.

තාක්ෂණික ඇගයීම් කමිටුවට සහාය ලබා දෙන විශේෂඥ වෛද්‍යවරයාට, අදාළ ඖෂධය සම්බන්ධයෙන් පෙර අත්දැකීම් නොමැති වීම මත ලංසු ප්‍රතික්ෂේප කිරීමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් විධිවිධාන සැලසී නොතිබුණු අතර මෙම ප්‍රසම්පාදනයන් 14 කදී අදාළ විශේෂඥ වෛද්‍යවරයා විසින් අවම ලංසුකරුගේ නිෂ්පාදන පෙර භාවිතා කර නොතිබුණු බවට කරන ලද නිර්දේශය පදනම් කර ගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් අවම ලංසු ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් සංස්ථාවට රු.මිලියන 230.86 ක අතිරේක වියදමක් කිරීමට සිදු වී තිබුණි.

2018 අගෝස්තු 31 දිනැති ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය මගින් Trastuzumab injection 440mg ඖෂධ ඒකකයක් සඳහා රු.95,000 ක උපරිම පාලන මිලක් නියම කර තිබුණු නමුත් 2018 සැප්තැම්බර් 04 දින නිකුත් කර තිබුණු ගැනුම් ඇණවුමට අදාළ Trastuzumab ඖෂධ ඒකක 500 ක් සඳහා ඒකකයකට රු.135,900 බැගින් මුදල් ගෙවා තිබුණි. පාලන මිලට වඩා වැඩියෙන් ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 20.45 ක් වී තිබුණි.

- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයුම් අංශය සඳහා Cefriaxone Injection 500mg ඖෂධයෙන් Vial එකක් රු.18.72 ක බැගින් Vials 80,000 ක් මිලදී ගැනීමේ ප්‍රධාන ඇණවුම ඉකුත් වර්ෂයේදී නිකුත් කර තිබුණු අතර තොගය ප්‍රමාදවී සපයා තිබුණි. ඒ හේතුවෙන් ඇතිවී තිබුණු තොග හිඟය වලක්වා ගැනීම සඳහා එම ඖෂධයෙන් ඒකක 10,998 ක් දේශීය වෙළඳපලෙන් Vial එකක් රු.490 බැගින් මිලදී ගැනීමට සිදුවී තිබුණි. ඇණවුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරුගේ ප්‍රමාදය හේතුවෙන් දැරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 5.18 ක් සැපයුම්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

- වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානිවූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම නිසා දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු හරපත්වල වටිනාකම රු.මිලියන 1,839.15 ක් වී තිබුණි. 2020 ජුනි 30 දින වන විටත් ඉන් රු.මිලියන 791.31 ක් අයකර ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත්වී තිබුණි.

### ව්‍යවසාය සම්පත් සැලැස්ම

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ව්‍යවසාය සම්පත් සැලැස්මක් (Enterprise Resource Plan) ස්ථාපිත කිරීම සඳහා 2016 දෙසැම්බර් 19 දින රු.මිලියන 49.35 ක වටිනාකමක් මත කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව 2018 පෙබරවාරි 19 දින වන විට ව්‍යාපෘතිය

අවසන් කළ යුතුව තිබුණි. දිගින් දිගටම ව්‍යාපෘතිය ඉටු කිරීමේ කාර්යසාධනය ඉතා පහළ මට්ටමක තිබුණු නමුත් ගිවිසුම් ගතවූ දින සිට වර්ෂ 03 කට අධික කාලයක් මුළුල්ලේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. වර්ෂ 03 කට පසුව 2020 පෙබරවාරි 20 දින ගිවිසුම අවසන් කර (Terminate) තිබුණි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී රු.මිලියන 32.36 ක් වැය කර පරිගණක හා උපාංග අයිතම 09 කින් ඒකක 497ක් මිලදී ගෙන තිබුණි. එම පරිගණක හා උපාංග ව්‍යාපෘති කටයුතු සඳහා පාවිච්චි කර නොතිබුණු අතර පිරිවැය රු.මිලියන 15.57 ක් වූ පරිගණක උපාංග අයිතම 07 ක ඒකක 266 ක් සංස්ථාවේ වෙනත් කාර්යයන් සඳහා භාවිතයට නිකුත් කර තිබුණි. ඉතිරි පිරිවැය රු.මිලියන 16.79 ක් වූ පරිගණක හා උපාංග අයිතම 07 කින් ඒකක 231 ක් 2020 ජුනි 30 දින වන විටත් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි.

ගබඩාව තුළ වූ Server Computers 04 ක පැවති අඩුපාඩු නිසා Server Computer 04 ක් නැවත සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණද, 2020 ජුනි 30 දින වන විටත් නැවත සපයා ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

වර්ෂ 03 කට අධික කාලයකට පසුව මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම, ඔසුසැල් ක්‍රියාකාරීත්වය ඇතුළු සංස්ථාවේ සියළුම කටයුතු සම්බන්ධ දත්ත පද්ධතිය කෙරෙහි සෘජුවම අහිතකර ලෙස බලපා තිබුණි.

## ඖෂධ නිෂ්පාදන

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මාසික නිෂ්පාදන සහ ඇසුරුම්කරණ සැලැස්ම ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී ඖෂධ වර්ග 45 ක් අතරින් ඖෂධ වර්ග 25 ක අපේක්ෂිත නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. තවද වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම් කර තිබුණු ඖෂධ වර්ග 38 කින් වර්ග 20 ක් සඳහා වූ සමස්ථ වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 80 ක් ඉක්මවා සැපයීමට සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී අපොහොසත් වී තිබුණි. තවත් ඖෂධ වර්ග 13 ක් සඳහා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම් කර තිබුණු සමස්ථ වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 50 ක් සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. එසේම ඖෂධ නිෂ්පාදනාගාරය තුළ වාතයේ තිබිය යුතු පිරිවිතර නොතිබීම, නිෂ්පාදන කටයුතු සහ ඇසුරුම් කටයුතු සඳහා අවශ්‍ය සේවකයන් නොසිටීම, නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟවීම හා ඒවා සපයා ගැනීමට ප්‍රමාද වීම හා අවශ්‍ය ඇසුරුම් ප්‍රමාණවත් නොවීම යන හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් මිල රු.මිලියන 528.86 ක්වූ ඖෂධ වර්ග 18 ක ඒකක මිලියන 408.23 ක් 2020 පෙබරවාරි 12 දින වන විටත් සැපයීමට නොහැකිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඖෂධ වර්ග 41 ක ඒකක මිලියන 353.95 ක අලෙවි ඉලක්කයක් සපුරාගත නොහැකිවී තිබුණු අතර එම අපේක්ෂිත ඉලක්ක කරා ළඟා නොවීමේ ප්‍රතිශතය සියයට 06 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක විහිදී තිබුණි.

## බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම

දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 17 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂවලදී ගිවිසුම්වලට එළඹ තිබුණි. 2019 වර්ෂයේදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය

සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- බද්ධ ව්‍යාපාර පිහිටුවීම සඳහා වන අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව (Official committee) විසින් අදාළ ඖෂධ නිපදවන සමාගම් (Producer) සමඟ සංස්ථාව බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත විය යුතු බව නිර්දේශ කර තිබුණද, එම නිර්දේශයට පටහැනිව කටයුතු කරමින් ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කර සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයා හා අතරමැදි ආයතනයක් සමඟ සංස්ථාවේ සභාපති විසින් ත්‍රෛයිපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව (official committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස්වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය. නමුත් සංස්ථාව වෙත කොටස් නිකුත් කර නොතිබුණු පෞද්ගලික සමාගම් දෙකකින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,172.65 කට ඖෂධ අයිතම 15 ක් හා රු.මිලියන 42.41 කට ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 05 ක්ද සපයා ගෙන වෛද්‍ය සැපයුම් අංශය වෙත අලෙවි කර තිබුණි. එසේම එම පෞද්ගලික සමාගම් දෙකෙහි නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රමාණවත් තත්ත්ව පාලනයක්, කළමනාකරණයක් හෝ තාක්ෂණික සහායක් සංස්ථාව විසින් සපයා නොතිබුණි.
- බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එවැනි එක් ආයෝජකයෙකුගෙන් සපයාගෙන වෛද්‍ය සැපයුම් අංශයට අලෙවිකර තිබුණු ඖෂධ අයිතම 11 ක මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 13.73 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද, ඉන්වොයිස් මිලෙන් සියයට 8.28 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද, උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 23.15 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතුකර විකුණුම් මිල තීරණය කර තිබුණි.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි, ඖෂධ හා වෛද්‍ය උපකරණ නිෂ්පාදනය කරන සමාගම් සමඟ පමණක් බද්ධ ව්‍යාපාරය පිහිටු විය යුතු වුවද, ශල්‍ය උපකරණ නිෂ්පාදනය නොකර බෙදාහැරීම පමණක් සිදු කරන පෞද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයක් සඳහා ගිවිසුම් ගත වී තිබුණි. මෙම අතරමැදි ආයෝජකයා විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08 කදී වෙනත් නිෂ්පාදකයන්ගෙන් මිලදී ගෙන සපයා තිබුණු ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදී තිබුණු මිල පිළිබඳව සලකා බැලීමේදී, සත්‍ය නිෂ්පාදකයාගේ විකුණුම් මිලෙන් සියයට 56 ක සිට සියයට 115 ක් දක්වා වූ පරාසයක ලාභ හා සේවා ගාස්තු අතරමැදි ආයෝජකයන් හා සංස්ථාව විසින් තබාගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු අතර මෙම සැබෑ නිෂ්පාදකයාගේ නිෂ්පාදන පිරිවැය පිළිබඳව සංස්ථාව විසින් කිසිදු විටෙක අවධානය යොමුකර නොතිබුණි.

- ශල්‍ය උපකරණ නිෂ්පාදනය නොකර බෙදාහැරීම පමණක් සිදු කරන එම පෞද්ගලික සමාගම විසින් ඉහත සඳහන් ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම සම්බන්ධයෙන් සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද පිරිවැය පත්‍රිකා නිවැරදි නොවන බවත්, ඒවා මුල් නිෂ්පාදකයාගේ සත්‍ය නිෂ්පාදන පිරිවැය ඇතුළත්ව පිළියෙල කර නොතිබුණු බවත්, තහවුරු විය. සංස්ථාවේ කිසිදු වගකිව යුතු නිලධාරියෙකු විසින් එම පිරිවැය පත්‍රිකා නිවැරදි බවට තහවුරු කර ගැනීමට හා පිරිවැය පත්‍රවල ඇතුළත් දත්ත, ස්වාධීන පාර්ශවයකින් සහතික කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- මෙලෙස බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් ලාභ හා ඊට අමතරව සංස්ථාව විසින් සේවා ගාස්තුද, උපයා තිබීම හේතුවෙන් බද්ධ ව්‍යාපාරයක් ගොඩ නැගී නොතිබුණු අතරම අපේක්ෂිත පරිදි අවම පිරිවැයක් යටතේ ඖෂධ සපයා ගැනීමේ අරමුණද ඉටුවී නොතිබුණි. වෛද්‍ය සැපයීම් සඳහා රජය වැය කරනු ලබන මහජන මුදල් අතරමැදි සමාගම් කිහිපයක ආදායම් බවට පත්කිරීමේ ක්‍රියාවලියක් මේ හරහා ක්‍රියාත්මක කර තිබුණි. බද්ධ ව්‍යාපාරවල ප්‍රධාන හවුල්කරුවූ සංස්ථාව විසින් මේ පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක්, මෙහෙයවීමක් හෝ පාලනයක් සිදු කර නොතිබුණි.

### පොදු රසායනාගාරයක් හා පුහුණු පාසලක් පිහිටුවීම

පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් 2017 හා 2018 වර්ෂවලදී රු.මිලියන 131.39 ක් වැයකර නවීකරණය කර තිබුණු ගොඩනැගිල්ල 2019 අගෝස්තු 18 දින රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් භාරගෙන තිබුණි. නමුත් විගණිත දිනය වූ 2020 මැයි 20 දින වන විටත් එය කිසිදු භාවිතයකින් තොරව නිෂ්කාර්යව වසාදමා තිබුණු අතර ගොඩනැගිල්ල සඳහා අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතු අනුකූලතා සහතිකය (COC) පවා ලබාගෙන නොතිබුණි. එමෙන්ම ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් පසුව හෝ රසායනාගාරය සහ පුහුණු පාසල පිහිටුවීම සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සඳහා සංස්ථාවේ පෙර සැලස්මක් හෝ සූදානමක් නොපැවතුණි.

### Cephalexin නිෂ්පාදනාගාරය නවීකරණය කිරීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 88.42 ක් වැයකර Cephalexin නිෂ්පාදනාගාරය නවීකරණය කර 2019 අගෝස්තු 09 දින කොන්ත්‍රාත්කරු විසින් සංස්ථාව වෙත භාරදී තිබුණි. මෙම නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කිරීමට යෝජිත Cephalexin Capsules USP 250mg ඖෂධය සඳහා යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ සහතිකය (Good Manufacturing Practices) හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියද ලබාගෙන නොතිබුණු බැවින් 2020 ජූලි 16 දින වන විටත් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරිමට නොහැකිවී තිබුණි.

### හිස හා කොදු ඇට පෙළ සම්බන්ධ රෝගීන් සඳහා අති නවීන තෘතීයික සත්කාරක මධ්‍යස්ථානය

සෞදි සංවර්ධන අරමුදල විසින් සහන ණය පදනම මත ශ්‍රී ලංකා රජය වෙත ලබාදී තිබුණු ඇමරිකන් ඩොලර් මිලියන 12කට සමාන රු.මිලියන2 ,791. 16ක ණය මුදලින්

කොළඹ ජාතික රෝහලේ හිස හා කොඳු ඇට පෙළ සම්බන්ධ රෝගීන් සඳහා ඇඳන් 300 කින් හා අති නවීන තෘතීයික සත්කාරක මධ්‍යස්ථානයකින් සමන්විත නව ඒකකයක් ඉදිකර තිබුණි .2010 වර්ෂයේ සිට රෝගී සත්කාරක සේවා සඳහා එය විවෘත කර තිබුණි .මෙම ඒකකය සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ හා ලිබඩු මිලදී ගැනීම සඳහා එම ණය මුදලින් පිළිවෙලින් රු.මිලියන43 . 33 ක් හා රු.මිලියන820 . 02ක් වැය කර තිබුණි .ඒකකය විවෘත කර වර්ෂ 09 ක කාලයක් ගතවී තිබුණත්, වෛද්‍ය කාර්යය මණ්ඩලයේ තනතුරු 16ක්, විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරු 01ක්, හෙද සොයුරි තනතුරු 03ක්, හෙද කාර්යය මණ්ඩලයේ තනතුරු 112ක් හා කණිෂ්ඨ කාර්යය මණ්ඩලයේ තනතුරු 27 ක් වශයෙන් වූ කාර්යය මණ්ඩල පුරප්පාඩුවීම හේතුවෙන් මෙම ඒකකය තුළ ස්ථාපිත දැඩි සත්කාර ඒකක 06 කින් එකක් රෝගී සත්කාර සේවා සඳහා යොදාගෙන නොතිබුණි .තවත් දැඩි සත්කාර ඒකකයක් දැඩි උපස්ථායක ඒකකයක්) High Defensive Unit ) ලෙස පාවිච්චි කර තිබුණි . එම හේතුව නිසා දැඩි සත්කාර ඒකකවල පැවති සමස්ථ ඇඳන් ප්‍රමාණයෙන් සියයට 44කට සමාන ඇඳන් 29 ක් නිෂ්කාර්යව පැවැතුණි .

දැඩි සත්කාර ඒකකයන්වල සේවයේ නියුක්ත හෙද හෙදියන් සඳහා පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල මඟින් පුහුණු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විශේෂිත ප්‍රමාණවත් පුහුණුවක් ලබා දෙන නමුත් 2011වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දැඩි සත්කාර ඒකක 06 ට අනුයුක්තව සිටි 185 දෙනෙකුගෙන් සමන්විත වූ සමස්ථ හෙද කාර්යය මණ්ඩලයෙන් සියයට 04 කට සමාන හෙද නිලධාරීන් 08දෙනෙක් සඳහා පමණක් එම පුහුණුව ලබාදී තිබුණි.

## පටක සාම්පල් පරීක්ෂා කිරීමේ රසායනාගාරය

2018 සැප්තැම්බර් මාසයේදී රු.මිලියන 9. 89ක් වැය කර කොළඹ ජාතික රෝහලේ පටක සාම්පල් පරීක්ෂා කිරීමේ රසායනාගාරය (Histopathology Lab) සඳහා Fully Automated slide preparation System (Biogenex fully Automated IHC Strainer With Glass Slipper ) යන යන්ත්‍ර පද්ධතිය මිලදී ගෙන තිබුණි .මෙම පද්ධතිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් නිකුත් කරන ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කර නොතිබුණු ලංසුකරුවෙකු වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු අතර කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු නිර්දේශය සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර යන්ත්‍ර පද්ධතිය රෝහලේ පටක පරීක්ෂණ රසායනාගාරය වෙත 2018 සැප්තැම්බර් මාසයේදී ලැබී තිබුණි .නමුත් යන්ත්‍රය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය විදුලි සැපයුම ලබාදී නොතිබුණු බැවින් 2020 ජූලි 23දින වන විටත් යන්ත්‍ර පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව පැවැතුණි.

## විදුලි ලොන්ඩ්‍රිය

කොළඹ ජාතික රෝහලේ රෙදි පිරිසිදු කිරීමේ සේවාව සපයන විදුලි ලොන්ඩ්‍රිය සඳහා 2018මැයි 23 දින රු.මිලියන2 . 98ක් වැය කර විදුලි අයන් රෝලක් මිලදී ගෙන තිබුණි .එය පරිහරණය කිරීමේ අපහසුතාවය හේතුවෙන් පාවිච්චියට නොගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවැතුණි.

## අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් හිඟව පැවැතීම

මහරගම අපේක්ෂා රෝහලේ පිළිකා රෝගීන් සඳහා නිකුත් කරනු ලබන අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් වර්ග 26ක් 2019වර්ෂයේදී දින 06 ක සිට දින 316 ක් අතර කාල පරාසයක් හිඟව තිබුණි .එසේම ඇතැම් පිළිකා රෝගීන්ගේ නමින් ගෙන්වනු ලබන ඖෂධ හා එන්නත් වර්ග 07ක් 2019 අවසන් මාස 06 තුළදී දින 02 ක සිට දින 180ක් දක්වා කාල පරාසයක් හිඟව තිබුණි . තවද වෛද්‍ය නිර්දේශය අනුව නොකඩවා මාස 06 ක් අඛණ්ඩව ලබාදිය යුතු සමහර ඖෂධවල හිඟවීම හේතුවෙන් එම වෛද්‍ය නිර්දේශයට අනුව කටයුතු කළ නොහැකි වී තිබුණි .

## ඖෂධ ගබඩාකර තැබීම සඳහා ශීත කන්ටේනරයක් මිලදී ගැනීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහන් විධිවිධාන අනුගමනය නොකර මහරගම අපේක්ෂා රෝහල විසින් 2018වර්ෂයේ දී රු.මිලියන5 . 44ක් වැය කර විශේෂිත පිළිකා නාශක ඖෂධ ගබඩාකර තැබීම සඳහා ශීත කන්ටේනරයක් මිලදී ගෙන තිබුණි .තවද මෙම ප්‍රසම්පාදනය සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා විශේෂඥ උපදෙස් ලබාගෙන නොතිබීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අසම්පූර්ණ වී තිබුණි .ඒ හේතුවෙන් විශේෂිත පිළිකා නාශක ඖෂධ ගබඩාකර තැබීමට නොසුදුසු පිරිවිතර සහිත ශීත කන්ටේනරයක් මිලදීගෙන වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවැති අතර එහි වගකීම් කාලයද ඉකුත් වී තිබුණි .රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05ක් වූ රු.මිලියන0 . 27ක රැඳවුම් මුදල වර්ෂයකින් එළඹෙන සෑහීමකට පත් සේවා කාලයකින් පසුව හා පිරිවිතරවලට අනුකූල බවට වූ ඉංජිනේරු සහතිකය ලබා ගැනීමෙන් පසුව නිදහස් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි .ප්‍රමාද ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් වගන්තියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මාස 09 ක ප්‍රමාද ගාස්තු අයකළ නොහැකි වී තිබුණි .

## කන්තලේ මූලික රෝහල සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

කන්තලේ මූලික රෝහල විසින් රු.මිලියන 110. 22ක් වැය කර වෛද්‍ය උපකරණ 30 ක් හා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් මිලදී ගෙන එම රෝහල වෙත ලබාදී තිබුණු වටිනාකම හෙළදරව් නොකෙරුණු වෛද්‍ය උපකරණ 49 ක් එම රෝහලේ ස්ථාපිත දැඩිසත්කාර ඒකකය වෙත ලබාදී තිබුණි .නමුත් නිර්වින්දන වෛද්‍යවරුන් නොමැතිවීම හේතුවෙන් 2016දෙසැම්බර් මාසයේ සිට 2018 ජූලි මාසය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ වරින් වර රෝහල වසා දමා තිබුණු අතර 2018 අගෝස්තු මාසයෙන් පසු එම ඒකකය දැඩි උපස්ථාන ඒකකයක් ලෙස පවත්වා තිබුණි.

## කන්තලේ මූලික රෝහල තුළ රුධිරය කාන්දු පෙරණ ඒකකයක් ඉදිකිරීම

වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ යාමේ ප්‍රවනතාවයට පිළියම් ලෙස වකුගඩු රෝගී සත්කාර සේවාව ප්‍රාදේශීයව ලබාදීමේ අරමුණින් 2015වර්ෂයේදී රු.මිලියන3 . 78 ක් වැයකර කන්තලේ මූලික රෝහල තුළ රුධිරය කාන්දු පෙරණ ඒකකයක් ඉදිකර තිබුණි .2017 වර්ෂයේදී රු.මිලියන11 . 94ක් වැයකර ඩයලිසිස්) Dialysis (යන්ත්‍ර 03 ක් හා මල්ටි පැරා මොනිටර්ස් ) multi Para monitors (03 ක් ඇතුළුව එම ඒකකය සඳහා උපකරණ 44ක් මිලදී ගෙන තිබුණි .

ඒකකයට අවශ්‍ය සියළුම උපකරණ හා පුහුණුවලත් හෙද කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු නමුත් වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් **2020**ජුනි මාසය වන විටත් මෙම ඒකකය තුළ රෝගී සත්කාර කටයුතු ආරම්භ කර නොතිබුණි .මෙම ඒකකය නිෂ්කාර්යව පැවති වර්ෂ **02** ක කාලය තුළදී දළ වශයෙන් වාර**6 , 570**ක් පමණ රුධිරය කාන්දු පෙරණය **(Dialysis)** කිරීමට තිබුණු හැකියාව මඟහැරී තිබුණි.

# ක්‍රීඩා කටයුතු

ක්‍රියාශීලි ජාතියක් ගොඩනැගීම හා ජාතික ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ඉහළ නැංවීම සඳහා රටේ දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩාවන්ට අදාළ කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ වන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාපිත ආයතන 05 ක්, ක්‍රීඩා අරමුදලක් හා ක්‍රීඩා සංගම් 65 මගින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියට හා ජාත්‍යන්තර ඔලිම්පික් ප්‍රඥප්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සහා අවශ්‍ය පියවර ගැනීම සහ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරිම හා සානුබලයන් සැපයීම
- ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරිම
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම
- ජාතික ක්‍රීඩා සංගම් නියාමනය කිරිම
- ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරිම හා ක්‍රීඩා කිරීමේදී තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරිම හා කළමනාකරණය කිරිම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 21,206.48 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 11,155.02 ක් උපයෝජනය කර තිබුණි. පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 47.40 ක් හෙවත් රු.මිලියන 10,051.46 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 57 හි දැක්වේ.




රූපසටහන 57 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

### ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහණ.

2019 වර්ෂයේදි ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් ජාත්‍යන්තර තරගාවලි 12 කට සහභාගීවී රන් පදක්කම් 64 ක්, රිදී පදක්කම් 106 ක් හා ලෝකඩ පදක්කම් 161 ක් වශයෙන් පදක්කම් 331ක් හිමිකරගෙන තිබුණි. එමෙන්ම ආසියානු යොවුන් දැල් පන්දු තරගාවලියේ ලෝකඩ පදක්කම ද, අවුරුදු 19 න් පහළ පැසි පන්දු තරගාවලියේ අනුශූරතාවද, ආසියානු දැල්පන්දු තරගාවලියේ ශූරතාවයද හිමිකරගෙන තිබුණි.

### තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම

සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය විසින් ක්‍රීඩාවට අදාළ තිරසාර සංවර්ධන අරමුණු සකස් කර නොතිබුණි.

### ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

- ක්‍රීඩා අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 කෘතිම ධාවන පථය සහ වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘති 2 ක් සඳහා පිළිවෙලින් රු.මිලියන 310 ක් සහ රු.මිලියන 15.16 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2019 වර්ෂයේදී එම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 183.85 ක් සහ රු.මිලියන 10.3 ක් වැයකර තිබුණි. එම ව්‍යාපෘති දෙකෙහි ඉදිකිරීම් වැඩ, පිළිවෙලින් 2018 දෙසැම්බර් 30 දින හා 2018 අප්‍රේල් 29 දින නිමකළ යුතුව තිබුණද, 2019 වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි.

- ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.23 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ව්‍යාපෘති සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 7.43 ක් වැය කර තිබුණි. 2018 නොවැම්බර් 03 දින නිමකළ යුතු මෙම ව්‍යාපෘතිය 2019 මැයි 23 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද, 2019 දෙසැම්බර් වන විටත් වැඩ නිමකර නොතිබුණි.

- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම යටතේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 7 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2018 වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 10 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 07 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 692 ක් වැය කර තිබුණි. එයින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 6 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 2 ක වැඩ අවසන් කර තිබුණු අතර ඉතිරි දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 4 ක සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 ක වැඩ අවසන් කර නොතිබුණි.

- 2019 වර්ෂය සඳහා රු.මිලියන 101 ක් වූ අයවැය ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත පර්යේෂණ උපකරණ සැපයීම, ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ කටයුතු සඳහා රු.මිලියන 59.28 ක් වූ වටිනාකමකට පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම් ගත වී තිබුණි. ප්‍රසම්පාදන කටයුතුවල පැවති සැලකිය යුතු ප්‍රමාදයන් හේතුවෙන් 2020

අගෝස්තු මාසය වන විටද අදාළ උපකරණ ස්ථාපිත කිරීම පමණක් සිදුකර තිබුණි. යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරින් පුහුණු කිරීම් සහ යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා විශේෂඥ සේවා ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් එම උපකරණ භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

## අතහැර දමන ලද ව්‍යාපෘති

අවුරුදු 13-14 වයස් කාණ්ඩවල පසුවන ක්‍රීඩා කෞශලායන්ගෙන් හෙබි දරුවන් විද්‍යාත්මක පදනමකින් හඳුනා ගනිමින් 2024 සහ 2028 වර්ෂවලදී පැවැත්වෙන ඔලිම්පික් තරඟාවලියට යොමු කිරීම සඳහා වූ ව්‍යාපෘති 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලැසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා එකතුව රු.මිලියන 474 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 160.16 ක් වැයකර 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය නවතා දමා තිබුණි.

## යටිතල පහසුකම් උපයෝජනය කිරීම

ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිකිරීම් කර තිබුණු කිලිනොච්චි ක්‍රීඩා සංකීර්ණ පිහිනුම් තටාකය, කිලිනොච්චි ගෘහස්ථ ක්‍රීඩාංගනය, කිලිනොච්චි ක්‍රීඩා පිටිය සහ හොකී පිටිය නිසි පරිදි උපයෝජනය කිරීම හා නඩත්තු කිරිම සිදු කර නොතිබුණි.

## ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් හා බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම

පොළොන්නරුව හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ජාත්‍යන්තර තත්වයට දියුණු කළ හැකිවන පරිදි ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් හා බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් රු.මිලියන 132.09 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිට වැයකර තිබුණි. මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2017 අගෝස්තු 17 දින කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණු අතර 2018 ඔක්තෝබර් මාසයේදී වැඩ අවසන් කිරීමට යෝජිතව පැවතුණි. ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා අක්කර 10 ක භූමි ප්‍රමාණය ඇතුළත් හිමිකම් ඔප්පුව සඳහා ආයතන දෙකකින් ලබාගත යුතු අනුමැතිය ලබාගෙන නොතිබුණු බැවින්, එම ඉඩමේ අයිතිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලබා ගෙන නොතිබුණි. මෙම ක්‍රීඩාංගනය තුළ වාරික්‍රමය සඳහා ජලනල එලීම සිදුකළද ජලය බැසයාමේ පද්ධතිය නිසි පරිදි සකස් කර නොතිබුණි. තවද ආරක්ෂිත වැටක් ඉදිකිරීම හා මීටර් 600 කට ආසන්න දුරක් සහිත ප්‍රවේශ මාර්ගය සකස් කිරීම් කටයුතු සිදුකර නොතිබුණු අතර ක්‍රීඩාංගන පරිශ්‍රය සඳහා විදුලිබලයද ලබා ගෙන නොතිබුණි. ක්‍රීඩාංගනයේ වැඩ ආරම්භ කිරීමේදී ප්‍රමාදයක් සිදු වී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

## අනුග්‍රාහක අයිතිය වෙනුවෙන් ලැබිය යුතු ආදායම්

2018 වර්ෂයේ දී දකුණු අප්‍රිකා - ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරයට අදාළව අනුග්‍රාහක අයිතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබිය යුතු ආදායම වූ එ.ජ.ඩොලර් 187,085 ක් හෙවත් රු.මිලියන 33.96 ක් අනුග්‍රාහක සමාගමෙන් ලැබිය යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ගනුදෙනුවට සිදුකර තිබුණු සැක කටයුතු සහ අවිධිමත් මැදිහත්වීම් හේතු කොට ගෙන එම මුදල අනුග්‍රාහකගෙන් අයකර ගැනීම සැක සහිත වූ අතර මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදුකරමින් පවතී.

## ක්‍රිකට් විද්‍යායතනයක් ස්ථාපිත කිරීම

ක්‍රිකට් විද්‍යායතනයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තිස් අවුරුදු බදු ගිවිසුමක් යටතේ 2017 අප්‍රේල් 29 දින මහනුවර කටුගස්තොට පිහිටි පර්චස් 256 ක් වූ වලකුඹුරවත්ත නැමැති ඉඩම ලබා ගෙන තිබුණු අතර වසර 30 ක් සඳහා ගෙවිය යුතු බදු කුලිය රු.මිලියන 26.25ක් වී තිබුණි. මෙකී බදුකුලියට අමතරව රු.මිලියන 25 ක පරිත්‍යාගයක් 2017 වර්ෂයේදී බදුකරු වෙත ගෙවා තිබුණි. කෙසේ වුවත්, මෙම ක්‍රිකට් විද්‍යායතනයේ ඉදිකිරීමේ වැඩකටයුතු 2020 අගෝස්තු මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

## උපයන විට ගෙවිය යුතු බදු

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරුගෙන් අයකර ගෙන ගෙවිය යුතු වූ උපයන විට ගෙවීම් බදු රු.මිලියන 15.54 ක් පුහුණුකරු වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. තවද එම පුහුණුකරුගේ ආදායම් මත ගෙවිය යුතු බදු ගණනයේ දී ඇතැම් ආදායම් නොසලකා හැරිම හේතුවෙන් එකතුව රු.මිලියන 1.59 ක් වූ ආදායම් බදු, දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත ගෙවීම පැහැර හැර තිබුණි.

## රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරිම

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 හා 41 වන වගන්ති යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවල III වන කොටසෙහි ජාතික ක්‍රීඩා සංගම්වල කාර්යය බලතල සහ කර්තව්‍ය යටතේ XXI වගන්තිය මගින් සෑම ක්‍රීඩා සංගමයක් විසින්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වුවත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එම මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි

## ජාතික ක්‍රීඩා අරමුදල

ඌව ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල හා ක්‍රීඩාපිටිය අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම් සඳහා ජාතික ක්‍රීඩා අරමුදලින් රු.මිලියන 2.50 ක් ගෙවා තිබුණි. එම ක්‍රීඩා සමාජය තෝරා ගැනිම හා ක්‍රීඩා සමාජයේ අවශ්‍යතාවයන් හඳුනාගත් ආකාරය පිළිබඳ පැහැදිලි කර නොතිබුණි. ඊට අමතරව එමගින් ක්‍රීඩා ක්ෂේත්‍රයට වූ දායකත්වය සහ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය හා පසුවිපරම කිරීම සිදුකර නොතිබුණු අතර, අරමුදල විසින් මෙවැනි ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## මුදල් වංචාව

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ හිටපු මුදල් කළමනාකරු විසින් තරඟ විනිසුරුවන් හා සැපයුම්කරුවන් ලෙස ව්‍යාජ නම් ඇතුළත් කර මුදල් ලබාගෙන තිබුණු බව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් අනාවරණය කරගෙන තිබුණි. මෙම මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරික්ෂණ පවත්වා වංචාව අධිකරණය වෙත යොමුකර තිබුණි. වංචා කරන ලද මුළු මුදල රු.මිලියන 46.86 ක් ලෙස 2020 අගෝස්තු මාසයේදී අනාවරණය කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වංචාවට අදාළව හඳුනාගත් අරමුදල් මාරුකිරීම් ලෙස රු.මිලියන 16.05 ක් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි. වංචා කරන ලද මුදල් අයකර ගැනීම සඳහා සම්මේලනය විසින් 2020 අගෝස්තු මාසය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව මෙම මුදල් අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ විගණනයට තහවුරු කරගත නොහැකි විය.

# යෞවන කටයුතු

තරුණ පරපුර නිවැරදි දිශාන්තියකට යොමු කිරීමේ අරමුණින් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 05 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටුකළ යුතුව තිබුණි.

- තරුණ කටයුතු විෂයයන්ට අදාළ ව්‍යාපෘති සහ වැඩසටහන් සම්පාදනය කිරිම
- තරුණ පරපුර නිවැරදි දිශාන්තියකට යොමු කිරීමේ අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරිම සහ ක්‍රියාත්මක කිරිම
- තරුණ පරපුර කේන්ද්‍ර කර ගත් අන්තර්ජාතික සහයෝගීතා සංවර්ධන වැඩසටහන් සහ රැකියා විරහිත තරුණයන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- තරුණ ප්‍රජාව ඉලක්ක කර ගත් ස්වේච්ඡා වැඩසටහන් සම්පාදනය කිරිම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට රු.මිලියන 20,741.11 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 14,270.64 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 31.20 ක් හෙවත් රු.මිලියන 6,470.47 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 58 හි දැක්වේ.




රූපසටහන 58 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන 05 ක් විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

ජාතික තරුණ සේවා සභාවේ 2018 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 50 ක පුහුණු අභ්‍යාසලාභීන් 21,007 ක් පූර්ණ කාලීන හා අර්ධ කාලීන පුහුණු පාඨමාලාවලට බඳවාගෙන තිබුණද පුහුණු පාඨමාලා සඳහා පවතින ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වී තිබුණි. 2018 වර්ෂයේදී මධ්‍යස්ථාන 28 ක පූර්ණ කාලීන පුහුණු පාඨමාලා 58 ක් සඳහා අයදුම්පත් 2977 ක් ලැබී තිබුණු අතර පුහුණුව සඳහා අයදුම්කරුවන් 1433 ක් පමණක් ලියාපදිංචි කරගෙන තිබුණි. ඒ අනුව, එම මධ්‍යස්ථානවල පාඨමාලා සඳහා අයදුම්කරන ලද සංඛ්‍යාවෙන් සියයට 40 ක සිට සියයට 70 ක් දක්වා වූ ප්‍රමාණයකට පුහුණු අවස්ථා ලබාදීමට අපොහොසත් වී තිබුණි. එසේම 2017 වර්ෂයේදී මධ්‍යස්ථාන 22 ක අර්ධ කාලීන පුහුණු පාඨමාලා 80 ක් සඳහා අයදුම්පත් 5,661 ක් ලැබී තිබුණු අතර අයදුම්කරුවන් 2,386 ක් පමණක් ලියාපදිංචි කරගෙන තිබුණි. ඒ අනුව එම මධ්‍යස්ථානවල පාඨමාලා සඳහා අයදුම්කරන ලද සංඛ්‍යාවෙන් සියයට 40 ක සිට සියයට 75 ක් දක්වා වූ ප්‍රමාණයකට පුහුණු අවස්ථා ලබාදීමට අපොහොසත් වී තිබුණි.

## නව පාඨමාලා හඳුනා නොගැනීම.

ජාතික තරුණ සේවා සභාවේ මධ්‍යස්ථාන 54 හි 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය වන විට පවත්වනු ලබන පුහුණු පාඨමාලා පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මධ්‍යස්ථාන 06 ක පාඨමාලා 54 ක සිට 46 ක් දක්වා අඩුවී තිබුණු අතර මධ්‍යස්ථාන 20 ක පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාවෙහි වැඩිවීමක් සිදුවී නොතිබුණි. තවද, 2019 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 14 ක පුහුණු පාඨමාලා එකක් හෝ දෙකක් පමණක් පවත්වමින් පැවතුණි.

## අරමුණට පටහැනි වියදම්

ශ්‍රී ලංකා තාරුණ්‍යයේ කාලීන අවශ්‍යතාවය හා වුවමනාවන් අවස්ථානුකූලව කළමනාකරණය කරමින් නූතන තාක්ෂණය සහ ක්‍රමවේදයන් භාවිතයට ගනිමින් කාලීන වැඩ ලෝකයට සරිලන සේ තාරුණ්‍ය ගොඩනැංවීමත් එමගින් ඔවුන්ගේ ජීවන සහ වෘත්තීය ඉලක්ක ජයග්‍රහණය සඳහාත්, රටේ සංවර්ධනයට ඍජු දායකත්වය ලබාදිය හැකි තරුණ පිරිසක් ගොඩනැංවීම සඳහාත් ඒ අනුව පෙලගස්වන ලද ක්‍රියාදාමයන් හා ව්‍යාපෘති ගණනාවක් එකම අවස්ථාවක එළි දැක්වීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් යොවුන් පුර වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. තරුණ තරුණියන්ගේ දැනුම කුසලතා හා නායකත්වය වැඩි දියුණු කිරීමට වඩා ප්‍රදර්ශනාත්මක හා විනෝදකාමී අංගයන්ට ප්‍රමුඛතාවය ලබා දීමට වැඩි පරිශ්‍රමයක් හා වියදමක් කරමින් 2019 මාර්තු 26 දින දෙබරවැව මහජන ක්‍රීඩාංගණයේ මහජනතාව සඳහා සංගීත සංදර්ශනයක් පැවැත්වීම, දෙබරවැව මංසන්දියේ තොරණක් ඉදිකිරීම, යොවුන්පුර ප්‍රදර්ශන භූමිය තුළ දින 05 ක් පුරා රාත්‍රී සංගීත ප්‍රසංග සංවිධානය කිරීම, තාවකාලික සිනමා ශාලා ඉදිකිරීම, ප්‍රදර්ශන භූමිය තුළ තොරණ 2 ක් ඉදිකිරීම යනාදී යොවුන්පුර වැඩසටහනේ අරමුණු සමග ඍජු සම්බන්ධතාවයක් නොතිබුණු කාර්යයන් වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියන 40.59 ක් වැය කර තිබුණි.

## මතභේදයට තුඩු දුන් ගනුදෙනු

ජාතික තරුණ සේවා සභාවේ 2019 වර්ෂයේ යොවුන්පුර වැඩසටහන සඳහා අවශ්‍ය ඩෝම්ස් කුලී පදනම මත ලබා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි සැලසුමකින් හා ගිවිසුම්ගතවීමකින් තොරව සිදුකර තිබුණි. ප්‍රසම්පාදනයට අදාළව ඇණවුම් ලබාදීමටත් පෙර, ගබඩා භාරකරු ලබාදී තිබුණු ප්‍රකාශ

මත පදනම්ව මුල් කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා වියදම් අනුමත කර ඒවා සාධාරණීකරණය කිරීමට සහ ඒ සඳහා විධිමත් හේතු දැක්වීමට කටයුතු නොකර ගබඩා දෙකක් සඳහා අමතර දින 8 ක් හා 10 ක් සඳහා රු.මිලියන 2.23 ක් ගෙවීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබිණි.

# තාක්ෂණික සංවර්ධනය

## අංශ

### විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

### සන්නිවේදනය

## නිරීක්ෂණ

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම
- එළඹ තිබුණු ගිවිසුම් කඩ කළ නිලධාරීන්ගෙන් අයවිය කළ යුතු මුදල්
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම්
- ආර්ථික ප්‍රතිලාභයක් නොලැබීම
- නිකුත් කළ අත්තිකාරම් පියවා නොතිබීම
- Light Measurement පද්ධතියම අක්‍රීයවීම
- නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්
- ලබා දුන් ප්‍රතිපාදන නැවත පවරා ගැනීම
- ස්ථාවර හා ජංගම දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව
- අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව අඩුවීම
- ADSL අන්තර්ජාල පහසුකම්වල ව්‍යාප්තිය පහළ අගයක් ගැනීම
- ඊ-රාජ්‍යය සමීක්ෂණ වාර්තා
- හිඟහිටි ආදායම්
- අධිභාර ගෙවීම
- අස්ථානගත වූ සංගීත භාණ්ඩ
- විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹ නොතිබීම
- Earth Watchman ව්‍යාපෘතිය
- තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම
- උත්සව කටයුතුවලදී මත්පැන්වලින් සංග්‍රහ කිරීම
- තිරසර සංවර්ධන අරමුණු
- බඳවාගැනීම් සහ උසස්කිරීම්
- රජයේ රූපවාහිනී මාධ්‍ය ජාලයේ වෙළඳපොළ කොටස
- අලුතින් හඳුන්වාදුන් පුවත්පත් නවතා දැමීම සහ පුවත්පත් අලෙවිය අඩුවීම
- වෙනත් රජයේ ආයතනවලට සේවකයන් මුදාහැරීම
- සමාගමට එදිරිව පවතින නඩු කටයුතු
- සැලසිනේ රූපවාහිනී ආයතනය
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- නෙළුම් කුළුන ව්‍යාපෘතිය

# විද්‍යා හා තාක්ෂණය

විද්‍යාත්මක පර්යේෂණවල නිරතවීමෙන් හා විද්‍යා තාක්ෂණය ප්‍රචලිත කිරීම හරහා විද්‍යාත්මකව හා තාක්ෂණකත්වයෙන් සංවර්ධනය වූ රටක් ඇති කිරීම මෙම අංශයේ මූලික අරමුණ වී තිබුණි. මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 18 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනීම්වලට අනුගතවන පරිදි දේශීය පර්යේෂණ හා සොයා ගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- දැනුම පාදක කරගත් ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය වැඩිදියුණු කිරීම.
- විද්‍යාත්මක, කාර්මික, සමාජ හා ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- තොරතුරු, නැනෝ, රොබෝ, යන්ත්‍ර ඉලෙක්ට්‍රොනික හා ජෛව තාක්ෂණය ඇතුළුව නව පර්යේෂණ හා සොයා ගැනීම්වලින් ලබා ගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුළුව අදාළ පාර්ශවයන් වෙත ලබා දීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන සියළුම පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කරමින් ජාතික සංවර්ධන අරමුණු සාධනය සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය, සංවර්ධනය සඳහා වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- බුද්ධිමය දේපල පිළිබඳ ජාත්‍යන්තර සංයුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 28,428.58 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 18,498.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාලපරිච්ඡේදය සඳහා පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 34.93 ක් හෙවත් රු.මිලියන 9,930.57 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 59 හි දැක්වේ.




රූපසටහන 59 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවාසන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටුකිරිම

- ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට 2019 වර්ෂයේ සැලැසුම් කර තිබුණත්, ඒ සඳහා ඉඩම මිලදී ගැනීමේ කටයුතු පමණක් අවසන් කර තිබුණි.
- කාර්මික තාක්ෂණ ආයතනය මඟින් පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂාව සඳහා පහසුකම් ස්ථාපන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 70 ක් වැය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.
- කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිමකළ යුතු පර්යේෂණ ව්‍යාපෘති 56 ක් අතරින් ව්‍යාපෘති 25 ක අවසන් පරීක්ෂණ වාර්තා නිකුත් කර නොතිබුණි. මේ හේතුවෙන් එකී කාල පරිච්ඡේදය තුල සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

## එළඹ තිබුණු ගිවිසුම් කඩ කළ නිලධාරීන්ගෙන් අයවිය කළ යුතු මුදල්

කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් විදේශ ශිෂ්‍යත්ව සඳහා විදේශ ගතවීමේදී ආයතනය සමඟ එළඹ තිබුණු ගිවිසුම්වල කොන්දේසි කඩ කළ විට අදාළ මුදල් එම නිලධාරීන්ගෙන් අයකළ යුතුව තිබුණි. එසේ ගිවිසුම්වලට එළඹ විදේශ ශිෂ්‍යත්ව මත විදේශ ගතවීමේදී නිලධාරීන් 20 දෙනෙකු විසින් එළඹ තිබුණු ගිවිසුම්වල කොන්දේසි කඩ කර තිබුණු අතර ඒ වෙනුවෙන් ඔවුන්ගෙන් රු.මිලියන 16.90 ක මුදලක් අය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවැති එම මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම්

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍යාංශයට

අයත් ශ්‍රී ලංකා ගුහලෝකාගාර කුටියේ ආසන 564 ක් අළුත්වැඩියා කිරීම, පොලිෂ් කිරීම හා කුෂන් කිරීම සඳහා රු.මිලියන 4.52 ක මුදලක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. .

## ආර්ථික ප්‍රතිලාභයක් නොලැබීම

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ මඟින් තාක්ෂණය පැවරීම වෙනුවෙන් රු.මිලියන 1.61 ක ආදායමක් උපයා තිබුණි. එම කාලපරිච්ඡේය තුළ පර්යේෂණ ව්‍යාපෘති සඳහා රු.මිලියන 61.45 ක්ද, පර්යේෂණ දීමනා වශයෙන් රු.මිලියන 33.98 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 95.43 ක් වැයකර තිබුණි. ඒ අනුව පර්යේෂණ ව්‍යාපෘතිවලට වැය කරන ලද මුදල්වලට ආර්ථික ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

## නිකුත් කළ අත්තිකාරම් පියවා නොතිබීම

කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ නව ඒකාබද්ධ මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම හා ස්ථාපනය කිරීම 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ආයතනය වෙත රු.772,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. එම පද්ධතියේ පැවති තාක්ෂණික අඩුපාඩු නිසා කොන්ත්‍රාත්තුව නතර කර තිබුණත් කොන්ත්‍රාත්කරුගෙන් නිකුත් කර තිබුණු අත්තිකාරම් මුදල අයකර ගෙන නොතිබුණි.

## Light Measurement පද්ධතියම අක්‍රියවීම

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ 2015 ඔක්තෝබර් 12 දින සිට 2017 ඔක්තෝබර් 13 දින දක්වා වර්ෂ දෙකක වගකීම් කාලයක් සහිතව Light Measurement System යන්ත්‍රයක් රු.මිලියන 15.48 කට මිලදී ගෙන තිබුණි. 2017 ඔක්තෝබර් 11 දින වන විට රු.925,000 ක් වටිනා Power Analyzer (xitron 2801) දෝෂ සහිත වී 2017 ඔක්තෝබර් 17 දින වන විට Mini Computer ක්‍රියාත්මක නොවීම හේතුවෙන් Light Measurement පද්ධතියම අක්‍රියවී තිබුණි. ඒ අනුව 2017 ඔක්තෝබර් 11 දින සිට 2018 නොවැම්බර් 09 දින දක්වා මාස 13 ක කාලයක් එම පද්ධතිය අක්‍රිය වී තිබුණි. එම දෝෂ නිවැරදි කර සතියක් ඉක්මවූ පසු 2018 නොවැම්බර් 19 දින රු.මිලියන 2.35 ක් වටිනා Amatek Power Supply උපකරණය අක්‍රිය වී තිබුණි. එදින සිට 2019 සැප්තැම්බර් 23 දින දක්වා වර්ෂ 2 ක කාලයක් පද්ධතිය අක්‍රිය වී තිබුණි. Light Measurement පද්ධතිය මිලදී ගෙන වර්ෂ 2 ක කාලයකට පසුව එම පද්ධතියේ උපාංග 03 ක් ක්‍රියාවිරහිත වීම නිසා අතිරේකව රු.මිලියන 3.28 ක් වැය කර දෝෂ නිවැරදි කර තිබුණත්, නැවතත් ක්‍රියාවිරහිත වී තිබුණි. මේ අනුව එම පද්ධතිය මාස 25 ක කාලයක් ක්‍රියාවිරහිත වීම නිසා ආයතනයට අහිමි වූ ආදායම රු.මිලියන 2.80 ක් වී තිබුණි.

## නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

- කාර්මික තාක්ෂණ ආයතනයේ LIMS පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පරිගණක අංශය වෙත රු.මිලියන 2.55 ක් වටිනා Rack Mountable Server පද්ධතිය 2019 සැප්තැම්බර් 05 දින ආයතනය වෙත ලැබී තිබුණි. 2020 ජුනි 23 දින වනවිටත් එය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.
- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ පුස්තකාලයේ පොත් පිටතට ගෙනයාම පරික්ෂාව සඳහා RFID තාක්ෂණය උපයෝගි කරගත්

දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය RFID ගේට්ටු 2ක් 2018 වර්ෂයේ දී රු.මිලියන 1.37 කට මිලදී ගෙන තිබුණි. ඒවා භාවිතයෙන් තොරව පුස්තකාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවැතුණි.

- ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණය ආරම්භ කරන අවස්ථාවේදීම පර්යේෂණයට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදනය ඒ ඒ ව්‍යාපෘති යටතේ වූ ජංගම ගිණුමකට බැර කර තිබුණි. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 97 කට අදාළව රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.මිලියන 411.51 ක් ජංගම ගිණුම්වලට බැර කර තිබුණි. 2020 සැප්තැම්බර් මාසය වන විට රු.මිලියන 236.14 ක මුදලක් ජංගම ගිණුම්වල නිෂ්කාර්ය පැවැතුණි.

### ලබා දුන් ප්‍රතිපාදන නැවත පවරා ගැනීම

ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ ඇස්තමේන්තු, වියදම්, සැලසුම්, ප්‍රසම්පාදන කටයුතු හා මූල්‍ය ප්‍රගතිය නිසි පරිදි ජාතික පර්යේෂණ සභාව හරහා අධීක්ෂණය කර නොතිබුණි. එම හේතුව මත 2019 වර්ෂයේදී අවසන් කරන ලද ව්‍යාපෘති 53 කට අදාල රු.මිලියන 67.72 ක් නැවත සභාව වෙත අයකර ගෙන තිබුණි. ඉන් ව්‍යාපෘති 10 කට අදාළව ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 42 ක සිට සියයට 93 ක් දක්වා ප්‍රතිපාදන එසේ නැවත පවරා ගෙන තිබුණි.

# සන්නිවේදනය

ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල වූ දැයක් ගොඩනැගීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවකින්ද, ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස කටයුතු කිරීමේ අපේක්ෂාවෙන් ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය හා ඒයටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 08 කින්ද, නවතම තාක්ෂණය හා කළමනාකරණ ක්‍රමයන් භාවිතා කරමින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිව තැපැල් සේවා හා මුස්ලිම් ආගමික අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවකින්ද, මෙම අංශයේ පහත සඳහන් කාර්යභාරය ඉටුකළ යුතුව තිබුණි.

- විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.
- රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උචිත තොරතුරු තාක්ෂණ විසඳුම් යොදා ගැනීමට සහය වීම.
- පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම දිරි ගැන්වීම සඳහා ක්‍රමෝපායන් සැකසීම
- ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනමාධ්‍ය විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.
- ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම.
- ජනතාව තුළ දැනුම, ආකල්ප, රසඥතාවයන් ඇතිකරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මෙම අංශයෙන් ඉටු කළ යුතු කාර්යභාරය වී තිබුණි. එම කාර්යභාරය ඉටු කිරීම සඳහා ඉහත සඳහන් අමාත්‍යාංශ 03 හා දෙපාර්තමේන්තුවේ අරමුණු වී තිබුණි. එම අරමුණු ඉටුකිරීම සඳහා පහත සඳහන් කාර්යභාරය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන නවයක් විසින් ඉටුකළ යුතුව පැවතුණි.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසන් වන විට රු.මිලියන 80,496.48 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 58,488.32 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 27.34 ක් හෙවත් රු.මිලියන 22,008.16 ක

ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 60 හි දැක්වේ.




රූපසටහන 60 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ස්ථාවර හා ජංගම දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව

ශ්‍රී ලංකාවේ ස්ථාවර සේවා ග්‍රාහක සංඛ්‍යාව 2011 වර්ෂයේදී මිලියන 3.6 ක් වී තිබුණත්, එය 2019 වර්ෂය වන විට මිලියන 2.3 ක් දක්වා සියයට 36 කින් අඩු වී තිබුණි. පසුගිය වර්ෂ 12 ක කාලය තුළ ජංගම දුරකථන අංශයේ සංයුක්ත වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ඒ අනුව 2005 වර්ෂයේදී මිලියන 3.36 ක් වූ ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 2019 වර්ෂය අවසාන වන විට මිලියන 32.88 ක් දක්වා සියයට 879 කින් වර්ධනය වී තිබුණි. දුරකථන ග්‍රාහක සංඛ්‍යා වෙන් ස්ථාවර දුරකථන ග්‍රාහක සංඛ්‍යාව අඩු වී ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව වැඩිවීම පිළිබඳ විස්තර රූපසටහන 61 හි දැක්වේ.




රූපසටහන 61 - දුරකථන ග්‍රාහක සංඛ්‍යාව
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

මෙහිදී 2018 වර්ෂයේදී ස්ථාවර දුරකථන ඝනත්වය පුද්ගලයන් 100 කට 11.5 ක් වී තිබුණත්, එය 2019 වර්ෂයේදී 10.5 දක්වා අඩු වී තිබුණි. ඊට ප්‍රතිලෝමව ජංගම දුරකථන ඝනත්වය පුද්ගලයින් 100 කට 2018 වර්ෂයේදී 150.1 ක සිට 2019 වර්ෂයේදී එය 161.4 ක් දක්වා වර්ධනය වී තිබුණි. සක්‍රීය ග්‍රාහක අනන්‍යතා මොඩියුල් පත් (Sim cards) සැලකිය යුතු ප්‍රමාණයක් තනි එකම පුද්ගලයකු විසින් භාවිතා කරන බැවින් මෙම සංඛ්‍යාවලින් සත්‍ය තත්ත්වය පිළිඹිබු වී නොතිබුණි.

## අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව අඩුවීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යා ලේඛන අනුව අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 2017, 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් 6,747,154 ක්, 10,562,675 ක් හා 13,408,403 ක් වූ නමුත් එම ප්‍රමාණයන් ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වීම ඉතා පහල මට්ටමක පැවතුණි. මෙම ග්‍රාහක සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කළද, එම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ජනගහනය හා සමඟ සැසඳීමේදී ඉතා අඩු අගයක් ගෙන තිබුණි.

## ADSL අන්තර්ජාල පහසුකම්වල ව්‍යාප්තිය පහළ අගයක් ගැනීම

2019 වර්ෂය වනවිට ADSL අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබුණු ප්‍රමාණය 908,418 ක් පමණක් වී තිබුණි. එයින් සියයට 42.66 ක් බස්නාහිර පළාතේ හා සියයට 0.46 සිට සියයට 31.18 දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් අනෙකුත් පළාත් අතර ව්‍යාප්ත වී තිබුණි. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල ADSL අන්තර්ජාල පහසුකම්වල ව්‍යාප්තිය ඉතා පහළ මට්ටමක පැවැතුණි.

## ඊ-රාජ්‍යය සමීක්ෂණ වාර්තා

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධනය පිළිබඳ ඊ-රාජ්‍ය සමීක්ෂණ වාර්තාවට (United Nations E-Government Survey) අනුව 2012 වර්ෂයේදී 192 ක් වූ ශ්‍රී ලංකාවේ ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය 2014 වර්ෂයේදී 74 දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේදී එම දර්ශකය 85 දක්වා අඩුවී තිබුණි.

## හිඟහිටි ආදායම්

2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික මාධ්‍ය ආයතන දෙකකින් ආනයනික ටෙලිනාට්‍ය,

චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා අයවිය යුතු බදු ආදායම දඩ මුදල්ද සමඟ රු.මිලියන 53.16 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් එම හිඟහිටි ආදායම් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### අධිභාර ගෙවීම

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 5.1 වගන්තිය අනුව සේවය අවසන් කිරීමේ දිනයේ සිට දින 30 ඇතුළත පාරිතෝෂික දීමනා ගෙවිය යුතුව තිබුණි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකුට හිමි පාරිතෝෂික දීමනාව මාස 08 ක කාලයක් ප්‍රමාද කර ගෙවා තිබුණි. පාරිතෝෂික ගෙවීම ප්‍රමාද කිරීම නිසා කම්කරු කොමසාරිස් විසින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට රු.253,884 ක අධිභාරයක් පනවා තිබුණි.

### අස්ථානගත වූ සංගීත භාණ්ඩ

2016 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රුහුණු සේවයේ තිබියදී සංගීත භාණ්ඩ 12 ක් අස්ථානගත වී තිබුණි. එම භාණ්ඩ නැවත ප්‍රතිස්ථාපන කිරීමේ අගය වූ රු.305,900 ක් වී තිබුණත්, එම අලාභය වගකිව යුතු නිලධාරියාගෙන් අයකර ගැනීමට 2019 ජූලි 31 දින වන විටත් සංස්ථාව අපොහොසත් වී තිබුණි.

### විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹ නොතිබීම

නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කර තිබුණු ගම් උදාව ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පත්කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු.මිලියන 103.55 ක ගුවන්කාල ආදායමක් අය විය යුතුව තිබුණි. එම හිඟහිටි ආදායම 2020 ජූනි මාසය වන විටත් අයකරගෙන නොතිබුණි. මෙම දැන්වීම් ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග සංස්ථාව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීම සඳහා පාර්ශවයන් කිහිපයකින් වරින් වර ඉල්ලීම් සිදුකර තිබුණද එම ඉල්ලීම්වල විධිමත්භාවයක් නොතිබුණි.

### Earth Watchman ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිනිය සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් සමග එළඹ තිබුණු ගිවිසුමකට අනුව Earth Watchman ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එහි සමාරම්භක උත්සවය වෙනුවෙන් සංස්ථාව විසින් රු.මිලියන 1.72 ක් වැය කර තිබුණි. එම උත්සවය පමණක් පවත්වා ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1.25 ක අනුග්‍රාහකත්වයක් පමණක් ලැබී තිබුණු අතර, විධිමත් අධ්‍යයනයක් සිදුකිරීමෙන් තොරව ව්‍යාපෘතිය ආරම්භ කිරීම හේතුවෙන් සංස්ථාවට රු.470,035 ක අලාභයක් සිදු වී තිබුණි.

### තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම

මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුගමනය නොකරමින් අවස්ථා 12 කදී නිලධාරීන් වෙත රු.100,000 ක් ඉක්මවූ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 3.06 ක් ගෙවා තිබුණි. එම අත්තිකාරම් ගෙවූ කාර්ය අවසන්වීමෙන් පසුව දින 10 ක් ඇතුළත එම අත්තිකාරම් නිරවුල් කළ යුතුව තිබුණත්, දින 02 ක සිට දින 192 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර එම අත්තිකාරම් පියවා තිබුණි.

## උත්සව කටයුතුවලදී මත්පැන්වලින් සංග්‍රහ කිරීම

1990 මැයි 18 දිනැති අංක 26/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ආයතනවල උත්සව කටයුතුවලදී මත්පැන්වලින් සංග්‍රහ නොකළ යුතුව තිබුණි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් කොළඹ හිල්ටන් හෝටලයේ පවත්වන ලද නව්‍යකරණයේ අභිමංගල්‍ය වැඩසටහන සඳහා මධුසාද පිළිගැනීම (Cocktail Reception) වෙනුවෙන් රු.මිලියන 1.70 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. 1979 ඔක්තෝබර් 16 දිනැති අංක 148 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම රාජ්‍ය නිලධාරීන් මධුසාද වැනි ප්‍රසිද්ධ ස්වභාවයක් උසුලන සාදවලට සහභාගී නොවිය යුතු වුවද, ඊට පටහැනිව ඉහත වැඩසටහන සඳහා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහභාගී වී තිබුණි. මෙම වැඩසටහන සඳහා හෝටලය තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

## තිරසර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව දැනුවත් වී තිබුණද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

සංස්ථාවට අදාළව තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර ඒ හේතුවෙන් තිරසර සංවර්ධනයට අදාළ වන කාර්යයන් කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, සංස්ථාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සඳහා තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාළව සංස්ථාව විසින් කිසිදු චක්‍රලේඛයක් හෝ උපදෙස් මාලාවක් හෝ නිකුත් කර නොතිබුණි.

තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කළ යුතු වුවත්, සංස්ථාව විසින් සම්බන්ධීකරණය විය යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට සැලැසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

## බඳවාගැනීම් සහ උසස්කිරීම්

- අනුමත බඳවා ගැනීමේ පරිපාටියකින් තොරව හා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙන් තොරව සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ තනතුරු 07 ක් සඳහා පත්වීම් ලබා දී තිබුණි. 2019 ජූනි 21 දිනැති අංක 325/30 දරන අධ්‍යක්ෂ මණ්ඩල සටහන අනුව, මාධ්‍ය ජාලයේ ගණකාධිකාරී තනතුර හොබවන නිලධාරිණිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුරෙහි ද රාජකාරී ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි. එසේ වුවද, එම නිලධාරිණිය විධිමත් පත්කිරීමකින් තොරව 2018 නොවැම්බර් 07 දින සිට කළමනාකරු මුදල් තනතුරෙහි රාජකාරී ඉටුකර තිබුණි. එම තනතුරු දෙකෙහිම රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් එම

නිලධාරිණියට 2018 නොවැම්බර් 07 දින සිට 2019 ජූලි 31 දින දක්වා කාලය සඳහා රු. 477,086 ක් ගෙවා තිබුණි. එම නිලධාරිණිය කළමනාකරු මුදල් තනතුරට උසස් කළ බව සහ රු.61,809 ක වැටුපක් සහ අනෙකුත් අනුමත දීමනා, බඳවාගැනීම පිළිබඳ අවසන් තීරණයකට එළඹෙන තෙක් ලබාදීමට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් රු.9,635 ක මාසික දීමනාවක් ගෙවීමට අනුමත කර ඇති බවට 2019 ජූලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අංක 328/35 ඉදිරිපත් කර තිබුණද, 2019 සැප්තැම්බර් 03 දිනැති අංක 329/14 දරන අධ්‍යක්ෂ මණ්ඩල සටහන අනුව මෙම පත්වීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකරන බව සහ ඒ වෙනුවෙන් සිදු කර තිබුණු ගෙවීම් නීත්‍යානුකූල නොවන බවද සඳහන් කර තිබුණි.

- සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් කළමනාකරු අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි (ආවරණ), සහකාර කළමනාකරු (අලෙවි), කළමනාකරු (අලෙවි)(රේඩියෝ), සහකාර කළමනාකරු (අලෙවි) (රේඩියෝ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්) සහ කළමනාකරු (ව්‍යාපාර සංවර්ධන) යන තනතුරු සඳහා පත්කිරීම් සිදුකර තිබුණි. මෙම තනතුරු සඳහා වඩාත් සුදුසු පුද්ගලයා තෝරාපත් කර ගැනීමට හැකිවන පරිදි බඳවාගැනීමේ අවශ්‍යතාවය සඳහා ප්‍රචාරණයක් සිදුකර අයදුම්පත් කැඳවා නොතිබුණි. එමෙන්ම බඳවාගැනීම් සාධාරණ හා විනිවිද භාවයකින් යුතුව සිදුකර නොතිබුණි. යෝජිත බඳවාගැනීම් පටිපාටිය අනුව සම්පූර්ණ කළ යුතු සුදුසුකම් හෝ පත්වීම් ලද නිලධාරීන් විසින් සම්පූර්ණ කර නොතිබුණි.

- කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය අනුව අදාළ තනතුරුවලට අයත් වැටුප් පරිමාණයන් ඉක්මවා ගෙවීම් නොකළ යුතුව තිබුණි. කළමනාකරු අලෙවි තනතුරට අයත් වැටුපට අමතරව එම නිලධාරියා හට 2019 වර්ෂයේදී රු.මිලියන 1.11 ක් සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් ගෙවා තිබුණි. එම දීමනාවලට අමතරව නිලධාරියා වෙත පෙට්‍රල් ලීටර් 120 ක් හෝ ඩීසල් ලීටර් 140 ක මාසික දීමනාවක්ද ලබාදී තිබුණි. කළමනාකරු අලෙවි (රේඩියෝ) තනතුර සඳහා හිමි වැටුප් හා දීමනා වලට අමතරව රු.222,144 ක්ද, සහකාර කලමනාකරු (අලෙවි)(රේඩියෝ) තනතුර සඳහා හිමි දීමනාව ඉක්මවා රු. 200,544 ක්ද, 2019 වර්ෂය තුළදී ගෙවා තිබුණි.

- සීමාසහිත ස්වාධීන රූපවාහිනි මාධ්‍ය ජාලයේ කළමනාකරු මුදල් තනතුරට හා කළමනාකරු නිර්මාණ වැඩසටහන් තනතුරට උසස්වීම් ලබා දී තිබුණි. ආයතනයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමකින් තොරව යෝජිත බඳවාගැනීම් පටිපාටිය ප්‍රකාරව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු නිලධාරීන් හට මෙම උසස්වීම් ලබා දී තිබුණි.

## රජයේ රූපවාහිනී මාධ්‍ය ජාලයේ වෙළඳපොළ කොටස

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සහ සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ පසුගිය වර්ෂ පහක වෙළඳපොළ තත්ත්වය පිළිබඳ තොරතුරු රූපසටහන 62 හි දැක්වේ.




රූපසටහන 62 - රූපවාහිනී මාධ්‍ය වෙළෙඳපොළෙහි රාජ්‍ය මාධ්‍ය කොටස
මූලාශ්‍රය - MLRB වාර්තා

එම තොරතුරු අනුව මෙම ආයතන දෙකෙහි වෙළඳපොළ කොටස අඛණ්ඩවම වර්ෂයෙන් වර්ෂයට පහත වැටී තිබුණු අතර 2019 වර්ෂයේදී නැවත සුළු ඉහළයාමක් පැවැතුණි. එසේ වෙළඳපොළ කොටස අඩුවීම නිසා ආයතනයන්හි ප්‍රධානතම ආදායම් මාර්ගය වන ගුවන් කාල විකුණුම් ආදායමද, වාර්ෂිකව සීඝ්‍රයෙන් අඩු වී තිබුණි. විස්තර රූපසටහන 63 හි දැක්වේ.




රූපසටහන 63 - ගුවන් කාල විකුණුම් ආදායම
මූලාශ්‍රය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

මෙසේ ගුවන් කාල විකුණුම් ආදායම අඩුවීම නිසා වෙළඳපොළ කොටස් අඩු වී තිබුණු අතර සේවාදායකයන් පෞද්ගලික රූපවාහිනී නාලිකාවලට ආකර්ෂණය වී ඇත. මෙලෙස රූපවාහිනී නාලිකා දෙකෙන් ඉවත්වන සේවාදායකයන් නැවත ආකර්ෂණය කරවා ගැනීම සඳහා එම සේවාදායකයන්ට නාලිකා දෙකෙහි පවතින අනුමත වෙළඳ දැන්වීම් සඳහා අයකරනු ලබන සම්මත රේටයන්ට වඩා ඉතා අඩු රේටයන්ට එනම්, සියයට 65 ඉක්මවන වට්ටම් සහිතව ගුවන් කාලය ලබා දීමට සිදු වී තිබුණි. එසේ වට්ටම් ලබා දීමට අමතරව එම සේවාදායකන් සඳහා ගාස්තු අය කිරීමෙන් තොරව ලබා දෙනු ලබන තීරු පටි දැන්වීම්, අතිරේක දැන්වීම් වැනි දේද වැඩියෙන් ලබා දී තිබුණි.

## අලුතින් හඳුන්වාදුන් පුවත්පත් නවතා දැමීම සහ පුවත්පත් අලෙවිය අඩුවීම

සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් 2019 වර්ෂයේදී සිළුමිණ, දිනමිණ, ඊසා, සන්ඩේ ඔබ්සවර්, ඬේලි නිවුස්, තිනකරන් සහ වාරමංජරී නමින් වර්ග 07 ක පුවත්පත් සහ තරුණී, සරසවිය, මිහිර ඇතුළු වාර සඟරා 10 ක් ප්‍රකාශයට පත්කර තිබුණි. 2018 වර්ෂයේ දී හඳුන්වාදෙන ලද දිනපතා පුවත්පතක් වන "ඊසා" 2020 ජනවාරි 30 දින දී නවතා දැමීමට කළමනාකරණය තීරණය කර තිබුණි. "ඊසා" පුවත්පතින් අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට 52 කින් අඩු වී තිබුණි. සෙසු පුවත්පත් 06 හි සමස්ත අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට 7 ක සිට සියයට 20 ක් දක්වා වූ පරාසයකින් අඩු වී තිබුණි. වාර සඟරා 10 කින් 08 ක අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාව 2018 වර්ෂයටට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට 07 ක සිට සියයට 22 ක් දක්වා පරාසයකින් අඩු වී තිබුණි.

## වෙනත් රජයේ ආයතනවලට සේවකයන් මුදාහැරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් කලාවේදීන් නව දෙනෙකු, කර්තෘවරු හතර දෙනෙකු, සහකාර කළමනාකාරවරයෙකු, ඡායාරූප ශිල්පියෙකු, ජ්‍යෙෂ්ඨ විධායකයෙකු සහ මුදල් අයකැමියෙකු ඇතුළු නිලධාරීන් දහහත් දෙනෙකු වෙනත් රජයේ ආයතනවල සේවයට මුදාහැර තිබුණි. ඔවුන්ගේ වැටුප්, වේතන හා දීමනා ලෙස රු.මිලියන 8.83 ක් සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් වැයකර තිබුණි. පුවත්පත් කලාවේදීන් නව දෙනෙකු සහ කර්තෘවරු හතර දෙනෙකු මුදාහැරීමෙන් පසුවත් කොන්ත්‍රාත් පදනම මත පුවත්පත් කලාවේදීන් විසිහය දෙනෙකු සහ කර්තෘවරු විසිතුන් දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් බඳවාගෙන තිබුණි.

## සමාගමට එදිරිව පවතින නඩු කටයුතු

1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ "මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය" යන නිවේදනය පළ කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් විසින් සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට එරෙහිව අපහාස නඩු 15 ක් ගොනුකර තිබුණි. එම අපහාස නඩු 15 න් එක් නඩුවක් සඳහා පැමිණිලිකරු විසින් රු.මිලියන 500 ක වන්දියක් සමාගමෙන් ඉල්ලා තිබුණු අතර 2010 වර්ෂයේ එම නඩුව කොළඹ දිස්ත්‍රික් උසාවියේ කැඳවන අවස්ථාවේදි විත්තිකරුවන් සහ සමාගමේ නීතිඥවරයා අදාළ නඩු කාමරයේ නොසිටීම හේතුවෙන් තීන්දුව පැමිණිලිකරුට වාසි සහගත වන ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. එම තීන්දුවට එරෙහිව සමාගම පළමුව කොළඹ දිස්ත්‍රික් උසාවියට ද, දෙවනුව සිවිල් අභියාචන මහාධිකරණයට ද අභියාචනය

ඉදිරිපත් කර තිබුණ ද පෙර තීන්දුවම තහවුරු කිරීම නිසා සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට යොමු වී තිබුණි. ඒ අනුව 2019 අගෝස්තු 30 දිනැති අංක එෆ් 104.19 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් ජනාධිපති නීතිඥයෙක් රු.මිලියන 18.23 ක ගාස්තුවකට තෝරා ගැනීමට සමාගම තීරණය කර තිබුණු අතර එම මුදල 2019 ඔක්තෝබර් 09 දින ගෙවා තිබුණි.

## සැලසිනේ රූපවාහිනී ආයතනය

සැලසිනේ රූපවාහිනී ආයතනය 2001 දෙසැම්බර් 20 දින මහවැලි අධිකාරියෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චයකර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනත් නීතියකින් විධිවිධාන සලසා ගෙන නොතිබුණි. මෙම ආයතනය " සැලසිනේ ලිමිටඩ්" ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද, 2019 වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතනවල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකර ගත යුතුව තිබුණි. ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු වුවත්, වර්ෂ 9 ක කාලයක් ගතවී තිබුණද, එම අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනවලට උප කොන්ත්‍රාත් ලබා දීම ආයතනයේ සාමාන්‍ය ක්‍රමවේදය වී තිබුණි. නියැදි විගණන පරීක්ෂාව අනුව වැඩසටහන් නිෂ්පාදන කාර්යයන් 7 ක් සඳහා රු.මිලියන 37.42 ක ආදායමක් ලැබී තිබුණද, එම වැඩසටහන් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.මිලියන 24.29 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි.

ආයතනය විසින් ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කිරීම ඉතා දුර්වල මට්ටමක පැවැතුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ට වැඩි සේවා ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කර ප්‍රසම්පාදනයන් විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව මුද්‍රණ කාර්යයන් 3 ක් ඉටුකර ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව සැපයුම්කරුවන් තෝරාගෙන බාහිර පාර්ශවයන්ට රු.මිලියන 5.04 ක් ගෙවා තිබුණි.

නෙවිල් ප්‍රනාන්දු පෞද්ගලික රෝහල රජයට පවරා ගැනීමේ උත්සවය සංවිධානය කිරීමේ කටයුතු රු.මිලියන 13.57 කට සිදුකිරීමට ආයතනය කටයුතු කර තිබුණු අතර එහි ප්‍රධාන සංවිධාන කටයුතු ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 4.54 ක ඇස්තමේන්තුවකට බාහිර ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. එම ආයතනයට මුදල් ගෙවා තිබුණත්, එම මුදල භාරගත් බවට තෝරාගන්නා ලද ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් තබා නොතිබුණි. තවද, එම සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි. සේවාවන් සඳහා මිල ගණන් නියම කිරීමේදී සියයට 15ක පමණ ලාභ ආන්තිකයක් භාවිතාකරනු ලබන බව ආයතනය විසින් සඳහන් කළද, මෙම උත්සවයට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මිල ගණන් ඉදිරිපත් කිරීමේදී රු.මිලියන 13.57 ක් එනම් පිරිවැයට සියයට 152ක ලාභයක් එකතුකර

මිල ගණන් ඉදිරිපත්කර තිබුණු බැවින් මිල නියම කිරීමෙහි විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි.

### ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2019 වර්ෂයේදී පාසල් සඳහා පරිගණක හා පරිගණක උපාංග මිලදී ගැනීම ඇතුළුව ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශ යටතේ ආර්ථිකය ඩිජිටල්කරණ ව්‍යාපෘති සඳහා රු.මිලියන 1,055 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 194 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවිය යුතුව තිබුණු බිල්පත්වල වටිනාකම රු.මිලියන 363 ක් වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 53 ක් වූ අතර වර්ෂය තුළ නිම කළ යුතු ව්‍යාපෘති 14 ක් අතරින් සම්පූර්ණයෙන් නිමකළ ව්‍යාපෘති ගණන 04 ක් පමණක් වී තිබුණි. සිදුකළ යුතු ප්‍රසම්පාදනයන් නියමිත දිනවකවානු තුළදී සිදු නොකිරීම හා භාණ්ඩාගාරය විසින් අක් මුදල් ලබා නොදීම නිසා සමාලෝචිත වර්ෂයේදී සැලැසුම් කළ පරිදි ඉලක්කය වෙත ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

### නෙළුම් කුළුන ව්‍යාපෘතිය

2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර තිබුණි. 2012 ජනවාරි 03 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙම සමාගම් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. මෙහි කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩොලර් 104,300,000 ක් වූ අතර ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 දින සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණි. 2017 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව අනුමත කර තිබුණි.

මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, EXIM බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් එ.ජ.ඩොලර් මිලියන 88.655 ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතුව තිබුණි.

2011 දෙසැම්බර් 14 දිනැති අංක අමප/11/2262/501/026/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නෙළුම් කුළුන ඉදිකරන ලද හෙක්ටයාර් 2.59 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත පවරා දිය යුතුව තිබුණද, එසේ පවරා දී නොතිබුණි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අදාළ කාලසටහනට අනුව ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණ අතර අදාළ කාලය තුළදී එ.ජ.ඩොලර් 67,259,758 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලබාදී තිබුණි. මෙහිදී එ.ජ.ඩොලර් 21,395,242 ක ණය මුදල් ප්‍රමාණයක් ලබාගැනීමට නොහැකි වී තිබුණ ද, මුළු ණය මුදලම සඳහා රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ගෙවා තිබුණි. මෙසේ ලබා නොගත් ණය මුදලට සමානුපාතිකව ගෙවා තිබුණු රක්ෂණ ගාස්තුව එ.ජ.ඩොලර් 2,091,287 ක්, එකඟතා ගාස්තු එ.ජ.ඩොලර් 627,789 ක් හා කළමනාකරණ ගාස්තු එ.ජ.ඩොලර් 192,557 ක් ලෙස එකතුව එ.ජ.ඩො. 2,911,633 ක් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

මෙම ව්‍යාපෘතියට අදාළව සකස් කර තිබූ මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර වාර්ෂිකව රු.මිලියන 1,685 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණත්, ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම මත එම වාර්ෂික ආදායම අහිමි වී තිබුණි.

2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ අංක 5.4 viii මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ හිමිකාරිත්වය යටතේ කළමනාකරණ උපදේශක සමාගමක් පිහිටුවීමට අනුමැතිය ලබාදී තිබුණද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත අනුව එවැනි සමාගමක් පිහිටුවීමට කොමිෂන් සභාවට බලතල නොතිබුණි. එබැවින් 2019 සැප්තැම්බර් 11 දිනැති අංක අමප/19/2305/103/140 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් කොළඹ නෙළුම් කුළුණේ වාණිජකරණ කටයුතු කළමනාකරණය කිරීම පිණිස රාජ්‍ය සමාගමක් ස්ථාපනය කිරීමට භාණ්ඩාගාරයට බලය පවරා තිබුණද එම කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි.

නෙළුම් කුළුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වැඩ නිමකර 2017 ඔක්තෝබර් 31 දින භාරදිය යුතුව තිබුණද, 2020 අගෝස්තු 31 දින වන විටත් භාරදී නොතිබුණි. ඒ අනුව 2020 අගෝස්තු 31 දින වන විට ප්‍රමාද වූ කාලය දින 1035 ක් වුවද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අය කිරීම දින 200 කට පමණක් සීමා වී තිබුණි.

මූලික සැලැසුම් අනුව ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලැසුම් කර තිබුණද, සැලැසුම් කළ ආකාරයට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩොලර් 39,335,307 ක් ණය වාරික හා පොලී වශයෙන් කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. මෙසේ ණය හා වාරික ගෙවීමට සිදුවීම හේතුවෙන් ඒකාබද්ධ අරමුදලට කරන ලද ප්‍රේෂණ 2016 වර්ෂයට සාපේක්ෂව 2017, 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 5,200 ක්, රු.මිලියන 6,150 ක් හා රු.මිලියන 19,050 ක් වශයෙන් එකතුව රු. මිලියන 30,400 ක් අඩු වී තිබුණි.

නෙළුම් කුළුන ඉදිකිරීම සඳහා ණය මුදලක් ලබාගැනීම හේතුවෙන් එකඟතා ගාස්තු, කළමනාකරණ ගාස්තු, රක්ෂණ ගාස්තු හා 2019 දෙසැම්බර් 31 දිනට පොලී මුදල ලෙස පිළිවෙලින් එ.ජ.ඩොලර් 1,573,054 ක්, එ.ජ.ඩොලර් 797,895 ක්, එ.ජ.ඩොලර් 8,665,620 ක් හා එ.ජ.ඩොලර් 12,738,807 ක් ලෙස එකතුව එ.ජ.ඩොලර් 23,775,376 ක අතිරේකව දැරීමට කොමිෂන් සභාවට සිදුවී තිබුණි.

# පරිසරය

## අංශ

## වනජීවී

## පරිසර කළමනාකරණය

### නිරීක්ෂණ

- හිඟ ආදායම්
- වනඅලි මිය යාම
- වනඅලි සංචරණ පිවිසුම් (අලිමංකඩ) ඇති කිරීම
- විදුලි වැට ඉදිකිරීම
- හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය.
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය
- ජාතික පාරිසරික පනත සංශෝධනය කිරිම.
- පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය.
- තේක්ක ගස් අස්ථානගත වීම
- ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය
- ණයගැති ශේෂය
- මාදම්පිටිය පිරිපහදු පොම්පාගාරය
- තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම
- දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය
- කූට ලේඛණ උපයෝගී කරගෙන රජයේ ඉඩම් අවභාවිතා කිරිම
- පුත්තලම දිසාවේ වීරක්කුලිචෝලේ රක්ෂිතයෙහි අනවසර දැව හෙළීම.
- හුරුළු පරිසර වන උද්‍යානයෙන් බාහිර ස්වේච්ඡා සංවිධානයක් ආදායම් ඉපැයීම
- නව සංශෝධිත ප්‍රවේශපත්‍ර ගාස්තු නිසා හුරුළු පරිසර වන උද්‍යානයේ ආදායම් පහළ යාම
- වව්නියාව දිසා වන කාර්යාලයෙහි කළුගල් වැඩපලවල් පරීක්ෂාව.
- ශ්‍රී ලංකාවේ වන ආවරණය

# වනජීවී

වර්තමාන සහ අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම දැක්ම කරගත් සහභාගීත්ව කළමණාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම යන මෙහෙවර ඉටු කිරීම සඳහා සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වනජීවී සම්පත් සංරක්ෂණය
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම
- වඳවීයාමේ තර්ජනයට මුහුණ පාන සත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 7,641.40 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 6,191.89 ක් උපයොජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් එම කාලපරිච්ඡේදය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 18.97 ක් හෙවත් රු.මිලියන 1,449.51 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 63 හි දැක්වේ.




රූපසටහන 63 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## හිඟ ආදායම්

වනජීවී භාරය විසින් හෝටන්තැන්න හා යාල වනෝද්‍යානවල වනජීවි දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල ආපනශාලා පවත්වා තිබුණි. 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එම ගොඩනැගිලි වෙනුවෙන් රු.මිලියන 9.30 ක කුලිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි.

## වනඅලි මිය යාම

වන සතුන්, වෘක්ෂලතා හා ඒවායේ වාසභූමි වාණිජ ලෙස සහ වෙනත් අනිසි ලෙස භාවිතයට ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වන අලි ගහනය හා එහි පැවැත්මට බාධාකාරී වී තිබුණි. 2019 වර්ෂයේදී සමස්ථ අලි මරණ අතරින් ගිනි අවි භාවිතය, විදුලි සැර වැද්දවීම, හක්කපටස්, වසදීම් ආදිය හේතුවෙන් සියයට 50 කට වඩා වැඩි මරණ සංඛ්‍යාවක් සිදුවී තිබුණි.

සංවර්ධන කටයුතුවලට හා නීති විරෝධීව සිදුවන වන සංහාරය නිසාම භූමි පරිහරණ රටාවේ වෙනස්වීම්, භාවිත කළ හැකි සුපෝෂිත වාසස්ථාන පිරිහීම හා අවම වීම, අලින්ගේ ආහාර හිඟවීම නිසා අලි ගම්වැදීම හා සංවර්ධන කටයුතු නිසා අලිමංකඩ අවහිර කිරීම වැනි හේතු මත අලි මිනිස් ගැටුම සමාලෝචිත වර්ෂය අවසන් වන විට සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. අලි මිනිස් ගැටුම උග්‍රවීම හේතුවෙන් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි වර්ධනය වීම පිළිබඳ විස්තර රූපසටහන 64 හි දැක්වේ සිදුව තිබුණි.




රූපසටහන 64 - වනඅලි මරණ, මිනිස් මරණ හා දේපල හානිවල වර්ධනය

## වනඅලි සංචරණ පිවිසුම් (අලිමංකඩ) ඇති කිරීම

වනඅලින්ට නිදහසේ සංචරණය කිරීමට ඉඩ සැළසීම සඳහා 2019 සැප්තැම්බර් මාසය වන විට වනඅලි පිවිසුම් 3 ක් පමණක් ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදන මඟින් ප්‍රකාශයට පත් කර තිබුණි. 2015 මැයි මාසයේදී සිදුකළ වනඅලි මිනිස් ගැටුම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපෘති යෝජනාව මඟින් තවත් ව්‍යාපෘති 16 ක් හඳුනාගෙන, සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිවිසුම් 7 ක සමීක්ෂණ කටයුතු සිදු කර තිබුණි. නමුත් 2020 අගෝස්තු 31 දින

වන විටත් එක් වන පිවිසුමක් හෝ ප්‍රකාශයට පත් කිරීමට අපොහොසත් වී තිබුණි.

## විදුලි වැට ඉදිකිරීම

2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව විදුලි වැට 21 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 24.20 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2019 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරිම් වැඩ අවසන් කර නොතිබුණි. විදුලි වැට ඉදිකිරීමේදී ප්‍රජා එකඟත්වය ලබා ගැනීම හා අදාළ ඉඩම් නිරවුල් කිරීම පූර්ව කාර්යයක් වී තිබුණි. එම පූර්වකාර්යන් ඉටු නොකර විදුලි වැට ඉදිකිරීමේ කාර්යය සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. එම හේතුවෙන් මතු වී තිබුණු ගැටළු තත්ත්වයන් මත 2019 අගෝස්තු 31 දින වන විටත් විදුලි වැට 11 ක ඉදිකිරීම් කටයුතු අවසන් කිරිමට නොහැකි වී තිබුණි.

## හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය.

හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කර තිබුණු අලි 51 දෙනෙකුගෙන් අලි 15 දෙනෙකුගේ සෞඛ්‍ය තත්ත්වය දුර්වල මට්ටමක පැවැතු බව අලින් ඇතුළත් කරනු ලබන ලේඛනයේ සඳහන් කර තිබුණි. එසේ අසනීප තත්ත්වයෙන් පසුවූ අලින් පිළිබඳව කිසිදු පසුවිපරමක් කර නොතිබුණි.

2019 ජූනි මාසයේදී පවත්වන ලද අලි සංගණන වාර්තාවට අනුව හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කරන ලද අලින් 52 දෙදෙනෙකුගෙන් 09 දෙනෙකු පමණක් ඉතිරිව සිටි අතර, 12 දෙනෙකු විවිධ හේතූන් මත මියගොස් තිබුණි. ඉතිරි අලින් 31 දෙනා එම ස්ථානයෙන් පැන ගියා ද නැතහොත් මිය ගියා ද යන්න පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

# පරිසර කළමනාකරණය

තිරසාර පරිසරයක් උදෙසා ක්‍රියාත්මක වීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පරිසර ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම
- වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම
- පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
- සමුද්‍ර දූෂණ නිරාවරණ කටයුතු සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- වනාන්තර, වන සතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය
- රටේ දැව සපුරාලීම සඳහා වාණිජ වනවගා ප්‍රවර්ධනය
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය.
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 142,888.53 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 116,324.63 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 18.59 ක් හෙවත් රු.මිලියන 26,563.90 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 65 හි දැක්වේ.




රූපසටහන 65 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් ආයතන විසින් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි

විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමාඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතාවලට බලපෑමක් ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌනතාවයෙන් පෙළෙන දක්ෂිණ කළාපයේ කිරිඳිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන ශ්‍රී ලංකා රජය හා ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් 2007 නොවැම්බර් 27 දින අත්සන් කර තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) හරහා ලැබෙන විදේශ ණය එ.ජ.ඩොලර් 450,000,000 ක්, ශ්‍රී ලංකා රජය ලබාදෙන එ.ජ.ඩොලර් 79,059,198 හා රු.මිලියන 15,474.25 කින් සමන්විත වේ. ව්‍යාපෘතියේ සියළුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම හෝ නිම කිරීම නියමිත කාල රාමුව තුළ සිදුකිරීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.

## ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 41,886,000 ක් වන අතර ඉන් කොරියානු ණය ආධාර එ.ජ.ඩොලර් 33,536,000 ක් වන අතර එම ණය, වාර්ෂික පොළිය 0.15% ක් යටතේ වසර 10 ක සහන කාලයක් ඇතුළත්ව වසර 40 කින් ගෙවිය යුතු වේ. ව්‍යාපෘතියේ දේශීය අරමුදල් ප්‍රතිපාදනය එ.ජ.ඩොලර් 8,350,000 කි. මෙම ණය ගිවිසුම 2013 ජූලි 23 දින අත්සන් කර ඇති අතර වර්ෂ 04 (මාස 48) ක් ඇතුළත පොකුරු ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජනනය වන කසළ අවසාන ලෙස බැහැර කිරීම සඳහා පහසුකම් සැපයීමට සනීපාරක්ෂක කසළ රඳවන 04 ක් අනුරාධපුරයේ කීරික්කුලම, හික්කඩුව මොන්රෝවියාවත්ත, පානදුර මාලමුල්ල හා උඩුනුවර ගොනාධිකාවත්ත යන ස්ථානවල ඉදිකිරීමට සැලසුම්කර තිබුණි.

විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර සනීපාරක්ෂක කසළ රඳවන සඳහා ස්ථාන තෝරා ගැනීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම කටයුතු කර නොතිබූ අතර පානදුර මාලමුල්ල හා උඩුනුවර ගොනාධිකාවත්ත ඉදිකිරීම් වෙනුවට යාපනය කීරිමලේ හා මැදිරිගිරිය යුධගනාව යන ස්ථානවල මෙම කසල රඳවන ස්ථාපිත කිරීමට පමණක් ව්‍යාපෘතිය ආරම්භ කර වසර 2 ක් පමණ ගත වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු කාලානුරූපීව හා ඵලදායී ලෙස ළඟා කර ගැනීමට නොහැකි වී තිබූ අතර කසළ රඳවන ඉදිකිරීම් කටයුතු මේ වන විටද ආරම්භ කර නොතිබුණි.

2020 ජූලි 03 දිනැති අංක 20/0933/227/013-i දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර තිබුණි. මේ දක්වා ව්‍යාපෘතියේ මූලික අවශ්‍යතාවයන් වෙනුවෙන් වියදම් කර ඇති රු. මිලියන 457 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

## පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හී ඇති සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කර කළමනාකරණය කිරීම තුළින් ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) මගින් සපයනු ලැබූ එ.ජ.ඩොලර් මිලියන 45 ක ණය මුදලක් මගින් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ව්‍යාපෘති සංරචක ලෙස නියමු භූදර්ශන සැලැසුම් සැකසීම හා කළමනාකරණය, ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම සහ මිනිසාගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම සඳහා අලි මිනිස් සහජීවනය, රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික කුසලතා සංවර්ධනය හා ව්‍යාපෘති කළමනාකරණය දක්වා ඇත. ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය ප්‍රතිපාදිත මුදලින් සියයට 24 ක අවම මට්ටමක් පැවතුණ අතර ව්‍යාපෘති කාලය සියයට 70 ක් ද, ඉක්මවා තිබුණි.

## ජාතික පාරිසරික පනත සංශෝධනය කිරිම.

ජාතික පාරිසරික පනත සංශෝධනය කිරිමේ කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය නිම කර නොතිබුණි.

## පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය.

පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම අතරමග නවතා තිබුණි. අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඇති වන අතුරුඵලයක් වන කොම්පෝට් පොහොර නිෂ්පාදනය තුළින් රසායනික පොහොර භාවිතය අවම කිරිම පිළිබඳව ප්‍රමුඛතාවට ලබාදීම පාරිසරික පනතට අනුව බලතල ලැබී තිබුණද, ඒ සඳහා අවධානය යොමු වී නොතිබුණි.

## තේක්ක ගස් අස්ථානගත වීම

2015 වර්ෂයේදි රාජ්‍ය දැව සංස්ථාවේ මින්නේරිය ප්‍රාදේශීය කාර්යාලය යටතේ සිදුකරනු ලැබූ හල්මිල්ලැව වැඩ බිමෙහි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ තේක්ක ගස් 7,840 ක් සංස්ථාවට සැපයීමේදී ඉන් ගස් 69 ( 358,890 $dm^3$) ක් අස්ථානගත කිරීම හේතුවෙන් සංස්ථාවට රු.මිලියන 2.99 ක පාඩුවක් සිදුවී තිබුණි.

## ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය

රාජ්‍ය දැව සංස්ථාවේ බුස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණය සඳහා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කර ගැනීමට කොන්ත්‍රාත්කරුවන් හය දෙනෙකු වෙත ලබා දී තිබුණු අත්තිකාරම්වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.මිලියන 13.78 ක ශේෂයක් පැවැතුණි. එම ශේෂය පියවා ගැනීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙතින් ඊට සමාන වටිනාකමට භාණ්ඩ සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශයට අනුව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 කට නොවැඩි වටිනාකමක් අත්තිකාරම් ගෙවිය හැකිව තිබුණත්, එම සීමාව ඉක්මවා කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 54.4 ක සිට සියයට 80.2 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි.

ගබඩාව තුළ රු.මිලියන 10.51 ක් වටිනා ගෘහ භාණ්ඩ තිබියදී ඒවා විකිණීමට සුදුසු තත්ත්වයට පත් නොකර එම ගෘහභාණ්ඩ අයිතම නිෂ්පාදනය සඳහා නව ගිවිසුම්වලට එළඹ තිබුණු අතර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරවාගෙන අලෙවි කිරිමට කටයුතු කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නිෂ්පාදනාගාරයෙන් ගබඩාව වෙත ලබා දී තිබූ රු.මිලියන 14.90 ක ගෘහ භාණ්ඩ තොගයක් ගබඩාව තුළ දිර්ඝකාලීනව රඳවා ගැනීම හා එම ගෘහ භාණ්ඩ ක්‍රමවේදයකින් තොරව හා අනාරක්ෂිතව ගබඩාවේ තැන තැන ගොඩගැසීම නිසා පළුදුවීම්වලටද ලක් වී අලෙවි කිරීමට නුසුදුසු තත්වයට පත්ව තිබුණි.

2019 ජනවාරි මාසයේ සිට 2019 දෙසැම්බර් 17 දින දක්වා කාලය තුළ බුස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණයේ නිෂ්පාදන කටයුතුවලින් සියයට 88 ක් කොන්ත්‍රාත් පදනම මත බාහිර කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉටු කර ගෙන තිබුණි. නිෂ්පාදන කටයුතුවලින් සියයට 12 ක් පමණක් සංස්ථා සේවකයින්ගෙන් ඉටු කරවා ගෙන තිබුණි. මෙම කාල සීමාව තුළ ගෘහ භාණ්ඩ සංකීර්ණයේ සේවයේ නියුතු සේවකයින් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 10.85 ක් ගෙවා තිබුණි. ඒ අනුව සංස්ථා සේවකයින්ගෙන් නිෂ්පාදන කටයුතු සඳහා දායකත්වය අවම මට්ටමක පැවති අතර ඔවුන්ගේ වැටුප් දීමනා ඇතුළු වියදම් නිෂ්පාදන පිරිවැයට එකතු කර තිබුණි. ලැබී තිබූ නිෂ්පාදන ඇණවුම්වලින් සියයට 93 ක ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් ලැබී තිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණේ සියයට 7 ක් ඉතා අඩු ප්‍රමාණයකි. එහෙත් සංස්ථාව පෞද්ගලික අංශයේ ඉල්ලුම වැඩිකර ගැනීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

### ණයගැති ශේෂය

පෞද්ගලික සමාගමකින් රු.මිලියන 11.87 ක මුදලක් වර්ෂ 36 ක් මුළුල්ලේ හිඟහිටව පැවැතුණි. එම ණයගැති ශේෂය කපා හැරීම සඳහා 2012 සැප්තැම්බර් 06 දින එවකට පරිසර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා ප්‍රතිචාරයක් ලැබී නොතිබුණි.

### මාදම්පිටිය පිරිපහදු පොම්පාගාරය

මාදම්පිටිය පිරිපහදු පොම්පාගාරය වෙත පිටස්තර ආයතනවල මළ සහ අපජලය රැගෙන එනු ලබන බවුසර්වලින් ලබාගන්නා නියැදි අතුරින් කිහිපයක් පමණක් එම ස්ථානයේ ස්ථාපිත කර තිබුණු විද්‍යාගාරය තුළ පරීක්ෂණයන්ට ලක්කරනු ලබයි. එහිදී බොහෝවිට අපජලයේ PH අගය පමණක් පරීක්ෂා කරනු ලබයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිව එක් පරීක්ෂණ නිලධාරිනියක් පමණක් සේවය කරනු ලබන මෙම විද්‍යාගාරය මඟින් කරනු ලබන පරීක්ෂණ ප්‍රතිඵල රහිත ක්‍රියාවක් වී තිබුණි. එම පොම්පාගාරයට බැමට පෙර නියමිත ප්‍රමිතියෙන් තොර අපජලය සහිත බවුසර් හඳුනාගැනීමට නොහැකි වීම හේතුවෙන් සමුද්‍ර දූෂණය වැලැක්වීමට අපහසු වී තිබුණි.

### තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා දර්ශක 05 ක් හඳුනාගෙන තිබූ අතර ප්ලාස්ටික් පොලිතින් භාවිතය අවම කිරීමට නිවැරදි විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. පරිසර අමාත්‍යාංශ මට්ටමින් ක්‍රමවත් වැඩපිළිවෙලක් නොවීම හේතුවෙන් ඉලක්ක සපුරා ගැනීමේ ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබුණි.

### දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියට අදාළ මාස 73 ක් වූ කාලයෙන් මාස 65 ක් ගතවී තිබුණු අතර එය මුළු කාලයෙන් සියයට 89 ක් වී තිබුණද ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනය වූ එ.ජ.ඩොලර් මිලියන 110 කින් එ.ජ.ඩොලර් මිලියන 79.32 ක් හෙවත් රු.මිලියන12,388.92 ක් පමණක් වැය කර තිබුණි. එය සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 72.1 ක් වී තිබුණි. ඒ අනුව මුළු ප්‍රතිපාදනයෙන් සියයට 27.9 ක් මාස 08 ක් තුළ උපයෝජනය කළ යුතුව තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩ අවසන් විය යුතු වටිනාකම රු.මිලියන 1,540.7 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 30 ක වැඩ අවසන් නොවී පැවති අතර, තවදුරටත් කෙරීගෙන යන වැඩ ලෙස පැවතුණි. එම පැකේජයන්හි මාස 01 ක සිට මාස 34 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

### කූට ලේඛණ උපයෝගී කරගෙන රජයේ ඉඩම් අවභාවිතා කිරීම

පුද්ගලයෙකු විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුරාධපුර දිසාවේ අක්කර 10,000 ක් පමණ රජයේ ඉඩම් විවිධ පාර්ශවයන්ගේ සහාය ලබා ගෙන කූට ලේඛන උපයෝගි කරගෙන වංචනික ලෙස තම නමට පවරා ගෙන විකිණීමට කටයුතු කර තිබුණි. එම දේපල මත බැංකු හා මූල්‍ය සමාගම් වෙතින් ද ණය පහසුකම් ලබා ගෙන තිබුණි. එසේ විකුණන ලද ඉඩම්වල මූල්‍ය වටිනාකම දළ වශයෙන් රු.මිලියන 2,000 ක් පමණ වී තිබුණි. මේ සම්බන්ධයෙන් කැබැතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණයේ බී වාර්තා අංක 405/2018 යටතේ ද කරුණු වාර්තා කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳුමක් ලබා ගෙන නොතිබුණි.

### පුත්තලම දිසාවේ වීරක්කුලිචෝලේ රක්ෂිතයෙහි අනවසර දැව හෙලීම.

පුත්තලම දිසාවේ ඉහත රක්ෂිතය හෙක්ටයාර් 23,354 ක භූමි ප්‍රමාණයක ව්‍යාප්ති වී තිබුණි. වන රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (FRMP) මඟින් මැනුම් කර 2013 ඔක්තෝබර් 28 දිනැති අංක 1834/13 දරන ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මඟින් රක්ෂිතයක් ලෙස ප්‍රකාශ කර තිබුණි.

රක්ෂිතයෙහි අනවසර දැව හෙලීමක් 2016 අග භාගයේදී හා 2017 වර්ෂයේ මුල භාගයේදී සිදු වී තිබුණු අතර අනවසර දැව හෙලීම් සම්බන්ධව 2018 මැයි 11 දින සිට 2020 ජුනි 30 දින වන විට වර්ෂ 02 කටක් වැඩි කාලයක් මුළුල්ලේ මූලික විමර්ෂන කණ්ඩායම් 04 ක් පත්කර තිබුණද, ඒ එක් එක් කමිටු විසින් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

රක්ෂිතයෙන් හෙලීම් කර ඉවත් කරගෙන තිබුණු පලු හා වෙනත් ගස් 1,443 කින් ගස් 139 ක දැව පරිමාව ඝන මීටර් 263,977 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.මිලියන 6.93 ක් ලෙස හඳුනා ගෙන තිබුණි. අනෙකුත් ගස් 1,304 හි දැව පරිමාව හා මූල්‍යමය වටිනාකම ගණනය කර නොතිබුණි.

වන අපරාධකරුවන් විසින් වීරක්කුලිචෝලේ රක්ෂිතයෙන් හෙලීම් කර ඉවත් කරගෙන ඇති දැව රැගෙන ගිය හෝ එම දැව දැනට පවතින ස්ථානයක් හෝ හෙලිදරව් කර ගෙන නොතිබුණු අතර වන අපරාධකරුවන් සොයා ඔවුන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම ද සිදු කර නොතිබුණි.

### හුරුළු පරිසර වන උද්‍යානයෙන් බාහිර ස්වේච්ඡා සංවිධානයක් ආදායම් ඉපැයීම

හුරුළු පරිසර වනාන්තරය 2008/10/21 දින අංක 1572/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණු අතර අංක 1767/03 හා 2012.07.16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංරක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. මෙම සංරක්ෂිතය හෙක්ටයාර් 18,268 ක වපසරියකින් යුක්ත වන අතර ඉන් හෙක්ටයාර් 2,700 ක් පමණ වූ ප්‍රමාණයක හුරුළු පාරිසරික වන උද්‍යානය පිහිටා ඇත.

2006 වර්ෂයේ සිට මෙම උද්‍යානය තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ නොමැති බාහිර ස්වේච්ඡා සංවිධානයක් ක්‍රියාත්මක වන අතර ඔවුන් විසින් දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් මාර්ගෝපදේශන ගාස්තුවක් අය කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවට අයත් වන උද්‍යානයකින් රජයට ලැබිය යුතු ආදායමක් රාජ්‍ය අනුග්‍රහය හෝ අනුමැතියක් නොමැතිව ඉහත ස්වේච්ඡා සංවිධානය විසින් 2006 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින වන විට ආදායම් උපයා තිබුණි. එහි මුළු වටිනාකම කොපමණද යන්න නිශ්චිතවම සනාථ කර ගැනීමට නොහැකි වූ අතර 2012 වර්ෂයේ සිට 2020 මාර්තු මාසය දක්වා පමණක් ස්වේච්ඡා සංවිධානය ආසන්න වශයෙන් රු.මිලියන 92.98 ක ආදායමක් උපයා තිබුණි.

දෙපාර්තමේන්තුව විසින් සංචාරකයින්ට සැපයිය යුතු සේවාවක් අනියම් ආකාරයට බාහිර ස්වේච්ඡා සංවිධානයක් මඟින් සිදු කිරීමට ඉඩ ලබාදී රජයට උපයාගැනීමට හැකියාව ඇති ආදායමක් වලක්වා තිබුණු අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා අනවශ්‍ය ලෙස මැදිහත් වීමට ඉහත ස්වේච්ඡා සංවිධානයට ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබුණි. දෙපාර්තමේන්තුවේ අනුබද්ධිත ආයතනයක් ලෙස හැඟෙන පරිදි දෙපාර්තමේන්තුවේ නමද යොදාගනිමින් ලිපි ශීර්ෂ භාවිතා කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කීර්තිනාමයටද බලපෑමක් මෙම සංවිධානය විසින් සිදු කර තිබුණි.

### නව සංශෝධිත ප්‍රවේශපත්‍ර ගාස්තු නිසා හුරුළු පරිසර වන උද්‍යානයේ ආදායම් පහළ යාම

දෙපාර්තමේන්තුව ප්‍රවේශ පත්‍ර ගාස්තු සංශෝධනය කර එමඟින් රාජ්‍ය ආදායම සියයට 20 කින් වැඩි කර ගැනීමට උත්සහ කර තිබුණද මෙම උද්‍යානයේ සංශෝධිත ප්‍රවේශ පත්‍ර මිල ගණන් අඩු වීම නිසා 2019 දෙසැම්බර් 16 දින සිට 2020 ජනවාරි 31 දක්වා කාලපරිච්ඡේදය තුළ පමණක් දෙපාර්තමේන්තුවට අහිමි වූ ආදායම රු.මිලියන 13.07 ක් වී තිබුණි.

### වව්නියාව දිසා වන කාර්යාලයෙහි කළුගල් වැඩපලවල් පරීක්ෂාව.

ඉහත දිසා වන කාර්යාලය අයත් කළුගල් වැඩලපවල් අතරින් නියැදි භෞතික පරීක්ෂණයක් සිදු කරන ලද අතර ඒ සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ භූ විද්‍යාඥයින් තිදෙනකුගේ සහාය ලබා ගැනීමට කටයුතු කරන ලදි. වනජ ද්‍රව්‍ය මැනීම සඳහා වර්තමානයේ දියුණු රටවල් භාවිතා කරනු ලබන EDM (Electronic Distance Measurement) උපකරණය මැනුම් කිරීම සඳහා භාවිතා කරන ලද අතර එම මිනුම් දත්ත උපයෝගී කර ගනිමින් කළුගලෙහි අන්තර්ගත සැබෑ කියුබ් ප්‍රමාණය ගණනය කර ගන්නා ලදි.

දිසාවට අයත් බලපත්‍රලාභීන් විසින් කළුගලෙන් දැනට කඩා ඉවත් කර ඇති

කළුගල් ප්‍රමාණය ගණනය කිරීමේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගනිමින් 2009 වර්ෂයේ DEM (Digital Elevation Model) දත්ත පදනම් කර ගන්නා ලද අතර 2019 වර්ෂයේදී EDM උපකරණය මඟින් GPS පාඨාංක පදනම් කර ගත් මිනුම්කරන ලද දත්තයන් ද පදනම් කර ගන්නා ලදි. ඒ අනුව 2009 හා 2019 අතර කාල පරාසයන්හි ගණනය කරන ලද කියුබ් ප්‍රමාණයන් අතර වෙනස කළුගලෙන් දැනට කඩා ඇති සම්පූර්ණ කළුගල් කියුබ් ප්‍රමාණය ලෙස නිරීක්ෂණය කරන ලදි.

ඒ අනුව වව්නියාව දිසා වන කාර්යාලයේ කළුගල් වැඩපලවල් පවත්වා ගෙන යන බලපත්‍රකරුවන් විසින් අනුමත බලපත්‍ර සීමාවන් ඉක්මවා වැඩිපුර කළුගල් කැඩීම සිදු කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම කළුගල් වැඩපලවල් විධිමත් අධීක්ෂණයක් සිදු කර නොතිබූ අතර එමගින් රජයට අයවිය යුතු හිඟ ගාස්තු අයකර ගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකාවේ වන ආවරණය

තිරසාර සංවර්ධන අරමුණු 15.2 යටතේ 2020 වන විට සියළුම වර්ග වල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම, ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශයට පත්වූ වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය හා නැවත වන වගාව වර්ධනය කිරීම මෙම අංශයෙන් දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මුළු වන ආවරණය මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 35.12 ක් ලෙස ගූගල් චන්ද්‍රිකා ඡායාරූප යොදාගෙන on screen digitizing ක්‍රමය යටතේ හඳුනාගෙන තිබුණි. එම යොදා ගත් ක්‍රමවේදය වෙනසකට භාජනය කරමින් නැවතත් වන ආවර්ණ සිතියමක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණු අතර ඒ අනුව මුළු දිවයිනේ වන ආවර්ණය සියයට 29.3 ක් ලෙස හඳුනාගෙන තිබුණි.

2030 වර්ෂය වන විට මුළු වන ආවර්ණය සියයට 32 ක් දක්වා ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරනු ලැබුවද, රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් නිදහස් කිරීමට සිදුවී තිබීමෙන් වන ආවර්ණයෙහි ශුද්ධ වැඩිවීමක් ලගා කර ගැනීමට නොහැකි වී තිබුණි. 2010 - 2015 වර්ෂයන්හි පමණක් දෙපාර්තමේන්තුව සතු ඉඩම් හෙක්ටයාර් 26,158 ක් නිදහස් කර තිබුණි.

# ප්‍රාදේශීය සංවර්ධනය

## අංශ

ග්‍රාමීය ආර්ථික කටයුතු

ප්‍රාදේශීය පරිපාලනය

## නිරීක්ෂණ

- විමධ්‍යගත අයවැය
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන
- ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන
- හරිත සමාජ ක්‍රියාකාරකම් වැඩසටහන
- ව්‍යාපෘති ඉටු නොකිරීම
- වත්කම් ඌන උපයෝජනය
- පාඩු හා හානි

# ග්‍රාමීය ආර්ථික කටයුතු

කෘෂිකාර්මික, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධනය, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ එක් වැයශීර්ෂයක් ලෙස ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහන් කර තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ලෙස එහි දක්වා තිබුණි. එමෙන්ම ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය, ගෘහස්ත ආර්ථිකය වැඩසටහන යටතේ විමධ්‍යගත අයවැය, යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 172,225.36 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 102,825.55 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40.30 ක් හෙවත් රු.මිලියන 69,399.81 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 66 හි දැක්වේ.




රූපසටහන 66 පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### විමධ්‍යගත අයවැය

යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රජාවගේ සමාජ ආර්ථික ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණ ඇතිව එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත වාර්ෂිකව රු.මිලියන 10 ක ප්‍රතිපාදන සළසා දී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී ව්‍යාපෘති 21,263 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 2,350 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනුමත කර තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,418 ක් උපයෝජනය කර ව්‍යාපෘති 20,612 ක් නිම කර තිබුණි. ඒ අනුව අනුමත කර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 40 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර අනුමත ව්‍යාපෘතිවලින් 651 ක කටයුතු අවසන් කර නොතිබුණි.

### ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අයවැය ඇස්තමේන්තු මඟින් රු.මිලියන 13,825 ක ප්‍රතිපාදන සලසා තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා අමාත්‍යාංශ ලේකම්වරුන්ට ව්‍යාපෘති 8,248 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 13,154 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති 4,528 ක් වැඩ නිම කරමින් රු.මිලියන 4,584 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 63.69 ක් උපයෝජනය කර නොතිබුණු අතර ව්‍යාපෘති 3,272 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2019 වැඩසටහන, යටිතල පහසුකම් ගුණාත්මක තත්ත්වය දියුණු කරමින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා උපකාර කිරීම සහ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් රු.මිලියන 48,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 47,283 ක ඇස්තමේන්තු වටිනාකමකින් යුත් ව්‍යාපෘතීන් 117,354 ක් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘති 105,203 ක් ක්‍රියාත්මක කර රු.මිලියන 34,480 ක් වටිනාකමින් යුතු ව්‍යාපෘති 101,391 නිම කර තිබුණු අතර ව්‍යාපෘති 12,151ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

# ප්‍රාදේශීය පරිපාලනය

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා ඒ යටතේ වන පළාත් සභා 09, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් හා ව්‍යවස්ථාපිත ආයතන දෙකක් මගින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන්, නිලධාරීන් සහ සේවකයින් පුහුණු කිරීම
- පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්
- පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම
- පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයන්හි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරකම්, ව්‍යාපෘතීන්, වැඩසටහන් හා සම්පත් සම්බන්ධිකරණය කිරීම
- උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 800,087.00 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 725,536.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 9.32 ක් හෙවත් රු.මිලියන 74,550.26 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 67 හි දැක්වේ.




රූපසටහන 67 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## හරිත සමාජ ක්‍රියාකාරකම් වැඩසටහන

කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 03 ක, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 02 ක හරිත සමාජ ක්‍රියාකරකම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මඟින් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 9.11 ක් උපයෝජනය කර නොතිබුණි.

## ව්‍යාපෘති ඉටු නොකිරීම

- මහියංගනය ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රු. මිලියන 2.21 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කළ බතලයාය විද්‍යාලයේ අත්පන්දු ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පස්සර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3.60 ක් වූ මහජන ක්‍රීඩාංගනයේ පැති බැම්ම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් විටිනාකම රු. මිලියන 3.97 හා රු.මිලියන 3.64 ක් වූ ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

- බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත ග්‍රාම නිලධාරි, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ට පහසුකම් සහිත කාර්යාල ලබාදීමේ අරමුණින් 2015 හා 2016 වර්ෂවල රු.මිලියන 10.75 ක් වැයකර ආරම්භ කර තිබුණු බහුකාර්ය ගොඩනැගිලි 4 ක්, සේවා පියස 5 ක් හා නිල සෙවන ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන් වැඩ අවසන් නොකර අතර මග නවතා දමා තිබුණි.

- කළුතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 108.48 කට 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2018 වර්ෂයේදී එහි වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් වැඩ අතරමග නවතා දමා තිබුණු අතර මුළු වැඩ ප්‍රමාණයෙන් සියයට 22.5 ක ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 42.90 ක් වියදම් කර තිබුණි.

- කිලිනොච්චි, පච්චිලෙයිපල්ලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජාතික ජලසම්පාදන ව්‍යාපෘතිවලට ඉඩම් මිලදී ගැනීම සඳහා ඉකුත් වර්ෂ 4 ක සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 2.15 ක් ලබා දී තිබුණි. එම කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු නොකර ලැබී තිබුණු මුදල් තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

- ඔකෙවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි සැලැසුම් කිරීමේදී හා ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීමේදී භූමිය සහ සේවාදායකගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි. එම හේතුවෙන් ඉදිකිරීම් සිදුකිරීමේදී ගොඩනැගිලි සැලැස්මේ වෙනස්කම් සිදුකර තිබූ අතර, අමතර වැඩ ලෙස අයිතම 72 ක් සඳහා රු.මිලියන 5.40 ක් ගෙවා තිබුණි. තවද, පළමු ලංසුකරු සාවද්‍ය ලේඛන ඉදිරිපත් කිරීම මත එම කොන්ත්‍රාත්තුව අවලංගුකර දෙවන ලංසුකරුට පැවරීම

හේතුවෙන් රු.මිලියන 3.68 ක අමතර වියදමක් කර තිබුණි.

- හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් රු.මිලියන 188 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම 2017 වර්ෂයේදී අතරමග අත්හිටුවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නැවත වැඩ ආරම්භ කර නොතිබුණි.

## වත්කම් ඌන උපයෝජනය

- පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොරකාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.මිලියන 7.52 ක් වියදම් කර තිබුණි. එම ක්‍රීඩා පිටිය ප්‍රයෝජනයට ගතහැකි වන ආකාරයට සකස්කර නොතිබුණු අතර නඩත්තු කටයුතු නිසි ආකාරයෙන් සිදු කර නොතිබුණි. ඉටු කර තිබුණු සංවර්ධන කටයුතු විනාශවෙමින් පැවැතුණි.

- පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත ග්‍රාම නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ට පහසුකම් සහිත කාර්යාල ලබාදීමේ අරමුණින් 2014-2016 අතර කාලය තුළ රු.මිලියන 19.09 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිලි 9 ක් හා සේවා පියසක් 2020 ජුනි 10 දින වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි.

- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තලතෙල් නිෂ්පාදන යන්ත්‍රයක් 2018 වර්ෂයේදී රු.4,978,350 කට මිලදී ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා තලතෙල් නිෂ්පාදනයට අදාල යන්ත්‍ර භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- 2019 වර්ෂයේ නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ හින්දු සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මඩු ප්‍රදේශයේ පළතුරු යුෂ නිෂ්පාදනය කිරීමේ අරමුණින් රු.මිලියන 15.95 ක් වටිනා යන්ත්‍ර මිලදීගෙන මඩු සමූපකාර සංගමයට ලබාදී තිබුණි. එම යන්ත්‍ර අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂයකට අධික කාලයක් සිට නිෂ්කාර්යව පැවතුණි.

- මන්නාරම් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ අරමුදලින් ඉදිකළ රු.මිලියන 151.60 ක් වටිනා නිවාස 208 ක් භාවිතයට ගෙන තිබුණි. නිවාස භාරගත් අයවලුන් විසින් ඒවා නඩත්තු කර නොතිබීම හා නුසුදුසු ස්ථාන තේරීම නිසා වර්ෂ 05 කට අධික කාලයක් සිට එම නිවාස හානියට පත්වී තිබුණි.

- මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ දීර්ඝ කාලයක් අවතැන්වූ සිංහල මුස්ලිම් ජනතාව සඳහා යටිතල පහසුකම් වැඩසටහන යටතේ රු.මිලියන 2.00 ක ඇස්තමේන්තුවක් මත ඉඩමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවූ ඉඩමක පෙර පාසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 1.98 ක් වැය කර තිබුණි. 2018 දෙසැම්බර් මාසයේදී එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණද, එය භාවිතයට ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩමේ අයිතිය පවරා

ගැනීමට එලදායී ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

- 2017 වර්ෂයේදී හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපකාර්යාල 02 ක් රත්ගම හා මාදම්පාගම කුළී ගොඩනැගිල්ලක ආරම්භ කර තිබුණි. 2019 ජුනි මාසය වන විට උපකාර්යාල දෙකෙහි නඩත්තු කටයුතු සඳහා එකතුව රු.මිලියන 8.33 ක් වැය කර තිබුණි. කෙසේවුවත්, එම උපකාර්යාල මගින් ගර්භනී කාන්තාවන් සඳහා පෝෂණ මුද්දර නිකුත් කිරීම හා ග්‍රාම නිලධාරී සහතික නිකුත් කිරීමේ කාර්යයන් පමණක් සිදුකර තිබුණි.

- ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 4.88 ක් වූ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බයිසිකල් නැවතුම් ස්ථානය අලුත්වැඩියා කිරීමේ ප්‍රසම්පාදනය කරගහකාරී ලංසු කැඳවීමකින් තොරව රු.මිලියන 4.64 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

### පාඩු හා හානි

- ගාල්ල දිස්ත්‍රික් ලේකම් නිල නිවස සංරක්ෂණය සඳහා ගේබියන් බැම්ම සුදුසු ප්‍රමිතියකට අනුව ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් 2019 ඔක්තෝබර් මාසයේ දින 02කදී බැම්ම හානියට පත්වීමෙන් රජයට රු.මිලියන 7.69 ක පාඩුවක් සිදුවී තිබුණි.

- අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියන්ගස්තොට ප්‍රදේශයේ පවත්වා ගෙන යන කළුගල් වැඩබිමේ 2017 ඔක්තෝබර් මාසයේ සිට 2019 ඔක්තෝබර් මාසය දක්වා පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑ.26,244 ක් නිකුත් කර තිබුණි. එසේ වුවද, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන් 2019 ඔක්තෝබර් මාසයේ දී කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව කැණීම් කරන ලද මුළු කළුගල් පරිමාව කියුබ් 12,656 ක් වූ අතර ඒ සඳහා වැයවන අවම පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑම් 6328 ක් වී තිබුණි. ඒ අනුව ඉතිරි පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑම් 19,916 ක් හෙවත් නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 76 ක අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය යොදා ගෙන තිබුණු කාර්යයන් අනාවරණය නොවුණි.

- ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවත්වා තිබුණු කළුගල් වැඩබිම, අංක 240 දරන අවසන් ගම් පිඹුරේ තම පුද්ගලික සීමාව ඉක්මවා රජයේ සීමාවේ හෙක්ටයාර් 0.6227 ක භූමියේ කැණීම් සිදුකර තිබුණි. එසේ අනවසරයෙන් කැණීම්කළ කළුගල් කියුබ් 10,911 ක් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ගාස්තු අයකරගෙන නොතිබුණි.

# සමාජ ආරක්ෂණය

## අංශ

ප්‍රජා සංවර්ධනය

සමාජ සහන

සමාජ ආරක්ෂාව

## නිරීක්ෂණ

- සමෘද්ධි සහනාධාර වැඩසටහන
- අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ටවැඩි පුරවැසියන් සඳහා දීමනාවක් ලබාදීම
- ආබාධිත දීමනාව ගෙවීම
- ආබාධ සහිත තැනැත්තන්ට ගොඩනැගිලිවලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම
- නිෂ්කාර්යව පැවැති ඉඩම්
- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය
- ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීම
- පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරිම
- ග්‍රාම සංවර්ධන පර්යේෂණ සහ අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාර පවත්වා ගැනීම
- ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය
- හිඟහිටි සේවක ණය
- පොරොත්තු අනුපිළිවෙලින් බැහැරව සමෘද්ධි සහනාධාර ප්‍රදානය කිරිම
- කොට්ටාව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය ඉදිකිරීම
- මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම
- කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම
- අභ්‍යාසලාභීන්ට මෙවලම් කට්ටල ලබාදීම
- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ ආධාර වැඩසටහන
- කාන්තා හා ළමා අපයෝජන සහ හිංසන සම්බන්ධයෙන් කටයුතු කිරිම
- ළමුන්ගේ සුරක්ෂිතභාවය ඇති කිරිමට සිවිල් සමාජය ශක්තිමත් කිරිම
- වියළි කළාප සංවර්ධන ව්‍යාපෘතිය
- ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති සම්පාදනය නොකිරීම
- ළමා නිවාස පුනරුත්ථාපනය
- පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදය
- ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත නොකිරීම

- මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු නොකිරීම
- රජයේ සේවක විශ්‍රාම වැටුප ආර්ථිකයට වන බලපෑම
- අරමුදල් පරිපාලනය
- කොළඹ මහා නගර සභාව සඳහා ගිනි නිවීමේ වාහන හා උපකරණ සැපයීම

# ප්‍රජා සංවර්ධනය

ජීවිතයේ ගුණාත්මකභාවය නංවනු වස්, ආයතනයන් සේවා ජාලයන් හා වෘත්තිකයන් හරහා ප්‍රබලවූත්, කාර්යක්ෂමවූත් වේගවත් හා ඵලදායීවූත් ජනහිතකාමී සාමාජීය හා ආර්ථිකමය සේවාවන් සළසනු පිණිස දේශීය හා ගෝලීය නියෝජිතායතනයන් සමඟ එක්ව, නිර්මාණාත්මක ක්‍රමවේද ඔස්සේ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල උත්පාදනය කිරීම,එම ප්‍රතිඵල අත්පත් කර ගැනීම යන ප්‍රජා සංවර්ධන කටයුතු වෙනුවෙන් ජාතික වශයෙන් ක්‍රියාත්මකවීම මෙම අංශයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි.

එම අරමුණ ඉටු කිරිම සඳහා ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා ඒයටතේ වන දෙපාර්තමේන්තු 03 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, අගය එකතු කිරිම, අපනයන වෙළෙඳපොළ අවස්ථා වැඩිදියුණු කිරිම සහ කර්මාන්ත සුරක්ෂිතතාවය ඇති කරමින් ගොවීන්, ධීවරයින් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරිම සඳහා උපාය මාර්ග සම්පාදනය කිරිම.
- අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය කිරිම.
- කෘෂිකාර්මික සංවර්ධන කළාප සහ ධිවර අපනයන සංවර්ධන කළාප සඳහා පහසුකම් සැපයීම
- වැඩිහිටියන් රැකබලා ගැනීම හා ආරක්ෂණය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවයන් හඳුනා ගැනීම සහ පුනරුත්ථාපනය සිදුකිරීම.
- සමෘද්ධි වැඩ සටහන ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශිය ආර්ථික සංවර්ධනය කිරිම
- මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරිම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණය හඳුන්වා දීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට,පිළිකා හා තැලිසීමියා රෝගීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම.
- සමාජ ආරක්ෂණ හා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරිම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පාර්ලිමේන්තුව විසින් එකතුව රු.මිලියන 228,020.02 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 209,884.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.95 ක් හෙවත් රු.මිලියන 18,135.51ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 68 හි දක්වා ඇත.




රූපසටහන 68 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## සමෘද්ධි සහනාධාර වැඩසටහන

2018 වර්ෂයේදී දිවයිනපුරා විසිරී සිටින දිවි නැගුම හා සමෘද්ධි සහානාධාරලාභී පවුල් ගණන 1,384,021 ක් වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රමාණය 416,161 කින් හෙවත් සියයට 30.06 කින් වැඩි වී පවුල් 1,800,182 ක් වී තිබුණි. එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධන අරමුණු 1.1 හි සඳහන් පරිදි 2030 වන විට සියළු ප්‍රදේශවල සිටින අන්ත දුගී බවෙන් පෙළෙන සියළුම මිනිසුන්ගේ දුගීකම පිටුදැකීම සිදු කළ යුතුව තිබුණත්, 2015 ශ්‍රී ලංකාවේ සමෘද්ධිලාභී පවුල් ගණන 1,453,078 ක් සිටියත් 2019 වර්ෂය අවසාන වන විට පවුල් ගණන 1,800,182 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම 2015 වර්ෂයේදී පෝෂණ දීමනාව ලබාගත් ප්‍රතිලාභීන් ගණන 101.200 ක් වී තිබුණත්, එය 2019 වර්ෂය වන විට 300,246 ක් දක්වා වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 69 හි දැක්වේ




රූපසටහන ..... - සමෘද්ධි සහනාධාර ගන්නා පවුල් ගණන
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2019

## අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ටවැඩි පුරවැසියන් සඳහා දීමනාවක් ලබාදීම

ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන අවුරුදු 70 ඉක්මවූ රු.3000 ට වඩා අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයෙකුට රු.2,000 ක් බැගින් මාසික දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වැඩිහිටියන් 416,667 දෙනෙකුට රු.මිලියන 9,855.5 ක ප්‍රතිලාභ ගෙවා තිබුණු අතර, තවත් පොරොත්තු ලේඛන ගතව වැඩිහිටියන් 157,720 කට ප්‍රතිලාභ ගෙවීමට නොහැකි වී තිබුණි. 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම දීමනාවෙන් රු.100 ක් අඩුකර ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන රු.502.8 ක් එම අරමුදලින් ගොඩනගන ලද වැඩිහිටි අරමුදලට බැරකර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. බිලියන 1.93 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එම අරමුදලින් වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් වූ කාර්යයන් 14 ක් ඉටුකිරීම සඳහා රු.මිලියන.1,404.8 ක් ප්‍රතිපාදනය සළසා තිබුණද, ඒ වෙනුවෙන් රු. මිලියන 297.22 ක් හෙවත් සියයට 21 පමණක් උපයෝජනය කර තිබුණි.

## ආබාධිත දීමනාව ගෙවීම

2019 මැයි මාසයේ සිට රු.2,000 ක්වූ ආබාධිත දීමනාව රු.5,000 ක් දක්වා වැඩිකර තිබූ අතර ආබාධිත පුද්ගලයන් 72,000 කට දීමනා ගෙවා තිබුණි. 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 4,320 ක් ප්‍රතිපාදනය සළසා තිබුණු අතර, පළමු මාස 04 තුළදී රු.3,000 බැගින්ද ඊළඟ මාස 08 සඳහා රු.5,000, බැගින්ද ආබාධිත පුද්ගලයන් 72,000 ට දීමනා ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා රු. මිලියන 2,810 ක් වැය කර තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 35 ක් උපයෝජනය කර නොතිබුණි.

## ආබාධ සහිත තැනැත්තන්ට ගොඩනැගිලිවලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම

2016 අංක 01 දරන ආබාධ තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ නියෝග යටතේ ආබාධ සහිත තැනැත්තන්ට ගොඩනැගිලිවලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සහ ප්‍රවේශ පහසුකම් සපුරාලීමට අදාළ පසුවිපරම් හා අධීක්ෂණ කටයුතු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ සභාව විසින් ඉටු කළ යුතුව තිබුණි. ජාතික ආබාධිත මහ ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තාක්ෂණ නිලධාරීවරයෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් බඳවා නොගැනීම නිසා එම කාර්යයන් සාර්ථකව ඉටු කිරිමට නොහැකි වී තිබුණි.

## නිෂ්කාර්යව පැවැති ඉඩම

වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී තෑගි ඔප්පුවක් මගින් රු.මිලියන 13 ක් වටිනා ඉඩමක් හා රු.මිලියන 3.2 ක් වටිනා තවත් ඉඩමක් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉඩම්වල වැඩිහිටි නිවාස ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා එම ඉඩම් නිෂ්කාර්යව පැවැතුණි.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය

රටේ සංවර්ධන අභිප්‍රායන් සාක්ෂාත්කරණයේදී වැඩිහිටි ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පැන නැඟිම අනුව වියපත්වීම අභියෝගයක් නොවනු පිණිස කෙසේ කටයුතු කළ යුතුද යන්න පදනම් කර ගෙන 2016 වර්ෂයේදී වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කර තිබුණි. 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරවීමට යෝජනා කර තිබුණු එම ප්‍රතිපත්තිය සමාජගත කිරිම සඳහා රු.මිලියන 5 ක් වැය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය සමාජගත කර නොතිබුණි.

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීම

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමට කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීම සඳහා රු.මිලියන 12.51 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට සළසා තිබුණි. මෙම පරිගණක පද්ධතිය මිළදී ගැනීම වර්ෂ 04 ක පමණ කාලයක් ප්‍රමාද කර තිබුණි. 2016 වර්ෂයේ සිට මණ්ඩලයේ පවත්නා කළමනාකරණ තොරතුරු පද්ධතිය දෝෂ තත්ත්වයන් පැවතීම හේතුවෙන් නියමිත දායක මුදල් ගෙවා සක්‍රිය තත්ත්වයේ සිටින සහ අක්‍රිය දායකයන් හඳුනා ගැනීමට මණ්ඩලයට නොහැකිවී තිබුණි.

## පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම

1999 අංක 33 දරන සමාජ ආරක්‍ෂණ මණ්ඩලය (සංශෝධන) පනතේ සඳහන් විධිවිධාන අනුව මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කර නොතිබුණි.

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දිරිමත් කිරීම
- ඔවුන්ගේ හැකියාවන් හා දක්‍ෂතා වැඩිදියුණු කිරීම
- ස්වයං රැකියාවල යෙදීමට තරුණයන් දිරිමත් කිරීම හා හැකියාවන්, දක්‍ෂතා වැඩි දියුණු කිරීම
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම

## ග්‍රාම සංවර්ධන පර්යේෂණ සහ අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාර පවත්වා ගැනීම

අමාත්‍යාංශය යටතේ බොරැල්ලේ පවත්නා ග්‍රාම සංවර්ධන පර්යේෂණ ආයතනයට අයත් නිලධාරීන් 30 දෙනෙකුට නේවාසිකව පුහුණු පහසුකම් සහිත නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2018 වර්ෂයේ සිට වසා දමා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භකර නොතිබුණ අතර ඒ අනුව පුහුණු කටයුතුද සිදු කළ නොහැකිව පැවැතුණි. තවද, 2017 හා 2018 වර්ෂවලදී නේවාසිකාගාරය සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 3.38 ක් වටිනා උපකරණ ගබඩාවේ නිෂ්කාර්යව පැවතිණි.

## ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී පවුල් බලගැන්වීම අරමුණු කරගෙන වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම වැඩසටහන් මගින් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජීය මට්ටම ඉහළ නැංවීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරීම, වෘත්තීය පුහුණුව ලබාදීම, නීති කටයුතු සඳහා සහාය වීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පරිසර සංවර්ධනය ඇති කිරීම කළ යුතුව තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 504.85 ක් වැයකර තිබුණි.

සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන් 02 ක් හා ව්‍යාපෘති 7,938 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 හා 2019 වර්ෂවල එකතුව රු.මිලියන 199.78 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්යයන් හා ව්‍යාපෘති ඉටු කර නොතිබුණි.

## හිඟහිටි සේවක ණය

2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කළ දෙපාර්තමේන්තු 02 ක ස්ථාන මාරුවී ගිය, මියගිය, වැඩ තහනම් කළ හා සේවයෙන් පහකළ නිලධාරීන් 204 ක ගෙන් මාස 3 ක සිට වර්ෂ 05 ක කාල පරාසයක සිට අයවීම් හිඟහිටව පැවැත එමින් තිබුණු ණය ශේෂවල එකතුව රු.මිලියන 3.98 ක් වී තිබුණි තවද, දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි 03 ක සේවකයන්ගේ ණය ඇතුළත් සේවක ණය චක්‍රීය අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂය රු. මිලියන 130.16 ක් වී තිබුණි. අධිකාරිවලින් දෙපාර්තමේන්තු ගත වූ නිලධාරීන්ට මෙම අරමුදලින් ණය ලබා දී තිබුණත්, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමටත්, 2014 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමටත් කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය චක්‍රීය අරමුදලේ ලැබිය යුතු ණය ශේෂය අනාවරණය නොවුණි.

## පොරොත්තු අනුපිළිවෙලින් බැහැරව සමෘද්ධි සහනාධාර ප්‍රදානය කිරීම

දිස්ත්‍රික්ක 21 ක පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 589,472 කින් පවුල් 135,106 කට සමෘද්ධි සහනාධාර ලබා දී නොතිබුණි. එසේම ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 43,853 කින් පොරොත්තු අනුපිළිවෙලින් බැහැරව තෝරාගත් පවුල් 33,398 කට සහනාධාර ප්‍රදානය කර තිබුණි.

# සමාජ සහන

"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදිමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම" මෙම අංශයේ අරමුණුවේ. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රාථමික කර්මාන්ත, සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 04 ක් මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- වැඩිහිටියන් බලා ගැනීම හා ආරක්ෂණය
- විශේෂ අවස්ථා සහිත පුද්ගලයින්ගේ දුබලතාවයන් හඳුනා ගැනීම හා පුනරුත්ථාපනය සිදු කිරීම
- මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා රෝගීන්ට හා තැලසිමියා රෝගීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපයන් සැලැසීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 2,371.46 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 2,008.64 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපර්වඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15.30 ක් හෙවත් රු.මිලියන 362.82 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 70 හි දැක්වේ.




රූපසටහන 70 - පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## කොට්ටාව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය ඉදිකිරීම

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 48.9 ක් වූ සමාජසේවා දෙපාර්තමේන්තුවට අයත් කොට්ටාව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය ආරම්භකිරීම ප්‍රමාදවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එදින වන විට ඉදිකිරීම සඳහා රු.මිලියන 43.06 ක් වියදම් කර තිබුණු නමුත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම හේතුවෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

## මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම

මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම, 2016 වර්ෂයේ ආරම්භ කර 2017 අවසන් කිරීමට නියමිතවී තිබුණි. එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 100 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට එම ඉදිකිරීම් කටයුතු සඳහා වර්ෂ 04 ක පමණ කාලයක් ගතවී තිබුණු අතර රු.මිලියන 97.43 ක් වැයකර තිබුණි. සැලැසුම් අනුව සමාලෝචිත වර්ෂයේ උපදේශකවරුන් බඳවා ගෙන අදාළ පාඨමාලා ආරම්භ කිරීමට නියමිතවී තිබුණද, ඉදිකිරීම අවසන් කර නොතිබීම හේතුවෙන් පුහුණු කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

## කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම

උතුරු පළාත් තරුණ ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් කිලිනොච්චියේ ඉදිකිරීමට 2017 වර්ෂයේදී සැලසුම් කර තිබුණි. එහි පළමු අදියර සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 90.43 ක් වී තිබුණි. 2018 ඔක්තෝබර් මාසයේදී මෙම කොන්ත්‍රාත්තුවේ පළමු අදියර යටතේ පිරිමි

හා කාන්තා නේවාසිකාගාර හා පන්ති කාමර ඉදිකර අවසන් කර තිබුණි. කෙසේවුවද, පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල මුලුතැන් ගෙවල් හා කෑම කාමර ඉදිකිරීම දෙවන අදියර යටතට ඇතුළත් කර තිබීම නිසා සිසුන් බඳවාගෙන පුහුණු කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

## අභ්‍යාසලාභීන්ට මෙවලම් කට්ටල ලබාදීම

ආබාධ සහිත වූවන් සඳහා සුභසාධන හා සංවර්ධන වැඩසටහන යටතේ විධිමත් පරිදි වෘත්තීය පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල සහ මහන මැෂින් ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.19 ක් ප්‍රතිපාදනය සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදි පාඨමාලා 13 ක පුහුණු කටයුතු අවසන් කර විභාග සමත්වූ අභ්‍යාසලාභීන් 169 දෙනෙකුට මෙම මෙවලම් කට්ටල සහ මහන මැෂින් ලබාගැනීමට සුදුසුකම් ලබාගෙන තිබුණි. එසේ වුවද, 2019 වර්ෂයේදී මෙවලම් කට්ටල කිසිවක් ලබාදී නොතිබුණු අතර 2020 සැප්තැම්බර් මාසය වනවිට පාඨමාලා 02 ක අභ්‍යාසලාභීන් 10 ක් සඳහා පමණක් රු.174,439 ක් වූ උපකරණ මිළදී ගෙන තිබුණි. ඒ අනුව මෙවලම් කට්ටල ලබාදීම ප්‍රමාද තත්ත්වයක පැවතිණි.

## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ ආධාර වැඩසටහන

පළාත් සභා විසින් ක්‍රියාත්මක කරන ළමා වැඩසටහන්වලට දායකත්වය දැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ ආධාර යටතේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මගින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 50 ක් ප්‍රතිපාදන සළසා තිබුණි. 2019 වර්ෂයේදී නැගෙනහිර, ඌව හා මධ්‍යම යන පළාත් සභාවල ඉල්ලීම පරිදි එම පළාත් සභා මගින් ළමා ආරක්ෂණ කටයුතු, අධ්‍යාපන වැඩසටහන් සහ සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 35.93 ක් වූ අක්මුදල් අමාත්‍යාංශ වැය ශීර්ෂය හරහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර තිබුණි. ඒ අනුව මේ සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28 ක් හෙවත් රු.මිලියන 14.07 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

# සමාජ ආරක්ෂාව

ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කරන හිතකර සංවේදී සමාජයක් බිහි කිරීමේ අපේක්ෂාවෙන් කාන්තා හා ළමා කටයුතු සහ වියළි කළාප සංවර්ධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත අධිකාරියක් යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තා මූලික ගෘහ කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇති කිරීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා කටයුතුවලට අදාළ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවෙකු ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

එමෙන්ම රාජ්‍ය සේවා විශ්‍රාමිකයින් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන්ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවීමෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම තුළින් ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීම සඳහා 1934 පෙබරවාරි 05 දින ස්ථාපිත වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමද, 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනත යටතේ වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමද, 1942 අංක 18 දරන ආඥා පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පරිපාලනය හා ගෙවීම් ක්‍රියාවලිය නියාමනය කිරීමද මෙම අංශය විසින් සිදු කළ යුතු කාර්යභාරය වේ.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා මෙම අංශය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකකදී පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 742,064.59 ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 733,531.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 1.15 ක් හෙවත් රු.මිලියන 8,533.59 ක

ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 71 හි දැක්වේ.




රූපසටහන 71 - පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## කාන්තා හා ළමා අපයෝජන සහ හිංසන සම්බන්ධයෙන් කටයුතු කිරීම

අසරණභාවයට පත් කාන්තාවන් හා දරුවන් සඳහා සුබසාධන හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රැකවරණය ලබා දීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ කාන්තා කමිටුවේ 1938 අංක දරන දුරකතනයට විවිධාකාරයෙන් සිදුවන කාන්තා හිංසන පිළිබඳ වාර්තා වූ පැමිණිලි 1,806 ක් ලැබී තිබුණි. එමෙන්ම පුවත්පත්වල කාන්තා හා ළමා හිංසන, අපයෝජන හා අපචාර 1,664 ක් පිළිබඳ පුවත් වාර්තා වී තිබුණි. එම පැමිණිලි හා පුවත් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## ළමුන්ගේ සුරක්ෂිතභාවය ඇති කිරීමට සිවිල් සමාජය ශක්තිමත් කිරීම

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් ඔවුන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම වෙනුවෙන් වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම හා ඒ පිළිබඳ සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ අරමුණින් සිවිල් සමාජ ක්‍රියාකාරීන් හඳුනා ගැනීමේ දිප ව්‍යාප්ත වැඩසටහනක් වශයෙන් 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සඳහා ජන පවුර වැඩසටහන ගම් මට්ටමින් ආරම්භ කිරීමට රු.මිලියන 6.58 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ග්‍රාමීය සිවිල් සමාජ ක්‍රියාකාරීන් හඳුනා ගැනීම පමණක් සිදු කර තිබුණි.

## වියළි කළාප සංවර්ධන ව්‍යාපෘතිය

වියළි දේශගුණ කළාපයේ ජීවත්වන ප්‍රජාවගේ සමාජ ආර්ථික අභිවෘද්ධිය උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඔවුන් මුහුණදෙන පීඩාකාරී තත්ත්වයන් අවම කිරීම

හා එම කලාපය තුළ දේශගුණ බලපෑම් හේතුවෙන් උද්ගතවන තත්ත්වයන් සමනය කිරීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වියළි කලාප සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. වියළි කලාපය තුළ පවත්නා දිස්ත්‍රික්ක අතරින් වඩාත් පීඩාවට පත්ව තිබුණු දිස්ත්‍රික්ක තෝරා ගැනීම සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. එමෙන්ම වියළි කලාපයේ විශාලම දිස්ත්‍රික්කය වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් වියළි කලාප සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තෝරා ගෙන තිබුණි. 12 දෙනෙකුගෙන් යුත් අමතර කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතිය සඳහා බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 4.63 ක වැටුප් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 331 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 67.37 ක් හෙවත් සියයට 20 ක් ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

## ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති සම්පාදනය නොකිරීම

1956 වර්ෂයේ ආරම්භ වූ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව වර්ෂ 64 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

## ළමා නිවාස පුනරුත්ථාපනය

සමාලෝචිත වර්ෂයේදී ළමා නිවාස පුනරුත්ථාපනය සඳහා රු.මිලියන 3.50 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, ඉන් රු.මිලියන 3.25 ක් ළමා නිවාස 10 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත යවා තිබුණි. සැලසුම් කළ පුනරුත්ථාපන කටයුතු නිම කිරීමට පෙර මුදල් යවා තිබීම නිසා එම මුදල් පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. එමෙන්ම සැලසුම් කළ කාර්යභාරයන් මුදල් ලැබීමෙන් පසුව වෙනස් කර තිබුණු අතර, මිල ගණන් කැඳවීමට පෙර මුදල් යවා තිබුණු අතර කාර්යභාරය ඊට අඩු වියදමකින් සිදු කිරීම නිසා යවන ලද මුදල් ඉතිරි වී තිබුණි. කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද සිදුකර නොතිබුණි.

## පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදය

2011 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වී තිබුණු පැමිණිලි 81,259 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැමිණිලි 41,142 ක් හෙවත් ලැබී තිබුණු පැමිණිලිවලින් සියයට 50 ක ප්‍රමාණයක් විසදා නොතිබුණි. අධිකාරිය වෙත වර්ෂයක් පාසා ලැබෙන පැමිණිලිවලට සම්බන්ධ තොරතුරු රැස්කර වාර්තා කිරීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය, තොරතුරු කැඳවීම හා විමර්ශන කටයුතු පිළිබඳ පසුවිපරම් නොකිරීම හා නිසි අධීක්ෂණය සිදු නොකිරීම යනාදිය නිසා නොවිසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබුණි. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කර පවත්වා නොතිබුණි.

## ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත නොකිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා වර්ෂ 20 ක් ගත වී තිබුණත් ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

### මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු නොකිරීම

ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණාත්මයෙන් යුතු මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ අරමුණින් එ.ජ.ඩො.මිලියන 50 ක ලෝක බැංකු ණය ආධාර යටතේ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2019 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු ඉටු කිරීම සඳහා රු.මිලියන 1,200 ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 1,186.78 වැය කර තිබුණි. 2019 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු වතු අංශයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 75 ක් ඉදිකිරීම, මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථාන 03 ක් ඉදිකිරීම, නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 12 ක් ඉදිකිරීම යන කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 254 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සැලසුම් කළ පරිදි එම කාර්යයන් ඉටු කර නොතිබුණි. එමෙන්ම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1,700 ක පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලියන 375 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, 2019 වර්ෂය අවසානයේ දී මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 92 කට පමණක් ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර, ඉන් මධ්‍යස්ථාන 03 ක පමණක් වැඩ නිම කර තිබුණි.

### රජයේ සේවක විශ්‍රාම වැටුප ආර්ථිකයට වන බලපෑම

2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සක්‍රීය විශ්‍රාමිකයින් 639,984 කට ප්‍රතිලාභ ලබා දී තිබුණු අතර 2019 වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රුපියල් මිලියන 272,463 ක් වී තිබුණි. එය මුළු රජයේ පුනරාවර්තන වියදමෙන් සියයට 11.8 ක් වී තිබුණු අතර එය මුළු රජයේ ආදායමෙන් සියයට 11.6 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ 7 ක මුළු විශ්‍රාම වැටුප් වියදමේ වර්ධනය රූපසටහන 72 හි දැක්වේ.




රූපසටහන 72 - විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන් ගණන හා විශ්‍රාම වැටුප් වියදම
මූලාශ්‍රය - විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය - මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 2019

## අරමුදල් පරිපාලනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් අරමුදල් 05 ක් පරිපාලනය කරනු ලබන අතර ඉන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පමණක් ක්‍රියාකාරී මට්ටමක පැවතුණි. 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිතවීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දින සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නව සාමාජිකයින් එකතුවීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම මත ගෙවීමට ප්‍රමාණවත් අරමුදල්වල නොමැතිවීම නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබාගෙන අවශ්‍ය ගෙවීම් සිදු කර තිබුණි.

1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුව තිබුණි. නමුත් දායක මුදල් රැස් කිරීම හා වියදම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වා නොතිබුණු අතර දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු අනත්දරු දායක මුදල් බැංකු ගිණුමට රැස්කර තිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන ලබා ගෙන ඒ වෙනුවෙන් වියදම් කර තිබුණි.

## කොළඹ මහා නගර සභාව සඳහා ගිනි නිවීමේ වාහන හා උපකරණ සැපයීම

කොළඹ මහා නගර සභාව සඳහා ගිනි නිවීමේ වාහන හා උපකරණ මිලදී ගැනීම සඳහා ඔස්ට්‍රියානු රජයෙන් ණය මුදලක් ලබා ගැනීමට 2018 වර්ෂයේදී කටයුතු කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී ඒ සඳහා පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2019 ඔක්තෝබර් 31 දින දක්වා ණය ගිවිසුමට එළඹීම ප්‍රමාද වී තිබුණි. එම හේතුවෙන් 2019 වර්ෂයේදී එම ව්‍යාපෘතියට අදාළ කටයුතු සිදු කිරීමට අපොහොසත් වීම නිසා පාර්ලිමේන්තුව සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

| සේවා ආර්ථිකය |
| --- |
| අංශ |
| මූල්‍යමය සේවා<br><br>රාජ්‍ය සේවා<br><br>වෙළෙඳ<br><br>සංචාරක<br><br>සත්වෝද්‍යාන හා උද්භිද උද්‍යාන |
| නිරීක්ෂණ |
| රජයේ ආදායම<br><br>ආනයනය කරනු ලබන භාණ්ඩවල ප්‍රමිතිය<br>ආනයනික භාණ්ඩ ඇතුළත් බහාලුම් ගැඹුරු පරීක්ෂාවකට ලක්කිරිම<br>නව බදු පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම මන්දගාමී වීම<br>මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම<br>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්<br>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය<br>කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරිම<br>ආයෝජනයන් සිදු කර නොතිබීම<br>විද්‍යුත් මාධ්‍යය උපයෝගී කරගෙන වැඩසටහන් විකාශනය කිරිම<br>කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙනයාම<br>මල්මඩුවාව ග්‍රාමයේ නිවැසියන්ට ජලය ලබාදීම<br>යාපනය දිස්ත්‍රික්කය තුළ වැසි ජලය රැස් කිරිමේ ඒකක (ටැංකි) 3000ක් ඉදිකිරීම<br>භාවිතා නොකළ මෘදුකාංග<br>මහජනයා විසින් සෘජුවම පරිහරණය කරනු ලබන ආකෘතිපත්‍ර<br>නෙළුම් පොකුණ රඟහලේ ආදායම්<br>උසස් අධ්‍යාපනය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම<br>පුහුණු ව්‍යාපෘති සහයකවරුන් බඳවා ගැනීම<br>රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල<br>විදේශ දූත මණ්ඩල සඳහා දේපල අත්කර ගැනීම<br>කාර්යක්ෂමතා කඩඉම් විභාග<br>අනුමැතියකින් තොරව දිරිදීමනා ගෙවීම |

නිෂ්ක්‍රිය වත්කම්
ද්විතීයන දීමනාවක් ගෙවීම
හිඟහිටි රජයේ නිල නිවාස කුලී
අනවසරයෙන් රජයේ නිවාසවල පදිංචිවීම
අලාභහානි
ව්‍යාජ මිනුම් වැටලීම්
නව විද්‍යාගාරයෙහි වායුසමීකරණ පද්ධතිය සවිකිරීම
දෙපාර්තමේන්තුව සතු ගබඩා
විද්‍යාත්මක ගබඩා උපයෝජනය
අපනයන වෙළඳපොළ ප්‍රවේශයට සහයවීමේ වැඩසටහන
නව අපනයනකරුවන් 2000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන
තොග කළමනාකරණය

ව්‍යවසාය සම්පත් සැලැසුම්කරණ ව්‍යාපෘතිය
සමාගම් පනතේ නියමයන්ට අනනුකූලව ක්‍රියා කිරීම
හිඟහිටි ආදායම්
සමාගම්වල මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම
සමාගම් ලිපිගොනු පරිලෝකනය කිරීම
නිෂ්කාර්ය වත්කම්
සංචාරකයින්ගේ පැමිණීම හා විදේශ විනිමය ඉපැයීම
ප්‍රතිපාදන ඌන උපයෝජනය

අපේක්ෂිත ඉලක්ක ඉටු කිරීම
අලෙවි ප්‍රවර්ධන වියදම්
අපගමන බදු අය කර ගැනීමට කටයුතු නොකිරීම
බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව නිලධාරීන් බඳවා ගැනීම්

# මූල්‍ය සේවා

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය කඩිනම් කිරීම සඳහා රාජ්‍ය සම්පත් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කිරීම සහතික කිරීම පිණිස රාජ්‍ය මූල්‍ය කටයුතුවලට අදාළ වන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සහ ජනතා ආකල්ප යහපත් මානයක් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලනික ක්ෂේත්‍රයන්හි දායකත්වය ලබාදීම මෙම අංශයෙන් කාර්යභාරය වේ.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 20 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 19 ක් විසින් ඉහත සඳහන් කාර්යභාරය කළ යුතුව තිබුණි.

ඉහත කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 6,235,441.91 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 5,878,065.95 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 5.73 ක් හෙවත් රු.මිලියන 357,375.96 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 73 හි දැක්වේ.




රූපසටහන 73 - පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදන හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය අමාත්‍යාංශය හා ඒ යටතේවන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## රජයේ ආදායම

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, ආදායම් බදු මඟින් රැස් කර ඇති ආදායම රු.බිලියන 428 ක් හෙවත් මුළු බදු ආදායමෙන් සියයට 25 ක්ද, සමස්ත රජයේ ආදායමෙන් සියයට 22 ක් ද වී

තිබුණි. එය ඉකුත් වර්ෂයේ රැස් කළ ආදායම් බදු සමඟ සැසඳීමේ දී සියයට 38 ක එනම් රු.බිලියන 117 කින් වර්ධනය වී තිබුණි. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ක්‍රියාවට නැංවීම හේතුවෙන් සංස්ථාපිත බදු ව්‍යුහයේ හා බදු අනුපාතවල සිදු වූ වෙනස් කම් ආදායම් බදු මඟින් රැස් කළ ආදායම ඉහළ යාමට මූලිකවම බලපා තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ දී රැස් කර තිබුණ බදු ආදායමෙන් දේශීය භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු ආදායම රු.බිලියන 974 ක් හෙවත් මුළු බදු ආදායමෙන් සියයට 56 ක් ද, මුළු රජයේ ආදායමෙන් සියයට 51 ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී එය සමස්ත බදු ආදායමින් සියයට 62 ක් ද මුළු රජයේ ආදායමෙන් සියයට 55 ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දේශීය භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු ආදායම අඩුවීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේ රට තුළ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් ආර්ථිකයේ සමහර අංශ අඩාල වීම හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 ක සිට සියයට 8 ක් දක්වා පහත දැමීම හා ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කිරීමටත් රජය පියවර ගෙන තිබීම හේතු වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී ද දේශීය භාණ්ඩ හා සේවා යටතේ වන එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලින් සියයට 29 කට වඩා වැඩි දායකත්වයක් මුළු රජයේ ආදායමට ලබා දී තිබුණි.

- මත්පැන් හා සිගරට් යන භාණ්ඩ මත පනවා තිබුණු බදුවලින් මුළු රජයේ ආදායමට සියයට 10.5 දායකත්වයක් ලබා දී තිබුණු අතර මෝටර් වාහන හා ඛනිජ තෙල් නිෂ්පාදන මත පනවා ඇති නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු වලින් සියයට 10 කට වැඩි දායකත්වයක් රජයේ මුළු ආදායමට දායක වී තිබුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් රු.බිලියන 333 ක ආදායම් රැස් කර තිබුණ අතර එය මුළු බදු ආදායමින් සියයට 19 ක් ද, සමස්ත රජයේ ආදායමෙන් සියයට 17 ක් ද වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් ආදායම් රැස් කිරීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 3 කින් හෙවත් රු.බිලියන 8 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු.බිලියන 5.4 කින් අඩු වී තිබීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.

- ඉහත සඳහන් පරිදි රාජ්‍ය ආදායම් ව්‍යුහය තුළ බදු ආදායම් සංයුතියේ වෙනස්වීම සඳහා පහත සඳහන් සාධකයන් ගෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදු වී තිබුණ ද, එම බලපෑම්වල මූල්‍යමය වටිනාකම ගණනය කිරීම සඳහා ආදායම් එකතු කරන දෙපාර්තමේන්තු විසින් ප්‍රමාණාත්මක පියවර ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම් රැස් කරන දෙපාර්තමේන්තුවල සැබෑ කාර්යසාධනය මැනීම සඳහා රැස් කරන ආදායමේ වර්ධනය පමණක් සැලකිල්ලට ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

  - රජය විසින් බදු අනුපාත සංශෝධනය කිරීම
  - භාණ්ඩ හා සේවාවල විදේශීය වෙළඳපළ මිල ගණන් ඉහළ යාම නිසා සිදුවන බදු ආදායමේ වර්ධනය.
  - විශේෂ අවස්ථාවල දී සිදුවන ආනයනයන්ගේ වර්ධනය

හේතුවෙන් ඇතිවන බදු ආදායම් වර්ධනය.

- විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුවෙන් ඇතිවන ආනයන වර්ධනය මත බදු ආදායම වර්ධනය වීම.
- තවද, විදේශීය වෙළඳ ගිවිසුම් සහ වෙනත් නීතීන් මත සිදු කරනු ලබන බදු අත් හැරීම්, ලිහිල් කිරීම් සහ බදු නිදහස් කිරීම් හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදුවන බලපෑම සම්බන්ධ විස්තරාත්මක තොරතුරු අදාළ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය මැනීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

- ශ්‍රී ලංකා රේගුව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තා අනුව එදිනට අයවිය යුතු මුළු හිඟ බදු ආදායම රු.බිලියන 22.9 ක් වී තිබුණි. එම හිඟ බදු වාර්තාවල රු.බිලියන 4.9 ක හිඟහිටි ආදායම් පවතින බව විගණනයේදී අනාවරණය විය. එමෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් වාර්තා අනුව, 2019 දෙසැම්බර් 31 දිනට අය කර ගත හැකි බදු හා දඩ මුදල එකතුව රු.බිලියන 264 ක් වී තිබුණි. ඒ අනුව, ආදායම් ගණන්දීමේ නිලධාරින් විසින් හිඟ ආදායම් රැස් කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## ආනයනය කරනු ලබන භාණ්ඩවල ප්‍රමිතිය

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ නියමිත ප්‍රමිතීන්ට අනුකූලව පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ඒ සඳහා වගකිව යුතු ආයතනයන්ගේ සහාය ලබා ගත යුතුව තිබුණි. එම ආයතනයන්ගේ සහතික ලැබෙන තෙක් අදාළ භාණ්ඩ පෞද්ගලික ඇපකර මත ආනයනකරුවන්ගේ පරිශ්‍ර වෙත මුදා හැරෙන නමුත්, එම භාණ්ඩ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොතිබුණි.

## ආනයනික භාණ්ඩ ඇතුළත් බහාලුම් ගැඹුරු පරීක්ෂාවකට ලක්කිරීම

ආනයනික භාණ්ඩ ඇතුළත් බහාලුම් ගැඹුරු පරීක්ෂාවකට ලක් නොවන අවස්ථා පැවතීම හේතුවෙන්, නීති විරෝධී මත් කුඩු වැනි ආනයනයන් සිදු කිරීම, ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනය කිරීම තුළින් බදු වංචා සිදු කිරීම, ප්‍රකාශ කළ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් භාණ්ඩ ආනයන කර රේගු බදු වංචා කිරීම,වැරදි වර්ගීකරණ අංකයන් යටතේ භාණ්ඩ ආනයනය කර බදු අක්‍රමිකතාවල නිරත වීම යනාදී රේගු වැරදි ගණනාවක් සිදු කරන බව රේගු නිලධාරීන්ගේ විමර්ශන තුළින්ම තහවුරු වී තිබුණි.

## නව බදු පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නව බදු පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණි. එදින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව බදු ගෙවන්නන් 329,979 වෙත නිකුත් කර තිබුණු බදු වාර්තා 764,251 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ආපසු ලැබී නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු බදු වාර්තා අතරින් බදු ගෙවන්නන් 210,572 දෙනෙකුගෙන් ලැබී තිබුණු බදු වාර්තා 283,055 ක් 2020 පෙබරවාරි 27 දින වන විටත් පද්ධතිය තුළ ක්‍රියාවලියට භාජනය කර නොතිබුණි. එම හේතුවෙන් වාර්තා මත හිඟ බදු වාර්තා

නොවීම්, අය කර ගැනීම් වැනි කටයුතු කාලීනව සිදු කර නොතිබුණි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් කළමනාකරණ පරිපාලන තොරතුරු පද්ධතියේ නඩත්තු කටයුතු 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් භාර ගත යුතුව පැවතුණි. ඊට අදාළ පූර්ව කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සකස් කර ගෙන නොතිබුණි. එමෙන්ම නව ආදායම් බදු පනතට අනුව බදු පරිපාලන පද්ධතියේ වෙනස් කිරීම් ඇතුළුව හඳුනා ගත් වෙනත් සංශෝධන සඳහා වන RAMIS 2.0 ව්‍යාපෘතිය සඳහා වූ කොන්ත්‍රාත්තුව අදාළ සැපයුම්කරු වෙත පිරිනැමීමට සැලකිය යුතු කාල පමාවක් සිදු කර තිබුණු අතර පළමු අදියරට අදාළ ගිවිසුම් 2019 සැප්තැම්බර් මාසයේදීත්, දෙවන අදියර ගිවිසුම් 2020 ජුලි මාසයේදීත් අත්සන් කර තිබුණි.

## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මන්දගාමී වීම

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල් සහ විදේශ ණය හා ආධාර යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,894.60 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘති 7 කින් එක් ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි. ඉතිරි ව්‍යාපෘති 06 ක කටයුතු මන්දගාමී ලෙස සිදු කරමින් පැවතුණි. මෙම අඩුපාඩු හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 72 ක් හෙවත් රු.මිලියන 1,364.68 ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

## මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම

2015 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නියෝගයක් අනුව මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ රු.මිලියන 1,055.00 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනවලින් සියයට 34 ක් හෙවත් රු.මිලියන 355.10 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. භාණ්ඩාගාරය විසින් අවශ්‍ය අග්‍රිම අමාත්‍යාංශය වෙත ලබා නොදීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභීන් වෙත නිකුත් කරන ලද විදුලි උත්පාදන බලපත්‍රයෙහි කොන්දේසි අංක 11 පරිදි අදාළ වර්ෂයේ ජුනි 30 දින හෝ ඊට පෙර හෝ පද්ධතියට විදුලි සැපයීම ආරම්භ කළ දිනයේ සිට දින 30 ක් ඇතුළතදී වාර්ෂික නියාමන ගාස්තු කොමිෂන් සභාවට ගෙවිය යුතුය තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු බලපත්‍රලාභීන් 25 දෙනෙකුගෙන් නියමිත දිනයට අයවිය යුතුව තිබුණු නියාමන ගාස්තුවල එකතුව රු.මිලියන 184.93 ක් වී තිබුණි. එම ගාස්තුවලින් රු.මිලියන 82.13 ක් 2020 සැප්තැම්බර් මාසය වන විටත් අයකර ගෙන නොතිබුණි. 2014 හා 2015 වර්ෂවලට අදාළව එකතුව රු.මිලියන 81.85 ක හිඟහිටි නියාමන ගාස්තු අයකර ගැනීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය කොමිෂන් සභාව සතුව තිබුණත්, එම නීතිමය ක්‍රියාමර්ග 2020 සැප්තැම්බර් මාසය වන විටත් ගෙන නොතිබුණි.

## වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අංශ 10 ක් යටතේ ක්‍රියාකාරකම් 123 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා

රු.මිලියන 339.26 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ක්‍රියාකාරකම් තුළ ඛනිජතෙල් කර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් 15 ක් සඳහා රු.මිලියන 80.30 ක්ද, ජල කර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් 10 ක් සඳහා රු.මිලියන 55.14 කද ප්‍රතිපාදන සළසා තිබුණි. සැලැසුම් කළ ක්‍රියාකාරකම්වලින් රු.මිලියන 104.46 ක ප්‍රතිපාදන සළසා තිබුණු ක්‍රියාකාරකම් 49 ක අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට අපොහොසත් වී තිබුණි.

## කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා විදුලිබල ක්ෂේත්‍රයේ නියාමන කටයුතු සම්බන්ධයෙන් බලතල ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත පැවරී තිබුණත්, සම්ප්‍රේක්ෂණ බලපත්‍රලාභියා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු වන ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු සැපයීම හා අනෙකුත් අවශ්‍යතා ඉටු නොකිරීම හේතුවෙන් කොමිෂන් සභාවේ නියමයන්ට හා නිර්දේශයන්ට අනුගත නොවූ අවස්ථාද තිබුණි.

# රාජ්‍ය සේවය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 හා 55 ව්‍යවස්ථාවන්වල රාජ්‍ය සේවයේ පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම සහ රජයේ නිලධාරින්ගේ විනය පාලනය අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත. රජයේ සේවයේ නිලධාරින් සම්බන්ධ කටයුතු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබයි. 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පහත සහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණය සහ ජාතික ඵලදායිතා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගැයීම
- ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
- දීපව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන්ට අදාළ පරිපාලන සහ පිරිස් කළමනාකරණය
- රාජ්‍ය සේවා පුහුණුව
- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම හා රජයේ සියළුම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධ කටයුතු
- නව යහපාලන ක්‍රම හඳුන්වා දීම

එමෙන්ම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සඳහන් විශේෂ වියදම් ඒකක, විදේශ කටයුතු අමාත්‍යාංශය,ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යාංශය, හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ යටතේ රාජ්‍ය සේවයට අදාළ කාර්යභාරයන්, අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන 04 ක් මගින් ඉටු කළ යුතුව තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 198,300.28 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.මිලියන 144,913.31 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 26.92 ක් හෙවත් රු.මිලියන 53,386.97 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 74 හි දක්වා ඇත.




රූපසටහන 74 පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## ආයෝජනයන් සිදු කර නොතිබීම

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත ප්‍රකාරව ආයතනය සතුව පවතින අතිරික්ත අරමුදල් ආයෝජනය කළ යුතුව තිබුණත්, 2019 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ පැවැති රු.මිලියන 51.2 ක ශේෂය, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## විද්‍යුත් මාධ්‍යය උපයෝගී කරගෙන වැඩසටහන් විකාශනය කිරීම

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 40.90 ක් වූ මුළු වියදමෙන් සියයට 48.07 ක් හෙවත් රු.මිලියන 19.66 ක් වැය ගුවන් විදුලි වැඩසටහන් 210 ක් හා රූපවාහිනී වැඩසටහන් 37ක් පවත්වා තිබුණි. එකී වැඩසටහන් කොතෙක්දුරට ජනතාවට සන්නිවේදනය වන්නේද හා කොතරම් දුරට ප්‍රයෝජනවත් වන්නේද යන්න පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී දන්නවනම් උගන්වන්න - දන්නේ නැත්නම් ඉගෙනගන්න වැඩසටහන ගුවන් විදුලියෙන් ප්‍රචාරය කිරීමට හා එහි සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් රු.මිලියන 15 ක් හා රූපවාහිනී වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 4.3 ක් වැය කර තිබුණි. එම සේවයන් ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව කටයුතු කර තිබුණි.

## කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙනයාම

අමාත්‍ය මණ්ඩලය විසින් 2016 හා 2018 යන වර්ෂවල අවස්ථා තුනකදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම අනුමත කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාර්යාලය ස්ථාපනය කිරීමට අපේක්ෂිත

ගොඩනැගිල්ල සහ දිනය පිළිබඳව නිශ්චිත තීරණයක් ගැනීමට අපොහොසත් වී තිබුණි.

අමාත්‍ය මණ්ඩල අනුමැතීන් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කාර්යාල පරිශ්‍රයේ වෙනසක් වී නොතිබුණත්, එසේ අනුමැතිය ලද භාවිතයට නොගත් ගොඩනැගිලි දෙකක් වෙනුවෙන් තත්ත්ව වාර්තා ලබා ගැනීමට, ආරක්ෂක රාජකාරී, ජල සහ විදුලි බිල්පත් වෙනුවෙන් 2017 අගෝස්තු 14 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු.මිලියන 2.4 ක් වැය කර තිබුණි.

## මල්මඩුවාව ග්‍රාමයේ නිවැසියන්ට ජලය ලබාදීම

මල්මඩුවාව ග්‍රාමයේ නිවැසියන්ට ජලය ලබාදීමේ අරමුණින් වතුර ටැංකි හා ජලනල පද්ධතිය සැකසීම සඳහා 2017 හා 2018 වර්ෂවලදි ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය විසින් පිළිවෙලින් රු.මිලියන 2.9 ක් හා රු.මිලියන 5.3 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ජලය ලබා ගන්නා පොදු ළිඳේ ජල මට්ටම වැඩිකර ගැනීමට ළිඳ ගැඹුරු කිරිම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියනක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.446,576 ක් වැය කර තිබුණද, අපේක්ෂිත පරිදි නල ජලය ලබා දීමේ කාර්යය ඉටු වී නොතිබුණි.

## යාපනය දිස්ත්‍රික්කය තුළ වැසි ජලය රැස් කිරිමේ ඒකක (ටැංකි) 3000ක් ඉදිකිරීම

යාපනය දිස්ත්‍රික්කය තුළ වැසි ජලය රැස් කිරිමේ ඒකක (ටැංකි) 3000ක් වසර 3ක් තුළ ඉදිකිරිම වෙනුවෙන් ඉන්දීය රජයෙන් රු. මිලියන 300 ක ආධාර ලබා දීමේ එකඟතාවය මත 2017 ජනවාරි 13 දින ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරිමේ ආයතන ලෙස ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය ක්‍රියා කර තිබුණි. එහෙත් අමුද්‍රව්‍ය හිඟකම, කොන්ත්‍රාත්කරුවන් සතුව පළපුරුදු හා හැකියාව ඇති ප්‍රමාණවත් සේවක පිරිසක් නොසිටීම, කොන්ත්‍රාත්කරුවන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හා ප්‍රතිලාභීන් අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම ආදි කරුණු හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් අතරමඟ වැඩ අත්හැර තිබුණි. එම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත නිමැවුම් මට්ටමින් සියයට 16කට සමාන ටැංකි 489ක් පමණක් ඉදි කර තිබුණි .තවද ඒ සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 17කට සමාන රු.මිලියන 51.9 ක් වැය කර තිබුණු අතර අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

## භාවිතා නොකළ මෘදුකාංග

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් සිංහල - දෙමළ සහ දෙමළ - සිංහල පරිවර්තන මෘදුකාංග 2ක් සකස් කිරිම සඳහා රු.මිලියන 7.2ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි සිංහල - දෙමළ පරිවර්තන කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

## මහජනයා විසින් සෘජුවම පරිහරණය කරනු ලබන ආකෘතිපත්‍ර

ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා , සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් මහජනයා සෘජුවම පරිහරණය කරනු ලබන ආකෘතිපත්‍ර 36 ක් සිංහල භාෂාවට හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට කටයුතු කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 1.2 ක් වැය කර තිබුණි. මෙම පරිවර්තිත පෝරම සංයුක්ත තැටි මගින් හා අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබාගැනීමට සැලැසුම් කර තිබුණද, පරිවර්තිත පෝරම සමාලෝචිත

වර්ෂය අවසන් වන විටත් වෙබ් අඩවියෙන් බාගත කිරිමට නොහැකි වී තිබුණි.

## නෙළුම් පොකුණ රඟහලේ ආදායම්

ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක කෙරුණු නෙළුම් පොකුණ රඟහලේ ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) අනුව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කළ යුතුව තිබුණත්, එසේ රැස්කළ ආදායම් රාජ්‍ය ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තැන්පත් ගිණුමෙන් ගෙවීම් කර තිබුණි.

## උසස් අධ්‍යාපනය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

උසස් අධ්‍යාපනය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය ඇතිව සී/ස උසස් තාක්ෂණවේද ආයතනය 2017 අගෝස්තු 01 දින සංස්ථාගත කර තිබුණි. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු , උසස් අධ්‍යාපන හා මහාමාර්ග ,සහ විද්‍යා,තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යවරුන් විසින් ''සීමාසහිත උසස් තාක්ෂණවේද ආයතනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1ක ප්‍රතිපාදන ලබා දීම " යන මැයෙන් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 දෙසැම්බර් 05 දින අමාත්‍ය මණ්ඩලය මඟින් , විදේශීය අයතනයක් වෙත ඉටුකළයුතු සේවය සඳහා ගෙවීමට ඇමරිකානු ඩොලර් මිලියන 1ක මුදලක් ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව එම ආයතනය සමඟ 2018 පෙබරවාරි 28 දින ගිවිසුමකට එළඹිණි. ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ සහ ගිවිසුමට අනුව නව ව්‍යාපාර පාසලේ කළමනාකරණය සඳහා විධිමත් පාලක මණ්ඩලයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ස්ථිර සැලැස්මක් සැකසීමට එම විදේශීය ආයතනය වෙතින් අවශ්‍ය සේවය ලබාගැනීම වෙනුවෙන් රු.මිලියන 113.75 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබුණි. තවද ,ඒ වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියන 40 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ගිවිසුමට එළඹ වර්ෂ දෙකක කාලයක් ගතවී තිබුණත් විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## පුහුණු ව්‍යාපෘති සහයකවරුන් බඳවා ගැනීම

සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය සඳහා පුහුණු ව්‍යාපෘති සහායකවරුන් 7,500 ක් බඳවා ගැනීම සඳහා 2019 මාර්තු 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. නමුත් ඒ සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණි. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලැබීමට ප්‍රථම බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ ආරම්භ කර තිබුණි. මෙම බඳවා ගැනීමට අදාල කටයුතු වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්තාපනය, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 6.95 ක් වැය කර තිබුණි. 2019 දෙසැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම බඳවා ගැනීම අවලංගු කර තිබුණි.

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

2015 ජූලි 23 දිනැති අංක 7/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 11 හා 12 වගන්ති සහ 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සියළුම දායක දායිකාවන්ගේ

ගිණුම්වල ඇති අනිවාර්ය දායක මුදලට සහ රජයේ ප්‍රසාද මුදලට වැල් පොලියක් හිමිවිය යුතුයි. එම විධානවලින් බැහැරව ටොරොන්ටෝ කොන්සියුලර් ජනරාල් කාර්යාලයේ සන්නිවේදන සහකාර නිලධාරියෙකුගේ 2008 අගෝස්තු මාසයේ සිට 2018 අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ රජයේ ප්‍රසාද මුදල වූ රු.මිලියන 2.8 ක මුදල සහ කළමනාකරණ සේවයේ නිලධාරිනියකගේ 2014 ජූනි මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ රජයේ ප්‍රසාද මුදල වූ රු.මිලියන 1.4 ක මුදල විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත 2019 මාර්තු මාසයේදී ප්‍රේෂණය කර තිබුණි. එබැවින් එම නිලධාරීන්ට හිමිවිය යුතු වැල් පොලිය අහිමි වී තිබුණි.

### විදේශ දූත මණ්ඩල සඳහා දේපල අත්කර ගැනීම

සමාලෝචිත වර්ෂයේදී විදේශ දූත මණ්ඩලවල දූත මණ්ඩල කාර්යාල, දූත මණ්ඩල ප්‍රධානි නිල නිවාස සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිවාස කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා වාර්ෂික කුලිය ලෙස රු.මිලියන 1,720 ක් විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. එයට පිළියමක් ලෙස මූල්‍යමය වශයෙන් වාසිදායකවන ආකාරයෙන් දූත මණ්ඩල සඳහා දේපල අත්පත්කර ගැනීමට අමාත්‍යාංශය විසින් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### කාර්යක්ෂමතා කඩඉම් විභාග

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීමේ පනතේ දක්වා ඇති අරමුණක් හෝ කාර්යභාරයක් නොවන සහ ආයතනයේ පුහුණු වැඩ සටහන්වලට අදාළ නොවන කාර්යක්ෂමතා කඩඉම් විභාග 37ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි.

### අනුමැතියකින් තොරව දිරිදීමනා ගෙවීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය අනුව දිරිදීමනා පටිපාටිය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2017 වර්ෂයේදී රු.මිලියන 6.0 ක්ද, 2018 වර්ෂයේදී රු.මිලියන 7.4 ක්ද හා 2019 වර්ෂයේ දී රු.මිලියන 2.3 ක්ද වශයෙන් ආයතනයේ කාර්ය මණ්ඩලයේ 95 දෙනෙකු වෙත දිරි දීමනා ගෙවා තිබුණි.

### නිෂ්ක්‍රිය වත්කම්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 වර්ෂයේ දී "සංධරණි" පර්යේෂණ මධ්‍යස්ථානය රු.මිලියන 3.4 ක් වැයකර නවීකරණය කර තිබුණු අතර, පර්යේෂණ මධ්‍යස්ථානයේ ගෘහ භාණ්ඩ, පරිගණක හා අනෙකුත් විද්‍යුත් උපකරණ උපයෝජනය නොකර නිෂ්ක්‍රියව පැවතුනි.

### ද්විතීයන දීමනාවක් ගෙවීම

2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ද්විතීයන අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත සියයට 50 ක ද්විතීයන දීමනාවක් ගෙවා තිබුණි. එය ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග අනුව මාසිකව ඉටුකළ යුතු අවම පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ළඟාවිය යුතු බව දක්වා තිබුණි. එම නියෝගයට පටහැනිව, ආයතනය වෙත 2015 ජූලි මාසයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 9.1 ක් ගෙවා තිබුණු. එසේ ගෙවා තිබුණු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්

අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා අයකරගත යුතු මුදල 2020 මැයි 31 දින වන විටත් ගණනය කර නොතිබුණි.

## හිඟහිටි රජයේ නිල නිවාස කුලී

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය අනුව රජයේ නිවාසවල පදිංචි විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 12.5ක් ද, අවිවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 7.5 ක් ද, වශයෙන් නිවාස කුලී ලෙස අයකර ගත යුතු වුවත්, 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රජයේ නිල නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් රු.මිලියන 64.6 ක නිවාස කුලියක් අය විය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කුලී ආදායම රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් අයකර ගෙන නොතිබුණි.

## අනවසරයෙන් රජයේ නිවාසවල පදිංචිවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය අනුව තනතුරකට වෙන්කරන ලද නිවසක් හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 5කට සීමා වන අතර රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. එසේ අනුමැතියකින් තොරව මැති ඇමතිවරුන් 14 දෙනෙකුගෙනද, රාජ්‍ය නිලධාරීන් 14 දෙනෙකුගෙන්ද 2020 ජුලි 22 දින වන විටත් අනවසරයෙන් රජයේ නිවාසවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

## අලාභහානි

හදිසි අනතුරක් සම්බන්ධයෙන්, එහි ගමන් කළ නිලධාරීන් හෝ රියදුරන් විසින් ළඟම ඇති පොලීසියට වාර්තා කළ යුතුය. එසේ වුවද රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වාහන අනතුරකින් රු. මිලියන 2.7 ක අලාභ හානියක් සිදු වී තිබුණත්, ඒ පිළිබඳව පොලිසියට වාර්තා කර නොතිබුණි. තවත් අනතුරු 05 ක් පිළිබඳව පොලීසියට රක්ෂණ ආවරණය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණිලි කර තිබුණි.

# වෙළෙඳ කටයුතු

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 05 ක්, රාජ්‍ය ආයතන 05 ක් හා රාජ්‍ය සමාගම් 13 ක් මගින් මෙම අංශය වෙනුවෙන් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- දේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමින් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිල ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවෙහි යෙදීම
- 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම
- පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 39,902.46 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 16,311.51 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය වෙනුවෙන් පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 59.12 ක් හෙවත් රු.මිලියන 23,590.95 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 75 හි දැක්වේ.




රූපසටහන 75 පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

## ව්‍යාජ මිනුම් වැටලීම්

සමාලෝචිත වර්ෂයේදී මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාජ මිනුම් වැටලීම් 22,165 ක් සිදු කර තිබුණි. එම වැටලීම්වලින් 1,514 ක වැටලීම් සාර්ථක වී තිබුණි. මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්කවල කිසිදු වැටලීමක් සිදුකර නොතිබුණි. දඩ මුදල් වශයෙන් රු.මිලියන 2.85 ක ආදායමක් උපයා ගෙන තිබුණි.

## නව විද්‍යාගාරයෙහි වායුසමීකරණ පද්ධතිය සවිකිරීම

නව විද්‍යාගාරයෙහි වායු සමීකරණ පද්ධතිය සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 995 ක ප්‍රතිපාදන සළසා තිබුණද, 2020 මැයි 25 දින වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

## දෙපාර්තමේන්තුව සතු ගබඩා

2019 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතුව මෙට්‍රික් ටොන් 271,046 ක ධාරිතාවයෙන් යුක්ත ගබඩා 120 ක් පැවතුණි. එම ගබඩාවලින් 46 ක් රජයේ හා පෞද්ගලික ආයතන වෙත කුලී සහිතවද, ගබඩා 28 ක් රාජ්‍ය ආයතන වෙත කුලී රහිතවද ලබාදී තිබුණු අතර දෙපාර්තමේන්තුව භාරයේ ගබඩා 24 ක්ද, දිස්ත්‍රික් ලේකම් භාරයේ ගබඩා 20 ක් හා භාවිතයට නුසුදුසු ගබඩා 02 ක්ද පැවතුණි. රජයේ හා පෞද්ගලික ආයතන වෙත කුලියට ලබා දී තිබූ ගබඩා වලින් 2019 වර්ෂයේදී ලැබුණු කුලී ආදායම රු.මිලියන 92.51 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු හිඟ ගබඩා කුලිය රු.මිලියන 111.16 ක් වූ අතර එම හිඟ ගබඩා කුලිය අයකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## විද්‍යාත්මක ගබඩා උපයෝජනය

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු වෙයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පැවති ධාරිතාවය මෙට්‍රික් ටොන් 34,300 ක් වූ ගබඩා 06 ක් සහල් ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීමේ අරමුණින් විද්‍යාත්මක සහ ස්වභාවික ගබඩා ලෙස නවීකරණය කර තිබුණි. ගබඩා නවීකරණ කටයුතු සඳහා 2012 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 292.31 ක් වැයකර තිබුණි. එසේ වුවද, 2019 වර්ෂයේ දෙපාර්තමේන්තුව සතුව කිසිදු ආරක්ෂිත සහල් තොගයක් නොතිබුණු අතර ගබඩා නිෂ්ක්‍රීයව පැවතුණි. මෙම ගබඩා නවීකරණය කිරීමේ අරමුණ ඉටු කර ගැනීම හා වැයකරන ලද මුදලින් ඵලදායි ප්‍රතිඵල ලබා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## අපනයන වෙළඳපොළ ප්‍රවේශයට සහයවීමේ වැඩසටහන

2019 වර්ෂයේ අයවැය යෝජනා අනුව සමාගම් 100 ක් සඳහා අපනයන වෙළඳපල ප්‍රවේශයට සහයවීමට ඉලක්කගත කළද මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළ පළමු වර්ගීකරණය යටතේ සමාගම් 36 ක් සඳහාද දෙවන වර්ගීකරණය යටතේ සමාගම් 52 ක් සඳහාද සහය දැක්වීමට තීරණය කර තිබුණි.

මෙහිදී පළමු වර්ගීකරණය යටතේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගිවීම සඳහා සමාගම් 36 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 17.3 ක් වැයකර තිබුණි. මේ අතර රබර් හා රබර් නිෂ්පාදන අංශයට අදාළව වෙළඳ ප්‍රදර්ශන සඳහා සමාගම් 2 ක්ද, ඇඟළුම් අංශයට අදාළව වෙළඳ ප්‍රදර්ශන සඳහා සමාගම් 11ක්ද, තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයට අදාළ වෙළඳ ප්‍රදර්ශන සඳහා සමාගම් 5ක්ද සහභාගි වී තිබුණි.

තවද, දෙවන වර්ගීකරණය යටතේ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා සමාගම් 34 ක් 2019 වර්ෂය තුළ අනුමත කර තිබූ අතර එයින් 13 ක් සඳහා අනුමත මුදලින් සියයට 40 ක් වන එකතුව රු.මිලියන 21.8 ක් ගෙවා තිබූ අතර නිෂ්පාදන ක්‍රියාවලි ප්‍රසාරණය, නිෂ්පාදන ධාරිතා වර්ධනය හා නව සන්නම් නාම සංවර්ධනය සඳහා සමාගම් 17 ක් සඳහා සහය දැක්වීමට අනුමත කර තිබූ අතර එයින් 11ක් සඳහා පමණක් සියයට 40 ක් බැගින් එකතුව රු.මිලියන 17.7 ක් ලබාදී තිබුණි.

තවද මෙම වැඩසටහන සඳහා 2019 වර්ෂයේ අනුමත ප්‍රතිපාදනය රු.මිලියන 175 ක් වී තිබුණත්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත රු.මිලියන 96 ක් පමණක් ලැබී තිබූ බැවින් අයවැයගත ඉලක්ක කරා ළඟාවීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

## නව අපනයනකරුවන් 2000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

ව්‍යවසායකයින් 2000 ක් නව අපනයනකරුවන් බවට පත්කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 34.12 ක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වැයකර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාලන කමිටුවක් පත්කළ යුතු බව 2017 මාර්තු 30 දිනැති අංක 2017/03/20 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබුණද, එසේ කර නොතිබුණි. තවද මෙම වැඩසටහන් පැවැත්වීමට ස්ථාන තෝරා ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවා රු.මිලියන 3.47 ක් වැය කර පෞද්ගලික හෝටල් 06ක වැඩසටහන් පවත්වා තිබුණි. මෙහිදී ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.215,900 ක් වැයකර තිබුණි. මෙම වැඩ සටහනින් ව්‍යවසායකයින් 2000 ක් අපනයනයට යොමු කිරීමට අපේක්ෂා කර තිබුණත්, 2017- 2019 කාලය තුළ 155 දෙනෙකු පමණක් අපනයනයට යොමුවී තිබුණි.

## තොග කළමනාකරණය

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා තොග කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පෞද්ගලික අංශයේ සමාගමකට පවරා තිබුණි. සමාගමේ තොග කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වූ කෙරවලපිටිය තොග ගබඩාවේ මෙහෙයුම් කටයුතු, 2019 ජූනි මාසයේ සිට නවතා තිබුණද, විධිමත් තොග කළමනාකරණයක් නොතිබීම හේතුවෙන් බෙදාහැරීමට සුදුසු කෙටි කාලයකින් කල් ඉකුත් වන, අලෙවිසැල් වලින් ආපසු හරවා එවන ලද වශයෙන් වර්ග කරන ලද රු.මිලියන 42.76 ක් වටිනා ග්‍රොසරි භාණ්ඩ තොගයක් 2019 ඔක්තෝබර් මාසය වන විටත් අදාල ගබඩාවේ පැවතුණි.

## ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය

ලංකා සතොස ලිමිටඩ් සමාගම විසින් රු.මිලියන 198.17 කට ප්‍රදානය කර මාස 15 ක් ඇතුළත අවසන් කළ යුතුව තිබූ ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් මුදලින් සියයට 30 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය නිම කර භාර දීමට ප්‍රමාද වුවහොත් ප්‍රමාද වන එක් දිනයකදී කොන්ත්‍රාත් මුදලින් සියයට 1 ක් අඩු කළ යුතු බව සඳහන් වී තිබුණි. ප්‍රමාද වන එක් දිනකට ගෙවිය යුතු ගාස්තුව නිශ්චය කර නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කළ යුතු දිනය ඉක්මවා දින 574 ක් ප්‍රමාදවී තිබියදී කොන්ත්‍රාත් මුදලින් සියයට 1ක් පමණක් අඩු කර අදාල මුදල් ගෙවීම් සිදු කර තිබුණි.

තවද, ගිවිසුම අනුව ගැණුම්කරුගේ ලිඛිත එකඟතාවයකින් තොරව කොන්ත්‍රාත්තුව හෝ එහි කොටසක් හෝ වෙනත් පාර්ශවයකට පැවරීමෙන් සිදු වන හානි හෝ පාඩු සම්බන්ධයෙන්, කොන්ත්‍රාත්කරු අදාළ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1 ක අගයට සමානව වගකීමට බැඳෙන නමුත් ඇතැම් කොටස් වෙනත් ආයතනයකට පැවරීම හේතුවෙන් ප්‍රමාද වී තිබූ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 1 ක් වූ රු. 19,817,578 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික කරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව, එකම සැපයුම්කරුවෙකුගෙන්, මිල ගණන් දෙකකට මිලදී ගෙන තිබූ වටිනාකම රු.මිලියන 24.38 ක් වූ ප්ලාස්ටික් ඇසුරුම් කූඩ 12, 800 කින් ඇසුරුම් කූඩ 1,975 ක් 2019 වර්ෂය අවසාන වන විටත් ගබඩාවල නිෂ්කාර්යව පැවති අතර එම කූඩවල අවම තක්සේරු වටිනාකම රු.මිලියන 3.76 ක් වී තිබුණි.

## සමාගම් පනතේ නියමයන්ට අනනුකූලව ක්‍රියා කිරීම

සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික වාර්තා 74,818 ක් ගොනු කළ යුතුව තිබුණත්, සමාගම් 17,532 ක් පමණක් එම වාර්තා ගොනු කර තිබුණි. ඒ අනුව වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමාගම්වලින් සියයට 77 ක ප්‍රමාණයක් වාර්ෂික වාර්තා ගොනු කිරීම පැහැර හැර තිබුණි.

## හිඟහිටි ආදායම්

2007 අංක 07 දරන සමාගම් පනතේ 131 (1) සහ (2) වගන්ති ප්‍රකාරව, ලියාපදිංචි සමාගම් වෙතින් අයවිය යුතු වාර්ෂික වාර්තා ආදායමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 2,292.00 ක ආදායම් හිඟහිටව පැවතුණි. ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 1,974.60 ක හිඟ හිටි ආදායම සමඟ සැසඳීමේදී එය සියයට 16 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම හිඟහිටි ආදායම් අයකර ගැනීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## සමාගම්වල මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම

සමාගම් පනතේ 170 (1) වගන්තියට අනුකූලව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 6893 ක් වී තිබුණි. ඉන් සමාගම් 1922 ක් පමණක් මූල්‍ය වාර්තා ඉදිරිපත් කර තිබුණද සමාගම් 4971 ක් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## සමාගම් ලිපිගොනු පරිලෝකනය කිරීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ක්‍රියාකාරී සමාගම් ගොනු 70,931 ක ලේඛණවලට අදාළ පිටු 9,128,320 ක් පරිලෝකනය (Scanning) හා දත්ත ඇතුළත් කිරීම (Indexing) සඳහා රු.මිලියන 68.09 කට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්කට එළඹ තිබුණි. එම ගොනු පරිලෝකනයට අදාල සත්‍ය පිටු ප්‍රමාණය පිටු 6,082,608 ක් වූ බැවින් එය ගිවිසුම් ගත පිටු ප්‍රමාණයට වඩා අඩුවීම හේතුවෙන් එම පරතරය පියවා ගැනීම සඳහා බොහොමයක් අක්‍රිය මට්ටමේ පැවති සමිති මෙන්ම විගණකවරුන්, ලේකම්වරුන් හා උකස් බැඳුම්කර ලියාපදිංචියට අදාළ ලේඛණද පරිලෝකනය කර තිබුණි. ඒ අනුව පෙර අපේක්ෂා නොකළ ලේඛනද පසුව පරිලෝකනය කිරීම හේතුවෙන් ඊට සමගාමී වන දත්ත ඇතුළත් කිරීමේ (Indexing) පිරිවැය ඉහළ යාම නිසා

කොන්ත්‍රාත්කරු සමඟ රු.මිලියන 25.71 ක අමතර වැඩ සඳහා නැවත ගිවිසුමකට එළඹ තිබුණි.

## නිෂ්කාර්ය වත්කම්

2018 වර්ෂයේ මිලදීගත් වගකීම් කාල සීමාව අවුරුදු 03 ක්වූ රු.මිලියන 1.325 ක් වටිනා රූපවාහිනී යන්ත්‍ර 05 ක්ද, රු.මිලියන 3.641 ක් වටිනා පරිගණක උපාංග තොගයක්ද 2019 වර්ෂයේ මිලදී ගත් වගකීම් කාල සීමාව අවුරුදු 03 ක්වූ රු.මිලියන 4.7801 ක්වූ පරිගණක හා පරිගණක උපාංග තොගයක්ද ප්‍රයෝජනයට නොගෙන සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගබඩාවේ 2020 අගෝස්තු මාසය අවසන් වන විටත් රඳවා ගෙන තිබුණි.

# සංචාරක කටයුතු



"ශ්‍රී ලංකාව සංචාරකයන්ගේ මතකයේ රැදෙන, අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ඨතම දූපත ලෙස හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත් කිරීම" සංචාරක සංවර්ධනය අංශයේ දැක්ම සහ මෙහෙවර වී තිබුණි. එය ඉටුකර ගැනීම සඳහා සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාර්ය ඉටු කළ යුතුව තිබුණි.

- සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
- සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු.
- විවේක ගත කිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාල කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 2 ක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් රු.මිලියන 3,061 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 1,241 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 59.46 ක් හෙවත් රු.මිලියන 1,820 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර තිබුණි. විස්තර රූපසටහන 76 හි දැක්වේ.




රූපසටහන 76 - සලසා තිබුණු ප්‍රතිපාදන හා උපයෝජනය කිරීම
මූලාශ්‍රය - භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ

මෙම අංශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### සංචාරකයින්ගේ පැමිණීම හා විදේශ විනිමය ඉපැයීම

2018 වර්ෂයේදී සංචාරකයින් 2,333,796 දෙනෙකු පැමිණ තිබුණු අතර එය 2019 වර්ෂයේදී 1,913,702 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. 2019 අප්‍රේල් මාසයේදී සිදු වූ පාස්කු ප්‍රහාරය නිසා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශාල බලපෑමක් සිදු වී තිබුණි. එම බලපෑම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මනාව පිළිපිඹු වේ. 2018 මැයි මාසයේ සංචාරකයින් 129,446 දෙනෙකු පැමිණ තිබුණු අතර 2019 මැයි මාසයේදී සංචාරකයින් 37,802 දෙනෙකු පමණක් පැමිණ තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මැයි මාසයට සාපේක්ෂව සියයට 70.8 ක අඩුවීමක් වාර්තා වේ. කෙසේ හෝ 2019 මැයි මාසයෙන් පසුව එම අනුපාතිකය ක්‍රමිකව අඩු වී 2019 දෙසැම්බර් මාසය වන විට සියයට 4.5 ක් දක්වා අඩු කර ගැනීමට හැකි වී තිබුණි. එම තත්ත්වය රූප සටහන 77 හි දැක්වේ.




රූපසටහන 77 – 2019 හා 2018 වර්ෂවල එක් එක් මාසයේ සාංචාරකයින්ගේ පැමිණීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2018 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරයෙන් රු.මිලියන 712,027.3 ක ආදායමක් රැස් කර තිබුණත්, 2019 වර්ෂයේදී එය රු.මිලියන 65,665 කින් හෙවත් සියයට 9.22 කින් අඩු වී තිබුණි. විදේශ විනිමය අනුව සලකා බලන විය 2018 වර්ෂයේදී එ.ජ.ඩො.මිලියන 4,380.6 කට සාපේක්ෂව 2019 වර්ෂයේදී එ.ජ.ඩො.මිලියන 3,606.9 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ එ.ජ.ඩො.මිලියන 773.7 ක් අහිමි වී තිබුණි. සංචාරක ව්‍යාපාරයෙන් ලද අදායම 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රමිකව වැඩි වී 2019 වර්ෂයේදී අඩු වී තිබුණි. ඒ පිළිබඳ විස්තරයක් රූපසටහන 78 හා 79 හි දැක්වේ.




රූපසටහන 78 - සංචාරක ආදායම රු.මිලියන
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




රූපසටහන 79 - සංචාරක ආදායම එ.ජ.ඩො.මිලියන
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පාස්කු ප්‍රහාරය හමුවේ සංචාරක ව්‍යාපාරය අඩපනවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද සියලුම ප්‍රධාන කළාපවල සංචාරක පැමිණීම අඩු වී තිබුණි. එමෙන් ම ඉන්දියාවෙන් සංචාරකයින් 355,002 දෙනෙකු පැමිණි අතර එය රටක් වශයෙන් වැඩිම සංචාරකයින් ප්‍රමාණය වී තිබුණි. එම සංඛ්‍යාව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 16.4 කින් අඩු වී තිබුණි. එක්සත් රාජධානියෙන් සංචාරකයින් 198,776 දෙනෙකු පැමිණ තිබුණු අතර එය ඊ ළඟ වැඩිම ආකර්ශණීය රටක් වී තිබුණි. නමුත් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 21.8 ක අඩුවීමක් වී තිබුණි. විස්තර රූපසටහන 80 හි දැක්වේ.




රූපසටහන 80 - රටවල් අනුව සංචාරකයින් පැමිණීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සමාලෝචිත වර්ෂයේදී සංචාරක හෝටල් ආදායමින් අය කරන සංචාරක සංවර්ධන බදු ආදායම රු.මිලියන 924.2 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ එම බදු ආදායම රු.මිලියන 1,482.1 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු.මිලියන 557.9 ක් හෙවත් සියයට 37.64 කින් අඩු වී තිබුණි. මෙ අඩුවීම කෙරෙහි 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරය බලපා තිබුණි. සංචාරක සංවර්ධන බදු ආදායම ඉකුත් වර්ෂවල ක්‍රමිකව වර්ධනය වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එය අඩු වී තිබුණි. විස්තර රූපසටහන 81 හි දැක්වේ.




රූපසටහන 81 - සංචාරක සංවර්ධන බදු ආදායම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

විදේශීය සංචාරක පැමිණීම පහළයාම මෙන්ම සංචාරකයකුගේ සාමාන්‍ය වියදම සහ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන පහළ යාම සංචාරක ඉපැයුම් අඩුවීමට ප්‍රධාන සාධකයක් වී තිබුණි. සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 2019 වර්ෂයේ දින 10 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී දින 11 ක් විය. 1987 වර්ෂයේ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 13 න සමඟ සැසඳීමේදී එම ඉලක්කයට ළඟා වීමට සමාලෝචිත වර්ෂයේදී ද නොහැකි වී තිබුණි. 2019 වර්ෂයේදී සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම එ.ජ.ඩො.181 ක් වූ අතර 2018 වර්ෂයේදී එ.ජ.ඩො.173.8 ක් වී තිබුණි. එසේ වුවද, සංචාරකයින්ගේ පැමිණීම සියයට 18 කින් අඩුවීමට සංචාරක ව්‍යාපාරයේ ආදායම සියයට 9.22 කින් පහළයාමට හේතු වී තිබුණි.

සංචාරක කර්මාන්තයේ සංවර්ධන කටයුතු සඳහා 2019 වර්ෂය වෙනුවෙන් රැස් කරනු ලැබූ සංචාරක සංවර්ධන බදු ආදායම හා අපගමන බදු ආදායම රු. මිලියන 3,031 ක් විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සංචාරක සම්මේලන කාර්යාංශය යන ආයතන 04 ක් සඳහා පිළිවෙලින් සියයට 14 ක, සියයට 70 ක

සියයට 12 ක හා සියයට 4 ක් බැගින් ලබා දී තිබුණි. තවද සංචාරක සංවර්ධන අරමුදලේ අපගමන බදු ආදායමෙන් පලාලි ගුවන් තොටුපල සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 801 ක් ලබා දී තිබුණි. සංචාරක සංවර්ධන අරමුදලට අමතරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සංචාරක සංවර්ධන කටයුතු සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට රු. මිලියන 318 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි.

## ප්‍රතිපාදන ඌන උපයෝජනය

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට සංචාරක සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 318 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 120 ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 86.24 ක් හෙවත් සියයට 28.13 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ බලකොටු සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 47.76 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමෙන්ම දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය අවසාන වන විට රු.මිලියන 8.71 ක් පමණක් වියදම් කර තිබුණි.

## අපේක්ෂිත ඉලක්ක ඉටු කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් 73 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණත්, ඉන් ක්‍රියාකාරකම් 46 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## අලෙවි ප්‍රවර්ධන වියදම්

මැදපෙරදිග, ඔස්ට්‍රියා සහ ඉතාලිය යන රටවල් වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් වියදම් කර තිබුණි. නමුත් එම රටවලින් සංචාරකයින් පැමිණීම සියයට 5 ක සිට සියයට 146 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩු වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ වාර්ෂික අයවැය ලේඛනයෙන් සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා රු.මිලියන 3,347.54 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 2,078.56 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## අපගමන බදු අය කර ගැනීමට කටයුතු නොකිරීම

2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) උපවගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, එලෙස නැව් මඟින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 2019 වර්ෂය තුළදී මගීන් 100,614 ක් පිටත්ව ගොස් ඇති බැවින් ඒ වෙනුවෙන් මගියෙකුගෙන් එ.ජ.ඩොලර් 1.66 බැගින් සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලට ලැබිය යුතු එ.ජ. ඩොලර් 167,019 ක් එනම් රු.මිලියන 29.73 ක අපගමන බදු ආදායම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව නිලධාරීන් බඳවා ගැනීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවී සේවා පලපුරුද්ද සපුරා නොමැති නිලධාරිණියන් දෙදෙනකු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා විවිධ දීමනා වශයෙන් පිළිවෙලින් රු.මිලියන 8.20 ක් හා රු.මිලියන 3.83 ක් ගෙවා තිබුණි.

# සත්වෝද්‍යාන හා උද්භිද උද්‍යාන

නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශණය කිරීම යන මෙහෙවර ඉටු කිරිම සඳහා සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විවේකය ගතකිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීම සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරිම.
- ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තය වැඩිදියුණු කිරිම.
- සිව්පාවුල්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශී කිරිම සහ ප්‍රදර්ශනය කිරිමටඅදාළ කටයුතු.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු.මිලියන 5,590.13 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් රු.මිලියන 4,755.46 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 17.93 ක් හෙවත් රු.මිලියන 834.67 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන් 82 හි දැක්වේ.




රූපසටහන 82- පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය මූලික පරමාර්ථයක් වී තිබුණත්, 2011 වර්ෂයේ සිට පින්නවල අලි අනාථාගාරය තුළ කිසිදු අලි පැටවකු උපත ලබා නොතිබුණි. අලි ඇතුන් අභිජනනය වීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක පසුබිමක් සලසා නොතිබීම ඊට හේතු වී තිබුණි. පින්නවල අලි අනාථාගාරයෙන් වර්ෂයකදී රු.මිලියන 3 ක පමණ ආදායමක් උපයන අතර, එම ආදායම ඉහළ නැංවීම කෙරෙහි බලපාන සාධකයක් වන අලි පැටවුන්ට කිරි පෙවීමේ අවස්ථාව සංචාරකයින්ට ප්‍රදර්ශනය කිරීමට නොහැකි වී තිබුණි.

## පරිශ්‍රය පිරිසිදුව පවත්වා ගැනීම

පින්නවල අලි අනාථාගාරයේ දෛනිකව එකතු වන අලි වසුරු හා ඉතිරි වන ආහාර කොටස් බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කළමණාකරණය අපොහොසත් වී තිබුණි. එම අලි වසරු හා ඉතිරිවන ආහාර කොටස් අලින් රඳවා සිටින ස්ථාන අසල ගොඩ ගසා තිබුණි. ඒ හේතුවෙන් පරිශ්‍රය අපවිත්‍රව පැවති අතර සංචාරක ආකර්ෂණය අඩු වීම කෙරෙහි එය බලපා තිබුණි.

## අප ජලය පිරිසිදු ජලය සමඟ මිශ්‍ර කර බැහැර නොකිරීම

මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව යම් ස්ථානයකින් අප ජලය බැහැර කිරීමේදී අවම වශයෙන් එම ජල ධාරිතාවය මෙන් අට ගුණයක්වත් පිරිසිදු ජලය සමග මිශ්‍රකර මුදාහැරීම සිදු කළ යුතුව තිබුණි. නමුත් දෙහිවල සත්වෝද්‍යානයෙන් පිට කරනු ලබන අප ජලය එසේ පිරිපහදු කිරීමකින් තොරව අසල පිහිටි ගල් වළ නමැති ස්ථානයට මුදා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රදේශයේ ජල මූලාශ්‍ර අපිරිසිදු වීම, අවට ජනතාවගේ සෞඛ්‍යයට අහිතකරව බලපෑම වැනි පාරිසරික ගැටළු ඇති වී තිබුණි.

# පළාත් සභා පිළිබඳ හැඳින්වීම

රජය සතු බලය පළාත් සඳහා බෙදා හැරීමේ අරමුණින් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් සහ 1987 අංක 42 දරන පළාත් සභා පනත මගින් ශ්‍රී ලංකාව තුළ පළාත් සභා පිහිටුවන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි පළාත් සභා 9 ක් ස්ථාපිත කරන ලද අතර කෘෂිකර්මය, අධ්‍යාපන, සෞඛ්‍යය, නිවාස, පළාත් පාලනය හා සමාජ සේවා ආදි ක්ෂේත්‍රයන් ඇතුළු ක්ෂේත්‍ර රාශියක පළාත් මට්ටමේ බලතල මෙම පළාත් සභාවලට පවරා දෙන ලදී. පළාත් සභාවක් ආණ්ඩුකාරවයාගේ පාලනය යටතේ පවතින අතර එහි ව්‍යවස්ථාදායකයෙහි ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයා කටයුතු කරන ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 04 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ. ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන බලධාරියා ලෙස කටයුතු කරනු ලබන අතර සෑම පළාත් සභාවක්ම පළාත් සභා අරමුදලින් හා හදිසි අවශ්‍යතා අරමුදල සමන්විත වේ. රජයෙහි ඒකාබද්ධ අරමුදල හා බෙහෙවින් සමාන වන මෙම පළාත් සභා අරමුදලට රජයේ ප්‍රදාන, බදු ඉපයීම හා අනෙකුත් මාර්ගයෙන් අරමුදල් ලැබෙන අතර අරමුදලින් පුනරාවර්ථන හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් දැරීමට සිදුවේ.තවද පළාත්සභා අමාත්‍යාංශයක් යටතට නොගෙන පළාත් සභා ආයතන, පළාත් සභා අමාත්‍යාංශ හා අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු විසර්ජන ගිණුම ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කරනු ලබයි.

ඒ හැරුණ විට සෑම පළාත් සභාවක්ම සියලු ආදායම් වියදම්, වත්කම්, වගකීම් දක්වමින් අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව හා 1987 අංක 42 දරන පළාත් සභා පනතෙහි 23 (1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා අරමුදලෙහි ගිණුම් විගණනය විගණකාධිපති විසින් කළ යුතුය.

ඒ අනුව බස්නාහිර, උතුරු මැද, සබරගමුව, වයඹ, මධ්‍යම,උතුරු,නැගෙනහිර,මධ්‍යම සහ ඌව යන පළාත් 9 හි 2018 සහ 2019 වර්ෂයන් සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

තවද පළාත් සභාවන්හි මූල්‍ය හා මෙහෙයුම් කාර්යයන් පිළිබඳව ප්‍රමාණාත්මක පාලනයක් මධ්‍යම රජය විසින් සිදු නොකරන හෙයින් 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 15 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු රජයේ මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ආදායම් සහ වියදම් දැක්වීමේ දී පළාත් සභාවන් අදාල කර ගෙන නොතිබුණි.

## පළාත් සභා ගිණුම් ඉදිරිපත් කිරීම

පළාත් සභා විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල ඉදිරිපත් කිරීමේ දී 2017 හා 2018 වර්ෂවලදී බොහෝ සෙයින් සමාන වූ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.එබැවින් එම වර්ෂයන් සඳහා සියලු පළාත් සභා මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කරමින් මා විසින් උපකල්පිත මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කලද 2019 වර්ෂය තුලදී පළාත්සභා විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හේතුවෙන් පෙර වර්ෂය සඳහා මෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට විගණනයට නොහැකි විය.

එහිදී පළාත් සභා කිහිපයක් උපචිත පදනමටද අනෙකුත් පළාත් සභා මුදල් පදනම හෝ modified cash basis පදනමද භාවිතා කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබුණි. තවද එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එකිනෙකට වෙනස් ආකෘතීන් භාවිතා කර තිබුණු බවද නිරීක්ෂණය විය. ඒ අනුව එම මූල්‍ය ප්‍රකාශන තුල සංගතතාවයක් නොමැති වී ඇති අතර එම මූල්‍ය ප්‍රකාශන සංසන්දනාත්මකව භාවිතා කරමින් තීරණ ගන්නා පාර්ශවයන් අපහසු තාවයට පත්විය හැකි බව නිරීක්ෂණය විය.පළාත් සභා විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරතිබූ ආකාරය සලකා බලමින් පහත සඳහන් සංරචකයන් විශ්ලේශණය කර ඉදිරිපත් කරන ලදී.

## පළාත් සභා ආදායම්

පළාත් සභාවක ආදායම ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රදාන, බදු ආදායම හා බදු නොවන ආදායම ඇතුළු විවිධ ප්‍රභවයන්ගෙන් සමන්විත වේ. ඇතැම් පළාත් සභාවන් මත ආදායම ගණනය කිරීමේ දී උපචිත පදනම සහ මුදල් පදනම විකල්ප ලෙස භාවිතා කර තිබීම සහ සියළුම පළාත් සභාවන් ආදායම් ගණනය කිරීමේ සමාන ප්‍රභවයන් යොදාගෙන නොතිබීම යන තත්ත්වයන්ට යටත්ව පළාත් සභාවන්හි ආදායම සහ එම සැසඳීම් සිදු කරන ලදී.

## රජයේ ප්‍රදාන

2019 වර්ෂය තුළදී පළාත් සභා 09 සඳහා ලබාදුන් රජයේ ප්‍රදානය රු.බිලියන 218 ක් වූ අතර එය 2018 වර්ෂයේ දී රු.බිලියන 204 කි. 2019 වර්ෂය තුළ ප්‍රදානයන්ගේ ඉහළම ප්‍රතිශතය එනම් සියයට 15 ක් මධ්‍යම පළාත්සභාවට ලබාදී තිබුණු අතර එය රු.බිලියන 32 කි. තවද, උතුරුමැද පළාත් සභාවට අඩුම ප්‍රදානය ලබාදී තිබුණු අතර එය රු.බිලියන 18 ක් වූ අතර මුළු ප්‍රදානයන් ගේ ප්‍රතිශතයක් ලෙස සියයට 8 කි. ඒ අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ රජයේ සමස්ථ වියදම වූ රු.බිලියන 2959 තුළ පළාත් සභාවන් සඳහා ලබාදුන් රු. බිලියන 218 ක් ප්‍රදාන ද ඇතුළත් වේ. එය සමස්ථ වියදමින් සියයට 7 කි.

## බදු ආදායම

2019 වර්ෂයේ දී සියලුම පළාත් සභාවන්හි බදු ආදායම රු.බිලියන78 ක් වූ අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 4 ක පමණ වැඩිවීමකි. 2019 බදු ආදායමෙන් ඉහළම බදු ආදායම බස්නාහිර පළාත් සභාවෙන් වාර්තා වන අතර එය රු. බිලියන 41 කි. එය මුළු පළාත් බදු ආදායමෙන් සියයට 53 ක් පමණ වේ. කෙසේවුවද 2019 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ශ්‍රී ලංකාවේ සමස්ථ බදු ආදායම හා සසඳන විට පළාත් සභා මඟින් ඉපයීමට හැකි වූ බදු ආදායම සියයට 4.4 ක් පමණි. 2019 වර්ෂයේ දී මධ්‍යම රජය ඉපයූ සමස්ථ බදු ආදායම රු.බිලියන 1,735 කි.

## බදු නොවන ආදායම

2019 වර්ෂයේදී උපයන ලද බදු නොවන ආදායම රු.බිලියන 12 ක් වූ අතර එය 2018 වර්ෂයේ දී රු.බිලියන 10 ක් විය.2019 වර්ෂය තුලදී උපයන ලද බදු නොවන ආදායම තුල බස්නාහිර පළාත් සභාව විසින් උපයන ලද රු.බිලියන 4 ක් වූ බදු නොවන ආදායමක් ඇතුළත් වූ අතර එය පළාත්සභා සියල්ල ඉපයූ බදුනොවන ආදායමෙන් සියයට 32 කි.තවද එම ආදායම රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව බදු නොවන ආදායමෙන් සියයට 7ක් පමණි.

## රජයේ ප්‍රදාන හා පළාත් සභා ඉපයූ බදු ආදායම හා බදු නොවන ආදායම

2019 වර්ෂයේදී රජය විසින් පළාත් සභා සඳහා රු.බිලියන 218 ක ප්‍රදානයන් ලබාදී තිබුණු අතර ඊට සාපේක්ෂව පළාත් සභා සඳහා ඉපයීමට හැකිව තිබූ සමස්ථ බදු හා බදු

නොවන ආදායම රු. බිලියන 90 ක් පමණි. එය ප්‍රදානයන්ට සාපේක්ෂව සියයට 41 ක් වූ අතර එම ප්‍රදානයන්ට සාපේක්ෂව ඉපයීමට හැකිම තිබූ බදු ආදායම සියයට 36 ක් පමණි.

## පළාත් සභා වියදම්

සෑම පළාත් සභාවක් විසින්ම පෞද්ගලික පාරිශ්‍රමික, අනෙකුත් භාණ්ඩ හා සේවා, නඩත්තු වියදම් ඇතුළත්ව පුනරාවර්ථන වියදම්ද ප්‍රාග්ධන ස්වරූපයෙන් සංවර්ධන වියදම්ද වාර්ෂිකව දරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂයේ පළාත් සභා විසින් දරන ලද සමස්ථ වියදම රු. බිලියන 314 කි. 2018 වර්ෂයේදී එම වියදම් සඳහා පළාත් සභා විසින් රු.බිලියන 300 ක් දරා තිබුණු අතර 2019 වර්ෂයේදී එම වටිනාකම ඉක්මවා රු.බිලියන 14 ක් වැය කර තිබුණි.තවද පළාත්සභා විසින් දරන ලද වියදම රජයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වියදමෙන් සියයට 10 කි.

## පුනරාවර්තන වියදම

2019 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 289 ක් පළාත් සභා විසින් වැය කර තිබුණි. 2018 වර්ෂයේදී එම වියදම රු.බිලියන 266 ක් වී තිබුණි. 2019 වර්ෂයේදී රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු පුනරාවර්තන වියදම රු. බිලියන 2,322 ක් වී තිබුණු අතර ඒ ැකුන රජයේ හා පළාත් සභාවල වියදමද ඇතුළත් සමස්ථ වියදම රු.බිලියන 2,611 ක් වී තිබුණි. තවද 2019 වර්ෂය තුළ ඉහළම පුනරාවර්තන වියදම බස්නාහිර පළාත් සභාව විසින් සිදු කර තිබුණු අතර එය සියලු පළාත් සභා දරන ලද පුනරාවර්තන වියදමින් සියයට 21 ක් වී තිබුණි.

තවද, 2019 වර්ෂයේ පළාත් සභා විසින් උපයන ලද සමස්ථ බදු හා බදු නොවන ආදායම ඉක්මවන ලද පුනරාවර්ථන වියදම රු.බිලියන 199 කි. ඒ අනුව එම ආදායම ඉක්මවන ලද පුනරාවර්ථන වියදමෙහි ප්‍රතිශතය සියයට 220 කි. උතුරු පළාත උපයන ආදායම ඉක්මවා සියයට 638 ක වියදම් දරා ඇති අතර පිළිවෙලින් නැගෙනහිර පළාත සියයට 563 ක්,ඌව පළාත 637 ක් හා සබරගමුව පළාත 444 ක් ලෙස වියදම් කර තිබුණි.

තවද 2019 වර්ෂයේ රජය විසින් පළාත් සභා සඳහා ලබාදුන් සමස්ථ ප්‍රදානය රු.බිලියන 218 ක් වුවද එම ප්‍රමාණයද රු. බිලියන 71 කින් ඉක්මවමින් එනම් බිලියන 289 ක පුනරාවර්තන වියදම් කර තිබුණි.

## සංවර්ධන වියදම්

2019 වර්ෂයෙහි රු.බිලියන 25 ක් සංවර්ධන වියදම් ලෙස පළාත් සභා 9 ම දරා තිබුණු අතර එය 2018 වර්ෂයේදී රු. බිලියන 34.8කි. ඒ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව සංවර්ධන වියදම් සඳහා දරන ලද වියදම රු.බිලියන 10.8 කින් පහළ ගොස් තිබුණි.. පළාත් සභා දරා තිබුණු වියදමට සාපේක්ෂව 2019 වර්ෂයේදී රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. බිලියන 637 ක් සංවර්ධන වියදම් ලෙස දරා තිබුණි.තවද ඉහළම සංවර්ධන වියදම වූ රු. බිලියන 69 බස්නාහිර පළාත් සභාව දරා තිබුණු අතර අඩුම සංවර්ධන වියදම වූ රු.බිලියන 0.3 නැගෙනහිර පළාත දරා තිබුණි.

## පළාත් සභා වත්කම්

2018 වර්ෂයේදී රු. බිලියන 222 ක් ලෙස හඳුනාගත් පළාත් සභා මුළු වත්කම් ප්‍රමාණය 2019 වර්ෂයේ දී රු.බිලියන 230 ක් ලෙස හඳුනාගෙන ඇති අතර එය සියයට 3 ක වර්ධනය වීමකි. තවද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයෙහි වත්කම් ප්‍රමාණය රු.බිලියන 2,199 ක් විය. පළාත් සභා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් හා රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයෙහි පැවති රටෙහි සමස්ථ වත්කම් ප්‍රමාණය රු.බිලියන

2.133 ක් ව පැවති 2019 වර්ෂය වන විට සමස්ථ වත්කම් ප්‍රමාණය රු. බිලියන 66 කින් එන්ම දක්වා සියයට 3කින් න් වර්ධනය වී තිබුණි.

### ජංගම නොවන වත්කම්

2018 වර්ෂයේ රු.බිලියන 179 ක් වූ ජංගම නොවන වත්කම් හි වටිනාකම 2019 වර්ෂය තුළදී රු.බිලියන 11 කින් වර්ධනය වී තිබුණු අතර එම වටිනාකම රු.බිලියන 190 කි. මෙම ජංගම නොවන වත්කම් තුළ තක්සේරු කරන ලද දේපළ, පිරියත හා උපකරණ රු.බිලියන 177 ක් ද ඇතුළත් වේ. තවද 2019 වර්ෂයෙහි රජයේ මූල්‍ය ප්‍රකාශනයන් හි ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.බිලියන 1.355 ක් වූ අතර සමස්ථ වටිනාකම රු.බිලියන 1.545 කි.

### ජංගම වත්කම්

2019 වර්ෂයේදී රු.බිලියන 42 ක් වූ ජංගම වත්කම් හි වටිනාකම 2019 වර්ෂයේදී රු.බිලියන 40 දක්වා පහළ ගොස් තිබුණි. පළාත් සභා ජංගම වත්කම් හා රජයේ මූල්‍ය ප්‍රකාශනයන් හි ජංගම වත්කම්වල සමස්ථ වටිනාකම 2019 වර්ෂයෙහි රු.බිලියන 884 කි.

### පළාත් සභා වගකීම්

2018 වර්ෂයේ රු.බිලියන 13.9 ක් වූ පළාත් සභා මුළු වගකීම 2019 වර්ෂයේදී රු.බිලියන 13.5 ක් වී තිබුණි. තවද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයෙහි මුළු වගකීම් රු.බිලියන 12.645 ක් විය.

# බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 24,477 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 56,804 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 81,281 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 68,377 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 12,904 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 81,281 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 21,608 ක්ද අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 44,922 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 66,530 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්තන වියදම රු.මිලියන 61,380 ක් හා මූලධන වියදම රු.මිලියන 7,591 ක් වශයෙන් රු.මිලියන 68,971 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම පිළිබඳ විස්තර රූපසටහන 82 හි දැක්වේ.




රූපසටහන 82 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම්
මූලාශ්‍රය - බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

## පාසලක් සඳහා බස්රථයක් ලබා ගැනීම

ගම්පහ අධ්‍යාපන කලාපයේ මහා විද්‍යාලයක් සඳහා බස් රථයක් මිලදී ගැනීම සඳහා ආදි ශිෂ්‍ය සංගමය විසින් දෙමාපියන් හා සිසුන්ට කිසිදු බලපෑමකින් තොරව දෙමාපියන් නොවන බාහිර පාර්ශවයන්ගෙන් අරමුදල් රැස්කරන බව ප්‍රකාශ කර ඒ සඳහා විදුහල්පතිගේ අනුමැතිය ලබා ගෙන අරමුදල් රැස්කර තිබුණි. මෙම අරමුණ සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට පාසලට අළුතින් ඇතුළත්වන දරුවන්ගෙන්ද, විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයෙන්ද, එකතු කළ රු.මිලියන 6.65 ක් ඉතිරිකිරීමේ බැංකු ගිණුමට බැර

කර තිබුණි. කෙසේනමුත් බස් රථය මිලදී ගැනීමේ අරමුණට පරිබාහිර වූ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් සඳහා එම බැංකු ගිණුමට බැර වූ මුදලින් රු.මිලියන 5.07 ක් වැය කර තිබුණි. 2018 නොවැම්බර් 19 හා 30 යන දිනයන්හිදී බස් රථය මිලදී ගැනීම සඳහා මූලික ගෙවීමක් වශයෙන් රු.මිලියන 1.20 ක් මෝටර් රථ අලෙවි කිරීමේ ආයතනයකට ගෙවා තිබුණි. තවදුරටත් ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 2.70 ක් ගෙවීම සඳහා කිසිදු අනුමැතියකින් තොරව මූල්‍ය කල්බදු සමාගමකින් සියයට 23.5 ක වාර්ෂික පොලියක් යටතේ මාස 24ක කාලයකින් ආපසු ගෙවීමේ පදනම මත චක්‍රීය ණය පහසුකමක් විදුහල්පතිවරයා විසින් ලබා ගෙන තිබුණි. 2019 ජනවාරි 01 දින වන විට බස් රථය පාසලට ලැබී තිබුණු අතර එය විදුහල්පතිවරයාගේ පෞද්ගලික නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටද එහි ලියාපදිංචිය පාසල නමට පැවැරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## වේලා පාලන පද්ධතියක් සවි කිරිම

බස්නාහිර පළාත් සභාවේ සභා කටයුතු කාරක සභා රැස්වීමේදී ධූරධාරීන්ගේ කාමර, All Committee Rooms (ABC) සහ සභා ශාලාව තුළ වේලා පාලන පද්ධතිය (Master Clock System) සවි කිරීමටත් ඊට අමතරව Digital Digits වලින් වේලාව දැක්වෙන ඔරලෝසු වර්තමාන සභාව පැවැත්වෙන ශාලාවේත්, සභා ලේකම් කාමරයේත්, සභා ලේකම් කාර්යාල පරිශ්‍රයේත් සවි කිරීමට තීරණය කර තිබුණි. නමුත් එම තීරණයට අනුකූල නොවන ලෙස සම්පූර්ණ පළාත් සභා ගොඩනැගිල්ලේම සවි කිරීම සඳහා එකක් රු.35,387 බැගින් Analog ඔරලෝසු 142 ක් හා එකක් රු.96,471 බැගින් Digital ඔරලෝසු 27 ක් ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 12.94 ක් වැය කර තිබුණි. ඔරලෝසු සවිකිරීමේදී අනවශ්‍ය පරිදි එක් ස්ථානයක ඔරලෝසු කිහිපයක් සවිකර තිබීම හා එක් එක් ඔරලෝසු අතර වේලාව එකිනෙකට වෙනස්වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පවතින චංචල හා නිශ්චල වත්කම්වල භාරකාරත්වය පැවරීම සහ ඉන්වෙන්ට්‍රිගත කිරීමට අදාළව 2019 ඔක්තෝබර් 02 දින නිකුත් කර තිබූ 09/2019 චක්‍රලේඛයට අනුව මෙම ඔරලෝසු 2020 පෙබරවාරි 17 දින වන විටත් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

## බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය අංශයට මෙහෙයුම් පද්ධතියක් මිලදීගැනීම

බස්නාහිර පළාත් සභාවට අවශ්‍ය මෘදුකාංග පද්ධතීන් ස්ථාපිත කිරීම සඳහා පළාත් සභාව සතුව බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය පිහිටුවා තිබෙන අතර අදාල මෘදුකාංග අවශ්‍යතාවය හා සැපයිය යුතු පහසුකම් පිළිබඳ නිසි අධ්‍යයනයකින් පසුව එම ආයතනය විසින් මිලට ගැනීම හෝ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කළ යුතුව තිබුණි. නමුත් එම අධිකාරිය පිහිටුවා තිබූ අරමුණු පිළිබඳ නිසි සැළකිල්ලක් නොදක්වා සහ අදාළ පද්ධතියේ අවශ්‍යතාවය නිසි පරිදි ගැළපෙන්නේ ද පිළිබඳ අධ්‍යයනයකින් තොරව බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය අංශය විසින් මෙහෙයුම් පද්ධතියක් මිලට ගැනීම සඳහා රු.මිලියන 7.71 ක් වැය කර තිබුණි. නව සිගාස් වැඩසටහන යටතේ එකී ඒකාබද්ධ ගිණුම් තොරතුරු ලබා ගැනීමේ පහසුකම පවතින අතර වෙනත් පරිබාහිර වැඩසටහනක ආධාරයකින් තොරව එකී පහසුකම් උපයෝගී කරගත හැකිව තිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර මෙම මිලදී ගැනීම සිදු කර තිබුණි.

### විදේශ ගමන්

සියළුම ගරු ආණ්ඩුකාරවරු හා සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු ඇමතූ හා 2017 ජනවාරි 26 දිනැති අංක CSA/1/4 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ 02 ඡේදය ප්‍රකාර විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට අඩු නම් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වේ. එසේ වුවත් විදේශගත වන කණ්ඩායමේ සාමාජිකයින් සංඛ්‍යාව 05 ට අඩු වන විට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පමණක් 2018 හා 2019 වර්ෂවලදී මහජන නියෝජිතයින් 28 දෙනෙකු හා නිලධාරීන් 21 දෙනෙකු විදේශ සංචාර 13 කට සහභාගී වී තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 66.78 ක් වැය කර තිබුණි.

# මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 36,436 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 9,820 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 46,256 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 39,529 ක් ද, මූලධන වියදම් වශයෙන් රු.මිලියන 6,806 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 46,335 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 32,230 ක් ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 7,836 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 40,066 ක ආදායමක් රැස්කර තිබුණි. 2019 වර්ෂයේ දී පුනරාවර්තන වියදම රු.මිලියන 37,567 ක් හා මූලධන වියදම රු.මිලියන 2,745 ක් වශයෙන් රු.මිලියන 40,312 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 83 හි දැක්වේ.




රූපසටහන 83 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

මධ්‍යම පළාත් සභාවට අදාළව 2019 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

## ජලබදු අයකර ගැනීමේ නීති කාලීනව සංශෝධනය නොකිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක කුඩා ජල විදුලි බලාගාර 13 ක් භෞතිකව පරීක්ෂා කිරීමේ දී අදාළ

බලාගාරවලින් 2019 වර්ෂයේ ජල බදු වශයෙන් රු.මිලියන 2.29 ක් අයකර තිබුණි. අදාළ සමාගම් එම වර්ෂය තුළ නිපදවන ලද විදුලිය කිලෝවොට් 54,782,382 ක් වෙනුවෙන් රු.මිලියන 848.27 ක ආදායමක් උපයා තිබුණි. ජල බදු අය කිරීමේ නීති කාලීනව සංශෝධනය නොකිරීමේ හේතුවෙන් ඉපැයූ ආදායමට සාපේක්ෂව අයකර තිබූ ජල බදු ප්‍රමාණය සියයට 0.27 ක් වී තිබුණි. උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ලේඛනගත වීමක් සිදුවී නොතිබුණු කුඩා ජල විදුලි බලාගාර 04 ක් 2019 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ විදුලිය කිලෝවොට් 8,430,932 ක් නිෂ්පාදනය කර තිබුණු අතර එමගින් රු.මිලියන 118.03 ක ආදායමක් උපයා තිබුණත්, කිසිදු බදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

### පළාත් පාලන ආයතනවලට අයත් ආදායම් ප්‍රේෂණය නොකිරීම

පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන වෙනුවෙන් එකතු කරනු ලබන, මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා ප්‍රජා සේවාවන් ඉටු කිරීම සඳහා එම ආයතන වෙත ලබා දීමට කටයුතු කළ යුතු වුවත්, මධ්‍යම පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුද්දර ගාස්තු සහ උසාවි දඩ ලෙස එකතු කර තිබුණු රු.මිලියන 2,481.66 ක් අදාළ පළාත් පාලන ආයතන වෙත ලබා දීමට කටයුතු නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

### මධ්‍යම පළාත සඳහා වූ පස් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම

මධ්‍යම පළාත් සභාවේ පරිපාලන ව්‍යුහය තුළ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලැසුම් තනතුර යටතේ පාලනය වන සැලසුම් ක්ෂේත්‍රයට අදාළ දැනුම ලත් නිලධාරීන් 09 දෙනෙකු ඇතුළු 37 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. තිරසාර සංවර්ධනය සඳහා මධ්‍යම පළාත සඳහා වූ පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම සඳහා එම ක්ෂේත්‍රය පිළිබඳ කිසිම සම්බන්ධයක් නොමැති කළාපීය ආර්ථික සංවර්ධන ආයතනය සමඟ රු.මිලියන 4.69 ක්වූ කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ගිවිසුමකට එළඹ තිබුණි. එම සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඍජුවම වගකීම් දරන නිලධාරීන් 07 දෙනෙකුට රු.මිලියන 1.75 ක දීමනා ගෙවා තිබුණි. 2019 – 2023 කාලය තුළ මෙම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2020 ජනවාරි 23 දින වන විටත් සිංහල දෘඩ හා මෘදු පිටපත් ද ඉදිරිපත් කර නොතිබුණු අතර 2020 වර්ෂය වෙනුවෙන්ද මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

### නිල නිවාස දෙකක් බැගින් ලබා ගැනීම

1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම්) පනතේ 2(අ) හා (ආ) වගන්ති හා 2009 මාර්තු 05 දිනැති අංක 10/2007/(1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිවාස පහසුකම් ලබා දීම මැයෙන් නිකුත් කළ චක්‍ර ලේඛය ප්‍රකාරව ආණ්ඩුකාරවරයාට හා ප්‍රධාන අමාත්‍යවරයාට එක් නිල නිවසක් පමණක් බැගින් ලබා දිය යුතුව තිබුණි. නමුත් ආණ්ඩුකාරවරයාට හා ප්‍රධාන අමාත්‍යවරයාට මහනුවර හා නුවරඑළිය යන නගර වල නිවාස දෙකක් බැගින් ලබා දී තිබුණි.

### අනුමැතිය ලබා නොගෙන විදේශගතවීම

2017 ජනවාරි 26 දිනැති අංක සීඑස්ඒ/1/4 දරන ජනාධිපතිලේකම්ගේ චක්‍ර ලේඛය ප්‍රකාරව විදේශගතවන කණ්ඩායමේ සංඛ්‍යාව 05 කට වැඩිනම් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ජනාධිපති කාර්යාලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව දන්වා තිබුණි. පළාත් සභා 09

ක සභාපතිවරුන් හා ලේකම්වරුන් ඇතුළුව **18** දෙනෙකු සහභාගී වූ විදේශ චාරිකාව සඳහා අතිගරු ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර චාරිකාවට සහභාගී වූ මධ්‍යම පළාත් සභාවේ ගරු සභාපතිවරයා සහ සභා ලේකම් වෙනුවෙන් රු.මිලියන **2.36** ක් පළාත් සභා අරමුදලින් වැය කර තිබුණි.

# දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 28,362 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 8,745 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 37,107 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 34,719 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 5,842 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 40,561 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 27,697 ක්ද අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 8,795 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 36,492 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්තන වියදම රු.මිලියන 33,919 ක් හා මූලධන වියදම රු.මිලියන 3,853 ක් වශයෙන් එකතුව රු.මිලියන 37,772 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම පිළිබඳ විස්තර රූපසටහන 84 හි දැක්වේ.




රූපසටහන 84- ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම්
මූලාශ්‍රය - දකුණු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

## තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය විසින් යශෝරාපුර ආදර්ශ ගම්මානය සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට එකඟ වෙමින් රු.මිලියන 26.92 ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම්වලට එළඹ තිබුණු දින සිට දින 08 කින් මහල් 02 කින් යුත් ගොඩනැගිල්ල ඉදි කළ යුතුව තිබුණි. ඒ අනුව ගිවිසුම්ගත කාලය තුළ එම ගොඩනැගිල්ල ඉදි කළ නොහැකි බව පැහැදිලි වී තිබුණත්, එය නොසළකා ගිවිසුම්වලට එළඹ තිබුණු අතර එය ඉදිකිරීම 2019 වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. කාර්යසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ නොකර කර්මාන්තයේ කාලය දින 842 කින් දීර්ඝ කර තිබුණි. ලැමිනේටඩ් ටෙම්පර්ඩ් වීදුරු සවි කිරීම වැඩ විෂයය සඳහා

වියාජ ලෙස රු.මිලියන 7.14 ක් ගෙවා තිබුණි. කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම නිසා මිල ගණන් වෙනස් වීම මත රු.723,664 ක් හා අමතර වැඩ යටතේ රු.357,566 ක් ලෙස එකතුව රු.මිලියන 8.22 ක් ගෙවා තිබුණි.

## අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ නිලධාරීන් සතියේ දිනවල රාජකාරියට වාර්තා කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර තිබුණි. සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවලදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකර අතිකාල හා නිවාඩු දින රාජකාරි කිරීම වෙනුවෙන් රු.914,624 ක දීමනා ගෙවා තිබුණි.

## ඉදිකිරීම් වෙනුවෙන් වැඩිපුර ගෙවීම

සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 3.75 ක් වූ හල්පාතොට නිවර්තන නිවාසයේ ගල් බැම්ම සහ තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සුදුසුකම් පරීක්ෂාවකින් තොරව අදාළ මූල්‍ය සීමාව ඉක්මවා ග්‍රාම සංවර්ධන සමිතියකට පිරිනමා තිබුණි. එම ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් එකතුව රු.මිලියනයක් වැඩියෙන් ගෙවා තිබුණි.

## අවිධිමත් ගෙවීම්

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් හුංගම ගොවිපළ භූමියේ භෞතික ප්‍රාග්ධන වත්කම් ගොඩනැගීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 3.39 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියට භාවිතා නොකළ ගොඩනැගිලි ද්‍රව්‍ය හා අනෙකුත් භාණ්ඩ සඳහා රු.මිලියන 1.14 ක්ද, සැපයුම්කරු විසින් සපයා නොතිබුණු භාණ්ඩ හා සේවා සඳහා රු.332,050 ක්ද හා පුහුණු හා නුපුහුණු ශ්‍රමයට අනුමත වැටුප් රේටයන් ඉක්මවා හා වැඩකළ සත්‍ය දින ගණන ඉක්මවා රු.443,750 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 1.91 ක් අවිධිමත් ලෙස වැඩියෙන් ගෙවා තිබුණි.

# උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 25,742 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 3,945 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 29,686 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායමින් පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 25,382 ක් ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 4,488 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 29,870 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 23,614 ක්ද, අභ්‍යන්තර ආදායම් මාර්ග මගින් රු.මිලියන 5,122 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 28,736 ක ආදායම් රැස්කර තිබුණි. 2019 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 24,463 ක් හා මූලධන වියදම රු.මිලියන 2,588 ක් වශයෙන් එකතුව රු.මිලියන 27,051 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 85 හි දැක්වේ.




රූපසටහන 85 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

## ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

ළගම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන එකතුව රු.මිලියන 44.73 ක් වටිනා ගොඩනැගිලි 05 ක් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම නොකර අතරමග නවතා තිබුණි.

## මූල්‍යමය වංචාවන්

වඩමාරච්චි කළාප අධ්‍යාපන කාර්යාලයේ යා/සිදම්බර විද්‍යාලයේ පැසි පන්දු ක්‍රීඩාපිටිය රු.මිලියන 0.3 ක කොන්ත්‍රාත් වටිනාකමකින් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම පිටිය සම්පූර්ණයෙන් ඉදිකළ බව ප්‍රකාශ කර රු.මිලියන 0.28 ක් වූ බිල්පත්වලට සම්පූර්ණ ගෙවීම් කර තිබුණි. නමුත් එම පැසි පන්දු පිටිය ආරම්භක

උතුරු පළාත් සභාව

අදියරේදීම ඉදිකිරීම් නොකර අතරමග
නවතා දමා තිබුණි.

# නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු. මිලියන 21,612 ක් රජයේ ප්‍රදාන මගින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 4,830 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 26,442ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු. මිලියන 26,442 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 3,929 ක් මූලධන වියදම් වශයෙන් එකතුව රු.මිලයන 30,371 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 21,612ක්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 3,921 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 25,533 ක ආදායම් රැස්කර තිබුණි. 2019 වර්ෂයේදී පුනරාවර්තන වියදම් රු.මිලියන 26,012 ක් හා මූලධන වියදම් රු.මිලියන 1,996 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 28,008 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4කදී පළාත් සභාව විසින් රැස්කළ ආදායම හා උපයෝජනය පිළිබඳ විස්තර රූපසටහන 86 හි දැක්වේ.




රූපසටහන - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

නැගෙනහිර පළාත් සභාවට අදාළව 2019 වර්ෂයේදී සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ද්වි-මාධ්‍යය සිසුන් සඳහා වෙනම පන්ති පැවැත්වීම

2008 අප්‍රේල් 21 දිනැති අංක 2008/12 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව පාසල්වල ද්වි භාෂාවෙන් ඉගෙනුම ලබන සිසුන් සඳහා වෙනම පංතියක් ආරම්භ නොකළ යුතු බවත්, සිංහල හෝ දෙමළ හෝ මාධ්‍ය සිසුන් සමඟ ස්ව භාෂා මාධ්‍ය සිසුන් ද එකම පංතියේ සිටිය

යුතු අතර අදාළ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා අවස්ථාවන්හි දී පමණක් වෙන්ව සිටිය යුතු බවත්, ඒ අකාරයට ක්‍රියාත්මක කළ හැකි පරිදි කාලසටහන් සකස් කිරීම විදුහල්පතිගේ වගකීම බවත් සඳහන් කර තිබුණි. එම උපදෙස්වලට පටහැනිව කින්නියා අධ්‍යාපන කළාපයේ පාසල් 6 ක් විසින් සිංහල/දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිසුන් සමඟ මිශ්‍රව පංති නොපවත්වා ඉංග්‍රීසි භාෂාවෙන් විෂයයන් කිහිපයක් ඉගෙන ගන්නා සිසුන් සඳහා වෙනම පංති 20 ක් පවත්වා තිබුණි.

## වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම

1998 ජූලි 06 දිනැති අංක 1998/23 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කරන තෙක් වැඩබලන විදුහල්පතිවරුන් පත් කළ හැකි වුවත්, එම උපදෙස්වලට පටහැනිව ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් 27 දෙනෙකු කින්නියා අධ්‍යාපන කළාපයේ වැඩබලන විදුහල්පතිවරුන් ලෙස පත් කර තිබුණි.

## විදුහල්පතිවරුන් අනුයුක්ත කිරිම

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 08 දෙනෙකු පාසල් පරිපාලන වගකීම් නොමැතිව පාසල්වලට අනුයුක්ත කර තිබුණි. නමුත් කින්නියා කළාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 27 ක විදුහල්පති පුරප්පාඩු පැවැතුණි.

## ගුරුවරුන් අනුයුක්ත කිරිම

සුවිශේෂී තත්ත්වයක් මත ගුරුවරුන් තාවකාලික පදනමින් පාසල්වලට අනුයුක්ත කළ යුතු වුවද, කල්මුනෙයි අධ්‍යාපන කළාපයේ ගුරුවරුන් 21 දෙනෙකු වර්ෂ 02 ක සිට වර්ෂ 07 ක් දක්වා කාලයක් සඳහා ජාතික පාසල්වල සිට පළාත් සභා පාසල්වලට අනුයුක්ත කර තිබුණි. කෙසේ නමුත් ඔවුන්ගේ වැටුප් අදාළ ජාතික පාසල්වල වැටුප් ලේඛන මගින් ගෙවා තිබුණි. එම තාවකාලික අනුයුක්ත කිරීම් අවලංගු කර සුදුසු පරිදි පළාත් සභාවේ පාසල්වලට අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි.

## විදුහල්පතිවරුන්ගේ අතිරික්තය

කල්මුනෙයි අධ්‍යාපන කළාපයේ විදුහල්පතිවරුන් 31දෙනෙකුගේ අතිරික්තයක් වාර්තා වී තිබුණද, එම විදුහල්පතිවරුන් කල්මුනෙයි අධ්‍යාපන කළාපයේ පවතින පාසල්වල විදුහල්පති පුරප්පාඩු පිරවීමට හෝ කළාපයෙන් පිට පවතින පුරප්පාඩු පිරවිම සඳහා ස්ථාන මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## ගුරුවරුන්ගේ අතිරික්තය

විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව කල්මුනෙයි කළාප අධ්‍යාපන බලප්‍රදේශයේ පාසල්වල ප්‍රාථමික මට්ටම, විද්‍යාව හා ඉංග්‍රීසි වැනි ප්‍රධාන විෂයන්වලට අදාළව ගුරුවරුන් 472 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතුණි. එම අතිරික්ත ගුරුවරුන් කල්මුනෙයි කළාප අධ්‍යාපන කළාප බලප්‍රදේශයේ පුරප්පාඩු පවතින පාසල්වලට හෝ කළාපයෙන් පිටත ගුරු පුරප්පාඩු පවතින පාසල්වලට හෝ ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

## සිසුන් පාසල් හැරයාම

කල්මුනයි අධ්‍යාපන කළාපයේ පාසල් 17 ක පළාත් ශ්‍රේණිගත කිරීම් පවත්වාගෙන යාම සඳහා කාර්යසාධනය අඩු සිසුන්ට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට ඉඩ දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන්ට කිසිදු අධ්‍යාපන සුදුසුකමක් නොමැතිව පාසල් හැර යාමට සිදු වී තිබුණි. එම ක්‍රියාකලාපය අදාළ

සිසුන්ගේ උසස් අධ්‍යාපනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

### ගුරුවරුන් මාරු නොකිරීම

අංක 20/2007 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව එකම පාසලේ වර්ෂ 08 ක සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථානමාරු කළ යුතුව තිබුණත්, කල්මුනෙයි අධ්‍යාපන කළාපයට අනුයුක්ත ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් 311 දෙනෙකු ස්ථාන මාරු කිරීමකින් තොරව වර්ෂ 08 ක සිට වර්ෂ 15 ක් දක්වා කාලපරිච්ඡේදයක් එම පාසලේම සේවයෙහි යොදවා තිබුණි. මේ අනුව කල්මුනෙයි අධ්‍යාපන කළාප කාර්යාල බල ප්‍රදේශයේ පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන් සම්බන්ධයෙන් විධිමත් ගුරු ස්ථාන මාරුකිරීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### පළාත් ආදායම් කොමසාරිස් පත් නොකිරීම

2008 අංක 01 මුදල් ප්‍රඥප්තියේ 2 වන වගන්තියට අනුව, පළාත් ආදායම් කොමසාරිස්වරයකු පත්කළ යුතුව තිබුණි. නමුත් නැගෙනහිර පළාත් ආදායම් කොමසාරිස් ධුරය 2011 දෙසැම්බර් 18 දින සිට පුරප්පාඩු වී තිබුණද, පළාත් සභාව විසින් මෙම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 08 ක් මුළුල්ලේ පළාත් ආදායම් කොමසාරිස් ධුරය පුරප්පාඩුව පැවැතීම නිසා පළාත් සභාවේ මූල්‍ය ප්‍රඥප්තියේ නියම කර ඇති ආදායම් රැස්කිරීම සහ පරිපාලනය කිරීමේ කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

### දේපළවල මුහුණත වටිනාකම වෙනස් කිරීම

මඩකළපුව හා අම්පාර දිස්ත්‍රික්කයන්හි දේපලවල අගය තක්සේරුකරුවන් විසින් අඩුවෙන් දැක්වීම හේතුවෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අමතර මුද්දර ගාස්තුවක් පනවා එකතුව රු.මිලියන 42 ක අමතර ආදායමක් රැස්කරගෙන තිබුණි. 2014 වර්ෂයේ සිට තක්සේරුකරු විසින් ලබා දෙන ලද නව තක්සේරු අගයට දේපළවල මුහුණත වටිනාකම වෙනස් කරන ලෙසට දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය, මඩකළපුව හා අම්පාර යන දිස්ත්‍රික්කවල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාවලට දැනුම් දී නොතිබුණි. මේ හේතුව නිසා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල තක්සේරු කළ දේපෙලහි පැරණි මුහුණත වටිනාකම වර්ෂ ගණනකින් මුළුල්ලේ නොවෙනස්ව පැවතුණි.

### මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් එක්රැස් කිරීම

2017 හා 2018 වර්ෂවලදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ජංගම සේවය මගින් නැගෙනහිර පළාතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ඉඩම් ලියාපදිංචි කළ ඉඩම් හිමියන් 794 දෙනෙකුගේ ඉඩම්වල අගය අඩුවෙන් තක්සේරු කර තිබුණි. එම දේපල සම්බන්ධයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 14 ක අතිරේක මුද්දර ගාස්තු පනවා තිබුණි. කෙසේ නමුත්, එම ඉඩම්හිමියන් වෙත පැනවූ රු.මිලියන 1.79 ක හිඟ මුද්දර ගාස්තු නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට 2019 දෙසැම්බර් 31 දින වන විටත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## බදු පැහැර හරින්නන්ට දඩ මුදල් පැනවීම

2008 අංක 1 දරන මුල්‍ය ප්‍රඥප්තියේ 57(ආ) වගන්තිය ප්‍රකාරව, බදු පැහැර හැරීම් සඳහා නිසි බදු මුදල මෙන් තුන් ගුණයක් නොඉක්මවන දඩ මුදලක් නියම කළ හැකිය. කෙසේ නමුත්, ඉඩම් හිමියන් 115 දෙනෙකු මුද්දර ගාස්තු පැහැර හැරීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු විසින් කිසිදු දඩයක් පනවා නොතිබුණි. මේ හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

## හිමිකම් ඔප්පු තක්සේරු කිරීමට අපොහොසත්වීම

2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර තිබුණු ඔප්පු 6,026 ක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර නොතිබුණි. මේ හේතුවෙන් අගය අඩුවෙන් තක්සේරු කර තිබුණු ඉඩම් වෙනුවෙන් පළාත් සභාවට අයකර ගත හැකිව තිබුණු අතිරේක මුද්දර ගාස්තු ආදායමක් අහිමි වී තිබුණි.

## ස්වකීය අරමුදලක් රැස්කර ගැනීම

2014 ජුනි 20 දිනැති අංක G/EPC/B/14/R/H දරන නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය ප්‍රකාරව, පළාත් නිවාස අධිකාරිය පළාත් සභා අරමුදල මත යැපීම වෙනුවට, ස්වයං අරමුදල් උත්පාදනය කිරීමේ කොන්දේසිය මත 2014 වර්ෂයේදී වැටුප් හා අනෙකුත් වියදම් සඳහා අරමුදල් සපයා තිබුණි. කෙසේවෙතත්, අධිකාරිය පිහිටුවා වර්ෂ 5ක් ගතවී තිබුණත්, වියදම් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය වෙනුවෙන් කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

## ස්ථිර කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරීමට අපොහොසත් වීම

පළාත් නිවාස අධිකාරිය පිහිටුවා වර්ෂ 03ක් ඉක්මවා තිබුණත්, අධිකාරියේ කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් 08දෙනෙකු ඔවුන්ගේ ස්ථිර තනතුරුවලට අමතරව අධිකාරිය වෙත රාජකාරි අධීක්ෂණය කිරීම සඳහා මුදා හැර තිබුණි.

## අවිධිමත් ලෙස සභාපතිවරු පත්කිරීම

2013 අංක 2 දරන නැගෙනහිර පළාත් නිවාස අධිකාරි ප්‍රඥප්තියේ 1(1) පරිච්ඡේදයේ 03(3) වගන්තියට අනුව, යම් පුද්ගලයෙක් පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු වන්නේ නම්, ඔහු අධිකාරියේ සභාපතිවරයෙකු ලෙස පත්වීමට නුසුදුස්සෙකු වේ. ඒරාවූර් නගර සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයෙකු ලෙස සභා රැස්වීම්වලට සහභාගී වූ තැනැත්තෙකුට එම ප්‍රඥප්තියට පටහැනිව 2019 ජනවාරි 30 දින නැගෙනහිර පළාත් නිවාස අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කර තිබුණි.
එමෙන්ම 2016 අංක 1 දරන නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශ ප්‍රඥප්තියේ 11(අ) වගන්තියට අනුව, යම් පුද්ගලයෙකු පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු වන්නේ නම්, ඔහු කාර්යාංශයේ සභාපතිවරයා ලෙස පත්වීමට සුදුසුකම් නොලබයි. කෙසේ වෙතත්, එම කාලය තුළ අම්පාර නගර සභාවට තේරී පත් වූ හා සභා රැස්වීම්වලට සහභාගී වූ මන්ත්‍රීවරයෙකු ඉහත ප්‍රඥප්තියට පටහැනිව 2019 ජනවාරි 30 දින නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ සභාපතිවරයා ලෙස පත් කර තිබුණි.

## නිවාස සංවර්ධන සැලැස්ම

නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය විසින් සකස් කර තිබුණු නිවාස සංවර්ධන සැලැස්ම (2015-2019) ප්‍රකාරව, 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රු. මිලියන 14,525 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නිවාස නොමැති පවුල් 29,700 කට නිවාස ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවත්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිලාභීන්ට නිවාස ආධාර ලබා දීම හැර මෙම කාලය තුළ කිසිදු නිවසක් ඉදිකර නොතිබුණි.

## අරමුණුවලට පටහැනිව කටයුතු කිරීම

පළාත් නිවාස අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අංක 2014/03/03 තීරණයට අනුව, නැගෙනහිර පළාතේ සංවර්ධන කටයුතු සිදුකරන කොන්ත්‍රාත්කරුට සිමෙන්ති බෙදාහැරීම සඳහා එක්තරා සිමෙන්ති සමාගමකින් සිමෙන්ති මිලදී ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, එම තීරණයට පටහැනිව, අධිකාරිය විසින් එම සමාගමෙන් සිමෙන්ති මිලදී ගෙන ලාභ උපයා ගැනීම සඳහා උප නියෝජිතයින්ට විකුණා තිබුණි. එම හේතුව පදනම් කරගෙන සමාගම විසින් අධිකාරියට සිමෙන්ති නිකුත් කිරීම නවතා තිබීම නිසා පළාත තුළ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට සිමෙන්ති ලබා දීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

## සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය

පළාත් නිවාස අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අංක 2014/03/05 තීරණයට අනුව, අධිකාරිය විසින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම සඳහා පළාත තුළ නිෂ්පාදන මධ්‍යස්ථාන 10 ක් පිහිටුවීමට තීරණය කර තිබුණි. සිමෙන්ති ගඩොල් මිලියන 1.2 ක් නිෂ්පාදනය කිරීමෙන් වර්ෂයකට රු. මිලියන 4.3 ක ලාභයක් උපයා ගැනීමට අපේක්ෂා කර තිබුණත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## හිඟ ආදායම් එකතු කිරීම

නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 45කින් වරිපනම් බදු, කඩකුලී, බලපත්‍ර ගාස්තු හා බදු කුලී වැනි ප්‍රධාන ආදායම් මූලාශ්‍රවලින් ලැබිය යුතු හිඟ හිටි ආදායම් රු.මිලියන 895ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම හිඟහිටි ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## රජයේ ඉඩම්වලින් ලැබිය යුතු බදු ආදායම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාළව 1991 වර්ෂයේ සිට රජයේ ඉඩම්වලින් ලැබිය යුතු රු. මිලියන 333 ක බදු ආදායම් හිඟහිටව පැවැතුණි. 2020 ජූනි 30 දින වන විටත් එම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට පළාත් ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## නිෂ්කාර්යව පවතින (GPRS) පද්ධතිය

නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් පර්යන්ත වෙත බස්රථ ළඟාවීම හා පිටවීම පටිගත වන සාමාන්‍ය පැකට් ගුවන් විදුලි සේවය (GPRS) සහිතව විකුණුම් උපකරණ (POS) 13 ක් සහ ටිකට් රෝල් 2000 ක් 2015 ජූනි 08 දින රු. මිලියන 1.142 කට මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, වර්ෂ 5ක අධික කාලයක සිට මෙම උපකරණ ක්‍රියාත්මක කිරීමට විධිමත් මෘදුකාංග පද්ධතියක් නොතිබීමෙන් අදාල අරමුණු උදෙසා එම උපකරණ භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

### ISO සහතිකය ලබාගැනීමට අපොහොසත් වීම

ISO 9001: 2015 ප්‍රමිතිය මත පදනම්ව ඵලදායී තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් රු. මිලියන 1ක වටිනාකමට 2016 සැප්තැම්බර් 16 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු. මිලියන 0.326 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය අපේක්ෂා කළ පරිදි ISO සහතිකය 2020 ජුනි 30 දක්වාම ලබාගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියට වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

### පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කිරීම

යුනිසෙෆ් ආයතනය සමග පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පෙර පාසල් ගුරුවරුන් සඳහා අවම ප්‍රමිතීන් සම්බන්ධ ප්‍රතිපත්ති මාර්ගෝපදේශයට අනුව ගුරුවරුන් අනිවාර්යයෙන් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ අනුමත ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතු විය. කෙසේ වෙතත්, පෙර පාසල් ගුරුවරුන් 1,515 දෙනෙකු 2020 ජුනි 30 දින වන විටත් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි.

### දහන යන්ත්‍රය අළුත්වැඩියාව

පෞද්ගලික සමාගමකින් 2016 ජුනි මාසයේදී රු. මිලියන 5.28 කට මිලදී ගෙන මුතූර් මූලික රෝහලේ ස්ථාපනය කර තිබූ දහන යන්ත්‍රය වෙනුවෙන් ස්ථාපනය කිරීමෙන් පසුව, 2020 මැයි 31 දින දක්වා යන්ත්‍රයේ පිරිවැයෙන් සියයට 46 ක් හෙවත් රු.මිලියන 2.43 කට වැඩි ප්‍රමාණයක අළුත්වැඩියාන් සිදු කර තිබුණි.

### රෝහල් සඳහා ඇඳන් හා මෙට්ට මිලදී ගැනීම

2019 පෙබරවාරි 04 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා පුද්ගලික සැපයුම්කරුවෙකු සමඟ රු.මිලියන 3.66 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත පළාතේ රෝහල් සඳහා ඇඳන් හා මෙට්ට මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි. 2017 සැප්තැම්බර් 21 දිනැති අංක PT/04/2017 දරන පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 7.3 ඡේදය ප්‍රකාරව භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී වෙළෙඳපොල මිල සැදෑහුම් ක්‍රමවේදය පිළිබඳ උපදෙස් අනුව දෙපාර්තමේන්තුව සඳහා අධිකාරි සීමාව රු. මිලියන 2 ක් වී තිබුණි. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් එම සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි.

## උතුරු මැද පළාත් සභාව

උතුරු මැද පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 20,469 ක් රජයේ ප්‍රදාන මගින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 4,731 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 25,200 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු.මිලියන 20,377.34 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 4,068 ක් මූලධන වියදම් වශයෙන් එකතුව රු.මිලියන 24,445.34 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 16,680.58 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 4,877.56 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 21,558.14 ක ආදායම් රැස් කර තිබුණි. 2019 වර්ෂයේදී පුනරාවර්තන වියදම් රු.මිලියන 15,741.5 ක් හා මූලධන වියදම් රු.මිලියන 5,857.1 ක් වශයෙන් එකතුව රු.මිලියන 21,598.6 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව ආදායම ඉක්මවූ වියදම රු.මිලියන 40.46 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4කදී පළාත් සභාව විසින් රැස්කළ ආදායම හා උපයෝජනය පිළිබඳ විස්තර රූපසටහන 87 හි දැක්වේ.




රූපසටහන 87 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

උතුරු මැද පළාත් සභාවට අදාළව 2019 වර්ෂයේදී සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

### අග්‍රිම කළමනාකරණය

සෑම වර්ෂයක් අවසානයේදී පවතින අග්‍රිම ශේෂය පළාත් භාණ්ඩාගාරයට පියවිය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් අමාත්‍යාංශ 03 කට අදාළව පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 27.78 ක් වී තිබුණි. එම අග්‍රිම ශේෂවලින් සියයට 95 ක් වූ රු.මිලියන 26.41 ක අග්‍රිම

ශේෂ වර්ෂ 9 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු අතර ඉතිරි අග්‍රිම ශේෂ වර්ෂ 05 කට අධික කාලයක සිට පැවැත එමින් තිබුණි. එම ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට අපොහොසත් වී තිබුණි.

## ආදායම් කළමනාකරණය

ආදායම් සංකේත 08 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 3,525.35 වී තිබුණු අතර රැස්කළ ආදායම රු.මිලියන 2,472.12 ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ ආදායමෙන් රු.මිලියන 1,053.23 ක් රැස් කර ගැනිමට අපොහොසත් වී තිබුණි. එසේ රැස් කළ නොහැකි වූ ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 8 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාව විසින් නව වැඩ යෝජනා හා අවිච්ඡේද වැඩ යෝජනා වශයෙන් යෝජනා 1,437 ක් ක්‍රියාත්මක කිරිම සඳහා රු.මිලියන 3,487 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,086 ක් උපයෝජනය කර යෝජනා 1,160 ක කටයුතු සම්පූර්ණයෙන් නිම කර තිබුණි. එම වැඩ යෝජනාවලින් 57 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණු අතර, ඒ සඳහා සලසා තිබුණු රු.මිලියන 70 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවැතුණි. වැඩ යෝජනා 59 ක් සම්පූර්ණ කිරිම සඳහා රු.මිලියන 324 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම වැඩ යෝජනාවලින් සියයට 50 ක අඩුවෙන් ක්‍රියාත්මක කර තිබුණි. වැඩ යෝජනාවල ප්‍රගතිය වගුව 23 හි දැක්වේ.

| විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. මිලියන |
| සම්පූර්ණයෙන් නිමකළ | 873 | 287 | 1,160 | 2,086 |
| %50කට වඩා වැඩියෙන් නිමකළ | 151 | 10 | 161 | 1,007 |
| %50කට වඩා අඩුවෙන් නිමකල | 58 | 01 | 59 | 324 |
| ආරම්භ කර නොතිබූ | 57 | 0 | 57 | 70 |
| එකතුව | 1,139 | 298 | 1,437 | 3,487 |

වගුව 23 පළාත් සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය 2019
මූලාශ්‍රය : ප්‍රගති වාර්තාව 2019

## විශේෂ අධ්‍යාපන ඒකකය

- 2001 මැයි 24 දිනැති අංක 1/වි.අ/2/84 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ඒකකයකට දරුවන් ඇතුළත් කර ගැනීමේදී, විශේෂ අධ්‍යාපන විෂයභාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විශේෂ අධ්‍යාපන විෂයභාර ගුරු උපදේශකවරුන්, විශේෂ අධ්‍යාපන ගුරුභවතුන් ප්‍රාථමික අංශය /විෂයභාර ගුරුභවතුන් යන අයගෙන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම කළ යුතු වේ. එසේ වුවත්, උතුරුමැද පළාත තුළ එම ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කිරීම නිසා සාමාන්‍ය පන්ති කාමරයක අධ්‍යාපනය ලබා දිය යුතු කියවීමේ හා ලිවීමේ හැකියාව අවම

මට්ටමක පවතින දරුවන්, පූර්ව ළමාවිය අධ්‍යාපනයක් ලබා නොමැති දරුවන්, ඉතා දිළිඳු පවුල්වල සාමාන්‍ය දරුවන් සහ පිරිසිදුකමින් අඩු දරුවන් බොහොමයක් විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කර තිබුණි.

- 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පත්වීම් ලබා ඇති ගුරුවරුන්, පත්වීම් ලිපියෙහි කුමන අනු විෂයයක් සඳහන් වුවද, ප්‍රධාන විෂයය වන විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිම සේවය කිරීම අනිවාර්යවේ. එසේ වුවත්, විශේෂ අධ්‍යාපන ඒකකයක ඉගැන්වීම සඳහා විධිමත් පුහුණුව ලබා ඇති ගුරුභවතුන් 20 දෙනෙකු උතුරු මැද පළාත තුළ වෙනත් විෂයයන් ඉගැන්වීම සඳහා යොදවා තිබුණි.

- 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/ 2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විශේෂ අධ්‍යාපන ඒකක සඳහා අවම වශයෙන් ශිෂ්‍යයන් 05 දෙනෙකුට එක් ගුරුවරයෙකු බැගින් වන සේ එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා ඇති ගුරුවරුන් පත් කළ යුතු වේ. එසේ වුවත්, උතුරු මැද පළාතේ අධ්‍යාපන කළාප 08 හි විශේෂ අධ්‍යාපන ඒකක පවතින පාසල් 24 ක් සඳහා එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලැබූ ගුරුභවතුන් 29 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

- උතුරු මැද පළාතේ අධ්‍යාපන කළාප 08 හි ඇති අධ්‍යාපන කොට්ඨාශ 30 කින් කොට්ඨාශ 04 ක විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබීම නිසා එම අධ්‍යාපන කොට්ඨාශවල සිටින විශේෂිත අවශ්‍යතා සහිත දරුවන්ට විශේෂ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

- 2017 වර්ෂයේදී උතුරු මැද පළාතේ අධ්‍යාපන කළාප 03 කට අයත් පාසල් 13 ක රු. මිලියන 18.48 ක වියදමින් විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ගොඩනැගිලි නවීකරණය කර තිබුණද, 2019 වර්ෂය අවසාන වන විටත් එකී විශේෂ අධ්‍යාපන ඒකක ක්‍රියාත්මක කර නොතිබුණු අතර තවත් පාසල් 12 ක විශේෂ අධ්‍යාපන ඒකක සඳහා සුදුසු ගොඩනැඟිලි ලබා දී නොතිබුණි. ඒ අනුව විශේෂ අධ්‍යාපන ඒකක අවශ්‍ය පාසල් නිවැරදිව හඳුනා ගෙන ගොඩනැගිලි නවීකරණය කිරීමට හා නව ගොඩනැගිලි ඉදි කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි.

- 2007 මැයි 14 දිනැති අංක 2007/9 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල් ගොඩනැඟිලි ඉදිකිරීමේදී හා නවීකරණය කිරීමේදී ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීම පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතු අතර පාසල් තුළ ප්‍රවේශ පහසුව සැලසීම අනිවාර්ය වේ. එසේ වුවත්, උතුරු මැද පළාතේ පාසල් 14 ක පවතින විශේෂ අධ්‍යාපන ඒකක සඳහා සුදුසු පරිදි ප්‍රවේශ පහසුකම් සකස් කර නොතිබුණි.

- 2017 ජනවාරි 30 දිනැති අංක ED/09/18/02/01/2 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය හා අංක 1963/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනය අනුව වයස අවුරුදු 5-16 වයසේ පසුවන සියළුම දරුවන් අනිවාර්යයෙන්ම අධ්‍යාපනයට යොමු කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

සඳහා පාසල් කමිටුව සහ අධීක්ෂණ කමිටුව ක්‍රියාත්මක කළ යුතු වුවත්, පළාත තුල පිහිටි පෝෂක ප්‍රදේශවල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගෙන පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### සේවයට නොපැමිණි දින වෙනුවෙන් දීමනා ලබා ගැනීම

අනුරාධපුර ගල්කිරියාගම ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරුන් දෙදෙනෙකු 2019 වර්ෂයේදී සේවයට නොපැමිණි දිනවල සේවයට පැමිණි බවට දින පොත් ලියා තිබුණි. ඉන් කාර්යභාර වෛද්‍ය නිලධාරී ලෙස සේවය කල එක් වෛද්‍යවරයෙකු සේවයට නොපැමිණි දින 99 ක දී පැය 396 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.385,856 ක් හා සේවයට නොපැමිණි දින 06 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.25,739 ක් ද, අනෙක් වෛද්‍යවරයා සේවයට නොපැමිණි දින 67 කදී පැය 268 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.146,060 ක් හා සේවයට නොපැමිණි දින 04 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.9,732 ක් ද ලබාගෙන තිබුණි. කාර්යභාර වෛද්‍ය නිලධාරීවරයා සේවා මුර සටහන් වර්ෂයේ මාස 03 කට පමණක් පිළියෙල කර තිබුණි.

### දෘෂ්‍ය අක්‍රමිකතා

ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන මත සිදුකල ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මගින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.මිලියන 8.61 ක් වී තිබුණි.

### තඹුත්තේගම පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් විශේෂ ව්‍යාපෘති යටතේ 2016 වර්ෂයේදී තඹුත්තේගම පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 24.99 ක ලංසු වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව විභව ලංසුකරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු අවම දින 21 ක කාලය ලබා නොදී දින 05 ක කාලයක් පමණක් ලබාදීම නිසා එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වී තිබුණි. එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව 2017 පෙබරවාරි 22 දින ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබුණත්, එය 2019 ජනවාරි 10 දින අවසන් කර තිබීම නිසා ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතු රු.මිලියන 2.50 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. මෙම ගොඩනැගිල්ල රු.මිලියන 25.20 ක් වැය කර ඉදිරි කර තිබුණත්, 2020 ජූලි 15 දින වන විටත් විවෘත නොකර වර්ෂයකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

### ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය

#### අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු නොකිරීම

ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් නිම කිරීම සඳහා රු.මිලියන 21.95 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්වලට එළඹ තිබුණි. මෙම කොන්ත්‍රාත් ක්‍රියාමක කිරීම සඳහා එකතුව රු.මිලියන 9.07 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. එම

කොන්ත්‍රාත්කරුවන් විසින් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු අතර ගෙවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට නිතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා ගිවිසුම්වලට එළඹීම

ළහම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ වූ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 1.71 ක්වූ උප ව්‍යාපෘතියක කොන්ත්‍රාත්තුව අනුමත සමිතියකට ප්‍රදානය කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව රු.292,725 කින් ඉක්මවූ වටිනාකමක් මත ගිවිසුම්වලට එළඹ තිබුණි.

### නිෂ්ක්‍රීය වූ ව්‍යාපෘතිය

ළහම පාසල හොඳම පාසල ව්‍යෘපෘතිය යටතේ රු.මිලියන 36.64 ක් වැයකර ඉදිකර තිබුණු මුදුනේගම මහා විද්‍යාලයේ කණිෂ්ඨ, ද්විතියික ප්‍රාථමික විද්‍යාගාර ගොඩනැගිල්ල 2019 මාර්තු 01 දින විවෘත කර තිබුණත් විදුලි සම්බන්ධතාවය නොමැතිවීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

### නිම නොකළ ව්‍යාපෘතිය

ළහම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ තිරප්පනේ මහානාම විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල හා ප්‍රාථමික විදුහලේ දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා රු.මිලියන 41.45 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත 2017 මාර්තු 13 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව 2017 සැප්තැම්බර් 13 දිනට ප්‍රථම නිම කළ යුතුව තිබුණි. 2017 මාර්තු 13 දින රු.මිලියන 14.30 ක් වූ සියයට 30 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණු නමුත් 2019 ජනවාරි 18 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 5 ක් ව පැවතුණි. එදින වන විට අත්තිකාරම් සුරක්ෂණයේ කාලයද අවසන් වී තිබුණි.

### නිෂ්ඵල වියදම්

මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ පරිපාලන සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නිශ්චිත ස්ථානයක් හඳුනා ගෙන නොතිබුණි. නිශ්චිත ස්ථානයක් නොමැතිව ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකර තිබුණි. එසේ පිළියෙල කළ රු.මිලියන 24.27 ක ඇස්තමේන්තුවක් මත කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ප්‍රධාන අමාත්‍යාංශය 2017 ජූලි 31 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. පසුව අනුරාධපුර මහනගර සභා බල ප්‍රදේශයේ භූමියක ඉදිකිරීම් ආරම්භ කර තිබුණත්, සංවර්ධන බලපත්‍රය ලබාගැනීමට කටයුතු නොකිරීම සහ එකඟතාවය ලබාදුන් පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි වැඩ අතරමඟ නවතා තිබුණි. ඒ වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 2.08 ක් වැය කර තිබුණු අතර, එම වියදම නිෂ්ඵල වී තිබුණි.

### නිෂ්ක්‍රීය වත්කම්

ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කළාපයේ පාසල්වල පැවති නිල නිවාස 25 කින් නිල නිවාස 22 ක් ගුරුවරුන්ට ලබා දීමට කටයුතු නොකිරීම නිසා එම නිවාස නිෂ්ක්‍රීයව පැවතුණි.

2016 වර්ෂයේදී උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු. මිලියන 02 ක් ගෙවා මිලදී ගෙන තිබුණු කසල දාහක යන්ත්‍රය, 2017 අගෝස්තු 08 දින කැබිතිගොල්ලෑව මූලික රෝහල වෙත ලබාදී තිබුණි. රෝහල විසින් එම යන්ත්‍රය එදින සිට භාවිතයට නොගෙන නිෂ්ක්‍රියව පැවැතුණි.

## විශේෂ අධ්‍යාපනය වෙනුවෙන් ලබාදුන් මුදල් උපයෝජනය නොකිරිම

කලාප අධ්‍යාපන කාර්යාල 08 ක විශේෂ අධ්‍යාපනය වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලබා දී තිබුණු පිළිවෙලින් රු.435,449 ක්, රු.341,731 ක්,රු.358,730 ක් සහ රු.378,239 ක් වශයෙන් එකතුව රු.1,514,149 ක් උපයෝජනය කර නොතිබුණි

## වත්කම් විධිමත්ව පවරා නොදීම

වර්ෂ 05 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට වසාදමා තිබුණු ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කළාපයේ පාසල් 04 ක පැවති වත්කම් වෙනත් බාහිර පාර්ශවයන් විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණත්, එම වත්කම් විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි.

# වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 28,550 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 10,449 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 38,999 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේ දී පුනරාවර්තන හා මූලධන වියදම් ලෙස පිළිවෙලින් රු.මිලියන 35,934 ක් හා රු.මිලියන 3,065 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 38,999 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 25,884 ක් ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 8,907 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 34,791 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්තන වියදම රු.මිලියන 33,876 ක් හා මූලධන වියදම රු.මිලියන 1,942 ක් වශයෙන් එකතුව රු.මිලියන 35,818 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 88 හි දැක්වේ.




රූපසටහන 88 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - වයඹ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

වයඹ පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කළ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

## හිඟ ආදායම්

ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 08 ක් වෙනුවෙන් රු.මිලියන 232.9 ක් වූ ආදායම හිඟහිටව පැවතුණි. ඉන් රු.මිලියන 152.9 ක් වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවත එමින් තිබුණි.

## බදු ආදායම් නිදහස් කිරීම.

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 1991 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ ලිපිගොනු 784 කට අයත් රු.මිලියන 117 ක් වූ හිඟ පිරිවැටුම්

බදු, 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු ගොනු 483 කට අයත් බදු මුදල් හා දඩ මුදල් පිළිවෙලින් රු.මිලියන 36.9 ක්, රු.මිලියන 40.1 ක් සහ අතිරේක මුද්දර ගාස්තු රු.මිලියන 76.9 ක් 2016 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිදහස් කිරීම නිසා පළාත් සභා අරමුදලට රු.මිලියන 193.9 ක් අහිමි වී තිබුණි.

## සයමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

වයඹ පළාත් සභාව සහ කුරුණෑගල මහ නගර සභාව ඒකාබද්ධව සයමහල් ගොඩනැගිල්ලක් රු.මිලියන 1,384.8 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ඉදිකිරීමට කටයුතු කර තිබුණි. ගොඩනැගිල්ලක අවශ්‍යතාවය හඳුනාගෙන පළාත් මූල්‍ය රීති 4.2.1 (ආ) හි පරිදි අදියර දෙකකදී අනුමත කිරීමේ කාර්ය පටිපාටියට අනුකූලව අනුමත වී වාර්ෂික සංවර්ධන සැලසුම්වල ඇතුළත් කළ යුතු වුවත් මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. මුදල් කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව 2019 වර්ෂය තුළදී මෙම ඉදි කිරීම හඳුනාගෙන කඩිනම් ව්‍යාපෘතියක් ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. ආණ්ඩුකාරවරයා විසින් වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට මෙම ඉදි කිරීම් සඳහා සැලසුමක් සකස් කර දෙන ලෙස දන්වා තිබුණත්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදී ඉතා හදිසි කටයුත්තක් සේ සලකා නිර්මාණය කර ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. එහෙත් මෙම කොන්ත්‍රාත් ක්‍රමයට තෝරාගනු ලබන්නේ අදාළ ඉදිකිරීම් පිළිබඳ තාක්ෂණික දැනුම නොමැතිකම හා පිරිවැය නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවලදී පමණි.

ලංසු ඇගයීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4(ආ) මාගෝපදේශය අනුව ප්‍රමාණවත් නොවන ලංසු සුරක්ෂණ ප්‍රකාශන ආකෘති භාවිතා කිරීම විශාල බැහැරවීමක් ලෙස සලකා ලංසු ඇගයීමට භාජනය නොකළ යුතු වේ. එහෙත් ඇස්තමේන්තුගත විටානකම රු.මිලියන 720 ක් වූ මෙම ඉදිකිරීම සඳහා ඉදිරිපත් වූ අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු විවෘත නොකර ලංසු ඇගැයීමට භාජනය නොකර රු.මිලියන 1,384.8 ක් වූ ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු ඉදිකිරීම සඳහා තෝරා ගෙන තිබුණි. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවද අදාළ කොන්ත්තුව ප්‍රදානය කිරීම මූලික ප්‍රසම්පාදන නීති රීති වලට පටහැනි බව දන්වා තිබුණි.

හදිසි කටයුත්තක් සේ සලකා ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට පටහැනිව කොන්ත්‍රාත්තුව පිරිනමා 2019 නොවැම්බර් 06 දින ගිවිසුමකට එළඹ තිබුණද, 2020 ඔක්තෝබර් 15 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණවත් වැඩ කොටසක් සිදු කර නොතිබුණි.

## නිෂ්ක්‍රීය වත්කම්

- විදේශාධාර ව්‍යාපෘතියක් මත වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ගල්ගමුව මූලික රෝහල නවීකරණය යටතේ ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි පිහිටුවා තිබුණු දැඩිසත්කාරක ඒකකයේ රු.මිලියන 26 ක් වටිනා වෛද්‍ය උපකරණ 46 ක්ද, නොමේරු ළදරු ඒකකයේ රු.මිලියන 16.7 ක් වටිනා වෛද්‍ය උපකරණ 14 ක්ද, වර්ෂ 05 ක පමණ කාලයක් මුළුල්ලේ නිෂ්කාර්යව පැවතුණි.

- වයඹ සංවර්ධන අධිකාරිය විසින් විධිමත් ශක්‍යතා අධ්‍යනයක් හා සැලසුම්කරණයක් නොමැතිව රු.මිලියන 12.6 ක් වැය කර නිම කරන ලද මදුරන්කුලිය සංචාරක තොරතුරු හා

පහසුකම් මධ්‍යස්ථානය වර්ෂ 03 ක කාලයක් මුළුල්ලේ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

- දඹදෙණිය මූලික රෝහලේ රුධිර කාන්දුකරන ඒකකය ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හා පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ රු.මිලියන 15.6 ක් ලැබී තිබුණි. 2019 වර්ෂයේදී රු.මිලියන 9.9 ක් වටිනා රුධිර කාන්දුකරන උපකරණ මිලදීගෙන තිබියදීත් වර්ෂය අවසන් වන විටද එම ඒකකයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එම තත්ත්වය මත අවට ප්‍රදේශවල සිටින රෝගීන් හට කුලියාපිටිය හා කුරුණෑගල රෝහල් වෙත ප්‍රතිකාර සඳහා රෝගීන් යොමු කිරීමට සිදුවී තිබුණි.

# සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 27,298 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 5,385 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 32,683 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 28,387 ක් ද මූලධන වියදම් වශයෙන් රු.මිලියන 4,296 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 32,683 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 25,563 ක් ද අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 5,059 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 30,622 ක ආදායම් රැස්කර තිබුණි. 2019 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු. මිලියන 27,447 ක් හා මූලධන වියදම රු.මිලියන 2,624 ක් වශයෙන් රු. මිලියන 30,071 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 89 හි දැක්වේ.




රූපසටහන - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම
මූලාශ්‍ර - සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

සබරගමුව පළාත් සභාවට අදාලව 2019 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

## ප්‍රඥප්ති මගින් ස්ථාපිත අරමුදල් සඳහා රීති මාලාවන් පිළියෙල නොකිරීම

1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 07 වගන්තිය ප්‍රකාරව අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන පරිදි අදාළ සීමාවන් තුළ අරමුදල් යෙදවීමේ

ක්‍රම පිළිබඳව රෙගුලාසි සකස් කර ගැනීමේ බලය පළාත් අමාත්‍යවරයා සතුව තිබුණද, ඒ අනුව කටයුතු කර රෙගුලාසි සම්පාදනය කර නොතිබුණි.

## සහනාධාර ලබා දීම සඳහා සමීක්ෂණයන් නොකිරීම

1994 අංක 04 දරන සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 24 වන රෙගුලාසිය ප්‍රකාරව වෙනත් කිසිදු ආධාර යෝජනා ක්‍රමයකින් ආධාර හෝ සහනාධාර ලැබී නැති ඉතාමත් අන්ත දුගී තත්ත්වයෙන් සිටින පවුල්වල පුද්ගලයින්ට සහන සැලැසිය හැකිව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අරමුදලේ රු.මිලියන 79.13 ක ශේෂයක් පැවැතුණි. අරමුදල විසින් ප්‍රමාණවත් පරිදි සමීක්ෂණයක් සිදු කර එවැනි පවුල් හඳුනාගෙන ආධාර ලබා දීමට කටයුතු කර නොතිබුණි. එම හේතුව නිසා ඉකුත් වර්ෂය සඳහා ද්‍රව්‍ය හා මුදල් ආධාර සඳහා අරමුදල වැය කළ මුදලට වඩා සියයට 47 ක් හෙවත් රු.මිලියන 8.87 ක් අඩුවෙන් ද්‍රව්‍ය හා මුදල් ආධාර වෙනුවෙන් වැය කර තිබුණි.

## හිඟ ආදායම අයකර ගැනීමට අපොහොසත්වීම

- සබරගමුව පළාතේ පළාත් මූල්‍ය රීති 116.1 ප්‍රකාරව හිඟ ආදායම් එකතු කරන නිලධාරින් අවධානයෙන් හා ඉතා සැලකිලිමත්ව කටයුතු කර හිඟහිටි ආදායම් එකතු කර ගත යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකකට අදාළ රු.මිලියන 49.40 ක්වූ හිඟහිටි ඉඩම් බදු ආදායම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

- ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1995 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විඳිනු ලබන හෙක්ටයාර 9.9123 ක් වූ රජයේ ඉඩම් කොටස් 04 ක් දිර්ඝකාලින බදු පදනම යටතේ ලබා දීම සඳහා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දි අමාත්‍යවරයා විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2020 ජනවාරි 13 දින වන විට එකතුව රු.මිලියන 10.45 ක හිඟ බදු මුදල් අයකර දිර්ඝ කාලීන බදුකරයන් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

- ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිගාන ග්‍රාම නිලධාරි වසමේ හෙක්ටයාර 2.350 ක ඉඩම් කොටසක් කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත 1999 වර්ෂයේදී වර්ෂ 21 ක කාලයක් සඳහා දිර්ඝ කාලීන බදු දී තිබුණි. එසේ බදු දුන් දින සිට සිට 2020 වර්ෂය දක්වා කාලය තුළදී ජලය හරවා ගැනීම වෙනුවෙන් අයකල යුතු රු.මිලියන 2.34 ක ජල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

සබරගමුව පළාත තුළ පිහිටුවා ඇති සහ පවත්වාගෙන යනු ලබන සියළු පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය විය. සමාලෝචිත වර්ෂය වන විට පෙර පාසල් 1,238 ක් ලියාපදිංචි කර තිබුණු අතර තවත් පාසල් 275 ක් ලියාපදිංචි වී නොතිබුණි. ලියාපදිංචි වී තිබුණු පෙර පාසල් ගණනින් සියයට 67 ක් හෙවත් පාසල් 824 ක් ලියාපදිංචිය යාවත්කාලින කර නොතිබුණි. මේ නිසා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පළාත් සභාවේ අධික්ෂණය දුර්වල වී තිබුණි.

## රෝහල් සඳහා අමු ආහාර සැපයීමේ අවිධිමත්භාවය

බලංගොඩ සහ කහවත්ත මූලික රෝහල්වල 2019 සැප්තැම්බර් මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලසීමාව තුළ ඇනවුම් කරන ලද අමු ආහාර ප්‍රමාණයම වඩා අඩුවෙන් සපයා තිබීම සහ ඇනවුම් කරන ලද අමු ආහාර හෝ අදාළ ආදේශකයක් හෝ සපයා නොතිබුණු අවස්ථා 43 ක් පැවැතුණි.

## අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

සබරගමුව පළාතේ සංචාරක ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී එකතුව රු.මිලියන 2.03 ක් වැය කර සීලෝගම ප්‍රජා සංචාරක ගම්මානයේ සංචාරක නිවාස සඳහා උපකරණ ලබා දීම හා ගොඩනැගිලි ඉදිකිරිම සිදුකර තිබුණි. අපේක්ෂිත අරමුණ වෙනුවෙන් එම උපකරණ හා ගොඩනැඟිලි උපයෝජනය කර නොතිබුණු අතර, පළාත් අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

## සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2019 සංවර්ධන සැලැස්ම යටතේ සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නිම කිරීමට සැලසුම් කළ එකතුව රු.මිලියන 127.15 ක් වූ ව්‍යාපෘති 16 ක 2019 දෙසැම්බර් 31 දින වන විට ඒවායේ ප්‍රගතිය සියයට 10 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක පැවතුණි.

## කාර්යසාධන ඇපකර ලබා නොගැනීම

- ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 14.86 ක්වූ කඩමුදුන සිංහරාජ ආරණ්‍ය මාර්ගය කි.මී 1.00 ක සිට කි.මී 2.325 ක් දක්වා කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ ගිවිසුම ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු රු.743,120 ක් වූ කාර්යසාධන බැඳුම්කරය ලබාගෙන නොතිබුණි. වැඩ ආරම්භ කිරීමට ප්‍රථම කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු රක්ෂණ ආවරණය ද ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

- ප්‍රධාන අමාත්‍යාංශය විසින් වැඩ වටිනාකම රු.මිලියන 120.71 ක් වූ පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පස්මහල් නව නේවාසිකාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව රු.මිලියන 6.04 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර, 2020 ජූනි 24 දින වන විට අදාළ කොන්ත්‍රාත්තුවේ කටයුතු නිම කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරිම් කටයුතු අතරමඟ නවතා තිබුණි.

# ඌව පළාත් සභාව

ඌව පළාත් සභාව විසින් 2019 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 26,732 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එයින් රු.මිලියන 22,027 ක් රජයේ ප්‍රදාන මගින් ලබාගැනීමට හා රු.මිලියන 4,705 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද, ඇස්තමේන්තු කර තිබුණි. එසේ රැස්කළ ආදායමෙන් රු.මිලියන 23,729 ක් පුනරාවර්තන වියදම් සඳහා ද රු.මිලියන 4,473 ක් මූලධන වියදම් සඳහා ද වැය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 21,249 ක් ලැබී තිබුණු අතර රු.මිලියන 3,677 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. එසේ රැස්කළ ආදායමෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 24,166 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 968 ක් වැය කර තිබුණි. ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම ඉකුත් වර්ෂය සමඟ සසඳා රූපසටහන 90 හි දැක්වේ.




රූපසටහන 90 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

## ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර මාර්ගවලින් රැස්කිරීමට ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන 4,705 ක් වූ අතර, රැස් කර තිබුණු ආදායම රු.මිලියන 3,677 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 05 ක සමුච්චිත හිඟ ආදායම රු.මිලියන 201.25 ක් වී තිබුණු අතර එය 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 4.28 ක් වී තිබුණි. .

1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ X වන පරිච්ඡේදය ප්‍රකාරව අයකරනු ලබන මුද්දර ගාස්තු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2)(ආ), නගර සභා ආඥා පනතේ 158 (2)(ආ) සහ මහා නගර සභා ආඥා පනතේ 185 (2)(ඇ) ප්‍රකාරව අදාළ පළාත් පාලන ආයතනයේ අරමුදලට බැරවිය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ඌව පළාත් සභාව විසින් රැස්කරන ලද රු.මිලියන 332 ක මුද්දර ගාස්තු අදාළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කරන තෙක් බැරකමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර පළාත්

සභාවේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

### හාලිඇල පරිගණක සම්පත් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම

හාලිඇල පරිගණක සම්පත් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2016 ජුනි 27 දින ඉදිකිරීම් සමාගමක් සමඟ රු.මිලියන 68.85 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත ගිවිසුමකට එළඹ තිබුණි. 2017 ජුනි 21 දිනට කර්මාන්තයේ වැඩ අවසන් කළ යුතුව තිබුණත්, 2019 දෙසැම්බර් 31 දින වන විටද එහි වැඩ අවසන් කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව අය කළ යුතු ප්‍රමාද ගාස්තුව රු.මිලියන 3.42 ක් වී තිබුණත්, 2018 අප්‍රේල් 24 දින වන විට ඉන් රු.මිලියන 1.72 ක් පමණක් අයකර ගෙන තිබුණි.

2019 අප්‍රේල් 09 දින කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුම අවලංගු කර තිබුණු අතර පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මු.රී.705 ප්‍රකාරව වගකීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට කොන්ත්‍රාත්කරුගේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

2016 අගෝස්තු 29 දින අත්තිකාරම් වශයෙන් රු.මිලියන 13.76 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 1.74 ක් පමණක් අයකර ගෙන තිබුණි. අත්තිකාරම් ගෙවීම ඇපකරයක් මත සිදු කර තිබුණත්, ඇපකරයේ වලංගු කාලය 2018 සැප්තැම්බර් 21 දින අවසන් වී තිබුණු අතර අත්තිකාරම් මුදල පියවා ගැනීමට හෝ ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා රු.මිලියන 12.02 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

කාර්ය සංසිද්ධි ඇපකරයේ වලංගු කාලය 2019 ජුලි 31 දින අවසන් වී තිබුණු අතර ඇපකරය මගින් රු.මිලියන 3.44 ක් අයකර ගත හැකිව තිබුණත්, එම මුදල අයකර ගෙන නොතිබුණි.

### විශ්‍රාමික නිලධාරීන් පත් කිරීම

2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව විශ්‍රාමික නිලධාරීන් 07 දෙනෙකු දීප ව්‍යාප්ත හා සමාන්තර සේවාවල තනතුරු සඳහා පත්කර තිබුණු අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ කෘෂි විද්‍යාඥ තනතුරක් සඳහා විශ්‍රාමික නිලධාරියෙකු පත්කර තිබුණි.

### ව්‍යාපෘති නිම නොකිරීම

- ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථාන භූමියෙහි කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා නිල නිවසක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.මිලියන 5.85 කට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 14 දින කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර, 2019 පෙබරවාරි 10 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2020 පෙබරවාරි 25 දින වන විට එම කර්මාන්තයේ කොටසක් නිමකර, ඉදිකිරීම් වැඩ නතර කර තිබුණි. 2019 අගෝස්තු 07 දින වන විට මෙම කර්මාන්තය වෙනුවෙන් රු.මිලියන 2.73 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

- ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දියතලාව හෙල බොජුන් හලෙහි විවේකාගාරය හා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.මිලියන 1.30 ක් පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි 2020 පෙබරවාරි 25 දින වන විටත් එම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

- ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, ජේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද උඩවලව සංචාරක විවේකාංගණය සඳහා 2018 වර්ෂය වන විට රු.මිලියන 39.82 ක් වැය කර තිබුණි. 2019 ජූලි මාසය වන විටත්, විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබුණි.

- කිතුල්කොටේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය හා ආපනශාලාව ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් 2016 ඔක්තෝබර් 20 දින රු.මිලියන 26.09 ක කොන්ත්‍රාත් වටිනාකමට ගිවිසුම්ගත වී ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. ඉදිරිපත් කරන ලද අවසන් බිල්පත අනුව නිමි වැඩවල වටිනාකම රු.මිලියන 20.99 ක් වී තිබුණි. 2019 ජූනි මාසය වන විටද එම ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි.

- කිතුල්කොටේ සංචාරක පහසුකම් මධ්‍යස්ථායේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා රු.මිලියන 6.33 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. 2016 සැප්තැම්බර් 30 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර රු.මිලියන 6.03 ක අවසන් බිල්පතද ගෙවා තිබුණත්, 2019 ජූනි මාසය වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

- ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කිණිගම ලුහු ඉංජිනේරු මධ්‍යස්ථානයට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තයේ දෙවන අදියර සඳහා රු.මිලියන 1.91 කට කොන්ත්‍රාත්කාර සමිතියක් සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. ගිවිසුම් අනුව 2018 නොවැම්බර් 15 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතුව තිබුණත්, 2020 පෙබරවාරි 25 දින වන විටත් එය නිමකර නොතිබුණි.